බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 43

අභිධර්මපිටකයෙහි

03 වන ග්‍රන්ථය

# විභඞ්ගප්පකරණ

ද්විතීය භාගය

ලංකාබෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ
සම්මතය පරිදි

රාජකීය පණ්ඩිත,
ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන් වහන්සේ
හා
රාජකීය පණ්ඩිත,
කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ
විසින් කරන ලද

පාඨශෝධන පූර්වක සිංහල අනුවාදයෙන්
යුක්ත යි.

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 43

The Third Book in the

**Abhidhamma-Pitaka**

**3**

# VIBHANGAPPAKARANA (II)

With the Sinhala translation by

**The Venerable Pandita Labugama Lankānanda Thera**
Anunāyaka of the Kōtte Sri Kalyānī Sāmaggrīdharma Mahāsangha Sabhā
Vice Principal of Pravacanōdaya Pirivena, Molligoda Wādduwa
&
**The Venerable Pandita Karahampitigoda Sumanasāra Thera**
Mākadawara Vihāra, Hingula

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u><br><u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u><br><u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පළමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ වින්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

අභිධම්මපිටකෙ

# විභඞ්ගප්පකරණං

දුතියො භාගො

අභිධර්මපිටකයෙහි

# විභඞ්ගප්‍රකරණය

ද්විතීය භාගය

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 16 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:16 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය... | ix—x |
| ත්‍රිපිටක සම්පාදකමණ්ඩලය | xi |
| සංඥාපනය | xiii—xv |
| සංක්ෂිප්ත නිරූපණය – ABBREVIATIONS | xvii |
| පාළි හෝඩිය – PALI ALPHABET ... | xviii |
| විෂය සූචි | xix—xx |
| පෙළ හා පරිවර්තනය ... | 2—329 |
| විශේෂපදානුක්‍රමණිකා | 331—341 |
| ශුද්ධිපත්‍රය | 342 |

# සංස්කාරක නිවේදනය

අභිධර්ම, සප්තප්‍රකරණයට අයත් විභඞ්ගප්‍රකරණය ග්‍රන්ථප්‍රමාණය සලකා කාණ්ඩ දෙකක් වශයෙන් මුද්‍රණය කරවීමට නියම විය. එහි ඛන්ධවිභඞ්ගයේ පටන් විභඞ්ග නවයකින් ප්‍රථමභාගය සංගෘහීත විය. ''බොජ්ඣඞ්ග'' විභඞ්ගයේ පටන් ''ධම්මහදය'' විභඞ්ගය අවසන් කොට ඇති මේ ද්විතීය භාගය **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි** තෙසාලිස් 43 වැනි ග්‍රන්ථය වශයෙන් පළවන්නේය.

ලඞ්කා බෞද්ධමණ්ඩලයේ ආරාධනය පරිදි විභඞ්ගප්‍රකරණයේ මේ ද්විතීය භාගය මාතර ශ්‍රී සුදර්ශී පරිවෙණාධිපති ව විසූ **කඩවැද්දුව සිරිනිවාස** නායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් සිංහල භාෂායෙන් අනුවාද කරනලද්දේ විය. එහෙත් ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලයේ සම්මතය පරිදි මෙ ද අප විසින් පාඨශෝධනය සහිත කොට යළි හෙළබසින් ලියනලද්දේය. මෙහි දු ශෝධන පරිවර්තන කාර්‍ය්‍ය පිළිබඳ කොට කියයුතු දෑ ප්‍රථමභාගයෙහි ලා නිවේදනය කරන ලද්දේය.

මුද්‍රණ අවස්ථාවට පැමිණ අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති කෝදාගොඩ සිරි ඤාණාලොකාභිධාන දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සංඝනායකස්ථවිරයන් වහන්සේ යැ විද්‍යොදය පිරුවන්හි උපපරිවෙණාධිපති ශාස්ත්‍රපති විද්‍යාවිශාරද රාජකීය පණ්ඩිත රද්දල්ලේ සිරි පඤ්ඤාලොක අනුනායකස්ථවිරයන් වහන්සේ යැ, විද්‍යොදය පිරුවන්හි ආචාර්‍ය්‍ය ශාස්ත්‍රපති විද්‍යාවිශාරද රාජකීය පණ්ඩිත වේඩරුවේ සිරි අනොමදස්සී නායක ස්ථවිරයන් වහන්සේ යැ, රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ යැ යන ත්‍රිපිටක සම්පාදකමණ්ඩලය හොබවන ධර්මධර මහතෙරවරුන්ගේ අනවස්ථිත පරිශ්‍රමය අතිශයින් උපස්තම්භක වූ බව කියයුතු ය, ලේඛකාධිකාරී දෙර ගමුවේ සිරි ධම්මපාල නායකස්ථවිරයන් වහන්සේගෙන් ලැබෙන සහාය ද මෙහිලා අනුස්මරණීය වේ.

තවද ශ්‍රී ලඞ්කාජනරජයේ ගරු අග්‍රාමාත්‍යධුරන්ධර **සිරිමාවෝ බණ්ඩාරනායක මැතිතුමිය** ත්‍රිපිටක ග්‍රන්ථමාලාව මුද්‍රණය කරවා ලීමෙහි ලා දක්වන බලවත් ප්‍රසාදය ද, වර්තමාන සංස්කෘතික අමාත්‍යතැන් පත් ගරු ටී. බී. **තෙන්නකෝන්** මැතිතුමාණන් ත්‍රිපිටක මුද්‍රණය හැකිතාක් ඉක්මනින් අවසාන කිරීමට දක්වන උද්‍යොගය ද ප්‍රශංසාර්හ ය. සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් තැන්පත් **ඒ. එච්. ඇම්. සුමතිපාල** මහතාණන් හා සංස්කෘතික අධ්‍යක්ෂ පී. බී. වේරගොඩ මහතාණන් ද, සහකාර අධ්‍යක්ෂ **සෝමපාල ජයවර්ධන** මහතාණන් හා සාහිත්‍ය සංවර්ධන නිලධාරී **කේ. ජී. අමරදාස** මහතාණන් ප්‍රමුඛ සංස්කෘතික නිලදරුවන් මෙහි ලා දක්වන උනන්දුව බෞද්ධජනතාවගේ ප්‍රසාදයට සුදුසු බව කියම්හ.

රාජ්‍යය පිළිබඳ අනෙකශත කාර්‍ය්‍යබහුලාත්‍යයෙන් සම්බාධ ව තිබියදීත් රජයේ මුද්‍රණාලයාධිපති ඇල්. ඩබ්ලිව්. පී. **පීරිස්** මහතාණන් ත්‍රිපිටක මුද්‍රණකාර්‍ය්‍යාංශයකුදු පිහිටුවා ඒ සඳහා දෙන අනුබලය ද, එම කාර්‍ය්‍යාංශයෙහි මහතුන් භක්තිසම්ප්‍රයුක්ත ව මුද්‍රණ කටයුතු මැනැවින් කරගෙනයෑම ද ජාතියේ ප්‍රශංසාවට නිසි වෙයි. ත්‍රිපිටකකාර්‍ය්‍යාලය පිහිටි කොළඹ මහානායකචාරිකාරාමයෙහි නියුක්ත ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතාගෙන් මේ සඳහා ලැබෙන සහාය ද ප්‍රශංසාමුඛයෙන් පවසම්හ.



Free Distribution www.aathaapi.org

සියලු ලෝවැසියනට වැඩද වූ අතිපරිශුද්ධ ත්‍රිපිටක පර්‍යාප්ති ධර්මය ව්‍යාප්ත කිරීමෙහි යත්නදරන මෙ හැම සාධුහු ද, ත්‍රිපිටක සංශොධන සිංහලපරිවර්තන සඳහා නන් අයුරින් සහාය දුන් හැම පින්වත්හු ද ධර්මදානමය කුශලහෙතුයෙන් සුබභාගී වෙත්වයි මෙත්සිතින් ආශංසනය කරම්හ.

මෙවගට—ශාසනොදයකාරී,

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර,
ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

ශ්‍රී බුද්ධවර්ෂ 2518,
රාජ්‍යවර්ෂ 1975 දෙසැම්බර් 10 දින,
ත්‍රිපිටක කාර්‍යාලය,
මහානායක චාරිකාරාමය,
115, විජේරාමමාවත,
කොළඹ 7.



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

ශ්‍රී ලඞ්කා බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය රාජකීය පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඤාණාලොක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභා යෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

දෙමටගොඩ ධම්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති, රාජකීය පණ්ඩිත, පරවාහැර සිරි පඤ්ඤානන්ද (බී.ඒ. ලන්ඩන්) කොළඹ නවකෝරළයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

කිරුළපන පූර්වාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දොල්ලේ ශ්‍රී ප්‍රඥාලොක,කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී නායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ—මාකඩවර විහාරාධිවාසී, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

**ලෙඛකාධිකාරී :**

කොළඹ බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවෙ සිරි ධම්මපාල කොළඹ දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.



Free Distribution www.aathaapi.org

# සංඥාපනය

සකල ඥෙයධර්මවිෂයෙහි ප්‍රවෘත්ත වූ ඥානවාර ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ යමකමහාප්‍රාතිහාර්‍ය්‍ය දක්වා අවසානයෙහි ත්‍රිදශාලයෙහි වස්විසූසේක් පාරිච්ඡත්තකමූල යෙහි පාණ්ඩුකම්බල නම් සලසුන්හි වැඩහිඳ මාතෘදිව්‍යරාජයන් කායසාක්ෂි කොට දසදහසක් සක්වළ දෙවියනට අනෙකනය ශතසහස්‍රප්‍රතිමණ්ඩිත වූ විජම්පෙළ දේශනා කළ සේක. ඒ සා මහත් ධර්මරාශිය අගසවු අනුබුදු සැරියුත් මහරහතුන් වහන්සේ වාචනාමාර්ගයට නඟා පන්සියක් පමණ වූ සිය අතැවැසිගණයාට උගන්වාලූසේක. සප්තප්‍රකරණාන්තර්ගත වූ ඒ විජම්පෙළ මහකසුබු ඈ මහරහතුන් විසින් සංගීතානුසංගීත වැ මෙවක් දක්වා අමෘතප්‍රවාහයක් මෙන් පවත්නේ ය.

බුද්ධජයන්ති මහොත්සවය අනුස්මරණය සඳහා ලඞ්කාබෞද්ධ මණ්ඩලය විසින් කරනලද යෝජනා පරිදි ත්‍රිපිටකග්‍රන්ථ ශෝධනය කොට හෙළබසට නඟා, ශ්‍රීලඞ්කා ජනරජයේ අනුග්‍රහයෙන් දනට එම ග්‍රන්ථමාලායෙන් අඩක් පමණ ප්‍රකාශයට පමුණුවන ලද්දේ ය. අභිධර්මපිටකයට අයත් ග්‍රන්ථයන් අතුරෙන් ධම්මසඞ්ගණී, විභඞ්ග, කථාවත්ථු යන තුන්ප්‍රකරණය මුද්‍රණය වී ඇත. එහි අභිධර්මය හා ධම්මසඞ්ගණීප්පකරණය ගෙන කියයුතු දෑ, ධම්මසඞ්ගණී සංඥාපනයෙහි ද, කථාවත්ථුප්පකරණය ගෙන කථාවත්ථු ප්‍රථමභාග සංඥාපනයෙහි ද, මේ විභඞ්ගප්පකරණය පිළිබඳව මෙහි ප්‍රථමභාගසංඥාපන යෙහි ද ප්‍රකාශ කරනලද්දේ ය. එහෙත් මේ විභඞ්ග–ද්විතීයභාගයෙහි ලා ඇතැම් ශොධ්‍යස්ථාන ගෙන ප්‍රකාශ කරම්හ.

විභඞ්ගප්පකරණයෙහි සියවස් බොහෝ ගණනක පටන් අපරීක්ෂායෙන් හෝ අන්‍යථා පරීක්ෂණයෙන් හෝ පතිත වූ ඛලිතස්ථාන හමුවූ බව කියයුතු වේ. එයින් කිසි තැනක් ධර්මධරයන්ගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනුලැබේ : පටිසම්භිදාවිභඞ්ගයෙහි (118 පිට) ''අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, අත්ථධම්මනිරුත්තා භිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා'' යනු දේශනා පෙළ යැ. පෙළ මෙසේ තිබියයුතු වුව ද '' අත්ථධම්මනිරුත්තාභිලාපෙ '' යන පදය ඇතැම් කෙනෙක් 'තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ'යි ද වෙනත් කෙනෙක් ''තත්ථ ධම්මනිරුත්තා භිලාපෙ '' යි ද ශුද්ධපාඨ සේ ගත්හ. අටුවායෙහි එන '' තස්මිං අත්ථෙ ච ධම්මෙ ච යා සභාවනිරුත්ති තස්ස අභිලාපෙ '' යනු බලා ' ධම්ම ' ශබ්ද ස්වභාවය ද කියනුයෙන් ' තස්මිං සභාවනිරුත්තියා අභිලාපෙ ' යනු අර්ථ වියයුතු යයි සලකා තත්ථ හෝ තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ' යනු ශුද්ධ පාඨ සේ ගත් හ'යි පෙනේ. සිංහල සංස්කරණ කීපයක ද බුරුමරට ඡට්ඨ සඞ්ගීතිකාරකයන්ගේ ශෝධනයෙහි ද වෙනත් බොහෝ තැනක ද මේ පාඨය පෙනෙන හෙයින් අපේ සංස්කාරක මණ්ඩලයෙහි ද වැඩි දෙනකුන් වහන්සේගේ මතය පරිදි ''තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ'' යනු පෙළ විසින් ගන්නා ලද්දේ ය.

එහෙත් හැම ශොධක සුධීහු මැ අත්ථ–ධම්ම–නිරුත්ති යන තුන් පටිසම්භිදායෙහි අර්ථකථා සංසන්දන නොකොට අයථා නිගමනයකට බැසගත්හ' යි සිතියැ හෙයි. ' පටිසම්භිදාමග්ග–ගණ්ඨිපදත්ථවණ්ණනා ' යෙහිදු මේ අපපාඨය පෙනෙනුයෙන් කාලාන්තරපතිත දෝෂයක්බව කියයුතු ය. ඇතැම් පටිසම්භිදාමග්ග අටුවාපොතෙක '' අත්ථ ධම්ම නිරුත්තාභිලාපෙ ඤාණං '' (ඒ අර්ථයෙහි ද ධර්මයෙහි ද වූ ස්වභාවනිරුක්තිවචනයෙහි ප්‍රභෙදගත ඤාණය) යන ශුද්ධපාඨය ශෙෂව තිබීම හේතුකොටගෙන අපි මේ නිගමනයට බැසගතුම්හ.



Free Distribution www.aathaapi.org

එහි අර්ථකථාවිවරණය මෙසේ යැ: යං කිඤ්චි පච්චයසමුප්පන්නං, නිබ්බානං, භාසිතත්ථො, විපාකො, කිරියා'ති ඉමෙ පඤ්ච ධම්මා අත්ථො...... තං අත්ථං පච්චවෙක්ඛන්තස්ස තස්මිං අත්ථෙ පභෙදගතං ඤාණං අත්ථපටිසම්භිද '' ප්‍රත්‍යයසමුප්පන්න යැ, නිර්වාණ යැ, භාෂිතාර්ථ යැ, විපාක යැ ක්‍රියා යැ යන පඤ්ච අර්ථයෙහි ප්‍රභෙදයට ගිය ඥානය අත්ථපටිසම්භිද ''යි. '' යො කොචි ඵලනිබ්බත්තකො හෙතු, අරියමග්ගො, භාසිතං, කුසලං, අකුසලන්ති ඉමෙ පඤ්ච ධම්මා ධම්මො...... තං ධම්මං පච්චවෙක්ඛන්තස්ස තස්මිං ධම්මෙ පභෙදගතං ඤාණං ධම්මපටිසම්භිද ''යි ඵල උපදවන හෙතු යැ, ආර්‍ය්‍යමාර්ග යැ, භාෂිත යැ, කුශල යැ, අකුශල යැ යන පඤ්ච ධර්මයෙහි ප්‍රභෙදයට ගිය ඥානය 'ධම්මපටිසම්භිද'යි. '' තස්මිං අත්ථෙ ච ධම්මෙ ච යා සභාවනිරුත්ති, තස්සා අභිලාපෙ තං සභාවනිරුත්තිසද්දං ආරම්මණං කත්වා පච්චවෙක්ඛන්තස්ස තස්මිං සභාව නිරුත්තාභිලාපෙ පභෙදගතං ඤාණං නිරුත්තිපටිසම්භිද ''යි ඒ පඤ්චවිධ අර්ථයෙහි ද පඤ්චවිධ ධර්මයෙහි ද සභාවනිරුත්තියක් අවිපරීතව්‍යවහාරයක් ඇත, එය පැවැසීමෙහි දී ඒ ස්වභාවනිරුක්ති ශබ්දය අරමුණු කොටගෙන ප්‍රත්‍යවෙක්ෂාකරන්නහුට එහි ප්‍රභෙදයට ගිය ඥානය නිරුත්තිපටිසම්භිද'යි.

තවද පටිසම්භිදවිභඞ්ගයෙහි සුත්තන්තභාජනිය සංගහවාර විභාගවාර යයි වාර දෙකෙක ලා වදරන ලද්දේ ය. සංගහවාරයෙහි යට දක්වූ පඤ්ච අර්ථයෝ ද පඤ්ච ධර්මයෝ ද සංගෘහීතයහ. ඒ ප්‍රභෙදවාරය සච්චවාර, හෙතුවාර, ධම්මවාර, පච්චයාකාරවාර, පරියත්තිවාර විසින් පස්වැදෑරුම් වෙයි. එහි පර්‍ය්‍යාප්ති සංඛ්‍යාත නවාඞ්ගශාස්තෘශාසන ධර්මය–බුද්ධභාෂිතය , ධර්ම ' බව ද, භාෂිතප්‍රත්‍යයෙන් අවබොධ කටයුතු භාෂිතාර්ථය ' අර්ථ ' බව ද දක්වන්නට පස්වැනි වූ ' පරියත්තිවාරය ' වදරනලද්දේය. එහි දු භාෂිතය දැනැගෙන පසුව භාෂිතාර්ථය දැනැගන්නා සෙයින් භාෂිත භාෂිතාර්ථක්‍රමයෙන් පළමු ධම්මපටිසම්භිදව වදරා පසුව අත්ථපටිසම්භිදව වදරන ලදි. එහි සුත්ත ගෙය්‍යා'දි නවාඞ්ග යෙන් නිෂ්ප්‍රදෙශ විසින් තන්තිධර්මය ගන්නා ලදි. අත්ථපටිසම්භිදයෙහි දු භාෂිතවශයෙන් නිෂ්ප්‍රදෙශ විසින් තන්තිධර්මය මැ ගන්නාලද වෙයි. අටුවායෙහි මේ වදරනලදි: '' අයං ඉමස්ස අත්ථො අයං ඉමස්ස අත්ථො'ති ඉමස්මිම්පි ඨානෙ භාසිතවසෙන නිප්පදෙසතො තන්ති එව ගහිතා ''යි. භාෂිතවශයෙන් තන්තිධර්මය ම ' අර්ථ 'යි ද ගන්නාලදූයි දක්වා ඇත. මෙසේ අවධාන සහිත කොට විමසා බලත් බලත් මැ අත්‍ථ ධම්ම දෙක්හි බැසගෙන සිටුනා සභාවනිරුක්ති ශබ්දය අරමුණු කොට නුවණින් විමසන්නහුට එහි ප්‍රභෙදගත ඥානය නිරුත්තිපටිසම්භිද වෙයි. මේ අර්ථය පහළකරනු සඳහා '' අත්ථධම්මනිරුත්තා භිලාපෙඤාණං නිරුත්ති පටිසම්භිද ''යි පෙළ හෙළාගතයුතු බව කියම්හ. මේ සංස්කරණ යෙහි දු සුත්තන්තභාජනියෙහි සත් තැනක ද අභිධම්මභාජනියෙහි එක්විසි තැනෙක ද තත්‍ර යන පදය යෙදී ඇත. ඒ හැමයෙහි ' අත්ථ ' යනු තථාගතානුමත රූපය සේ යොදගත යුතු යි.

තවද ධම්මහදයවිභඞ්ගයෙහි ලා '' කාමධාතුයා උප්පත්තික්ඛණෙ කති ඛන්ධා පාතුභවන්ති '' යනාදීන් වදළ භූමිත්‍රයෙහි උත්පත්තික්ෂණයෙහි විද්‍යමාන අවිද්‍යමානධර්මයන් දක්වන සතරවැනි වාරයෙහි හෙතු දක්වන තැන බොහෝ සංස්කරණයන්හි ' කස්සචි අහෙතුකා පාතුභවන්ති 'යි පාඨයක් දක්නට ලැබිණ, එය මුලින් සිටි '' කස්සචි දෙව හෙතු පාතු භවන්ති '' යනාදි පාඨ බලා කාලාන්තරයෙහි පටන් ලේඛකයන් අතින් පතිත වූ ප්‍රමාදපාඨ යක් ශෝධකයන් විසිනුදු එසේ ම ගත්බව සිතිය හෙයි, එහෙයින් '' කෙචි අහෙතුකා පාතු භවන්ති ''යි (290 පිට) සකස්කළම්හ. එහි ම අහේතුකයන් දක්වන තැන හැම සංස්කරණයක ම ' අවසෙසානං සත්තානං අහෙතුකා පාතු භවන්ති ' යන වාක්‍යය එයි.



Free Distribution www.aathaapi.org

එ ද ලේඛකයන්ගේ අනවධානයක් බව පෙනෙන හෙයින් "අසඤ්ඤසත්තා දෙවා අහෙතුකා අනාහරා...... අචිත්තකා පාතුභවන්ති" (300 පිට) යන පාළිය හා සසඳා "අවසෙසා සත්තා අහෙතුකා පාතුභවන්ති"යි (298 පිට) ශුද්ධපාඨය සේ යොදු ලුම්හ. මේ සංස්කරණයෙහි අනිකුදු බොහෝ ශොධ්‍යස්ථාන ඒ ඒ පිටුයෙහි අධො ලිඛිත පාඨ විසින් දතහැකි වේ.

අපගේ මේ පරිශ්‍රමය සම්බුද්ධශාසනයාගේ අකලඞ්ක වැ චිරජීවනය පිණිස පවතීවා'යි ද මේ සත්ක්‍රියායෙහි සහාය වූ ද ප්‍රසාදය දැක්වූ ද හැම සජ්ජනයෝ සුබභාගී වෙත්වා'යි ද ආශංසනය කරම්හ.

මෙවගට—ශාසනොදයකාරී,

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර,
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

ශ්‍රී බුද්ධවර්ෂ 2518
රාජ්‍යවර්ෂ 1975 දෙසැම්බර් 10 දින.



Free Distribution www.aathaapi.org

# සඞ්කෙත නිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සී | — | මහනුවර (පත්තිරිප්පුව) රාජකීය පුස්තකාලයට අයත් විභඞ්ගප්පකරණ පුස්කොළපොත |
| සීපැවි, පැවි | — | පැල්මඩුල්ල විහාරය සතු විභඞ්ගප්පකරණ පුස්කොළපොත |
| සිරිමු | — | ශ්‍රීපාද ත්‍රිපිටක මුද්‍රණයෙහි විභඞ්ගප්පකරණය |
| සයා | — | තායිලන්තයෙහි මුද්‍රිත විභඞ්ගප්පකරණය |
| මජසං | — | මරම්මජට්ඨසඞ්ගීති විභඞ්ගප්පකරණය |
| සං, සංවි | — | සම්මොහවිනොදනී අට්ඨකථා |
| PTS | — | PALI TEXT SOCIETY VIBHANGAPPAKARANA |



1A—88 17626 (3/75)

Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඦ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | ව්හ vha |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො ō |

# විභඞ්ගප්පකරණ දුතියභාග

## විසය සූචි


| | | පිට්ඨඞ්කං |
|---|---|---|
| 10. | බොජ්ඣඞ්ගවිභඞ්ගො | 2 – 16 |
| | 1. සුත්තන්තභාජනීයං | 2 – 6 |
| | 2. අභිධම්මභාජනීයං | 6 – 10 |
| | 3. පඤ්හපුච්ඡකං | 10 – 16 |
| 11. | මග්ගවිභඞ්ගො | 18 – 32 |
| | 1. සුත්තන්තභාජනීයං | 18 – 20 |
| | 2. අභිධම්මභාජනීයං | 20 – 26 |
| | 3. පඤ්හපුච්ඡකං | 26 – 32 |
| 12. | ඣානවිභඞ්ගො | 34 – 78 |
| | 1. මාතිකා | – 34 |
| | 2 සුත්තන්තභාජනීයං | 36 – 62 |
| | 3. අභිධම්මභාජනීයං | 64 – 72 |
| | 4 පඤ්හපුච්ඡකං | 72 – 78 |
| 13. | අප්පමඤ්ඤාවිභඞ්ගො | 80 – 102 |
| | 1 සුත්තන්තභාජනීයං | 80 – 86 |
| | 2. අභිධම්මභාජනීයං | 86 – 96 |
| | 3. පඤ්හපුච්ඡකං | 96 – 102 |
| 14. | සික්ඛාපදවිභඞ්ගො | 104 – 116 |
| | 1 අභිධම්මභාජනීයං | 104 – 112 |
| | 2. පඤ්හපුච්ඡකං | 112 – 116 |
| 15. | පටිසම්භිදාවිභඞ්ගො | 118 – 140 |
| | 1. සුත්තන්තභාජනීයං | 118 – 120 |
| | 2. අභිධම්මභාජනීයං | 120 – 132 |
| | 3. පඤ්හපුච්ඡකං | 134 – 140 |




Free Distribution www.aathaapi.org

| | | |
|---|---|---|
| | | පිට්ඨඞ්කො |
| **16.** | **ඤාණවිභඞ්ගො** | **142 – 192** |
| 1 | මාතිකා | 142 – 152 |
| 2. | එකවිධෙන ඤාණවත්ථු | – 142 |
| 3. | දුවිධෙන ඤාණවත්ථු | – 144 |
| 4. | තිවිධෙන ඤාණවත්ථු | 144 – 148 |
| 5. | චතුබ්බිධෙන ඤාණවත්ථු | 148 – 150 |
| 6. | පඤ්චවිධෙන – නවවිධෙන ඤාණවත්ථු | – 150 |
| 7. | දසවිධෙන ඤාණවත්ථු | 150 – 152 |
| 8. | එකකං | 154 – 158 |
| 9. | දුකං | 158 – 162 |
| 10. | තිකං | 162 – 166 |
| 11. | චතුක්කං | 168 – 174 |
| 12. | පඤ්චකං – නවකං | 176 – 178 |
| 13. | දසවිධෙන ඤාණවත්ථු | 178 – 192 |
| **17.** | **ඛුද්දකවත්ථුවිභඞ්ගො** | **194 – 274** |
| 1. | මාතිකා | 194 – 198 |
| 2. | එකකං | 198 – 210 |
| 3. | දුකං | 210 – 216 |
| 4. | තිකං | 218 – 224 |
| 5. | චතුක්කං | 226 – 240 |
| 6. | පඤ්චකං | 240 – 244 |
| 7. | ඡක්කං | 244 – 248 |
| 8. | සත්තකං | 248 – 258 |
| 9. | අට්ඨකං | 252 – 252 |
| 10. | නවකං | 258 – 260 |
| 11. | දසකං | 260 – 262 |
| 12. | අට්ඨාරස තණ්හාවිචරිතානි | 262 – 274 |
| 13. | ද්වාසට්ඨි දිට්ඨිගතානි | – 274 |
| **18.** | **ධම්මහදයවිභඞ්ගො** | **276 – 328** |
| 1. | පඨමො වාරො | 276 – 278 |
| 2. | දුතියො වාරො | 278 – 286 |
| 3. | තතියො වාරො | 286 – 290 |
| 4. | චතුත්ථො වාරො | 290 – 302 |
| 5. | පඤ්චමො වාරො | 302 – 304 |
| 6. | ඡට්ඨො වාරො | 304 – 310 |
| 7. | සත්තමො වාරො | 310 – 314 |
| 8. | අට්ඨමො වාරො | 314 – 316 |
| 9. | නවමො වාරො | – 316 |
| 10. | දසමො වාරො | 318 – 328 |




Free Distribution www.aathaapi.org

අභිධම්මපිටකෙ

# විභඞ්ගප්පකරණං

දුතියො භාගො

2—ඝ8 17626 (3/75)

අභිධම්මපිටකෙ

# විභඞ්ගප්පකරණං

## දුතියො භාගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

## 10. බොජ්ඣඞ්ගවිභඞ්ගො

533. සත්ත බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛා[1]සම්බොජ්ඣඞ්ගො.

534. තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා[2] අනුස්සරිතා, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො.

සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය විචිනති පවිචිනති[3] පවිචරති. පරිවීමංසමාපජ්ජති, අයං වුච්චති ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො.

තස්ස තං ධම්මං පඤ්ඤාය විචිනතො පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, අයං වුච්චති විරියසම්බොජ්ඣඞ්ගො.

ආරද්ධවිරියස්ස[4] උප්පජ්ජති පීති නිරාමිසා, අයං වුච්චති පීතිසම්බොජ්ඣඞ්ගො.

පීතිමනස්ස කායො'පි පස්සම්භති චිත්තම්පි පස්සම්භති, අයං වුච්චති පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො.

පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, අයං වුච්චති සමාධිසම්බොජ්ඣඞ්ගො.

සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, අයං වුච්චති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

535. සත්ත බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

---

1. උපෙඛා - පා: වි.
2. සරිතා හොති - සිරිමු, මජසං.
3. පවිචිනාති - සිරිමු.
4. ආරද්ධස්ස විරියස්ස - සී පා: වි.



Free Distribution www.aathaapi.org

## අභිධර්මපිටකයෙහි

# විභඞ්ග පෙළ

## ද්විතීය භාගය

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

## 10. බොධ්‍යඞ්ග විභඞ්ගය

533. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ සමාධිසම්බොධ්‍යඞ්ග යැ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

534. එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ සිහි ඇත්තේ උතුම් සිහිනුවණින් යුක්ත වූයේ බොහෝ කලකින් පෙර කරන ලද්ද ද බොහෝ කලකින් පෙර කියන ලද්ද ද සිහිකරන්නේ පුනපුනා සිහිකරන්නේ වෙයි. මෙ ' ස්මෘතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

එසේ ඒ මහණ සිහි ඇති ව වසන්නේ ඒ ධර්මය නුවණින් විමසයි, වෙසෙසින් විමසයි, ප්‍රඥාව හසුරුවයි, විමසීමට පැමිණෙයි. මෙ ' ධර්මවිචයසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

ඒ ධර්මය නුවණින් විමසන වෙසෙසින් විමසන නුවණින් හසුරුවන විමසීමට පැමිණෙන ඒ මහණහු විසින් වීර්‍ය්‍යය ආරබ්ධ වෙයි, එහෙයින් ම නො හැකුළුණේ වෙයි. මෙ ' වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තහුට පරිශුද්ධ වූ ප්‍රීතිය උපදී. මෙ ' ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

ප්‍රීතිසම්ප්‍රයුක්ත සිත් ඇත්තහුගේ නාමකය ද සන්හිඳෙයි, සිත ද සන්හිඳෙයි. මෙ ' ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

සන්හුන්කය ඇති එහෙයින් මැ උපන් සුව ඇත්තහුගේ සිත (අරමුණෙහි) සමාහිත වෙයි. මෙ ' සමාධිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

හෙතෙම එසෙයින් සමාහිත වූ සිත මොනොවට උපෙක්ෂා කරන්නේ වෙයි. මෙ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ.

535. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ සමාධිසම්බොධ්‍යඞ්ග යැ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

536. තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: අත්ථි අජ්ඣත්තං ධම්මෙසු සති, අත්ථි බහිද්ධා ධම්මෙසු සති. යද්'පි අජ්ඣත්තං ධම්මෙසු[1] සති තද්'පි සතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි බහිද්ධා ධම්මෙසු සති තද්'පි සතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො: අත්ථි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො, අත්ථි බහිද්ධා ධම්මෙසු පවිචයො. යද්'පි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො තද්'පි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි බහිද්ධා ධම්මෙසු පවිචයො තද්'පි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො විරියසම්බොජ්ඣඞ්ගො: අත්ථි කායිකං විරියං, අත්ථි චෙතසිකං විරියං. යද්'පි කායිකං විරියං තද්'පි විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි චෙතසිකං විරියං තද්'පි විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො පීතිසම්බොජ්ඣඞ්ගො: අත්ථි සවිතක්කසවිචාරා පීති, අත්ථි අවිතක්කඅවිචාරා පීති. යද්'පි සවිතක්කසවිචාරා පීති තද්'පි පීතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. යද්'පි අවිතක්කඅවිචාරා පීති තද්'පි පීතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො: අත්ථි කායපස්සද්ධි අත්ථි චිත්තපස්සද්ධි. යද්'පි කායපස්සද්ධි තද්'පි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි චිත්තපස්සද්ධි තද්'පි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො සමාධිසම්බොජ්ඣඞ්ගො: අත්ථි සවිතක්කසවිචාරො[2] සමාධි, අත්ථි අවිතක්කඅවිචාරො[3] සමාධි. යද්'පි සවිතක්කසවිචාරො[2] සමාධි තද්'පි සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි අවිතක්කඅවිචාරො[3] සමාධි තද්'පි සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තත්ථ කතමො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො: අත්ථි අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා, අත්ථි බහිද්ධා ධම්මෙසු උපෙක්ඛා. යද්'පි අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා තද්'පි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යද්'පි බහිද්ධා ධම්මෙසු උපෙක්ඛා තද්'පි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

537. සත්ත බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

---

1. අජ්ඣත්තධම්මෙසු - ස.
2. සවිතක්කො සවිචාරො - සිරිමු, මජසං, ස්‍යා.
3. අවිතක්කො අවිචාරො - සිරිමු, මජසං, ස්‍යා.

536. එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : අධ්‍යාත්ම (සංස්කාර) ධර්මයන්හි ස්මෘතියෙක් ඇත, බාහිරධර්මයන්හි ස්මෘතියෙක් ඇත, අධ්‍යාත්මධර්මයන්හි යම් ස්මෘතියෙක් ඇද්ද ඒ ස්මෘතිය ද, ස්මෘති සම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස මාර්ගය පිණිස නිර්වාණය පිණිස පවතී. බාහිරධර්මයන්හි යම් ස්මෘතියකුත් ඇද්ද ඒ ස්මෘතිය ද ස්මෘති සම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස මාර්ගය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : අධ්‍යාත්මධර්මයන්හි විමසීමෙක් ඇත, බාහිරධර්මයන්හි විමසීමෙක් ඇත. අධ්‍යාත්මධර්මයන්හි යම් විමසීමෙකුත් ඇද්ද, හෙ ද ධර්මවිචයසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස මාර්ගය පිණිස නිර්වාණය පිණිස පවතී. බාහිරධර්මයන්හි යම් විමසීමෙකුත් ඇද්ද, හෙ ද ධර්මවිචයසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස මාර්ගය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : කායිකවීර්‍ය්‍යයෙක් ඇත, චෛතසිකවීර්‍ය්‍යයෙක් ඇත. යම් කායිකවීර්‍ය්‍යයෙකුත් ඇද්ද, හෙ ද වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. යම් චෛතසිකවීර්‍ය්‍යයෙකුත් ඇද්ද, හෙ ද වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : සවිතර්කසවිචාර ප්‍රීතියෙක් ඇත, අවිතර්ක අවිචාරප්‍රීතියෙක් ඇත. යම් සවිතර්කසවිචාරප්‍රීතියකුත් ඇද්ද හෙ ද ප්‍රීතිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. යම් අවිතර්කඅවිචාර ප්‍රීතියකුත් ඇද්ද, හෙ ද ප්‍රීතිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : කායප්‍රශ්‍රබ්ධියෙක් (කයෙහි සන්හුන් බවෙක්) ඇත, චිත්තප්‍රශ්‍රබ්ධියෙක් (සිතෙහි සන්හුන් බවෙක්) ඇත. යම් කායප්‍රශ්‍රබ්ධියකුත් ඇද්ද, හෙ ද ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. යම් චිත්තප්‍රශ්‍රබ්ධියකුත්, ඇද්ද, හෙ ද ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි සමාධිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : සවිතර්කසවිචාරසමාධියෙක් ඇත අවිතර්කඅවිචාරසමාධියෙක් ඇත. යම් සවිතර්කසවිචාරසමාධියකුත් ඇද්ද, හෙ ද සමාධිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. යම් අවිතර්කඅවිචාරසමාධියකුත් ඇද්ද, හෙ ද සමාධිසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

එහි උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : අධ්‍යාත්මධර්මයන්හි උපේක්ෂාවක් ඇත, බාහිරධර්මයන්හි උපේක්ෂාවක් ඇත. අධ්‍යාත්මධර්මයන්හි යම් උපේක්ෂාවක් ඇද්ද, එ ද උපේක්ෂාසම්බොධ්‍යඞ්ග වූයේ අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. බාහිරධර්මයන්හි යම් උපේක්ෂාවකුත් ඇද්ද, එ ද අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

537. බෝධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යෑ ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යෑ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යෑ, ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යෑ ප්‍රශ්‍රබ්ද්ධිසම්බොධ්‍යඞ්ග යෑ සමාධිසම්බොධ්‍යඞ්ග යෑ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

538. තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං.

සුත්තන්තභාජනියං.

---

539. සත්ත බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

540. තත්ථ කතමෙ සත්ත බොජ්ඣඞ්ගා: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ සත්ත බොජ්ඣඞ්ගා හොන්ති. සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

541. තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො විරියසම්බොජ්ඣඞ්ගො: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති විරියසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො පීතිසම්බොජ්ඣඞ්ගො: යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍ය්‍යං[2] අත්තමනතා චිත්තස්ස පීතිසම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති පීතිසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො: යා වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස විඤ්ඤාණක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො.

---

1. පඨමජ්ඣානං - සිරිමු, මජසං.
2. ඔදග්‍යං - සිරිමු.

538. එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ තෙමේ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමුණු ස්මෘතිසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . සමාධිසම්බොධ්‍යඞ්ගය වඩයි, විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමුණු උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය වඩයි.

**සූත්‍රාන්තභාජනීය යි.**

---

539. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යැ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ සමාධිසම්බොධ්‍යඞ්ග යැ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

540. එහි සප්තබොධ්‍යඞ්ගයෝ කවරහ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි සප්තබොධ්‍යඞ්ගයෝ වෙති : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ . . . උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

541. එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් සිහි කිරීමෙක් පුනපුනා සිහිකිරීමෙක් අභිමුඛ වැ මෙන් සිහි කිරීමෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණට බැසගැනීමෙක් නො නස්නා බවෙක් ස්මෘති යෙක් ස්මෘතින්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක් ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ස්මෘතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

එහි ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මාර්ගඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් ප්‍රඥයෙක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් සියුසස්දහම් සෙවීමෙක් සම්‍යග් දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ධර්මවිචයසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

එහි වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මාර්ගඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් චෛතසිකවීර්‍ය්‍යාරම්භයෙක් . . . සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍ය්‍යසම්බොධ්‍යාඞ්ගයෙක් වේ ද, මේ ' වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

එහි ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : යම් ප්‍රීතියක් ප්‍රාමොද්‍යයෙක් ආමොදනයෙක් ප්‍රමොදනයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් සතුටෙක් ඔදවැඩි බවෙක් චිත්තයාගේ සතුටු බවෙක් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

එහි ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : වෙදනාස්කන්ධයාගේ සංඥස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් සන්හිඳීමෙක් වෙසෙසින් සන්හිඳීමෙක් සන්හුන් අයුරෙක් වෙසෙසින් සන්හුන් අයුරෙක් සන්හිඳුණු බවෙක් සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

තත්ථ කතමො සමාධිසම්බොජ්ඣඞ්ගො: යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සමාධිසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො: යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ වුච්චන්ති සත්තබොජ්ඣඞ්ගා. අවසෙසා ධම්මා සත්තහි බොජ්ඣඞ්ගෙහි සම්පයුත්තා.

542 සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. යා තස්මිං සමයෙ සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො, අවසෙසා ධම්මා සතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා විරියසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා පීතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා.

තත්ථ කතමො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. යා තස්මිං සමයෙ උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො. අවසෙසා ධම්මා උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගසම්පයුත්තා.

543. සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමෙ සත්තබොජ්ඣඞ්ගා: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානායපඨමාය භූමියා පත්තියා විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. යො තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා.

තස්සෙ'ව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. තස්මිං සමයෙ සත්තබොජ්ඣඞ්ගා හොන්ති සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: යා සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො -පෙ-.

තත්ථ කතමො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො: යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ වුච්චන්ති සත්තබොජ්ඣඞ්ගා, අවසෙසා ධම්මා සත්තහි බොජ්ඣඞ්ගෙහි සම්පයුත්තා.

Free Distribution www.aathaapi.org

එහි සමාධිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : චිත්තයාගේ යම් මාර්ගාඞ්ග වූ මාර්ග පර්‍යාපන්න වූ ස්ථිතියක් . . . සම්‍යක්සමාධියක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සමාධිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ.

එහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : යම් උපෙක්ෂාවක් උපෙක්ෂාකාර යෙක් අධික උපෙක්ෂාවක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ. මොහු සප්තබොධ්‍යඞ්ගයෝ යි කියනු ලැබෙත්, අවශෙෂධර්මයෝ සප්තබොධ්‍යඞ්ගයන් හා සම්ප්‍රයුක්තයෝ යි.

542. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි. ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ . . . උපෙක්ෂ සම්බොධ්‍යඞ්ග යි.

එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි මාර්ගඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් සිහි කිරීමෙක් පුනපුනා සිහිකිරීමෙක් සම්‍යක්ස්මෘතියක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ස්මෘතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ස්මෘති සම්බොධ්‍යඞ්ගසම්ප්‍රයුක්තයහ. . . . අවශෙෂධර්මයෝ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගසම්ප්‍ර යුක්තයහ. අවශෙෂධර්මයෝ වීර්‍යසම්බොධ්‍යඞ්ගසම්ප්‍රයුක්තයහ. . . . අවශෙෂධර්මයෝ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගසම්ප්‍රයුක්තයහ. . . . අවශෙෂධර්මයෝ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගසම්ප්‍ර යුක්තයහ. . . . අවශෙෂධර්මයෝ සමාධිසම්බොධ්‍යඞ්ගසම්ප්‍රයුක්තයහ.

එහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි යම් උපෙක්ෂාවක් උපෙක්ෂාකාර යෙක් අධිකඋපෙක්ෂායෙක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

543. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ . . . උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග යි.

එහි සප්තබොධ්‍යඞ්ගයෝ කවරහ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගත යන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධා භිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් ස්පර්ශයෙක් වේ ද . . . අවික්ෂෙප යෙක් වේ ද මේ ධර්මයෝ කුශලයෝ යි. එ මැ ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාකප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි සප්තබොධ්‍යඞ්ගයෝ වෙති : ස්මෘති සම්බොධ්‍යඞ්ග යැ . . . උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මාර්ගඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' ස්මෘතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ. . . .

එහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : යම් උපේක්ෂායෙක් උපෙක්ෂා අයුරෙක් අධික උපේක්ෂායෙක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යෙක් වේ ද, මේ ' උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබේ. මොහු ' සප්තබොධ්‍යඞ්ග යෝ ' යි කියනු ලැබෙත්. අවශේෂ ධර්මයෝ සප්තබොධ්‍යඞ්ගයන් හා සම්ප්‍රයුක්තයහ.

544. සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. යා තස්මිං සමයෙ සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො, අවසෙසා ධම්මා සතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා විරියසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා පීතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා.

තත්ථ කතමො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපපිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, යා තස්මිං සමයෙ උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. අවසෙසා ධම්මා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා.

## අභිධම්මභාජනියං.

---

545. සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචය[1] සම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

546. සත්තන්නං බොජ්ඣඞ්ගානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා -පෙ- කති සරණා, කති අරණා:

547. සියා කුසලා, සියා අබ්‍යාකතා.

පීතිසම්බොජ්ඣඞ්ගො සුඛාය වෙදනාය සම්පයුත්තො. ඡ බොජ්ඣඞ්ගා සියා සුඛාය වෙදනාය සම්පයුත්තා, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා.

සියා විපාකා, සියා විපාකධම්මධම්මා.

---

1. ධම්මවිචයො - සිරිමු.

544. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යෑ . . . උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග යි.

එහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වෙ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ මැ ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාකප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි මාර්ගඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් සම්‍යක් ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වෙ ද, මේ ' ස්මෘතිසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ. අවශෙෂධර්මයෝ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යැ . . . අවශෙෂධර්මයෝ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යැ . . . අවශෙෂධර්මයෝ වීර්‍යසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යැ , . . අවශෙෂ ධර්මයෝ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යැ . . . අවශෙෂධර්මයෝ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යැ . . . අවශෙෂධර්මයෝ සමාධිසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

එහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි. . . . අවික්ෂෙපය වෙ, මේ ධර්මයෝ කුශලයෝ යැ. එ මැ ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ විපාකප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. එසමයෙහි යම් උපෙක්ෂායෙක් උපෙක්ෂා අයුරෙක් අධික උපෙක්ෂායෙක් චිත්තයාගේ මධ්‍යස්ථභාවයෙක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යෙක් වෙ ද, මේ ' උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග ' යි කියනු ලැබෙ. අවශෙෂධර්මයෝ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

අභිධර්මභාජනීය යි.

---

545. බොධ්‍යඞ්ගයෝ සත්දෙනෙකි : ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචයසම්බොධ්‍ය ඞ්ග යැ වීර්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ සමාධි සම්බොධ්‍යඞ්ග යැ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

546. සප්තබොධ්‍යඞ්ගයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද, අකුශලයෝ කෙතෙක් ද, අව්‍යාකෘතයෝ කෙතෙක් ද, . . . සරණයෝ කෙතෙක් ද, අරණයෝ කෙතෙක් ද යත් :

547. (සප්තබොධ්‍යඞ්ගයෝ) කුශල ද වන්නාහ, අව්‍යාකෘත ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ය. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) විපාක ද වන්නාහ, විපාකස්වභාවධර්ම ද වන්නාහු ය.

අනුපාදින්නානුපාදානියා.

අසංකිලිට්ඨඅසංකිලෙසිකා.

සියා සවිතක්කසවිචාරා, සියා අවිතක්කවිචාරමත්තා, සියා අවිතක්ක අවිචාරා.

පීතිසම්බොජ්ඣඞ්ගො න පීතිසහගතො සුඛසහගතො න උපෙක්ඛාසහගතො. ඡ බොජ්ඣඞ්ගා සියා පීතිසහගතා, සියා සුඛසහගතා, සියා උපෙක්ඛාසහගතා.

නෙ'ව දස්සනෙන න භාවනාය පහාතබ්බා.

නෙ'ව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

සියා අපචයගාමිනො, සියා නෙවාචයගාමි නාපචයගාමිනො.

සියා සෙක්ඛා, සියා අසෙක්ඛා.

අප්පමාණා.

අප්පමාණාරම්මණා.

පණීතා.

සියා සම්මත්තනියතා, සියා අනියතා.

න මග්ගාරම්මණා, සියා මග්ගහෙතුකා, සියා මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගහෙතුකාති'පි මග්ගාධිපතිනොති'පි.

සියා උප්පන්නා, සියා අනුප්පන්නා, සියා උප්පාදිනො.

සියා අතීතා, සියා අනාගතා, සියා පච්චුප්පන්නා.

න වත්තබ්බා අතීතාරම්මණාති'පි අනාගතාරම්මණාති'පි පච්චුප්පන්නාරම්මණාති'පි.

සියා අජ්ඣත්තා සියා බහිද්ධා සියා අජ්ඣත්තබහිද්ධා.

අජ්ඣත්තබහිද්ධාරම්මණා.

අනිදස්සනඅප්පටිඝා.

548. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො හෙතු. ඡ බොජ්ඣඞ්ගා න හෙතු.

සහෙතුකා.[1]

හෙතුසම්පයුත්තා.

ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො හෙතු චෙව සහෙතුකො ච ඡ බොජ්ඣඞ්ගා න වත්තබ්බා හෙතු චෙව සහෙතුකා'ති සහෙතුකා චෙව න ච හෙතු.

ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො හෙතු චෙව හෙතුසම්පයුත්තො ච, ඡ බොජ්ඣඞ්ගා න වත්තබ්බා හෙතු චෙව හෙතුසම්පයුත්තා'ති, හෙතු සම්පයුත්තා චෙව න ච හෙතු.

ඡ බොජ්ඣඞ්ගා න හෙතු සහෙතුකා. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො න වත්තබ්බො න හෙතු සහෙතුකොති'පි න හෙතු අහෙතුකොති'පි

1. න හෙතු, සහෙතුකා. ඉති අයං මරම්මඡට්ඨසඞ්ගායනා පොත්ථකෙ මුද්දිතසීහලක්ඛරපොත්ථකෙ ච න දිස්සති.

Free Distribution www.aathaapi.org

(සප්තබොධ්‍යඞ්ගයෝ) අනුපාදින්නොපාදනියහ.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අසංක්ලිෂ්ටඅසාංක්ලෙශිකයෝ යි.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සවිතර්කසවිචාර ද වන්නාහ, අවිතර්කවිචාරමාත්‍ර ද වන්නාහ, අවිතර්කඅවිචාර ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ප්‍රීතිසහගත නො වෙයි. සුඛසහගත වෙයි, උපෙක්ෂාසහගත නො වේ. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් ප්‍රීතිසහගත ද වන්නාහ, සුඛසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අපචයගාමී ද වන්නාහ, නො ම ආචයගාමී නො ද අපචයගාමී ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) ශෛක්ෂ ද වන්නාහ, අශෛක්ෂ ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අප්‍රමාණයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අප්‍රමාණාලම්බනයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) ප්‍රණීතයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සම්‍යක්ත්වනියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) මාර්ගාලම්බනයෝ නො වෙති. මාර්ගහෙතුක ද වන්නාහ, මාර්ගාධිපති ද වන්නාහ, මාර්ගහෙතුකහ යි ද මාර්ගාධිපතිහ යි ද නො කියයුතු ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) උත්පන්න ද වන්නාහ, අනුත්පන්න ද වන්නාහ, උත්පාදී ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අතීත ද වන්නාහ, අනාගත ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්න ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අතීතාලම්බනහ යි ද අනාගතාලම්බනහ යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බනහ යි ද නො කියයුත්තාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අධ්‍යාත්ම ද වන්නාහ, බාහිර ද වන්නාහ, අධ්‍යාත්මබාහිර ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අධ්‍යාත්මබාහිරාලම්බනයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අනිදර්ශනඅප්‍රතිඝයෝ යි.

548. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය හේතු ය. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් හේතු නොවෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සහෙතුකයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) හේතුසම්ප්‍රයුක්තයෝ ය.

ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය හේතු ද වූයේ ම සහේතුක ද වෙයි. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් හේතු ද වූ ම සහේතුකහ යි නො කියයුත්තාහ, සහේතුක ද වූවාහු ම නො ද හේතු වෙත්.

ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය හේතු ද වූයේ ම හේතුසම්ප්‍රයුක්ත ද වෙයි, බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් හෙතු ද වූවාහු ම හෙතුසම්ප්‍රයුක්තහ යි නො කියයුත්තාහ, හෙතුසම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද හෙතු වෙත්.

බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් හේතු නො වූ සහේතුකයෝ ය, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය හේතු නො වූ සහේතුක යි ද හෙතු නො වූ අහේතුක යි ද නො කියයුත්තේ යි.

549. සප්පච්චයා.

සඞ්ඛතා.

අනිදස්සනා.

අප්පටිඝා.

අරූපා.

ලොකුත්තරා.

කෙනචි විඤ්ඤෙය්‍යා; කෙනචි න විඤ්ඤෙය්‍යා.

550. නො ආසවා.

අනාසවා.

ආසවවිප්පයුත්තා.

න වත්තබ්බා ආසවා චෙව සාසවා'ති'පි සාසවා චෙ'ව නො ච ආසවා'ති'පි.

න වත්තබ්බා ආසවා චෙව ආසවසම්පයුත්තා'ති'පි ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා'ති'පි.

ආසවවිප්පයුත්තා අනාසවා

551. නො සඤ්ඤොජනා -පෙ- නො ගන්ථා -පෙ- නො ඔඝා -පෙ- නො යොගා -පෙ- නො නීවරණා -පෙ- නො පරාමාසා -පෙ-

552. සාරම්මණා.

නො චිත්තා.

චෙතසිකා.

චිත්තසම්පයුත්තා.

චිත්තසංසට්ඨා.

චිත්තසමුට්ඨානා

චිත්තසහභුනො.

චිත්තානුපරිවත්තිනො.

චිත්තසංසට්ඨසමුට්ඨානා.

චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

බාහිරා.

නො උපාදා.

අනුපාදින්නා.

549. (සප්තබොධ්‍යඞ්ගයෝ) සප්‍රත්‍යයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සඞ්ඛතයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අනිදර්ශනයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අප්‍රතිඝයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අරූපයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) ලෝකෝත්තරයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) (චක්ෂුරාදි) කිසිවිඥනයෙකින් දතයුත්තාහ, කිසිවිඥනයෙකින් නොදත යුත්තාහු යි.

550. (සප්තබොධ්‍යඞ්ගයෝ) ආස්‍රව නො වෙති, අනාස්‍රවයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) ආස්‍රවවිප්‍රයුක්තයෝ ය.

(සප්තබෝධ්‍යඞ්ගයෝ) ආස්‍රව ද වූවාහු ම සාස්‍රවහ යි ද සාස්‍රව ද වූවාහු ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

(සප්තබෝධ්‍යඞ්ගයෝ) ආස්‍රව ද වූවාහු ම ආස්‍රවසම්ප්‍රයුක්තහ යි ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රවයෝ යි.

551. (සප්තබොධ්‍යඞ්ගයෝ) සංයොජන නො වෙති . . . ග්‍රන්ථයෝ නො වෙති . . . ඔඝයෝ නො වෙති . . . යොගයෝ නො වෙති . . . නීවරණයෝ නො වෙති . . . පරාමර්ශයෝ නො වෙති. . . .

552. (සප්තබොධ්‍යඞ්ගයෝ) සාලම්බනයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්ත නො වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චෛතසික වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසම්ප්‍රයුක්තයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසමුත්ථානයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසහභූහ.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තානුපරිවර්තීහ.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූහ.

(සප්තබොධ්‍යඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහ.

(සප්තබොධ්‍යඞ්ගයෝ) බාහිරයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) උපාද නො වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අනුපාදින්නයෝ යි.

553. නො උපාදනා -පෙ- නො කිලෙසා -පෙ-

න දස්සනෙන පහාතබ්බා.

න භාවනාය පහාතබ්බා.

න දස්සනෙන පහාතබ්බහෙතුකා.

න භාවනාය පහාතබ්බහෙතුකා.

සියා සවිතක්කා සියා අවිතක්කා.

සියා සවිචාරා සියා අවිචාරා.

පීතිසම්බොජ්ඣඞ්ගො අප්පීතිකො. ඡ බොජ්ඣඞ්ගා සියා සප්පීතිකා සියා අප්පීතිකා.

පීතිසම්බොජ්ඣඞ්ගො න පීතිසහගතො. ඡ බොජ්ඣඞ්ගා සියා පීතිසහගතා සියා න පීතිසහගතා.

පීතිසම්බොජ්ඣඞ්ගො සුඛසහගතො. ඡ බොජ්ඣඞ්ගා සියා සුඛසහගතා, සියා න සුඛසහගතා.

පීතිසම්බොජ්ඣඞ්ගො න උපෙක්ඛාසහගතො. ඡ බොජ්ඣඞ්ගා සියා උපෙක්ඛාසහගතා සියා න උපෙක්ඛාසහගතා.

න කාමාවචරා.

න රූපාවචරා.

න අරූපාවචරා.

අපරියාපන්නා.

සියා නිය්‍යානිකා සියා අනිය්‍යානිකා.

සියා නියතා සියා අනියතා.

අනුත්තරා.

අරණාති.

පඤ්හාපුච්ඡකං.

බොජ්ඣඞ්ගවිභඞ්ගො නිට්ඨිතො.

Free Distribution www.aathaapi.org

553. (සප්තබොධ්‍යඞ්ගයෝ) උපාදනයෝ නො වෙති . . . ක්ලෙශයෝ නො වෙති. . . .

(සප්තබොධ්‍යඞ්ගයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති, භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙත්.

(සප්තබොධ්‍යඞ්ගයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ නො වෙති, භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ නො වෙත්.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සවිතර්ක ද වන්නාහ, අවිතර්ක ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) සවිචාර ද වන්නාහ, අවිචාර ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය අප්‍රීතික ය, බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් සප්‍රීතික ද වන්නාහ, අප්‍රීතික ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ප්‍රීතිසහගත නො වෙයි. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් ප්‍රීතිසහගත ද වන්නාහ, ප්‍රීතිසහගත නො ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය සුඛසහගත ය. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් සුඛසහගත ද වන්නාහ, සුඛසහගත නො ද වන්නාහු ය.

ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය උපෙක්ෂාසහගත නො වෙයි. බොධ්‍යඞ්ගයෝ සදෙනෙක් උපෙක්ෂාසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත නො ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) කාමාවචර නො වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) රූපාවචරයෝ නො වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අරූපාවචරයෝ නො වෙති.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අපයර්‍යාපන්නයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) නෛර්‍යාණික ද වන්නාහ, අනෛර්‍යාණික ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) නියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අනුත්තරයෝ ය.

(සප්තබොධ්‍යඞ්ගයෝ) අරණයෝ යි.

පඤ්හපුච්ඡක යි.

බොධ්‍යඞ්ගවිභඞ්ග නිමි.

---



Free Distribution www.aathaapi.org

# 11. මග්ගවිභඞ්ගො

554. අරියො අට්ඨඞ්ගිකො මග්ගො: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

555. තත්ථ කතමා සම්මාදිට්ඨි: දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති සම්මාදිට්ඨි.

තත්ථ කතමො සම්මාසඞ්කප්පො: නෙක්ඛම්මසඞ්කප්පො අව්‍යාපාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො, අයං වුච්චති සම්මාසඞ්කප්පො.

තත්ථ කතමා සම්මාවාචා: මුසාවාදා වෙරමණී පිසුනාය වාචාය[1] වෙරමණී ඵරුසාය වාචාය[2] වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති සම්මාවාචා.

තත්ථ කතමො සම්මාකම්මන්තො: පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චති සම්මාකම්මන්තො.

තත්ථ කතමො සම්මාආජීවො: ඉධ අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති සම්මාආජීවො.

තත්ථ කතමො සම්මාවායාමො: ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චති සම්මාවායාමො.

තත්ථ කතමා සම්මාසති: ඉධ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, අයං වුච්චති සම්මාසති.

---

1. පිසුණාවාචා - සිරිමු. පිසුණාවාචාය - සීපැවි.
2. ඵරුසාවාචා - සිරිමු, ඵරුසාවාචාය - සීපැවි.



Free Distribution www.aathaapi.org

# 11. මාර්ගවිභඞ්ගය

554. ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි : හේ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක් කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි.

555. එහි සම්‍යග්දෘෂ්ටි කවරෙ යත් : දුඃඛසත්‍යයෙහි ඥාන යැ දුඃඛසමුදයසත්‍යයෙහි ඥාන යැ දුඃඛනිරොධසත්‍යයෙහි ඥාන යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදසත්‍යයෙහි ඥාන යි. මේ ' සම්‍යග්දෘෂ්ටි ' යි කියනු ලැබෙ.

එහි සම්‍යක්සංකල්ප කවරෙ යත් : නෛෂ්ක්‍රම්‍යසංකල්ප යැ අව්‍යාපාදසංකල්ප යැ අවිහිංසාසංකල්ප යි. මේ ' සම්‍යක්සංකල්ප ' යි කියනු ලැබෙ.

එහි සම්‍යග්වචනය කවරෙ යත් : මුසවායෙන් වැළකීම යැ පිසුණුබසින් වැළකීම යැ පරොස්බසින් වැළකීම යැ සිස්බසින් වැළකීම යි. මේ ' සම්‍යග්වචන ' යි කියනු ලැබෙ.

එහි සම්‍යක්කර්මාන්තය කවරෙ යත් : පණිවායෙන් වැළකීම යැ අයිනාදනින් වැළකීම යැ කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම යි. මේ ' සම්‍යක්කර්මාන්ත ' යි කියනු ලැබෙ.

එහි සම්‍යගාජීවය කවරෙ යත් : මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම මිථ්‍යාජීවය හැරපියා සම්‍යගාජීවයෙන් ජීවිකාව කෙරෙයි. මේ ' සම්‍යගාජීව ' යි කියනු ලැබෙ.

එහි සම්‍යග්ව්‍යායාමය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුසල්දහම් නූපදනා පිණිස කත්තුකම්‍යතාකුසලච්ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වැර වඩයි, සිත නඟාගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් ලාමක අකුසල්දහම් ප්‍රහාණය පිණිස කුසලච්ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වැර වඩයි, සිත නඟාගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. නූපන් කුසල්දහම් උපදනා පිණිස කුසලච්ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වැර වඩයි, සිත නඟාගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් කුසල්දහම් සිටීම පිණිස නො නැසීම පිණිස පුනපුනා වැඩීම පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණ වීම පිණිස කුසලච්ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වැර වඩයි, සිත නඟාගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. මේ ' සම්‍යග්ව්‍යායාම ' යි කියනු ලැබෙ.

එහි සම්‍යක්ස්මෘතිය කවර යත් : මෙ සස්නෙහි මහණ තෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ කාය සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස් දුරු කොට කයෙහි කය අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ වෙදනා සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට වෙදනාවන්හි වෙදනාව අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ චිත්ත සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට සිතෙහි සිත අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ (නීවරණාදි) ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට (නීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව බලමින් වෙසේ. මේ ' ස්ම්‍යක්ස්මෘති ' යි කියනු ලැබෙ.

තත්ථ කතමො සම්මාසමාධි: ඉධ භික්ඛු විවිච්චෙ'ව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං[1] අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[2] අදුක්ඛමසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති සම්මා සමාධි.

556 අරියො අට්ඨඞ්ගිකො මග්ගො: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මා සඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: ඉධ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං -පෙ- සම්මා සඞ්කප්පං භාවෙති -පෙ- සම්මාවාචං භාවෙති -පෙ- සම්මාකම්මන්තං භාවෙති -පෙ- සම්මාආජීවං භාවෙති -පෙ- සම්මාවායාමං භාවෙති -පෙ- සම්මාසතිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං.

සුත්තන්තභාජනියං.

---

557. අට්ඨඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

තත්ථ කතමො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ අට්ඨඞ්ගිකො මග්ගො හොති: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාදිට්ඨි.

තත්ථ කතමො සම්මා සඞ්කප්පො: යො තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසඞ්කප්පො.

තත්ථ කතමා සම්මාවාචා: යා චතූහි වචීදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාවාචා මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාවාචා.

1. එකොධිභාවං - සිරිමු.
2. අත්ථගමා - PTS.

එහි සම්‍යක්සමාධි කවරෙ යත් : මෙ සස්නෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන් වැ මැ අකුශලධර්මයන්ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, ප්‍රීතියගේ ද විරාග යෙන් උපෙක්ෂා ඇත්තේත් ස්මෘතිමත් වූයේත් සම්‍යග්ඥාන ඇති වැ වෙසෙයි. නාම කයින් සුඛය ද විඳියි. යම් ධ්‍යානයක් හේතුකොටගෙන උපේක්ෂා ඇත්තේ යැ ස්මෘතිමත් වූයේ යැ සුඛවිහරණ ඇත්තේ යැ යි ආර්‍ය්‍යයෝ කියත් ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස් දෙම්නසුන්ගේ නැති කිරීමෙන් නො දුක් නො සුව වූ උපෙක්ෂාව හා ස්මෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ. මේ ' සම්‍යක්සමාධි ' යි කියනු ලැබේ.

556. ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වෙයි, හෙ මෙසේ යි : සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි.

එහි සම්‍යග්දෘෂ්ටි කවරෙ යත් : මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමුණු සම්‍යග්දෘෂ්ටිය වඩයි . . . සම්‍යක්සංකල්පය වඩයි . . . සම්‍යග්වචනය වඩයි . . . සම්‍යක්කර්මාන්තය වඩයි . . . සම්‍යගාජීවය වඩයි . . . සම්‍යග්ව්‍යායාමය වඩයි . . . සම්‍යක්ස්මෘතිය වඩයි. විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමුණු සම්‍යක්සමාධිය වඩයි.

**සූත්‍රාන්තභාජනිය යි.**

---

557. අෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි යැ . . . සම්‍යක්සමාධි යි.

එහි අෂ්ටාඞ්ගිකමාර්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ තෙම යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. එසමයෙහි අෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි. සම්‍යග්දෘෂ්ටි යැ . . . සම්‍යක්සමාධි යි.

එහි සම්‍යග්දෘෂ්ටිය කවර යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් ප්‍රඥයෙක් පජානනාකාරයෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ සම්‍යග්දෘෂ්ටි යි කියනු ලැබේ.

එහි සම්‍යක්සංකල්පය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් තර්ක යෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණායෙක් බලවත් අර්පණායෙක් අරමුණෙහි සිත පිහිටුවීමෙක් සම්‍යක්සංකල්පයෙක් වේ ද, මේ ' සම්‍යක්සංකල්ප ' යි කියනු ලැබේ.

එහි සම්‍යග්වචනය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වෙන්වීමෙක් විරතියෙක් පටිවිරතියෙක් විරමණයෙක් අක්‍රියායෙක් අකරණයෙක් නො පැමිණීමෙක් සීමාඅනතික්‍රමණයෙක් ප්‍රත්‍යය නැසීමෙක් සම්‍යග්වචන යෙක් වේ ද, මේ ' සම්‍යග්වචන ' යි කියනු ලැබේ.

තත්ථ කතමො සම්මාකම්මන්තො: යා තීහි කායදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාකම්මන්තො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාකම්මන්තො.

තත්ථ කතමො සම්මාආජීවො: යා මිච්ඡාආජීවා ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාආජීවො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාආජීවො.

තත්ථ කතමො සම්මාවායාමො: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාවායාමො.

තත්ථ කතමා සම්මාසති: යා සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසති.

තත්ථ කතමො සම්මාසමාධි: යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසමාධි. අයං වුච්චති අට්ඨඞ්ගිකො මග්ගො. අවසෙසා ධම්මා අට්ඨඞ්ගිකෙන මග්ගෙන සම්පයුත්තා.

558. පඤ්චඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමො පඤ්චඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකො මග්ගො හොති: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාදිට්ඨි.

තත්ථ කතමො සම්මාසඞ්කප්පො: යො තක්කො විතක්කො -පෙ- සම්මාසඞ්කප්පො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසඞ්කප්පො

තත්ථ කතමො සම්මාවායාමො: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාවායාමො.

තත්ථ කතමා සම්මාසති: යා සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසති.

තත්ථ කතමො සම්මාසමාධි: යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසමාධි. අයං වුච්චති පඤ්චඞ්ගිකො මග්ගො. අවසෙසා ධම්මා පඤ්චඞ්ගිකෙන මග්ගෙන සම්පයුත්තා.

එහි සම්‍යගාජීවය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් මිථ්‍යාආජීව යෙන් වෙන් වීමෙක් විරතියෙක් පටිවිරතියෙක් විරමණයෙක් අක්‍රියායෙක් අකරණයෙක් නොපැමිණීමෙක් සීමාඅනතික්‍රමණයෙක් ප්‍රත්‍යය නැසීමෙක් සම්‍යගාජීවයෙක් වේ ද, මේ ' සම්‍යගාජීව ' යි කියනු ලැබේ.

එහි සම්‍යග්ව්‍යායාමය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් . . . සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යග් ව්‍යායාම ' යි කියනු ලැබේ.

එහි සම්‍යක්ස්මෘතිය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්ස්මෘතියක් සමෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යක් ස්මෘති ' යි කියනු ලැබේ.

එහි සම්‍යක්සමාධි කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් ස්ථිතියක් චිත්තයාගේ . . . සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යක් සමාධි ' යි කියනු ලැබේ. මේ ' අෂ්ටාඞ්ගමාර්ග ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ අෂ්ටාඞ්ගමාර්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

558. පඤ්චාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි ය සම්‍යක්සඞ්කල්ප ය සම්‍යග් ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක්සමාධි යී.

එහි පඤ්චාඞ්ගිකමාර්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල පංචාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි ය සම්‍යක්සංකල්ප ය සම්‍යග්ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක්සමාධි යි.

එහි සම්‍යග්දෘෂ්ටිය කවර යත් : මාර්ගාඞ්ග වූ යම්ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යග්දෘෂ්ටි ' යි කියනු ලැබේ.

එහි සම්‍යක්සංකල්පය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් තර්ක යෙක් විතර්කයෙක් . . . සම්‍යක්සංකල්පයෙක් වේ ද, මේ ' සම්‍යක්සංකල්ප ' යි කියනු ලැබේ.

එහි සම්‍යග්ව්‍යායාමය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් . . . සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යග්ව්‍යායාම ' යි කියනු ලැබේ.

එහි සම්‍යක්ස්මෘතිය කවර යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්ස්මෘතියක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යක් ස්මෘති ' යි කියනු ලැබේ.

එහි සම්‍යක්සමාධිය කවරෙ යත් : මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ චිත්තයාගේ ස්ථිතියක් . . . සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ සම්‍යක්සමාධි යි කියනු ලැබේ. මේ පඤ්චාඞ්ගිකමාර්ග යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ පඤ්චාඞ්ගික මාර්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

559. පඤ්චඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාදිට්ඨි. අවසෙසා ධම්මා සම්මාදිට්ඨියා සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාසඞ්කප්පෙන සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාවායාමෙන සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාසතියා සම්පයුත්තා.

තත්ථ කතමො සම්මාසමාධි: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසමාධි, අවසෙසා ධම්මා සම්මාසමාධිනා සම්පයුත්තා.

560. අට්ඨඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

තත්ථ කතමො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. තස්මිං සමයෙ අට්ඨඞ්ගිකො මග්ගො හොති: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති අට්ඨඞ්ගිකො මග්ගො. අවසෙසා ධම්මා අට්ඨඞ්ගිකෙන මග්ගෙන සම්පයුත්තා.

561. පඤ්චඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමො පඤ්චඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකො මග්ගො හොති: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං වුච්චති පඤ්චඞ්ගිකො මග්ගො. අවසෙසා ධම්මා පඤ්චඞ්ගිකෙන මග්ගෙන සම්පයුත්තා.

559. පඤ්චාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග් ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි යි.

එහි සම්‍යක්දෘෂ්ටිය කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගත යන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයෙක් වෙ ද, මේ සම්‍යග්දෘෂ්ටි යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ සම්‍යග්දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තයෝ යි. . . . අවශෙෂධර්මයෝ සම්‍යක් සංකල්පය හා සම්ප්‍රයුක්තයෝ යි. . . . අවශෙෂධර්මයෝ සම්‍යග්ව්‍යායාමය හා සම්ප්‍රයුක්තයෝ යි. . . . අවශෙෂධර්මයෝ සම්‍යක්ස්මෘතිය හා සම්ප්‍රයුක්තයෝ යි.

එහි සම්‍යක්සමාධිය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තර ධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ චිත්තයාගේ යම් ස්මෘතියක් . . . සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යක් සමාධි ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ සම්‍යක්සමාධිය හා සම්ප්‍රයුක්තයෝ යි.

560. අෂ්ටාංගිකමාර්ග වෙයි : සම්‍යග්දෘෂ්ටිය . . . සම්‍යක්සමාධි යි.

එහි අෂ්ටාඞ්ගිකමාර්ගය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල ස්පර්ශය වෙයි, . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ ය. එම ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන් ගෙන් වෙන් ව මැ . . . ශූන්‍යත වූ දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ විපාක ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල අෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටිය . . . සම්‍යක්සමාධි යි. ' මේ අෂ්ටාඞ්ගිකමාර්ග ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ අෂ්ටාඞ්ගිකමාර්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

561. පංචාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග් ව්‍යායාම ය, සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි යි.

එහි පංචාඞ්ගිකමාර්ගය කවරෙ යත් : මේ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ ය. එ ම ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් ව මැ . . . ශූන්‍යත වූ දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ විපාක ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල පඤ්චාඞ්ගිකමාර්ගය වෙයි. සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සංකල්ප ය සම්‍යග්ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක්සමාධි ය යි. මේ ' පඤ්චාඞ්ගිකමාර්ග ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ පඤ්චාඞ්ගිකමාර්ගය හා සම්ප්‍රයුක්තයෝ යි.

562. පඤ්චඞ්ගිකො මග්ගො: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ එසො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාදිට්ඨි. අවසෙසා ධම්මා සම්මාදිට්ඨියා සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාසඞ්කප්පෙන සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාවායාමෙන සම්පයුත්තා -පෙ- අවසෙසා ධම්මා සම්මාසතියා සම්පයුත්තා.

තත්ථ කතමො සම්මාසමාධි: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ එසො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති සම්මාසමාධි. අවසෙසා ධම්මා සම්මාසමාධිනා සම්පයුත්තා.

අභිධම්මභාජනීයං.

---

563 අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි..

564. අට්ඨන්නං මග්ගඞ්ගානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා -පෙ- කති සරණා, කති අරණා:

565. සියා කුසලා, සියා අබ්‍යාකතා.

සම්මාසඞ්කප්පො සුඛාය වෙදනාය සම්පයුත්තො. සත්ත මග්ගඞ්ගා සියා සුඛාය වෙදනාය සම්පයුත්තා, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා.

සියා විපාකා, සියා විපාකධම්මධම්මා.

අනුපාදින්නානුපාදානියා.

අසංකිලිට්ඨසංකිලෙසිකා.

Free Distribution www.aathaapi.org

562. පංචාඞ්ගිකමාර්ගය වෙයි : සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි යි.

එහි සම්‍යග්දෘෂ්ටිය කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල ස්පර්ශය වෙයි. . . .අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ ය. එ ම ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාක ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියක් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යග්දෘෂ්ටි ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ සම්‍යග්දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තයෝ යි. . . . අවශෙෂධර්මයෝ සම්‍යක්සංකල්පය හා සම්ප්‍රයුක්තයෝ යි . . . අවශෙෂධර්මයෝ සම්‍යග්ව්‍යායාමය හා සම්ප්‍රයුක්තයෝ යි . . . අවශෙෂධර්මයෝ සම්‍යක්ස්මෘතිය හා සම්ප්‍රයුක්තයෝ යි.

එහි සම්‍යක්සමාධිය කවරෙ යත් : මෙ සස්නෙහි මහණ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙ ද, එකල ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ ය. එ ම ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාකප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් චිත්තයාගේ සිටීමෙක් මොනොවට සිටීමෙක් අරමුණෙහි බැසගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළ සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ ' සම්‍යක්සමාධි ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ සම්‍යක්සමාධිය හා සම්ප්‍රයුක්තයෝ යි.

**අභිධර්මභාජනිය යි.**

---

563. ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි, ඒ මෙසේ ය : සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක් සංකල්ප ය, සම්‍යග්වචන ය, සම්‍යක්කර්මාන්ත ය, සම්‍යගාජීව ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි යි.

564. අෂ්ටමාර්ගාඞ්ගයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද, අකුශලයෝ කෙතෙක් ද, අව්‍යාකෘතයෝ කෙතෙක් ද, සරණයෝ කෙතෙක් ද, . . . අරණයෝ කෙතෙක් ද යත් :

565. (අෂ්ටමාර්ගාඞ්ගයෝ) කුශල ද වන්නාහ, අව්‍යාකෘත ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වූයේ වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, උපෙක්ෂාවේදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) විපාක ද වන්නාහ, විපාකස්වභාවධර්ම ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනුපාදින්නඅනුපාදනියයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අසංක්ලිෂ්ටසාංක්ලෙශිකයෝ ය.

සම්මාසඞ්කප්පො අවිතක්කවිචාරමත්තො. සත්ත මග්ගඞ්ගා සියා සවිතක්කසවිචාරා, සියා අවිතක්කවිචාරමත්තා, සියා අවිතක්කඅවිචාරා.

සම්මාසඞ්කප්පො පීතිසහගතො සුඛසහගතො න උපෙක්ඛාසහගතො. සත්ත මග්ගඞ්ගා සියා පීතිසහගතා, සියා සුඛසහගතා, සියා උපෙක්ඛාසහගතා.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

සියා අපචයගාමිනො, සියා නෙවාචයගාමි නාපචයගාමිනො.

සියා සෙක්ඛා, සියා අසෙක්ඛා.

අප්පමාණා.

අප්පමාණාරම්මණා.

පණීතා.

සියා සම්මත්තනියතා, සියා අනියතා.

න මග්ගාරම්මණා. සියා මග්ගහෙතුකා, සියා මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගහෙතුකාති'පි මග්ගාධිපතිනොති'පි.

සියා උප්පන්නා, සියා අනුප්පන්නා, සියා උප්පාදිනො.

සියා අතීතා, සියා අනාගතා, සියා පච්චුප්පන්නා.

න වත්තබ්බා අතීතාරම්මණාති'පි අනාගතාරම්මණාති'පි පච්චුප්පන්නා-රම්මණාති'පි.

සියා අජ්ඣත්තා, සියා බහිද්ධා, සියා අජ්ඣත්තබහිද්ධා.

බහිද්ධාරම්මණා.

අනිදස්සනාප්පටිඝා.

566. සම්මාදිට්ඨි හෙතු. සත්ත මග්ගඞ්ගා න හෙතු.

සහෙතුකා.

හෙතුසම්පයුත්තා.

සම්මාදිට්ඨි හෙතුචෙව සහෙතුකා ච. සත්ත මග්ගඞ්ගා න වත්තබ්බා හෙතුචෙව සහෙතුකාති, සහෙතුකාචෙ'ව න ච හෙතු.

සම්මාදිට්ඨි හෙතු චෙ'ව හෙතුසම්පයුත්තා ච, සත්ත මග්ගඞ්ගා න වත්තබ්බා හෙතු චෙ'ව හෙතුසම්පයුත්තා'ති, හෙතුසම්පයුත්තාචෙ'ව න ච හෙතු.

සත්ත මග්ගඞ්ගා න හෙතු සහෙතුකා. සම්මාදිට්ඨි න වත්තබ්බා න හෙතු සහෙතුකාති'පි න හෙතු අහෙතුකාති'පි.

Free Distribution www.aathaapi.org

සම්‍යක්සංකල්පය අවිතර්කවිචාරමාත්‍ර වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ සවිතර්කසවිචාර ද වන්නාහ, අවිතර්කවිචාරමාත්‍ර ද වන්නාහ, අවිතර්කඅවිචාර ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය ප්‍රීතිසහගත වෙයි, සුඛසහගත වෙයි, උපෙක්ෂාසහගත නො වේ. සප්තමාර්ගාඞගයෝ ප්‍රීතිසහගත ද වන්නාහ, සුඛසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) නො ම දර්ශනයෙන් නොද භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අපචයගාමී ද වන්නාහ, නො ම ආචයගාමී නො ද අපචයගාමී ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ශෛක්ෂ ද වන්නාහ, අශෛක්ෂ ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අප්‍රමාණයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අප්‍රමාණාලම්බනයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ප්‍රණීතයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) සම්‍යක්ත්වනියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) මාර්ගාලම්බන නො වෙති. මාර්ගහෙතුක ද වන්නාහ, මාර්ගාධිපති ද වන්නාහ, මාර්ගහෙතුකහ යි ද මාර්ගාධිපතිහ යි ද නො කියයුතු ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) උත්පන්න ද වන්නාහ, අනුත්පන්න ද වන්නාහ, උත්පාදී ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අතීත ද වන්නාහ, අනාගත ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්න ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අතීතාලම්බනහ යි ද අනාගතාලම්බනහ යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බනහ යි ද නො කියයුතු වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අධ්‍යාත්ම ද වන්නාහ, බාහිර ද වන්නාහ, අධ්‍යාත්මබාහිර ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) බාහ්‍යාලම්බනයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනිදර්ශනඅප්‍රතිඝයෝ යි.

566. සම්‍යග්දෘෂ්ටිය හේතු වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ හේතු නො වෙත්.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) සහේතුකයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) හේතුසම්ප්‍රයුක්තයෝ ය.

සම්‍යග්දෘෂ්ටිය හේතු ද වූ ම සහේතුක වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ හේතු ද වූවාහු ම සහේතුකහ යි නො කියයුත්තාහ, සහේතුක ද වූවාහු ම නො ද හෙතු වෙත්.

සම්‍යග්දෘෂ්ටිය හෙතු ද වූ ම හේතුසම්ප්‍රයුක්ත ද වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ හේතු ද වූවාහු ම හේතුසම්ප්‍රයුක්තහ යි නො කියයුත්තාහ, හේතු සම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද හෙතු වෙත්.

සප්තමාර්ගාඞ්ගයෝ හේතු නොවෙති. සහෙතුක වෙත්. සම්‍යග්දෘෂ්ටිය හෙතු නො වූ සහේතුකහ යි ද හේතු නො වූ අහේතුකහ යි ද නො කියයුතු යි.

567. සප්පච්චයා.

සඞ්ඛතා.

අනිදස්සනා.

අප්පටිඝා.

අරූපා.

ලොකුත්තරා.

කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

නො ආසවා.

අනාසවා.

ආසවවිප්පයුත්තා.

න වත්තබ්බා ආසවා චෙ'ව සාසවා'ති'පි සාසවා චෙ'ව නො ච ආසවා'ති'පි.

න වත්තබ්බා ආසවා චෙ'ව ආසවසම්පයුත්තා'ති'පි ආසවසම්පයුත්තා-චෙ'ව නො ච ආසවා'ති'පි.

ආසවවිප්පයුත්තා, අනාසවා.

568. නො සංයොජනා -පෙ- නො ගන්ථා -පෙ- නො ඔඝා -පෙ- නො යොගා -පෙ- නො නීවරණා -පෙ- නො පරාමාසා -පෙ-

569. සාරම්මණා.

නො චිත්තා.

චෙතසිකා.

චිත්තසම්පයුත්තා.

චිත්තසංසට්ඨා.

චිත්තසමුට්ඨානා.

චිත්තසහභුනො.

චිත්තානුපරිවත්තිනො.

චිත්තසංසට්ඨසමුට්ඨානා.

චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

බාහිරා.

නො උපාදා.

අනුපාදින්නා.

567. (අෂ්ටමාර්ගාඞ්ගයෝ) සප්‍රත්‍යයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) සඞ්ඛතයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනිදර්ශනයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අප්‍රතිඝයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අරූපයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ලොකොත්තරයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) කිසි විඥානයකින් දතයුත්තාහ, කිසි විඥානයකින් නො දත යුත්තාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ආස්‍රවයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනාස්‍රවයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ආස්‍රවවිප්‍රයුක්තයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ආස්‍රව ද වූ ම සාස්‍රවහ යි ද සාස්‍රව ද වූ ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ආස්‍රව ද වූ ම ආස්‍රවසම්ප්‍රයුක්තහ යි ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ආස්‍රවවිප්‍රයුක්ත අනාස්‍රවයෝ යි.

568. (අෂ්ටමාර්ගාඞ්ගයෝ) සංයෝජනයෝ නො වෙති . . . ග්‍රන්ථයෝ නො වෙති . . . ඔඝයෝ නො වෙති . . . යොගයෝ නො වෙති . . . නීවරණයෝ නො වෙති . . . පරාමර්ශයෝ නො වෙත්. . . .

569. (අෂ්ටමාර්ගාඞ්ගයෝ) සාලම්බනයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චෛතසිකයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසම්ප්‍රයුක්තයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසමුත්ථානයෝ ය.

(අෂ්ටමාර්ගඞ්ගයෝ) චිත්තසහභූහ.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තානුපරිවර්තීහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූහු වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහු වෙත්.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) බාහිරයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) උපාද නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනුපාදින්නයෝ යි.

570. නො උපාදානා -පෙ- නො කිලෙසා -පෙ- න දස්සනෙන පහාතබ්බා.

න භාවනාය පහාතබ්බා

න දස්සනෙන පහාතබ්බහෙතුකා.

න භාවනාය පහාතබ්බහෙතුකා.

සම්මාසඞ්කප්පො අවිතක්කො. සත්ත මග්ගඞ්ගා සියා සවිතක්කා, සියා අවිතක්කා.

සම්මාසඞ්කප්පො සවිචාරො. සත්ත මග්ගඞ්ගා සියා සවිචාරා, සියා අවිචාරා.

සම්මාසඞ්කප්පො සප්පීතිකො. සත්ත මග්ගඞ්ගා සියා සප්පීතිකා, සියා අප්පීතිකා.

සම්මාසඞ්කප්පො පීතිසහගතො. සත්ත මග්ගඞ්ගා සියා පීතිසහගතා, සියා න පීතිසහගතා.

සම්මාසඞ්කප්පො සුඛසහගතො. සත්ත මග්ගඞ්ගා සියා සුඛසහගතා, සියා න සුඛසහගතා.

සම්මාසඞ්කප්පො න උපෙක්ඛාසහගතො. සත්ත මග්ගඞ්ගා සියා උපෙක්ඛාසහගතා, සියා න උපෙක්ඛාසහගතා.

න කාමාවචරා.

න රූපාවචරා.

න අරූපාවචරා.

අපරියාපන්නා.

සියා නිය්‍යානිකා, සියා අනිය්‍යානිකා.

සියා නියතා, සියා අනියතා.

අනුත්තරා.

අරණාති.

පඤ්හාපුච්ඡකං.

මග්ගවිභඞ්ගො නිට්ඨිතො.

570. (අෂ්ටමාර්ගාඞ්ගයෝ) උපාදානයෝ නො වෙති. . . .

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) ක්ලේශයෝ නො වෙති. . . .

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යහේතු ඇත්තාහු නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු නො වෙත්.

සම්‍යක්සංකල්පය අවිතර්ක ය. සප්තමාර්ගාඞ්ගයෝ සවිතර්ක ද වන්නාහ, අවිතර්ක ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය සවිචාර ය. සප්තමාර්ගාඞ්ගයෝ සවිචාර ද වන්නාහ, අවිචාර ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය සප්‍රීතික ය. සප්තමාර්ගාඞ්ගයෝ සප්‍රීතික ද වන්නාහ, අප්‍රීතික ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය ප්‍රීතිසහගත ය. සප්තමාර්ගාඞ්ගයෝ ප්‍රීතිසහගත ද වන්නාහ නො ද ප්‍රීතිසහගත ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය සුඛසහගත ය. සප්තමාර්ගාඞ්ගයෝ සුඛසහගත ද වන්නාහ, සුඛ සහගත නො ද වන්නාහු ය.

සම්‍යක්සංකල්පය උපෙක්ෂාසහගත නො වෙයි. සප්තමාර්ගාඞ්ගයෝ උපෙක්ෂා සහගත ද වන්නාහ, නො ද උපෙක්ෂාසහගත ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) කාමාවචරයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) රූපාවචරයෝ නො වෙති.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අරූපාවචරයෝ නො වෙත්.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අපයඞාපන්නයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) නෛයඞාණික ද වන්නාහ, අනෛයඞාණික ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) නියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අනුත්තරයෝ ය.

(අෂ්ටමාර්ගාඞ්ගයෝ) අරණයෝ යි.

**පඤ්හපුච්ඡක යි.**

**මාර්ගවිභඞ්ග නිමි.**

---



Free Distribution www.aathaapi.org

# 12. ඣානවිභඞ්ගො

571. ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ පුබ්බරත්තා'පරරත්තං ජාගරියානුයොගමනුයුත්තො සාතච්චං නෙපක්කං බොධිපක්ඛියානං[1] ධම්මානං භාවනානුයොගමනුයුත්තො. සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ[2] සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. සො විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං අප්පසද්දං අප්පනිග්ඝොසං විජනවාතං මනුස්සරාහසෙය්‍යකං පටිසල්ලානසාරුප්පං. සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී, ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති. ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති. සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙ'ව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා[2] පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

මාතිකා.

---

1. බොධිපක්ඛිකානං - සිරිමු, මජසං, සතා. බොධපක්ඛිකානං-සීපැවි.
2. ඛාදිතෙ-සීපැවි. 1. තතියජ්ඣානං-සිරිමු. 2. සමතික්කමාය-සීපැවි.



Free Distribution www.aathaapi.org

# 12. ඣානවිභඞ්ගය

571. මෙ සස්නෙහි මහණ ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්ත වූයේ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාස කෙරෙයි. ස්වල්පමාත්‍ර වූ වරදෙහි භය දක්නාසුලු වූයේ ශික්ෂාපදයන්හි සමාදන් ව හික්මෙයි. ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇති ව භොජනයෙහි මාත්‍රඥ ව පූර්වරාත්‍ර-අපරරාත්‍රයෙහි ජාගර්‍ය්‍යානුයොගයෙහි යෙදුණේ වීර්‍ය්‍යයෙන් හා ප්‍රඥ-යෙන් යුක්ත ව බෝධිපාක්ෂිකධර්මයන් වැඩීමෙහි යෙදුණේ වෙසෙයි. හෙතෙම ඉදිරියට යෑමෙහි හා නැවැත්මෙහි සම්‍යග්ඥනයෙන් යුක්ත ව කරන්නේ වෙයි. ඉදිරිබැල්මෙහි හා විදිසාවන් බැල්මෙහි ද, අවයව හැකිලීමෙහි හා දිගුකිරීමෙහි ද, සඟළ පාසිවුරු දැරීමෙහි ද, භොජනයෙහි පානයෙහි කෑමෙහි රසවිඳීමෙහි ද, මලමූත්‍රකිරීමෙහි ද, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි තුෂ්ණීම්භාවයෙහි ද සම්‍යග්ඥනයෙන් යුක්ත ව කරන්නේ වෙයි. හෙතෙම අරණ්‍ය ය, වෘක්ෂමූල ය, පර්වත ය, කඳුරැලි ය, ගිරිගුහා ය, සොහොන ය, වනපත්ථ ය, අභ්‍යවකාශ ය, පිදුරුබිස්ස ය, යන ශබ්ද රහිත නිර්ඝෝෂ රහිත වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යකරණයට ස්ථාන වූ විවෙකයට අනුරූප වූ විවේකසෙනසුනක් භජනය කෙරෙයි. හෙතෙම අරණ්‍යසෙනාසනයට ගියේ හෝ වෘක්ෂමූලසෙනාසනයට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ පලක් බැඳ කය සෘජුව තබා සිහිය කර්මස්ථානයට අභිමුඛකොට එළවා හිඳියි. හෙතෙම ස්කන්ධලෝකයෙහි අභිධ්‍යාව හැර පියා පහ වූ අභිධ්‍යා ඇති සිතින් යුක්ත ව වෙසෙයි, අභිධ්‍යායෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදොෂය දුරුකොට ව්‍යාපාද රහිත සිත් ඇති ව සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පී ව වෙසෙයි, ව්‍යාපාදප්‍රදෙෂයෙන් සිත පිරිසිදු කෙරෙයි. ථීනමිද්ධය හැර පියා පහව ගිය ථීනමිද්ධ ඇති ව ආලොක සංඥ ඇතිව සිහි ඇති ව සම්‍යග්ඥන ඇති ව වෙසෙයි, ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය හැරපියා උඩඟු නො වූයේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති ව වෙසෙයි, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව හැර පියා තරණයකළ විචිකිත්සා ඇති ව කුශලධර්මයන්හි සැක රහිත ව වෙසෙයි, විචිකිත්සායෙන් සිත පිරිසිදු කෙරෙයි. හෙතෙම චිත්තයට උපක්ලෙශ වූ ප්‍රඥව දුර්වල කරන මේ පඤ්ච නීවරණයන් හැරපියා කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. විතර්කවිචාරයන් සංහිඳීමෙන් අධ්‍යාත්ම යෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. ප්‍රීතියගේ ද ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ ද සිහි ඇත්තේ ද සම්‍යග්ඥන ඇති ව නාමකයින් සුඛය ද විඳියි, යම් ධ්‍යානයක් හෙතුකොටගෙන (බුද්ධාදි) ආර්‍ය්‍යයෝ ඒ ධ්‍යානසමඞ්ගීපුද්ගලයා 'උපෙක්ෂා ඇත්තේ ය ස්මෘති ඇත්තේ ය සුඛවිහරණ ඇත්තේ' යි කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. (කායික) සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු වැ සොම්නස් දෙම්නසුන්ගේ ප්‍රහාණයෙන් දුක් නො වූ සුඛ නො වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. සර්වප්‍රකාරයෙන් රූප සංඥවන් ඉක්මවාලීමෙන් ප්‍රතිඝසංඥවන් දුරලීමෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාසය අනන්ත' යි භාවනාකොට ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤණය අනන්තය යි භාවනා කොට විඤ්ඤණඤ්චායතනයට පැමිණ වෙසෙයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤණා-ඤ්චායතනය ඉක්මවා 'නත්ථි කිඤ්චි' යි භාවනා කොට ආකිඤ්චඤ්ඤයතනයට පැමිණ වෙසෙයි, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤයතනය ඉක්මවා නෙවසඤ්ඤනා-සඤ්ඤයතනයට පැමිණ වෙසේයි.

මාතෘකා යි.



Free Distribution www.aathaapi.org

572. ‘ඉධා’ති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ. තෙන වුච්චති ඉධාති.

573. ‘භික්ඛූ’ති සමඤ්ඤාය භික්ඛු, පටිඤ්ඤාය භික්ඛු, භික්ඛතී’ති භික්ඛු, භික්ඛකො’ති භික්ඛු, භික්ඛාචරියං අජ්ඣුපගතො’ති භික්ඛු, භින්නපටධරො’ති භික්ඛු, භින්දති පාපකෙ අකුසලෙ ධම්මෙ’ති භික්ඛු, භින්නත්තා පාපකානං අකුසලානං ධම්මානං භික්ඛු, ඔධිසො කිලෙසානං පහානා භික්ඛු, අනොධිසො කිලෙසානං පහානා භික්ඛු, සෙක්ඛො භික්ඛු, අසෙක්ඛො භික්ඛු, නෙවසෙක්ඛො නාසෙක්ඛො භික්ඛු, අග්ගො භික්ඛු භද්‍රො භික්ඛු, මණ්ඩො භික්ඛු, සාරො භික්ඛු, සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො[1] භික්ඛු.

574. ‘පාතිමොක්ඛ’න්ති සීලං පතිට්ඨා ආදි චරණං සඤ්ඤමො සංවරො මුඛං පමුඛං[2] කුසලානං ධම්මානං සමාපත්තියා. සංවරො’ති කායිකො අවීතික්කමො, වාචසිකො අවීතික්කමො, කායිකවාචසිකො අවීතික්කමො. සංවුතො’ති ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො[3] උපපන්නො සමුපපන්නො[4] සමන්නාගතො. තෙන වුච්චති පාතිමොක්ඛසංවරසංවුතොති.

575. ‘විහරතී’ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති විහරතී’ති.

576. ‘ආචාර ගොචර සම්පන්නො’ති අත්ථි ආචාරො, අත්ථි අනාචාරො. තත්ථ කතමො අනාචාරො: කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො, කායිකවාචසිකො වීතික්කමො, අයං වුච්චති අනාචාරො. සබ්බම්පි දුස්සීල්‍යං අනාචාරො: ඉධෙකච්චො වෙළුදානෙන වා පත්තදානෙන වා පුප්ඵදානෙන වා ඵලදානෙන වා සිනානදානෙන වා දන්තකට්ඨදානෙන වා චාටුකම්‍යතාය වා මුග්ගසූප්පතාය වා පාරිභට්ටතාය වා ජඞ්ඝපෙසනියෙන වා, අඤ්ඤතරඤ්ඤතරෙන වා බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති අනාචාරො. තත්ථ කතමො ආචාරො: කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො, අයං වුච්චති ආචාරො, සබ්බොපි සීලසංවරො ආචාරො. ඉධෙකච්චො, න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න දන්තකට්ඨදානෙන න චාටුකම්‍යතාය න මුග්ගසූප්පතාය න පාරිභට්ටතාය න ජඞ්ඝපෙසනියෙන[5] න අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති ආචාරො.

---

1. උපසම්පන්නොති – සීපැවි, ස්‍යා  2. මොක්ඛං, පාමොක්ඛං – සිරිමු, මජසං.  3. උපාගතො සමුපාගතො – සිරිමු, මජසං.
4 උප්පන්නො සමුප්පන්නො – සිරිමු, මජසං.
5. ජඞ්ඝපෙසනිකෙන – සිරිමු, මජසං.

572. ' ඉධ ' යනු : මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයයෙහි මේ ධර්මවිනයයෙහි මේ ප්‍රවචනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මේ ශාස්තෘශාසනයෙහි, එයින් කියනු ලැබෙයි ' ඉධ ' යි.

573. ' භික්ඛු ' යනු : ව්‍යවහාරයෙන් භික්ෂු ය, ප්‍රතිඥයෙන් භික්ෂු ය, භික්ෂාටනය කෙරේනු යි භික්ෂු ය, භික්ෂාටනය කරනුයේ නු යි භික්ෂු ය, භික්ෂාචර්‍ය්‍යාවට පැමිණියේ නු යි භික්ෂු ය, භින්න වූ වස්ත්‍ර දරනුයේ නු යි භික්ෂු ය, ලාමක අකුශලධර්මයන් බිඳී නු යි භික්ෂු ය, ලාමක අකුශලධර්මයන් බිඳහළ හෙයින් භික්ෂු ය, අවධි වශයෙන් ක්ලෙශයන් ගේ ප්‍රහාණයෙන් භික්ෂු ය, අනවධි (සීමාරහිත) වශයෙන් ක්ලෙශයන් ගේ ප්‍රහාණයෙන් භික්ෂු ය, ශෛක්ෂ භික්ෂු ය, අශෛක්ෂ භික්ෂු ය, නො ම ශෛක්ෂ වූ අශෛක්ෂ ද නො වූ භික්ෂු ය, (සිලසමාධිප්‍රඥවිමුක්තියෙන්) අග්‍රවූයේ භික්ෂු ය, භද්‍ර භික්ෂු ය, මණ්ඩ (ප්‍රසන්න) භික්ෂු ය, සාරභික්ෂු ය, සමගසඞ්ඝයා විසින් අකොප්‍ය වූ ස්ථානාර්හ වූ ඤත්තිචතුත්ථ කර්මයෙන් උපසම්පන්න වූයේ භික්ෂු යි.

574. ' පාතිමොක්ඛ ' යනු : ශීල ය කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා ය, ආදි ය, චරණ (පාද) ය, සංයම ය, සංවර ය, ද්වාර ය, ප්‍රමුඛ යි. ' සංවර ' යනු : කායිකඅව්‍යතික්‍රම ය, වාචසිකඅව්‍යතික්‍රම ය, කායිකවාචසිකඅව්‍යතික්‍රම යි. ' සංවුත ' යනු : මේ පාතිමොක්ඛසංවරයෙන් උපෙත, සමුපෙත, උපගත, සමුපගත, උපපන්න, සමුපපන්න සමන්නාගත වූයේ වෙයි. එහෙයින් කියනු ලැබෙයි ' පාතිමොක්ඛසංවරසංවුතො ' යි.

575. ' විහරති ' යනු : ඉරියවු පවත්වයි, වැටෙයි, පාලනය කෙරෙයි, යැපෙයි, යපනය කෙරෙයි, හැසිරෙයි, වාසය කෙරේ. එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

576. ' ආචාරගොචරසම්පන්න ' යනු : ආචාරයෙක් ඇත, අනාචාරයෙක් ඇති. එහි අනාචාරය කවරෙ යත් : කායිකව්‍යතික්‍රම ය, වාචසිකව්‍යතික්‍රම ය, කායිකවාචසිකව්‍යතික්‍රම යි. මේ ' අනාචාර ' යි කියනු ලැබෙ. හැම දුශ්ශිල්‍යය අනාචාර යි. මෙ සස්නෙහි කිසිවෙක් හුණුදඬු දීමෙන් හෝ පත්‍රදනයෙන් හෝ පුෂ්පදනයෙන් හෝ ඵලදනයෙන් හෝ නහනු දීමෙන් හෝ දැහැටිදඬු දීමෙන් හෝ චාටුබස් කීමෙන් හෝ මුද්ගසූපය වැනි බොරු මුසු කථායෙන් හෝ (දරුවන් නැලවීම් ආදි) පාරිභට්ටතායෙන් හෝ (ගෙන් ගෙට) හසුන්පත් ගෙන යැමෙන් හෝ බුදුන් විසින් පිළිකුල් කරන ලද එක්තරාමිථ්‍යාජීවයෙකින් ජීවිකාව කෙරෙයි. මේ ' අනාචාර ' යි කියනු ලැබෙ. එහි ආචාර කවරෙ යත් : කායික අව්‍යතික්‍රම ය, වාචසික අව්‍යතික්‍රම ය, කායිකවාචසික අව්‍යතික්‍රම යි. මෙ ' ආචාර ' යි කියනු ලැබෙ. හැම ශිලසංවරය ' ආචාර ' යි. මෙ සස්නෙහි කිසිවෙක් හුණුදඬු දීමෙන්, පත්‍රදනයෙන්, පුෂ්පදනයෙන්, ඵලදනයෙන්, නහනු දීමෙන්, දැහැටිදඬු දීමෙන්, චාටුකම්‍යතායෙන්, මුද්ගසූප්‍යතායෙන්, පාරිභට්ටතායෙන්, ජඞ්ඝපෙසනියයෙන් යන බුදුන් විසින් පිළිකුල් කරන ලද අන්‍යතරාන්‍යතර මිථ්‍යාජීවයෙකින් ජීවිකාව නො කෙරේ. මේ ' ආචාර ' යි කියනු ලැබෙ.

‘ගොචරෙ’ති අත්ථි ගොචරො, අත්ථි අගොචරො. තත්ථ කතමො අගොචරො: ඉධෙකච්චො වෙසියගොචරො වා හොති. විධවාගොචරො වා, ථුල්ලකුමාරිගොචරො වා, පණ්ඩකගොචරො වා, භික්ඛුනීගොචරො වා, පානාගාරගොචරො වා, සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන. යානි වා පන තානි කුලානි අස්සද්ධානි අප්පසන්නානි අනොපානභූතානි අක්කොසක පරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති, අයං වුච්චති අගොචරො.

තත්ථ කතමො ගොචරො: ඉධෙකච්චො න වෙසියගොචරො හොති. න විධවාගොචරො න ථුල්ලකුමාරිගොචරො න පණ්ඩකගොචරො න භික්ඛුනීගොචරො න පානාගාරගොචරො, අසංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන. යානි වා පන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපානභූතානි කාසාවපජ්ජොතානි ඉසිවාතපටිවාතානි අත්ථකාමානි හිතකාමානි ඵාසුකකාමානි යොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. තථා රූපානි කුලානි සෙවති භජති පයිරුපාසති, අයං වුච්චති ගොචරො. ඉති ඉමිනා ච ආචාරෙන ඉමිනා ච ගොචරෙන උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති ආචාරගොචරසම්පන්නොති.

577. ‘අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී’ති තත්ථ කතමෙ අණුමත්තා වජ්ජා: යානි තානි වජ්ජානි අප්පමත්තකානි ඔරමත්තකානි ලහුසානි[1] ලහුසම්මතානි[2] සංයමකරණීයානි සංවරකරණීයානි චිත්තුප්පාදකරණීයානි මනසිකාරපටිබද්ධානි, ඉමෙ වුච්චන්ති අණුමත්තා වජ්ජා. ඉති ඉමෙසු අනුමත්තෙසු වජ්ජෙසු වජ්ජදස්සාවී ච හොති භයදස්සාවී ච ආදීනවදස්සාවී ච නිස්සරණදස්සාවී ච. තෙන වුච්චති අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවීති.

578. ‘සමාදාය සික්ඛති සික්ඛාපදෙසූ’ති තත්ථ කතමා සික්ඛා: චතස්සො සික්ඛා: භික්ඛූනං භික්ඛුසික්ඛා, භික්ඛුනීනං භික්ඛුනීසික්ඛා, උපාසකානං උපාසකසික්ඛා, උපාසිකානං උපාසිකාසික්ඛා. ඉමා වුච්චන්ති සික්ඛායො. ඉති ඉමාසු සික්ඛාසු සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං සමාදාය වත්තති. තෙන වුච්චති සමාදාය සික්ඛති සික්ඛාපදෙසූති.

1. ලහුකානි - සිරිමු. 2. ලහුකසම්මතානි - සිරිමු.

'ගෝචර' යනු : ගෝචරයෙක් ඇත, අගෝචරයෙක් ඇති. එහි අගෝචර කවරෙ යත් : මෙ සස්නෙහි කිසිවෙක් වෙශ්‍යාවන් ගෝචර කොට ඇත්තේ හෝ වැන්දඹුවන් ගෝචර කොට ඇත්තේ හෝ මැහැලි කුමාරිකාවන් ගෝචර කොට ඇත්තේ හෝ පණ්ඩකයන් ගෝචර කොට ඇත්තේ හෝ භික්ෂුණීන් ගෝචර කොට ඇත්තේ හෝ අවන්හල් ගෝචර කොට ඇත්තේ හෝ වේ ද, රජුන් හා රජමහඇමැතියන් හා තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවක යන් හා අනනුලොමික වූ සංසර්ගයෙන් සංසෘෂ්ට ව වෙසේ ද, යලි යම් ඒ කුලකෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදෑහිලි නැත්තාහු ද අප්‍රසන්න වූවාහු ද ඔපානයක් (සතරමංසැල කැණිළිදක්) වැනි නො වූවාහු ද මහණ–මෙහෙණ–උවසු–උවැසියනට ආක්‍රොශපරිභව කරන්නාහු අවැඩ කැමැත්තාහු අහිත කැමැත්තාහු නො සුව කැමැත්තාහු උපද්‍රව කැමැත් තාහු වෙත් ද, එබඳු කුලයන් සෙවනභජනපර්යුපාසන කෙරේ ද, මේ 'අගෝචර' යි කියනු ලැබේ.

එහි 'ගෝචර' කවරෙ යත් : මෙහි එකෙක් වෙශ්‍යාවන් ගෝචර (යායුතුතැන්) කොට නැත්තේ වේ ද, වැන්දඹුවන් ගෝචර කොට නැත්තේ මැහැලි කුමාරිකාවන් ගෝචර කොට නැත්තේ පණ්ඩකයන් ගෝචර කොට නැත්තේ භික්ෂුණීන් ගෝචර කොට නැත්තේ සුරාගාරයන් ගෝචර කොට නැත්තේ වේ ද, රජුන් හා රජමහඇමැතියන් හා තිර්ථිකයන් හා තීර්ථිකශ්‍රාවකයන් හා අනනුලොමික වූ සංසර්ගයෙන් අසංසෘෂ්ට ව වෙසේ ද, යලි යම් ඒ කුල කෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදෑහිලි ඇත්තාහු ප්‍රසන්න වූවාහු ඔපානයක් වැනි වූවාහු (මහණමෙහෙණන් හන් පෙරැවී) කහවත්හි ප්‍රභායෙන් එකාලොක වෙත් ද (ගෙට වදනා නික්මෙන මහණ මෙහෙණ සඞ්ඛ්‍යාත) සෘෂීන්ගේ චීවරවාතයෙන් පරිවාත වෙද්ද භික්ෂුණීඋපාසකඋපාසිකාවනට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු නිර්භය කැමැත්තාහු වෙද්ද, එබඳු කුලයන් සේවනභජනපර්යුපාසන කෙරේ ද, මේ 'ගෝචර' යි කියනු ලැබේ. මෙසේ මේ ආචාරයෙන් ද මේ ගෝචරයෙන් ද උපෙත වූයේ . . . සමන්වාගත වේ. එහෙයින් කියනු ලැබෙයි 'ආචාරගොචරසම්පන්නො' යි.

577. 'අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී' යනු : එහි අණුමාත්‍රවද්‍යයෝ කවරහ යත්: යම් ඒ වද්‍ය කෙනෙක් අල්පමාත්‍ර වූවාහු ද, ස්වල්පමාත්‍ර වූවාහු ද, ලඝු වූවාහු ද, ලඝු යයි සම්මත වූවාහු ද, සංයම කළ යුතු වූවාහු ද, සංවර කළයුතු වූවාහු ද, චිත්තොත්පාද මාත්‍රයෙන් පිළියම් කළයුතු වූවාහු ද, ආවර්ජිතමාත්‍රයෙන් පිළියම් කළයුතු වූවාහු ද මොහු අණුමාත්‍ර වද්‍යයෝ යි කියනු ලැබෙත්. මෙසේ මේ අණුමාත්‍රවද්‍යයන්හි වරද වශයෙන් දක්නාසුලු වූයේත් භය වශයෙන් දක්නාසුලු වූයේත් ආදීනව වශයෙන් දක්නාසුලු වූයේත් නිස්සරණය දක්නාසුලු වූයේත් වේ. එහෙයින් කියනු ලැබෙයි 'අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී' යි.

578. 'සමාදය සික්ඛති සික්ඛාපදෙසු' යනු : එහි ශික්ෂා කවර යත් : ශික්ෂා සතරෙකි : භික්ෂූන්ට භික්ෂුශික්ෂා ය, භික්ෂුණීන්ට භික්ෂුණීශික්ෂා ය, උපාසකයන්ට උපාසක ශික්ෂා ය, උපාසිකාවන්ට උපාසිකාශික්ෂා යි. මොහු 'ශික්ෂා' යි කියනු ලැබෙත්. මෙසේ මේ ශික්ෂාවන්හි සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිරවශෙෂ කොට සමාදන් ව පවතියි. එහෙයින් කියනු ලැබෙයි 'සමාදය සික්ඛති සික්ඛාපදෙසු' යි.

579. 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො'ති අත්ථි ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, අත්ථි අගුත්තද්වාරතා. තත්ථ කතමා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා: ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං අගුත්ති අගොපනා අනාරක්ඛා[1] අසංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා. තත්ථ කතමා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා: ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති. නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං සංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං ගුත්ති ගොපනා ආරක්ඛා[1] සංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා. ඉමාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය උපෙතො හොති සමුපෙතො -පෙ- සමන්නාගතො. තෙන වුච්චති ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරොති.

580. 'භොජනෙ මත්තඤ්ඤූ'ති අත්ථි භොජනෙ මත්තඤ්ඤුතා, අත්ථි අමත්තඤ්ඤුතා. තත්ථ කතමා භොජනෙ අමත්තඤ්ඤුතා: ඉධෙකච්චො අප්පටිසඞ්ඛා අයොනිසො ආහාරං ආහාරෙති දවාය මදාය මණ්ඩනාය විභූසනාය[1] යා තත්ථ අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා අප්පටිසංඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ අමත්තඤ්ඤුතා. තත්ථ කතමා භොජනෙ මත්තඤ්ඤුතා: ඉධෙකච්චො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. යා තත්ථ සන්තුට්ඨිතා මත්තඤ්ඤුතා පටිසඞ්ඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ මත්තඤ්ඤුතා. ඉමාය භොජනෙ මත්තඤ්ඤුතාය උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති භොජනෙ මත්තඤ්ඤූති.

1. අනාරක්ඛො - මජසං.

Free Distribution www.aathaapi.org

579. 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො' යනු : ඉන්ද්‍රියයන්හි ගුත්තද්වාරතායෙක් ඇත, අගුත්තද්වාරතායෙක් ඇති. එහි ඉන්ද්‍රියයන්හි අගුත්තද්වාරතා කවර යත් : මෙ සස්නෙහි කිසිවෙක් චක්ෂුර්විඥනයෙන් රූපයක් දැක (ක්ලෙශවස්තු වූ) නිමිති ගන්නේ වෙයි, (හස්තපාදදි) ආකාර විසින් ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත ව වසන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි, චක්ෂුරින්ද්‍රිය නො රකී. චක්ෂුරින්ද්‍රිය යෙහි සංවරයට නො පැමිණෙයි. ශ්‍රොත්‍රයෙන් ශබ්දයක් අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට . . . ජිහ්වායෙන් රසයක් විඳ . . . කයින් පහසක් පැහැස . . . මනසින් දහමක් දැන නිමිති ගන්නේ වෙයි, ආකාර විසින් ගන්නේ වෙයි, යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත ව වසන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි, මනින්ද්‍රිය නො රකියි, මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. මේ ෂඩින්ද්‍රියයන්ගේ යම් අගුප්තියෙක් අගොපනයෙක් අනාරක්ෂායෙක් අසංවරයෙක් වේ ද, මේ 'ඉන්ද්‍රියයන්හි අගුත්ත ද්වාරතා' යි කියනු ලැබේ. එහි ඉන්ද්‍රියයන්හි ගුත්තද්වාරතා කවර යත් : මෙ සස්නෙහි කිසිවෙක් ඇසින් රූපයක් දැක (ක්ලෙශවස්තු වූ) නිමිති නො ගන්නේ වෙයි, ආකාර විසින් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත ව වාසය කරන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ෂු රින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි, චක්ෂුරින්ද්‍රිය රකී, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ශ්‍රොත්‍රයෙන් ශබ්දයක් අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට . . . දිවින් රසයක් විඳ . . . කයින් පහසක් පැහැස . . . මනසින් ධර්මයක් දැන නිමිති නො ගන්නේ වෙයි, ආකාර විසින් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත ව වසන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි, මනින්ද්‍රිය රකියි, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මේ ෂඩින්ද්‍රියයන්ගේ යම් ගුප්තියෙක් ගෝපන යෙක් ආරක්ෂායෙක් සංවරයෙක් වේ ද මේ 'ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා' යි කියනු ලැබේ. මේ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතායෙන් උපේත වූයේ සමුපේත වූයේ සමන්වාගත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො' යි.

580. 'භොජනෙ මත්තඤ්ඤු' යනු : භෝජනයෙහි මාත්‍රඥතායෙක් ඇත, භෝජන යෙහි අමාත්‍රඥතායෙක් ඇති. එහි භෝජනයෙහි අමාත්‍රඥතා කවර යත් : මෙ සස්නෙහි කිසිවෙක් ප්‍රත්‍යවෙක්ෂා නො කොට නුනුවණින් කෙළි පිණිස මද පිණිස අලඞ්කාර පිණිස සැරහුම් පිණිස ආහාර ගනී. ඒ භොජනයෙහි යම් අසන්තුෂ්ට බවෙක් අමාත්‍රඥ බවෙක් ප්‍රත්‍යවෙක්ෂා රහිත බවෙක් වේ ද, මේ 'භෝජනයෙහි අමාත්‍රඥතා' යි කියනු ලැබේ. එහි භෝජනයෙහි මාත්‍රඥතා කවර යත් : මෙ සස්නෙහි කිසිවෙක් ප්‍රත්‍යවෙක්ෂා කොට නුවණින් අහර වළඳයි : කෙළි පිණිස නො ම වළඳයි, මද පිණිස අලඞකාර පිණිස සැරසුම් පිණිස නො ම වළඳයි, යම්තාක් මේ කය පැවැත්ම පිණිස යැපීම පිණිස බඩගිනි වෙදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳයි. මෙසේ පැරණි බඩගිනි වෙදනා නසමි, අළුත් වෙදනාත් නුපදවමි, මා ගේ යැපීම ද වන්නේ ය, අනවද්‍යභාවය ද සැපවිහරණය ද වන්නේ යි. ඒ භෝජනයෙහි යම් සන්තුෂ්ට බවෙක් මාත්‍රඥ බවෙක් ප්‍රත්‍යවෙක්ෂා යෙක් වේ ද, මේ 'භොජනයෙහි මාත්‍රඥතා' යි කියනු ලැබේ. මේ භෝජනයෙහි මාත්‍රඥතායෙන් යුක්ත වූයේ . . . සමන්වාගත වූයේ වේ.

581. කථඤ්ච භික්ඛු පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගමනුයුත්තො හොති: ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා මජ්ඣිමං යාමං[1] දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො වුට්ඨානසඤ්ඤං මනසි කරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං භික්ඛු පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගමනුයුත්තො.

582. ‘සාතච්ච’න්ති යො චෙතසිකො විරියාරම්භො-පෙ-සම්මාවායාමො

583 ‘නෙපක්ක’න්ති යා පඤ්ඤා පජානනා-පෙ-අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි.

584. බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො’ති: තත්ථ කතමෙ බොධිපක්ඛියා ධම්මා: සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ වුච්චන්ති බොධිපක්ඛියා ධම්මා. ඉති ඉමෙ[2] බොධිපක්ඛියෙ ධම්මෙ ආසෙවති භාවෙති බහුලීකරොති. තෙන වුච්චති බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො’ති.

585. කථඤ්ච භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති: ඉධ භික්ඛු සතො සම්පජානො අභික්කමති, සතො සම්පජානො පටික්කමති, සතො සම්පජානො ආලොකෙති, සතො සම්පජානො විලොකෙති, සතො සම්පජානො සම්මිඤ්ජෙති[3] සතො සම්පජානො පසාරෙති, සතො සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ, සතො සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ, සතො සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ, සතො සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ.

‘සතො’ති[4] තත්ථ කතමා සති: යා සති අනුස්සති-පෙ-සම්මාසති, අයං වුච්චති සති.

---

1. මජ්ඣිමයාමං – මජසං.
2. ඉති තෙ – සිරිමු, මජසං.
3. සමිඤ්ජෙති – මජසං.
4. සතො සම්පජානකාරී හොතීති – සිරිමු, මජසං.

Free Distribution www.aathaapi.org

581. කිසෙයින් මහණ පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි ජාගය්‍ය්‍යානුයොගයෙහි යෙදුණේ වේ ද යත් : මෙ සස්නෙහි මහණ දහවල්හි සක්මනින් ද හිඳීමෙන් ද නීවරණධර්මයන් ගෙන් සිත පිරිසිදු කෙරෙයි. රාත්‍රියෙහි පෙරයම සක්මනින් ද හිඳීමෙන් ද ආවරණීයධර්ම යන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. ඊ මැදියම දකුණුපයෙහි වම්පය මදක් ඇද තබා සිහිනුවණ ඇතියේ උත්ථානසංඥව මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කෙරෙයි. ඊ අලුයම නැඟීසිට චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යායෙන් ආවරණීයධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. මෙසේ මහණ ' පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි ජාගය්‍ය්‍යානුයොගයෙහි යෙදුණේ ' වේ.

582. ' සාතච්චං ' යනු : යම් චෛතසික වූ වීය්‍ය්‍යාරම්භයෙක් . . . සම්‍යග්ව්‍යායාම යෙක් වේ ද එය යි.

583. ' නෙපක්කං ' යනු : යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්ම විචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි.

584. ' බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො ' යනු : එහි බෝධි පාක්ෂිකධර්මයෝ කවරහ යත් : සප්තබොධ්‍යඞ්ගයෝ ය : ස්මෘතිසම්බොධ්‍යඞ්ග ය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග ය, වීය්‍ය්‍යසම්බොධ්‍යඞ්ග ය, ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ය, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග ය, සමාධිසම්බොධ්‍යඞ්ග ය, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි. මොහු ' බොධිපාක්ෂිකධර්මයෝ ' යි කියනු ලැබෙත්. මෙසේ මේ බොධිපාක්ෂිකධර්මයන් ආසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. එහෙයින් කියනු ලැබෙයි : ' බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො ' යි.

585. කිසෙයින් මහණ ඉදිරියට යෑමෙහි නැවැත්මෙහි සම්පජානකාරී වේ ද, ඉදිරිය බැලීමෙහි හාත්පස බැලීමෙහි සම්පජානකාරී වේ ද, අත්පා හැකිළීමෙහි දිගු කිරීමෙහි සම්පජානකාරී වේ ද, සඟල–පා–සිවුරු දැරීමෙහි සම්පජානකාරී වේ ද, භොජන යෙහි පානයෙහි කෑමෙහි රසවිඳීමෙහි සම්පජානකාරී වේ ද, මල–මූ කිරීමෙහි සම්පජාන කාරී වේ ද, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි සම්පජානකාරී වේ ද යත් : මෙ සස්නෙහි මහණ සිහි ඇති ව නුවණ ඇති ව ඉදිරියට යෙයි, සිහි ඇති ව නුවණ ඇති ව පෙරළා එයි, සිහිනුවණ ඇති ව ඉදිරිය බලයි, සිහි නුවණ ඇති ව හාත්පස බලයි, සිහිනුවණ ඇති ව අත්පා හකුළයි, සිහිනුවණඇති ව අත්පා දිගු කෙරෙයි, සඟල–පා–සිවුරු දැරීමෙහි සිහි ඇතිව නුවණින් කරනසුලු වෙයි. වැළඳීමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වෙයි, මල–මූ කිරීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වෙයි, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වේ.

' සතො ' යනු : එහි සති කවර යත් : යම ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්-ස්මෘතියක් වේ ද, මේ ' සති ' යි කියනු ලැබේ.

'සම්පජානො'ති තත්ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉති ඉමාය ච සතියා, ඉමිනා ච සම්පජඤ්ඤෙන උපෙතො හොති-පෙ-සමන්නාගතො. එවං භික්ඛු සතො සම්පජානො අභික්කමති සතො සම්පජානො පටික්කමති, සතො සම්පජානො ආලොකෙති. සතො සම්පජානො විලොකෙති, සතො සම්පජානො සම්මිඤ්ජෙති[1] සතො සම්පජානො පසාරෙති, සතො සම්පජානකාරී හොති සංඝාටි-පත්තචීවරධාරණෙ, සතො සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ, සතො සම්පජානකාරී හොති උච්චාරපස්සාව කම්මෙ, සතො සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ.

586. 'විවිත්ත'න්ති සන්තිකෙ චෙ'පි සෙනාසනං හොති. තං ච අනාකිණ්ණං ගහට්ඨෙහි පබ්බජිතෙහි, තෙන තං විවිත්තං. දූරෙ චෙ'පි සෙනාසනං හොති, තං ච අනාකිණ්ණං ගහට්ඨෙහි පබ්බජිතෙහි, තෙන තං විවිත්තං.

587. 'සෙනාසන'න්ති මඤ්චො'පි සෙනාසනං, පීඨම්පි සෙනාසනං භිසි'පි සෙනාසනං, බිම්බොහනම්පි සෙනාසනං, විහාරො'පි සෙනාසනං අඩ්ඪයොගො'පි සෙනාසනං, පාසාදො'පි සෙනාසනං, අට්ටො'පි සෙනාසනං, මාළො'පි සෙනාසනං, ලෙනම්පි සෙනාසනං, ගුහා'පි සෙනාසනං, රුක්ඛමූලම්පි සෙනාසනං, වෙළුගුම්බො'පි සෙනාසනං, යත්ථ වා පන භික්ඛූ පටික්කමන්ති සබ්බමෙතං සෙනාසනං.

588. 'භජතී'ති[2] ඉමං විවිත්තං සෙනාසනං භජති සම්භජති සෙවති නිසෙවති සංසෙවති, තෙන වුච්චති විවිත්තං සෙනාසනං භජතී'ති.

589. 'අරඤ්ඤ'න්ති නික්ඛමිත්වා බහිඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං.

590. රුක්ඛමූල'න්ති රුක්ඛමූලඤ්ඤෙ'ව රුක්ඛමූලං. පබ්බතොයෙව පබ්බතො. කන්දරායෙව කන්දරා. ගිරිගුහායෙව ගරිගුහා. සුසානංයෙව සුසානං. අබ්භොකාසොයෙව අබ්භොකාසො. පලාලපුඤ්ජො එව පලාලපුඤ්ජො.

591. 'වනපත්ථ'න්ති දූරානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති වනසණ්ඩානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති භිංසනකානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති සලොමහංසානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති පරියන්තානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති න මනුස්සූපචාරානමෙතං සෙනාසනානං අධිවචනං, 'වනපත්ථ'න්ති දුරභිසම්භවානමෙතං සෙනාසනානං අධිවචනං.

592. 'අප්පසද්ද'න්ති සන්තිකෙ චෙ'පි සෙනාසනං හොති තං ච අනාකිණ්ණං ගහට්ඨෙහි පබ්බජිතෙහි, තෙන තං අප්පසද්දං. දූරෙ චෙපි සෙනාසනං හොති තඤ්ච අනාකිණ්ණං ගහට්ඨෙහි පබ්බජිතෙහි, තෙන තං අප්පසද්දං.

---

1. සමිඤ්ජෙති - මජසං.
2. විවිත්තං සෙනාසනං භජතීති - සිරිමු, මජසං.

'සම්පජානො' යනු : එහි 'සම්පජඤ්ඤ' කවරෙ යත්: යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ 'සම්පජඤ්ඤ' යි කියනු ලැබේ. මෙසේ මේ සතියෙන් ද මේ සම්පජඤ්ඤයෙන් ද උපේත වූයේ . . . සමන්වාගත වූයේ වේ. මෙ සෙයින් මහණ සිහිනුවණ ඇතියේ ඉදිරියට යෙයි, සිහිනුවණ ඇතියේ පෙරළා එයි, සිහිනුවණ ඇතියේ ඉදිරිය බලයි, සිහි නුවණ ඇතියේ හාත්පස බලයි, සිහිනුවණ ඇතියේ අත්පා හකුළයි, සිහිනුවණ ඇතියේ අත්පා දිගු කෙරෙයි, සඟල-පා-සිවුරු දැරීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වෙයි වැළඳීමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වෙයි, මල-මූ කිරීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වෙයි, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි සිහි ඇති ව නුවණින් කරනසුලු වේ.

586. 'විවිත්තං' යනු : සමීපයෙහි සෙනසුනක් වේ නමුදු එ ද ගිහියන්ගෙන් පැවිද්දන්ගෙන් අනාකීර්ණ වේ නම් එ කරුණින් එය විවික්ත ය. දුරෙහි වූ සෙනසුනක් වේ නමුදු එ ද ගිහියන්ගෙන් පැවිද්දන්ගෙන් අනාකීර්ණ වේ නම් එ කරුණින් එය විවික්ත යි.

587. 'සෙනාසනං' යනු : ඇඳ ද සෙනසුනෙක, පුටුව ද සෙනසුනෙක, බිස්ස ද සෙනසුනෙක, බිම්බෝහනය ද සෙනසුනෙක, විහාරය ද සෙනසුනෙක, ගුරුළුවක් සෙවෙනි ඇති ගෙය ද සෙනසුනෙක, පහය ද සෙනසුනෙක, අටල්ල ද සෙනසුනෙක, මහල ද සෙනසුනෙක, ලෙන ද සෙනසුනෙක, ගුහාව ද සෙනසුනෙක, රුක්මුල ද සෙනසුනෙක, හුණුලැහැබ ද සෙනසුනෙකි. තවද යම් තැනෙක භික්ෂූහු රැස් වෙත් නම් එ හැම සෙනසුනි.

588. 'භජති' යනු : මේ විවික්තසේනාසනය භජනය කෙරෙයි, සම්භජනය කෙරෙයි, සේවනය කෙරෙයි, නිසේවනය කෙරෙයි, සංසේවනය කෙරේ. එයින් කියනු ලැබෙයි 'විවිත්තං සෙනාසනං භජති ' යි.

589. අරඤ්ඤං යනු : ඉන්ද්‍රඛීලයෙන් පිටත නික්ම තෙල සියල්ල අරණ්‍ය යි.

590. 'රුක්ඛමූලං' යනු : වෘක්ෂමූලය ම 'රුක්ඛමූල' යි. පබ්බතය ම පර්වත යි. කන්දරා ම කඳුරැලි යි. ගිරිගුහා ම ගිරිගුහා යි. සුසානය ම සොහොන යි. අබ්භොකාසය ම අභ්‍යවකාශ යි. පලාලපුඤ්ජය ම පලාලපුඤ්ජ යි.

591. 'වනපත්ථං' යනු : තෙල දුරු වූ සෙනසුන්වලට නමෙකි. 'වනපත්ථං' යනු : තෙල වනලැහැබ සෙනසුන්වලට නමෙකි. 'වනපත්ථං' යනු : තෙල බිහිසුණු සෙනසුන් වලට නමෙකි. 'වනපත්ථං' යනු : ලොමුදහගැනුම් සහිත සෙනසුන්වලට නමෙකි. 'වනපත්ථං' යනු : තෙල වනකෙළවර වූ සෙනසුන්වලට නමෙකි. 'වනපත්ථං' යනු : තෙල මිනිසුන්ගේ හැසිරීම් නැති සෙනසුන්වලට නමෙකි. 'වනපත්ථං' යනු : තෙල නො ලත් විවේකසුව ඇතියන් විසින් නො විසිය හැකි සෙනසුනට නමෙකි.

592. 'අප්පසද්දං' යනු : සමීපයෙහි සෙනසුනක් වේ නමුදු එ ද ගිහියන්ගෙන් පැවිද්දන්ගෙන් අනාකීර්ණ වේ නම් එ කරුණින් එය අල්පශබ්ද ය, දුරු සෙනසුනක් වේ නමුදු එ ද ගිහියන්ගෙන් පැවිද්දන්ගෙන් අනාකීර්ණ වේ නම් එ කරුණින් එය අල්පශබ්ද යි.

593. 'අප්පනිග්ඝොස'න්ති යදෙව තං අප්පසද්දං තදෙව තං අප්පනිග්ඝොසං, යදෙව තං අප්පනිග්ඝොසං තදෙව තං විජනවාතං, යදෙව තං විජනවාතං තදෙව තං මනුස්සරාහසෙය්‍යකං, යදෙව තං මනුස්සරාහසෙය්‍යකං තදෙව තං පටිසල්ලානසාරුප්පං.

594. අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා'ති අරඤ්ඤගතො වා හොති රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා.

595. නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා'ති නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා.

596. 'උජුං කායං පණිධායා'ති උජුකො හොති කායො ඨිතො පණිහිතො.

597. 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'ති තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති, අයං වුච්චති සති. අයං සති උපට්ඨිතා හොති සුපට්ඨිතා නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා. තෙන වුච්චති 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'ති.

598. 'අභිජ්ඣං ලොකෙ පහායා'ති තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති අභිජ්ඣා. තත්ථ කතමො ලොකො: පඤ්චුපාදානක්ඛන්ධා ලොකො, අයං වුච්චති ලොකො. අයං අභිජ්ඣා ඉමම්හි ලොකෙ සන්තා හොති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා, තෙන වුච්චති 'අභිජ්ඣං ලොකෙ පහායා'ති

599. 'විගතාභිජ්ඣෙන චෙතසා'ති තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං විගතාභිජ්ඣං හොති. තෙන වුච්චති 'විගතාභිජ්ඣෙන චෙතසා'ති.

600. 'විහරතී'ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති 'විහරතී'ති.

601. 'අභිජ්ඣාය චිත්තං පරිසොධෙතී'ති තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො අයං වුච්චති අභිජ්ඣා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය අභිජ්ඣාය සොධෙති විසොධෙති පරිසොධෙති මොචෙති විමොචෙති පරිමොචෙති, තෙන වුච්චති 'අභිජ්ඣාය චිත්තං පරිසොධෙතී'ති.

602. 'ව්‍යාපාදපදොසං පහායා'ති අත්ථි ව්‍යාපාදො අත්ථි පදොසො. තත්ථ කතමො ව්‍යාපාදො: යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[1] අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති ව්‍යාපාදො.

තත්ථ කතමො පදොසො: යො ව්‍යාපාදො සො පදොසො, යො පදොසො සො ව්‍යාපාදො, ඉති අයං ච ව්‍යාපාදො අයං ච පදොසො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'ව්‍යාපාදපදොසං පහායා'ති.

---

1. අසුරොපො – සිරිමු.

593. 'අප්පනිග්ඝොසං' යනු : යමෙක් ම අල්පශබ්ද වේ නම් එ ම අල්පනිර්ඝොෂ යි, යමෙක් ම අල්පනිර්ඝොෂ නම් එ ම විජනවාත යි, යමෙක් ම විජනවාත නම් එ ම මනුස්ස රාහසෙය්‍යක යි, යමෙක් ම මනුෂ්‍යරාහස්‍යක නම් එ ම ප්‍රතිසංලීනයට සුදුසු යි.

594. 'අරඤ්ඤගතො වා රුක්ඛමූලගතොවා සුඤ්ඤාගාරගතො වා' යනු : අරණ්‍ය-යකට ගියේ හෝ වෘක්ෂමූලයකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ වේ.

595. 'නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා' යනු : පලක් බැඳ හුන්නේ වේ.

596. 'උජුං කායං පණිධාය' යනු : කය ඍජු ව සිටියේ පිහිටුවන ලද්දේ වේ.

597. 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' යනු : එහි 'සති' කවර යත් : යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්ස්මෘතියක් වේ ද මේ 'සති' යි කියනු ලැබේ. මේ 'සතිය' නාසිකාග්‍රයෙහි හෝ මුඛනිමිත්තයෙහි හෝ එළඹ සිටියා මැනැවින් එළඹ සිටියා වේ. එහෙයින් කියනු ලැබෙයි 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' යි.

598. 'අභිජ්ඣං ලොකෙ පහාය' යනු : එහි අභිධ්‍යා කවර යත් : යම් රාගයෙක් සංරාගයෙක් . . . චිත්තයාගේ සංරාගයෙක් වේ ද, මේ 'අභිධ්‍යා' යි කියනු ලැබේ. එහි ලෝකය කවරෙ යත් : පඤ්චොපාදනස්කන්ධයෝ ලෝක යි. මේ 'ලෝක' යි කියනු ලැබේ. මේ අභිධ්‍යාව මේ උපාදනස්කන්ධලෝකයෙහි ශාන්ත–ශමිත–ව්‍යුපශාන්ත-අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වේ. එහෙයින් කියනු ලැබෙයි 'අභිජ්ඣං ලොකෙ පහාය' යි.

599. 'විගතාභිජ්ඣෙන චෙතසා' යනු : එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබේ. මේ සිත පහ වූ අභිධ්‍යා ඇත්තේ වේ. එහෙයින් කියනු ලැබෙයි 'විගතා භිජ්ඣෙන චෙතසා' යි.

600. 'විහරති' යනු : ඉරියවු පවත්වයි, වැටෙයි, පාලනය කෙරෙයි, යැපෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසේ. එහෙයින් කියනු ලැබෙයි 'විහරති' යි.

601. 'අභිජ්ඣාය චිත්තං පරිසොධෙති' යනු : එහි අභිධ්‍යා කවර යත් : යම් රාගයෙක් සංරාගයෙක් . . . චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ 'අභිධ්‍යා' යි කියනු ලැබේ. එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබේ. මේ සිත මේ අභිධ්‍යාව කෙරෙන් ශොධනය කෙරෙයි, විශොධනය කෙරෙයි, පරිශොධනය කෙරෙයි, මුදයි, වෙසෙසින් මුදයි, හාත්පසින් මුදයි. එහෙයින් කියනු ලැබෙයි 'අභිජ්ඣාය චිත්තං පරිසොධෙති' යි.

602. 'ව්‍යාපාදපදොසං පහාය' යනු : ව්‍යාපාදයෙක් ඇත, ප්‍රද්වෙෂයෙක් ඇති. එහි ව්‍යාපාදය කවරෙ යත් : චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රති විරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ ව්‍යාපත්තියෙක් මනඃප්‍රද්වෙෂයෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාර යෙක් කිපුණු බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපත්තියෙක් ව්‍යාපාද අයුරෙක් ව්‍යාපන්න බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ 'ව්‍යාපාද' යි කියනු ලැබේ.

එහි ප්‍රද්වෙෂය කවරෙ යත් : යම් ව්‍යාපාදයෙක් වේ ද හේ ප්‍රද්වෙෂ යි, යම් ප්‍රද්වෙෂ යෙක් වේ ද හේ ව්‍යාපාද යි. මෙසේ මේ ව්‍යාපාදයත් මේ ප්‍රද්වෙෂයත් ශාන්ත වෙයි, ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශො ෂිත – ව්‍යන්තීකෘත වේ. එහෙයින් කියනු ලැබෙයි 'ව්‍යාපාදපදොසං පහාය' යි.

603. 'අව්‍යාපන්නචිත්තො'ති තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං අව්‍යාපන්නං හොති. තෙන වුච්චති 'අව්‍යාපන්නචිත්තො'ති විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

604. 'ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙතී'ති අත්ථි ව්‍යාපාදො අත්ථි පදොසො. තත්ථ කතමො ව්‍යාපාදො: යො චිත්තස්ස ආඝාතො පටිඝාතො -පෙ- චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති ව්‍යාපාදො. තත්ථ කතමො පදොසො: යො ව්‍යාපාදො සො පදොසො, යො පදොසො සො ව්‍යාපාදො. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං, ඉදං චිත්තං ඉමම්හා ව්‍යාපාදපදොසා සොධෙති විසොධෙති පරිසොධෙති මොචෙති විමොචෙති පරිමොචෙති. තෙන වුච්චති 'ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙතී'ති.

605. 'ථිනමිද්ධං පහායා'ති අත්ථි ථිනං අත්ථි මිද්ධං. තත්ථ කතමං ථිනං: යා චිත්තස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථිනං ථියනා ථියිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති ථිනං. තත්ථ කතමං මිද්ධං: යා කායස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔනාහො පරියොනාහො අන්තොසමොරොධො මිද්ධං සොප්පං[1] පචලායිකා සොප්පං[1] සුපනා සුපිතත්තං[2], ඉදං වුච්චති මිද්ධං. ඉති ඉදං ච ථිනං ඉදං ච මිද්ධං සන්තා හොන්ති සමිතා වූපසන්තා -පෙ- සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'ථිනමිද්ධං පහායා'ති.

606. 'විගතථිනමිද්ධො'ති තස්ස ථිනමිද්ධස්ස චත්තත්තා වන්තත්තා මුත්තත්තා පහීනත්තා පටිනිස්සට්ඨත්තා පහීනපටිනිස්සට්ඨත්තා. තෙන වුච්චති 'විගතථිනමිද්ධො'ති.

'විහරතී'ති ඉරියති -පෙ- විහරති. තෙන වුච්චති විහරතී'ති.

607. 'ආලොකසඤ්ඤී'ති තත්ථ කතමා සඤ්ඤා: යා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං වුච්චති සඤ්ඤා. අයං සඤ්ඤා ආලොකා හොති විවටා පරිසුද්ධා පරියොදාතා. තෙන වුච්චති 'ආලොකසඤ්ඤී'ති.

608. 'සතො සම්පජානො'ති තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මා සති, අයං වුච්චති සති. තත්ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉති ඉමාය ච සතියා ඉමිනා ච සම්පජඤ්ඤෙන උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති 'සතො සම්පජානො'ති.

---

1. සුප්පං - සිරිමූ, මජසං.
2. සුප්පනා සුප්පිතත්තං - සිරිමූ, මජසං.

603. 'අව්‍යාපන්න චිත්තො' යනු : එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඤ්ඤාණධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබේ. මේ සිත අව්‍යාපන්න වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි 'අව්‍යාපන්න චිත්තො' යි. 'විහරති' යනු . . . එහෙයින් කියනු ලැබෙයි 'විහරති' යි.

604. 'ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති' යනු: ව්‍යාපාදයෙක් ඇත, ප්‍රද්වෙෂයෙක් ඇති. එහි ව්‍යාපාදය කවරෙ යත් : චිත්තයාගේ යම් ආඝාතයෙක් . . සැඩ බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ 'ව්‍යාපාද' යි කියනු ලැබේ. එහි ප්‍රද්වෙෂය කවරෙ යත් : යමෙක් ව්‍යාපාද නම් හේ ප්‍රද්වෙෂ ය, යමෙක් ප්‍රද්වෙෂ නම් හේ ව්‍යාපාද යි. එහි චිත්තය කවරෙ යත් : යම් සිතෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඤ්ඤාණධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබේ. මේ චිත්තය මේ ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වෙෂය කෙරෙන් ශොධනය කෙරෙයි විශොධනය කෙරෙයි පරිශොධනය කෙරෙයි මුදයි වෙසෙසින් මුදයි හාත්පසින් මුදයි එහෙයින් කියනු ලැබෙයි 'ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති' යි.

605. 'ථීනමිද්ධං පහාය' යනු : ථීනයෙක් ඇත, මිද්ධයෙක් ඇති. එහි ථීනය කවරෙ යත් : චිත්තයාගේ යම් ගිලන් බවෙක් අකර්මණ්‍ය බවෙක් හැකිළෙන අයුරෙක් හැකිළෙන බවෙක් ලීනයෙක් ලීනාකාරයෙක් හැකුළුණු බවෙක් චිත්තයාගේ නො පැතිරීමෙක් නො පැතිරෙන අයුරෙක් නො පැතිරුණු බවෙක් වේ ද, මේ 'ථීන' යි කියනු ලැබේ. එහි මිද්ධය කවරෙ යත් : නාමකායයාගේ යම් ගිලන් බවෙක් අකර්මණ්‍ය බවෙක් බැඳීමෙක් හාත්පසින් බැඳීමෙක් ඇතුළත ඇවිරීමෙක් පෙළීමෙක් නිදීමෙක් කපිනිද්‍රාවක් ශයනයෙක් ශයනාකාරයෙක් ශයනය කළ බවෙක් වේ ද, මේ 'මිද්ධ' යි කියනු ලැබේ. මෙසේ මේ ථීනයත් මේ මිද්ධයත් ශාන්ත වෙයි, ශමිත – ව්‍යුපශාන්ත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වේ. එහෙයින් කියනු ලැබෙයි 'ථීනමිද්ධං පහාය' යි.

606. 'විගතථීනමිද්ධො' යනු : ඒ ථීනමිද්ධය හළ බැවින් වමනය කළ බැවින් මිදූ බැවින් පුහුන් බැවින් බැහැර කළ බැවින් පැහීමෙන් බැහැර කළ බැවින්, එහෙයින් කියනු ලැබෙයි 'විගතථීනමිද්ධො' යි. 'විහරති' යනු : ඉරියවු පවත්වයි . . . වෙයේ. එහෙයින් කියනු ලැබෙයි 'විහරති' යි.

607. 'ආලොකසඤ්ඤී' යනු : එහි සංඥා කවර යත් : යම් හැඳිනීමෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ 'සංඥා' යි කියනු ලැබේ. මේ සංඥාව සප්‍රභ – විවෘත – පරිශුද්ධ – පර්‍ය්‍යවදාත වේ. එහෙයින් කියනු ලැබෙයි 'ආලොකසඤ්ඤී' යි.

608. 'සතො සම්පජානො' යනු : එහි සති කවර යත් : යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් . . . සම්‍යක් ස්මෘතියෙක් වේ ද, මේ 'සති' යි කියනු ලැබේ. එහි සම්පජඤ්ඤ කවරෙ යත් : යම් ප්‍රඥාවයෙක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග් දෘෂ්ටියක් වේ ද, මේ 'සම්පජඤ්ඤ' යි කියනු ලැබේ. මෙසේ මේ සතියෙන්ද මේ සම්පජඤ්ඤයෙන් ද යුක්ත වෙයි . . . සමන්වාගත වේ. එහෙයින් කියනු ලැබෙයි 'සතො සම්පජානො' යි.

5—ඕ8 17626 (3/75)

609. 'ථීනමිද්ධා චිත්තං පරිසොධෙතී'ති අත්ථි ථීනං අත්ථි මිද්ධං. තත්ථ කතමං ථීනං: යං චිත්තස්ස අකල්‍යතා -පෙ- ථීයිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති ථීනං. තත්ථ කතමං මිද්ධං: යා කායස්ස අකල්‍යතා -පෙ- සුපිතත්තං, ඉදං වුච්චති මිද්ධං. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමම්හා ථීනමිද්ධා සොධෙති විසොධෙති පරිසොධෙති මොචෙති විමොචෙති පරිමොචෙති. තෙන වුච්චති 'ථීනමිද්ධා චිත්තං පරිසොධෙතී'ති.

610. 'උද්ධච්චකුක්කුච්චං පහායා'ති අත්ථි උද්ධච්චං අත්ථි කුක්කුච්චං. තත්ථ කතමං උද්ධච්චං: යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං. තත්ථ කතමං කුක්කුච්චං: අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං. ඉති ඉදං ච උද්ධච්චං ඉදං ච කුක්කුච්චං සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'උද්ධච්චකුක්කුච්චං පහායා'ති.

611. 'අනුද්ධතො'ති තස්ස උද්ධච්චකුක්කුච්චස්ස චත්තත්තා වන්තත්තා මුත්තත්තා පහීනත්තා පටිනිස්සට්ඨත්තා පහීනපටිනිස්සට්ඨත්තා. තෙන වුච්චති 'අනුද්ධතො'ති. විහරතීති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

612. 'අජ්ඣත්ත'න්ති යං අජ්ඣත්තං පච්චත්තං. 'වූපසන්තචිත්තො'ති. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජා මනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං, ඉදං චිත්තං අජ්ඣත්තං සන්තං හොති සමිතං වූපසන්තං. තෙන වුච්චති, අජ්ඣත්තං වූපසන්තචිත්තො'ති.

613. 'උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙතී'ති අත්ථි උද්ධච්චං අත්ථි කුක්කුච්චං. තත්ථ කතමං උද්ධච්චං: යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං. තත්ථ කතමං කුක්කුච්චං: අකප්පියෙ කප්පියසඤ්ඤිතා -පෙ- වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා. යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං තත්ථ කතමං චිත්තං: -පෙ- ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමම්හා උද්ධච්චකුක්කුච්චා සොධෙති විසොධෙති පරිසොධෙති මොචෙති විමොචෙති පරිමොචෙති. තෙන වුච්චති 'උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙතී'ති.

614. 'විචිකිච්ඡං පහායා'ති තත්ථ කතමා විචිකිච්ඡා: යා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා, ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා. අයං විචිකිච්ඡා සන්තා හොති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'විචිකිච්ඡං පහායා'ති.

1 ඡම්භිතත්තං - සිරිමු, මජසං.

609. 'ථිනමිද්ධා චිත්තං පරිසොධෙති' යනු : ථිනයෙක් ඇත, මිද්ධයෙක් ඇති. එහි ථිනය කවරෙ යත් : චිත්තයාගේ යම් ගිලන් බවෙක් . . . චිත්තයාගේ නො පැකුරුණු බවෙක් වේ ද, මේ 'ථින' යි කියනු ලැබෙ. එහි මිද්ධය කවරෙ යත් : නාමකායයාගේ යම් ගිලන් බවෙක් . . . සුප්ත බවෙක් වේ ද, මේ 'මිද්ධ' යි කියනු ලැබෙ. එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනයෙක් . . . තදනුරූපමනොවිඤ්ඤාණධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබෙ. මේ චිත්තය මේ ථිනමිද්ධය කෙරෙන් ශුද්ධ කෙරෙයි, විශුද්ධ කෙරෙයි, පරිශුද්ධ කෙරෙයි, මුදයි, වෙසෙසින් මුදයි' හාත්පසින් මුදයි. එහෙයින් කියනු ලැබෙයි 'ථිනමිද්ධා චිත්තං පරිසොධෙති' යි.

610. 'උද්ධච්චකුක්කුච්චං පහාය' යනු : උද්ධච්චයෙක් ඇත කුක්කුච්චයෙක් ඇති. එහි උද්ධච්චය කවරෙ යත් : චිත්තයාගේ යම් ඖද්ධත්‍යයෙක් අව්‍යුපශමයෙක් චිත්තයාගේ වික්ෂෙපයෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද මේ 'උද්ධච්ච' යි කියනු ලැබෙ. එහි කුක්කුච්චය කවරෙ යත් : අකැපයෙහි කැපය යන සංඥා ඇති බව ය, කැපයෙහි අකැපය යන සංඥා ඇති බව ය, නිවරදෙහි වරදය යන සංඥා ඇති බව ය, වරදෙහි නිවරදය යන සංඥා ඇති බවයි. මෙබඳු යම් කුකුසෙක් කුකුස්නා අයුරෙක් කුකුස් කළ බවෙක් චිත්තයාගේ විපිළිසරයෙක් සිත ඉරිතැළීමෙක් වේ ද, මේ 'කුක්කුච්ච' යි කියනු ලැබෙ. මෙසේ මේ උද්ධච්චය ද මේ කුක්කුච්චය ද ශාන්ත වෙයි, ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වේ. එහෙයින් කියනු ලැබෙයි 'උද්ධච්චකුක්කුච්චං පහාය' යි.

611. 'අනුද්ධතො' යනු : ඒ උද්ධච්චකුක්කුච්චය හළ බැවින් වමනය කළ බැවින් මිදූ බැවින් ප්‍රහීණ බැවින් ප්‍රතිනිසෘෂ්ට බැවින් ප්‍රහාණයෙන් බැහැර කළ බැවින්, එහෙයින් කියනු ලැබෙයි 'අනුද්ධතො' යි. 'විහරති' යනු . . . එහෙයින් කියනු ලැබෙයි 'විහරති' යි.

612. 'අජ්ඣත්තං' යනු . යම් අධ්‍යාත්මයෙක් ප්‍රත්‍යාත්මයෙක් වේ ද, එය යි. 'වූපසන්තචිත්තො' යනු : එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඤ්ඤාණධාතුයෙක් වේ ද, මේ 'චිත්ත' යි කියනු ලැබෙ. මේ සිත අධ්‍යාත්මයෙහි ශාන්ත වෙයි, ශමිත – ව්‍යුපශාන්ත වේ. එහෙයින් කියනු ලැබෙයි 'අජ්ඣත්තං වූපසන්තචිත්තො' යි.

613. 'උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති' යනු : ඖද්ධත්‍යයෙක් ඇත, කෞකෘත්‍යයෙක් ඇති. එහි ඖද්ධත්‍යය කවරෙ යත් : චිත්තයාගේ යම් නො සන්හුන් බවෙක් අව්‍යුපශමයෙක් චිත්තයාගේ විසිරීමෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද, මේ 'ඖද්ධත්‍ය' යි කියනු ලැබෙ. එහි කෞකෘත්‍ය කවරෙ යත් : අකැපයෙහි කැපය යන සංඥා ඇති බව ය . . . වරදෙහි නිවරද ය යන සංඥා ඇති බව යි. මෙබඳු යම් කෞකෘත්‍යයෙක් කුකුස් අයුරෙක් කුකුස් කළ බවෙක් චිත්තයාගේ විපිළිසරයෙක් සිත හිරිගැසීමෙක් වේ ද, මේ 'කෞකෘත්‍ය' යි කියනු ලැබෙ. එහි චිත්තය කවරෙ යත් : . . . මේ 'චිත්ත' යි කියනු ලැබෙ. මේ සිත මේ ඖද්ධත්‍යකෞකෘත්‍යය කෙරෙන් ශුද්ධ කෙරෙයි ; විශුද්ධ කෙරෙයි, පරිශුද්ධ කෙරෙයි, මුදයි, වෙසෙසින් මුදයි, හාත්පසින් මුදයි. එහෙයින් කියනු ලැබෙයි 'උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති' යි.

614. 'විචිකිච්ඡං පහාය' යනු : එහි විචිකිත්සා කවර යත් : යම් සැකයෙක් සැක අයුරෙක් සැක කළ බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් ද්වෙළ්හකයෙක් ද්විධාපථයෙක් ශංසයෙක් අනෛකාන්තග්‍රාහයෙක් පැකිළීමෙක් හාත්පසින් පැකිළීමෙක් නො බැස ගැන්මෙක් චිත්තයාගේ තද බවෙක් සිත හිරිගැසීමෙක් වේ ද, මේ 'විචිකිත්සා' යි කියනු ලැබෙ. මේ විචිකිත්සාව ශාන්ත වෙයි, ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වේ. එහෙයින් කියනු ලැබෙයි 'විචිකිච්ඡං පහාය' යි.

615. 'තිණ්ණවිචිකිච්ඡො'ති ඉමං විචිකිච්ඡං තිණ්ණො හොති උත්තිණ්ණො නිත්තිණ්ණො පාරං ගතො පාරමනුප්පත්තො. තෙන වුච්චති 'තිණ්ණවිචිකිච්ඡො'ති. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

616. 'අකථංකථී කුසලෙසු ධම්මෙසූ'ති ඉමාය විචිකිච්ඡාය කුසලෙසු ධම්මෙසු න කඞ්ඛති න විචිකිච්ඡති. අකථංකථී හොති. නික්කථඞ්කථො[1] විගතකථඞ්කථො[2]. තෙන වුච්චති අකථංකථී කුසලෙසු ධම්මෙසූති.

617. 'විචිකිච්ඡාය චිත්තං පරිසොධෙතී'ති තත්ථ කතමා විචිකිච්ඡා: යා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං -පෙ- ථම්භිතත්තං[3] චිත්තස්ස මනොවිලෙඛො අයං වුච්චති විචිකිච්ඡා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය විචිකිච්ඡාය සොධෙති විසොධෙති පරිසොධෙති මොචෙති විමොචෙති පරිමොචෙති. තෙන වුච්චති 'විචිකිච්ඡාය චිත්තං පරිසොධෙතී'ති.

618. 'ඉමෙ පඤ්චනීවරණෙ පහායා'ති ඉමෙ පඤ්චනීවරණා සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'ඉමෙ පඤ්චනීවරණෙ පහායා'ති.

619. 'චෙතසො උපක්කිලෙසෙ'ති ඉමෙ පඤ්චනීවරණා චිත්තස්ස උපක්කිලෙසා.

620. 'පඤ්ඤාය දුබ්බලීකරණෙ'ති ඉමෙහි පඤ්චහි නීවරණෙහි අනුප්පන්නා චෙව පඤ්ඤා න උප්පජ්ජති උප්පන්නා ච පඤ්ඤා නිරුජ්ඣති; තෙන වුච්චති 'පඤ්ඤාය දුබ්බලීකරණෙ'ති.

621. 'විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහී'ති: තත්ථ කතමෙ කාමා: ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමො, - ඉමෙ වුච්චන්ති කාමා. තත්ථ කතමෙ අකුසලා ධම්මා: කාමච්ඡන්දො ව්‍යාපාදො ථීනං මිද්ධං උද්ධච්චං කුක්කුච්චං විචිකිච්ඡා, ඉමෙ වුච්චන්ති අකුසලා ධම්මා, ඉති ඉමෙහි ච කාමෙහි ඉමෙහි ච අකුසලෙහි ධම්මෙහි විවිත්තො හොති තෙන වුච්චති 'විවිච්චෙව'ච කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහී'ති.

622. 'සවිතක්කං සවිචාර'න්ති අත්ථි විතක්කො අත්ථි විචාරො. තත්ථ කතමො විතක්කො: යො තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො, අයං වුච්චති විතක්කො. තත්ථ කතමො විචාරො: යො චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා අනුපෙක්ඛනතා, අයං වුච්චති විචාරො. ඉති ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන උපෙතො හොති-පෙ-සමන්නාගතො. තෙන වුච්චති 'සවිතක්කං සවිචාර'න්ති.

---

1. නික්කථංකථී - සිරිමු, මජසං.
2. විකථඞ්කථො - සිරිමු, මජසං.
3. ඡම්භිතත්තං - සිරිමු, මජසං.

615. ' තිණ්ණවිචිකිච්ඡො ' යනු : මේ විචිකිත්සාව තරණය කළේ වෙයි, එතෙර වූයේ උවදුරු මැඩගෙන තරණය කෙළේ පරතෙරට ගියේ පරතෙරට පැමිණියේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' තිණ්ණවිචිකිච්ඡො ' යි. විහරති යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

616. ' අකථංකථී කුසලෙසු ධම්මෙසු ' යනු : මේ විචිකිත්සායෙන් නිරවද්‍ය ධර්මයන්හි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, සැක නැත්තේ වෙයි, නික්මගිය කථංකථා (සැක) ඇත්තේ පහව ගිය කථංකථා ඇත්තේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' අකථංකථී කුසලෙසු ධම්මේසු ' යි.

617. ' විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති ' යනු : එහි විචිකිත්සා කවර යත් : යම් සැකයෙක් සැක අයුරෙක් සැක කළ බවෙක් . . . චිත්තයාගේ තද බවෙක් සිත හිරිගැසීමෙක් වේ ද, මේ ' විචිකිත්සා ' යි කියනු ලැබේ. එහි චිත්තය කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ විචිකිත්සාව කෙරෙන් ශුද්ධ කෙරෙයි, විශුද්ධ කෙරෙයි, පරිශුද්ධ කෙරෙයි, මුදයි, වෙසෙසින් මුදයි, හාත්පසින් මුදයි. එහෙයින් කියනු ලැබෙයි ' විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති ' යි.

618. ' ඉමෙ පඤ්චනීවරණෙ පහාය ' යනු : මේ පඤ්චනීවරණයෝ සන්හිඳුනාහු වෙති ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වූවාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' ඉමෙ පඤ්චනීවරණෙ පහාය ' යි.

619. ' චෙතසො උපක්කිලෙසෙ ' යනු : මේ පඤ්චනීවරණයෝ චිත්තයට උපක්ලෙශයෝ යි.

620. ' පඤ්ඤාය දුබ්බලීකරණෙ ' යනු : මේ පඤ්චනීවරණයන් කරණකොට ගෙන නූපන්නා වූ ද ප්‍රඥව නූපදියි. උපන්නා වූ ද ප්‍රඥව නිරුද්ධ වේ. එහෙයින් කියනු ලැබෙයි ' පඤ්ඤාය දුබ්බලීකරණෙ ' යි.

621. ' විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි ' යනු : එහි කාම කවරෙ යත් : ඡන්දය කාම ය, රාගය කාම ය, ඡන්දරාගය කාම ය, සංකල්පය කාම ය, රාගය කාම ය, සංකල්පරාගය කාම යි. මොහු ' කාමයෝ ' යි කියනු ලැබෙත්. එහි අකුශලධර්මයෝ කවරහ යත් : කාමච්ඡන්ද ය, ව්‍යාපාද ය, ස්ත්‍යානමිද්ධ ය, ඖද්ධත්‍ය ය, කෞකෘත්‍ය ය, විචිකිත්සා යි. මොහු ' අකුශලධර්මයෝ ' යි කියනු ලැබෙත්. මෙසේ මේ කාමයන් කෙරෙන් ද මේ අකුශලධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි ' යි.

622. ' සවිතක්කං සවිචාරං ' යනු : විතර්කයෙක් ඇත, විචාරයෙක් ඇති. එහි විතර්ක කවරෙ යත් : යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණයෙක් ව්‍යර්පණයෙක් සිත අරමුණට නැඟීමෙක් සම්‍යක්සංකල්පයෙක් වේ ද, මේ ' විතර්ක ' යි කියනු ලැබේ. එහි විචාරය කවරෙ යත් : යම් චාරයෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් සිත අරමුණෙහි ගළපන බවෙක් අනුව බලන බවෙක් වේ ද, මේ ' විචාර ' යි කියනු ලැබේ. මෙසේ මේ විතර්කයෙන් ද මේ විචාරයෙන් ද යුක්ත වූයේ වෙයි . . . සමන්වාගත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සවිතක්කං සවිචාරං ' යි.

623. 'විවෙකජ'න්ති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, තෙ ඉමම්හි විවෙකෙ ජාතා හොන්ති සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා. තෙන වුච්චති 'විවෙකජ'න්ති.

624. 'පීතිසුඛ'න්ති: අත්ථි පීති, අත්ථි සුඛං. තත්ථ කතමා පීති: යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්ගං අත්තමනතා චිත්තස්ස, අයං වුච්චති පීති. තත්ථ කතමං සුඛං: යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛං. ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං. තෙන වුච්චති 'පීතිසුඛ'න්ති.

625. 'පඨම'න්ති ගණනානුපුබ්බතා[1] පඨමං, ඉදං පඨමං සමාපජ්ජතීති පඨමං.

626. 'ඣාන'න්ති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා.

627. 'උපසම්පජ්ජා'ති යො පඨමස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා[2] සච්ඡිකිරියා උපසම්පදා.

628. 'විහරතී'ති ඉරියති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

629. 'විතක්කවිචාරානං වූපසමා'ති අත්ථි විතක්කො අත්ථි විචාරො. තත්ථ කතමො විතක්කො: යො තක්කො විතක්කො -පෙ- සම්මාසඞ්කප්පො. අයං වුච්චති විතක්කො. තත්ථ කතමො විචාරො: යො චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා අනුපෙක්ඛනතා, අයං වුච්චති විචාරො. ඉති අයඤ්ච විතක්කො අයඤ්ච විචාරො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'විතක්කවිචාරානං වූපසමා'ති.

630. 'අජ්ඣත්ත'න්ති යං අජ්ඣත්තං පච්චත්තං.

631. 'සම්පසාදන'න්ති යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො.

632. 'චෙතසො එකොදිභාව'න්ති යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි.

633. 'අවිතක්කං අවිචාර'න්ති අත්ථි විතක්කො, අත්ථි විචාරො. තත්ථ කතමො විතක්කො: යො තක්කො විතක්කො -පෙ- සම්මාසඞ්කප්පො අයං වුච්චති විතක්කො. තත්ථ කතමො විචාරො: යො චාරො -පෙ- අනුපෙක්ඛනතා. අයං වුච්චති විචාරො. ඉති අයඤ්ච විතක්කො අයඤ්ච විචාරො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'අවිතක්කං අවිචාර'න්ති.

---

1. ගණනානුපුබ්බතො - සයා.
2 ඵස්සනා - සීපැවි.

623. ' විවෙකජං ' යනු : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තයාගේ ඒකාග්‍රතා යි. ඔහු මේ විවෙකයෙහි හටගත්තාහු වෙති, ප්‍රත්‍යයසමවායයෙන් හටගත්තාහු නිපන්නාහු වෙසෙයින් නිපන්නාහු පහළ වූවාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' විවෙකජං ' යි.

624. ' පීතිසුඛං ' යනු : ප්‍රීතියක් ඇත, සුඛයෙක් ඇති. එහි ප්‍රීතිය කවර යත් : යම් ප්‍රීතියක් තරුණප්‍රීතියක් ආමොදනයෙක් ප්‍රමොදනයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් සතුටක් ඔදවැඩි බවෙක් චිත්තයාගේ සියමනබවෙක් වේ ද, මේ ' ප්‍රීති ' යි කියනු ලැබෙ. එහි සුඛය කවරෙ යත් : යම් චෛතසික වූ මිහිරෙක් චෛතසික වූ සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනාවක් වේ ද, මේ ' සුඛය ' යි කියනු ලැබෙ. මේ සුඛය මේ ප්‍රීතිය සහගියේ වෙයි, සහජාත වූයේ සංසෘෂ්ට වූයේ සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' පීතිසුඛං ' යි.

625. ' පඨමං ' යනු : ගණනානුපූර්වතායෙන් පඨම ය, මේ ධ්‍යානයට පළමු කොට සමවදී නු යි පඨම යි.

626. ' ඣානං ' යනු : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි.

627. ' උපසම්පජ්ජ ' යනු : ප්‍රථමධ්‍යානයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සාක්ෂාත් කිරීමෙක් පැමිණීමෙක් වේ ද එය යි.

628. ' විහරති ' යනු : ඉරියවු පවත්වයි . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

629. ' විතක්කවිචාරානං වූපසමා ' යනු : විතර්කයෙක් ඇත, විචාරයෙක් ඇති. එහි විතර්ක කවරෙ යත් : යම් තර්කයෙක් විතර්කයෙක් . . . සම්‍යක්සංකල්පයෙක් වේ ද, මේ ' විතර්ක ' යි කියනු ලැබෙ. එහි විචාර කවරෙ යත් : යම් චාරයෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් සිත අරමුණෙහි ගළපන බවෙක් අනුප්‍රෙක්ෂණතායෙක් වේ ද, මේ ' විචාර ' යි කියනු ලැබේ. මෙසේ මේ විතර්කය ද මේ විචාරය ද සන්හිඳුනාහු වෙති, සන්හිඳුවන ලද්දහු වෙසෙයින් සන්හිඳුණාහු අස්තයට ගියාහු වෙසෙයින් අස්තයට ගියාහු අර්පිත වූවාහු වෙසෙයින් අර්පිත වූවාහු වියලන ලද්දහු වෙසෙයින් වියලන ලද්දහු විගතාන්ත කරන ලද්දහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' විතක්කවිචාරානං වූපසමා ' යි.

630. ' අජ්ඣත්තං ' යනු : යම් අධ්‍යාත්මයෙක් ප්‍රත්‍යාත්මයෙක් වේ ද එය යි.

631. ' සම්පසාදනං ' යනු : යම් හැදහීමෙක් හදහන අයුරෙක් අරමුණෙහි බැසගැන්මෙක් අභිප්‍රසාදයෙක් වේ ද, එය යි.

632. ' චෙතසො එකොදිභාවං ' යනු : චිත්තයාගේ යම් සිටීමෙක් . . . සම්‍යක් සමාධියක් වේ ද, එය යි.

633. ' අවිතක්කං අවිචාරං ' යනු : විතර්කයෙක් ඇත, විචාරයෙක් ඇති. එහි විතර්ක කවරෙ යත් : යම් තර්කයෙක් විතර්කයෙක් . . . සම්‍යක්සඞ්කල්පයෙක් වේ ද, මේ ' විතර්ක ' යි කියනු ලැබෙ. එහි විචාර කවරෙ යත් : යම් චාරයෙක් . . . අනුප්‍රෙක්ෂණතායෙක් වේ ද, මේ ' විචාර ' යි කියනු ලැබෙ. මෙසේ මේ විතර්කය ද මේ විචාර ය ද ශාන්ත වූවාහු වෙති, ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වූවාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' අවිතක්කං අවිචාරං ' යි.

634. 'සමාධිජ'න්ති සම්පසාදෙ පීතිසුඛං, තෙ ඉමම්හි සමාධිම්හි ජාතා හොන්ති සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා. තෙන වුච්චති 'සමාධිජ'න්ති.

635. 'පීතිසුඛ'න්ති අත්ථි පීති, අත්ථි සුඛං. තත්ථ කතමා පීති -පෙ- අයං වුච්චති පීති. තත්ථ කතමං සුඛං -පෙ- ඉදං වුච්චති සුඛං, ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං. තෙන වුච්චති 'පීතිසුඛ'න්ති.

636. 'දුතිය'න්ති ගණනානුපුබ්බතා දුතියං. ඉදං දුතියං සමාපජ්ජතීති දුතියං.

637. 'ඣාන'න්ති සම්පසාදෙ පීතිසුඛං චිත්තස්ස එකග්ගතා.

638. 'උපසම්පජ්ජා'ති යො දුතියස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

639. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

640. 'පීතියා ච විරාගා'ති තත්ථ කතමා පීති: යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස. අයං වුච්චති පීති. අයං පීති සන්තා හොති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තී කතා. තෙන වුච්චති 'පීතියා ච විරාගා'ති.

641. 'උපෙක්ඛකො'ති තත්ථ කතමා උපෙක්ඛා: යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස, අයං වුච්චති උපෙක්ඛා. ඉමාය උපෙක්ඛාය උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති 'උපෙක්ඛකො'ති.

642. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

643. 'සතො ච සම්පජානො'ති තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති, අයං වුච්චති සති. තත්ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉති ඉමාය ච සතියා ඉමිනා ච සම්පජඤ්ඤෙන උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති 'සතො ච සම්පජානො'ති.

644. 'සුඛං ච කායෙන පටිසංවෙදෙතී'ති තත්ථ කතමං සුඛං: යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛං. තත්ථ කතමො කායො: සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, අයං වුච්චති කායො. ඉදං සුඛං ඉමිනා කායෙන පටිසංවෙදෙති. තෙන වුච්චති 'සුඛං ච කායෙන පටිසංවෙදෙතී'ති.

645. 'යං තං අරියා ආචික්ඛන්තී'ති තත්ථ කතමෙ අරියා: අරියා වුච්චන්ති බුද්ධා ච බුද්ධසාවකා ච, තෙ ඉමං ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති පකාසෙන්ති. තෙන වුච්චති 'යං තං අරියා ආචික්ඛන්තී'ති.

634. ' සමාධිජං ' යනු : සම්ප්‍රසාද ය ප්‍රීතිය හා සුඛය (යන) ඒ ධර්මයෝ මේ සමාධියෙහි හටගත්තාහු වෙති, ප්‍රත්‍යයසමවායයෙන් හටගත්තාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු පහළ වූවාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' සමාධිජං ' යි.

635. පීතිසුඛං යනු : ප්‍රීතියක් ඇත, සුඛයෙක් ඇති. එහි ප්‍රීති කවර යත් ' . . . මේ ' ප්‍රීති ' යි කියනු ලැබේ. එහි සුඛ කවර යත් . . . මේ ' සුඛ ' යි කියනු ලැබේ. මේ සුඛය මේ ප්‍රීතිය සහගියා වෙයි, සහජාත – සංසෘෂ්ට – සම්ප්‍රයුක්ත වේ. එහෙයින් කියනු ලැබෙයි ' ප්‍රීතිසුඛං ' යි.

636. ' දුතියං ' යනු : ගණනානුපූර්වතායෙන් ද්විතීය ය. මේ ධ්‍යානයට දෙ වැනි ව සමවදී නු යි ද්විතීය යි.

637. ' ඣානං ' යනු : සම්ප්‍රසාද ය, ප්‍රීතිය හා සුඛ ය, චිත්තෛකාග්‍රතා යි.

638. ' උපසම්පජ්ජ ' යනු : ද්විතීයධ්‍යානයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සාක්ෂාත්ක්‍රියාවක් පැමිණීමෙක් වේ ද, එය යි.

639. ' විහරති ' යනු . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

640. ' පීතියා ච විරාගා ' යනු : එහි ප්‍රීති කවර යත් : යම් ප්‍රීතියක් ප්‍රමොද බවෙක් ආමොදනයෙක් ප්‍රමොදනයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් සන්තොෂයෙක් ඔදවැඩි බවෙක් චිත්තයාගේ සියමනබවෙක් වේ ද, මේ ' ප්‍රීති ' යි කියනු ලැබේ. මේ ප්‍රීතිය ශාන්ත – ශමිත – ව්‍යුපශාන්ත – අස්තඞ්ගත – අභ්‍යස්තඞ්ගත – අර්පිත – ව්‍යර්පිත – ශොෂිත – විශොෂිත – ව්‍යන්තීකෘත වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' පීතියා ච විරාගා ' යි.

641. ' උපෙක්ඛකො ' යනු : එහි උපෙක්ෂා කවර යත් : යම් උපෙක්ෂාවක් උපෙක්ෂා අයුරෙක් අධ්‍යුපෙක්ෂණයෙක් චිත්තයාගේ මැදහත් බවෙක් වේ ද, මේ ' උපෙක්ෂා ' යි කියනු ලැබේ. මේ උපෙක්ෂායෙන් යුක්ත වූයේ වෙයි . . . සමන්වාගත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' උපෙක්ඛකො ' යි.

642. ' විහරති ' යනු : . . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

643. ' සතො ච සම්පජානො ' යනු : එහි ' සති' කවර යත් : යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්ස්මෘතියක් වේ ද, මේ ' සති ' යි කියනු ලැබේ. එහි සම්පජඤ්ඤ කවරෙ යත් : යම් ප්‍රඥවක් දන්නා අයුරෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ ' සම්පජඤ්ඤ ' යි කියනු ලැබේ. මෙසේ මේ සතියෙන් ද මේ සම්පජඤ්ඤයෙන් ද යුක්ත වූයේ වෙයි . . . සමන්වාගත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සතො ච සම්පජානො ' යි.

644. ' සුඛං ච කායෙන පටිසංවෙදෙති ' යනු : එහි ' සුඛ' කවරෙ යත් : යම් චෛතසික වූ මිහිරෙක් චෛතසික වූ සුවයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් මිහිරි වූ සුව වූ වෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදනාවක් වේ ද, මේ ' සුඛ ' යි කියනු ලැබේ. එහි කාය කවරෙ යත් : සංඥස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥනස්කන්ධ යි. මේ ' කාය ' යි කියනු ලැබේ. මේ සුඛය මේ කයින් විඳියි. එහෙයින් කියනු ලැබෙයි ' සුඛං ච කායෙන පටිසංවෙදෙති ' යි.

645. ' යං තං අරියා ආචික්ඛන්ති ' යනු : එහි ආර්‍යයෝ කවරහ යත් : බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද ' ආර්‍යයෝ ' යි කියනු ලැබෙත්. ඔහු මේ පුද්ගලයා උදෙසති, දෙසති, පනවති, පිහිටුවති, ප්‍රකට කෙරෙති, විභාග කෙරෙති, නො ගැඹුරු කෙරෙති, ප්‍රකාශ කෙරෙත්. එහෙයින් කියනු ලැබෙයි ' යං තං අරියා ආචික්ඛන්ති ' යි.

646. 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තත්ථ කතමා උපෙක්ඛා: යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස, අයං වුච්චති උපෙක්ඛා. තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති, අයං වුච්චති සති. තත්ථ කතමං සුඛං: යං චෙතසිකං සාතං -පෙ- ඉදං වුච්චති සුඛං. ඉති ඉමාය ච උපෙක්ඛාය ඉමාය ච සතියා ඉමිනා ච සුඛෙන සමන්නාගතො ඉරියති වත්තති පාලෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති.

647. 'තතිය'න්ති ගණනානුපුබ්බතා[1] තතියං, ඉදං තතියං සමාපජ්ජතී'ති තතියං.

648. 'ඣාන'න්ති උපෙක්ඛාසතිසම්පජඤ්ඤං සුඛං චිත්තස්ස එකග්ගතා.

649. 'උපසම්පජ්ජා'ති යො තතියස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

650. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති විහරතී'ති.

651. 'සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා'ති අත්ථි සුඛං, අත්ථි දුක්ඛං. තත්ථ කතමං සුඛං: යං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛං. තත්ථ කතමං දුක්ඛං: යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දුක්ඛං. ඉති ඉදඤ්ච සුඛං ඉදඤ්ච දුක්ඛං සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා'ති.

652. 'පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා'ති අත්ථි සොමනස්සං, අත්ථි දොමනස්සං. තත්ථ කතමං සොමනස්සං: යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සොමනස්සං. තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දොමනස්සං. ඉති ඉදං ච සොමනස්සං ඉදං ච දොමනස්සං පුබ්බෙව සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා. තෙන වුච්චති 'පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා'ති.

653. 'අදුක්ඛමසුඛ'න්ති යං චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා. තෙන වුච්චති 'අදුක්ඛමසුඛ'න්ති.

---

1. ගණනානුපුබ්බතො - සයා.

Free Distribution www.aathaapi.org

646. ' උපෙක්ඛකො සතිමා සුඛවිහාරී ' යනු : එහි උපෙක්ෂා කවර යත් : යම් උපෙක්ෂායෙක් උපෙක්ෂාකාරයෙක් අධ්‍යුපෙක්ෂණයෙක් චිත්තයාගේ මැදහත් බවෙක් වේ ද, මේ ' උපෙක්ෂා ' යි කියනු ලැබේ. එහි සති කවර යත් : යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් . . . සම්‍යක්ස්මෘතියෙක් වේ ද, මේ ' සති ' යි කියනු ලැබේ. එහි සුඛය කවරෙ යත් ' යම් චෛතසික වූ සාතයෙක් . . . මේ ' සුඛ ' යි කියනු ලැබේ. මෙසේ මේ උපෙක්ෂායෙන් ද මේ ස්මෘතියෙන් ද මේ සුඛයෙන් ද සමන්වාගත වූයේ ඉරියවු පවත්වයි, වැටෙයි, පාලනය කෙරෙයි, යැපෙයි, හැසිරෙයි, වෙසේ. එහෙයින් කියනු ලැබෙයි ' උපෙක්ඛකො සතිමා සුඛවිහාරී ' යි.

647. ' තතියං ' යනු : ගණනානුපූර්වතායෙන් තෘතීය යි. මේ ධ්‍යානයට තුන් වැනි ව සමවදී නු යි තෘතීය යි.

648. ' ඣානං ' යනු : උපෙක්ෂායෙන් උපන් ස්මෘතිසම්ප්‍රජන්‍ය ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි.

649. ' උපසම්පජ්ජ ' යනු : තෘතීයධ්‍යානයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සක්ෂාත්ක්‍රියායෙක් පැමිණීමෙක් වේ ද එය යි.

650. ' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

651. ' සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා ' යනු : සුඛයෙක් ඇත, දුඃඛයෙක් ඇති. එහි ' සුඛ ' කවරෙ යත් : යම් කායික වූ මිහිරෙක් කායික වූ සුවයෙක් කායසම්ඵස්සයෙන් උපන් මිහිරි වූ සුව වූ වෙදයිතයෙක් කායසම්ඵස්සයෙන් උපන් මිහිරි වූ සුව වූ වෙදනාවක් වේ ද, මේ ' සුඛ ' යි කියනු ලැබේ. එහි දුඃඛ කවරෙ යත් : යම් කායික වූ අමිහිරෙක් කායික වූ දුකෙක් කායසම්ඵස්සයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදයිතයෙක් කායසම්ඵස්සයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදනායෙක් වේ ද, මේ ' දුඃඛ ' යි කියනු ලැබේ. මෙසේ මේ සුඛය ද මේ දුඃඛය ද සන්හිඳුනාහු වෙති, ශමිත වූවාහු ව්‍යුපශාන්ත වූවාහු අස්තයට ගියාහු වෙසෙසින් අස්තයට ගියාහු අර්පිත වූවාහු වෙසෙසින් අර්පිත වූවාහු වියළන ලද්දාහු වෙසෙසින් වියළන ලද්දාහු විගතාන්ත කරන ලද්දාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා ' යි.

652. ' පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා ' යනු : සොමනස්සයෙක් ඇත, දෞමනස්සයෙක් ඇති. එහි සොමනස්ස කවරෙ යත් : යම් චෛතසික වූ මිහිරෙක් චෛතසික වූ සුවයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් මිහිරි වූ සුව වූ වෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් මිහිරි වූ සුව වූ වෙදනායෙක් වේ ද, මේ ' සොමනස්ස ' යි කියනු ලැබේ. එහි දොමනස්ස කවරෙ යත් : යම් චෛතසික වූ අමිහිරෙක් චෛතසික වූ දුකෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදනායෙක් වේ ද, මේ ' දොමනස්ස ' යි කියනු ලැබේ. මෙසේ මේ සොමනස්සය ද මේ දොමනස්සය ද පෙර ම සන්හිඳුනාහු වෙති. ශමිත වූවාහු ව්‍යුපශාන්ත වූවාහු අස්තයට ගියාහු වෙසෙසින් අස්තයට ගියාහු අර්පිත වූවාහු වෙසෙසින් අර්පිත වූවාහු වියළන ලද්දාහු වෙසෙසින් වියළන ලද්දාහු විගතාන්ත කරන ලද්දාහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා ' යි.

653. ' අදුක්ඛමසුඛං ' යනු : යම් චෛතසික වූ නො ම සාත වූ අසාත නො වූ චෙතොසම්ඵස්සයෙන් උපන් නො දුක් නො සුව වෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් නො දුක් නො සුව වෙදනායෙක් වේ ද එය යි. එහෙයින් කියනු ලැබෙයි ' අදුක්ඛම සුඛං ' යි.

654. 'උපෙක්ඛාසතිපාරිසුද්ධි'න්ති තත්ථ කතමා උපෙක්ඛා: යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස, අයං වුච්චති උපෙක්ඛා. තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති. අයං වුච්චති සති. අයං සති ඉමාය උපෙක්ඛාය විවටා හොති පරිසුද්ධා පරියොදාතා. තෙන වුච්චති 'උපෙක්ඛාසතිපාරිසුද්ධි'න්ති.

655. 'චතුත්ථ'න්ති ගණනානුපුබ්බතා[1] චතුත්ථං. ඉදං චතුත්ථං සමාපජ්ජතීති චතුත්ථං.

656. 'ඣාන'න්ති උපෙක්ඛා සති චිත්තස්ස එකග්ගතා.

657. 'උපසම්පජ්ජා'ති, යො චතුත්ථස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

658. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

659. 'සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා'ති. තත්ථ කතමා රූපසඤ්ඤා: රූපාවචරසමාපත්තිං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්ම[2]සුඛවිහාරිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, ඉමා වුච්චන්ති රූපසඤ්ඤායො. ඉමා රූපසඤ්ඤායො අතික්කන්තො හොති වීතික්කන්තො සමතික්කන්තො. තෙන වුච්චති 'සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා'ති.

660. 'පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා'ති තත්ථ කතමා පටිඝසඤ්ඤා: රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා, ඉමා වුච්චන්ති පටිඝසඤ්ඤායො. ඉමා පටිඝසඤ්ඤායො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා, තෙන වුච්චති පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමාති.

661. 'නානත්තසඤ්ඤානං අමනසිකාරා'ති. තත්ථ කතමා නානත්තසඤ්ඤා: අසමාපන්නස්ස මනොධාතුසමඞ්ගිස්ස වා මනොවිඤ්ඤාණධාතුසමඞ්ගිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, ඉමා වුච්චන්ති නානත්තසඤ්ඤායො. ඉමා නානත්තසඤ්ඤායො න මනසිකරොති. තෙන වුච්චති 'නානත්තසඤ්ඤානං අමනසිකරා'ති.

662. 'අනන්තො ආකාසො'ති තත්ථ කතමො ආකාසො: යො ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහි, අයං වුච්චති ආකාසො. තස්මිං ආකාසෙ චිත්තං ඨපෙති සණ්ඨපෙති අනන්තං ඵරති. 'තෙන වුච්චති අනන්තො ආකාසො'ති.

663. 'ආකාසානඤ්චායතන'න්ති ආකාසානඤ්චායතනං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා.

664. 'උපසම්පජ්ජා'ති යො ආකාසානඤ්චායතනස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

665. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

---

1. ගණනානුපුබ්බතො - ස්‍යා.
2. දිට්ඨධම්මෙ - සීපෑවි.

654. ' උපෙක්ඛාසතිපාරිසුද්ධිං ' යනු : එහි උපෙක්ෂා කවර යත් : යම් උපෙක්ෂා යෙක් උපෙක්ෂාකාරයෙක් අධ්‍යුපෙක්ෂණයෙක් චිත්තයාගේ මැදහත් බවෙක් වේ ද, මේ ' උපෙක්ෂා ' යි කියනු ලැබේ. එහි 'සති' කවර යත් : යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් . . සම්‍යක්ස්මෘතියෙක් වේ ද, මේ ' සති ' යි කියනු ලැබේ. මේ ස්මෘතිය මේ උපෙක්ෂායෙන් විවෘත වූවා පරිශුද්ධ වූවා පර්‍ය්‍යවදාත වූවා වෙයි. එහෙයින් කියනු ලැබෙයි ' උපෙක්ඛා සතිපාරිසුද්ධිං ' යි.

655. ' චතුත්ථං ' යනු : ගණනානුපූර්වතායෙන් චතුර්ථ ය. මේ ධ්‍යානයට සතර වැනි ව සමවදී නු යි චතුර්ථ යි.

656. ' ඣානං ' යනු : උපෙක්ෂායෙන් උපන් ස්මෘති ය, චිත්තයාගේ එකාග්‍රතා යි.

657. ' උපසම්පජ්ජ ' යනු : චතුර්ථධ්‍යානයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සාක්ෂාත්ක්‍රියායෙක් පැමිණීමෙක් වේ ද එය යි.

658. ' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

659. ' සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා ' යනු : එහි ' රූපසංඥා ' කවර යත් : රූපාවචරසමාපත්තියට සමවන්හුගේ හෝ පැමිණියහුගේ හෝ දෘෂ්ටධර්මසුඛවිහාර ඇත්තහුගේ හෝ හැඳිනීමෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මොහු ' රූප සංඥා ' යි කියනු ලැබෙත්. මේ රූපසංඥාවන් ඉක්මගියේ වෙයි, වෙසෙසින් ඉක්මගියේ මොනවට ඉක්මගියේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සබ්බසො රූපසඤ්ඤාන. සමතික්කමා ' යි.

660. ' පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා ' යනු : එහි ' ප්‍රතිඝසංඥා ' කවර යත් : රූපසංඥා ය, ශබ්දසංඥා ය, ගන්ධසංඥා ය, රසසංඥා ය, ස්පර්ශසංඥා යි. මොහු ' ප්‍රතිඝසංඥා ' යි කියනු ලැබෙත්. මේ ප්‍රතිඝසංඥාවෝ සන්හිඳුණාහු වෙති, සන්හිඳුවන ලද්දහු වෙසෙසින් සන්හිඳුණාහු අස්තයට ගියාහු වෙසෙසින් අස්තයට ගියාහු අර්පිත වූවාහු ව්‍යර්පිත වූවාහු වියළන ලද්දහු වෙසෙසින් වියළන ලද්දහු විගතාන්ත කරන ලද්දහු වෙත්. එහෙයින් කියනු ලැබෙයි ' පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා ' යි.

661. ' නානත්තසඤ්ඤානං අමනසිකාරා ' යනු : එහි ' නානාත්වසංඥා ' කවර යත් : මනොධාතුසමඞ්ගී වූ හෝ මනොවිඥානධාතුසමඞ්ගී වූ හෝ අසමාපන්නයාගේ සංඥායෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මොහු ' නානාත්වසංඥා ' යි කියනු ලැබෙත්. මේ නානාත්වසංඥාවන් නො මෙනෙහි කෙරෙයි. එහෙයින් කියනු ලැබෙයි ' නානත්ත සඤ්ඤානං අමනසිකාරා ' යි.

662. ' අනන්තො ආකාසො ' යනු : එහි ආකාශය කවරෙ යත් : යම් ආකාශයෙක් ආකාශගතයෙක් (නො ගැටෙන හෙයින්) අඝයෙක් අඝගතයෙක් විවරයෙක් විවරගත යෙක් සතර මහාභූතයන් විසින් නො පහස්නා ලද්දෙක් වේ ද, මේ ' ආකාශ ' යි කියනු ලැබේ. ඒ ආකාශයෙහි සිත තබයි, මොනොවට තබයි, අනන්ත ව පතුරයි. එහෙයින් කියනු ලැබෙයි ' අනන්තො ආකාසො ' යි.

663. ' ආකාසානඤ්චායතනං ' යනු : ආකාසානඤ්චායතනයට සමවන්හු ගේ හෝ පැමිණියහුගේ හෝ ඉහාත්මසුඛවිහාර ඇත්තහුගේ හෝ චිත්තචෛතසික ධර්මයෝ යි.

664. ' උපසම්පජ්ජ ' යනු : ආකාසානඤ්චායතනයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සාක්ෂාත්ක්‍රියායෙක් පැමිණීමෙක් වේ ද එය යි.

665. ' විහරති ' යනු . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

666. 'සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්මා'ති, ඉමං ආකාසානඤ්චායතනං අතික්කන්තො හොති වීතික්කන්තො සමතික්කන්තො. 'තෙන වුච්චති සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්මා'ති.

667. 'අනන්තං විඤ්ඤාණ'න්ති තං යෙව ආකාසං විඤ්ඤාණෙන ඵුට්ඨං මනසිකරොති අනන්තං ඵරති. තෙන වුච්චති 'අනන්තං විඤ්ඤාණ'න්ති.

668. 'විඤ්ඤාණඤ්චායතන'න්ති විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා.

669. 'උපසම්පජ්ජා'ති යො විඤ්ඤාණඤ්චායතනස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

670. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

671. 'සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්මා'ති ඉමං විඤ්ඤාණඤ්චායතනං අතික්කන්තො හොති වීතික්කන්තො සමතික්කන්තො. තෙන වුච්චති 'සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්මා'ති.

672. 'නත්ථි කිඤ්චී'ති තං යෙව විඤ්ඤාණං භාවෙති විභාවෙති අන්තරධාපෙති නත්ථි කිඤ්චීති පස්සති. තෙන වුච්චති 'නත්ථි කිඤ්චී'ති.

673. 'ආකිඤ්චඤ්ඤායතන'න්ති ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා.

674. 'උපසම්පජ්ජා'ති යො ආකිඤ්චඤ්ඤායතනස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

675. 'විහරතී'ති -පෙ- තෙන වුච්චති 'විහරතී'ති.

676. 'සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්මා'ති ඉමං ආකිඤ්චඤ්ඤායතනං අතික්කන්තො හොති වීතික්කන්තො සමතික්කන්තො. තෙන වුච්චති 'සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්මා'ති.

677. 'නෙවසඤ්ඤීනාසඤ්ඤී'ති තං යෙව ආකිඤ්චඤ්ඤායතනං සන්තතො මනසිකරොති සඞ්ඛාරාවසෙසසමාපත්තිං භාවෙති. තෙන වුච්චති 'නෙවසඤ්ඤීනාසඤ්ඤී'ති.

678. 'නෙවසඤ්ඤානාසඤ්ඤායතන'න්ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා' චිත්තචෙතසිකා ධම්මා.

679. 'උපසම්පජ්ජා'ති යො නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා.

680. 'විහරතී'ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති 'විහරතී'ති.

සුත්තන්තභාජනීයං

---

666. ' සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම ' යනු : මේ ආකාසානඤ්චා යතනය ඉක්මගියේ වෙයි, වෙසෙසින් ඉක්මගියේ මොනොවට ඉක්මගියේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම ' යි.

667. ' අනන්තං විඤ්ඤාණං ' යනු : විඥානයෙන් පහස්නා ලද එම ආකාශය මෙනෙහි කෙරෙයි. අනන්ත යි පතුරයි. එහෙයින් කියනු ලැබෙයි ' අනන්තං විඤ්ඤාණං ' යි.

668. ' විඤ්ඤාණඤ්චායතනං ' යනු : විඤ්ඤාණඤ්චායතනයට සමවන්හුගේ හෝ පැමිණියහුගේ හෝ දෘෂ්ටධර්මසුඛවිහාර ඇත්තහුගේ හෝ චිත්තචෛතසිකධර්මයෝ යි.

669. ' උපසම්පජ්ජ ' යනු : විඤ්ඤාණඤ්චායතනයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් පැහැස්මෙක් පසක්කිරීමෙක් පැමිණීමෙක් වේ ද එය යි.

670. ' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

671. ' සබ්බසො විඤ්ඤාණඤ්චායතනං ' සමතික්කම්ම යනු : මේ විඤ්ඤාණඤ්චා යතනය ඉක්මගියේ වෙයි වෙසෙසින් ඉක්මගියේ මැනැවින් ඉක්මගියේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම ' යි.

672. ' නත්ථි කිඤ්චි ' යනු : එ ම විඥානය වඩයි, වෙසෙසින් වඩයි, අතුරුදහන් කෙරෙයි, ' කිසිවක් නැතැ ' යි බලයි. එහෙයින් කියනු ලැබෙයි ' නත්ථි කිඤ්චි ' යි.

673. ' ආකිඤ්චඤ්ඤායතනං ' යනු : ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හු ගේ හෝ පැමිණියහු ගේ හෝ දෘෂ්ටධර්මසුඛවිහාර ඇත්තහුගේ හෝ චිත්තචෛතසිකධර්මයෝ යි.

674. ' උපසම්පජ්ජ ' යනු : ආකිඤ්චඤ්ඤායතනයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් පැහැස්මෙක් පසක්කිරීමෙක් පැමිණීමෙක් වේ ද එය යි.

675. ' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

676. ' සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම ' යනු : මේ ආකිඤ්චඤ්ඤා යතනය ඉක්මගියේ වෙයි, වෙසෙසින් ඉක්මගියේ මැනැවින් ඉක්මගියේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම ' යි.

677. ' නෙවසඤ්ඤීනාසඤ්ඤී ' යනු : එ ම ආකිඤ්චඤ්ඤායතනය ශාන්තවශයෙන් මෙනෙහි කෙරෙයි, සංස්කාරාවශෙෂ සමාපත්තිය වඩයි, එහෙයින් කියනු ලැබෙයි ' නේවසඤ්ඤීනාසඤ්ඤී ' යි.

678 ' නේවසඤ්ඤානාසඤ්ඤායතනං ' යනු : නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්හු ගේ හෝ පැමිණියහුගේ හෝ දෘෂ්ටධර්මසුඛවිහාර ඇත්තහුගේ හෝ චිත්තචෛතසික ධර්මයෝ යි.

679. ' උපසම්පජ්ජ ' යනු : නේවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ යම් ලාභයෙක් ප්‍රතිලාභයෙක් ප්‍රාප්තියක් සම්ප්‍රාප්තියක් ස්පර්ශයෙක් සාක්ෂාත්ක්‍රියායෙක් පැමිණීමෙක් වේ ද එය යි.

680. ' විහරති ' යනු : ඉරියවු පවත්වයි, වැටෙයි, පාලනය කෙරෙයි, යැපෙයි යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසේ. එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

**සූත්‍රාන්තභාජනීය යි.**

---

681. චත්තාරි ඣානානි: පඨමං ඣානං[1] දුතියං ඣානං තතියං ඣානං චතුත්ථං ඣානං.

682. තත්ථ කතමං පඨමං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

683. තත්ථ කතමං දුතියං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති දුතියං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

684. තත්ථ කතමං තතියං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති තතියං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

685. තත්ථ කතමං චතුත්ථං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

686. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

687. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි අවිතක්කං විචාරමත්තං[2] විවෙකජං පීති සුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ චතුරඞ්ගිකං ඣානං හොති. විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති දුතියං ඣානං. අවසෙසා ධම්මා ඣාන සම්පයුත්තා.

688. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති තතියං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

689. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති. සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

---

1. පඨමජ්ඣානං - සිරිමු.
2. අවිතක්කවිචාරමත්තං - සීපෑවි.

681. ධ්‍යානයෝ සතර දෙනෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතියධ්‍යාන ය, තෘතියධ්‍යාන ය, චතුර්ථධ්‍යාන යි.

682. එහි ප්‍රථමධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගිකධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තයාගේ එකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ ' අවශේෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

683. එහි ද්විතියධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . පඨවිකසිණ ද්විතියධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ත්‍ර්‍යාඞ්ගධ්‍යානය වෙයි : ප්‍රීති ය සුඛ ය චිත්තෛකාග්‍රතා යි. මේ ' ද්විතියධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

684. එහි තෘතියධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . පඨවිකසිණ තෘතියධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යාඞ්ගධ්‍යානය වෙයි : සුඛ ය චිත්තෛකාග්‍රතා යි. මේ ' තෘතියධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

685. එහි චතුර්ථධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . පඨවිකසිණ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යාඞ්ගධ්‍යානය වෙයි : උපේක්ෂා ය චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

686. මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

687. මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම අවිතර්ක වූ විචාර මාත්‍ර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති පඨවිකසිණ ද්විතියධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි චතුරඞ්ගධ්‍යානය වෙයි : විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ද්විතියධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

688. මෙ සස්නෙහි මහණ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් . . . පඨවිකසිණ තෘතියධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ත්‍ර්‍යාඞ්ගධ්‍යානය වෙයි : ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' තෘතියධ්‍යාන යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

689. මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . පඨවිකසිණ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යාඞ්ගධ්‍යානය වෙයි : සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

6—ඕමී 17626 (3/75)

Free Distribution www.aathaapi.org

690. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. සුඛස්ස ච පහානා -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඤ්චමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

691 ඉධ භික්ඛු යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා-සහගතං. සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

692. චත්තාරි ඣානානි: පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං, චතුත්ථං ඣානං.

693. තත්ථ කතමං පඨමං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං. දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති. විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

694 තත්ථ කතමං දුතියං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති දුතියං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

තත්ථ කතමං තතියං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති තතියං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

696. තත්ථ කතමං චතුත්ථං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

697. ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති. විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

690. මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . පඨවිකසිණ පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : උපේක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' පඤ්චම ධ්‍යාන යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

691. මෙ සස්නෙහි මහණ යම් කලෙක අරූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . නේවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ සහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : උපේක්ෂා ය, චිත්තෛකාග්‍රතායි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

692. ධ්‍යාන සතරෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථධ්‍යාන යි.

693. එහි ප්‍රථමධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . දුක් වූ ප්‍රතිපද ඇති ලැසි වූ අභිඥ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන යි' කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

694. එහි ද්විතීයධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . දුඃඛ ප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ත්‍ර්‍යඞ්ගධ්‍යානය වෙයි : ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ද්විතීයධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

695. එහි තෘතීයධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' තෘතීයධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

696. එහි චතුර්ථධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂ ධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

697. මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

698. ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි අවිතක්කං විචාරමත්තං විවෙකජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ චතුරඞ්ගිකං ඣානං හොති විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති දුතියංඣානං අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

699. ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං. දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති තතියංඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

700. ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථංඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

701. ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා සුඛස්ස ච පහානා -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඤ්චමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

702. චත්තාරි ඣානානි : පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං, චතුත්ථං ඣානං.

703. තත්ථ කතමං පඨමං ඣානං : ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව රූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති. විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

704 තත්ථ කතමං දුතියං ඣානං : ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති. ඉමෙ ධම්මා කුසලා. තස්සෙව රූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති. උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඤ්චමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා -පෙ-

698. මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම අවිතර්ක වූ විචාරමාත්‍ර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි චතුරඞ්ගධ්‍යානය වෙයි : විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ද්විතීයධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

699. මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ තෘතීය ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ත්‍ර්‍යඞ්ගධ්‍යානය වෙයි : ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකග්‍රතා යි. මේ ' තෘතීයධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

700. මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍ය්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යඞ්ගධ්‍යානය වෙයි : සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

701. මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යඞ්ගධ්‍යානය වෙයි : උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' පඤ්චමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

702. ධ්‍යාන සතරෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථ ධ්‍යාන යි.

703. එහි ප්‍රථමධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම රූපාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණ විපාකප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

704. එහි ද්විතීයධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . පෘථිවිකෘත්ස්න ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මෙ ධර්මයෝ කුශලයෝ යි. එ ම රූපාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් . . . විපාක වූ පෘථිවිකෘත්ස්න ද්විතීයධ්‍යානයට . . . තෘතීයධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට . . . ප්‍රථමධ්‍යානයට . . . පෘථිවිකෘතස්න පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යඞ්ගධ්‍යානය වෙයි : උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' පඤ්චමධ්‍යාන ' යි කියනු ලැබේ අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි . . .

705. ඉධ භික්ඛු යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති. ඉමෙ ධම්මා කුසලා. තස්සෙව අරූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතා සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

706. චත්තාරි ඣානානි : පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං, චතුත්ථං ඣානං.

707. තත්ථ කතමං පඨමං ඣානං : ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති : විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා. ඉදං වුච්චති පඨමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

708. තත්ථ කතමං දුතියං ඣානං : ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං. තස්මිං සමයෙ ඵස්සො හොති, -පෙ- අවික්ඛෙපො හොති. ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස ඣානස්ස කතත්තා භාවිතත්තා විපාකං විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඤ්චමං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

709. චත්තාරි ඣානානි : පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං, චතුත්ථං ඣානං.

710 තත්ථ කතමං පඨමං ඣානං : ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං. විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති. විතක්කො විචාරො පීති සුඛං චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඨමං ඣානං අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා.

705 මෙ සස්නෙහි මහණ යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා සුඛයාගේ ද ප්‍රහාණයෙන් .. නේවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ සහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි .. අවික්ෂේපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම අරූපාවචර කුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉකම, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... නේවසඤ්ඤානාසඤ්ඤායතන සංඥ සහගත වූ විපාක චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

706. ධ්‍යාන සතරෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථ ධ්‍යාන යි.

707. එහි ප්‍රථමධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම ලොකොත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාක ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශේෂ ධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

708. එහි ද්විතීයධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචය ගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... දුඃඛ ප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම ලෝකෝත්තරකුශලධ්‍යානය කළ බැවින් වැඩූ බැවින් විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාක වූ ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්වයඞ්ගධ්‍යානය වෙයි : උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' පඤ්චමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යි.

709. ධ්‍යාන සතරෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථ ධ්‍යාන යි.

710. එහි ප්‍රථමධ්‍යාන කවරෙ යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහරණ ඇති රූපාවචර ක්‍රියාධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි පඤ්චාඞ්ගධ්‍යානය වෙයි : විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෛතකාග්‍රතා යි. මේ ' ප්‍රථමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

තත්ථ කතමං දුතියං ඣානං: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං, විතක්කවිචාරානං වූපසමා-පෙ-දුතියං ඣානං-පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා, ඉදං වුච්චති පඤ්චමං ඣානං අවසෙසා ධම්මා ඣානසම්පයුත්තා-පෙ-.

712. ඉධ භික්ඛු යස්මිං සමයෙ අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං. සුඛස්ස ච පහානා-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති උපෙක්ඛා චිත්තස්ස එකග්ගතා. ඉදං වුච්චති චතුත්ථං ඣානං. අවසෙසා ධම්මා ඣානසම්පයුත්තාති.

## අභිධම්මභාජනියං.

---

713. චත්තාරි ඣානානි: පඨමං ඣානං දුතියං ඣානං තතියං ඣානං චතුත්ථං ඣානං.

714. චතුන්නං ඣානානං කති කුසලා, කති අකුසලා, කති අව්‍යාකතා-පෙ-කති සරණා, කති අරණා:

715. සියා කුසලා සියා අව්‍යාකතා.

තීණි ඣානානි එත්ථුප්පන්නං සුඛං වෙදනං ඨපෙත්වා සුඛාය වෙදනාය සම්පයුත්තා. චතුත්ථං ඣානං එත්ථුප්පන්නං අදුක්ඛමසුඛං වෙදනං ඨපෙත්වා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තං.

සියා විපාකා, සියා විපාකධම්මධම්මා, සියා නෙව විපාක න විපාකධම්මධම්මා.

සියා උපාදින්නුපාදානියා සියා අනුපාදින්නුපාදානියා සියා අනුපාදින්නඅනුපාදානියා.

සියා අසංකිලිට්ඨසංකිලෙසිකා සියා අසංකිලිට්ඨඅසංකිලෙසිකා.

පඨමං ඣානං එත්ථුප්පන්නෙ විතක්කවිචාරෙ ඨපෙත්වා සවිතක්කං සවිචාරං. තීණි ඣානානි අවිතක්කඅවිචාරා.

ද්වෙ ඣානා එත්ථුප්පන්නං පීතිං ඨපෙත්වා පීතිසහගතා. තීණි ඣානානි එත්ථුප්පන්නං සුඛං ඨපෙත්වා සුඛසහගතා. චතුත්ථං ඣානං එත්ථුප්පන්නං උපෙක්ඛං ඨපෙත්වා උපෙක්ඛාසහගතං.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බා.

නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

711. එහි ද්විතීයධ්‍යාන කවරේ යත්: මෙ සස්නෙහි මහණ යම් කලෙක නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහාර ඇති රූපාවචර ක්‍රියාධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . පෘථිවීකෘත්ස්නද්විතීය ධ්‍යානයට . . . තෘතීයධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට . . . ප්‍රථමධ්‍යානයට . . . පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යඞ්ගධ්‍යානය වෙයි: උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' පඤ්චමධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යාන සම්ප්‍රයුක්තයෝ යි.

712. මෙ සස්නෙහි මහණ යම් කලෙක සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගත වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහරණ ඇති අරූපාවචරක්‍රියාධ්‍යානය වඩා ද, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ද්ව්‍යඞ්ග ධ්‍යානය වෙයි: උපෙක්ෂා ය, චිත්තෛකාග්‍රතා යි. මේ ' චතුර්ථධ්‍යාන ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ ධ්‍යානසම්ප්‍රයුක්තයෝ යයි.

අභිධර්මභාජනීය යි.

---

713. ධ්‍යාන සතරෙකි: ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථ ධ්‍යාන යි.

714. සතර ධ්‍යානයන් අතුරෙහි කෙතෙක් කුශලයෝ ද, කෙතෙක් අකුශලයෝ ද, කෙතෙක් අව්‍යාකෘතයෝ ද, . . . කෙතෙක් සරණයෝ ද, කෙතෙක් අරණයෝ ද යත්:

715. (සතර ධ්‍යානයෝ) කුශල ද වන්නාහු ය, අව්‍යාකෘත ද වන්නාහු යි.

ධ්‍යානයෝ තිදෙනෙක් මෙහි උපන් සුඛවෙදනාව තබා සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත යෝ ය. චතුර්ථධ්‍යානය මෙහි උපන් අදුක්ඛමසුඛ වෙදනාව තබා අදුක්ඛමසුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත යි.

(සතර ධ්‍යානයෝ) විපාක ද වන්නාහ, විපාකස්වභාවධර්ම ද වන්නාහ, නො ම විපාක වූ නො ද විපාකස්වභාවධර්ම ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) උපාදින්නොපාදනිය ද වන්නාහ, අනුපාදින්නොපාදනිය ද වන්නාහ, අනුපාදින්නඅනුපාදනිය ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) අසංක්ලිෂ්ටසාංක්ලෙශික ද වන්නාහ, අසංක්ලිෂ්ටඅසාංක්ලෙශික ද වන්නාහු ය.

ප්‍රථමධ්‍යානය මෙහි උපන් විතර්කවිචාරයන් තබා සවිතර්ක ය, සවිචාර ය. ධ්‍යානයෝ තිදෙනෙක් අවිතර්කඅවිචාරයෝ යි.

ධ්‍යානයෝ දෙදෙදෙනෙක් මෙහි උපන් ප්‍රීතිය තබා ප්‍රීතිසහගතයෝ ය. ධ්‍යානයෝ තිදෙනෙක් මෙහි උපන් සුඛය තබා සුඛසහගතයෝ ය. චතුර්ථධ්‍යානය මෙහි උපන් උපෙක්ෂාව තබා උපෙක්ෂාසහගත යි.

(සතර ධ්‍යානයෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ යි.

(සතර ධ්‍යානයෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ය.

සියා ආචයගාමිනො සියා අපචයගාමිනො සියා නෙව ආචය-ගාමිනාපචයගාමිනො.

සියා සෙක්ඛා සියා අසෙක්ඛා සියා නෙවසෙක්ඛානාසෙක්ඛා.

සියා මහග්ගතා සියා අප්පමාණා.

තීණි ඣානානි න වත්තබ්බා පරිත්තාරම්මණාතිපි මහග්ගතාරම්මණාතිපි සියා අප්පමාණාරම්මණා සියා න වත්තබ්බා අප්පමාණාරම්මණාති. චතුත්ථං ඣානං සියා පරිත්තාරම්මණං සියා මහග්ගතාරම්මණං සියා අප්පමාණාරම්මණං සියා න වත්තබ්බං පරිත්තාරම්මණන්තිපි මහග්ගතා-රම්මණන්තිපි අප්පමාණාරම්මණන්තිපි.

සියා මජ්ඣිමා සියා පණීතා.

සියා සම්මත්තනියතා සියා අනියතා.

තීණි ඣානානි න මග්ගාරම්මණා සියා මග්ගහෙතුකා සියා මග්ගාධි-පතිනො සියා න වත්තබ්බා මග්ගහෙතුකාති'පි මග්ගාධිපතිනොති'පි චතුත්ථං ඣානං සියා මග්ගාරම්මණං සියා මග්ගහෙතුකං සියා මග්ගාධිපති සියා න වත්තබ්බං මග්ගාරම්මණන්ති'පි මග්ගහෙතුකන්ති'පි මග්ගාධිපතීති'පි.

සියා උප්පන්නා සියා අනුප්පන්නා සියා උප්පාදිනො.

සියා අතීතා සියා අනාගතා සියා පච්චුප්පන්නා.

තීණි ඣානානි න වත්තබ්බා අතීතාරම්මණාති'පි අනාගතා-රම්මණාති'පි පච්චුප්පන්නාරම්මණාති'පි. චතුත්ථං ඣානං සියා අතීතා-රම්මණං සියා අනාගතාරම්මණං සියා පච්චුප්පන්නාරම්මණං. සියා න වත්තබ්බං අතීතාරම්මණන්ති'පි අනාගතාරම්මණන්ති'පි පච්චුප්පන්නා-රම්මණන්ති'පි.

සියා අජ්ඣත්තා සියා බහිද්ධා සියා අජ්ඣත්තබහිද්ධා.

තීණි ඣානානි බහිද්ධාරම්මණා. චතුත්ථං ඣානං සියා අජ්ඣත්තාරම්මණං සියා බහිද්ධාරම්මණං සියා අජ්ඣත්තබහිද්ධාරම්මණං සියා න වත්තබ්බං අජ්ඣත්තාරම්මණන්ති'පි බහිද්ධාරම්මණන්ති'පි අජ්ඣත්තබහිද්ධාරම්ම-ණන්ති'පි.

716. අනිදස්සනඅප්පටිඝා.

න හෙතු.

සහෙතුකා.

හෙතුසම්පයුත්තා.

න වත්තබ්බා හෙතු චෙව සහෙතුකාති, සහෙතුකා චෙව න ච හෙතු

න වත්තබ්බා හෙතු චෙව හෙතුසම්පයුත්තාති, හෙතුසම්පයුත්තා චෙව න ච හෙතු.

න හෙතු සහෙතුකා.

Free Distribution www.aathaapi.org

(සතර ධ්‍යානයෝ) ආචයගාමී ද වන්නාහ, අපචයගාමී ද වන්නාහ, නො ම ආචයගාමී නො ද අපචයගාමී ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) ශෛක්ෂ ද වන්නාහ, අශෛක්ෂ ද වන්නාහ, නො ම ශෛක්ෂ නො ද අශෛක්ෂ ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) මහද්ගත ද වන්නාහ, අප්‍රමාණ ද වන්නාහු ය.

ධ්‍යානයෝ තිදෙනෙක් පරිත්තාලම්බනහ යි ද මහද්ගතාලම්බනහ යි ද නො කිය යුත්තාහ. අප්‍රමාණාලම්බන ද වන්නාහ, අප්‍රමාණාලම්බනහ යි නො කියයුතු ද වන්නාහ. චතුර්ථධ්‍යානය පරිත්තාලම්බන ද වන්නේ ය, මහද්ගතාලම්බන ද වන්නේ ය, අප්‍රමාණාලම්බන ද වන්නේ ය, පරිත්තාලම්බන යි ද මහද්ගතාලම්බන යි ද අප්‍රමාණාලම්බන යි ද නො කියයුතු ද වන්නේ යි.

(සතර ධ්‍යානයෝ) මධ්‍යම ද වන්නාහ, ප්‍රණීත ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) සම්‍යක්ත්වනියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

තුන් ධ්‍යානයෝ මාර්ගාලම්බන නො වෙති. මාර්ගහේතුක ද වන්නාහ, මාර්ගාධිපති ද වන්නාහ, මාර්ගහෙතුකහ යි ද මාර්ගාධිපතිහ යි ද නො කියයුතු ද වන්නාහ. චතුර්ථ ධ්‍යානය මාර්ගාලම්බන ද වන්නේ ය, මාර්ගහෙතුක ද වන්නේ ය, මාර්ගාධිපති ද වන්නේ ය. මාර්ගාලම්බන යි ද මාර්ගහෙතුක යි ද මාර්ගාධිපති යි ද නො කියයුතු ද වන්නේ යි.

(සතර ධ්‍යානයෝ) උත්පන්න ද වන්නාහ, අනුත්පන්න ද වන්නාහ, උත්පාදී ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) අතීත ද වන්නාහ, අනාගත ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්න ද වන්නාහු ය.

තුන් ධ්‍යානයෝ අතීතාලම්බනහ යි ද අනාගතාලම්බනහ යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බනහ යි ද නො කියයුත්තාහ. චතුර්ථධ්‍යානය අතීතාලම්බන ද වන්නේ ය, අනාගතාලම්බන ද වන්නේ ය, ප්‍රත්‍යුත්පන්නාලම්බන ද වන්නේ ය, අතීතාලම්බන යි ද අනාගතාලම්බන යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන යි ද නො කියයුතු ද වන්නේ යි.

(සතර ධ්‍යානයෝ) අධ්‍යාත්ම ද වන්නාහ, බාහිර ද වන්නාහ, අධ්‍යාත්මබාහිර ද වන්නාහු ය.

තුන් ධ්‍යානයෝ බාහිරාලම්බනයෝ ය. චතුර්ථධ්‍යානය අධ්‍යාත්මාලම්බන ද වන්නේ ය, බාහිරාලම්බන ද වන්නේ ය, අධ්‍යාත්මබාහිරාලම්බන ද වන්නේ ය, අධ්‍යාත්මාලම්බන යි ද බාහිරාලම්බන යි ද අධ්‍යාත්මබාහිරාලම්බන යි ද නො කියයුතු ද වන්නේ යි.

716. (සතර ධ්‍යානයෝ) අනිදර්ශන අප්‍රතිඝයෝ යි.

(සතර ධ්‍යානයෝ) හේතූහු නො වෙත්.

(සතර ධ්‍යානයෝ) සහේතුකයෝ යි.

(සතර ධ්‍යානයෝ) හේතු සම්ප්‍රයුක්තයෝ යි.

(සතර ධ්‍යානයෝ) හේතු ද වූ ම සහේතුකහ යි නො කියයුත්තාහ. සහේතුක ද වූවාහු ම නො ද හේතු වෙත්.

(සතර ධ්‍යානයෝ) හේතු ද වූ ම හේතුසම්ප්‍රයුක්තහ යි නො කියයුත්තාහ. හේතු සම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද හේතු වෙත්.

(සතර ධ්‍යානයෝ) හේතු නො වූ සහේතුකයෝ යි.

717. සප්පච්චයා, සඞ්ඛතා.

අනිදස්සනා.

අප්පටිඝා.

අරූපා.

සියා ලොකියා සියා ලොකුත්තරා.

කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

718. නො ආසවා.

සියා සාසවා සියා අනාසවා.

ආසවවිප්පයුත්තා.

න වත්තබ්බා ආසවා චෙව සාසවා චාති, සියා සාසවා චෙව නො ච ආසවා, සියා න වත්තබ්බා සාසවා චෙව නො ච ආසවාති.

න වත්තබ්බා ආසවා චෙව ආසවසම්පයුත්තාති'පි, ආසවසම්පයුත්තා චෙව නො ච ආසවාති'පි.

සියා ආසවවිප්පයුත්තා සාසවා, සියා ආසවවිප්පයුත්තා අනාසවා.

719. නො සඤ්ඤොජනා-පෙ-නො ගන්ථා-පෙ-නො ඔඝා-පෙ-නො යොගා-පෙ-නො නීවරණා-පෙ-නො පරාමාසා-පෙ-.

720. සාරම්මණා.

නො චිත්තා.

චෙතසිකා.

චිත්තසම්පයුත්තා.

චිත්තසංසට්ඨා.

චිත්තසමුට්ඨානා.

චිත්තසහභුනො.

චිත්තානුපරිවත්තිනො.

චිත්තසංසට්ඨසමුට්ඨානා.

චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

බාහිරා.

නො උපාදා.

සියා උපාදින්නා, සියා අනුපාදින්නා.

Free Distribution www.aathaapi.org

717. (සතර ධ්‍යානයෝ) සප්‍රත්‍යයෝ යි.

(සතර ධ්‍යානයෝ) සඞ්ඛතයෝ යි.

(සතර ධ්‍යානයෝ) අනිදර්ශනයෝ යි.

(සතර ධ්‍යානයෝ) අප්‍රතිඝයෝ යි.

(සතර ධ්‍යානයෝ) අරූපයෝ යි.

(සතර ධ්‍යානයෝ) ලෞකික ද වන්නාහ, ලොකොත්තර ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) කිසිවිඥානයෙකින් දතයුත්තාහ, කිසි විඥානයෙකින් නො දත යුත්තාහු ය.

718. (සතර ධ්‍යානයෝ) ආස්‍රවයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) සාස්‍රව ද වන්නාහ, අනාස්‍රව ද වන්නාහු යි.

(සතර ධ්‍යානයෝ) ආස්‍රවවිප්‍රයුක්තයෝ යි.

(සතර ධ්‍යානයෝ) ආස්‍රව ද වූ ම සාස්‍රවහ යි නො කියයුත්තාහ, සාස්‍රව ද වූවාහු ම නො ද ආස්‍රව ද වන්නාහ, සාස්‍රව ද වූ ම නො ද ආස්‍රවහ යි නො කියයුතු ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) ආස්‍රව ද වූ ම ආස්‍රවසම්ප්‍රයුක්තහ යි ද, ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

(සතර ධ්‍යානයෝ) ආස්‍රවවිප්‍රයුක්තසාස්‍රව ද වන්නාහ, ආස්‍රවවිප්‍රයුක්තඅනාස්‍රව ද වන්නාහු යි.

719. (සතර ධ්‍යානයෝ) සංයොජනයෝ නො වෙති . . . ග්‍රන්ථයෝ නො වෙති . . . ඔඝයෝ නො වෙති . . . යොගයෝ නො වෙති . . . නීවරණයෝ නො වෙති . . . පරාමර්ශයෝ නො වෙති. . .

720. (සතර ධ්‍යානයෝ) සාලම්බනයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) චෛතසිකයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තසම්ප්‍රයුක්තයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තසංසෘෂ්ටයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තසමුත්ථානයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තසහභූ වෙත්.

(සතර ධ්‍යානයෝ) චිත්තානුපරිවර්තීහු ය.

(සතර ධ්‍යානයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ යි.

(සතර ධ්‍යානයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූහු වෙත්.

(සතර ධ්‍යානයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහු වෙත්

(සතර ධ්‍යානයෝ) බාහිරයෝ යි.

(සතර ධ්‍යානයෝ) උපාද නො වෙත්.

(සතර ධ්‍යානයෝ) උපාදින්න ද වන්නාහ, අනුපාදින්න ද වන්නාහු යි.

721. නො උපාදානා-පෙ-නො කිලෙසා-පෙ-න දස්සනෙන පහාතබ්බා න භාවනාය පහාතබ්බා.

න දස්සනෙන පහාතබ්බහෙතුකා.

න භාවනාය පහාතබ්බහෙතුකා.

පඨමං ඣානං එත්ථුප්පන්නං විතක්කං ඨපෙත්වා සවිතක්කං. තීණි ඣානානි අවිතක්කා.

පඨමං ඣානං එත්ථුප්පන්නං විචාරං ඨපෙත්වා සවිචාරං. තීණි ඣානානි අවිචාරා.

ද්වෙ ඣානා එත්ථුප්පන්නං පීතිං ඨපෙත්වා සප්පීතිකා. ද්වෙ ඣානා අප්පීතිකා.

ද්වෙ ඣානා එත්ථුප්පන්නං පීතිං ඨපෙත්වා පීතිසහගතා. ද්වෙ ඣානා න පීතිසහගතා.

තීණි ඣානානි එත්ථුප්පන්නං සුඛං ඨපෙත්වා සුඛසහගතා. චතුත්ථංඣානං න සුඛසහගතං.

චතුත්ථං ඣානං එත්ථුප්පන්නං උපෙක්ඛං ඨපෙත්වා උපෙක්ඛාසහගතං. තීණි ඣානානි න උපෙක්ඛාසහගතා.

න කාමාවචරා.

සියා රූපාවචරා. සියා න රූපාවචරා.

තීණි ඣානානි න අරූපාවචරා. චතුත්ථං ඣානං සියා අරූපාවචරං සියා න අරූපාවචරං.

සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

සියා නිය්‍යානිකා, සියා අනිය්‍යානිකා.

සියා නියතා, සියා අනියතා.

සියා සඋත්තරා, සියා අනුත්තරා.

අරණාති.

පඤ්හපුච්ඡකං.

ඣානවිභඞ්ගො නිට්ඨිතො.

Free Distribution www.aathaapi.org

721. (සතර ධ්‍යානයෝ) උපාදනයෝ නො වෙත්. ...ක්ලෙශයෝ නො වෙත්. ...

(සතර ධ්‍යානයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ නො වෙත්.

ප්‍රථමධ්‍යානය මෙහි උපන් විතර්කය තබා සවිතර්ක ය, තුන් ධ්‍යානයෝ අවිතර්කයෝ යි.

ප්‍රථමධ්‍යානය මෙහි උපන් විචාරය තබා සවිචාර ය. තුන් ධ්‍යානයෝ අවිචාරයෝ යි.

ධ්‍යානයෝ දෙදෙනෙක් මෙහි උපන් ප්‍රීතිය තබා සප්‍රීතිකයෝ ය, ධ්‍යානයෝ දෙදෙනෙක් අප්‍රීතිකයෝ යි.

ධ්‍යානයෝ දෙදෙනෙක් මෙහි උපන් ප්‍රීතිය තබා ප්‍රීතිසහගතයෝ ය, ධ්‍යානයෝ දෙදෙනෙක් ප්‍රීතිසහගත නො වෙත්.

තුන් ධ්‍යානයෝ මෙහි උපන් සුඛය තබා සුඛසහගතයෝ යි. චතුර්ථධ්‍යානය සුඛසහගත නො වේ.

චතුර්ථධ්‍යානය මෙහි උපන් උපෙක්ෂාව තබා උපෙක්ෂාසහගත ය, තුන් ධ්‍යානයෝ උපෙක්ෂාසහගත නො වෙත්.

(සතර ධ්‍යානයෝ) කාමාවචරයෝ නො වෙත්.

(සතර ධ්‍යානයෝ) රූපාවචර ද වන්නාහ, රූපාවචර නො ද වන්නාහු ය.

තුන් ධ්‍යානයෝ අරූපාවචරයෝ නො වෙත්. චතුර්ථධ්‍යානය අරූපාවචර ද වන්නේ ය, අරූපාවචර නො ද වන්නේ යි.

(සතර ධ්‍යානයෝ) පර්‍යාපන්න ද වන්නාහ, අපර්‍යාපන්න ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) නෛර්‍යාණික ද වන්නාහ, අනෛර්‍යාණික ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) නියත ද වන්නාහ, අනියත ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) සඋත්තර ද වන්නාහ, අනුත්තර ද වන්නාහු ය.

(සතර ධ්‍යානයෝ) අරණයෝ යි.

පඤ්හපුච්ඡක යි.

ධ්‍යානවිභඞ්ග නිමි.

# 13. අප්පමඤ්ඤා විභඞ්ගො

722. චතස්සො අප්පමඤ්ඤායො. ඉධ භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං.[1] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන[2] ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං කරුණාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මුදිතාසහහතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

723. කථං ච භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති: සෙය්‍යථාපි නාම එකං පුග්ගලං පියං මනාපං දිස්වා මෙත්තායෙය්‍ය එවමෙව සබ්බෙ සත්තෙ මෙත්තාය ඵරති.

තත්ථ කතමා මෙත්තා: යා සත්තෙසු මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති. අයං වුච්චති මෙත්තා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය මෙත්තාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති මෙත්තා සහගතෙන චෙතසාති.

'එකං දිස'න්ති: පුරත්ථිමං වා දිසං පච්ඡිමං වා දිසං උත්තරං වා දිසං දක්ඛිණං වා දිසං උද්ධං වා අධො වා තිරියං වා විදිසං වා.

'ඵරිත්වා'ති: ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති: ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති[3] තෙන වුච්චති විහරතීති.

'තථා දුතිය'න්ති: යථෙව එකං දිසං තථා දුතියං දිසං, තථා තතියං දිසං, තථා චතුත්ථිං දිසං, තථා උද්ධං, තථා අධො, තථා තිරියං, තථා විදිසං.

---

1. චතුත්ථං - මජසං.
2. අබ්‍යාපජ්ජෙන - මජසං.
3. විචරති - සිමු 1, සිමු 2.



Free Distribution www.aathaapi.org

# 13. අප්‍රාමාණ්‍ය විභඞ්ගය

722. අප්‍රාමාණ්‍ය සතරෙකි : මෙ සස්නෙහි මහණ මෛත්‍රී සහගත සිතින් එක් දිශායෙක්හි (සත්ත්වයන්) ස්පර්ශ (අරමුණු) කොට වාස කෙරෙයි. එසෙයින් දෙ වැනි දිශායෙහි තුන් වැනි දිශායෙහි සතර වැනි දිශායෙහි (සත්ත්වයන් ස්පර්ශ කොට වෙසෙයි) මෙසේ උඩ යට සරස අනුදිග (සත්ත්වයන් ස්පර්ශ කොට වෙසෙයි.) සියලු තැන්හි සියල්ලන් ආත්මසමතායෙන් යුක්ත ව සියලු සත්ත්වයන් ඇති ලෝකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ මෛත්‍රීසහගත සිතින් ස්පර්ශ කොට වෙසෙයි. කරුණා සහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසෙයි. එසෙයින් දෙ වැනි දිශාව තුන් වැනි දිශාව සතර වැනි දිශාව (ස්පර්ශ කොට වෙසෙයි.) මෙසේ උඩ යට සරස අනුදිග (ස්පර්ශ කොට වෙසෙයි) සියලු තැන්හි සියල්ලන් ආත්මසමතායෙන් යුක්ත ව සියලු සත්ත්වයන් ඇති ලොකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ කරුණාසහගත සිතින් ස්පර්ශ කොට වෙසෙයි. මුදිතාසහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසෙයි. එසෙයින් දෙ වැනි දිශාව තුන් වැනි දිශාව සතර වැනි දිශාව (ස්පර්ශ කොට වෙසෙයි.) මෙසේ උඩ යට සරස අනුදිග (ස්පර්ශ කොට වෙසෙයි.) සියලු තැන්හි සියල්ලන් ආත්මසමතායෙන් යුක්ත ව සියලු සත්ත්වයන් ඇති ලෝකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ මුදිතාසහගත සිතින් ස්පර්ශ කොට වෙසෙයි. උපේක්ෂාසහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසෙයි. එසෙයින් දෙ වැනි දිශාව තුන් වැනි දිශාව සතර වැනි දිශාව (ස්පර්ශ කොට වෙසෙයි) මෙසේ උඩ යට සරස අනුදිග (ස්පර්ශ කොට වෙසෙයි) සියලු තැන්හි සියල්ලන් ආත්මසමතායෙන් යුක්ත ව සියලු සත්ත්වයන් ඇති ලොකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ උපේක්ෂාසහගත සිතින් ස්පර්ශ කොට වෙසේ.

723. කිසෙයින් මහණ මෛත්‍රීසහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසේ ද යත් : යම්සේ නම් ප්‍රිය වූ මනවඩන්නා වූ එක් පුද්ගලයකු දැක මෛත්‍රිය කරන්නේ ද, එපරිද්දෙන් ම සියලු සත්ත්වයන් මෛත්‍රියෙන් ස්පර්ශ කෙරෙයි.

එහි 'මෛත්‍රී' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් මෛත්‍රියක් මෙත් කරන අයුරෙක් මෙත් කළ බවෙක් මෛත්‍රීචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෛත්‍රී ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් හෘදයෙක් පණ්ඩර වූ භවාඞ්ගචිත්තයෙක් මන සඞ්ඛ්‍යාත මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥන ස්කන්ධයෙක් තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ මෛත්‍රිය හා සහගත සහජාත සංසෘෂ්ට සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' මෙත්තාසහගතෙන චෙතසා ' යි.

' එකං දිසං ' යනු : පෙරදිග හෝ අවරදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ උඩ හෝ යට හෝ සරස හෝ අනුදිග හෝ යි.

' ඵරිත්වා ' යනු : (අරමුණු කිරීම් වශයෙන්) ස්පර්ශ කොට වෙසෙසින් බැසගෙන.

' විහරති ' යනු : ඉරියවු පවත්වයි, පවතියි, පාලනය, කෙරෙයි, යැපෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසේ. එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

' තථා දුතියං ' යනු : එක් දිශායෙක්හි යම් බඳු ද, දෙ වැනි දිශායෙහි එබඳු ය, තුන් වැනි දිශායෙහි එබඳු ය, සතර වැනි දිශායෙහි එබඳු ය, උඩ එබඳු ය, යට එබඳු ය, සරස එබඳු ය, අනුදිග එබඳු යි.


Free Distribution www.aathaapi.org

‘සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක’න්ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදාය වචනමෙතං ‘සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක’න්ති

‘මෙත්තාසහගතෙන චෙතසා’ති තත්ථ කතමා මෙත්තා: යා සත්තෙසු මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති අයං වුච්චති මෙත්තා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං-පෙ-තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය මෙත්තාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති මෙත්තාසහගතෙන චෙතසාති.

‘විපුලෙනා’ති යං විපුලං තං මහග්ගතං, යං මහග්ගතං තං අප්පමාණං, යං අප්පමාණං සො අවෙරො, යො අවෙරො සො අව්‍යාපජ්ඣො[1].

‘ඵරිත්වා’ති ඵරිත්වා අධිමුච්චිත්වා.

‘විහරතී’ති -පෙ- තෙන වුච්චති විහරතීති.

724. කථඤ්ච භික්ඛු කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති: සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුග්ගතං දුරූපෙතං දිස්වා කරුණායෙය්‍ය, එවමෙව සබ්බෙ සත්තෙ කරුණාය ඵරති[2].

තත්ථ කතමා කරුණා: යා සත්තෙසු කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං-පෙ-තජ්ජාමනොවිඤ්ඤාණධාතු ඉදං වුච්චති චිත්තං, ඉදං චිත්තං ඉමාය කරුණාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති ‘කරුණාසහගතෙන චෙතසා’ති.

‘එකං දිස’න්ති: පුරත්ථිමං වා දිසං පච්ඡිමං වා දිසං උත්තරං වා දිසං දක්ඛිණං වා දිසං උද්ධං වා අධො වා තිරියං වා විදිසං වා.

‘ඵරිත්වා’ති: ඵරිත්වා අධිමුච්චිත්වා.

‘විහරතී’ති -පෙ- තෙන වුච්චති ‘විහරතී’ති.

‘තථා දුතිය’න්ති: යථෙව එකං දිසං තථා දුතියං දිසං, තථා තතියං දිසං, තථා චතුත්ථිං දිසං, තථා උද්ධං, තථා අධො, තථා තිරියං, තථා විදිසං.

‘සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක’න්ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදාය වචනමෙතං ‘සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක’න්ති.

‘කරුණාසහගතෙන චෙතසා’ති තත්ථ කතමා කරුණා: යා සත්තෙසු කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය කරුණාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති කරුණාසහගතෙන චෙතසාති.

---

1. අව්‍යාපජ්ජො - මජසං
2. විහරති - සීමු 1, සීමු 2.

Free Distribution www.aathaapi.org

' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු : සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට ගෙන කීමෙකි තෙල ' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු.

' මෙත්තාසහගතෙන චෙතසා ' යනු : එහි ' මෙත්තා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් මෛත්‍රියක් මෙත් කරන අයුරෙක් මෙත් කළ බවෙක් මෛත්‍රීචිත්තවිමුක්ති යෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් චිත්ත යෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ මෛත්‍රිය සහගියේ වෙයි සහජාත-සංසෘෂ්ට-සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' මෙත්තාසහගතෙන චෙතසා ' යි.

' විපුලෙන ' යනු ; යමෙක් (යම් සිතෙක්) විපුල නම් හේ මහද්ගත ය, යමෙක් මහද්ගත නම් හේ අප්‍රමාණ ය, යමෙක් අප්‍රමාණ නම් හේ අවෛර ය, යමෙක් අවෛර නම් හේ අබ්‍යාපජ්ඣ (නිදුක්) යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ (අරමුණු) කොට වෙසෙසින් බැසගෙන.

' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

724. කිසෙයින් මහණ කරුණාසහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසේ ද යත් : යම්සේ නම් දුගී වූ කායදුශ්චරිතාදියෙන් යුක්ත වූ එක් පුද්ගලයකු දැක කුළුණුසිත් උපදවන්නේ ද, එසෙයින් ම සියලු සත්ත්වයන් කරුණායෙන් ස්පර්ශ කෙරෙයි.

එහි ' කරුණා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් කරුණායෙක් කුළුණු අයුරෙක් කරුණා කළ බවෙක් කරුණාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් සිතෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥන ධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ කරුණාව සහගියේ වෙයි, සහජාත-සංසෘෂ්ට-සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' කරුණා සහගතෙන චෙතසා ' යි.

' එකං දිසං ' යනු : පැදුම් දිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ උඩ හෝ යට හෝ සරස හෝ අනුදිග හෝ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අරමුණෙහි හෙළා යි.

' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

' තථා දුතියං ' යනු : එක් දිශායෙක්හි යම් බඳු ද දෙ වැනි දිශායෙහි එ බඳු ය, තුන් වැනි දිශායෙහි එ බඳු ය, සතර වැනි දිශායෙහි එ බඳු ය, උඩ එ බඳු ය, යට එ බඳු ය, සරස එ බඳු ය, අනුදිග එ බඳු යි.

' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු : සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට ගෙන කීමෙකි තෙල ' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු.

' කරුණාසහගතෙන චෙතසා ' යනු : එහි කරුණා කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් කරුණායෙක් කුළුණු අයුරෙක් කුළුණු කළ බවෙක් කරුණාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් සිතෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥනධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ කරුණාව සහගියේ වෙයි, සහජාත-සංසෘෂ්ට-සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' කරුණාසහගතෙන චෙතසා ' යි.

'විපුලෙනා'ති : යං විපුලං තං මහග්ගතං, යං මහග්ගතං තං අප්පමාණං, යං අප්පමාණං සො අවෙරො, යො අවෙරො සො අබ්‍යාපජ්ජො.

'ඵරිත්වා'ති : ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති : -පෙ- තෙන වුච්චති විහරතීති.

725. කථඤ්ච භික්ඛු මුදිතා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති : සෙය්‍යථාපි නාම එකං පුග්ගලං පියං මනාපං දිස්වා මුදිතො අස්ස, එවමෙව සබ්බෙ සත්තෙ මුදිතාය ඵරති.

තත්ථ කතමා මුදිතා : යා සත්තෙසු මුදිතා මුදිතායනා මුදිතායිතත්තං මුදිතාචෙතොවිමුත්ති, අයං වුච්චති මුදිතා. තත්ථ කතමං චිත්තං : යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය මුදිතාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති මුදිතා සහගතෙන චෙතසාති.

'එකං දිස'න්ති : පුරත්ථිමං වා දිසං පච්ඡිමං වා දිසං උත්තරං වා දිසං දක්ඛිණං වා දිසං උද්ධං වා අධො වා තිරියං වා විදිසං වා.

'ඵරිත්වා'ති : ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති : -පෙ- තෙන වුච්චති විහරතීති.

'තථා දුතිය'න්ති : යථෙව එකං දිසං තථා දුතියං දිසං, තථා තතියං දිසං, තථා චතුත්ථිං දිසං, තථා උද්ධං, තථා අධො, තථා තිරියං, තථා විදිසං.

'සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක'න්ති : සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදාය වචනමෙතං 'සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක'න්ති.

'මුදිතාසහගතෙන චෙතසා'ති : තත්ථ කතමා මුදිතා : යා සත්තෙසු මුදිතා මුදිතායනා මුදිතායිතත්තං මුදිතාචෙතොවිමුත්ති, අයං වුච්චති මුදිතා. තත්ථ කතමං චිත්තං : යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය මුදිතාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති 'මුදිතා සහගතෙන චෙතසා'ති.

'විපුලෙනා'ති : යං විපුලං තං මහග්ගතං, යං මහග්ගතං තං අප්පමාණං, යං අප්පමාණං සො අවෙරො, යො අවෙරො සො අබ්‍යාපජ්ජො.

'ඵරිත්වා'ති : ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති : -පෙ- තෙන වුච්චති විහරතීති.

' විපුලෙන ' යනු : යම් සිතෙක් විපුල නම් හේ මහද්ගත ය. යමෙක් මහද්ගත නම් හේ අප්‍රමාණ ය. යමෙක් අප්‍රමාණ නම් හේ අවෛර ය, යමෙක් අවෛර නම් හේ අව්‍යාපජ්ඣ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අරමුණෙහි හෙළා යි.

' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

725. කිසෙයින් මහණ මුදිතාසහගත සිතින් එක් දිශාවක් ස්පර්ශ කොට වෙසේ ද යත් : යම්සේ නම් ප්‍රිය වූ මනාප වූ එක් පුද්ගලයකු දක ප්‍රමුදිත වූයේ වන්නේ ද, එපරිද්දෙන් ම සියලු සත්ත්වයන් මුදිතායෙන් ස්පර්ශ කෙරෙයි.

එහි ' මුදිතා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් මුදිතායෙක් ප්‍රමොද අයුරෙක් ප්‍රමුදිත බවෙක් මුදිතාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මුදිතා ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥාන ධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබෙ. මේ චිත්තය මේ මුදිතාව සහගියේ වෙයි, සහජාත–සංසෘෂ්ට–සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' මුදිතා සහගතෙන චෙතසා ' යි.

' එකං දිසං ' යනු : පැදුම්දිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ උඩ හෝ යට හෝ සරස හෝ අනුදිග හෝ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අරමුණෙහි හෙළා යි.

' විහරති ' යනු . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

' තථා දුතියං ' යනු : එක් දිශායෙක්හි යම් බඳු ද දෙ වැනි දිශායෙහි එ බඳු ය, තුන් වැනි දිශායෙහි එ බඳු ය, සතර වැනි දිශායෙහි එ බඳු ය, උඩ එ බඳු ය, යට එ බඳු ය, සරස එ බඳු ය, අනුදිග එ බඳු යි.

' සබ්බධි සබ්බත්තතාය සබ්බවන්තං ලොකං ' යනු : සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාර යෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට ගෙන කීමෙකි මෙතල ' සබ්බධි සබ්බත්ත තාය සබ්බාවන්තං ලොකං ' යනු.

' මුදිතාසහගතෙන චෙතසා ' යනු : එහි ' මුදිතා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් ප්‍රමොදයෙක් ප්‍රමොදකාරයෙක් ප්‍රමුදිත බවෙක් මුදිතාචෙතොවිමුක්තියෙක් වේ ද, මේ ' මුදිතා ' යි කියනු ලැබෙ. එහි චිත්ත කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානස යෙක් . . . තදනුරූපමනොවිඥානධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබෙ. මේ චිත්තය මේ මුදිතාව සහගියේ වෙයි, සහජාත–සංසෘෂ්ට–සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' මුදිතාසහගතෙන චෙතසා ' යි.

' විපුලෙන ' යනු . යම් සිතෙක් විපුල නම් හේ මහද්ගත ය, යමෙක් මහද්ගත නම් හේ අප්‍රමාණ ය, යමෙක් අප්‍රමාණ නම් හේ අවෛර ය, යමෙක් අවෛර නම් හේ අව්‍යාබාධ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අරමුණෙහි හෙළා යි.

' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

726. කථඤ්ච භික්ඛු උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති: සෙය්‍යථාපි නාම එකං පුග්ගලං නෙව මනාපං න අමනාපං දිස්වා උපෙක්ඛකො අස්ස, එවමෙව සබ්බෙ සත්තෙ උපෙක්ඛාය ඵරති. තත්ථ කතමා උපෙක්ඛා: යා සත්තෙසු උපෙක්ඛා උපෙක්ඛායනා උපෙක්ඛායිතත්තං උපෙක්ඛාචෙතොවිමුත්ති අයං වුච්චති උපෙක්ඛා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය උපෙක්ඛාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං, තෙන වුච්චති උපෙක්ඛාසහගතෙන චෙතසා'ති.

'එකං දිස'න්ති පුරත්ථිමං වා දිසං පච්ඡිමං වා දිසං උත්තරං වා දිසං දක්ඛිණං වා දිසං උද්ධං වා අධො වා තිරියං වා විදිසං වා.

'ඵරිත්වා'ති: ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති: -පෙ- තෙන වුච්චති විහරතීති.

'තථා දුතිය'න්ති: යථෙව එකං දිසං තථා දුතියං දිසං, තථා තතියං දිසං, තථා චතුත්ථිං දිසං, තථා උද්ධං, තථා අධො, තථා තිරියං, තථා විදිසං.

'සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක'න්ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදිය වචනමෙතං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොක'න්ති.

'උපෙක්ඛාසහගතෙන චෙතසා'ති තත්ථ කතමා උපෙක්ඛා: යා සත්තෙසු උපෙක්ඛා උපෙක්ඛායනා උපෙක්ඛායිතත්තං උපෙක්ඛාචෙතොවිමුත්ති, අයං වුච්චති උපෙක්ඛා. තත්ථ කතමං චිත්තං: යං චිත්තං මනො, මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං වුච්චති චිත්තං. ඉදං චිත්තං ඉමාය උපෙක්ඛාය සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං තෙන වුච්චති 'උපෙක්ඛාසහගතෙන චෙතසා'ති.

'විපුලෙනා'ති: යං විපුලං තං මහග්ගතං, යං මහග්ගතං තං අප්පමාණං, යං අප්පමාණං සො අවෙරො, යො අවෙරො සො අව්‍යාපජ්ඣො.

'ඵරිත්වා'ති: ඵරිත්වා අධිමුච්චිත්වා.

'විහරතී'ති: ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති තෙන වුච්චති 'විහරතී'ති.

සුත්තන්තභාජනීයං.

---

727. චතස්සො අප්පමඤ්ඤායො: මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා.

728. තත්ථ කතමා මෙත්තා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති. අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

726. කිසෙයින් මහණ උපෙක්ෂාසහගත සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් ස්පර්ශ කොට වෙසේ ද යත් : යම්සේ නම් නො ම මනාප වූ අමනාප නො වූ එක් පුද්ගල යකු දැක උපෙක්ෂා ඇත්තේ වන්නේ ද, එපරිද්දෙන් ම සියලු සත්ත්වයන් උපෙක්ෂායෙන් ස්පර්ශ කෙරෙයි. එහි ' උපෙක්ෂා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් උපෙක්ෂායෙක් මැදහත් අයුරෙක් උපෙක්ෂා කළ බවෙක් උපෙක්ෂාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' උපෙක්ෂා ' යි කියනු ලැබේ. එහි ' චිත්ත ' කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥානධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ උපෙක්ෂාව සහගියේ වෙයි, සහජාත-සංසෘෂ්ට-සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' උපෙක්ඛාසහගතෙන චෙතසා ' යි.

' එකං දිසං ' යනු : පැදුම්දිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ උඩ හෝ යට හෝ සරස හෝ අනුදිග හෝ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අරමුණෙහි හෙළා යි.

' විහරති ' යනු : . . . එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

' තථා දුතියං ' යනු : එක් දිශායෙක්හි යම් බඳු වේද, දෙවැනි දිශායෙහි එ බඳු ය, තුන් වැනි දිශායෙහි එ බඳු ය, සතර වැනි දිශායෙහි එ බඳු ය, උඩ එ බඳු ය, යට එ බඳු ය, සරස එ බඳු ය, අනුදිග එ බඳු යි.

' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු : සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාර යෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට ගෙණ කීමෙකි මෙතෙල ' සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං ' යනු.

' උපෙක්ඛාසහගතෙන චෙතසා ' යනු : එහි ' උපෙක්ෂා ' කවර යත් : සත්ත්වයන් කෙරෙහි යම් උපෙක්ෂායෙක් මැදහත් අයුරෙක් උපෙක්ෂා කළ බවෙක් උපෙක්ෂා චිත්ත-විමුක්තියෙක් වේ ද, මේ ' උපෙක්ෂා ' යි කියනු ලැබේ. එහි චිත්ත කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥානධාතුයෙක් වේ ද, මේ ' චිත්ත ' යි කියනු ලැබේ. මේ චිත්තය මේ උපෙක්ෂාව සහගියේ වෙයි, සහජාත-සංසෘෂ්ට-සම්ප්‍රයුක්ත වූයේ වේ. එහෙයින් කියනු ලැබෙයි ' උපෙක්ඛාසහගතෙන චෙතසා ' යි.

' විපුලෙන ' යනු : යම් සිතෙක් විපුල නම් හේ මහද්ගත ය, යමෙක් මහද්ගත නම් හේ අප්‍රමාණ ය, යමෙක් අප්‍රමාණ නම් හේ අවෛර ය, යමෙක් අවෛර නම් හේ අව්‍යාබාධ යි.

' ඵරිත්වා ' යනු : ස්පර්ශ කොට අධිමුක්ත කොට යනු යි.

' විහරති ' යනු : ඉරියවු පවත්වයි, පවති, පාලනය කෙරෙයි, යැපෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසේ. එහෙයින් කියනු ලැබෙයි ' විහරති ' යි.

සූත්‍රාන්තභාජනීය යි.

---

727. අප්‍රාමාණ්‍ය සතරෙකි : මෙත්තා ය කරුණා ය මුදිතා ය උපෙක්ෂා යි.

728. එහි ' මෙත්තා ' කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූප භවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එ සමයෙහි යම් මෛත්‍රියක් මෙත් අයුරෙක් මෙත් කළ බවෙක් මෛත්‍රී චිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශෙෂ ධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

තත්ථ කතමා මෙත්තා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

තත්ථ කතමා මෙත්තා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

729. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි අවිතක්කං විචාරමත්තං විවෙකජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං. යා තස්මිං සමයෙ මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං මෙත්තාචෙතොවිමුත්ති, අයං වුච්චති මෙත්තා. අවසෙසා ධම්මා මෙත්තාය සම්පයුත්තා.

730. තත්ථ කතමා කරුණා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

තත්ථ කතමා කරුණා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

Free Distribution www.aathaapi.org

එහි ' මෙත්තා ' කවර යත් : මෙ සස්නෙහි මහණ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . මෛත්‍රීසහගත ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එ සමයෙහි යම් මෛත්‍රියක් මෙත් අයුරෙක් මෙත් කළ බවෙක් මෛත්‍රී චිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

එහි ' මෙත්තා ' කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . මෛත්‍රීසහගත තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් මෛත්‍රියක් මෙත් අයුරෙක් මෙත් කළ බවෙක් මෛත්‍රී චිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

729. මෙ සස්නෙහි මහණ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන් ගෙන් වෙන් ව ම . . . මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් මෛත්‍රියක් මෛත්‍රී කරන අයුරෙක් මෛත්‍රී කළ බවෙක් මෛත්‍රීචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක රහිත වූ විචාරමාත්‍ර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති මෛත්‍රීසහගත ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් මෛත්‍රියක් මෛත්‍රීආකාරයෙක් මෛත්‍රී කළ බවෙක් මෛත්‍රීචිත්තවිමුක්ති යෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . මෛත්‍රීසහගත තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් මෛත්‍රියක් මෛත්‍රීආකාරයෙක් මෛත්‍රී කළ බවෙක් මෛත්‍රීචිත්ත විමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . මෛත්‍රීසහගත චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් මෛත්‍රියක් මෛත්‍රී ආකාරයෙක් මෛත්‍රී කළ බවෙක් මෛත්‍රීචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' මෙත්තා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ මෛත්‍රිය හා සම්ප්‍රයුක්තයෝ යි.

730. එහි ' කරුණා ' කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත් පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . කරුණාසහගත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් කරුණාවක් කරුණාආකාරයෙක් කරුණා කළ බවෙක් කරුණාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. අවශේෂ ධර්මයෝ කරුණාව හා සම්ප්‍රයුක්තයෝ යි.

එහි ' කරුණා ' කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . කරුණාසහගත ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් කරුණායෙක් කුළුණු අයුරෙක් කරුණා කළ බවෙක් කරුණාචිත්තවිමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. අවශේෂ ධර්මයෝ කරුණාව හා සම්ප්‍රයුක්තයෝ යි.

තත්ථ කතමා කරුණා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

731. ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි අවිතක්කං විචාරමත්තං විවෙකජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං, යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං. යා තස්මිං සමයෙ කරුණා කරුණායනා කරුණායිතත්තං කරුණාචෙතොවිමුත්ති, අයං වුච්චති කරුණා. අවසෙසා ධම්මා කරුණාය සම්පයුත්තා.

732. තත්ථ කතමා මුදිතා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මුදිතාසහගතං. යා තස්මිං සමයෙ මුදිතා මුදිතායනා මුදිතායිතත්තං මුදිතාචෙතොවිමුත්ති, අයං වුච්චති මුදිතා. අවසෙසා ධම්මා මුදිතාය සම්පයුත්තා.

තත්ථ කතමා මුදිතා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති මුදිතාසහගතං, යා තස්මිං සමයෙ මුදිතා මුදිතායනා මුදිතායිතත්තං මුදිතාචෙතොවිමුත්ති, අයං වුච්චති මුදිතා. අවසෙසා ධම්මා මුදිතාය සම්පයුත්තා.

තත්ථ කතමා මුදිතා: ඉධ භික්ඛු යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති මුදිතාසහගතං. යා තස්මිං සමයෙ මුදිතා මුදිතායනා මුදිතායිතත්තං මුදිතාචෙතොවිමුත්ති, අයං වුච්චති මුදිතා. අවසෙසා ධම්මා මුදිතාය සම්පයුත්තා.

එහි ' කරුණා ' කවර යත් : මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් . . . කරුණාසහගත තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් කරුණාවක් කරුණාආකාරයෙක් කරුණා කළ බවෙක් කරුණාචිත්ත විමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. අවශේෂධර්මයෝ කරුණාව හා සම්ප්‍රයුක්තයෝ යි.

731. මෙ සස්නෙහි මහණ යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . කරුණාසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි යම් කරුණායෙක් කරුණා අයුරෙක් කරුණා කළ බවෙක් කරුණාචෙතො විමුක්තියෙක් වේ ද, මේ ' කරුණා ' යි කියනු ලැබේ. අවශෙෂධර්මයෝ කරුණාව හා සම්ප්‍රයුක්තයෝ යි.

766. (පඤ්චශික්ෂාපදයෝ) සංයොජනයෝ නො වෙති . . . ග්‍රන්ථයෝ නො වෙති . . . ඔඝයෝ නො වෙති . . . යොගයෝ නො වෙති . . . නීවරණයෝ නො වෙති . . . පරාමර්ශයෝ නො වෙති. . . .

767. සාරම්මණා.
නො චිත්තා.
චෙතසිකා.
චිත්තසම්පයුත්තා.
චිත්තසංසට්ඨා.
චිත්තසමුට්ඨානා.
චිත්තසහභුනො.
චිත්තානුපරිවත්තිනො.
චිත්තසංසට්ඨසමුට්ඨානා.
චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.
චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.
බාහිරා.
නො උපාදා.
අනුපාදින්නා.

768. නො උපාදානා -පෙ- නො කිලෙසා -පෙ-
න දස්සනෙන පහාතබ්බා.
න භාවනාය පහාතබ්බා.
න දස්සනෙන පහාතබ්බහෙතුකා.
න භාවනාය පහාතබ්බහෙතුකා.
සවිතක්කා.
සවිචාරා.
සියා සප්පීතිකා, සියා අප්පීතිකා.
සියා පීතිසහගතා, සියා න පීතිසහගතා.
සියා සුඛසහගතා, සියා න සුඛසහගතා.
සියා උපෙක්ඛාසහගතා, සියා න උපෙක්ඛාසහගතා.
කාමාවචරා.
න රූපාවචරා.
න අරූපාවචරා.
පරියාපන්නා.
අනිය්‍යානිකා.
අනියතා.
සඋත්තරා.
අරණාති.

පඤ්හපුච්ඡකං.

සික්ඛාපදවිභඞ්ගො නිට්ඨිතො.

767. (පඤ්චශික්ෂාපදයෝ) සාලම්බනයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තයෝ නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) චෛතසිකයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසම්ප්‍රයුක්තයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසංසෘෂ්ටයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසමුත්ථානයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසහභූ වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තානුපරිවර්තීහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) බාහිරයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) උපාද නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) අනුපාදින්නයෝ යි.

768. (පඤ්චශික්ෂාපදයෝ) උපාදනයෝ නො වෙති . . .
(පඤ්චශික්ෂාපදයෝ) කෙලෙශයෝ නො වෙති . . .
(පඤ්චශික්ෂාපදයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) සවිතර්කයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) සවිචාරයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) සප්‍රීතික ද වන්නාහ, අප්‍රීතික ද වන්නාහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) ප්‍රීතිසහගත ද වන්නාහ, ප්‍රීතිසහගත නො ද වන්නාහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) සුඛසහගත ද වන්නාහ, සුඛසහගත නො ද වන්නාහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) උපෙක්ෂාසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත නො ද වන්නාහු ය.
(පඤ්චශික්ෂාපදයෝ) කාමාවචරයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) රූපාවචරයෝ නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) අරූපාවචරයෝ නො වෙති.
(පඤ්චශික්ෂාපදයෝ) පර්‍යාපන්නයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) අනෛර්‍යාණිකයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) අනියතයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) සඋත්තරයෝ ය.
(පඤ්චශික්ෂාපදයෝ) අරණයෝ යි.

**පඤ්හපුච්ඡක යි.**

**ශික්ෂාපදවිභඞ්ග නිමි.**

## 15. පටිසම්භිදා විභඞ්ගො

769. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා, පටිභානපටිසම්භිදා. අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

770. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. දුක්ඛෙ ඤාණං අත්ථපටිසම්භිදා, දුක්ඛසමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, දුක්ඛනිරොධෙ ඤාණං අත්ථපටි-සම්භිදා, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

771. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා, හෙතුඵලෙ ඤාණං අත්ථපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

772. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිදම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. යෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටි-සම්භිදා, යෙහි ධම්මෙහි[1] තෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා තෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

773. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. ජරාමරණෙ ඤාණං අත්ථපටිසම්භිදා ජරාමරණසමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, ජරාමරණනිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා, ජරාමරණ නිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්මපටි-සම්භිදා, තත්‍ර[2] ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

774. චතස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා, පටිභානපටිසම්භිදා. ජාතියා ඤාණං -පෙ- භවෙ ඤාණං -පෙ- උපාදානෙ ඤාණං -පෙ- තණ්හාය ඤාණං -පෙ- වෙදනාය ඤාණං -පෙ- ඵස්සෙ ඤාණං -පෙ- සළායතනෙ ඤාණං -පෙ- නාමරූපෙ ඤාණං -පෙ- විඤ්ඤාණෙ ඤාණං -පෙ- සඞ්ඛාරෙසු ඤාණං අත්ථපටිසම්භිදා, සඞ්ඛාරසමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, සඞ්ඛාරනිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා, සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

---

1. යම්හා ධම්මා - සීමු, සී, මජසං.
2. තත්ථ - සිපැවි, අට්ඨකථා.



Free Distribution www.aathaapi.org

# 15. පටිසම්භිදා විභඞ්ගය

769. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අර්ථයෙහි (ප්‍රභෙදගත) ඥනය අර්ථප්‍රතිසංවිද ය, ධර්මයෙහි (ප්‍රභෙදගත) ඥනය ධර්මප්‍රතිසංවිද ය, ඒ අර්ථයෙහි හා ධර්මයෙහි ස්වභාවනිරුක්ති සඞ්ඛ්‍යාතශබ්දයෙහි ප්‍රභේදගත ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, සර්වත්‍රඥනයෙහි ප්‍රභේදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

770. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. දුඃඛයෙහි ප්‍රභේදගත ඥනය අර්ථප්‍රතිසංවිද ය, දුඃඛසමුදයයෙහි ප්‍රභේදගත ඥනය ධර්මප්‍රතිසංවිද ය, දුඃඛනිරොධයෙහි ප්‍රභේදගත ඥනය අර්ථප්‍රතිසංවිද ය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ප්‍රභෙදගත ඥනය ධර්මප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්ති ශබ්දයෙහි ප්‍රභේදගත ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, ඥනයෙහි ප්‍රභෙදගත ඥනය ප්‍රතිභාන ප්‍රතිසංවිද යි.

771. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. හෙතුයෙහි ප්‍රභේදගත ඥනය ධර්මප්‍රතිසංවිද ය, හෙතුඵලයෙහි ප්‍රභේදගත ඥනය අර්ථප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභේදගත ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, ඥනයෙහි ප්‍රභේදගත ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

772. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. යම් ධර්ම කෙනෙක් හටගත්තාහු උපන්නාහු ප්‍රත්‍යයසමවායයෙන් හටගත්තාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු පහළ වූවාහු වෙත් ද, මේ ධර්මයන්හි ප්‍රභේදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් ධර්ම කෙනකුන් කෙරෙන් ඒ ධර්මයෝ හටගත්තාහු උපන්නාහු ප්‍රත්‍යයසමවායයෙන් හටගත්තාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු පහළ වූවාහු වෙත් ද, ඒ ධර්මයන්හි ප්‍රභේදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්ති ශබ්දයෙහි ප්‍රභේදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, ඥනයෙහි ප්‍රභේදගතඥනය ප්‍රතිභාන ප්‍රතිසංවිද යි.

773. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. ජරාමරණයෙහි ප්‍රභේදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, ජරාමරණ සමුදයෙහි ප්‍රභේදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, ජරාමරණනිරොධයෙහි ප්‍රභේදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදයෙහි ප්‍රභේදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභේදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, සියලු තැන්හි ඥනයෙහි ප්‍රභේදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

774. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. ජාතියෙහි ප්‍රභේදගතඥනය . . . භවයෙහි ප්‍රභේදගතඥනය . . . උපාදනයෙහි ප්‍රභේදගතඥනය . . . තෘෂ්ණායෙහි ප්‍රභේදගතඥනය . . . වෙදනායෙහි ප්‍රභේදගතඥනය . . . ස්පර්ශයෙහි ප්‍රභේදගතඥනය . . . ෂඩායතනයෙහි ප්‍රභේදගත ඥනය . . . නාමරූපයෙහි ප්‍රභෙදගත ඥනය . . . විඥනයෙහි ප්‍රභේදගත ඥනය . . . සංස්කාරයන්හි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, සංස්කාරසමුදයෙහි ප්‍රභේදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, සංස්කාරනිරොධයෙහි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, සංස්කාර නිරොධගාමිනීප්‍රතිපදයෙහි ප්‍රභේදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්ති ශබ්දයෙහි ප්‍රභේදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, සියලුතැන්හි ඥනයෙහි ප්‍රභේදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.



Free Distribution www.aathaapi.org

775 චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. තත්ථ කතමා ධම්මපටිසම්භිදා: ඉධ භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, අයං වුච්චති ධම්මපටිසම්භිදා. සො තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්ථො අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති අයං වුච්චති අත්ථපටිසම්භිදා. තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

## සුත්තන්තභාජනියං.

---

776. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා කුසලා: යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති, ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා

777. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා කුසලා: යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං -පෙ- සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

778. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා කුසලා: යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානී'ති ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

775. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. එහි ' ධර්මප්‍රතිසංවිද ' කවර යත් : මෙ සස්නෙහි මහණ සූත්ත ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භූතධම්ම ය, වෙදල්ල ය යන ධර්මය දනී ද, මේ ' ධර්මප්‍රතිසංවිද ' යි කියනු ලැබේ. හෙතෙම ' මේ ය මේ භාෂිතයාගේ අර්ථය, මේ ය මේ භාෂිතයාගේ අර්ථය ' යි ඒ ඒ භාෂිතයාගේ අර්ථය ම දනී ද, මේ ' අර්ථප්‍රතිසංවිද ' යි කියනු ලැබේ. එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, සියලු තැන්හි ඥනයෙහි ප්‍රභෙදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

**සූත්‍රාන්තභාජනිය යි.**

---

776. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. කුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරැබැ සොම්නස් සහගිය ඥනසම්ප්‍රයුක්ත කාමාවචරකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තිය කින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි යම් ඥනයෙකින් ඒ ඥනයන් දනගනී නම් ඒ ඥනයන්හි ප්‍රභෙදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

777. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. කුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරැබැ සොම්නස් සහගිය ඥනසම්ප්‍රයුක්ත කාමාවචරකුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද . . . සොම්නස් සහගිය ඥනවිප්‍රයුක්ත . . . සොම්නස් සහගිය ඥනවිප්‍රයුක්ත (කුශලචිත්තය) සංස්කාර සහිත වැ . . . උපෙක්ෂාසහගත ඥනසම්ප්‍රයුක්ත . . . උපෙක්ෂාසහගත ඥනසම්ප්‍රයුක්ත (කුශලචිත්තය) සංස්කාර සහිත වැ . . . උපෙක්ෂාසහගත ඥනවිප්‍රයුක්ත . . . උපෙක්ෂා සහගත ඥනවිප්‍රයුක්ත (කුශලචිත්තය) සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ නම් එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් ඒ ඥනයන්හි ප්‍රභෙදගතඥනය ප්‍රතිභානප්‍රති සංවිද යි.

778. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. කුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥනය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගත ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ නම් එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් ඒ ඥනයන්හි ප්‍රභෙදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

779. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා කුසලා: යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

780. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා කුසලා: යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

781. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අකුසලා: යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අකුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

782. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අකුසලා: යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං -පෙ- සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං -පෙ- දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තං රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අකුසලා. ඉමෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, තෙසං විපාකෙ ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති. තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

779. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. කුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක අරූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥාසහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාව නිරුක්තියෙහි ප්‍රභෙදගතඥානය, නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශකරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

780. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. කුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම . . . දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන් ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥානය, නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

781. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අකුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරබැ සොමනස්සහගත දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අකුශලයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

782. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අකුශලධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි, යළි යම් යම් අරමුණක් හෝ ඇරබැ සොමනස් සහගත දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත අකුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද . . .සොමනස් සහගත දෘෂ්ටිගතවිප්‍රයුක්ත . . . සොමනස් සහගත දෘෂ්ටිගතවිප්‍රයුක්ත (අකුශලචිත්තය) සංස්කාර සහිත වැ . . . උපෙක්ෂාසහගත දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත . . . උපෙක්ෂාසහගත දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත සංස්කාර සහිත වැ . . . උපෙක්ෂාසහගත දෘෂ්ටිගතවිප්‍රයුක්ත . . . උපෙක්ෂාසහගත දෘෂ්ටිගතවිප්‍රයුක්ත සංස්කාර සහිත වැ . . . දෙමනස් සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත . . . දෙමනස් සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත සංස්කාර සහිත වැ . . . උපෙක්ෂා සහගත විචිකිත්සාසම්ප්‍රයුක්ත . . . උපෙක්ෂාසහගත ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අකුශලයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද ය, ඔවුන්ගේ විපාකයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යභිලාපයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

783. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රූපාරම්මණං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

784. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං සොතවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං සද්දාරම්මණං -පෙ- ඝානවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ගන්ධාරම්මණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රසාරම්මණං -පෙ- කායවිඤ්ඤාණං උප්පන්නං හොති සුඛසහගතං ඵොට්ඨබ්බාරම්මණං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, සුඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

785. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොධාතු උප්පන්නා හොති උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ඵොට්ඨබ්බාරම්මණා වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

783. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වූ උපෙක්ෂාසහගතවිපාකචක්ෂුර්විඥානය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය අර්ථ ප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යා භිලාපයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

784. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් ශබ්දලම්බන වූ උපෙක්ෂාසහගතවිපාකශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ ද . . . ගන්ධාලම්බන වූ උපෙක්ෂාසහගතඝ්‍රාණවිඥානය උපදනේ වේ ද . . . රසාලම්බන වූ උපෙක්ෂාසහගතජිහ්වාවිඥානය උපදනේ වේ ද . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ සුඛසහගත කායවිඥානය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, සුඛෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් වෙත් නම් මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යාභිලාපයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

785. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි, යළි යම් යම් අරමුණක් හෝ ඇරැබ උපෙක්ෂාසහගත වූ විපාකමනොධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපෙක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍ය සමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් වෙත් නම් මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද ය. යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ නම් එහි ස්වභාවනිරුක්ත්‍යාභිලාපයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් ' මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥානයන් දනගනී නම් ඒ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

786. තිස්සො පටිසම්භිදා: අත්ථ පටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති සොමනස්සසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

787. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

788. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අබ්‍යාකතා: යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා -පෙ- සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- උපෙක්ඛාසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අබ්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

786. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරැබැ සොම්නස් සහගත වූ විපාකමනොවිඥනධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, සොමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ, තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රත්‍යය සමුත්පන්න වූ අරූපිධර්ම කෙනෙක් වෙත් නම් මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ නම් එහි ස්වභාවනිරුක්ත්‍යභිලාපයෙහි ප්‍රභෙදගතඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් ඒ ඥනයන්හි ප්‍රභෙදගතඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

787. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරැබැ උපෙක්ෂාසහගත වූ විපාකමනොවිඥනධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපෙක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. තවද එසමයෙහි ප්‍රත්‍යයසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපිධර්ම කෙනෙක් වෙත් නම් මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ප්‍රභෙදගතඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම්, ඒ එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

788. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක කාමාවචරකුශලකර්මය කළ බැවින් රැස්කළ බැවින් රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරැබැ සොම්නස් සහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ විපාකමනොවිඥනධාතුව උපදනේ වේ ද, සොම්නස් සහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ (මනොවිඥනධාතුව) සංස්කාර සහිත වැ . . . සොම්නස් සහගත වූ ඥනවිප්‍රයුක්ත වූ . . . සොම්නස් සහගත වූ ඥනවිප්‍රයුක්ත වූ (මනොවිඥනධාතුව) සංස්කාර සහිත වැ . . . උපෙක්ෂාසහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ . . . උපෙක්ෂාසහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ (මනොවිඥනධාතුව) සංස්කාර සහිත ව . . . උපෙක්ෂාසහගත වූ ඥනවිප්‍රයුක්ත වූ . . . උපෙක්ෂාසහගත වූ ඥනවිප්‍රයුක්ත වූ මනොවිඥනධාතුව සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි. මේ ධර්මයන්හි ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ නම් එහි ස්වභාවනිරුක්ත්‍යභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

789. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවිකසිණං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව රූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවිකසිණං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

790. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව අරූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා

791. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා කුසලා. තස්සෙව ලොකුත්තරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා භාවිතත්තා විපාකං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අව්‍යාකතා, ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

789. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද කාමයන්ගෙන් වෙන් ව ම . . . පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම රූපාවචරකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් කාමයන්ගෙන් වෙන් ව මැ . . . විපාක වූ පඨවිකසිණ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥනය අර්ථ ප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යාභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභාන ප්‍රතිසංවිද යි.

790. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවි යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අරූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතන සංඥසහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි. එ ම අරූපාවචර කුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නේවසඤ්ඤානාසඤ්ඤායතන සංඥසහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . විපාකචතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය, මේ ධර්මයන්හි ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාවනිරුක්ත්‍යාභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රති සංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

791. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථම භූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද කාමයන්ගෙන් වෙන් ව ම . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ කුශලයෝ ය, එ ම ලොකොත්තර කුශලකර්මය කළ බැවින් වැඩූ බැවින් කාමයන්ගෙන් වෙන් ව මැ . . . දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ විපාකප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ස්වභාව නිරුක්ත්‍යාභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභාන ප්‍රතිසංවිද යි.

10—ශ්‍රී 17626 (75/3)

792. තිස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභාන පටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා : යස්මිං සමයෙ අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රූපාරම්මණං -පෙ- සොතවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං සද්දාරම්මණං -පෙ- ඝානවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ගන්ධාරම්මණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රසාරම්මණං -පෙ- කායවිඤ්ඤාණං උප්පන්නං හොති දුක්ඛසහගතං ඵොට්ඨබ්බාරම්මණං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, දුක්ඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, දුක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යා තත්‍ර නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

793. තිස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා : යස්මිං සමයෙ අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොධාතු උප්පන්නා හොති උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ඵොට්ඨබ්බාරම්මණං වා -පෙ- මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති. උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යා තත්‍ර නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

794. තිස්සො පටිසම්භිදා : අත්ථපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා : යස්මිං සමයෙ මනොධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ඵොට්ඨබ්බාරම්මණං වා, යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යා තත්‍ර නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

792. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වූ උපේක්ෂාසහගත චක්ෂුර්විඥානය උපදනේ වේ ද . . .ශබ්දලම්බන වූ උපේක්ෂාසහගත ශ්‍රෝත්‍රවිඥානය උපදනේ වේ ද . . . ගන්ධාලම්බන වූ උපේක්ෂාසහගත ඝ්‍රාණවිඥානය උපදනේ වේ ද . . . රසාලම්බන වූ උපෙක්ෂාසහගතජිහ්වාවිඥානය උපදනේ වේ ද . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ දුඃඛසහගත කායවිඥානය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, දුඃඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, දුඃඛෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්ති යෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ඥානය නිරුක්ති ප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් 'මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ' යි ඒ ඥානයන් දනගනී නම් එබඳු ඥානයන්හි ඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

793. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ, කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි (යම් යම් අරමුණක් ඇරබැ) උපෙක්ෂාසහගත විපාක වූ මනොධාතුව උපදනේ වේ ද . . . රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරබැ උපෙක්ෂාසහගත මනොවිඥාන ධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥාව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපෙක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ඥානය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥානයෙකින් 'මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ' යි ඒ ඥානයන් දනගනී නම් එබඳු ඥානයන්හි ඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

794. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි යම් යම් අරමුණක් හෝ ඇරබැ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ උපෙක්ෂාසහගත ක්‍රියාමනොධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥාව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් ඇද්ද මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥානය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ඥානය නිරුක්තිප්‍රතිසංවිද ය. යම් ඥානයෙකින් 'මේ ඥානයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ' යි ඒ ඥානයන් දනගනී නම් එබඳු ඥානයන්හි ඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

795. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා, පටිභානපටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා සොමනස්සසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා -පෙ- මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

796. තිස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභාන පටිසම්භිදා. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති, කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා -පෙ- සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- උපෙක්ඛසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- රූපවචරං ඣානං භාවෙති -පෙ- අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති, ඉමෙ ධම්මා අව්‍යාකතා. ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති, තත්‍ර ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා. යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති ඉමානි ඤාණානි ඉදමත්ථජොතකානීති, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

797. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා, තිස්සො පටිසම්භිදා, කාමාවචර කුසලතො චතූසු ඤාණසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු, කිරියතො චතූසු ඤාණසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජන්ති. අත්ථපටිසම්භිදා එතෙසු චෙව උප්පජ්ජති චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු ච උප්පජ්ජති.

අභිධම්මභාජනියං.

795. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි (යම් යම් අරමුණක් හෝ ඇරැබැ) නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්ම විපාක වූ සොම්නස් සහගත වූ ක්‍රියාමනොවිඥානධාතුව උපදනේ වේ ද, රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යම් යම් අරමුණක් හෝ ඇරැබැ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ උපෙක්ෂාසහගත ක්‍රියාමනොවිඥානධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෙකාග්‍රතාව වෙයි, වීර්‍යෙන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂේන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වේ, තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය, මේ ධර්මයන්හි ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්තියෙකින් ඒ ධර්මයන් ගේ ප්‍රඥප්තිය වේ ද එහි ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ඥනය නිරුක්තිප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථ ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

796. ප්‍රතිසංවිද තුනෙකි : අර්ථප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ සොමනස්ස සහගත ඥනසම්ප්‍රයුක්ත වූ ක්‍රියාමනොධාතුව උපදනේ වේ ද . . . සොමනස්ස සහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ සසංස්කාර වැ . . . සොමනස්සසහගත වූ ඥන විප්‍රයුක්ත වූ . . . සොමනස්සසහගත වූ ඥනවිප්‍රයුක්ත වූ සසංස්කාර වැ . . . උපෙක්ෂා සහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ . . . උපේක්ෂාසහගත වූ ඥනසම්ප්‍රයුක්ත වූ සසංස්කාර වැ . . . උපෙක්ෂාසහගත වූ ඥනවිප්‍රයුක්ත වූ . . . උපේක්ෂාසහගත වූ ඥනවිප්‍රයුක්ත වූ සසංස්කාර වැ . . . නො ම කුසල් වූ නොද කර්මවිපාක වූ දෘෂ්ටධර්මසුඛවිහාර වූ ක්‍රියා රූපාවචරධ්‍යානය වඩා ද . . . නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ දෘෂ්ටධර්මසුඛවිහාර වූ අරූපාවචරක්‍රියාධ්‍යානය වඩා ද . . . සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤ යතනය ඉක්මවා නේවසඤ්ඤනාසඤ්ඤයතන සංඥ සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි . . . අවික්ෂෙපය වේ. මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය. මේ ධර්මයන්හි ඥනය අර්ථප්‍රතිසංවිද ය, යම් නිරුක්ති යෙකින් ඒ ධර්මයන්ගේ ප්‍රඥප්තිය වේ ද, එහි ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ඥනය නිරුක්ති ප්‍රතිසංවිද ය, යම් ඥනයෙකින් ' මේ ඥනයෝ මේ අර්ථය ප්‍රකාශ කරන්නාහ ' යි ඒ ඥනයන් දනගනී නම් එබඳු ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි.

797. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. ප්‍රතිසංවිදවෝ තිදෙනෙක් කාමාවචරකුශල විසින් සතර ඥන සම්ප්‍රයුක්තචිත්තොත්පාදයන්හි ද, ක්‍රියා විසින් සතර ඥනසම්ප්‍රයුක්තචිත්තොපාදයන්හි ද උපදිති. අර්ථප්‍රතිසංවිදව මේ චිත්තොත්පාදයන්හි ද උපදියි, සතර මාර්ගයන්හි ද සතරඵලයන්හි ද උපදී.

**අභිධර්මභාජනිය යි.**

---

798. චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්ති පටිසම්භිදා, පටිභානපටිසම්භිදා.

799. චතුන්නං පටිසම්භිදානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා -පෙ- කති සරණා, කති අරණා:

800. සියා කුසලා, සියා අබ්‍යාකතා.

සියා සුඛාය වෙදනාය සම්පයුත්තා, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා.

තිස්සො පටිසම්භිදා සියා විපාකධම්මධම්මා, සියා නෙවවිපාක න විපාකධම්මධම්මා. අත්ථපටිසම්භිදා සියා විපාකා, සියා විපාකධම්මධම්මා, සියා නෙවවිපාක න විපාකධම්මධම්මා.

තිස්සො පටිසම්භිදා අනුපාදින්නුපාදානියා. අත්ථපටිසම්භිදා සියා අනුපාදින්නුපාදානියා, සියා අනුපාදින්නඅනුපාදානියා.

තිස්සො පටිසම්භිදා අසංකිලිට්ඨඅසංකිලෙසිකා. අත්ථපටිසම්භිදා සියා අසංකිලිට්ඨසංකිලෙසිකා, සියා අසංකිලිට්ඨඅසංකිලෙසිකා.

තිස්සො පටිසම්භිදා සවිතක්කසවිචාරා. අත්ථපටිසම්භිදා සියා සවිතක්කසවිචාරා, සියා අවිතක්කවිචාරමත්තා, සියා අවිතක්කඅවිචාරා.

සියා පීතිසහගතා, සියා සුඛසහගතා, සියා උපෙක්ඛාසහගතා.

නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා.

නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

තිස්සො පටිසම්භිදා සියා ආචයගාමිනො, සියා නෙවාචයගාමිනාපචයගාමිනො, අත්ථපටිසම්භිදා සියා ආචයගාමිනී, සියා අපචයගාමිනී, සියා නෙවාචයගාමිනාපචයගාමිනී.

තිස්සො පටිසම්භිදා නෙව සෙක්ඛා නාසෙක්ඛා. අත්ථපටිසම්භිදා සියා සෙක්ඛා, සියා අසෙක්ඛා, සියා නෙව සෙක්ඛා නාසෙක්ඛා.

තිස්සො පටිසම්භිදා පරිත්තා. අත්ථපටිසම්භිදා සියා පරිත්තා, සියා අප්පමාණා.

නිරුත්තිපටිසම්භිදා පරිත්තාරම්මණා. තිස්සො පටිසම්භිදා සියා පරිත්තාරම්මණා, සියා මහග්ගතාරම්මණා, සියා අප්පමාණාරම්මණා.

තිස්සො පටිසම්භිදා මජ්ඣිමා. අත්ථපටිසම්භිදා සියා මජ්ඣිමා, සියා පණීතා.

තිස්සො පටිසම්භිදා අනියතා. අත්ථපටිසම්භිදා සියා සම්මත්තනියතා, සියා අනියතා.

Free Distribution www.aathaapi.org

798. ප්‍රතිසංවිද සතරෙකි : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රතිසංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි.

799. සතර ප්‍රතිසංවිද්ධර්මයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද, අකුශලයෝ කෙතෙක් ද, අව්‍යාකෘතයෝ කෙතෙක් ද, . . . සරණයෝ කෙතෙක් ද, අරණයෝ කෙතෙක් ද යත් :

800. (සතර ප්‍රතිසංවිද්ධර්මයෝ) කුසල් ද වන්නාහ, අව්‍යාකෘත ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිද්ධර්මයෝ) සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, අදුක්ඛමසුඛ වෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහු ය.

ප්‍රතිසංවිද්ධර්මයෝ තිදෙනෙක් විපාකස්වභාවධර්ම ද වන්නාහ, නෛවවිපාක නවිපාකස්වභාවධර්ම ද වන්නාහ, අර්ථප්‍රතිසංවිදව විපාක ද වන්නේ ය, විපාක ස්වභාවධර්ම ද වන්නේ ය, නෛවවිපාකනවිපාකස්වභාවධර්ම ද වන්නේ යි.

ප්‍රතිසංවිද්ධර්මයෝ තිදෙනෙක් අනුපාදින්නොපාදනිය වෙති. අර්ථප්‍රතිසංවිදව අනුපාදින්නොපාදනිය ද වන්නේ ය, අනුපාදින්නඅනුපාදනිය ද වන්නේ යි.

ප්‍රතිසංවිද්ධර්මයෝ තිදෙනෙක් අසංක්ලිෂ්ටඅසාංක්ලෙශිකයෝ ය. අර්ථප්‍රතිසංවිදව අසංක්ලිෂ්ටසාංක්ලෙශික ද වන්නේ ය, අසංක්ලිෂ්ටඅසාංක්ලෙශික ද වන්නේ යි.

ප්‍රතිසංවිද්ධර්මයෝ තිදෙනෙක් සවිතර්කසවිචාරයෝ ය. අර්ථප්‍රතිසංවිදව සවිතර්ක සවිචාර ද වන්නේ ය, අවිතර්කවිචාරමාත්‍ර ද වන්නේ ය, අවිතර්කඅවිචාර ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිදවෝ) ප්‍රීතිසහගත ද වන්නාහ, සුඛසහගත ද වන්නාහ, උපෙක්ෂා සහගත ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිදවෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ය.

(සතර ප්‍රතිසංවිදවෝ) නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතුකයෝ යි.

තුන් ප්‍රතිසංවිදවෝ ආචයගාමීහු ද වන්නාහ, නො ම ආචයගාමී නො ද අපචයගාමීහු ද වන්නාහ. අර්ථප්‍රතිසංවිදව ආචයගාමී ද වන්නේ ය, අපචයගාමී ද වන්නේ ය, නො ම ආචයගාමී නො ද අපචයගාමී ද වන්නේ යි.

තුන් ප්‍රතිසංවිදවෝ නොම ශෛක්ෂ නො ද අශෛක්ෂ වෙති. අර්ථප්‍රතිසංවිදව ශෛක්ෂ ද වන්නේ ය, අශෛක්ෂ ද වන්නේ ය, නො ම ශෛක්ෂ නො ද අශෛක්ෂ ද වන්නේ යි.

තුන්ප්‍රතිසංවිදවෝ පරිත්තයෝ ය. අර්ථප්‍රතිසංවිදව පරිත්ත ද වන්නේ ය, අප්‍රමාණ ද වන්නේ යි.

නිරුක්තිප්‍රතිසංවිදව පරිත්තාලම්බන ය. තුන් ප්‍රතිසංවිදවෝ පරිත්තාලම්බන ද වන්නාහ, මහද්ගතාලම්බන ද වන්නාහ, අප්‍රමාණාලම්බන ද වන්නාහු ය.

තුන් ප්‍රතිසංවිදවෝ මධ්‍යමයෝ ය. අර්ථප්‍රතිසංවිදව මධ්‍යම ද වන්නේ ය, ප්‍රණීත ද, වන්නේ යි.

තුන්ප්‍රතිසංවිදවෝ අනියතයෝ ය. අර්ථප්‍රතිසංවිදව සම්‍යක්ත්වනියත ද වන්නේ ය, අනියත ද වන්නේ යි.

නිරුත්තිපටිසම්භිදා න වත්තබ්බා මග්ගාරම්මණාතිපි, මග්ගහෙතුකාතිපි මග්ගාධිපතිනීතිපි. අත්ථපටිසම්භිදා න මග්ගාරම්මණා, සියා මග්ගහෙතුකා සියා මග්ගාධිපතිනී, සියා න වත්තබ්බා මග්ගහෙතුකාතිපි මග්ගාධිපතිනීති'පි. ද්වෙ පටිසම්භිදා සියා මග්ගාරම්මණා න මග්ගහෙතුකා, සියා මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගාරම්මණාති'පි මග්ගාධිපතිනො'තිපි.

තිස්සො පටිසම්භිදා සියා උප්පන්නා සියා අනුප්පන්නා, න වත්තබ්බා උප්පාදිනොති. අත්ථපටිසම්භිදා සියා උප්පන්නා, සියා අනුප්පන්නා, සියා උප්පාදිනී.

සියා අතීතා, සියා අනාගතා, සියා පච්චුප්පන්නා.

නිරුත්තිපටිසම්භිදා පච්චුප්පන්නාරම්මණා. ද්වෙ පටිසම්භිදා සියා අතීතාරම්මණා, සියා අනාගතාරම්මණා, සියා පච්චුප්පන්නාරම්මණා. අත්ථපටිසම්භිදා සියා අතීතාරම්මණා, සියා අනාගතාරම්මණා, සියා පච්චුප්පන්නාරම්මණා, සියා න වත්තබ්බා අතීතාරම්මණාති'පි අනාගතාරම්මණාති'පි පච්චුප්පන්නාරම්මණාති'පි.

සියා අජ්ඣත්තා, සියා බහිද්ධා, සියා අජ්ඣත්තබහිද්ධා.

නිරුත්තිපටිසම්භිදා බහිද්ධාරම්මණා. තිස්සො පටිසම්භිදා සියා අජ්ඣත්තාරම්මණා, සියා බහිද්ධාරම්මණා, සියා අජ්ඣත්තබහිද්ධාරම්මණා.

අනිදස්සනඅප්පටිඝා.

801. හෙතු.

සහෙතුකා.

හෙතුසම්පයුත්තා.

හෙතු චෙව සහෙතුකා ච.

හෙතු චෙව හෙතුසම්පයුත්තා ච.

න වත්තබ්බා න හෙතු සහෙතුකාතිපි න හෙතු අහෙතුකාතිපි.

802. සප්පච්චයා.

සඞ්ඛතා.

අනිදස්සනා.

අප්පටිඝා.

අරූපා.

තිස්සො පටිසම්භිදා ලොකියා. අත්ථපටිසම්භිදා සියා ලොකියා, සියා ලොකුත්තරා.

කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

Free Distribution www.aathaapi.org

නිරුක්තිප්‍රතිසංවිදව මාර්ගාලම්බන යි ද මාර්ගහේතුක යි ද මාර්ගාධිපති යි ද නො කිය යුතු ය, අර්ථප්‍රතිසංවිදව මාර්ගාලම්බන නො වෙයි. මාර්ගහෙතුක ද වන්නේ ය, මාර්ගාධිපති ද වන්නේ ය, මාර්ගහේතුක යි ද මාර්ගාධිපති යි ද නො කියයුතු ද වන්නේ යි. ප්‍රතිසංවිදවෝ දෙදෙනෙක් මාර්ගාලම්බන ද වන්නාහ, මාර්ගහෙතුක නො වෙති, මාර්ගාධිපති ද වන්නාහ, මාර්ගාලම්බන යි ද මාර්ගාධිපති යි ද නො කියයුතු ද වන්නාහු ය.

තුන් ප්‍රතිසංවිදවෝ උත්පන්න ද වන්නාහ, අනුත්පන්න ද වන්නාහ, උත්පාදීහ යි නො කියයුත්තාහ. අර්ථප්‍රතිසංවිදව උත්පන්න ද වන්නේ ය, අනුත්පන්න ද වන්නේ ය උත්පාදී ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) අතීත ද වන්නාහ, අනාගත ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්න ද වන්නාහු ය.

නිරුක්තිප්‍රතිසංවිදව ප්‍රත්‍යුත්පන්නාලම්බන ය. ප්‍රතිසංවිදවෝ දෙදෙනෙක් අතීතාලම්බන ද වන්නාහ, අනාගතාලම්බන ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්නාලම්බන ද වන්නාහ. අර්ථප්‍රතිසංවිදව අතීතාලම්බන ද වන්නේ ය, අනාගතාලම්බන ද වන්නේ ය, ප්‍රත්‍යුත්පන්නාලම්බන ද වන්නේ ය, අතීතාලම්බන යි ද අනාගතාලම්බන යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන යි ද නො කියයුතු ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) අධ්‍යාත්ම ද වන්නාහ, බාහ්‍ය ද වන්නාහ, අධ්‍යාත්මබාහ්‍ය ද වන්නාහු ය.

නිරුක්තිප්‍රතිසංවිදව බාහ්‍යාලම්බන ය. තුන් ප්‍රතිසංවිද්හු අධ්‍යාත්මාලම්බන ද වන්නාහ, බාහ්‍යාලම්බන ද වන්නාහ, අධ්‍යාත්මබාහ්‍යාලම්බන ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිද්හු) අනිදර්ශන අප්‍රතිඝයෝ යි.

801. සතර ප්‍රතිසංවිද්හු හේතුහු ය.

සතර ප්‍රතිසංවිද්හු සහේතුකයෝ ය.

සතර ප්‍රතිසංවිද්හු හේතුසම්ප්‍රයුක්තයෝ ය.

සතර ප්‍රතිසංවිද්හු හේතු ද වූ සහේතුකයෝ ද වෙති.

සතර ප්‍රතිසංවිද්හු හේතු ද වූ හේතුසම්ප්‍රයුක්තයෝ ද වෙති.

සතර ප්‍රතිසංවිද්හු හේතු නො වූ සහේතුකයහ යි ද, හේතු නො වූ අහේතුකයහ යි ද නො කිය යුත්තාහ.

802. (සතර ප්‍රතිසංවිද්හු) සප්‍රත්‍යයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) සඞ්ඛතයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) අනිදර්ශනයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) අප්‍රතිඝයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) අරූපයෝ ය.

තුන් ප්‍රතිසංවිද්හු ලෞකිකයෝ ය. අර්ථප්‍රතිසංවිදව ලෞකික ද වන්නේ ය, ලොකොත්තර ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) කිසිවිඥානයෙකින් දතයුත්තාහ, කිසිවිඥානයෙකින් නො දත යුත්තාහු ය.

803. නො ආසවා.

තිස්සො පටිසම්භිදා සාසවා. අත්ථපටිසම්භිදා සියා සාසවා, සියා අනාසවා.

ආසව විප්පයුත්තා.

තිස්සො පටිසම්භිදා න වත්තබ්බා ආසවා චෙව සාසවාති, සාසවා චෙව නො ච ආසවා. අත්ථපටිසම්භිදා න වත්තබ්බා ආසවො[1] චෙව සාසවාති, සියා සාසවා චෙව නො ච ආසවො, සියා න වත්තබ්බා සාසවා චෙව නො ච ආසවොති.

න වත්තබ්බා ආසවා චෙව ආසවසම්පයුත්තාතිපි, ආසවසම්පයුත්තා චෙව නො ච ආසවාතිපි.

තිස්සො පටිසම්භිදා ආසවවිප්පයුත්තා සාසවා. අත්ථපටිසම්භිදා සියා ආසවවිප්පයුත්තා සාසවා, සියා ආසවවිප්පයුත්තා අනාසවා.

804. නො සඤ්ඤොජනා -පෙ- නො ගන්ථා -පෙ- නො ඔඝා -පෙ- නො යොගා -පෙ- නො නීවරණා -පෙ- නො පරාමාසා -පෙ-

805. සාරම්මණා.

නො චිත්තා.

චෙතසිකා.

චිත්තසම්පයුත්තා.

චිත්තසංසට්ඨා.

චිත්තසමුට්ඨානා.

චිත්තසහභුනො.

චිත්තානුපරිවත්තිනො.

චිත්තසංසට්ඨසමුට්ඨානා.

චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

බාහිරා.

නො උපාදා.

අනුපාදින්නා.

806. නො උපාදානා -පෙ- නො කිලෙසා -පෙ-

න දස්සනෙන පහාතබ්බා.

න භාවනාය පහාතබ්බා.

න දස්සනෙන පහාතබ්බහෙතුකා.

න භාවනාය පහාතබ්බහෙතුකා.

---

1. ආසවා - සිමු.

803. (සතර ප්‍රතිසංවිද්හු) ආශ්‍රව නො වෙති.

තුන් ප්‍රතිසංවිද්හු සාශ්‍රවයෝ ය, අර්ථප්‍රතිසංවිදව සාශ්‍රව ද වන්නේ ය අනාශ්‍රව ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) ආශ්‍රවවිප්‍රයුක්තයෝ ය.

තුන් ප්‍රතිසංවිද්හු ආශ්‍රව ද වූ සාශ්‍රවහ යි නො කියයුත්තාහ, සාශ්‍රව ද වූවාහු නො ද ආශ්‍රවයෝ වෙති. අර්ථප්‍රතිසංවිදව ආශ්‍රව ද වූ සාශ්‍රව යි නො කියයුතු ය. සාශ්‍රව ද වූ නො ද ආශ්‍රව වන්නේ ය. සාශ්‍රව ද වූ නො ද ආශ්‍රවයෙකැ යි නො කියයුතු ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) ආශ්‍රව ද වූවාහු ම ආශ්‍රවසම්ප්‍රයුක්තහ යි ද ආශ්‍රවසම්ප්‍රයුක්ත ද වූ නො ද ආශ්‍රවහ යි ද නො කියයුත්තාහු ය.

තුන් ප්‍රතිසංවිද්හු ආශ්‍රවවිප්‍රයුක්ත වූ සාශ්‍රවයෝ ය. අර්ථප්‍රතිසංවිදව ආශ්‍රවවිප්‍රයුක්ත සාශ්‍රව ද වන්නේ ය, ආශ්‍රවවිප්‍රයුක්තඅනාශ්‍රව ද වන්නේ යි.

804. (සතර ප්‍රතිසංවිද්හු) සංයොජන නො වෙති. . . . ග්‍රන්ථයෝ නො වෙති . . . ඕඝයෝ නො වෙති . . . යොගයෝ නො වෙති . . . නීවරණයෝ නො වෙති . . . පරාමර්ශයෝ නො වෙති . . .

805. (සතර ප්‍රතිසංවිද්හු) සාලම්බනයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තයෝ නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) චෛතසිකයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසම්ප්‍රයුක්තයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසංසෘෂ්ටයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසමුත්ථානයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසහභූහු ය.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තානුපරිවර්තීහ.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසංසෘෂ්ටසමුත්ථානයහ.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසමුත්ථානසහභූහ.

(සතර ප්‍රතිසංවිද්හු) චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහ.

(සතර ප්‍රතිසංවිද්හු) බාහිරයෝ ය.

(සතර ප්‍රතිසංවිද්හු) උපාදා නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) අනුපාදින්නයෝ යි.

806. (සතර ප්‍රතිසංවිද්හු) උපාදානයෝ නො වෙති. . . .

(සතර ප්‍රතිසංවිද්හු) ක්ලෙශයෝ නො වෙති. . . .

(සතර ප්‍රතිසංවිද්හු) දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) භාවනායෙන් ප්‍රහාතව්‍යහේතුකයෝ නො වෙත්.

තිස්සො පටිසම්භිදා සවිතක්කා. අත්ථපටිසම්භිදා සියා සවිතක්කා සියා අවිතක්කා.

තිස්සො පටිසම්භිදා සවිචාරා. අත්ථපටිසම්භිදා සියා සවිචාරා, සියා අවිචාරා.

සියා සප්පීතිකා, සියා අප්පීතිකා.

සියා පීතිසහගතා, සියා න පීතිසහගතා.

සියා සුඛසහගතා, සියා න සුඛසහගතා.

සියා උපෙක්ඛාසහගතා, සියා න උපෙක්ඛාසහගතා.

තිස්සො පටිසම්භිදා කාමාවචරා. අත්ථපටිසම්භිදා සියා කාමාවචරා සියා න කාමාවචරා.

න රූපාවචරා.

න අරූපාවචරා.

තිස්සො පටිසම්භිදා පරියාපන්නා. අත්ථපටිසම්භිදා සියා පරියාපන්නා සියා අපරියාපන්නා.

තිස්සො පටිසම්භිදා අනිය්‍යානිකා. අත්ථපටිසම්භිදා සියා නිය්‍යානිකා සියා අනිය්‍යානිකා.

තිස්සො පටිසම්භිදා අනියතා. අත්ථපටිසම්භිදා සියා නියතා, සියා අනියතා.

තිස්සො පටිසම්භිදා ස උත්තරා, අත්ථපටිසම්භිදා සියා ස උත්තරා සියා අනුත්තරා.

අරණාති.

පඤ්හපුච්ඡකං.

පටිසම්භිදා විභඞ්ගො නිට්ඨිතො.

Free Distribution www.aathaapi.org

තුන් ප්‍රතිසංවිද්හු සවිතර්කයෝ ය. අර්ථප්‍රතිසංවිදව සවිතර්ක ද වන්නේ ය, අවිතර්ක ද වන්නේ යි.

තුන් ප්‍රතිසංවිද්හු සවිචාරයෝ ය. අර්ථප්‍රතිසංවිදව සවිචාර ද වන්නේ ය, අවිචාර ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) සප්‍රීතික ද වන්නාහ, අප්‍රීතික ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිද්හු) ප්‍රීතිසහගත ද වන්නාහ, නො ද ප්‍රීතිසහගත ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිද්හු) සුඛසහගත ද වන්නාහ, නො ද සුඛසහගත ද වන්නාහු ය.

(සතර ප්‍රතිසංවිද්හු) උපෙක්ෂාසහගත ද වන්නාහ, නො ද උපෙක්ෂාසහගත ද වන්නාහු ය.

තුන් ප්‍රතිසංවිද්හු කාමාවචරයෝ ය. අර්ථප්‍රතිසංවිදව කාමාවචර ද වන්නේ ය, නො ද කාමාවචර ද වන්නේ යි.

(සතර ප්‍රතිසංවිද්හු) රූපාවචර නො වෙති.

(සතර ප්‍රතිසංවිද්හු) අරූපාවචර නො වෙති.

තුන් ප්‍රතිසංවිද්හු පර්‍ය්‍යාපන්නයෝ ය. අර්ථප්‍රතිසංවිදව පර්‍ය්‍යාපන්න ද වන්නේ ය අපර්‍ය්‍යාපන්න ද වන්නේ යි.

තුන් ප්‍රතිසංවිද්හු අනෛර්‍ය්‍යාණිකයෝ ය. අර්ථප්‍රතිසංවිදව නෛර්‍ය්‍යාණික ද වන්නේ ය, අනෛර්‍ය්‍යාණික ද වන්නේ යි.

තුන් ප්‍රතිසංවිද්හු අනියතයෝ ය. අර්ථප්‍රතිසංවිදව නියත ද වන්නේ ය, අනියත ද වන්නේ යි.

තුන් ප්‍රතිසංවිද්හු සඋත්තරයෝ ය. අර්ථප්‍රතිසංවිදව සඋත්තර ද වන්නේ ය, අනුත්තර ද වන්නේ යි.

සතර ප්‍රතිසංවිද්හු අරණයෝයි.

**පඤ්හපුච්ඡක යි.**

**ප්‍රතිසංවිදවිභඞ්ග නිමි.**

# 16. ඤාණවිභඞ්ගො

807. එකවිධෙන ඤාණවත්ථු: පඤ්ච විඤ්ඤාණා න හෙතු, අහෙතුකා, හෙතුවිප්පයුත්තා, සප්පච්චයා, සඞ්ඛතා, අරූපා, ලොකියා, සාසවා, සඤ්ඤොජනියා, ගන්ථනීයා, ඔඝනීයා, යොගනීයා, නීවරණියා, පරාමට්ඨා, උපාදානියා, සංකිලෙසිකා, අව්‍යාකතා, සාරම්මණා, අචෙතසිකා, විපාකා, උපාදින්නුපාදානියා, අසංකිලිට්ඨසංකිලෙසිකා, න සවිතක්කසවිචාරා, න අවිතක්කවිචාරමත්තා, අවිතක්කඅවිචාරා, න පීතිසහගතා, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා, නෙවාචයගාමිනාපචයගාමිනො, නෙව සෙක්ඛා නාසෙක්ඛා, පරිත්තා, කාමාවචරා, න රූපාවචරා, න අරූපාවචරා, පරියාපන්නා, නො අපරියාපන්නා, අනියතා, අනිය්‍යානිකා, උප්පන්නා මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යා,[1] අනිච්චා, ජරාභිභූතා.

පඤ්චවිඤ්ඤාණා* උප්පන්නවත්ථුකා, උප්පන්නාරම්මණා, පුරෙජාතවත්ථුකා, පුරෙජාතාරම්මණා, අජ්ඣත්තිකවත්ථුකා, බාහිරාරම්මණා, අසම්භින්නවත්ථුකා, අසම්භින්නාරම්මණා, නානාවත්ථුකා, නානාරම්මණා, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති, න අසමන්නාහාරා උප්පජ්ජන්ති, න අමනසිකාරා උප්පජ්ජන්ති, න අබ්බොකිණ්ණා උප්පජ්ජන්ති, න අපුබ්බං අචරිමං උප්පජ්ජන්ති, න අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්ති.

පඤ්චවිඤ්ඤාණා අනාභොගා. පඤ්චහි විඤ්ඤාණෙහි න කිඤ්චි ධම්මං පටිජානාති අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කිඤ්චි ධම්මං පටිවිජානාති. පඤ්චහි විඤ්ඤාණෙහි න කිඤ්චි ඉරියාපථං කප්පෙති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කිඤ්චි ඉරියාපථං කප්පෙති. පඤ්චහි විඤ්ඤාණෙහි න කායකම්මං න වචීකම්මං පට්ඨපෙති පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කායකම්මං න වචීකම්මං පට්ඨපෙති. පඤ්චහි විඤ්ඤාණෙහි න කුසලාකුසලං ධම්මං සමාදියති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කුසලාකුසලං ධම්මං සමාදියති. පඤ්චහි විඤ්ඤාණෙහි න සමාපජ්ජති, න වුට්ඨාති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න සමාපජ්ජති, න වුට්ඨාති. පඤ්චහි විඤ්ඤාණෙහි න චවති, න උපපජ්ජති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න චවති, න උපපජ්ජති. පඤ්චහි විඤ්ඤාණෙහි න සුපති, න පටිබුජ්ඣති, න සුපිනං පස්සති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න සුපති, න පටිබුජ්ඣති, න සුපිනං පස්සති. යාථාවක[2] වත්ථු විභාවනා පඤ්ඤා.

එවං එකවිධෙන ඤාණවත්ථු.

---

1. මනොවිඤ්ඤාණෙන විඤ්ඤෙය්‍යා - සිරිමු. 2. යාථාවකා - සීපැමි.

* උප්පන්නා මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යා අනිච්චා ජරාභිභූතා පඤ්චවිඤ්ඤාණා—අයං ඡෙදො මරම්මඡට්ඨසඞ්ගායනා පොත්ථකෙ න දිස්සති.



Free Distribution www.aathaapi.org

# 16. ඥාන විභඞ්ගය

807. එක් ප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි : පඤ්චවිඥානයෝ හේතුහු නො වෙති අහේතුකයෝ ය, හේතුවිප්‍රයුක්තයෝ ය, සප්‍රත්‍යයෝ ය, සඞ්ඛතයෝ ය, අරූපයෝ ය, ලෞකිකයෝ ය, සාස්‍රවයෝ ය, සංයෝජනියයෝ ය, ග්‍රන්ථනීයයෝ ය, ඕඝනීයයෝ ය, යොගනීයයෝ ය, නීවරණීයයෝ ය, පරාමෘෂ්ටයෝ ය, උපාදනියයෝ ය, සාංක්ලේශිකයෝ ය, අව්‍යාකෘතයෝ ය, සාලම්බනයෝ ය, අචෛතසිකයෝ ය, විපාකයෝ ය, උපාදින්නොපාදනියයෝ ය, අසංක්ලිෂ්ටසාංක්ලේශිකයෝ ය, සවිතර්කසවිචාරයෝ නො වෙති, අවිතර්කවිචාරමාත්‍ර නො වෙති, අවිතර්කඅවිචාරයෝ ය, ප්‍රීතිසහගත නො වෙති, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ය, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහේතු ඇත්තාහු ය, නො ම ආචයගාමී නො ද අපචයගාමීහ, නො ම ශෛක්‍ෂ නො ද අශෛක්‍ෂයෝ ය, පරිත්තයෝ ය, කාමාවචරයෝ ය, රූපාවචර නො වෙති, අරූපාවචර නො වෙති, පර්‍යාපන්නයෝ ය, අපර්‍යාපන්න නො වෙති, අනියතයෝ ය, අනෛර්‍යාණිකයෝ ය, උත්පන්නයෝ ය, මනෝවිඥානයෙන් දත යුත්තාහ, අනිත්‍යයෝ ය, ජරාභිභූතයහ.

පඤ්චවිඥානයෝ උත්පන්නවස්තුකයෝ ය, උත්පන්නාලම්බනයෝ ය, පුරෙජාතවස්තුකයෝ ය, පුරෙජාතආලම්බනයෝ ය, ආධ්‍යාත්මිකවස්තුකයෝ ය, බාහිරාලම්බනයෝ ය, නිරුද්ධ නො වූ වස්තු ඇත්තාහු ය, නිරුද්ධ නො වූ ආලම්බන ඇත්තාහු ය, නානාවස්තුකයෝ ය, නානාලම්බනයෝ ය, අන්‍යොන්‍යගොචරවිෂය නො විඳිති, සමන්වාහාර රහිත වැ නූපදිති, මනසිකාර රහිත ව නූපදිති, අව්‍යාකීර්ණ ව නූපදිති, පෙරපසු නො වැ නූපදිති, අන්‍යොන්‍යයන්ට සමනන්තර ව නූපදිත්.

පඤ්චවිඥානයෝ ආභොග රහිතයෝ ය, අභිනිපාතමාත්‍රයක් (හමුවට පැමිණි) රූපාදි අරමුණු හැර පඤ්චවිඥානයන්ගෙන් (කුශලාකුශලාදි) කිසි ධර්මයක් නො දැනගනී. පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද කිසි ධර්මයක් නො දැනගනී. පඤ්චවිඥානයෙන් කිසි ඊර්‍යාපථයක් නො කෙරෙයි, පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද, කිසි ඊර්‍යාපථයෙක් නො කෙරෙයි, පඤ්චවිඥානයෙන් කායකර්මය වාක්කර්මය නො කෙරෙයි. පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද කායකර්මය වාක්කර්මය නො කෙරෙයි. පඤ්චවිඥානයෙන් කුශලාකුශල ධර්මසමාදනය නො කෙරෙයි, පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද කුශලාකුශලධර්ම සමාදනය නො කෙරෙයි, පඤ්චවිඥානයෙන් සමවතට නො පැමිණෙයි, සමවතින් නො නැඟෙයි, පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද සමවත් නො අවදියි, සමවතින් නො නැඟෙයි, පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද ච්‍යුත නො වෙයි, නූපදී, පඤ්චවිඥානයෙන් නො හොවියි, නො පිබිදෙයි, සිහින නො දකියි. පඤ්චවිඥානයන්ට සමනන්තර ව ද නො හොවී, නො පිබිදෙයි, සිහින නො දකියි, ඇති සැටි වස්තු ප්‍රකාශ කරන ප්‍රඥාව යි.

**මෙසේ එක් ප්‍රකාරයෙකින් ඥානවස්තු වේ.**



Free Distribution www.aathaapi.org

808. දුවිධෙන ඤාණවත්ථු : ලොකියා පඤ්ඤා, ලොකුත්තරා පඤ්ඤා කෙනචි විඤ්ඤෙය්‍යා පඤ්ඤා, කෙනචි න විඤ්ඤෙය්‍යා පඤ්ඤා. සාසවා පඤ්ඤා, අනාසවා පඤ්ඤා. ආසවවිප්පයුත්තා සාසවා පඤ්ඤා, ආසව-විප්පයුත්තා අනාසවා පඤ්ඤා. සඤ්ඤොජනියා පඤ්ඤා, අසඤ්ඤොජනියා පඤ්ඤා සඤ්ඤොජනෙන විප්පයුත්තා සඤ්ඤොජනියා පඤ්ඤා, සඤ්ඤොජන විප්පයුත්තා අසඤ්ඤොජනියා පඤ්ඤා. ගන්ථනීයා පඤ්ඤා, අගන්ථනීයා පඤ්ඤා. ගන්ථවිප්පයුත්තා ගන්ථනීයා පඤ්ඤා, ගන්ථවිප්පයුත්තා අගන්ථනීයා පඤ්ඤා. ඔඝනීයා පඤ්ඤා, අනොඝනීයා පඤ්ඤා, ඔඝවිප්පයුත්තා ඔඝනීයා පඤ්ඤා ඔඝවිප්පයුත්තා අනොඝනීයා පඤ්ඤා. යොගනීයා පඤ්ඤා, අයොගනීයා පඤ්ඤා. යොගවිප්පයුත්තා යොගනීයා පඤ්ඤා, යොගවිප්ප-යුත්තා අයොගනීයා පඤ්ඤා. නීවරණීයා පඤ්ඤා, අනීවරණීයා පඤ්ඤා. නීවරණවිප්පයුත්තා නීවරණීයා පඤ්ඤා, නීවරණවිප්පයුත්තා අනීවරණීයා පඤ්ඤා. පරාමට්ඨා පඤ්ඤා, අපරාමට්ඨා පඤ්ඤා. පරාමාසවිප්පයුත්තා-පරාමට්ඨා පඤ්ඤා, පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා පඤ්ඤා උපාදින්නා පඤ්ඤා අනුපාදින්නා පඤ්ඤා. උපාදානියා පඤ්ඤා අනුපාදානියා පඤ්ඤා. උපාදානවිප්පයුත්තා උපාදානියා පඤ්ඤා, උපාදානවිප්පයුත්තා අනුපාදානියා පඤ්ඤා. සංකිලෙසිකා පඤ්ඤා, අසංකිලෙසිකා පඤ්ඤා කිලෙසවිප්පයුත්තා සංකිලෙසිකා පඤ්ඤා, කිලෙසවිප්පයුත්තා අසංකිලෙසිකා පඤ්ඤා. සවිතක්කා පඤ්ඤා, අවිතක්කා පඤ්ඤා. සවිචාරා පඤ්ඤා, අවිචාරා පඤ්ඤා. සප්පීතිකා පඤ්ඤා, අප්පීතිකා පඤ්ඤා. පීතිසහගතා පඤ්ඤා, න පීති-සහගතා පඤ්ඤා. සුඛසහගතා පඤ්ඤා, න සුඛසහගතා පඤ්ඤා උපෙක්ඛා-සහගතා පඤ්ඤා, න උපෙක්ඛාසහගතා පඤ්ඤා. කාමාවචරා පඤ්ඤා, න කාමාවචරා පඤ්ඤා. රූපාවචරා පඤ්ඤා, න රූපාවචරා පඤ්ඤා. අරූපාවචරා පඤ්ඤා, න අරූපාවචරා පඤ්ඤා පරියාපන්නා පඤ්ඤා, අපරියාපන්නා පඤ්ඤා. නිය්‍යානිකා පඤ්ඤා, අනිය්‍යානිකා පඤ්ඤා. නියතා පඤ්ඤා, අනියතා පඤ්ඤා, සඋත්තරා පඤ්ඤා, අනුත්තරා පඤ්ඤා. අත්ථජාපිකා පඤ්ඤා, ජාපිතත්ථා පඤ්ඤා.

එවං දුවිධෙන ඤාණවත්ථු.

---

809. තිවිධෙන ඤාණවත්ථු : චින්තාමයා පඤ්ඤා සුතමයා පඤ්ඤා භාවනාමයා පඤ්ඤා, දානමයා පඤ්ඤා සීලමයා පඤ්ඤා භාවනාමයා පඤ්ඤා, අධිසීලෙ පඤ්ඤා අධිචිත්තෙ පඤ්ඤා අධිපඤ්ඤාය පඤ්ඤා, ආයකොසල්ලං අපායකොසල්ලං උපායකොසල්ලං, විපාකා පඤ්ඤා විපාකධම්මධම්මා පඤ්ඤා නෙවවිපාකනවිපාකධම්මධම්මා පඤ්ඤා, උපාදින්නුපාදානියා පඤ්ඤා අනුපාදින්නුපාදානියා පඤ්ඤා අනුපාදින්නානු-පාදානියා පඤ්ඤා, සවිතක්කසවිචාරා පඤ්ඤා අවිතක්කවිචාරමත්තා පඤ්ඤා අවිතක්කඅවිචාරා පඤ්ඤා, පීතිසහගතා පඤ්ඤා සුඛසහගතා පඤ්ඤා උපෙක්ඛා සහගතා පඤ්ඤා, ආචයගාමිනී පඤ්ඤා අපචයගාමිනී පඤ්ඤා නෙවාචයගාමි[1] නාපචයගාමිනී පඤ්ඤා, සෙක්ඛා පඤ්ඤා අසෙක්ඛා පඤ්ඤා නෙවසෙක්ඛා නාසෙක්ඛා පඤ්ඤා, පරිත්තා පඤ්ඤා මහග්ගතා පඤ්ඤා අප්පමාණා පඤ්ඤා, පරිත්තාරම්මණා පඤ්ඤා මහග්ගතාරම්මණා පඤ්ඤා අප්පමාණාරම්මණා පඤ්ඤා, මග්ගාරම්මණා පඤ්ඤා මග්ගහෙතුකා පඤ්ඤා මග්ගාධිපතිනී පඤ්ඤා, උප්පන්නා පඤ්ඤා අනුප්පන්නා පඤ්ඤා උප්පාදිනී පඤ්ඤා, අතීතා පඤ්ඤා අනාගතා පඤ්ඤා පච්චුප්පන්නා පඤ්ඤා, අතීතාරම්මණා පඤ්ඤා අනාගතාරම්මණා පඤ්ඤා පච්චුප්පන්නාරම්මණා පඤ්ඤා, අජ්ඣත්තා පඤ්ඤා බහිද්ධා පඤ්ඤා අජ්ඣත්තබහිද්ධා පඤ්ඤා, අජ්ඣත්තාරම්මණා පඤ්ඤා බහිද්ධාරම්මණා පඤ්ඤා අජ්ඣත්තබහිද්ධාරම්මණා පඤ්ඤා.

---

1. නෙවාචයගාමිනී – සිපැවි, සත්‍යා.

Free Distribution www.aathaapi.org

808. ද්විප්‍රකාරයෙකින් ඥනවස්තු වෙයි : ලෞකිකප්‍රඥ ය, ලොකොත්තර ප්‍රඥ යි. කිසි විඥනයෙකින් දතයුතු ප්‍රඥ ය, කිසි විඥනයෙකින් නො දතයුතු ප්‍රඥ යි. සාස්‍රව ප්‍රඥ ය, අනාස්‍රවප්‍රඥ යි. ආස්‍රවවිප්‍රයුක්තසාස්‍රවප්‍රඥ ය, ආස්‍රවවිප්‍රයුක්තඅනාස්‍රවප්‍රඥ යි. සංයොජනියප්‍රඥ ය, අසංයොජනියප්‍රඥ යි. සංයොජනවිප්‍රයුක්තසංයොජනියප්‍රඥ ය, සංයොජනවිප්‍රයුක්තඅසංයොජනියප්‍රඥ යි. ග්‍රන්ථනීයප්‍රඥ ය, අග්‍රන්ථනීයප්‍රඥ යි. ග්‍රන්ථ විප්‍රයුක්තග්‍රන්ථනීයප්‍රඥ ය, ග්‍රන්ථවිප්‍රයුක්තඅග්‍රන්ථනීයප්‍රඥ යි. ඔඝනීයප්‍රඥ ය, අනොඝ නීයප්‍රඥ යි. ඔඝවිප්‍රයුක්තඔඝනීය ප්‍රඥ ය, ඔඝවිප්‍රයුක්තඅනොඝනීයප්‍රඥ යි. යොගනීය ප්‍රඥ ය, අයෝගනීයප්‍රඥ යි. යෝගවිප්‍රයුක්තයෝගනීයප්‍රඥ ය, යෝගවිප්‍රයුක්තඅයෝගනීය ප්‍රඥ යි. නීවරණියප්‍රඥ ය, අනීවරණියප්‍රඥ යි. නීවරණවිප්‍රයුක්තනීවරණියප්‍රඥ ය, නීවරණවිප්‍රයුක්තඅනීවරණියප්‍රඥ යි. පරාමෘෂ්ටප්‍රඥ ය, අපරාමෘෂ්ටප්‍රඥ යි. පරාමර්ශ විප්‍රයුක්තපරාමෘෂ්ටප්‍රඥ ය, පරාමර්ශවිප්‍රයුක්තඅපරාමෘෂ්ටප්‍රඥ යි. උපාදින්නප්‍රඥ ය, අනුපාදින්නප්‍රඥ යි. උපාදනියප්‍රඥ ය, අනුපාදනියප්‍රඥ යි. උපාදනවිප්‍රයුක්තඋපාදනිය ප්‍රඥ ය, උපාදනවිප්‍රයුක්තඅනුපාදනියප්‍රඥ යි. සාංක්ලෙශිකප්‍රඥ ය, අසාංක්ලෙශිකප්‍රඥ යි. ක්ලේශවිප්‍රයුක්තසාංක්ලේශිකප්‍රඥ ය, කෙලේශවිප්‍රයුක්තඅසාංක්ලේශිකප්‍රඥ යි. සවිතර්කප්‍රඥ ය, අවිතර්කප්‍රඥ යි. සවිචාරප්‍රඥ ය, අවිචාරප්‍රඥ යි. සප්‍රීතිකප්‍රඥ ය, අප්‍රීතිකප්‍රඥ යි, ප්‍රීතිසහගතප්‍රඥ ය, ප්‍රීතිසහගත නො වූ ප්‍රඥ යි. සුඛසහගතප්‍රඥ ය, සුඛ සහගත නො වූ ප්‍රඥ යි. උපේක්ෂාසහගතප්‍රඥ ය, උපේක්ෂාසහගත නො වූ ප්‍රඥ යි. කාමාවචරප්‍රඥ ය, කාමාවචර නො වූ ප්‍රඥ යි. රූපාවචරප්‍රඥ ය, රූපාවචර නො වූ ප්‍රඥ යි. අරූපාවචරප්‍රඥ ය, අරූපාවචර නො වූ ප්‍රඥ යි. පර්‍යාපන්නප්‍රඥ ය, අපර්‍යාපන්නප්‍රඥ යි. නෛර්‍යාණිකප්‍රඥ ය, අනෛර්‍යාණිකප්‍රඥ යි. නියතප්‍රඥ ය, අනියතප්‍රඥ යි. සඋත්තර ප්‍රඥ ය, අනුත්තරප්‍රඥ යි. විපාක සඞ්ඛ්‍යාත අර්ථ උපදවන ප්‍රඥ ය, උපදවන අර්ථ ඇති ප්‍රඥ යි.

**මෙසේ ද්විප්‍රකාරයෙන් ඥනවස්තු වේ.**

---

809. ත්‍රිප්‍රකාරයෙන් ඥනවස්තු වෙයි : චින්තාමයප්‍රඥ ය, ශ්‍රැතමයප්‍රඥ ය, භාවනාමයප්‍රඥ යි. දනමයප්‍රඥ ය, ශීලමයප්‍රඥ ය, භාවනාමයප්‍රඥ යි. අධිශීලයෙහි ප්‍රඥ ය, අධිචිත්තයෙහි ප්‍රඥ ය, අධිප්‍රඥයෙහි ප්‍රඥ යි. වෘද්ධිකෞශල්‍ය ය, හානි කෞශල්‍ය ය, උපායකෞශල්‍ය යි. විපාකප්‍රඥ ය, විපාකස්වභාවධර්මප්‍රඥ ය, නෙව විපාකනවිපාකස්වභාවධර්මප්‍රඥ යි. උපාදින්නොපාදනියප්‍රඥ ය, අනුපාදින්නොපාදනිය ප්‍රඥ ය, අනුපාදින්නඅනුපාදනියප්‍රඥ යි. සවිතර්කසවිචාරප්‍රඥ ය, අවිතර්කවිචාරමාත්‍ර ප්‍රඥ ය, අවිතර්කඅවිචාරප්‍රඥ යි. ප්‍රීතිසහගතප්‍රඥ ය, සුඛසහගතප්‍රඥ ය, උපේක්ෂාසහගත ප්‍රඥ යි. ආචයගාමිනීප්‍රඥ ය, අපචයගාමිනීප්‍රඥ ය, නො ම ආචයගාමී නො ද අපචයගාමිනී ප්‍රඥ යි. ශෛක්ෂප්‍රඥ ය, අශෛක්ෂප්‍රඥ ය, නො ම ශෛක්ෂ නො ද අශෛක්ෂප්‍රඥ යි. පරිත්තප්‍රඥ ය, මහද්ගතප්‍රඥ ය, අප්‍රමාණප්‍රඥ යි. පරිත්තාලම්බනප්‍රඥ ය, මහද්ගතා ලම්බනප්‍රඥ ය, අප්‍රමාණාලම්බනප්‍රඥ යි. මාර්ගාලම්බනප්‍රඥ ය, මාර්ගහේතුකප්‍රඥ ය, මාර්ගාධිපතිප්‍රඥ යි. උත්පන්නප්‍රඥ ය, අනුත්පන්නප්‍රඥ ය, උත්පාදිනීප්‍රඥ යි. අතීත ප්‍රඥ ය, අනාගතප්‍රඥ ය, ප්‍රත්‍යුත්පන්නප්‍රඥ යි. අතීතාලම්බනප්‍රඥ ය, අනාගතාලම්බන ප්‍රඥ ය, ප්‍රත්‍යුත්පන්නාලම්බනප්‍රඥ යි. අධ්‍යාත්මප්‍රඥ ය, බාහිරප්‍රඥ ය, අධ්‍යාත්මබාහිර ප්‍රඥ යි. අධ්‍යාත්මාලම්බනප්‍රඥ ය, බාහිරාලම්බනප්‍රඥ ය, අධ්‍යාත්මබාහිරාලම්බනප්‍රඥ යි.

සවිතක්කසවිචාරා පඤ්ඤා අත්ථි විපාකා අත්ථි විපාකධම්මධම්මා අත්ථි නෙවවිපාකනවිපාකධම්මධම්මා, අත්ථි උපාදින්නුපාදානියා. අත්ථි අනුපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නඅනුපාදානියා, අත්ථි පීතිසහගතා අත්ථි සුඛසහගතා අත්ථි උපෙක්ඛාසහගතා, අත්ථි ආචයගාමිනී අත්ථි අපචයගාමිනී අත්ථි නෙවාචයගාමිනාපචයගාමිනී, අත්ථි සෙක්ඛා අත්ථි අසෙක්ඛා අත්ථි නෙවසෙක්ඛානාසෙක්ඛා, අත්ථි පරිත්තා අත්ථි මහග්ගතා අත්ථි අප්පමාණා, අත්ථි පරිත්තාරම්මණා අත්ථි මහග්ගතාරම්මණා අත්ථි අප්පමාණාරම්මණා, අත්ථි මග්ගාරම්මණා අත්ථි මග්ගහෙතුකා අත්ථි මග්ගාධිපතිනී, අත්ථි උප්පන්නා අත්ථි අනුප්පන්නා අත්ථි උප්පාදිනී, අත්ථි අතීතා අත්ථි අනාගතා අත්ථි පච්චුප්පන්නා, අත්ථි අතීතාරම්මණා අත්ථි අනාගතාරම්මණා අත්ථි පච්චුප්පන්නාරම්මණා, අත්ථි අජ්ඣත්තා අත්ථි බහිද්ධා අත්ථි අජ්ඣත්තබහිද්ධා, අත්ථි අජ්ඣත්තාරම්මණා අත්ථි බහිද්ධාරම්මණා අත්ථි අජ්ඣත්තබහිද්ධාරම්මණා.

අවිතක්කවිචාරමත්තා පඤ්ඤා අත්ථි විපාකා, අත්ථි විපාකධම්මධම්මා, අත්ථි නෙවවිපාකනවිපාකධම්මධම්මා, අත්ථි උපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නඅනුපාදානියා. අත්ථි ආචයගාමිනී අත්ථි අපචයගාමිනී අත්ථි නෙවාචයගාමි නාපචයගාමිනී. අත්ථි සෙක්ඛා අත්ථි අසෙක්ඛා අත්ථි නෙවසෙක්ඛානාසෙක්ඛා. අත්ථි උප්පන්නා අත්ථි අනුප්පන්නා අත්ථි උප්පාදිනී. අත්ථි අතීතා අත්ථි අනාගතා අත්ථි පච්චුප්පන්නා. අත්ථි අජ්ඣත්තා අත්ථි බහිද්ධා අත්ථි අජ්ඣත්තබහිද්ධා.

අවිතක්කඅවිචාරා පඤ්ඤා අත්ථි විපාකා අත්ථි විපාකධම්මධම්මා, අත්ථි නෙවවිපාකනවිපාකධම්මධම්මා, අත්ථි උපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නඅනුපාදානියා, අත්ථි පීතිසහගතා අත්ථි සුඛසහගතා අත්ථි උපෙක්ඛාසහගතා, අත්ථි ආචයගාමිනී අත්ථි අපචයගාමිනී අත්ථි නෙවාචයගාමි නාපචයගාමිනී, අත්ථි සෙක්ඛා අත්ථි අසෙක්ඛා අත්ථි නෙව, සෙක්ඛා නාසෙක්ඛා, අත්ථි පරිත්තාරම්මණා අත්ථි මහග්ගතාරම්මණා අත්ථි අප්පමාණාරම්මණා, අත්ථි මග්ගාරම්මණා අත්ථි මග්ගහෙතුකා අත්ථි මග්ගාධිපතිනී, අත්ථි උප්පන්නා අත්ථි අනුප්පන්නා අත්ථි උප්පාදිනී, අත්ථි අතීතා අත්ථි අනාගතා අත්ථි පච්චුප්පන්නා, අත්ථි අතීතාරම්මණා අත්ථි අනාගතාරම්මණා අත්ථි පච්චුප්පන්නාරම්මණා, අත්ථි අජ්ඣත්තා අත්ථි බහිද්ධා අත්ථි අජ්ඣත්තබහිද්ධා, අත්ථි අජ්ඣත්තාරම්මණා අත්ථි බහිද්ධාරම්මණා අත්ථි අජ්ඣත්තබහිද්ධාරම්මණා.

පීතිසහගතා පඤ්ඤා -පෙ- සුඛසහගතා පඤ්ඤා අත්ථි විපාකා අත්ථි විපාකධම්මධම්මා, අත්ථි නෙවවිපාකනවිපාකධම්මධම්මා, අත්ථි උපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නඅනුපාදානියා, අත්ථි සවිතක්කසවිචාරා අත්ථි අවිතක්කවිචාරමත්තා අත්ථි අවිතක්කඅවිචාරා, අත්ථි ආචයගාමිනී අත්ථි අපචයගාමිනී අත්ථි නෙවාචයගාමි නාපචයගාමිනී, අත්ථි සෙක්ඛා අත්ථි අසෙක්ඛා අත්ථි නෙවසෙක්ඛානාසෙක්ඛා, අත්ථි පරිත්තා අත්ථි මහග්ගතා අත්ථි අප්පමාණා, අත්ථි

සවිතර්කසවිචාරප්‍රඥව විපාක වූයෙක් ඇත, විපාකස්වභාවධර්ම වූයෙක් ඇත, නො ම විපාක නො ද විපාකස්වභාවධර්ම වූයෙක් ඇති. උපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නඅනුපාදනිය වූයෙක් ඇති. ප්‍රීති සහගත වූයෙක් ඇත, සුඛසහගත වූයෙක් ඇත, උපෙක්ෂාසහගත වූයෙක් ඇති. ආචය ගාමිනී වූයෙක් ඇත, අපචයගාමිනී වූයෙක් ඇත, නො ම ආචයගාමී නොද අපචයගාමිනී වූයෙක් ඇති. ශෛක්ෂ වූයෙක් ඇත, අශෛක්ෂ වූයෙක් ඇත, නො ම ශෛක්ෂ නො ද අශෛක්ෂ වූයෙක් ඇති. පරිත්ත වූයෙක් ඇත, මහද්ගත වූයෙක් ඇත, අප්‍රමාණ වූයෙක් ඇති. පරිත්තාලම්බන වූයෙක් ඇත, මහද්ගතාලම්බන වූයෙක් ඇත, අප්‍රමාණාලම්බන වූයෙක් ඇති. මාර්ගාලම්බන වූයෙක් ඇත, මාර්ගහේතුක වූයෙක් ඇත, මාර්ගාධිපති වූයෙක් ඇති. උත්පන්න වූයෙක් ඇත, අනුත්පන්න වූයෙක් ඇත, උත්පාදී වූයෙක් ඇති. අතීත වූයෙක් ඇත, අනාගත වූයෙක් ඇති, ප්‍රත්‍යුත්පන්න වූයෙක් ඇති. අතීතාලම්බන වූයෙක් ඇත, අනාගතාලම්බන වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නාලම්බන වූයෙක් ඇති. අධ්‍යාත්ම වූයෙක් ඇත, බාහිර වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිර වූයෙක් ඇති. අධ්‍යාත්මා ලම්බන වූයෙක් ඇත, බාහිරාලම්බන වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිරාලම්බන වූයෙක් ඇති.

අවිතර්කවිචාරමාත්‍රප්‍රඥව විපාක වූයෙක් ඇත, විපාකස්වභාවධර්ම වූයෙක් ඇත, නෛවවිපාකනවිපාකස්වභාවධර්ම වූයෙක් ඇති. උපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්න අනුපාදනිය වූයෙක් ඇති. ආචයගාමී වූයෙක් ඇත, අපචයගාමී වූයෙක් ඇත, නෛවාචයගාමීනාපචයගාමී වූයෙක් ඇති. ශෛක්ෂ වූයෙක් ඇත, අශෛක්ෂ වූයෙක් ඇත, නෛවශෛක්ෂනාශෛක්ෂ වූයෙක් ඇති. උත්පන්න වූයෙක් ඇත, අනුත්පන්න වූයෙක් ඇත, උත්පාදී වූයෙක් ඇති. අතීත වූයෙක් ඇත, අනාගත වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්න වූයෙක් ඇති. අධ්‍යාත්ම වූයෙක් ඇත බාහිර වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිර වූයෙක් ඇති.

අවිතර්කඅවිචාරප්‍රඥව විපාක වූයෙක් ඇත, විපාකස්වභාවධර්ම වූයෙක් ඇත, නෛවවිපාකනවිපාකස්වභාවධර්ම වූයෙක් ඇති. උපාදින්නොපාදනිය වූයෙක් ඇත අනුපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නඅනුපාදනිය වූයෙක් ඇති. ප්‍රීතිසහගත වූයෙක් ඇත, සුඛසහගත වූයෙක් ඇත, උපෙක්ෂාසහගත වූයෙක් ඇති. ආචයගාමී වූයෙක් ඇත, අපචයගාමී වූයෙක් ඇත, නෛවාචයගාමීනාපචයගාමී වූයෙක් ඇති. ශෛක්ෂ වූයෙක් ඇත, අශෛක්ෂ වූයෙක් ඇත, නෛවශෛක්ෂනාශෛක්ෂ වූයෙක් ඇති. පරිත්තාලම්බන වූයෙක් ඇත, මහද්ගතාලම්බන වූයෙක් ඇත, අප්‍රමාණාලම්බන වූයෙක් ඇති. මාර්ගාලම්බන වූයෙක් ඇත, මාර්ගහේතුක වූයෙක් ඇත, මාර්ගාධිපති වූයෙක් ඇති. උත්පන්න වූයෙක් ඇත, අනුත්පන්න වූයෙක් ඇත, උත්පාදී වූයෙක් ඇති. අතීත වූයෙක් ඇත, අනාගත වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්න වූයෙක් ඇති. අතීතාලම්බන වූයෙක් ඇත, අනාගතාලම්බන වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නාලම්බන වූයෙක් ඇති. අධ්‍යාත්ම වූයෙක් ඇත, බාහිර වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිර වූයෙක් ඇති. අධ්‍යාත්මාලම්බන වූයෙක් ඇත, බාහිරාලම්බන වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිරාලම්බන වූයෙක් ඇති.

ප්‍රීතිසහගතප්‍රඥව . . . සුඛසහගතප්‍රඥව විපාක වූයෙක් ඇත, විපාකස්වභාවධර්ම වූයෙක් ඇත, නෛවවිපාකනවිපාකස්වභාවධර්ම වූයෙක් ඇති. උපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නඅනුපාදනිය වූයෙක් ඇති. සවිතර්කසවිචාර වූයෙක් ඇත, අවිතර්කවිචාරමාත්‍ර වූයෙක් ඇත, අවිතර්කඅවිචාර වූයෙක් ඇති. ආචයගාමී වූයෙක් ඇත, අපචයගාමී වූයෙක් ඇත, නෛවාචයගාමීනාපචයගාමී වූයෙක් ඇති. ශෛක්ෂ වූයෙක් ඇත, අශෛක්ෂ වූයෙක් ඇත, නෛවශෛක්ෂ නාශෛක්ෂ වූයෙක් ඇති. පරිත්ත වූයෙක් ඇත, මහද්ගත වූයෙක් ඇත, අප්‍රමාණ වූයෙක්

පරිත්තාරම්මණා අත්ථි මහග්ගතාරම්මණා අත්ථි අප්පමාණාරම්මණා, අත්ථි මග්ගාරම්මණා අත්ථි මග්ගහෙතුකා අත්ථි මග්ගාධිපතිනී, අත්ථි උප්පන්නා අත්ථි අනුප්පන්නා අත්ථි උප්පාදිනී, අත්ථි අතීතා අත්ථි අනාගතා අත්ථි පච්චුප්පන්නා, අත්ථි අතීතාරම්මණා අත්ථි අනාගතාරම්මණා අත්ථි පච්චුප්පන්නාරම්මණා, අත්ථි අජ්ඣත්තා අත්ථි බහිද්ධා අත්ථි අජ්ඣත්තබහිද්ධා, අත්ථි අජ්ඣත්තාරම්මණා අත්ථි බහිද්ධාරම්මණා අත්ථි අජ්ඣත්තබහිද්ධා-රම්මණා.

උපෙක්ඛාසහගතා පඤ්ඤා අත්ථි විපාකා අත්ථි විපාකධම්මධම්මා, අත්ථි නෙවවිපාකනවිපාකධම්මධම්මා. අත්ථි උපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නුපාදානියා අත්ථි අනුපාදින්නඅනුපාදානියා, අත්ථි ආචයගාමිනී අත්ථි අපචයගාමිනී අත්ථි නෙවාචයගාමිනාපචයගාමිනී, අත්ථි සෙක්ඛා අත්ථි අසෙක්ඛා අත්ථි නෙවසෙක්ඛානාසෙක්ඛා, අත්ථි පරිත්තා අත්ථි මහග්ගතා අත්ථි අප්පමාණා, අත්ථි පරිත්තාරම්මණා අත්ථි මහග්ගතාරම්මණා අත්ථි අප්පමාණාරම්මණා, අත්ථි මග්ගාරම්මණා අත්ථි මග්ගහෙතුකා අත්ථි මග්ගාධිපතිනී, අත්ථි උප්පන්නා අත්ථි අනුප්පන්නා අත්ථි උප්පාදිනී, අත්ථි අතීතා අත්ථි අනාගතා අත්ථි පච්චුප්පන්නා, අත්ථි අතීතාරම්මණා අත්ථි අනාගතාරම්මණා අත්ථි පච්චුප්පන්නාරම්මණා, අත්ථි අජ්ඣත්තා අත්ථි බහිද්ධා අත්ථි අජ්ඣත්තබහිද්ධා, අත්ථි අජ්ඣත්තාරම්මණා අත්ථි බහිද්ධා-රම්මණා අත්ථි අජ්ඣත්තබහිද්ධාරම්මණා.

එවං තිවිධෙන ඤාණවත්ථු.

---

810. චතුබ්බිධෙන ඤාණවත්ථු: කම්මස්සකතං ඤාණං[1] සච්චානු-ලොමිකං ඤාණං මග්ගසමඞ්ගිස්ස ඤාණං ඵලසමඞ්ගිස්ස ඤාණං, දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං. කාමාවචරා පඤ්ඤා රූපාවචරා පඤ්ඤා අරූපාවචරා පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා. ධම්මෙ ඤාණං අන්වයෙ ඤාණං පරිච්ඡෙදෙ[2] ඤාණං සම්මුතිඤාණං.[3] අත්ථි පඤ්ඤා ආචයාය නො අපචයාය අත්ථි පඤ්ඤා අපචයාය නො ආචයාය, අත්ථි පඤ්ඤා ආචයාය චෙව අපචයාය ච, අත්ථි පඤ්ඤා නෙවාචයාය නො අපචයාය. අත්ථි පඤ්ඤා නිබ්බිදාය නො පටිවෙධාය, අත්ථි පඤ්ඤා පටිවෙධාය නො නිබ්බිදාය, අත්ථි පඤ්ඤා නිබ්බිදාය චෙව පටිවෙධාය ච, අත්ථි පඤ්ඤා නෙව නිබ්බිදාය නො පටිවෙධාය. හානභාගිනී පඤ්ඤා, ඨිතිභාගිනී පඤ්ඤා, විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බෙධභාගිනී පඤ්ඤා.

1. කම්මස්සකතඤාණං - සිරිමු, මජසං.
2. පරිචෙච ඤාණං - සිරිමු, ස්‍යා, පරියෙ - මජසං.
3. සම්මතිඤාණං - සංචි.

ඇති. පරිත්තාලම්බන වූයෙක් ඇත, මහද්ගතාලම්බන වූයෙක් ඇත, අප්‍රමාණාලම්බන වූයෙක් ඇති. මාර්ගාලම්බන වූයෙක් ඇත, මාර්ගහෙතුක වූයෙක් ඇත, මාර්ගාධිපති වූයෙක් ඇති. උත්පන්න වූයෙක් ඇත, අනුත්පන්න වූයෙක් ඇත, උත්පාදී වූයෙක් ඇති. අතීත වූයෙක් ඇත, අනාගත වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්න වූයෙක් ඇති. අතීතාලම්බන වූයෙක් ඇත, අනාගතාලම්බන වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නාලම්බන වූයෙක් ඇති. අධ්‍යාත්ම වූයෙක් ඇත, බාහිර වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිර වූයෙක් ඇති. අධ්‍යාත්මා ලම්බන වූයෙක් ඇත, බාහිරාලම්බන වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිරාලම්බන වූයෙක් ඇති.

උපෙක්ෂාසහගතප්‍රඥව විපාක වූයෙක් ඇත, විපාකස්වභාවධර්ම වූයෙක් ඇත, නෛවවිපාකනවිපාකස්වභාවධර්ම වූයෙක් ඇති. උපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නොපාදනිය වූයෙක් ඇත, අනුපාදින්නඅනුපාදනිය වූයෙක් ඇති. ආචයගාමී වූයෙක් ඇත, අපචයගාමී වූයෙක් ඇත, නෛවාචයගාමීනාපචයගාමී වූයෙක් ඇති. ශෛක්ෂ වූයෙක් ඇත, අශෛක්ෂ වූයෙක් ඇත, නෛවශෛක්ෂනාශෛක්ෂ වූයෙක් ඇති. පරිත්ත වූයෙක් ඇත, මහද්ගත වූයෙක් ඇත, අප්‍රමාණ වූයෙක් ඇති. පරිත්තාලම්බන වූයෙක් ඇත, මහද්ගතාලම්බන වූයෙක් ඇත, අප්‍රමාණාලම්බන වූයෙක් ඇති. මාර්ගා ලම්බන වූයෙක් ඇත, මාර්ගහෙතුක වූයෙක් ඇත, මාර්ගාධිපති වූයෙක් ඇති. උත්පන්න වූයෙක් ඇත, අනුත්පන්න වූයෙක් ඇත, උත්පාදී වූයෙක් ඇති. අතීත වූයෙක් ඇත, අනාගත වූයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්න වූයෙක් ඇති. අධ්‍යාත්ම වූයෙක් ඇත, බාහිර වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිර වූයෙක් ඇති. අධ්‍යාත්මාලම්බන වූයෙක් ඇත, බාහිරාලම්බන වූයෙක් ඇත, අධ්‍යාත්මබාහිරාලම්බන වූයෙක් ඇති.

**මෙසේ ත්‍රිප්‍රකාරයෙන් ඥානවස්තු වේ.**

---

810. චතුෂ්ප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: කර්මස්වකතාඥාන ය, සත්‍යානුලෝමික ඥාන ය, මාර්ගසමඞ්ගීහුගේ ඥාන ය, ඵලසමඞ්ගීහුගේ ඥාන යි. දුඃඛයෙහි ඥාන ය, දුඃඛ සමුදයයෙහි ඥාන ය, දුඃඛනිරොධයෙහි ඥාන ය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥාන යි. කාමාවචරප්‍රඥ ය, රූපාවචරප්‍රඥ ය, අරූපාවචරප්‍රඥ ය, අපයඤාපන්නප්‍රඥ යි. ධර්ම (මාර්ගප්‍රඥ) යෙහි ඥාන ය, අන්වය (කාරණ) යෙහි ඥාන ය, පරිච්ඡෙදයෙහි (සිත පිරිසිඳි මෙහි) ඥාන ය, සංවෘතිඥාන යි. ආචය පිණිස වූ අපචය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇත, අපචය පිණිස වූ ආචය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇත, ආචය පිණිසත් අපචය පිණිසත් වූ ප්‍රඥයෙක් ඇත, නො ම ආචය පිණිස වූ අපචය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇති. නිර්වෙදය පිණිස වූ ප්‍රතිවෙධය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇත, ප්‍රතිවෙධය පිණිස වූ නිර්වෙදය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇත, නිර්වෙදය පිණිසත් ප්‍රතිවෙධය පිණිසත් වූ ප්‍රඥයෙක් ඇත, නො ම නිර්වෙදය පිණිස වූ ප්‍රතිවෙධය පිණිස නො වූ ප්‍රඥයෙක් ඇති. හානභාගීප්‍රඥ ය, ස්ථිතිභාගී ප්‍රඥ ය, විශෙෂභාගීප්‍රඥ ය, නිර්වෙදභාගීප්‍රඥ යි.

චතස්සො පටිසම්භිදා, චතස්සො පටිපදා, චත්තාරි ආරම්මණානි, ජරාමරණෙ ඤාණං ජරාමරණසමුදයෙ ඤාණං ජරාමරණනිරොධෙ ඤාණං ජරාමරණනිරොධගාමිනියා පටිපදාය ඤාණං. ජාතියා ඤාණං -පෙ- භවෙ ඤාණං -පෙ- උපාදානෙ ඤාණං -පෙ- තණ්හාය ඤාණං -පෙ- වෙදනාය ඤාණං -පෙ- ඵස්සෙ ඤාණං -පෙ- සළායතනෙ ඤාණං -පෙ- නාමරූපෙ ඤාණං -පෙ- විඤ්ඤාණෙ ඤාණං -පෙ- සඞ්ඛාරෙසු ඤාණං සඞ්ඛාරසමුදයෙ ඤාණං සඞ්ඛාරනිරොධෙ ඤාණං සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

එවං චතුබ්බිධෙන ඤාණවත්ථු.

---

811. පඤ්චවිධෙන ඤාණවත්ථු : පඤ්චඞ්ගිකො සම්මාසමාධි, පඤ්චඤාණිකො සම්මාසමාධි, එවං පඤ්චවිධෙන ඤාණවත්ථු.

812. ඡබ්බිධෙන ඤාණවත්ථු : ඡසු අභිඤ්ඤාසු පඤ්ඤා, එවං ඡබ්බිධෙන ඤාණවත්ථු.

813. සත්තවිධෙන ඤාණවත්ථු : සත්තසත්තති ඤාණවත්ථූනි, එවං සත්තවිධෙන ඤාණවත්ථු.

814. අට්ඨවිධෙන ඤාණවත්ථු : චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා, එවං අට්ඨවිධෙන ඤාණවත්ථු.

815. නවවිධෙන ඤාණවත්ථු : නවසු අනුපුබ්බවිහාරසමාපත්තීසු පඤ්ඤා. එවං නවවිධෙන ඤාණවත්ථු.

816. දසවිධෙන ඤාණවත්ථු : දස තථාගතස්ස තථාගතබලානි : යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති. පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති, කතමානි දස : ඉධ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, යම්පි තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති යම්පි තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

සතර ප්‍රතිසංවිද්ඥාන ය, සතර ප්‍රතිපද්ඥාන ය, සතර ආරම්මණයෝ යැ, ජරාමරණ යෙහි ඥාන ය, ජරාමරණසමුදයයෙහි ඥාන ය, ජරාමරණනිරොධයෙහි ඥාන ය, ජරාමරණ නිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥාන යි. ජාතියෙහි ඥාන ය ... භවයෙහි ඥාන ය ... උපාදනයෙහි ඥාන ය ... තෘෂ්ණායෙහි ඥාන ය ... වෙදනායෙහි ඥාන ය ... ස්පර්ශ යෙහි ඥාන ය ... ෂඩායතනයෙහි ඥානය ... නාමරූපයෙහි ඥානය ... සංස්කාරයන්හි ඥාන ය, සංස්කාරසමුදයයෙහි ඥාන ය, සංස්කාරනිරොධයෙහි ඥාන ය, සංස්කාර නිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥාන යි.

මෙසේ චතුෂ්ප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

---

811. පඤ්චප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: පඤ්චාඞ්ග වූ සම්‍යක්සමාධි ය, පඤ්චඥානික වූ සම්‍යක්සමාධි ය. මෙසේ පඤ්චප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

812. ෂට්ප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: ෂට් අභිඥාවන්හි ප්‍රඥා යි. මෙසේ ෂට්ප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

813. සප්තප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: සත්සැත්තෑ ඥානවස්තුහු ය, මෙසේ සප්තප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

814. අෂ්ටප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: සතර මාර්ගයන්හි සතර ඵලයන්හි ප්‍රඥා යි. මෙසේ අෂ්ටප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

815. නවප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: නව අනුපූර්වවිහාරසමාපත්තීන්හි ප්‍රඥා යි. මෙසේ නවප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

816. දශප්‍රකාරයෙකින් ඥානවස්තු වෙයි: තථාගතයන් වහන්සේගේ තථාගත බලයෝ දශ දෙනෙකි: යම් බලයෙකින් සමන්වාගත වූ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෝ යි. කවර දශබලයෙක් ද යත්: මෙහි තථාගතයෝ කාරණය කාරණ හෙයින් ද අකාරණය අකාරණ හෙයින් ද ඇතිසැටියෙන් දනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ කාරණය කාරණ හෙයින් ද අකාරණය අකාරණ හෙයින් ද ඇති සැටියෙන් දනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය පවත්වත් ද එබඳු බලයෙකි.

තවද තථාගතයෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ කර්මසමාදනයන්ගේ විපාකය කාරණ වශයෙන් හේතු වශයෙන් ඇති සැටියෙන් දනගනිති. යම් ඥානයෙකින් තථාගත යෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ කර්මසමාදනයන්ගේ විපාකය කාරණ වශයෙන් හෙතු වශයෙන් දනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙකි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය පවත්වත් ද එබඳු බලයෙකි.

තවද තථාගතයෝ සර්වත්‍රගාමීමාර්ගය ඇති සැටියෙන් දනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ සර්වත්‍රගාමීමාර්ගය ඇති සැටියෙන් දනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

පුනචපරං තථාගතො අනෙකධාතු නානාධාතු ලොකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අනෙකධාතු නානාධාතු ලොකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, යම්පි තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො පරසත්තානං, පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, යම්පි තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, යම්පි තථාගතො ඣානවිමොක්ඛ-සමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං පජානාති, යම්පි තථාගතො පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො සත්තානං චුතූපපාතං යථාභූතං පජානාති, යම්පි තථාගතො සත්තානං චුතූපපාතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනචපරං තථාගතො ආසවානං ඛයං යථාභූතං පජානාති, යම්පි තථාගතො ආසවානං ඛයං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති. ඉමානි දස තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

එවං දසවිධෙන ඤාණවත්ථු.

මාතිකං

---

Free Distribution www.aathaapi.org

තවද තථාගතයෝ අනේකධාතුනානාධාතුලෝකය ඇති සැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ අනේකධාතුනානාධාතුලෝකය ඇති සැටියෙන් දැනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ බ්‍රහ්මචක්‍රය පවත්වත් ද එබඳු බලයෙකි.

තවද තථාගතයෝ සත්ත්වයන්ගේ නානාධිමුක්තික බව ඇතිසැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ සත්ත්වයන්ගේ නානාධිමුක්තික බව ඇති සැටියෙන් දැනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨ වූ බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

තවද තථාගතයෝ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරභාවය (වෘද්ධිහානිය) ඇති සැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ පරසත්ත්ව යන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරභාවය දැනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

තවද තථාගතයෝ ධ්‍යානවිමොක්ෂසමාධිසමාපත්තීන්ගේ සංක්ලේශය, ව්‍යවදානය, ව්‍යුත්ථානය ඇති සැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ ධ්‍යානවිමොක්ෂ සමාධිසමාපත්තීන්ගේ සංක්ලෙශය, ව්‍යවදානය, ව්‍යුත්ථානය දැනගනිත් නම් මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨ ස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

තවද තථාගතයෝ පූර්වනිවාසානුස්මෘතිය ඇති සැටියෙන් දැනගනිති. යම් ඥාන යෙකින් තථාගතයෝ පූර්වනිවාසානුස්මෘතිය ඇති සැටියෙන් දැනගනිත් ද මෙ ද තථාගත යන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

තවද තථාගතයෝ සත්ත්වයන්ගේ ච්‍යුති-උත්පත්තිය ඇති සැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ සත්ත්වයන්ගේ ච්‍යුති-උත්පත්තිය ඇති සැටියෙන් දැනගනිත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි.

තවද තථාගතයෝ ආස්‍රවක්ෂය ඇති සැටියෙන් දැනගනිති. යම් ඥානයෙකින් තථාගතයෝ ආස්‍රවක්ෂය ඇති සැටියෙන් දැනගනිත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගත බලයෙක් වෙයි. යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, එබඳු බලයෙකි. මොහු දසදෙන තථාගතයන්ගේ තථාගතබලයෝ යි. යම් බලයෙකින් සමන්වාගත වූ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද, පිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද එබඳු බලයෝ යි. මෙසේ දශප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

මාතෘකා යි.

817. පඤ්ච විඤ්ඤාණා[1] න හෙතුමෙව, අහෙතුකමෙව, හෙතුවිප්පයුත්තමෙව, සප්පච්චයමෙව, සඞ්ඛතමෙව, අරූපමෙව, ලොකියමෙව, සාසවමෙව, සංයොජනියමෙව, ගන්ථනියමෙව, ඔඝනියමෙව, යොගනියමෙව, නීවරණියමෙව, පරාමට්ඨමෙව, උපාදානියමෙව, සංකිලෙසිකමෙව, අව්‍යාකතමෙව, සාරම්මණමෙව, අචෙතසිකමෙව, විපාකමෙව, උපාදින්නුපාදානියමෙව, අසංකිලිට්ඨසංකිලෙසිකමෙව, න සවිතක්කසවිචාරමෙව, න අවිතක්කවිචාරමත්තමෙව, අවිතක්කඅවිචාරමෙව, න පීතිසහගතමෙව, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බමෙව, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකමෙව, නෙව ආචයගාමි න අපචයගාමිමෙව, නෙවසෙක්ඛනාසෙක්ඛමෙව, පරිත්තමෙව, කාමාවචරමෙව, න රූපාවචරමෙව, න අරූපාවචරමෙව, පරියාපන්නමෙව, නො අපරියාපන්නමෙව, අනියතමෙව, අනිය්‍යානිකමෙව, උප්පන්නං, මනොවිඤ්ඤාණවිඤ්ඤෙය්‍යමෙව, අනිච්චමෙව, ජරාභිභූතමෙව.

පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා උප්පන්නාරම්මණාති: උප්පන්නස්මිං වත්ථුස්මිං උප්පන්නෙ ආරම්මණෙ උප්පජ්ජන්ති. පුරෙජාතවත්ථුකා පුරෙජාතාරම්මණාති: පුරෙජාතස්මිං වත්ථුස්මිං පුරෙජාතෙ ආරම්මණෙ උප්පජ්ජන්ති. අජ්ඣත්තිකවත්ථුකා බාහිරාරම්මණාති: පඤ්චන්නං විඤ්ඤාණානං වත්ථු අජ්ඣත්තිකා, ආරම්මණා බාහිරා. අසම්භින්නවත්ථුකා අසම්භින්නාරම්මණාති: අසම්භින්නස්මිං වත්ථුස්මිං අසම්භින්නෙ ආරම්මණෙ උප්පජ්ජන්ති. නානාවත්ථුකා නානාරම්මණාති: අඤ්ඤං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු ච[2] ආරම්මණං ච, අඤ්ඤං සොතවිඤ්ඤාණස්ස වත්ථු ච[2] ආරම්මණං ච, අඤ්ඤං ඝානවිඤ්ඤාණස්ස වත්ථු ච ආරම්මණං ච, අඤ්ඤං ජිව්හාවිඤ්ඤාණස්ස වත්ථු ච[2] ආරම්මණං ච, අඤ්ඤං කායවිඤ්ඤාණස්ස වත්ථු ච ආරම්මණං ච, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තීති: චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරවිසයං සොතවිඤ්ඤාණං න පච්චනුභොති, සොතවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි චක්ඛුවිඤ්ඤාණං න පච්චනුභොති. චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරවිසයං ඝානවිඤ්ඤාණං න පච්චනුභොති, ඝානවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි චක්ඛුවිඤ්ඤාණං න පච්චනුභොති. චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරවිසයං ජිව්හාවිඤ්ඤාණං න පච්චනුභොති, ජිව්හාවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි චක්ඛුවිඤ්ඤාණං න පච්චනුභොති. චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරවිසයං කායවිඤ්ඤාණං න පච්චනුභොති, කායවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි චක්ඛුවිඤ්ඤාණං න පච්චනුභොති. සොතවිඤ්ඤාණස්ස -පෙ- ඝානවිඤ්ඤාණස්ස -පෙ- ජිව්හාවිඤ්ඤාණස්ස -පෙ- කායවිඤ්ඤාණස්ස ගොචරවිසයං චක්ඛුවිඤ්ඤාණං න පච්චනුභොති, චක්ඛුවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි කායවිඤ්ඤාණං න පච්චනුභොති, කායවිඤ්ඤාණස්ස ගොචරවිසයං සොතවිඤ්ඤාණං න පච්චනුභොති, සොතවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි කායවිඤ්ඤාණං න පච්චනුභොති. කායවිඤ්ඤාණස්ස ගොචරවිසයං ඝානවිඤ්ඤාණං න පච්චනුභොති, ඝානවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි කායවිඤ්ඤාණං න පච්චනුභොති. කායවිඤ්ඤාණස්ස ගොචරවිසයං ජිව්හාවිඤ්ඤාණං න පච්චනුභොති, ජිව්හාවිඤ්ඤාණස්ස ගොචරවිසයම්පි කායවිඤ්ඤාණං න පච්චනුභොති. න අසමන්නාහාරා උප්පජ්ජන්තීති: සමන්නාහරන්තස්ස උප්පජ්ජන්ති. න අමනසිකාරා උප්පජ්ජන්තීති: මනසිකරොන්තස්ස උප්පජ්ජන්ති. න අබ්බොකිණ්ණා උප්පජ්ජන්තීති: න පටිපාටියා උප්පජ්ජන්ති. න අපුබ්බං අචරිමං උප්පජ්ජන්තීති: න එකක්ඛණෙ උප්පජ්ජන්ති.

1. පඤ්චවිඤ්ඤාණං - සීපෑවි.
2. වත්ථුං ච - සීපෑවි.

817. පඤ්චවිඥානයෝ හේතු නො වූවාහු ම ය, අහේතුකයෝ ම ය, හේතු විප්‍රයුක්තයෝ ම ය, සප්‍රත්‍යයෝ ම ය, සඞ්ඛතයෝ ම ය, අරූපයෝ මය, ලෞකික යෝ ම ය, සාස්‍රවයෝ ම ය, සංයෝජනියයෝ ම ය, ග්‍රන්ථනීයයෝ ම ය, ඕඝනීයයෝ ම ය, යෝගනීයයෝ ම ය, නීවරණියයෝ ම ය, පරාමෘෂ්ටයෝ ම ය, උපාදනියයෝ ම ය, සාංක්ලෙසිකයෝ ම ය, අව්‍යාකෘතයෝ මය, සාලම්බනයෝ ම ය, අචෛතසිකයෝ ම ය, විපාකයෝ ම ය, උපාදින්නොපාදනියයෝ ම ය, අසාංක්ලිෂ්ටසංක්ලෙසිකයෝ ම ය, සවිතර්කසවිචාර නො වූවාහු ම ය, අවිතර්කවිචාරමාත්‍ර නො වූවාහු ම ය, අවිතර්කඅවිචාර යෝ ම ය, ප්‍රීතිසහගත නො වූවාහු ම ය, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහා තව්‍යයෝ ම ය, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහේතු ඇත්තාහු ම ය, නෛවාචයගාමීනාපචයගාමීහු ම ය, නෛවශෛක්ෂනාශෛක්ෂයෝ ම ය, පරිත්ත යෝ ම ය, කාමාවචරයෝ ම ය, රූපාවචර නො වූවාහු ම ය, අරූපාවචර නො වූවාහු ම ය, පර්‍යාපන්නයෝ ම ය, අපර්‍යාපන්න නො වූවාහු ම ය, අනියතයෝ ම ය, අනෛර්‍යාණික යෝ ම ය, උත්පන්නය, මනෝවිඥානයෙන් දතයුත්තෝ ම ය, අනිත්‍ය ම ය, ජරායෙන් මඩනා ලද්දහු මැ යි.

පඤ්චවිඥානයෝ උත්පන්නවස්තුකයෝ ය, උත්පන්නාලම්බනයෝ ය යනු : උපන් වස්තුයෙහි උපන් අරමුණෙහි උපදිත්. පුරෙජාතවස්තුකයෝ ය, පුරෙජාතාලම්බනයෝ ය යනු : පළමු උපන් වස්තුයෙහි පළමු උපන් අරමුණෙහි උපදිත්. ආධ්‍යාත්මිකවස්තුක යෝ ය, බාහිරාලම්බනයෝ ය යනු : පඤ්චවිඥානයන්ගේ වස්තුව ආධ්‍යාත්මික ය, ආලම්බනයෝ බාහිරයෝ යි. අසම්භින්නවස්තුකයෝ ය, අසම්භින්නආලම්බනයෝ ය යනු : අනිරුද්ධවස්තුයෙහි අනිරුද්ධආලම්බනයෙහි උපදිත්. නානාවස්තුකයෝ ය, නානාලම්බනයෝ ය යනු : චක්ෂුර්විඥානයාගේ වස්තුව (ප්‍රසාදය) ත් ආලම්බනයත් අනෙකෙක, ශ්‍රොත්‍රවිඥානයාගේ වස්තුවත් ආලම්බනයත් අනෙකෙක, ඝ්‍රාණවිඥානයාගේ වස්තුවත් ආලම්බනයත් අනෙකෙක, ජිහ්වාවිඥානයාගේ වස්තුවත් ආලම්බනයත් අනෙකෙක, කායවිඥානයාගේ වස්තුවත් ආලම්බනයත් අනෙකෙකි. අනොන්‍යන්‍ය ගෝචරවිෂය නො විඳිති යනු : චක්ෂුර්විඥානයාගේ ගෝචරවිෂය ශ්‍රෝත්‍රවිඥානය තෙමේ නො විඳියි, ශ්‍රොත්‍ර විඥානයාගේ ගොචරවිෂය ද චක්ෂුර්විඥානය නො විඳී. චක්ෂුර්විඥානයා ගේ ගොචරවිෂය ඝ්‍රාණවිඥානය නො විඳියි. ඝ්‍රාණවිඥානයාං ගොචරවිෂය ද චක්ෂුර් විඥානය නො විඳී. චක්ෂුර්විඥානයාගේ ගොචරවිෂය ජිහ්වාවිඥානය නො විඳියි. ජිහ්වා විඥානයාගේ ගොචරවිෂය ද චක්ෂුර්විඥානය නො විඳී. චක්ෂුර්විඥානයාගේ ගොචරවිෂය කායවිඥානය නො විඳියි. කායවිඥානයාගේ ගෝචරවිෂය ද චක්ෂුර්විඥානය නො විඳී. ශ්‍රොත්‍රවිඥානයාගේ . . . ඝ්‍රාණවිඥානයාගේ . . . ජිහ්වාවිඥානයාගේ . . . කායවිඥානයාගේ ගෝචරවිෂය චක්ෂුර්විඥානය නො විඳියි. චක්ෂුර්විඥානයාගේ ගොචරවිෂය ද කායවිඥානය නො විඳී. කායවිඥානයාගේ ගොචරවිෂය ශ්‍රොත්‍රවිඥානය නො විඳියි, ශ්‍රොත්‍රවිඥානයාගේ ගොචරවිෂය ද කායවිඥානය නො විඳී. කායවිඥානයාගේ ගොචරවිෂය ඝ්‍රාණවිඥානය නො විඳියි. ඝ්‍රාණවිඥානයාගේ ගොචරවිෂය ද කායවිඥානය නො විඳී. කායවිඥානයාගේ ගොචරවිෂය ජිහ්වාවිඥානය නො විඳියි. ජිහ්වාවිඥානයාගේ ගොචරවිෂය ද කායවිඥානය නො විඳී. අසමන්වාහාර ව නූපදිති යනු : සිත්හි ලා එළවන්නහුට උපදිත්. අමනසිකාර ව නූපදිති යනු : මෙනෙහි කරන්නහුට උපදිත්. අව්‍යාකීර්ණ ව නූපදිති යනු : පිළිවෙළින් නූපදිත්. පෙරපසු නො ව නූපදිති යනු : එකක්ෂණයෙහි නූපදිත්.

න අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්තීති : චක්ඛුවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා සොතවිඤ්ඤාණං න උප්පජ්ජති, සොතවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි චක්ඛුවිඤ්ඤාණං න උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා ඝානවිඤ්ඤාණං න උප්පජ්ජති, ඝානවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි චක්ඛුවිඤ්ඤාණං න උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා ජිව්හාවිඤ්ඤාණං න උප්පජ්ජති, ජිව්හාවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි චක්ඛුවිඤ්ඤාණං න උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා කායවිඤ්ඤාණං න උප්පජ්ජති, කායවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි චක්ඛුවිඤ්ඤාණං න උප්පජ්ජති. සොතවිඤ්ඤාණස්ස -පෙ- ඝානවිඤ්ඤාණස්ස -පෙ- ජිව්හාවිඤ්ඤාණස්ස -පෙ- කායවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා චක්ඛුවිඤ්ඤාණං න උප්පජ්ජති, චක්ඛුවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි කායවිඤ්ඤාණං න උප්පජ්ජති. කායවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා සොතවිඤ්ඤාණං න උප්පජ්ජති, සොතවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි කායවිඤ්ඤාණං න උප්පජ්ජති. කායවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා ඝානවිඤ්ඤාණං න උප්පජ්ජති, ඝානවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි කායවිඤ්ඤාණං න උප්පජ්ජති. කායවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරා ජිව්හාවිඤ්ඤාණං න උප්පජ්ජති, ජිව්හාවිඤ්ඤාණස්ස උප්පන්නසමනන්තරාපි කායවිඤ්ඤාණං න උප්පජ්ජති.

පඤ්ච විඤ්ඤාණා[1] අනාභොගාති : පඤ්චන්නං විඤ්ඤාණානං නත්ථි ආවජ්ජනා වා ආභොගො වා සමන්නාහාරො වා මනසිකාරො වා. පඤ්චහි විඤ්ඤාණෙහි න කඤ්චි[2] ධම්මං පටිවිජානාතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න කඤ්චි ධම්මං පටිවිජානාති. අඤ්ඤත්‍ර අභිනිපාතමත්තාති : අඤ්ඤත්‍ර ආපාතමත්තා. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කඤ්චි[2] ධම්මං පටිවිජානාතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න කඤ්චි ධම්මං පටිවිජානාති. පඤ්චහි විඤ්ඤාණෙහි න කඤ්චි ඉරියාපථං කප්පෙතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න කඤ්චි ඉරියාපථං කප්පෙති ගමනං වා ඨානං වා නිසජ්ජං වා සෙය්‍යං වා. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කිඤ්චි ඉරියාපථං කප්පෙතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න කිඤ්චි ඉරියාපථං කප්පෙති ගමනං වා ඨානං වා නිසජ්ජං වා සෙය්‍යං වා. පඤ්චහි විඤ්ඤාණෙහි න කායකම්මං න වචීකම්මං පට්ඨපෙතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න කායකම්මං වචීකම්මං පට්ඨපෙති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කායකම්මං න වචීකම්මං පට්ඨපෙතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න කායකම්මං න වචීකම්මං පට්ඨපෙති. පඤ්චහි විඤ්ඤාණෙහි න කුසලාකුසලං ධම්මං සමාදියතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න කුසලාකුසලං ධම්මං සමාදියති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න කුසලාකුසලං ධම්මං සමාදියතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න කුසලාකුසලං ධම්මං සමාදියති.

පඤ්චහි විඤ්ඤාණෙහි න සමාපජ්ජති න උට්ඨාතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න සමාපජ්ජති න උට්ඨාති.

පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න සමාපජ්ජති න වුට්ඨාතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න සමාපජ්ජති න වුට්ඨාති.

---

1. විඤ්ඤාණං - සීපැවි.
2. කිඤ්චි - සිරිමු, සීපැවි

Free Distribution www.aathaapi.org

ඔවුනොවුන්ට සමන්තර ව නූපදිති යනු : චක්ෂුර්විඥානය උපන් සමනන්තර ව ශ්‍රොත්‍රවිඥානය නූපදියි, ශ්‍රොත්‍රවිඥානය උපන් සමනන්තර ව ද චක්ෂුර්විඥානය නූපදී. චක්ෂුර්විඥානය උපන් සමනන්තර ව ඝ්‍රාණවිඥානය නූපදියි, ඝ්‍රාණවිඥානය උපන් සමනන්තර ව ද චක්ෂුර්විඥානය නූපදී. චක්ෂුර්විඥානය උපන් සමනන්තර ව ජිහ්වාවිඥානය නූපදියි, ජිහ්වාවිඥානය උපන් සමනන්තර ව ද චක්ෂුර්විඥානය නූපදී. චක්ෂුර්විඥානය උපන් සමනන්තර ව කායවිඥානය නූපදියි, කායවිඥානය උපන් සමනන්තර ව ද චක්ෂුර් විඥානය නූපදී. ශ්‍රොත්‍රවිඥානය . . . ඝ්‍රාණවිඥානය . . . ජිහ්වාවිඥානය . . . කායවිඥානය උපන් සමනන්තර ව චක්ෂුර්විඥානය නූපදියි, චක්ෂුර්විඥානය උපන් සමනන්තර ව ද කායවිඥානය නූපදී. කායවිඥානය උපන් සමනන්තර ව ශ්‍රොත්‍රවිඥානය නූපදියි, ශ්‍රොත්‍ර විඥානය උපන් සමනන්තර ව ද කායවිඥානය නූපදී. කායවිඥානය උපන් සමනන්තර ව ඝ්‍රාණවිඥානය නූපදියි, ඝ්‍රාණවිඥානය උපන් සමනන්තර ව ද කායවිඥානය නූපදී. කාය විඥානය උපන් සමනන්තර ව ජිහ්වාවිඥානය නූපදියි, ජිහ්වාවිඥානය උපන් සමනන්තර ව ද කායවිඥානය නූපදී.

පඤ්චවිඥානයෝ අනාභොගයෝ ය යනු : පඤ්චවිඥානයන්ගේ ආවර්ජනයෙක් හෝ අභොගයෙක් හෝ සමන්වාහාරයෙක් හෝ මනසිකාරයෙක් හෝ නැති. පඤ්චවිඥානයෙන් කිසි ධර්මයක් නො දනගනී යනු : පඤ්චවිඥානයෙන් අභිනිපාතමාත්‍රය හැර ආපාත (හමුවට පැමිණි රූපාදි අරමුණු) මාත්‍රය හැර (කුශලාකුශලාදි) කිසි ධර්මයක් නො දනගනී. පඤ්චවිඥානයන්ට සමන්තර ව ද කිසි ධර්මයක් නො දනගනී යනු : පඤ්චවිඥානයට සමන්තර වූ මනෝධාතුයෙනුදු කිසි ධර්මයක් නො දනගනී. පඤ්චවිඥානයෙන් කිසි ඊර්‍ය්‍යාපථයක් නො කෙරේ යනු : පඤ්චවිඥානයෙන් යැමක් වේවයි, සිටීමක් වේවයි, හිඳීමක් වේවයි, හොවීමක් වේවයි, කිසි ඊර්‍ය්‍යාපථයක් නො කෙරෙයි. පඤ්චවිඥානයට සමන්තර ව ද කිසි ඊර්‍ය්‍යාපථයක් නො කෙරේ යනු: පඤ්චවිඥානයට සමන්තර වූ මනෝධාතු යෙනුදු යැමක් වේවයි, සිටීමක් වේවයි, හිඳීමක් වේවයි, හොවීමක් වේවයි, කිසි ඊර්‍ය්‍යාපථ යක් නො කෙරෙයි. පඤ්චවිඥානයෙන් නො ද කායකර්මය නො ද වාක්කර්මය පිහිටුවයි යනු : පඤ්චවිඥානයෙන් කායකර්මය නො පිහිටුවයි, වාක්කර්මය නො පිහිටුවයි. පඤ්ච විඥානයට සමන්තර ව ද නො ද කායකර්මය නො ද වාක්කර්මය නො පිහිටුවයි යනු : පඤ්චවිඥානයට සමන්තර වූ මනොධාතුයෙනුදු කායකර්මය නො පිහිටුවයි, වාක්කර්මය නො පිහිටුවයි. පඤ්චවිඥානයෙන් කුශලාකුශලධර්මය සමාදනය නො කෙරේ යනු : පඤ්චවිඥානයෙන් කුශලාකුශලධර්මසමාදනය නො කෙරේ. පඤ්චවිඥානයට සමනන්තර ව ද කුශලාකුශලධර්මසමාදනය නො කෙරේ යනු : පඤ්චවිඥානයට සමනන්තර වූ මනොධාතුයෙනුදු කුශලාකුශලධර්මසමාදනය නො කෙරේ.

පඤ්චවිඥානයෙන් සමවතට නො පැමිණෙයි, සමවතින් නො නැඟේ යනු : පඤ්ච විඥානයෙන් සමවතට නො පැමිණෙයි, සමවතින් නො නැඟේ.

පඤ්චවිඥානයට සමන්තර ව ද සමවතට නො පැමිණෙයි, සමවතින් නො නැඟේ යනු : පඤ්චවිඥානයට සමනන්තර වූ මනොධාතුයෙනුදු සමවතට නො පැමිණෙයි, සමවතින් නො නැඟේ.

පඤ්චහි විඤ්ඤාණෙහි න චවති න උපපජ්ජතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න චවති න උපපජ්ජති. පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න චවති න උපපජ්ජතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න චවති න උපපජ්ජති.

පඤ්චහි විඤ්ඤාණෙහි න සුපති න පටිබුජ්ඣති න සුපිනං පස්සතීති : පඤ්චහි විඤ්ඤාණෙහි න සුපති න පටිබුජ්ඣති න සුපිනං පස්සති.

පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරාපි න සුපති න පටිබුජ්ඣති : න සුපිනං පස්සතීති : පඤ්චන්නං විඤ්ඤාණානං සමනන්තරා මනොධාතුයාපි න සුපති න පටිබුජ්ඣති න සුපිනං පස්සති. එවං යාථාවකවත්ථුවිභාවනා පඤ්ඤා.

එවං එකවිධෙන ඤාණවත්ථු.

එකකං.

---

818. තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ලොකියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා ලොකුත්තරා පඤ්ඤා.

සබ්බාව පඤ්ඤා කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා සාසවා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනාසවා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ආසවවිප්පයුත්තා සාසවා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා ආසවවිප්පයුත්තා අනාසවා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා සංයොජනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අසංයොජනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා සංයොජනවිප්පයුත්තා සංයොජනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා සංයොජන විප්පයුත්තා අසංයොජනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ගන්ථනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අගන්ථනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ගන්ථවිප්පයුත්තා ගන්ථනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා ගන්ථවිප්පයුත්තා අගන්ථනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ඔඝනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනොඝනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා ඔඝවිප්පයුත්තා ඔඝනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා ඔඝවිප්පයුත්තා අනොඝනියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා යොගනියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අයොගනියා පඤ්ඤා.

පඤ්චවිඥානයෙන් ව්‍යුත නො වෙයි, නූපදී යනු: පඤ්චවිඥානයෙන් ව්‍යුත නො වෙයි, නූපදී. පඤ්චවිඥානයට සමනන්තර ව ද ව්‍යුත නො වෙයි, නූපදී යනු : පඤ්චවිඥානයට සමනන්තර වූ මනොධාතුයෙනුදු ව්‍යුත නො වෙයි, නූපදී.

පඤ්චවිඥානයෙන් නො හොවී, නුපුබුදී, සිහින නො දකී යනු : පඤ්චවිඥානයෙන් නො හොවී, නුපුබුදී, සිහින නො දකී.

පඤ්චවිඥානයට සමනන්තර ව ද නො හොවී, නුපුබුදී, සිහින නො දකී යනු : පඤ්ච විඥානයට සමනන්තර වූ මනොධාතුයෙනුදු නො හොවී, නුපුබුදී, සිහින නො දකී. මෙසේ ඇති සැටියෙන් වස්තුන් ප්‍රකට කරන ප්‍රඥව වෙයි.

මෙසේ එක්ප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

එකක යි.

---

818. තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ලෞකිකප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව ලොකොත්තරප්‍රඥ යි.

හැම ප්‍රඥව කිසි විඥානයෙකින් දතයුතු ය, කිසි විඥානයෙකින් නො දත යුතු ය.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව සාශ්‍රව ප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනාශ්‍රවප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ආශ්‍රවවිප්‍රයුක්තසාශ්‍රවප්‍රඥ ය, සතර මාර්ග යෙහි සතර ඵලයෙහි ප්‍රඥව ආශ්‍රවවිප්‍රයුක්තඅනාශ්‍රවප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව සංයොජනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අසංයොජනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව සංයොජනවිප්‍රයුක්තසංයොජනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව සංයොජනවිප්‍රයුක්තඅසංයොජනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ග්‍රන්ථනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අග්‍රන්ථනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ග්‍රන්ථවිප්‍රයුක්තග්‍රන්ථනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව ග්‍රන්ථවිප්‍රයුක්තඅග්‍රන්ථනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ඔඝනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනොඝනිය ප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ඔඝවිප්‍රයුක්තඔඝනියප්‍රඥ ය, සතර මාර්ග යෙහි සතර ඵලයෙහි ප්‍රඥව ඔඝවිප්‍රයුක්තඅනොඝනිය ප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව යොගනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අයොගනියප්‍රඥ යි.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා යොගවිප්පයුත්තා යොගනීයා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා යොගවිප්පයුත්තා අයොගනීයා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා නීවරණියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනීවරණියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා නීවරණවිප්පයුත්තා නීවරණියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා නීවරණවිප්පයුත්තා අනීවරණියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා පරාමට්ඨා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අපරාමට්ඨා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා පඤ්ඤා

තීසු භූමීසු විපාකෙ පඤ්ඤා උපාදින්නා පඤ්ඤා, තීසු භූමීසු කුසලෙ තීසු භූමීසු කිරියාව්‍යාකතෙ චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනුපාදින්නා පඤ්ඤා

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා උපාදානියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනුපාදානියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා උපාදානවිප්පයුත්තා උපාදානියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා උපාදානවිප්පයුත්තා අනුපාදානියා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා සංකිලෙසිකා පඤ්ඤා. චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අසංකිලෙසිකා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා කිලෙසවිප්පයුත්තා සංකිලෙසිකා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා කිලෙසවිප්පයුත්තා අසංකිලෙසිකා පඤ්ඤා.

විතක්කසම්පයුත්තා පඤ්ඤා සවිතක්කා පඤ්ඤා, විතක්කවිප්පයුත්තා පඤ්ඤා අවිතක්කා පඤ්ඤා.

විචාරසම්පයුත්තා පඤ්ඤා සවිචාරා පඤ්ඤා, විචාරවිප්පයුත්තා පඤ්ඤා අවිචාරා පඤ්ඤා

පීතිසම්පයුත්තා පඤ්ඤා සප්පීතිකා පඤ්ඤා පීතිවිප්පයුත්තා පඤ්ඤා අප්පීතිකා පඤ්ඤා

පීතිසම්පයුත්තා පඤ්ඤා පීතිසහගතා පඤ්ඤා, පීතිවිප්පයුත්තා පඤ්ඤා න පීතිසහගතා පඤ්ඤා.

සුඛසම්පයුත්තා පඤ්ඤා සුඛසහගතා පඤ්ඤා, සුඛවිප්පයුත්තා පඤ්ඤා න සුඛසහගතා පඤ්ඤා.

උපෙක්ඛාසම්පයුත්තා පඤ්ඤා උපෙක්ඛාසහගතා පඤ්ඤා, උපෙක්ඛාවිප්පයුත්තා පඤ්ඤා න උපෙක්ඛාසහගතා පඤ්ඤා.

කාමාවචරකුසලාව්‍යාකතෙ පඤ්ඤා කාමාවචරා පඤ්ඤා, රූපාවචරා පඤ්ඤා අරූපාවචරා පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා න කාමාවචරා පඤ්ඤා.

රූපාවචරකුසලාව්‍යාකතෙ පඤ්ඤා රූපාවචරා පඤ්ඤා, කාමාවචරා පඤ්ඤා අරූපාවචරා පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා න රූපාවචරා පඤ්ඤා.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව යෝගවිප්‍රයුක්තයෝගනීයප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව යෝගවිප්‍රයුක්තඅයොගනීයප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව නීවරණියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනීවරණියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව නීවරණවිප්‍රයුක්තනීවරණියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව නීවරණවිප්‍රයුක්තඅනීවරණියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව පරාමෘෂ්ටප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අපරාමෘෂ්ටප්‍රඥ යි.

තුන් භූමියෙහි විපාකයෙහි ප්‍රඥව උපාදින්නප්‍රඥ ය, තුන් භූමියෙහි කුශලයෙහි තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘතයෙහි සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනුපාදින්නප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව උපාදනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනුපාදනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව උපාදනවිප්‍රයුක්තඋපාදනියප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව උපාදනවිප්‍රයුක්තඅනුපාදනියප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව සාංක්ලෙසිකප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අසාංක්ලෙසිකප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව ක්ලෙශවිප්‍රයුක්තසාංක්ලෙශිකප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව ක්ලෙශවිප්‍රයුක්තඅසාංක්ලෙශිකප්‍රඥ යි.

විතර්කසම්ප්‍රයුක්තප්‍රඥව සවිතර්කප්‍රඥ ය, විතර්කවිප්‍රයුක්තප්‍රඥව අවිතර්කප්‍රඥ යි.

විචාරසම්ප්‍රයුක්තප්‍රඥව සවිචාරප්‍රඥ ය, විචාරවිප්‍රයුක්තප්‍රඥව අවිචාරප්‍රඥ යි.

ප්‍රීතිසම්ප්‍රයුක්තප්‍රඥව සප්‍රීතිකප්‍රඥ ය, ප්‍රීතිවිප්‍රයුක්තප්‍රඥව අප්‍රීතිකප්‍රඥ යි.

ප්‍රීතිසම්ප්‍රයුක්තප්‍රඥව ප්‍රීතිසහගතප්‍රඥ ය, ප්‍රීතිවිප්‍රයුක්තප්‍රඥව ප්‍රීතිසහගත නො වූ ප්‍රඥ යි.

සුඛසම්ප්‍රයුක්තප්‍රඥව සුඛසහගතප්‍රඥ ය, සුඛවිප්‍රයුක්තප්‍රඥව සුඛසහගත නො වූ ප්‍රඥ යි.

උපෙක්ෂාසම්ප්‍රයුක්තප්‍රඥව උපෙක්ෂාසහගතප්‍රඥ ය, උපෙක්ෂාවිප්‍රයුක්තප්‍රඥව උපෙක්ෂාසහගත නො වූ ප්‍රඥ යි.

කාමාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව කාමාවචරප්‍රඥ ය. රූපාවචරප්‍රඥ ය අරූපාවචරප්‍රඥ ය අපර්‍යාපන්නප්‍රඥ ය යන මොහු කාමාවචර නො වූ ප්‍රඥ යි.

රූපාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව රූපාවචරප්‍රඥ ය. කාමාවචරප්‍රඥ ය අරූපාවචරප්‍රඥ ය අපර්‍යාපන්නප්‍රඥ ය යන මොහු රූපාවචර නො වූ ප්‍රඥ යි.

12—ඝඝ 17626 (3/75)

අරූපාවචරකුසලාව්‍යාකතෙ පඤ්ඤා අරූපාවචරා පඤ්ඤා, කාමාවචරා පඤ්ඤා රූපාවචරා පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා න අරූපාවචරා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා පරියාපන්නා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා.

චතූසු මග්ගෙසු පඤ්ඤා නිය්‍යානිකා පඤ්ඤා, තීසු භූමීසු කුසලෙ චතූසු භූමීසු විපාකෙ තීසු භූමීසු කිරියාව්‍යාකතෙ පඤ්ඤා අනිය්‍යානිකා පඤ්ඤා.

චතූසු මග්ගෙසු පඤ්ඤා නියතා පඤ්ඤා, තීසු භූමීසු කුසලෙ චතූසු භූමීසු විපාකෙ තීසු භූමීසු කිරියාව්‍යාකතෙ පඤ්ඤා අනියතා පඤ්ඤා.

තීසු භූමීසු කුසලාව්‍යාකතෙ පඤ්ඤා සඋත්තරා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනුත්තරා පඤ්ඤා.

තත්ථ කතමා අත්ථජාපිකා පඤ්ඤා: චතූසු භූමීසු කුසලෙ අරහතො අභිඤ්ඤං උප්පාදෙන්තස්ස සමාපත්තිං උප්පාදෙන්තස්ස කිරියාව්‍යාකතෙ පඤ්ඤා අත්ථජාපිතා පඤ්ඤා, චතූසු භූමීසු විපාකෙ අරහතො උප්පන්නාය අභිඤ්ඤාය උප්පන්නාය සමාපත්තියා කිරියාබ්‍යාකතෙ පඤ්ඤා ජාපිතත්ථා පඤ්ඤා.

එවං දුවිධෙන ඤාණවත්ථු.

දුකං.

---

819. තත්ථ කතමා චින්තාමයා පඤ්ඤා: යොගවිහිතෙසු වා කම්මායතනෙසු යොගවිහිතෙසු වා සිප්පායතනෙසු යොගවිහිතෙසු වා විජ්ජාට්ඨානෙසු කම්මස්සකතං වා සච්චානුලොමිකං වා රූපං අනිච්චන්ති වා වෙදනා අනිච්චාති වා සඤ්ඤා අනිච්චාති වා සඞ්ඛාරා අනිච්චාති වා විඤ්ඤාණං අනිච්චන්ති වා යං එවරූපිං අනුලොමිකං ඛන්තිං දිට්ඨිං රුචිං මුතිං[1] පෙක්ඛං ධම්මනිජ්ඣානක්ඛන්තිං පරතො අස්සුත්වා පටිලභති, අයං වුච්චති චින්තාමයා පඤ්ඤා. තත්ථ කතමා සුතමයා පඤ්ඤා. යොගවිහිතෙසු වා කම්මායතනෙසු යොගවිහිතෙසු වා සිප්පායතනෙසු යොගවිහිතෙසු වා විජ්ජාට්ඨානෙසු කම්මස්සකතං වා සච්චානුලොමිකං වා රූපං අනිච්චන්ති වා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චන්ති වා යං එවරූපිං අනුලොමිකං ඛන්තිං දිට්ඨිං රුචිං මුතිං පෙක්ඛං ධම්මනිජ්ඣානක්ඛන්තිං පරතො සුත්වා පටිලභති, අයං වුච්චති සුතමයා පඤ්ඤා. සබ්බාපි සමාපන්නස්ස පඤ්ඤා භාවනාමයා පඤ්ඤා

තත්ථ කතමා දානමයා පඤ්ඤා: දානං ආරබ්භ දානාධිගච්ඡ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති දානමයා පඤ්ඤා. තත්ථ කතමා සීලමයා පඤ්ඤා: සීලං ආරබ්භ සීලාධිගච්ඡ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති සීලමයා පඤ්ඤා. සබ්බාපි සමා-පන්නස්ස පඤ්ඤා භාවනාමයා පඤ්ඤා.

---

1. මුදිං - සිරිමු, මජසං.

අරූපාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව අරූපාවචරප්‍රඥ ය, කාමාවචරප්‍රඥ ය රූපාවචරප්‍රඥ ය අපයඪාපන්නප්‍රඥ ය යන මොහු අරූපාවචර නො වූ ප්‍රඥ යි.

තුන් භූමියෙහි කුශලාව්‍යාකෘතප්‍රඥව පයඪාපන්නප්‍රඥ ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අපයඪාපන්නප්‍රඥ යි.

සතර මාර්ගයෙහි ප්‍රඥව නෛයඪාණිකප්‍රඥ ය. තුන් භූමියෙහි කුශලයෙහි, සතර භූමියෙහි විපාකයෙහි, තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘතප්‍රඥව අනෛයඪාණිකප්‍රඥ යි.

සතර මාර්ගයෙහි ප්‍රඥව නියත වූ ප්‍රඥ ය. ත්‍රෛභූමකකුශලයෙහි, චාතුර්භූමක විපාකයෙහි, චාතුර්භූමකක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥව අනියත වූ ප්‍රඥ යි.

ත්‍රෛභූමකකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥව සඋත්තරප්‍රඥ ය. සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥව අනුත්තරප්‍රඥ යි.

එහි අර්ථොත්පාදකප්‍රඥව කවර යත් : (ශෛක්ෂපෘථග්ජනයන්ගේ) චාතුර්භූමක කුශලයෙහි, අභිඥ උපදවන්නා වූ සමාපත්ති උපදවන්නා වූ රහත්හුගේ ක්‍රියාව්‍යාකෘත යෙහි ප්‍රඥව අර්ථොත්පාදකප්‍රඥ ය, චාතුර්භූමකවිපාකයෙහි, රහත්හුගේ උපන් අභිඥයෙහි, උපන් සමාපත්තියෙහි ක්‍රියාව්‍යාකෘතප්‍රඥව උත්පාදිතාර්ථප්‍රඥ යි.

**මෙසේ ද්විප්‍රකාරයෙන් ඥනවස්තු වේ.**

**ද්වික යි.**

---

819. එහි චින්තාමයප්‍රඥ කවර යත් : ප්‍රඥයෙන් කරන ලද (යෝගවිහිත) කර්මායතනයෙහි හෝ ප්‍රඥයෙන් කරන ලද ශිල්පායතනයෙහි හෝ ප්‍රඥයෙන් කරන ලද විද්‍යායෙහි හෝ කර්මස්වකතා වූ හෝ සත්‍යානුලෝමික වූ හෝ ' රූපය අනිත්‍ය ' යි හෝ ' වේදනාව අනිත්‍ය ' යි හෝ ' සංඥව අනිත්‍ය ' යි හෝ ' සංස්කාරයෝ අනිත්‍යහ ' යි හෝ ' විඥනය අනිත්‍ය ' යි හෝ මෙබඳු වූ යම් අනුලෝමික ක්ෂාන්තියක් දෘෂ්ටියක් රුචියක් මුතියක් ප්‍රෙක්ෂාවක් ධර්මනිධ්‍යානක්ෂාන්තියක් මෙරමාගෙන් නො අසා ලබා ද, මේ ' චින්තාමයප්‍රඥ ' යි කියනු ලැබේ. එහි ශ්‍රුතමයප්‍රඥ කවර යත් : ප්‍රඥයෙන් කරන ලද කර්මායතනයෙහි හෝ ප්‍රඥයෙන් කරන ලද ශිල්පායතනයෙහි හෝ ප්‍රඥයෙන් කරන ලද විද්‍යායෙහි හෝ කර්මස්වකතා වූ හෝ සත්‍යානුලෝමික වූ හෝ ' රූපය අනිත්‍ය ' යි හෝ ' වේදනාව . . . සංඥව . . . සංස්කාරය . . . විඥනය අනිත්‍ය ' යි හෝ මෙබඳු වූ යම් අනුලෝමික ක්ෂාන්තියක් දෘෂ්ටියක් රුචියක් මුතියක් ප්‍රෙක්ෂාවක් ධර්මනිධ්‍යානක්ෂාන්තියක් මෙරමාගෙන් අසා ලබා ද මේ ' ශ්‍රුතමයප්‍රඥ ' යි කියනු ලැබේ. හැම සමාපන්නයාගේ හැම ප්‍රඥව ' භාවනාමයප්‍රඥ ' නම් වේ.

එහි දානමයප්‍රඥ කවර යත් : දානචේතනාව ඇරබැ දානචේතනාවට පැමිණ යම් ප්‍රඥවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ දානමයප්‍රඥ යි කියනු ලැබේ.

එහි ශීලමයප්‍රඥ කවර යත් : ශීලචේතනාව නිසා ශීලචේතනාවට පැමිණ යම් ප්‍රඥවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ ' ශීලමය ප්‍රඥ ' යයි. කියනු ලැබේ. සමාපන්නයාගේ හැමප්‍රඥව භාවනාමයප්‍රඥ නම් වේ.

තත්ථ කතමා අධිසීලෙ පඤ්ඤා: පාතිමොක්ඛසංවරසංවුතස්ස[2] යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අධිසීලෙ පඤ්ඤා.

තත්ථ කතමා අධිචිත්තෙ පඤ්ඤා: රූපාවචරාරූපාවචරසමාපත්තිං සමාපජ්ජන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අධිචිත්තෙ පඤ්ඤා.

තත්ථ කතමා අධිපඤ්ඤාය පඤ්ඤා: චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා, අයං වුච්චති අධිපඤ්ඤාය පඤ්ඤා.

තත්ථ කතමං ආයකොසල්ලං: ඉමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා න උප්පජ්ජන්ති. උප්පන්නා ච අකුසලා ධම්මා පහීයන්ති, ඉමෙ වා පනිමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්තීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති ආයකොසල්ලං.

තත්ථ කතමං අපායකොසල්ලං: ඉමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා න උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා නිරුජ්ඣන්ති ඉමෙ වා පනිමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්තීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති අපායකොසල්ලං.

සබ්බාපි තත්‍රූපායා පඤ්ඤා උපායකොසල්ලං.

චතූසු භූමීසු විපාකෙ පඤ්ඤා විපාකා පඤ්ඤා, චතූසු භූමීසු කුසලෙ පඤ්ඤා විපාකධම්මධම්මා පඤ්ඤා, තීසු භූමීසු කිරියාබ්‍යාකතෙ පඤ්ඤා නෙවවිපාකනවිපාකධම්මධම්මා පඤ්ඤා.

තීසු භූමීසු විපාකෙ පඤ්ඤා උපාදින්නුපාදානියා පඤ්ඤා, තීසු භූමීසු කුසලෙ තීසු භූමීසු කිරියාබ්‍යාකතෙ පඤ්ඤා අනුපාදින්නුපාදානියා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අනුපාදින්නඅනුපාදානියා පඤ්ඤා.

විතක්කවිචාරසම්පයුත්තා පඤ්ඤා සවිතක්කසවිචාරා පඤ්ඤා, විතක්කවිප්පයුත්තා විචාරසම්පයුත්තා පඤ්ඤා අවිතක්කවිචාරමත්තා පඤ්ඤා, විතක්කවිචාරවිප්පයුත්තා පඤ්ඤා අවිතක්කඅවිචාරා පඤ්ඤා.

පීතිසම්පයුත්තා පඤ්ඤා පීතිසහගතා පඤ්ඤා, සුඛසම්පයුත්තා පඤ්ඤා සුඛසහගතා පඤ්ඤා, උපෙක්ඛාසම්පයුත්තා පඤ්ඤා උපෙක්ඛාසහගතා පඤ්ඤා.

තීසු භූමීසු කුසලෙ පඤ්ඤා ආචයගාමිනී පඤ්ඤා, චතූසු මග්ගෙසු පඤ්ඤා අපචයගාමිනී පඤ්ඤා, චතූසු භූමීසු විපාකෙ තීසු භූමීසු කිරියාබ්‍යාකතෙ පඤ්ඤා නෙව ආචයගාමිනාපචයගාමිනී පඤ්ඤා.

චතූසු මග්ගෙසු තීසු ඵලෙසු පඤ්ඤා සෙක්ඛා පඤ්ඤා, උපරිට්ඨිමෙ අරහත්තඵලෙ පඤ්ඤා අසෙක්ඛා පඤ්ඤා, තීසු භූමීසු කුසලෙ තීසු භූමීසු විපාකෙ තීසු භූමීසු කිරියාබ්‍යාකතෙ පඤ්ඤා නෙවසෙක්ඛානාසෙක්ඛා පඤ්ඤා.

---

2. සංවරං, සංවරන්තස්ස - සිරිමු, මඡසං.

එහි අධිශීලයෙහි ප්‍රඥා කවර යත් : ප්‍රාතිමොක්ෂසංවරය රක්නහුට යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' අධිශීලයෙහි ප්‍රඥා ' යි කියනු ලැබේ.

එහි අධිචිත්තයෙහි ප්‍රඥා කවර යත් : රූපාවචරඅරූපාවචර සමවත් සමවදනහුට යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' අධිචිත්තයෙහි ප්‍රඥා ' යි කියනු ලැබේ.

එහි අධිප්‍රඥායෙහි ප්‍රඥා කවර යත් : සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥාව ය. මේ ' අධිප්‍රඥාවෙහි ප්‍රඥා ' යි කියනු ලැබේ.

එහි ආයකෞශල්‍යය කවරෙ යත් : මේ ධර්මයන් මෙනෙහි කරනුවහුට නූපන් අකුශලධර්මයෝත් නූපදිති උපන් අකුශලධර්මයෝත් ප්‍රහීණ වෙති, යළි මේ ධර්මයන් මෙනෙහි කරනුවහුට නූපන් කුශලධර්මයෝත් නූපදිති, උපන් කුශලධර්මයෝත් බහුල බවට විපුල බවට භාවනායෙන් වැඩීමට පැමිණෙති, එහි යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද මේ ' ආයකෞශල්‍යය ' යි කියනු ලැබේ.

එහි අපායකෞශල්‍යය කවරෙ යත් : මේ ධර්මයන් මෙනෙහි කරනුවහුට නූපන් කුශලධර්මයෝත් නූපදිති, උපන් කුශලධර්මයෝත් නිරුද්ධ වෙති, යළි මේ ධර්මයන් මෙනෙහි කරනුවහුට නූපන් අකුශලධර්මයෝත් උපදිති, උපන් අකුශලධර්මයෝත් බහුල බවට විපුල බවට පැමිණෙති, එහි යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අපායකෞශල්‍ය ' යි කියනු ලැබේ.

සියලු ම ඒ ඒ තැන්හි උපායප්‍රඥාව උපායකෞශල්‍ය නම් වේ.

සිවු බිම්හි විපාකයෙහි ප්‍රඥාව විපාකප්‍රඥා නම, සිවු බිම්හි කුශලයෙහි ප්‍රඥාව ' විපාක ස්වභාවධර්මප්‍රඥා ' නම, තුන් බිම්හි ක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' නෛවවිපාකනවිපාක ස්වභාවධර්මප්‍රඥා ' නම් වේ.

තුන් බිම්හි විපාකයෙහි ප්‍රඥාව ' උපාදින්නොපාදනියප්‍රඥා ' නම. තුන් බිම්හි කුශල යෙහි, තුන් බිම්හි ක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' අනුපාදින්නොපාදනියප්‍රඥා ' නම. සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥාව ' අනුපාදින්නඅනුපාදනියප්‍රඥා ' නම් වේ.

විතර්කවිචාරයන් හා සම්ප්‍රයුක්ත ප්‍රඥාව ' සවිතර්කසවිචාරප්‍රඥා ' නම. විතර්ක විප්‍රයුක්ත වූ විචාරය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රඥාව ' අවිතර්කවිචාරමාත්‍ර ප්‍රඥා ' නම. විතර්ක විචාරයෙන් විප්‍රයුක්ත වූ ප්‍රඥාව ' අවිතර්කඅවිචාරප්‍රඥා ' නම් වේ.

ප්‍රීතිය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රඥාව ' ප්‍රීතිසහගතප්‍රඥා ' නම. සුඛය හා සම්ප්‍රයුක්ත වූ ප්‍රඥාව ' සුඛසහගතප්‍රඥා ' නම. උපෙක්ෂාව හා සම්ප්‍රයුක්ත වූ ප්‍රඥාව ' උපෙක්ෂාසහගත ප්‍රඥා ' නම් වේ.

තුන් බිම්හි කුශලයෙහි ප්‍රඥාව ' ආචයගාමිනීප්‍රඥා ' නම. සතර මාර්ගයෙහි ප්‍රඥාව ' අපචයගාමිනීප්‍රඥා ' නම. සතර බිම්හි විපාකයෙහි, තුන් බිම්හි ක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' නෛවාචයගාමිනාපචයගාමිනීප්‍රඥා ' නම් වේ.

සතර මාර්ගයෙහි, තුන් ඵලයෙහි ප්‍රඥාව ' ශෛක්ෂප්‍රඥා ' නම. මත්තෙහි වූ අර්හත්ත්ව ඵලයෙහි ප්‍රඥාව ' අශෛක්ෂප්‍රඥා ' නම. තුන් බිම්හි කුශලයෙහි, තුන් බිම්හි විපාකයෙහි තුන් බිම්හි ක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' නෛවශෛක්ෂනාශෛක්ෂප්‍රඥා ' නම් වේ.

කාමාවචරකුසලාබ්‍යාකතෙ පඤ්ඤා පරිත්තා පඤ්ඤා, රූපාවචරාරූපාවචරකුසලාබ්‍යාකතෙ පඤ්ඤා මහග්ගතා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අප්පමාණා පඤ්ඤා.

තත්ථ කතමා පරිත්තාරම්මණා පඤ්ඤා: පරිත්තෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි- අයං වුච්චති පරිත්තාරම්මණා පඤ්ඤා, තත්ථ කතමා මහග්ගතාරම්මණා පඤ්ඤා: මහග්ගතෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති මහග්ගතාරම්මණා පඤ්ඤා. තත්ථ කතමා අප්පමාණාරම්මණා පඤ්ඤා: අප්පමාණෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අප්පමාණාරම්මණා පඤ්ඤා.

තත්ථ කතමා මග්ගාරම්මණා පඤ්ඤා: අරියමග්ගං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති මග්ගාරම්මණා පඤ්ඤා. චතූසු මග්ගෙසු පඤ්ඤා මග්ගහෙතුකා පඤ්ඤා. තත්ථ කතමා මග්ගාධිපතිනී පඤ්ඤා: අරියමග්ගං අධිපතිං කරිත්වා යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති මග්ගාධිපතිනී පඤ්ඤා.

චතූසු භූමීසු විපාකෙ පඤ්ඤා සියා උප්පන්නා සියා උප්පාදිනී, න වත්තබ්බා අනුප්පන්නාති. චතූසු භූමීසු කුසලෙ, තීසු භූමීසු කිරියා බ්‍යාකතෙ පඤ්ඤා සියා උප්පන්නා සියා අනුප්පන්නා, න වත්තබ්බා උප්පාදිනීති.

සබ්බාව පඤ්ඤා සියා අතීතා සියා අනාගතා සියා පච්චුප්පන්නා.

තත්ථ කතමා අතීතාරම්මණා පඤ්ඤා: අතීතෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි අයං වුච්චති අතීතාරම්මණා පඤ්ඤා. තත්ථ කතමා අනාගතාරම්මණා පඤ්ඤා: අනාගතෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අනාගතාරම්මණා පඤ්ඤා. තත්ථ කතමා පච්චුප්පන්නාරම්මණා පඤ්ඤා: පච්චුප්පන්නෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති පච්චුප්පන්නාරම්මණා පඤ්ඤා.

සබ්බාව පඤ්ඤා සියා අජ්ඣත්තා සියා බහිද්ධා සියා අජ්ඣත්තබහිද්ධා.

තත්ථ කතමා අජ්ඣත්තාරම්මණා පඤ්ඤා: අජ්ඣත්තෙ ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අජ්ඣත්තාරම්මණා පඤ්ඤා. තත්ථ කතමා බහිද්ධාරම්මණා පඤ්ඤා: බහිද්ධා ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති බහිද්ධාරම්මණා පඤ්ඤා. තත්ථ කතමා අජ්ඣත්තබහිද්ධාරම්මණා පඤ්ඤා: අජ්ඣත්තබහිද්ධා ධම්මෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අජ්ඣත්තබහිද්ධාරම්මණා පඤ්ඤා.

එවං තිවිධෙන ඤාණවත්ථු.

තිකං.

---

කාමාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' පරිත්තප්‍රඥා ' නම, රූපාවචරඅරූපාවචර කුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥාව ' මහද්ගතප්‍රඥා ' නම, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥාව ' අප්‍රමාණප්‍රඥා ' නම් වේ.

එහි පරිත්තාලම්බනප්‍රඥා කවර යත් : පරිත්තධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානන යෙක් . . . අමොහයෙක් ධර්මවිචයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' පරිත්තාලම්බන ප්‍රඥා ' යි කියනු ලැබේ. එහි මහද්ගතාලම්බනප්‍රඥා කවර යත් : මහද්ගතධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' මහද්ගතාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ. එහි අප්‍රමාණලම්බනප්‍රඥා කවර යත් : අප්‍රමාණධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අප්‍රමාණාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ.

එහි මාර්ගාලම්බනප්‍රඥාව කවර යත් : ආර්‍යමාර්ගය නිසා යම් ප්‍රඥාවක් ප්‍රජාන නයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' මාර්ගාලම්බන ප්‍රඥා ' යි කියනු ලැබේ. එහි මාර්ගාධිපතිප්‍රඥා කවර යත් : ආර්‍යමාර්ගය අධිපති කොට ගෙන යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' මාර්ගාධිපතිප්‍රඥා ' යි කියනු ලැබේ. සිවු බිම්හි විපාකයෙහි ප්‍රඥාව උත්පන්න ද වන්නේ ය, උත්පාදී ද වන්නේ යි. ' අනුත්පන්න ' යි නො කියයුතු ය. සිවු බිම්හි කුශලයෙහි, තුන් බිම්හි ක්‍රියාව්‍යාකෘතයෙහි ප්‍රඥාව උත්පන්න ද වන්නේ ය, අනුත්පන්න ද වන්නේ යි. ' උත්පාදී ' යි නො කියයුතු යි.

හැම ප්‍රඥාව අතීත ද වන්නේ ය, අනාගත ද වන්නේ ය, ප්‍රත්‍යුත්පන්න ද වන්නේ යි.

එහි අතීතාලම්බනප්‍රඥා කවර යත් : අතීතධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානන යෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අතීතාලම්බන ප්‍රඥා ' යි කියනු ලැබේ. එහි අනාගතාලම්බනප්‍රඥා කවර යත් : අනාගතධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අනාගතාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ. එහි ප්‍රත්‍යුත්පන්නාලම්බනප්‍රඥා කවර යත් : ප්‍රත්‍යුත්පන්නධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' ප්‍රත්‍යුත්පන්නාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ.

හැම ප්‍රඥාව අධ්‍යාත්ම ද වන්නේ ය, බාහිර ද වන්නේ ය, අධ්‍යාත්මබාහිර ද වන්නේ යි.

එහි අධ්‍යාත්මාලම්බනප්‍රඥා කවර යත් : අධ්‍යාත්මධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අධ්‍යාත්මා ලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ. එහි බාහිරාලම්බනප්‍රඥා කවර යත් : බාහිරධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' බාහිරාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ. එහි අධ්‍යාත්මබාහිරාලම්බනප්‍රඥා කවර යත් : අධ්‍යාත්මබාහිරධර්මයන් නිසා යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අධ්‍යාත්මබාහිරාලම්බනප්‍රඥා ' යි කියනු ලැබේ.

**මෙසේ ත්‍රිප්‍රකාරයෙන් ඥානවස්තු වේ.**

**ත්‍රික යි.**

---

820. තත්ථ කතමං කම්මස්සකතං ඤාණං : අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා, යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ඉදං වුච්චති කම්මස්සකතං ඤාණං. ඨපෙත්වා සච්චානුලොමිකං ඤාණං සබ්බාපි සාසවා කුසලා පඤ්ඤා කම්මස්සකතං ඤාණං. තත්ථ කතමං සච්චානුලොමිකං ඤාණං : රූපං අනිච්චන්ති වා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චන්ති වා, යා එවරූපී අනුලොමිකා ඛන්ති දිට්ඨි රුචි මුති[1] පෙක්ඛා ධම්මනිජ්ඣානක්ඛන්ති ඉදං වුච්චති සච්චානුලොමිකං ඤාණං. චතූසු මග්ගෙසු පඤ්ඤා මග්ගසමඞ්ගිස්ස ඤාණං. චතූසු ඵලෙසු පඤ්ඤා ඵලසමඞ්ගිස්ස ඤාණං. මග්ගසමඞ්ගිස්ස ඤාණං දුක්ඛෙපෙතං ඤාණං, දුක්ඛසමුදයෙපෙතං ඤාණං, දුක්ඛනිරොධෙපෙතං ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදායපෙතං ඤාණං.

තත්ථ කතමං දුක්ඛෙ ඤාණං : දුක්ඛං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති දුක්ඛෙ ඤාණං. දුක්ඛසමුදයං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධගාමිනිං පටිපදං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

කාමාවචරකුසලාබ්‍යාකතෙ පඤ්ඤා කාමාවචරා පඤ්ඤා, රූපාවචර කුසලාබ්‍යාකතෙ පඤ්ඤා රූපාවචරා පඤ්ඤා, අරූපාවචරකුසලාබ්‍යාකතෙ පඤ්ඤා අරූපාවචරා පඤ්ඤා, චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා අපරියාපන්නා පඤ්ඤා.

තත්ථ කතමං ධම්මෙ ඤාණං : චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා ධම්මෙ ඤාණං.

සො ඉමිනා ධම්මෙන ඤාතෙන දිට්ඨෙන පත්තෙන විදිතෙන පරියොගාළ්හෙන අතීතානාගතෙ නයං නෙති යෙ පි කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා දුක්ඛං අබ්භඤ්ඤංසු, දුක්ඛසමුදයං අබ්භඤ්ඤංසු, දුක්ඛනිරොධං අබ්භඤ්ඤංසු, දුක්ඛනිරොධගාමිනීපටිපදං අබ්භඤ්ඤංසු, ඉමඤ්ඤෙව තෙ දුක්ඛං අබ්භඤ්ඤංසු, ඉමඤ්ඤෙව තෙ දුක්ඛසමුදයං අබ්භඤ්ඤංසු, ඉමඤ්ඤෙව තෙ දුක්ඛනිරොධං අබ්භඤ්ඤංසු, ඉමඤ්ඤෙව තෙ දුක්ඛනිරොධගාමිනිං පටිපදං අබ්භඤ්ඤංසු. යෙපි කෙචි අනාගත-මද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා දුක්ඛං අභිජානිස්සන්ති, දුක්ඛසමුදයං අභිජානිස්සන්ති, දුක්ඛනිරොධං අභිජානිස්සන්ති, දුක්ඛනිරොධගාමිනී පටිපදං අභිජානිස්සන්ති, ඉමඤ්ඤෙව තෙ දුක්ඛං අභිජානිස්සන්ති. ඉමඤ්ඤෙව තෙ දුක්ඛසමුදයං අභිජානිස්සන්ති, ඉමඤ්ඤෙව තෙ දුක්ඛ නිරොධං අභිජානිස්සන්ති, ඉමඤ්ඤෙව තෙ දුක්ඛනිරොධගාමිනීපටිපදං අභිජානිස්සන්තීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්ම-විචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති අන්වයෙ ඤාණං.

1. මුදි - සිරිමු, මජසං.

820. එහි කර්මස්වකෘතඥාන කවරේ යත් : ' දුන් දෑයෙහි ඵල ඇත, යාගයෙහි ඵල ඇත, පූජායෙහි ඵල ඇත, සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක ඇත, මෙ ලොව ඇත, පරලොව ඇත, මව් ඇත, පියා ඇත, ඕපපාතිකසත්වයෝ ඇත, යම් කෙනෙක් මෙ ලොව ද පරලොව ද තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද, එබඳු වූ සම්‍යග්ගත වූ සම්‍යක්ප්‍රතිපන්න වූ මහණබමුණෝ ඇතැ ' යි යම් මෙ බඳු වූ ප්‍රඥාවක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' කර්ම ස්වකෘතඥාන ' යි කියනු ලැබේ. සත්‍යානුලොමිකඥානය තබා සියලු ම සාස්‍රවකුශල ප්‍රඥාව කර්මස්වකෘතඥාන නම. එහි සත්‍යානුලොමිකඥානය කවරේ යත් : රූපය අනිත්‍ය යි හෝ වෙදනාව–සංඥාව–සංස්කාරය–විඥානය අනිත්‍ය යි හෝ යම් මෙබඳු අනුලොමික වූ ක්ෂාන්තියක් දෘෂ්ටියක් රුචියක් මුතියක් ප්‍රෙක්ෂාවක් ධර්මනිධ්‍යානක්ෂාන්ති යක් වේ ද, මේ ' සත්‍යානුලොමිකඥාන ' යි කියනු ලැබේ. සතර මාර්ගයෙහි ප්‍රඥාව මාර්ගසමඞ්ගීහුගේ ඥාන යි. සතර ඵලයෙහි ප්‍රඥාව ඵලසමඞ්ගීහුගේ ඥාන යි. මාර්ග සමඞ්ගීහුගේ (යම්) ඥානයෙක් වේ ද, තෙල දුඃඛයෙහි ඥාන ද වෙයි, දුඃඛසමුදයෙහි ඥාන ද වෙයි, දුඃඛනිරොධයෙහි ඥාන ද වෙයි, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥාන ද වේ.

එහි දුඃඛයෙහි ඥාන කවරේ යත් : දුඃඛය නිසා යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' දුඃඛයෙහි ඥාන ' යි කියනු ලැබේ. දුඃඛසමුදය නිසා දුඃඛනිරොධය නිසා දුඃඛනිරොධගාමිනීප්‍රතිපදව නිසා යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥාන ' යි කියනු ලැබේ.

කාමාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥාව කාමාවචරප්‍රඥා ය, රූපාවචරකුශලාව්‍යාකෘත යෙහි ප්‍රඥාව රූපාවචරප්‍රඥා ය, අරූපාවචරකුශලාව්‍යාකෘතයෙහි ප්‍රඥාව අරූපාවචරප්‍රඥා ය, සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥාව අපර්‍යාපන්නප්‍රඥා යි.

එහි ' ධර්මයෙහි ඥාන ' කවරේ යත් : සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥාව ධර්ම යෙහි ඥානය යි. හෙතෙම මේ දන්නා ලද දක්නා ලද පැමිණෙන ලද ප්‍රකට කරන ලද බැසැගෙන සිටි මාර්ගඥාන සඞ්ඛ්‍යාත ධර්මයෙන් අතීතානාගතයෙහි නයසඞ්ඛ්‍යාත ප්‍රත්‍ය වෙක්ෂාඥානයට පමුණුවයි. ' අතීතකාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දුඃඛය ප්‍රතිවෙධ කළාහු ද, දුඃඛසමුදය ප්‍රතිවෙධ කළාහු ද, දුඃඛනිරොධය ප්‍රතිවෙධ කළාහු ද, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදව ප්‍රතිවෙධ කළාහු ද, ඔහු මෙ ම දුඃඛය ප්‍රතිවෙධ කළහ, මෙ ම දුඃඛසමුදය ප්‍රතිවෙධ කළහ, මෙ ම දුඃඛනිරොධය ප්‍රතිවෙධ කළහ, මෙ ම දුඃඛනිරොධගාමිනීප්‍රතිපදව ප්‍රතිවෙධ කළහ. අනාගතකාලයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දුඃඛය ප්‍රතිවෙධ කරන්නාහු ද, දුඃඛසමුදය ප්‍රතිවෙධ කරන්නාහු ද, දුඃඛනිරොධය ප්‍රතිවෙධ කරන්නාහු ද, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදව ප්‍රතිවෙධ කරන්නාහු ද, ඔහු මෙ ම දුඃඛය ප්‍රතිවෙධ කරන්නාහ, මෙ ම දුඃඛසමුදය ප්‍රතිවෙධ කරන්නාහ, මෙ ම දුඃඛනිරොධය ප්‍රතිවෙධ කරන්නාහ, මෙ ම දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපදව ප්‍රතිවෙධ කරන්නාහ ' යි. එහි යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' අන්වයෙහි ඥාන ' යි කියනු ලැබේ.

තත්ථ කතමං පරිච්ඡෙදෙ[1] ඤාණං: ඉධ භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සංඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාතීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති පරිච්ඡෙදෙ ඤාණං.

ඨපෙත්වා ධම්මෙ ඤාණං අන්වයෙ ඤාණං පරිච්ඡෙදෙ ඤාණං අවසෙසා පඤ්ඤා සම්මුතිඤාණං.

තත්ථ කතමා පඤ්ඤා ආචයාය නො අපචයාය: කාමාවචරකුසලෙ පඤ්ඤා ආචයාය නො අපචයාය, චතුසු මග්ගෙසු පඤ්ඤා අපචයාය නො ආචයාය, රූපාවචරාරූපාවචරකුසලෙ පඤ්ඤා ආචයාය චෙව අපචයාය ච, අවසෙසා පඤ්ඤා නෙව ආචයාය නො අපචයාය.

තත්ථකතමා පඤ්ඤා නිබ්බිදාය නො පටිවෙධාය: යාය පඤ්ඤාය කාමෙසු වීතරාගො හොති න ච අභිඤ්ඤායො පටිවිජ්ඣති[2] න ච සච්චානි, අයං වුච්චති පඤ්ඤා නිබ්බිදාය නො පටිවෙධාය, සෙච්ච පඤ්ඤාය කාමෙසු වීතරාගො සමානො අභිඤ්ඤායො පටිවිජ්ඣති න ච සච්චානි, අයං වුච්චති පඤ්ඤා පටිවෙධාය නො නිබ්බිදාය. චතුසු මග්ගෙසු පඤ්ඤා නිබ්බිදාය චෙව පටිවෙධාය ච, අවසෙසා පඤ්ඤා නෙව නිබ්බිදාය නො පටිවෙධාය.

තත්ථ කතමා හානභාගිනී පඤ්ඤා: පඨමස්ස ඣානස්ස ලාභිං[3] කාමසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා. තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිති[4]භාගිනී පඤ්ඤා. අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤා.

දුතියස්ස ඣානස්ස ලාභිං[3] විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිති[4] භාගිනී පඤ්ඤා, උපෙක්ඛාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා. නිබ්බිදාසහගතා[5] සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා[6] නිබ්බෙධ භාගිනී පඤ්ඤා.

තතියස්ස ඣානස්සලාභිං[3] පීතිසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා, අදුක්ඛමසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා[6] නිබ්බෙධභාගිනී පඤ්ඤා.

---

1. පරිච්චෙ - සිරිමු, ස්‍යා. පරියෙ - මජසං.
2. පටිවිජ්ජති - සිරිමු.
3. ලාභී - සිරිමු, මජසං.
4. ඨිති - සිරිමු.
5. නිබ්බිදාය සහගතා - සීපැවි.
6. විරාගූප සඤ්ඤිතා - සිරිමු,

එහි ' පරිච්ඡෙදයෙහි ඥාන ' කවරෙ යත් : මෙ සස්නෙහි මහණ තෙම පරසත්ත්වයන් ගේ පරපුද්ගලයන්ගේ සිත (තමාගේ) සිතින් පිරිසිඳ දනගනියි. සරාග වූ හෝ සිත සරාග වූ සිතැ යි දනගනියි, වීතරාග වූ හෝ සිත වීතරාග වූ සිතැ යි දනගනියි, සදෙස වූ හෝ සිත . . . වීතදෙෂ වූ හෝ සිත . . . සමොහ වූ හෝ සිත . . . වීතමොහ වූ හෝ සිත . . . සංක්ෂිප්ත වූ හෝ සිත . . . වික්ෂිප්ත වූ හෝ සිත . . . මහද්ගත වූ හෝ සිත . . . මහද්ගත නො වූ හෝ සිත . . . සඋත්තර වූ හෝ සිත . . . අනුත්තර වූ හෝ සිත . . . සමාහිත වූ හෝ සිත . . . සමාහිත නො වූ හෝ සිත . . . විමුක්ත වූ හෝ සිත . . . විමුක්ත නො වූ හෝ සිත විමුක්ත නො වූ සිතැ යි දනගනී යයි. එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' පරිච්ඡෙදයෙහි ඥාන ' යි කියනු ලැබෙ.

ධර්මයෙහි ඥානය තබා අන්වයෙහි ඥානය තබා පරිච්ඡෙදයෙහි ඥානය තබා අවශෙෂ ඥානය සංවෘතිඥාන යි.

එහි ආචය පිණිස වූ අපචය පිණිස නො වූ ප්‍රඥ කවර යත් : කාමාවචරකුශලයෙහි ප්‍රඥව ආචය පිණිස වෙයි, අපචය පිණිස නො වෙයි, සතර මාර්ගයෙහි ප්‍රඥව අපචය පිණිස වෙයි, ආචය පිණිස නො වෙයි. රූපාවචරඅරූපාවචරකුශලයෙහි ප්‍රඥව ආචය පිණිසත් අපචය පිණිසත් වෙයි. අවශෙෂප්‍රඥව නො ම ආචය පිණිස නො ද අපචය පිණිස වේ.

එහි නිර්වෙදය පිණිස වූ ප්‍රතිවෙධය පිණිස නො වූ ප්‍රඥ කවර යත් : යම් ප්‍රඥයෙකින් කාමයෙහි පහ වූ රාග ඇත්තේ වේ ද, නො ද අභිඥවන් නො ද සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද, මේ ' නිර්වෙදය පිණිස වූ ප්‍රතිවෙධය පිණිස නො වූ ප්‍රඥ ' යි කියනු ලැබෙ. හෙ ම ප්‍රඥ යෙන් කාමයෙහි පහ වූ රාග ඇත්තේ අභිඥවන් ප්‍රතිවෙධ කෙරෙයි. නො ද සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි. මේ ' ප්‍රතිවෙධය පිණිස වූ නිර්වෙදය පිණිස නො වූ ප්‍රඥ ' යි කියනු ලැබෙ. සතර මාර්ගයෙහි ප්‍රඥව නිර්වෙදය පිණිසත් ප්‍රතිවෙධය පිණිසත් වෙයි. අවශෙෂ ප්‍රඥව නො ම නිර්වෙදය පිණිස නො ද ප්‍රතිවෙධය පිණිස වේ.

එහි හානභාගිනීප්‍රඥ කවර යත් ! ප්‍රථමධ්‍යානලාභිහු කාමසහගතසංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනීප්‍රඥ ය. තදනුරූප වූ (මිථ්‍යා) ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනී ප්‍රඥ ය, අවිතර්ක (ද්විතීයධ්‍යාන) සහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් විශෙෂ භාගිනීප්‍රඥ ය, නිර්වෙද සඞ්ඛ්‍යාත විදර්ශනාඥාන සහගත වූ විරාගයෙන් යුක්ත වූ සංඥ මනසිකාරයෝ (නිවන් පසක් කරනු පිණිස) පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

ද්විතීයධ්‍යානලාභිහු විතර්කසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනී ප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, උපෙක්ෂාසහගතසංඥමනසිකාර යෝ පෙළත් නම් විශෙෂභාගිනීප්‍රඥ ය, නිර්වෙදසහගත වූ විරාගයෙන් යුත් සංඥමනසිකාර යෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

තෘතීයධ්‍යානලාභිහු ප්‍රීතිසුඛසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනී ප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, උපෙක්ෂාසහගත වූ සංඥමනසි කාරයෝ පෙළත් නම් විශෙෂභාගිනීප්‍රඥ ය, නිර්වෙදසහගත වූ විරාගයෙන් යුත් සංඥ මනසිකාරයෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

චතුත්ථස්ස ඣානස්ස ලාභිං උපෙක්ඛාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා, ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤා.

ආකාසානඤ්චායතනස්ස ලාභිං[1] රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිති-භාගිනී පඤ්ඤා, විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤා.

විඤ්ඤාණඤ්චායතනස්ස ලාභිං[1] ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා, ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤා.

ආකිඤ්චඤ්ඤායතනස්ස ලාභිං[1] විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤා.

තත්ථ කතමා චතස්සො පටිසම්භිදා: අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා පටිභානපටිසම්භිදා. අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, තත්ථධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා, ඉමා චතස්සො පටිසම්භිදා.

තත්ථ කතමා චතස්සො පටිපදා: දුක්ඛා පටිපදා[2] දන්ධාභිඤ්ඤා පඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා, සුඛා පටිපදා[3] දන්ධාභිඤ්ඤා පඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා.

තත්ථ කතමා දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා පඤ්ඤා: කිච්ඡෙන කසිරෙන සමාධිං උප්පාදෙන්තස්ස දන්ධං තණ්ඨානං[4] අභිජානන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා පඤ්ඤා.

තත්ථ කතමා දුක්ඛා පටිපදා[2] ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා: කිච්ඡෙන කසිරෙන සමාධිං උප්පාදෙන්තස්ස ඛිප්පං තණ්ඨානං[5] අභිජානන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති දුක්ඛා පටිපදා[2] ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා.

තත්ථ කතමා සුඛා පටිපදා[3] දන්ධාභිඤ්ඤා පඤ්ඤා: අකිච්ඡෙන අකසිරෙන සමාධිං උප්පාදෙන්තස්ස දන්ධං තණ්ඨානං[4] අභිජානන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති සුඛා පටිපදා[3] දන්ධාභිඤ්ඤා පඤ්ඤා.

තත්ථ කතමා සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා: අකිච්ඡෙන අකසිරෙන සමාධිං උප්පාදෙන්තස්ස ඛිප්පං තණ්ඨානං අභිජානන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති සුඛා පටිපදා[3] ඛිප්පාභිඤ්ඤා පඤ්ඤා. ඉමා චතස්සො පටිපදා.

---

1. ලාභී - සිරිමු.
2. දුක්ඛපටිපදා - මජසං.
3. සුඛපටිපදා - මජසං.
4. දන්ධා තණ්හානං - සිරිමු.
5. තණ්හානං - සිරිමු.

චතුර්ථධ්‍යානලාභිහු උපෙක්ෂාසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනී ප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, ආකාසානඤ්චායතනසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් විශෙෂභාගිනීප්‍රඥ ය, නිර්වෙදසහගත වූ විරාගයෙන් යුත් සංඥමනසිකාරයෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

ආකාසානඤ්චායතනලාභිහු රූපසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනීප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, විඤ්ඤණඤ්චායතන සහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් විශෙෂභාගිනීප්‍රඥ ය, නිර්වෙදසහග ත වූ විරාගයෙන් යුත් සංඥමනසිකාරයෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

විඤ්ඤණඤ්චායතනලාභිහු ආකාසානඤ්චායතනසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනීප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, ආකිඤ්චඤ්ඤයතනසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් විශෙෂභාගිනීප්‍රඥ ය, නිර්වෙදසහගත වූ විරාගයෙන් යුත් සංඥමනසිකාරයෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

ආකිඤ්චඤ්ඤයතනලාභිහු විඤ්ඤණඤ්චායතනසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් හානභාගිනීප්‍රඥ ය, තදනුරූප වූ ස්මෘතිය සිටී නම් ස්ථිතිභාගිනීප්‍රඥ ය, නෙවසඤ්ඤනාසඤ්ඤයතනසහගත වූ සංඥමනසිකාරයෝ පෙළත් නම් විශෙෂභාගිනී ප්‍රඥය, නිර්වෙදසහගත වූ විරාගයෙන් යුත් සංඥමනසිකාරයෝ පෙළත් නම් නිර්වෙදභාගිනීප්‍රඥ යි.

එහි සතර ප්‍රතිසංවිද කවර යත් : අර්ථප්‍රතිසංවිද ය, ධර්මප්‍රතිසංවිද ය, නිරුක්තිප්‍රති සංවිද ය, ප්‍රතිභානප්‍රතිසංවිද යි. අර්ථ (හෙතුඵල) යෙහි ඥනය අර්ථප්‍රතිසංවිද ය, ධර්ම (හෙතු) යෙහි ඥනය ධර්මප්‍රතිසංවිද ය, එහි ස්වභාවනිරුක්ත්‍යභිලාපයෙහි ඥනය නිරුක්ති ප්‍රතිසංවිද ය, ඥනයන්හි ඥනය ප්‍රතිභානප්‍රතිසංවිද යි. මොහු සතර ප්‍රතිසංවිදවෝ යි.

එහි සතර ප්‍රතිපද කවරහයත් : දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ ය, දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රඥ ය, සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ ය, සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රඥ යි.

එහි දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ කවර යත් : දුකින් ආයාසයෙන් (ලොකොත්තර) සමාධිය උපදවන්නහුට, ලැසි ව ඒ ලොකොත්තරසමාධි සඞ්ඛ්‍යාත ස්ථානය ප්‍රතිවෙධ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්ම විචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ ' යි කියනු ලැබෙ.

එහි දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රඥ කවර යත් : දුකින් ආයාසයෙන් සමාධිය උපදවන්නහුට, නො ලස් ව ඒ ස්ථානය ප්‍රතිවෙධ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානන යෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රඥ ' යි කියනු ලැබෙ.

එහි සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ කවර යත් : නිදුකින් අනායාසයෙන් සමාධිය උපදවන්නහුට ලැසි ව ඒ සමාධිස්ථානය ප්‍රතිවෙධ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග් දෘෂ්ටියෙක් උපදී ද, මේ ' සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රඥ ' යි කියනු ලැබෙ.

එහි සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥප්‍රඥ කවර යත් : නිදුකින් අනායාසයෙන් සමාධිය උපදවන්නහුට, නො ලස් ව ඒ සමාධිස්ථානය ප්‍රතිවෙධ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' සුඛ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥප්‍රඥ ' යි කියනු ලැබෙ. මොහු සතර ප්‍රතිපදවෝ යි.

තත්ථ කතමානි චත්තාරි ආරම්මණානි: පරිත්තා පරිත්තාරම්මණා පඤ්ඤා, පරිත්තා අප්පමාණාරම්මණා පඤ්ඤා, අප්පමාණා පරිත්තාරම්මණා පඤ්ඤා, අප්පමාණා අප්පමාණාරම්මණා පඤ්ඤා.

තත්ථ කතමා පරිත්තා පරිත්තාරම්මණා පඤ්ඤා: සමාධිස්ස න නිකාමලාභිස්ස ආරම්මණං ථොකං ඵරන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති පරිත්තා පරිත්තාරම්මණා පඤ්ඤා.

තත්ථ කතමා පරිත්තා අප්පමාණාරම්මණා පඤ්ඤා: සමාධිස්ස න නිකාමලාභිස්ස ආරම්මණං විපුලං ඵරන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති පරිත්තා අප්පමාණාරම්මණා පඤ්ඤා.

තත්ථ කතමා අප්පමාණා පරිත්තාරම්මණා පඤ්ඤා: සමාධිස්ස නිකාමලාභිස්ස ආරම්මණං ථොකං ඵරන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අප්පමාණා පරිත්තාරම්මණා පඤ්ඤා.

තත්ථ කතමා අප්පමාණා අප්පමාණාරම්මණා පඤ්ඤා: සමාධිස්ස නිකාමලාභිස්ස ආරම්මණං විපුලං ඵරන්තස්ස යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මා දිට්ඨි, අයං වුච්චති අප්පමාණා අප්පමාණාරම්මණා පඤ්ඤා. ඉමානි චත්තාරි ආරම්මණානි.

මග්ගසමඞ්ගිස්ස ඤාණං ජරාමරණෙපෙතං ඤාණං, ජරාමරණසමුදයෙපෙතං ඤාණං, ජරාමරණනිරොධෙපෙතං ඤාණං, ජරාමරණනිරොධගාමිනියා පටිපදායපෙතං ඤාණං.

තත්ථ කතමං ජරාමරණෙ ඤාණං: ජරාමරණං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති ජරාමරණෙ ඤාණං. ජරාමරණසමුදයං ආරබ්භ -පෙ- ජරාමරණනිරොධං ආරබ්භ -පෙ- ජරාමරණනිරොධගාමිනිං පටිපදං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති ජරාමරණනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

මග්ගසමඞ්ගිස්ස ඤාණං ජාතියාපෙතං ඤාණං -පෙ- භවෙපෙතං ඤාණං -පෙ- උපාදානෙපෙතං ඤාණං -පෙ- තණ්හායපෙතං ඤාණං -පෙ- වෙදනායපෙතං ඤාණං -පෙ- ඵස්සෙපෙතං ඤාණං -පෙ- සළායතනෙපෙතං ඤාණං -පෙ- නාමරූපෙපෙතං ඤාණං -පෙ- විඤ්ඤාණෙපෙතං ඤාණං -පෙ-

සඞ්ඛාරෙසුපෙතං ඤාණං, සඞ්ඛාරසමුදයෙපෙතං ඤාණං, සඞ්ඛාරනිරොධෙපෙතං ඤාණං, සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය පෙතං ඤාණං. තත්ථ කතමං සඞ්ඛාරෙසු ඤාණං: සඞ්ඛාරෙ ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සඞ්ඛාරෙසු ඤාණං. සඞ්ඛාරසමුදයං ආරබ්භ -පෙ- සඞ්ඛාරනිරොධං ආරබ්භ -පෙ- සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

එවං චතුබ්බිධෙන ඤාණවත්ථු.

චතුක්කං.

එහි සතර ආලම්බනයෝ කවරහ යත් : පරිත්ත වූ පරිත්තාලම්බනප්‍රඥ ය, පරිත්ත වූ අප්‍රමාණාලම්බනප්‍රඥ ය, අප්‍රමාණ වූ පරිත්තාලම්බනප්‍රඥ ය, අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන ප්‍රඥ යි.

එහි පරිත්ත වූ පරිත්තාලම්බනප්‍රඥ කවර යත් : නිකාමලාභී (කැමැති සේ ලබන සුලු) නො වූ සමාධිහුගේ අරමුණ අල්ප ව ස්පර්ශ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' පරිත්ත වූ පරිත්තාලම්බන ප්‍රඥ ' යි කියනු ලැබේ.

එහි පරිත්ත වූ අප්‍රමාණාලම්බනප්‍රඥ කවර යත් : නිකාමලාභී නො වූ සමාධිහුගේ අරමුණ විපුල ව ස්පර්ශ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' පරිත්ත වූ අප්‍රමාණාලම්බනප්‍රඥ ' යි කියනු ලැබේ.

එහි අප්‍රමාණ වූ පරිත්තාලම්බනප්‍රඥ කවර යත් : නිකාමලාභීසමාධිහුගේ අරමුණ අල්ප ව ස්පර්ශ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචය යෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' අප්‍රමාණ වූ පරිත්තාලම්බනප්‍රඥ ' යි කියනු ලැබේ.

එහි අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බනප්‍රඥ කවර යත් : නිකාමලාභීසමාධිහුගේ අරමුණ විපුල ව ස්පර්ශ කරන්නහුට යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචය යෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ ' අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බනප්‍රඥ ' යි කියනු ලැබේ. මොහු සතර ආලම්බනයෝ යි.

මාර්ගසමඞ්ගීහුගේ යම් ඥනයෙක් වේ ද තෙල ජරාමරණයෙහි ඥන ද වෙයි, තෙල ජරාමරණසමුදයෙහි ඥන ද වෙයි, තෙල ජරාමරණනිරොධයෙහි ඥන ද වෙයි, තෙල ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදයෙහි ඥන ද වේ.

එහි ජරාමරණයෙහි ඥන කවරෙ යත් : ජරාමරණය අරබැ යම් ප්‍රඥයෙක් ප්‍රජානන යෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' ජරාමරණයෙහි ඥන ' යි කියනු ලැබේ. ජරාමරණසමුදය ඇරබැ . . . ජරාමරණනිරොධය ඇරබැ . . . ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදව ඇරබැ යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ ' ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදයෙහි ඥන ' යි කියනු ලැබේ.

මාර්ගසමඞ්ගීහුගේ යම් ඥනයෙක් වේ ද තෙල ජාතියෙහි ඥනය ද වෙයි, . . . භව යෙහි ඥනය ද වෙයි, . . . උපාදනයෙහි ඥනය ද වෙයි . . . තෘෂ්ණායෙහි ඥනය ද වෙයි . . . වෙදනායෙහි ඥනය ද වෙයි . . . ස්පර්ශයෙහි ඥනය ද වෙයි . . . ෂඩායතනයෙහි ඥනය ද වෙයි . . . නාමරූපයෙහි ඥනය ද වෙයි . . . විඥනයෙහි ඥනය ද වෙයි . . .

තෙල සංස්කාරයන්හි ඥනය ද වෙයි, සංස්කාරසමුදයෙහි ඥනය ද වෙයි, සංස්කාර නිරොධයෙහි ඥනය ද වෙයි, සංස්කාරනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥනය ද වේ. එහි සංස්කාරයන්හි ඥනය කවර යත් : සංස්කාරයන් නිසා යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' සංස්කාරයන්හි ඥන ' යි කියනු ලැබේ. සංස්කාරසමුදය නිසා . . . සංස්කාරනිරොධය නිසා . . . සංස්කාර නිරොධගාමිනීප්‍රතිපදව නිසා යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමෝහයෙක් ධර්මවිචය යෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද, මේ ' සංස්කාරනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥන ' යි කියනු ලැබේ.

මෙසේ චතුෂ්ප්‍රකාරයෙන් ඥනවස්තු වේ.

චතුෂ්ක යි.

821. තත්ථ කතමො පඤ්චඞ්ගිකො සම්මාසමාධි : පීතිඵරණතා සුඛඵරණතා චෙතොඵරණතා ආලොකඵරණතා පච්චවෙක්ඛනානිමිත්තං. ද්වීසු ඣානෙසු පඤ්ඤා පීතිඵරණතා, තීසු ඣානෙසු පඤ්ඤා සුඛඵරණතා, පරචිත්තෙ ඤාණං චෙතොඵරණතා, දිබ්බචක්ඛු ආලොකඵරණතා, තම්හා තම්හා සමාධිම්හා වුට්ඨිතස්ස පච්චවෙක්ඛනාඤාණං පච්චවෙක්ඛනානිමිත්තං, අයං වුච්චති පඤ්චඞ්ගිකො සම්මාසමාධි.

තත්ථ කතමො පඤ්චඤාණිකො සම්මාසමාධි : අයං සමාධි පච්චුප්පන්නසුඛො චෙව ආයතිඤ්ච සුඛවිපාකොති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි අරියො නිරාමිසොති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි අකාපුරිසසෙවිතොති[1] පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධිලද්ධො[2] එකොදිභාවාධිගතො න සසඞ්ඛාරනිග්ගය්හ වාරිතවතොති[3] පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති. සො ඛො පනාහං ඉමං සමාධිං සතො සමාපජ්ජාමි සතො උට්ඨහාමීති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති. අයං පඤ්චඤාණිකො සම්මාසමාධි, එවං පඤ්චවිධෙන ඤාණවත්ථු.

822. තත්ථ කතමා ඡසු අභිඤ්ඤාසු පඤ්ඤා : ඉද්ධිවිධෙ ඤාණං, සොතධාතුවිසුද්ධියා ඤාණං, පරචිත්තෙ ඤාණං, පුබ්බෙනිවාසානුස්සතියා ඤාණං,[4] සත්තානං චුතූපපාතෙ ඤාණං, ආසවානං ඛයෙ ඤාණං, ඉමා ඡසු අභිඤ්ඤාසු පඤ්ඤා. එවං ඡබ්බිධෙන ඤාණවත්ථු.

823. තත්ථ කතමානි සත්තසත්තති ඤාණවත්ථූනි : ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං. අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං. අතීතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං. අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං. අනාගතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං. යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං, තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං. භවපච්චයා ජාතීති ඤාණං -පෙ- උපාදානපච්චයා භවොති ඤාණං -පෙ- තණ්හාපච්චයා උපාදානන්ති ඤාණං -පෙ- වෙදනාපච්චයා තණ්හාති ඤාණං -පෙ- ඵස්සපච්චයා වෙදනාති ඤාණං -පෙ- සළායතනපච්චයා ඵස්සොති ඤාණං -පෙ- නාමරූපපච්චයා සළායතනන්ති ඤාණං -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඤාණං -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති ඤාණං -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං. අතීතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං, අනාගතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරාති ඤාණං. යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං, තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං. ඉමානි සත්තසත්තති[5] ඤාණවත්ථූනි. එවං සත්තවිධෙන ඤාණවත්ථු.

---

1. මහාපුරිසසෙවිතොති - සිරිමු, මජසං.
2. පටිප්පස්සද්ධා - සිරිමු.
3. වාරිතගතොති - සිරිමු, මජසං.
4. පුබ්බෙනිවාසානුස්සතිඤාණං - සිරිමු, ස්‍යා.
5. සත්තති - සිරිමු.

821. එහි පඤ්චාඞ්ගික වූ සම්‍යක්සමාධි කවරෙ යත් : පීතිඵරණතා ය, සුඛඵරණතා ය, චෙතොඵරණතා ය, ආලොකඵරණතා ය, පච්චවෙක්ඛණානිමිත්ත යි. (ප්‍රථම ද්විතීය) ධ්‍යානද්වයෙහි ප්‍රඥාව පීතිඵරණතා ය, ධ්‍යානත්‍රයෙහි ප්‍රඥාව සුඛඵරණතා ය, පරචිත්තයෙහි ප්‍රඥාව චෙතොඵරණතා ය, දිව්‍යචක්ෂුස ආලොකඵරණතා ය, ඒ ඒ සමාධියෙන් නැඟීසිටියහු ගේ ප්‍රත්‍යවෙක්ෂාඥානය පච්චවෙක්ඛණානිමිත්ත යි, මෙ 'පඤ්චාඞ්ගික වූ සම්‍යක් සමාධි' යි කියනු ලැබේ.

එහි පඤ්චඥානික වූ සම්‍යක්සමාධිය කවරෙ යත් : මේ (අර්හත්ඵල) සමාධිය ප්‍රත්‍යුත්පන්නසුඛයත් ආයතිසුඛවිපාකත් ඇත්තේ යයි තමා කෙරෙහි ම ඥානය උපදී, මේ සමාධිය ආර්‍ය ය, නිරාමිෂ යයි තමා කෙරෙහි ම ඥානය උපදී, මේ සමාධිය මහාපුරුෂයන් විසින් සෙවුනා ලද යි තමා කෙරෙහි ම ඥානය උපදී. මේ සමාධිය ශාන්ත ය, ප්‍රණීත ය, කෙලෙසුන් සන්හිඳුවීමෙන් ලබන ලද ය, එකඟ බැවින් පැමිණෙන ලද ය, සප්‍රයොග සිතින් නිග්‍රහ කොට කෙලෙස් වරා පැමිණියේ නො වේ යයි තමා කෙරෙහි ඥානය උපදී. ඒ මම මේ සමාධියට සිහි ඇති ව සමවදිමි සිහි ඇති ව (ඉන්) නැඟෙමි තමා කෙරෙහි ම ඥානය උපදී. මේ පඤ්චඥානික වූ සම්‍යක්සමාධිය වේ. මෙසේ පඤ්චප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

822. එහි ෂට්–අභිඥාවන්හි ප්‍රඥා කවර යත් : ඍද්ධිවිධයෙහි ඥාන ය, ශ්‍රොත්‍රධාතු විශුද්ධියෙහි ඥාන ය, පරචිත්තයෙහි ඥාන ය, පූර්වනිවාසානුස්මෘතියෙහි ඥාන ය, සත්ත්වයන්ගේ ච්‍යුති–උපපාතයෙහි ඥාන ය, ආශ්‍රවක්ෂයයෙහි ඥාන යි. මේ ෂට්–අභිඥාවන්හි ප්‍රඥා යි. මෙසේ ෂට්ප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

823. එහි සත්සැත්තෑ ඥානවස්තූහු කවරහ යත් : ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැ යි ඥානයෙක, ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි ඥානයෙක, අතීතකාලයෙහිදු ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ යැ යි ඥානයෙක, ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි ඥානයෙක, අනාගතකාලයෙහිදු ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ යැ යි ඥානයෙක, ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි ඥානයෙක, යම් ඒ ධර්මස්ථිති (ප්‍රත්‍යයාකාර) ඥානයෙකුත් වන්නේ නම් හෙ ද ක්ෂයස්වභාව ඇත්තේ ය, ව්‍යයස්වභාව ඇත්තේ ය, විරාගස්වභාව ඇත්තේ ය, නිරොධස්වභාව ඇත්තේ යැ යි ඥානයෙක, භවප්‍රත්‍යයෙන් ජාතිය වේ යැ යි ඥානයෙක, . . . උපාදානප්‍රත්‍යයෙන් භවය වේ යැ යි ඥානයෙක . . . තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය වේ යැ යි ඥානයෙක, . . . වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යැ යි ඥානයෙක . . . ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා වේ යැ යි ඥානයෙක . . . ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ යැ යි ඥානයෙක . . . නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ යැ යි ඥානයෙක . . . විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ යැ යි ඥානයෙක . . . සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ යැ යි ඥානයෙක . . . අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙතැ යි ඥානයෙක. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැතැ යි ඥානයෙක, අතීතකාලයෙහිදු අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වූහ යි ඥානයෙක, අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැතැ යි ඥානයෙක, අනාගත කාලයෙහිදු අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වන්නාහ යි ඥානයෙක, අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැතැ යි ඥානයෙක, යම් ඒ ධර්මස්ථිතිඥානයෙකුත් වන්නේ නම් හෙ ද ක්ෂයස්වභාව ඇත්තේ ය, ව්‍යයස්වභාව ඇත්තේ ය, විරාගස්වභාව ඇත්තේ ය, නිරොධ ස්වභාව ඇත්තේ යැ යි ඥානයෙකි. මොහු සත්සත්තෑ ඥානවස්තූහු වෙත්. මෙසේ සප්තප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

13—ශිප 17626 (3/75)

824. තත්ථ කතමා චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා: සොතාපත්ති මග්ගෙ පඤ්ඤා, සොතාපත්ති ඵලෙ පඤ්ඤා, සකදාගාමි මග්ගෙ පඤ්ඤා, සකදාගාමි ඵලෙ පඤ්ඤා, අනාගාමි මග්ගෙ පඤ්ඤා, අනාගාමි ඵලෙ පඤ්ඤා, අරහත්තමග්ගෙ පඤ්ඤා, අරහත්තඵලෙ පඤ්ඤා. ඉමා චතූසු මග්ගෙසු චතූසු ඵලෙසු පඤ්ඤා. එවං අට්ඨවිධෙන ඤාණවත්ථු.

825. තත්ථ කතමා නවසු අනුපුබ්බවිහාරසමාපත්තීසු පඤ්ඤා: පඨමජ්ඣානසමාපත්තියා පඤ්ඤා, දුතියජ්ඣානසමාපත්තියා පඤ්ඤා, තතියජ්ඣානසමාපත්තියා පඤ්ඤා, චතුත්ථජ්ඣානසමාපත්තියා පඤ්ඤා, ආකාසානඤ්චායතනසමාපත්තියා පඤ්ඤා, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා පඤ්ඤා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා පඤ්ඤා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පඤ්ඤා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස පච්චවෙක්ඛනාඤාණං. ඉමා නවසු අනුපුබ්බවිහාරසමාපත්තීසු පඤ්ඤා. එවං නවවිධෙන ඤාණවත්ථු.

826. තත්ථ කතමං තථාගතස්ස ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණං: ඉධ තථාගතො අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති, අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො මාතරං ජීවිතා වොරොපෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො මාතරං ජීවිතා වොරොපෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො පිතරං ජීවිතා වොරොපෙය්‍ය -පෙ- අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය -පෙ- දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය -පෙ- සඞ්ඝං භින්දෙය්‍ය -පෙ- අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය -පෙ- අට්ඨමං භවං නිබ්බත්තෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො අට්ඨමං භවං නිබ්බත්තෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති.

Free Distribution www.aathaapi.org

824. එහි සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥ කවර යත් : ශ්‍රොතාපත්තිමාර්ග යෙහි ප්‍රඥ ය, ශ්‍රොතාපත්තිඵලයෙහි ප්‍රඥ ය, සකෘදගාමිමාර්ගයෙහි ප්‍රඥ ය, සකෘදගාමි ඵලයෙහි ප්‍රඥ ය, අනාගාමිමාර්ගයෙහි ප්‍රඥ ය, අනාගාමිඵලයෙහි ප්‍රඥ ය, අර්හත් මාර්ගයෙහි ප්‍රඥ ය, අර්හත්ඵලයෙහි ප්‍රඥ යි. මේ සතර මාර්ගයෙහි සතර ඵලයෙහි ප්‍රඥ යි. මෙසේ අෂ්ටප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

825. එහි නව අනුපූර්වවිහාරසමාපත්තීන්හි ප්‍රඥ කවර යත් : ප්‍රථමධ්‍යානසමාපත්ති යෙහි ප්‍රඥ ය, ද්විතීයධ්‍යානසමාපත්තියෙහි ප්‍රඥ ය, තෘතීයධ්‍යානසමාපත්තියෙහි ප්‍රඥ ය, චතුර්ථධ්‍යානසමාපත්තියෙහි ප්‍රඥ ය, ආකාසානඤ්චායතනසමාපත්තියෙහි ප්‍රඥ ය, විඤ්ඤ ණඤ්චායතනසමාපත්තියෙහි ප්‍රඥ ය, ආකිඤ්චඤ්ඤයතනසමාපත්තියෙහි ප්‍රඥ ය, නෙවසඤ්ඤනාසඤ්ඤයතනසමාපත්තියෙහි ප්‍රඥ ය, සංඥවෙදයිතනිරොධසමාපත්තියෙන් නැඟීසිටියහු ගේ ප්‍රත්‍යවෙක්ෂණාඥන යි. මේ නවඅනුපූර්වවිහාරසමාපත්තීන්හි ප්‍රඥ යි. මෙසේ නවප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

826. එහි තථාගතයන්ගේ කාරණය කාරණ හෙයින් ද අකාරණය අකාරණ හෙයින් ද ඇති සැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : යම් කරුණෙකින් දෘෂ්ටිසම්පන්න (සෝවන්) පුද්ගල තෙමේ කිසි සංස්කාරයක් නිත්‍ය විසින් ගන්නේ නම් මෙය අහෙතුක ය, අනවකාශ ය. මෙ කරුණ නො පැනේ යයි මෙහි තථාගත තෙමේ දනියි. යම් කරුණෙකින් පෘථග්ජන තෙමේ කිසි සංස්කාරයක් නිත්‍ය විසින් ගන්නේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ ය යි දනියි. යම් කරුණෙකින් දෘෂ්ටි සම්පන්නපුද්ගල තෙමේ කිසි සංස්කාරයක් සුඛ විසින් ගන්නේ නම් මේ අස්ථාන ය, අනවකාශ ය, මෙ කරුණ නො පැනේ යයි දනියි. යම් කරුණෙකින් පෘථග්ජන තෙමේ කිසි සංස්කාරයක් සුඛ විසින් ගන්නේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් දෘෂ්ටිසම්පන්නපුද්ගල තෙමේ කිසි සංස්කාරයක් ආත්ම විසින් ගන්නේ නම් මේ අස්ථාන ය, අනවකාශ ය, මෙ කරුණ නො පැනේ යයි දනියි. යම් කරුණෙකින් පෘථග්ජන තෙමේ කිසි සංස්කාරයක් ආත්ම විසින් ගන්නේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ ය යි දනී.

යම් කරුණෙකින් දෘෂ්ටිසම්පන්නපුද්ගල තෙම මව දිවි ගලවන්නේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ නො පැනේ යයි දනියි. යම් කරුණෙකින් පෘථග්ජන තෙම මව දිවිගලවන්නේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් දෘෂ්ටිසම්පන්නපුද්ගල තෙම පියා දිවිගලවන්නේ නම් ... රහත්හු දිවිගලවන්නේ නම් ... දුෂ්ට වූ සිතින් බුදුන් සිරිරින් ලෙහෙ සොලවා නම් ... සඞ්ඝභෙද කෙරේ නම් ... අන් ශාස්තෘවක්හු උදෙසා නම් ... අට වැනි භවයෙක උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ නො පැනේ යයි දනී. යම් කරුණෙකින් පෘථග්ජන තෙම අටවැනි භවයෙක උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී.

අට්ඨානමෙතං අනවකාසො යං එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං එකිස්සා ලොකධාතුයා එකො අරහං සම්මාසම්බුද්ධො උප්පජ්ජෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං එකිස්සා ලොකධාතුයා ද්වෙ රාජානො චක්කවත්තී අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං එකිස්සා ලොකධාතුයා එකො රාජා චක්කවත්තී උප්පජ්ජෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං ඉත්ථී අරහං අස්ස සම්මාසම්බුද්ධො නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුරිසො අරහං අස්ස සම්මාසම්බුද්ධො ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං ඉත්ථී රාජා අස්ස චක්කවත්තී නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුරිසො රාජා අස්ස චක්කවත්තී ඨානමෙතං විජ්ජතීති පජානාති අට්ඨානමෙතං අනවකාසො යං ඉත්ථී සක්කත්තං කරෙය්‍ය මාරත්තං කරෙය්‍ය බ්‍රහ්මත්තං කරෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති -පෙ- ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුරිසො බ්‍රහ්මත්තං කරෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති

අට්ඨානමෙතං අනවකාසො යං කායදුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං කායදුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං වචීදුච්චරිතස්ස -පෙ- යං මනොදුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති -පෙ- ඨානඤ්ච ඛො එතං විජ්ජති යං මනොදුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං කායසුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං කායසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං වචීසුචරිතස්ස -පෙ- යං මනොසුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජතීති පජානාති -පෙ- ඨානඤ්ච ඛො එතං විජ්ජති යං මනොසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො යං කායදුච්චරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං කායදුච්චරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති, අට්ඨානමෙතං අනවකාසො යං වචීදුච්චරිතසමඞ්ගී -පෙ යං මනොදුච්චරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති -පෙ- ඨානඤ්ච ඛො එතං විජ්ජති යං මනොදුච්චරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති.

Free Distribution www.aathaapi.org

යම් කරුණෙකින් එක් ලොකධාතුයෙක්හි අර්හත් සම්මාසම්බුදුවරයෝ දෙදෙනෙක් පෙරපසු නො ව උපදනාහු නම් මෙ කරුණ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් එක් ලොකධාතුයෙක්හි එක් අර්හත් සම්මාසම්බුදුවරයෙක් උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් එක් ලොකධාතුයෙක්හි සක්විතිරජවරු දෙදෙනෙක් පෙරපසු නො ව උපදනාහු නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් එක් ලොකධාතුයෙක්හි එක් සක්විතිරජෙක් උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් මාගමක් අර්හත් සම්මාසම්බුදු වේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් පිරිමියෙක් අර්හත් සම්මාසම්බුදු වේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් මාගමක් සක්විතිරජ වේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නොවේ යයි දනී. යම් කරුණෙකින් පිරිමියෙක් සක්විතිරජ වේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් මාගමක් ශක්‍ර බව . . . මාර බව . . . බ්‍රහ්ම බව කෙරේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් පිරිමියෙක් බ්‍රහ්ම බව කෙරේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී.

යම් කරුණෙකින් කායදුශ්චරිතයාගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකය උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් කායදුශ්චරිතයාගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ විපාක උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනියි. යම් කරුණෙකින් වාග්දුශ්චරිතයාගේ . . . මනොදුශ්චරිතයාගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකය උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් මනොදුශ්චරිතයාගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ විපාකය උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනියි. යම් කරුණෙකින් කායසුචරිතයාගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ විපාකය උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් කායසුචරිතයාගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකය උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් කරුණෙකින් වාක්සුචරිතයාගේ . . . මනස්සුචරිතයාගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ විපාකය උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනී. යම් කරුණෙකින් මනස්සුචරිතයාගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකය උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී.

යම් කරුණෙකින් කායදුශ්චරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මත්තෙහි සැපයට ගති වූ ස්වර්ගලොකයෙහි උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් කායදුශ්චරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන්මරණින් මත්තෙහි සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස ව පතිත වන නිරයට පැමිණෙන්නේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනියි. යම් කරුණෙකින් වාග්දුශ්චරිත සමඞ්ගී වූ . . . මනොදුශ්චරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මත්තෙහි සැපයට ගති වූ ස්වර්ගලොකයෙහි උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් මනොදුශ්චරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන්මරණින් මත්තෙහි සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස ව පතිත වන නිරයෙහි උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී.

අට්ඨානමෙතං අනවකාසො යං කායසුචරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය නෙතං ඨානං විජ්ජතීති පජානාති, ඨානඤ්ච ඛො එතං විජ්ජති යං කායසුචරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය ඨානමෙතං විජ්ජතීති පජානාති. අට්ඨානමෙතං අනවකාසො යං වචීසුචරිතසමඞ්ගී -පෙ- යං මනොසුචරිතසමඞ්ගී තංනිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජතීති පජානාති -පෙ- ඨානඤ්ච ඛො එතං විජ්ජති යං මනොසුචරිතසමඞ්ගී තං නිදානං තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතීති පජානාති. යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං හෙතු පච්චයා උප්පාදය තං තං ඨානං යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං න හෙතු අප්පච්චයා උප්පාදය තං තං අට්ඨානන්ති යා තත්‍ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණං.

827 තත්‍ථ කතමං තථාගතස්ස අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණං: ඉධ තථාගතො පජානාති අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි ගතිසම්පත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි උපධිසම්පත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි කාලසම්පත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි පයොගසම්පත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි ගතිවිපත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි උපධිවිපත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමා-දානානි කාලවිපත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි පයොගවිපත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි ගතිවිපත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි උපධිවිපත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි කාලවිපත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි පයොගවිපත්තිපටිබාළ්හානි න විපච්චන්ති. අත්‍ථෙ-කච්චානි කල්‍යාණානි කම්මසමාදානානි ගතිසම්පත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි උපධිසම්පත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි කාලසම්පත්තිං ආගම්ම විපච්චන්ති. අත්‍ථෙකච්චානි කල්‍යාණානි කම්මසමාදානානි පයොගසම්පත්තිං ආගම්ම විපච්චන්තීති යා තත්‍ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස අතීතා-නාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණං.

යම් කරුණෙකින් කායසුචරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන්මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට ගති වූ විවස ව පතිත වන නිරයෙහි උපදනේ නම් මේ හෙතු රහිත ය, ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් කායසුචරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එකරුණෙන් ඒ හෙතුයෙන් කාබුන්මරණින් මත්තෙහි සැපයට ගති වූ ස්වර්ගලොකයෙහි උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනියි. යම් කරුණෙකින් වාක්සුචරිත සමඞ්ගී වූ . . . මනස්සුචරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට ගති වූ නිරයෙහි උපදනේ නම් මේ හෙතු රහිත ය ප්‍රත්‍යය රහිත ය, මෙ කරුණ විද්‍යමාන නො වේ යයි දනියි. යම් කරුණෙකින් මනස්සු චරිතසමඞ්ගී වූ පුද්ගල තෙම එ කරුණෙන් ඒ හෙතුයෙන් කාබුන්මරණින් මත්තෙහි සැපයට ගති වූ ස්වර්ගලොකයෙහි උපදනේ නම් මෙ කරුණ වූකලී ඇත්තේ ය, මෙ කරුණ විද්‍යමාන වේ යයි දනී. යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනකුන්ට හෙතු වෙත් ද ප්‍රත්‍යය වෙත් ද, ඒ ඒ ධර්මය පිණිස කාරණ ය, යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනකුන්ට හෙතු නො වෙත් ද, ප්‍රත්‍යය නො වෙත් ද, ඒ ඒ ධර්මය පිණිස අකාරණ යැ යි එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' තථාගතයන්ගේ කාරණය කාරණ හෙයින් ද අකාරණය අකාරණ හෙයින් ද ඇති සැටියෙන් දන්නා නුවණ ' වේ.

827. එහි තථාගතයන් ගේ කාරණ විසින් හෙතු විසින් අතීත–අනාගත–ප්‍රත්‍යුත්පන්න කර්මසමාදනයන්ගේ විපාකය ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම මෙසේ දනී. කෙසේද යත් : ' ගතිසම්පත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, උපධිසම්පත්තින් බාධිත ව විපත නො දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, කාලසම්පත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, ප්‍රයොගසම්පත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, ගතිවිපත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැ ම් ලාමක කර්ම සමාදන කෙනෙක් ඇත, උපධිවිපත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, කාලවිපත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත. ප්‍රයොගවිපත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් ලාමක කර්මසමාදන කෙනෙක් ඇත, ගතිවිපත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, උපධිවිපත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, කාල විපත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, ප්‍රයොගවිපත්තින් බාධිත ව විපාක නො දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, ගතිසම්පත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, උපධිසම්පත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, කාලසම්පත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇත, ප්‍රයොගසම්පත්තියට පැමිණ විපාක දෙත් නම් එබඳු වූ ඇතැම් කල්‍යාණ කර්මසමාදන කෙනෙක් ඇතැ ' යි. එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' තථාගතයන්ගේ කාරණ විසින් හෙතු විසින් අතීතානාගතප්‍රත්‍යුත්පන්න කර්මසමාදනයන්ගේ විපාකය ඇති සැටියෙන් දන්නා නුවණ ' වේ.

828. තත්ථ කතමං තථාගතස්ස සබ්බත්ථගාමිනීපටිපදං යථාභූතං ඤාණං: ඉධ තථාගතො අයං මග්ගො අයං පටිපදා නිරයගාමිනීති[1] පජානාති. අයං මග්ගො අයං පටිපදා තිරච්ඡානයොනිගාමිනීති[1] පජානාති. අයං මග්ගො අයං පටිපදා පෙත්තිවිසයගාමිනීති[1] පජානාති. අයං මග්ගො අයං පටිපදා මනුස්සලොකගාමිනීති පජානාති අයං මග්ගො අයං පටිපදා දෙවලොකගාමිනීති පජානාති. අයං මග්ගො අයං පටිපදා නිබ්බානගාමිනීති පජානාතීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස සබ්බත්ථගාමිනීපටිපදං යථාභූතං ඤාණං.

829. තත්ථ කතමං තථාගතස්ස අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං ඤාණං: ඉධ තථාගතො ඛන්ධනානත්තං පජානාති, ආයතනනානත්තං පජානාති: ධාතුනානත්තං පජානාති, අනෙකධාතුනානාධාතුලොකනානත්තං පජානාතීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං ඤාණං.

830. තත්ථ කතමං තථාගතස්ස සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං ඤාණං: ඉධ තථාගතො පජානාති: සන්ති සත්තා හීනාධිමුත්තිකා, සන්ති සත්තා පණීතාධිමුත්තිකා, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති, භජන්ති, පයිරුපාසන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති, භජන්ති, පයිරුපාසන්ති, අතීතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු, භජිංසු, පයිරුපාසිංසු, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු, භජිංසු, පයිරුපාසිංසු, අනාගතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති, භජිස්සන්ති, පයිරුපාසිස්සන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති, භජිස්සන්ති, පයිරුපාසිස්සන්තීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං ඤාණං.

831. තත්ථ කතමං තථාගතස්ස පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං ඤාණං: ඉධ තථාගතො සත්තානං ආසයං පජානාති, අනුසයං පජානාති, චරිතං පජානාති, අධිමුත්තිං පජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති

කතමො ච සත්තානං ආසයො: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, ඉති භවදිට්ඨිසන්නිස්සිතා වා සත්තා හොන්ති, විභවදිට්ඨිසන්නිස්සිතා වා, එතෙ වා පන උභො අන්තෙ අනුපගම්ම ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අනුලොමිකා ඛන්ති පටිලද්ධා හොති යථාභූතං වා ඤාණං,[2] අයං සත්තානං ආසයො.

---

1. ගාමිනී - සිපැවි.
2. යථාභූතං ඤාණං - සිරිමු.

828. එහි තථාගතයන්ගේ සර්වත්‍රගාමිනීප්‍රතිපදව ඇතිසැටියෙන් දන්නානුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම මේ මඟ මේ පිළිවෙත නිරයගාමී යි දනගනී. මේ මඟ මේ පිළිවෙත තියඞ්ග්යොනිගාමී යි දනගනී. මේ මඟ මේ පිළිවෙත ප්‍රෙත්‍යවිෂයගාමී යි දනගනී. මේ මඟ මේ පිළිවෙත මනුෂ්‍යලොකගාමී යි දනගනී. මේ මඟ මේ පිළිවෙත දිව්‍යලොකගාමී යි දනගනී. මේ මඟ මේ පිළිවෙත නිර්වාණගාමී යි දනගනී යි එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ තථාගතයන්ගේ සර්වත්‍රගාමිනීප්‍රතිපදව ඇතිසැටියෙන් දන්නා නුවණ වේ.

829. එහි තථාගතයන්ගේ අනෙකධාතුනානාධාතුලොකය ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම ස්කන්ධනානාත්වය දනගනී, ආයතන නානාත්වය දනගනී, ධාතුනානාත්වය දනගනී, අනෙකධාතුනානාධාතුලොකනානාත්වය දනගනී යි එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ තථාගතයන්ගේ අනෙකධාතුනානාධාතුලොකය ඇතිසැටියෙන් දන්නා නුවණ වේ.

830. එහි තථාගතයන් සත්ත්වයන්ගේ නානාධිමුක්තික බව ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම මෙසේ දනගනි යි. කෙසේද යත් : හීනාධිමුක්තික සත්ත්වයෝ වෙති, ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝවෙත්, හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධි මුක්තිකසත්ත්වයන් සෙවනය කෙරෙති, භජනය කෙරෙති, පර්යුපාසනය කෙරෙත්. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවනය කෙරෙති, භජනය කෙරෙති, පර්යුපාසනය කෙරෙත්, අතීතකාලයෙහිදු හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධි මුක්තිකසත්ත්වයන් සෙවනය කළහ, භජනය කළහ, පර්යුපාසනය කළහ, ප්‍රණීතාධි මුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවනය කළහ, භජනය කළහ, පර්යුපාසනය කළහ. අනාගතකාලයෙහිදු හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තික සත්ත්වයන් සෙවනය කරන්නාහ, භජනය කරන්නාහ, පර්යුපාසනය කරන්නාහුය, ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවනය කරන්නාහ, භජනය කරන්නාහ, පර්යුපාසනය කරන්නාහු යි එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ තථාගතයන් සත්ත්වයන්ගේ හීනාධිමුක්තික බව ඇතිසැටියෙන් දන්නා නුවණ වේ.

831. එහි තථාගතයන් පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරතා ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම සත්ත්වයන්ගේ ආසය දනගනී, අනුසය දනගනියි, චරිතය දනගනියි, අධ්‍යාශය දනගනියි, අල්පරජස්ක වූ මහාරජස්ක වූ (ශ්‍රද්ධාදි) තියුණු වූ ඉන්ද්‍රිය ඇති මෘදු වූ ඉන්ද්‍රිය ඇති සුන්දර වූ ආකාර ඇති නපුරු වූ ආකාර ඇති සුවසෙ හැඟැවිය හැකි දුකසේ හැඟැවිය හැකි භව්‍යාභව්‍ය වූ සත්ත්වයන් දනගනී.

සත්ත්වයන්ගේ ආසය කවරෙ යත් : ලොකය ශාස්වත යැ හෝ ලොකය අශාස්වත යැ හෝ ලොකය අන්තවත් යැ හෝ ලොකය අනන්තවත් යැ හෝ එ ම ජීව යැ එ ම ශරීර යැ හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි වන්නේ යැ හෝ සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො වන්නේ යැ හෝ සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් වේ යැ හෝ සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො ම වන්නේත් නොද නො වන්නේත් වේ යැ හෝ මෙසේ ශාස්වත දෘෂ්ටිනිශ්‍රිත වූ හෝ උච්ඡෙදදෘෂ්ටිනිශ්‍රිත වූ හෝ සත්ත්වයෝ වෙති. මේ අන්තද්වයට නො පැමිණ ඉදංප්‍රත්‍යයභාවයෙහි ද ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි ද විදර්ශනාඥාන සඞ්ඛ්‍යාත අනුලොමක්ෂාන්තිය ලබන ලද වෙයි. යථාභූතඥානය හෝ ලබන ලද වේ. මේ ' සත්ත්වයන්ගේ ආසය ' යි.

කතමො ච සත්තානං අනුසයො: සත්තානුසයා: කාමරාගානුසයො පටිඝානුසයො මානානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො, යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථ සත්තානං රාගානුසයො අනුසෙති. යං ලොකෙ අප්පියරූපං අසාතරූපං එත්ථ සත්තානං පටිඝානුසයො අනුසෙති ඉති ඉමෙසු ද්වීසු ධම්මෙසු අවිජ්ජානුපතිතා, තදෙකට්ඨො මානො ච දිට්ඨි ච විචිකිච්ඡා ච දට්ඨබ්බා, අයං සත්තානං අනුසයො.

කතමඤ්ච සත්තානං චරිතං: පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො පරිත්තභූමකො වා මහාභූමකො වා, ඉදං සත්තානං චරිතං.

කතමා ච සත්තානං අධිමුත්ති: සන්ති සත්තා හීනාධිමුත්තිකා සන්ති සත්තා පණීතාධිමුත්තිකා, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති, භජන්ති පයිරුපාසන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති භජන්ති පයිරුපාසන්ති. අතීතම්පි අද්ධානං -පෙ- අනාගතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති, භජිස්සන්ති පයිරුපාසිස්සන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති, භජිස්සන්ති, පයිරුපාසිස්සන්ති. අයං සත්තානං අධිමුත්ති.

කතමෙ තෙ සත්තා මහාරජක්ඛා: දසකිලෙසවත්ථූනි: ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං. යෙසං සත්තානං ඉමානි දසකිලෙසවත්ථූනි ආසෙවිතානි භාවිතානි බහුලීකතානි උස්සදගතානි. ඉමෙ තෙ සත්තා මහාරජක්ඛා.

කතමෙ තෙ සත්තා අප්පරජක්ඛා: යෙසං සත්තානං ඉමානි දස කිලෙසවත්ථූනි අනාසෙවිතානි අභාවිතානි අබහුලීකතානි අනුස්සදගතානි. ඉමෙ තෙ සත්තා අප්පරජක්ඛා.

කතමෙ තෙ සත්තා මුදින්ද්‍රියා: පඤ්චින්ද්‍රියානි: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. යෙසං සත්තානං ඉමානි පඤ්චින්ද්‍රියානි අනාසෙවිතානි අභාවිතානි අබහුලීකතානි අනුස්සදගතානි,[1] ඉමෙ තෙ සත්තා මුදින්ද්‍රියා.

කතමෙ තෙ සත්තා තික්ඛින්ද්‍රියා: යෙසං සත්තානං ඉමානි පඤ්චින්ද්‍රියානි ආසෙවිතානි භාවිතානි බහුලීකතානි උස්සදගතානි,[1] ඉමෙ තෙ සත්තා තික්ඛින්ද්‍රියා.

කතමෙ තෙ සත්තා ද්වාකාරා: යෙ තෙ සත්තා පාපාසයා පාපානුසයා පාපචරිතා පාපාධිමුත්තිකා මහාරජක්ඛා මුදින්ද්‍රියා ඉමෙ තෙ සත්තා ද්වාකාරා.

කතමෙ තෙ සත්තා ස්වාකාරා: යෙ තෙ සත්තා කල්‍යාණා කල්‍යාණාසයා කල්‍යාණචරිතා කල්‍යාණාධිමුත්තිකා අප්පරජක්ඛා තික්ඛින්ද්‍රියා, ඉමෙ තෙ සත්තා ස්වාකාරා.

කතමෙ තෙ සත්තා දුවිඤ්ඤාපයා: යෙව තෙ සත්තා ද්වාකාරා තෙව තෙ සත්තා දුවිඤ්ඤාපයා, යෙව තෙ සත්තා ස්වාකාරා, තෙව තෙ සත්තා සුවිඤ්ඤාපයා.

---

1. කතානි – සීපෑවි.

Free Distribution www.aathaapi.org

සත්ත්වයන්ගේ අනුසය කවරේ යත් : අනුශයයෝ සත් දෙනෙකි : කාමරාගානුශය ය, ප්‍රතිඝානුශය ය, මානානුශය ය, දෘෂ්ට්‍යනුශය ය, විචිකිත්සානුශය ය, භවරාගානුශය ය, අවිද්‍යානුශය යි. යමෙක් ලොකයෙහි ප්‍රියරූප සාතරූප වේ ද, මෙහි සත්ත්වයන්ගේ රාගානුශය පවතී. යමෙක් ලොකයෙහි අප්‍රියරූප අසාතරූප වේ ද මෙහි සත්ත්වයන්ගේ ප්‍රතිඝානුශය පවතී. මෙසේ මේ දෙ දහම්හි අවිද්‍යාව (අරමුණු වශයෙන්) පතිත වෙයි. තදෙකස්ථ වූ මානය ද දෘෂ්ටිය ද විචිකිත්සාව ද දතයුතු. මේ සත්ත්වයන්ගේ අනුශය යි.

සත්ත්වයන්ගේ චරිතය (කරන ලද්ද) කවරේ යත් : පරිත්තභූමක වූ හෝ මහද්ගතභූමක වූ හෝ පුණ්‍යාභිසංස්කාර ය, අපුණ්‍යාභිසංස්කාර ය, ආනෙඤ්ජාභිසංස්කාර යි. මේ සත්ත්වයන්ගේ චරිත යි.

සත්ත්වයන්ගේ අධ්‍යාශය කවරේ යත් : හීන වූ අධ්‍යාශය ඇති සත්ත්වයෝ ඇත, ප්‍රණීත වූ අධ්‍යාශය ඇති සත්ත්වයෝ ඇති. හීන වූ අධ්‍යාශය ඇති සත්ත්වයෝ හීන වූ අධ්‍යාශය ඇති සත්ත්වයන් සෙවනය කෙරෙති, භජනය කෙරෙති, පර්යුපාසනය කෙරෙත්. ප්‍රණීත වූ අධ්‍යාශය ඇති සත්ත්වයෝ ප්‍රණීත වූ අධ්‍යාශය ඇති සත්ත්වයන් සෙවනය කෙරෙති භජනය කෙරෙති ; පර්යුපාසනය කෙරෙත්. අතීතකාලයෙහි ද . . . අනාගත කාලයෙහි ද හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තිකසත්ත්වයන් සෙවනය කරන්නාහ, භජනය කරන්නාහ, පර්යුපාසනය කරන්නාහු ය. ප්‍රණීතාධිමුක්තික සත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තික සත්ත්වයන් සෙවනය කරන්නාහ, භජනය කරන්නාහ, පර්යුපාසනය කරන්නාහු යි. මේ සත්ත්වයන්ගේ අධිමුක්ති යි.

ඒ මහාරජස්කසත්ත්වයෝ කවරහ යත් : කෙලෙශවස්තූහු දශදෙනෙකි : ලොභ ය ද්වෙෂ ය මොහ ය මාන ය දෘෂ්ටි ය විචිකිත්සා ය ස්ත්‍යාන ය ඖද්ධත්‍ය ය අහ්‍රීකය ය අනපත්‍රපා යි. යම් සත්ත්ව කෙනකුන් විසින් මේ දශක්ලෙශවස්තූහු සෙවුනා ලද්දාහු ද වඩනා ලද්දාහු ද බහුල කරන ලද්දාහු ද උත්සද (විපුල) කරන ලද්දාහු ද, මොහු ඒ මහාරජස්ක සත්ත්වයෝ යි.

ඒ අල්පරජස්කසත්ත්වයෝ කවරහ යත් : යම් සත්ත්ව කෙනෙකුන් විසින් මේ දශක්ලෙශවස්තූහු නො සෙවුනා ලද්දාහු ද නො වඩනා ලද්දාහු ද බහුල නො කරන ලද්දාහු ද උත්සද නො කරන ලද්දාහු ද, මොහු ඒ අල්පරජස්කසත්ත්වයෝ යි.

ඒ මෘද්වින්ද්‍රියසත්ත්වයෝ කවරහ යත් : ඉන්ද්‍රියයෝ පස් දෙනෙකි : ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍ය්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය යි. යම් සත්ත්ව කෙනකුන් විසින් මේ පඤ්චෙන්ද්‍රියයෝ නො සෙවුනා ලද්දාහු ද නො වඩනා ලද්දාහු ද බහුල නො කරන ලද්දාහු ද උත්සද නො කරන ලද්දාහු ද, මොහු ඒ මෘද්වින්ද්‍රියසත්ත්වයෝ යි.

ඒ තීක්ෂ්ණෙන්ද්‍රියසත්ත්වයෝ කවරහ යත් : යම් සත්ත්ව කෙනකුන් විසින් මේ පඤ්චෙන්ද්‍රියයෝ සෙවුනා ලද්දාහු ද වඩනා ලද්දාහු ද බහුල කරන ලද්දාහු ද උත්සද කරන ලද්දාහු ද, මොහු ඒ තීක්ෂ්ණෙන්ද්‍රියසත්ත්වයෝ යි.

ඒ ද්වාකාරසත්ත්වයෝ කවරහ යත් : යම් ඒ සත්ත්ව කෙනෙක් අකුශලාධ්‍යාශය ඇත්තාහු ද පාපානුශය ඇත්තාහු ද ලාමකචරිත ඇත්තාහු ද ලාමකඅධ්‍යාශය ඇත්තාහු ද මහාරජස්කයෝ ද මෘද්වින්ද්‍රිය ඇත්තාහු ද, මොහු ඒ ද්වාකාරසත්ත්වයෝ යි.

ඒ ස්වාකාරසත්ත්වයෝ කවරහ යත් : යම් ඒ සත්ත්ව කෙනෙක් කල්‍යාණ ද කල්‍යාණාධ්‍යාශය ඇත්තාහු ද කල්‍යාණචරිත ඇත්තාහු ද කල්‍යාණාධිමුක්ති ඇත්තාහු ද අල්පරජස්කයෝ ද තීක්ෂ්ණෙන්ද්‍රිය ඇත්තාහු ද, මොහු ඒ ස්වාකාරසත්ත්වයෝ යි.

ඒ දුර්විඥප්‍යසත්ත්වයෝ කවරහ යත් : යම් මැ කෙනෙක් ඒ ද්වාකාරසත්ත්වයෝ නම් ඔහු මැ ඒ දුර්විඥප්‍යසත්ත්වයෝ යි. යම් මැ කෙනෙක් ඒ ස්වාකාරසත්ත්වයෝ නම් ඔහු මැ ඒ සුවිඥප්‍යසත්ත්වයෝ යි.

කතමෙ තෙ සත්තා අභබ්බා: යෙ තෙ සත්තා කම්මාවරණෙන සමන්නාගතා, කිලෙසාවරණෙන සමන්නාගතා, විපාකාවරණෙන සමන්නාගතා, අස්සද්ධා අච්ඡන්දිකා දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං, ඉමෙ තෙ සත්තා අභබ්බා.

කතමෙ තෙ සත්තා භබ්බා: යෙ තෙ සත්තා න කම්මාවරණෙන සමන්නාගතා, න කිලෙසාවරණෙන සමන්නාගතා, න විපාකාවරණෙන සමන්නාගතා, සද්ධා ඡන්දිකා පඤ්ඤවන්තො භබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමෙ තෙ සත්තා භබ්බාති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං ඤාණං.

832. තත්ථ කතමං තථාගතස්ස ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං. ඣායීති චත්තාරො ඣායී: අත්ථෙකච්චො ඣායී සම්පත්තිංයෙව[1] සමානං විපත්තීති පච්චෙති. අත්ථෙකච්චො ඣායී විපත්තිංයෙව[2] සමානං සම්පත්තීති පච්චෙති. අත්ථෙකච්චො ඣායී සම්පත්තිංයෙව සමානං සම්පත්තීති පච්චෙති. අත්ථෙකච්චො ඣායී විපත්තිංයෙව සමානං විපත්තීති පච්චෙති. ඉමෙ චත්තාරො ඣායී.

අපරෙපි චත්තාරො ඣායී. අත්ථෙකච්චො ඣායී දන්ධං සමාපජ්ජති ඛිප්පං වුට්ඨාති, අත්ථෙකච්චො ඣායී ඛිප්පං සමාපජ්ජති දන්ධං වුට්ඨාති, අත්ථෙකච්චො ඣායී දන්ධං සමාපජ්ජති දන්ධං වුට්ඨාති, අත්ථෙකච්චො ඣායී ඛිප්පං සමාපජ්ජති ඛිප්පං වුට්ඨාති. ඉමෙ චත්තාරො ඣායී.

අපරෙපි චත්තාරො ඣායී: අත්ථෙකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො, අත්ථෙකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං සමාධිකුසලො, අත්ථෙකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සමාපත්තිකුසලො ච, අත්ථෙකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො. ඉමෙ චත්තාරො ඣායී.

ඣානන්ති චත්තාරි ඣානානි: පඨමං ඣානං දුතියං ඣානං තතියං ඣානං චතුත්ථං ඣානං.

විමොක්ඛොති අට්ඨ විමොක්ඛා: රූපී රූපානි පස්සති, අයං පඨමො විමොක්ඛො. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, අයං දුතියො විමොක්ඛො. සුභන්තෙව අධිමුත්තො හොති, අයං තතියො විමොක්ඛො. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, අයං චතුත්ථො විමොක්ඛො. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, අයං පඤ්චමො විමොක්ඛො. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, අයං ඡට්ඨො විමොක්ඛො. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, අයං සත්තමො විමොක්ඛො. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, අයං අට්ඨමො විමොක්ඛො.

1. සම්පත්තියෙව - මජසං. 2. විපත්තියෙව - මජසං.

Free Distribution www.aathaapi.org

ඒ අභව්‍යසත්ත්වයෝ කවරහ යත් : යම් ඒ සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්වාගතයෝ ද ක්ලෙශාවරණයෙන් සමන්වාගතයෝ ද විපාකාවරණයෙන් සමන්වාගතයෝ ද අශ්‍රද්ධයෝ ද කුශලච්ඡන්ද රහිතයෝ ද දුෂ්ප්‍රාඥයෝ ද කුශලධර්මයන්හි සම්‍යක්ත්වනියාම සඞ්ඛ්‍යාත මාර්ගයට බැසගන්නට අභව්‍ය වූවාහු ද, මොහු ඒ අභව්‍ය සත්ත්වයෝ යි.

ඒ භව්‍යසත්ත්වයෝ කවරහ යත් : යම් ඒ සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්වාගත නො වූවාහු ද ක්ලෙශාවරණයෙන් සමන්වාගත නො වූවාහු ද විපාකාවරණයෙන් සමන්වාගත නො වූවාහු ද ශ්‍රද්ධා ඇත්තාහු ද කුශලච්ඡන්ද ඇත්තාහු ද ප්‍රඥ ඇත්තාහු ද කුශලධර්මයන්හි සම්‍යක්ත්ව නියාම සඞ්ඛ්‍යාත මාර්ගයට බැසගන්නට භව්‍යයෝ ද, මොහු ඒ භව්‍යසත්ත්වයෝ යි. එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ ' තථාගතයන් පරසත්ත්වයන්ගේ පරපුද්ගල යන්ගේ ඉන්ද්‍රියපරාවරතා ඇතිසැටියෙන් දන්නා නුවණ ' යි.

832. එහි තථාගතයන් ධ්‍යානවිමොක්ෂසමාධිසමාපත්තීන්ගේ සංක්ලෙශව්‍යවදාන ව්‍යුත්ථාන ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : ධ්‍යායී යනු : ධ්‍යායීහු සතර දෙනෙකි : සම්පත් වූයේ ම විපතැ යි ගනී නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, විපත් වූයේ ම සම්පතැ යි ගනී නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, සම්පත් වූයේ ම සම්පතැ යි ගනී නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, විපත් වූයේ ම විපතැ යි ගනී නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇති. මොහු සතර ධ්‍යායීහු ය.

අන්‍ය වූ ද ධ්‍යායීහු සතර දෙනෙකි : ලැසි ව සමවදී නම් වහා දැහැනින් නැඟේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, වහා සමවදී නම් ලැසි ව දැහැනින් නැඟේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, ලැසි ව සමවදී නම් ලැසි ව දැහැනින් නැඟේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, වහා සමවදී නම් වහා දැහැනින් නැඟේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇති. මොහු සතර ධ්‍යායීහු ය.

අන්‍ය වූ ද ධ්‍යායීහු සතර දෙනෙකි : සමාධියෙහි සමාධිකුශල වේ නම් සමාධියෙහි සමාපත්තිකුශල නො වේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, සමාධියෙහි සමාපත්තිකුශල වේ නම් සමාධියෙහි සමාධිකුශල නො වේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, සමාධියෙහි සමාධිකුශල ද වේ නම් සමාධියෙහි සමාපත්තිකුශල ද වේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇත, සමාධියෙහි නො ම සමාධිකුශල වේ නම් සමාධියෙහි නො ද සමාපත්තිකුශල වේ නම් එබඳු ඇතැම් ධ්‍යාන කරන්නෙක් ඇති. මොහු සතර ධ්‍යායීහු වෙත්.

ධ්‍යාන යනු : ධ්‍යාන සතරෙකි : ප්‍රථමධ්‍යාන ය, ද්විතීයධ්‍යාන ය, තෘතීයධ්‍යාන ය, චතුර්ථධ්‍යාන යි.

විමොක්ෂ යනු විමොක්ෂ අටෙකි : රූපධ්‍යාන ඇත්තේ රූපයන් දකී. මේ ප්‍රථම විමොක්ෂ ය, අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ බාහ්‍යරූපයන් දකී. මේ ද්විතීය විමොක්ෂ ය, ශුභ යයි අධිමුක්ති ඇත්තේ වෙයි. මේ තෘතීය විමොක්ෂ ය, සර්වප්‍රකාර යෙන් රූපසංඥවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්ව සංඥවන් නො මෙනෙහි කිරීමෙන් ' ආකාශය අනන්තය ' යි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කෙරෙයි. මේ චතුර්ථවිමොක්ෂ ය, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම ' විඥනය අනන්තය ' යි විඤ්ඤණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ පඤ්චමවිමොක්ෂය යි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤණඤ්චායතනය ඉක්මවා ' කිසිවක් නැතැ ' යි ආකිඤ්චඤ්ඤයතනයට පැමිණ වාසය කෙරෙයි. මේ ෂෂ්ඨවිමොක්ෂය යි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤයතනය ඉක්මවා නෙවසඤ්ඤනාසඤ්ඤයතනයට පැමිණ වාසය කෙරෙයි. මේ සප්තමවිමොක්ෂය යි. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤනාසඤ්ඤ යතනය ඉක්මවා සංඥවෙදයිතනිරොධයට පැමිණ වාස කෙරේ. මේ අෂ්ටම විමොක්ෂය යි.

සමාධීති තයො සමාධී: සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්කඅවිචාරො සමාධි.

සමාපත්තීති නව අනුපුබ්බවිහාරසමාපත්තියො, පඨමජ්ඣානසමාපත්ති දුතියජ්ඣානසමාපත්ති තතියජ්ඣානසමාපත්ති චතුත්ථජ්ඣානසමාපත්ති ආකාසානඤ්චායතනසමාපත්ති විඤ්ඤාණඤ්චායතනසමාපත්ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති.

සංකිලෙසන්ති හානභාගියො ධම්මො.

වොදානන්ති විසෙසභාගියො ධම්මො.

වුට්ඨානන්ති වොදානම්පි වුට්ඨානං, තම්හා තම්හා සමාධිම්හා වුට්ඨානම්පි වුට්ඨානන්ති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං.

833. තත්ථ කතමං තථාගතස්ස පුබ්බෙනිවාසානුස්සති යථාභූතං ඤාණං: ඉධ තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො, වීසතිම්පි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාළීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො, එවමාහාරො, එවංසුඛදුක්ඛපටිසංවෙදී, එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො, එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරතීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො, ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස පුබ්බෙනිවාසානුස්සති යථාභූතං ඤාණං.

834. තත්ථ කතමං තථාගතස්ස සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණං: ඉධ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති, ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාතීති, යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො, සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණං.

සමාධි යනු : සමාධි තුනෙකි : සවිතර්කසවිචාරසමාධි ය, අවිතර්කවිචාරමාත්‍ර සමාධි ය, අවිතර්කඅවිචාරසමාධි යි.

සමාපත්ති යනු : අනුපූර්වවිහාරසමාපත්ති නවයෙකි. ප්‍රථමධ්‍යානසමාපත්ති ය, ද්විතීයධ්‍යානසමාපත්ති ය, තෘතීයධ්‍යානසමාපත්ති ය, චතුර්ථධ්‍යානසමාපත්ති ය, ආකාසානඤ්චායතනසමාපත්ති ය, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති ය, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති ය, සඤ්ඤාවෙදයිතනිරොධ සමාපත්ති යි.

සංකෙලශ යනු : හානභාගිය ධර්ම යි.

වොදන යනු : විශෙෂභාගිය ධර්ම යි.

ව්‍යුත්ථාන යනු : ව්‍යවදනය ද ව්‍යුත්ථාන ය, ඒ ඒ සමාධියෙන් නැඟීසිටීම ද ව්‍යුත්ථාන යි. එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ 'තථාගතයන් ධ්‍යානවිමොක්ෂසමාධිසමාපත්තීන්ගේ සාංක්ලෙශව්‍යවදනව්‍යුත්ථාන ඇති සැටියෙන් දන්නා නුවණ යි.

833. එහි තථාගතයන්ගේ පූර්වනිවාසයන් (පෙරවිසූකඳපිළිවෙළ) ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම නන්වැදෑරුම් වූ පූර්වනිවාසය සිහි කෙරෙයි. ඔහ මෙසේ යි : එක් ජාතියකුදු, ජාතිදෙකකුදු, ජාතිතුනකුදු, ජාති සතරකුදු, ජාති පසකුදු, ජාති දසයකුදු, ජාතිවිස්සකුදු, ජාති තිසකුදු, ජාති සතළිසකුදු, ජාති පනසකුදු, ජාතිසියයකුදු, ජාතිදහසකුදු, ජාති ලක්ෂයකුදු, නොයෙක් සංවර්තකල්පයනුදු, නොයෙක් විවර්තකල්පයනුදු, නොයෙක් සංවර්තවිවර්තකල්පයනුදු අසුවල් තැන මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැසටහන් ඇතියෙම් මෙබඳු අහාර ඇතියෙම් මෙබඳු සුවදුක් විඳිනාසුලුයෙම් මෙබඳු ආයුපර්‍යන්ත ඇතියෙම් වීමි. මම එතැනින් ච්‍යුත වූයෙම් අසුවල් තැන උපන්මි. එහිදු මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැසටහන් ඇතියෙම් මෙබඳු ආහාර ඇතියෙම් මෙබඳු සුවදුක් විඳිනාසුලුයෙම් මෙබඳු ආයුපර්‍යන්ත ඇතියෙම් වීමි. මම එතැනින් ච්‍යුත වූයෙම් මෙහි උපන්මියි මෙසේ ආකාර සහිත ව උද්දෙශ සහිත ව නන්වැදෑරුම් වූ පූර්වනිවාසය සිහි කෙරේ යයි, එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ තථාගතයන්ගේ පූර්වනිවාසයන් ඇති සැටියෙන් දන්නා නුවණ යි.

834. එහි තථාගතයන් සත්ත්වයන්ගේ ච්‍යුති-උත්පත්ති ඇතිසැටියෙන් දන්නා නුවණ කවරෙ යත් : මෙහි තථාගත තෙම මිනිස් බව ඉක්මගිය විශුද්ධ වූ දිවඇසින් ච්‍යුත වන්නා වූ හීන වූ ප්‍රණීත වූ ශොභනවර්ණ වූ දුර්වර්ණ වූ සුන්දරගති ඇති නපුරුගති ඇති සත්ත්වයන් දකී. මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්වාගතයහ, මනොදුශ්චරිතයෙන් සමන්වාගතයහ, ආර්‍යෝපවාදකයහ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහ, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන ඇත්තාහ, ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ගති ඇති විවස ව පතිත වන නිරයෙහි උපන්නාහු ය, තවද මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්වාගතයහ, වාක්සුචරිතයෙන් සමන්වාගතයහ, මනස්සුචරිතයෙන් සමන්වාගතයහ, ආර්‍යයන්ට උපවාද නො කරන්නාහ, සම්‍යග්දෘෂ්ටි ඇත්තාහ, සම්‍යග්දෘෂ්ටිකර්මසමාදන ඇත්තාහ, ඔහු කාබුන් මරණින් මතු සුන්දරගති ඇති ස්වර්ගලොකයෙහි උපන්නාහු යි මෙසේ මිනිස් බව ඉක්මගිය විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන්නා වූ උපදනා වූ හීන වූ ප්‍රණීත වූ ශොභනවර්ණ වූ දුර්වර්ණ වූ සුන්දරගති ඇති නපුරුගති ඇති සත්ත්වයන් දකී. කම්වූපරිද්දෙන් ගිය සත්ත්වයන් දනගනී යයි එහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ 'තථාගතයන් සත්ත්වයන්ගේ ච්‍යුති-උත්පත්ති ඇතිසැටියෙන් දන්නා නුවණ ' යි.

835. තත්ථ කතමං තථාගතස්ස ආසවානං ඛයෙ යථාභූතං ඤාණං : ඉධ තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති යා තත්ථ පඤ්ඤා පජානනා සල්ලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදෙ පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදෙ පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස ආසවානං ඛයෙ යථාභූතං ඤාණන්ති, ඉමානි දස තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

එවං දසවිධෙන ඤාණවත්ථු.

ඤාණවිභඞ්ගො නිට්ඨිතො.

---

835. එහි තථාගතයන්ගේ ආස්‍රවක්ෂයයෙහි යථාභූතඥානය කවරේ යත් : මෙහි තථාගත තෙම ආස්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්ති යත් මෙ අත්බැව්හි ම තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසේ යයි එහි යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් සංලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් (අනිත්‍යාදි) විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂා යෙක් පෘථුලප්‍රඥායෙක් මෙධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් පතොදප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලොකයෙක් ප්‍රඥා-අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ 'තථාගතයන්ගේ ආස්‍රවක්ෂයයෙහි යථාභූතඥාන' යි. මොහු තථාගතයන්ගේ දශතථාගතබලයෝ යි. යම් බල කෙනකුන්ගෙන් සමන්වාගත වූ තථාගත තෙම ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරේ නම් පිරිස්හි අභීතනාද කෙරේ නම් ශ්‍රෙෂ්ඨ වූ ධර්මචක්‍රය පවත්වා නම් ඔහු යි.

මෙසේ දශප්‍රකාරයෙන් ඥානවස්තු වේ.

ඥානවිභඞ්ග නිමි.

---

14—ඩ8 17626 (3/75)

# 17. ඛුද්දකවත්ථුවිභඞ්ගො

836. ජාතිමදො ගොත්තමදො ආරොග්‍යමදො යොබ්බනමදො ජීවිතමදො ලාභමදො සක්කාරමදො ගරුකාරමදො පුරෙක්ඛාරමදො පරිවාරමදො භොගමදො වණ්ණමදො සුතමදො පටිභානමදො රත්තඤ්ඤු-මදො පිණ්ඩපාතිකමදො අනවඤ්ඤත්තිමදො[1] ඉරියාපථමදො ඉද්ධිමදො යසමදො සීලමදො ඣානමදො සිප්පමදො ආරොහමදො පරිණාහමදො සණ්ඨානමදො පාරිපූරිමදො මදො පමාදො ථම්භො සාරම්භො අත්‍රිච්ඡතා මහිච්ඡතා පාපිච්ඡතා සිඞ්ගං තින්තිණං චාපල්‍යං අසභාගවුත්ති, අරති තන්දී විජම්භිකා භත්තසම්මදො චෙතසො ච ලීනත්තං, කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා, සෙය්‍යොහමස්මීති මානො සදිසොහමස්මීති මානො හීනොහමස්මීති මානො, සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො සෙය්‍යස්ස හීනොහමස්මීති මානො, සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො සදිසස්ස සදිසොහමස්මීති මානො සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙය්‍යොහමස්මීති මානො හීනස්ස සදිසොහමස්මීති මානො හීනස්ස හීනොහමස්මීති මානො, මානො අතිමානො මානාති-මානො ඔමානො අධිමානො අස්මිමානො මිච්ඡාමානො, ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො ලාභසක්කාරසිලොකපටිසංයුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසං-යුත්තො විතක්කො.

එකකං.

837. කොධො ච උපනාහො ච, මක්ඛො ච පලාසො ච, ඉස්සා ච මච්ඡරියං ච, මායා ච සාඨෙය්‍යං ච, අවිජ්ජා ච භවතණ්හා ච, භවදිට්ඨි ච විභවදිට්ඨි ච, සස්සතදිට්ඨි ච උච්ඡෙදදිට්ඨි ච, අන්තවාදිට්ඨි ච අනන්තවාදිට්ඨි ච, පුබ්බන්තානුදිට්ඨි ච අපරන්තානුදිට්ඨි ච, අහිරිකං ච අනොත්තප්පං ච, දොවචස්සතා ච පාපමිත්තතා ච, අනජ්ජවො ච අමද්දවො ච, අක්ඛන්ති ච අසොරච්චං ච, අසාඛල්‍යං ච අප්පටිසන්ථාරො ච, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච භොජනෙ අමත්තඤ්ඤුතා ච, මුට්ඨස්සච්චං ච අසම්ප-ජඤ්ඤං ච, සීලවිපත්ති ච දිට්ඨිවිපත්ති ච, අජ්ඣත්තසංයොජනං ච බහිද්ධාසංයොජනං ච.

දුකං.

238. තීණි අකුසලමූලානි, තයො අකුසලවිතක්කා, තිස්සො අකුසලසඤ්ඤා, තිස්සො අකුසලධාතුයො, තීණි දුච්චරිතානි, තයො ආසවා, තීණි සංයොජනානි, තිස්සො තණ්හා, අපරාපි තිස්සො තණ්හා, තිස්සො එසනා, තිස්සො විධා, තීණි භයානි, තීණි තමානි, තීණි තිත්ථායතනානි, තයො කිඤ්චනා, තීණි අඞ්ගණානි, තීණි මලානි, තීණි විසමානි අපරානිපි තීණි විසමානි, තයො අග්ගී, තයො කසාවා, අපරෙපි තයො කසාවා, අස්සාදදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, අරති විහෙසා අධම්මචරියා,

1. අනවඤ්ඤතමදො – සිරිමු, මජසං.



Free Distribution www.aathaapi.org

# 17. ක්‍ෂුද්‍රකවස්තු විභඞ්ගය

836. ජාතිමද ය ගොත්‍රමද ය ආරොග්‍යමද ය යෞවනමද ය ජීවිතමද ය ලාභමද ය සත්කාරමද ය ගරුකාරමද ය පුරස්කාරමද ය පරිවාරමද ය භොගමද ය වර්ණමද ය ශ්‍රුත මද ය ප්‍රතිභානමද ය රාත්‍රඥමද ය පිණ්ඩපාතිකමද ය අනවඥමද ය ඊර්‍ය්‍යාපථමද ය ඍද්ධි මද ය යශොමද ය ශීලමද ය ධ්‍යානමද ය ශිල්පමද ය ආරොහමද ය පරිණාහමද ය සංස්ථාන මද ය පරිපූර්ණමද ය මද ය ප්‍රමාද ය ස්තම්භ ය සාරම්භ ය අත්‍රිච්ඡ බව ය මහෙච්ඡ බව ය පාපෙච්ඡ බව ය ශෘඞ්ග ය තින්තින ය චපල බව ය නො සම පැවැත්ම ය නො ඇල්ම ය මැලි බව ය ඇහමැලිහරන බව ය බත්මත ය චිත්තයාගේ ලීන බව ය කුහක බව ය ලපන ය නෛමිත්තික බව ය, නිප්පෙසිකතා (පරගුණපිසලීම) ය, ලාභයෙන් ලාභ සොයන බව ය. මම උසස්මි යන මාන ය, මම සමානයෙමි යන මාන ය, මම හීනයෙමි යන මාන ය, මම උසස්වූවහුට උසස්මි යන මාන ය, මම උසස් වූවහුට සමානයෙමි යන මාන ය, මම උසස් වූවහුට හීනයෙමි යන මාන ය, මම සමානයාහට උසස්මි යන මාන ය, මම සමානයාට සමානයෙමි යන මාන ය, මම සමානයාට හීනයෙමි යන මාන ය, මම හීනයාට උසස්මි යන මාන ය මම හීනයාට සමානයෙමි යන මාන ය, මම හීනයාට හීනයෙමි යන මාන ය, මාන ය, අතිමාන ය මානාතිමාන ය අවමාන ය අධිමාන ය අස්මිමාන ය මිථ්‍යාමාන ය, ඥතිවිතර්ක ය ජනපදවිතර්ක ය අමරවිතර්ක ය මෙරමාහට දයායෙන් ප්‍රතිසංයුක්ත විතර්ක ය ලාභසත්කාරශ්ලොකප්‍රතිසංයුක්තවිතර්ක ය අනවඥප්‍රතිසංයුක්තවිතර්ක යි.

**එකක යි.**

837. ක්‍රොධය ද බද්ධවෛරය ද, මකු බව ද පළාසය ද, ඊර්ෂ්‍යාව ද මාත්සර්‍ය්‍යය ද, මායාව ද සඨ බව ද, අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද, භවදෘෂ්ටිය ද විභවදෘෂ්ටිය ද, ශාශ්වත දෘෂ්ටිය ද උච්ඡෙදදෘෂ්ටිය ද, අන්තවද්දෘෂ්ටිය ද, අනන්තවද්දෘෂ්ටිය ද, පූර්වාන්තානුදෘෂ්ටිය ද අපරාන්තානු දෘෂ්ටිය ද, අපත්‍රපාව ද, අනුත්තාපය ද, දුර්වච බව ද, පාපමිත්‍ර බව ද, අනාර්ජවය ද, අමාර්දවය ද, නො ඉවසීම ද, සුරත නො වන බව ද, අසඛිල බව ද, පටිසන්ථාර රහිත බව ද, ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාර බව ද, භොජනයෙහි අමාත්‍රඥ බව ද, මුෂිතස්මෘතිය ද, සම්‍යග්ඥාන රහිත බව ද, ශීලවිපත්තිය ද, දෘෂ්ටිවිපත්තිය ද, අධ්‍යාත්ම සංයොජන ද බාහ්‍යසංයොජන ද යි.

**ද්වික යි.**

838. අකුශලමූලයෝ තිදෙනෙකි, අකුශලවිතර්කයෝ තිදෙනෙකි, අකුශලසංඥචෝ තිදෙනෙකි, අකුශලධාතූහු තිදෙනෙකි, දුශ්චරිතයෝ තිදෙනෙකි, ආස්‍රවයෝ තිදෙනෙකි, සංයොජනයෝ තිදෙනෙකි, තෘෂ්ණාවෝ තිදෙනෙකි, අන්‍ය වූ ද තෘෂ්ණාවෝ තිදෙනෙකි, එෂණයෝ තිදෙනෙකි, විධාවෝ (මාන) තිදෙනෙකි, භය තුනෙකි, තමස්හු තිදෙනෙකි, තීර්ථායතනයෝ තිදෙනෙකි, කිඤ්චන (පලිබොධ) යෝ තිදෙනෙකි, අඞ්ගණයෝ තිදෙනෙකි, මලයෝ තිදෙනෙකි, විෂමයෝ තිදෙනෙකි, අන්‍ය වූ ද විෂමයෝ තිදෙනෙකි, අග්නීහු තිදෙනෙකි, කසටයෝ තිදෙනෙකි, අන්‍ය වූ ද කසටයෝ තිදෙනෙකි, ආස්වාදදෘෂ්ටි ය ආත්මානුදෘෂ්ටි ය මිථ්‍යාදෘෂ්ටි ය, අරති ය විහෙසා ය අධර්මචර්‍ය්‍යා ය,

දොවචස්සතා පාපමිත්තතා නානත්තසඤ්ඤා, උද්ධච්චං කොසජ්ජං පමාදො, අසන්තුට්ඨිතා අසම්පජඤ්ඤතා මහිච්ඡතා, අහිරිකං අනොත්තප්පං පමාදො, අනාදරියං දොවචස්සතා පාපමිත්තතා, අස්සද්ධියං අවදඤ්ඤුතා කොසජ්ජං, උද්ධච්චං අසංවරො දුස්සීල්‍යං, අරියානං අදස්සනකම්‍යතා සද්ධම්මං අසොතුකම්‍යතා උපාරම්භචිත්තතා, මුට්ඨස්සච්චං අසම්පජඤ්ඤං චෙතසො වික්ඛෙපො, අයොනිසොමනසිකාරො කුම්මග්ගසෙවනා චෙතසො ච ලීනත්තං.

තිකං.

839. චත්තාරො ආසවා, චත්තාරො ගන්ථා, චත්තාරො ඔඝා, චත්තාරො යොගා, චත්තාරි උපාදානානි, චත්තාරො තණ්හුප්පාදා, චත්තාරි අගතිගමනානි, චත්තාරො විපරියෙසා, චත්තාරො අනරියවොහාරා, අපරෙපි චත්තාරො අනරියවොහාරා, චත්තාරි දුච්චරිතානි, අපරානිපි චත්තාරි දුච්චරිතානි, චත්තාරි භයානි, අපරානිපි චත්තාරි භයානි, චතස්සො දිට්ඨියො.

චතුක්කං.

840. පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි, පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤොජනානි, පඤ්ච මච්ඡරියානි, පඤ්ච සඞ්ගා, පඤ්ච සල්ලා, පඤ්ච චෙතොඛිලා, පඤ්ච චෙතසො විනිබන්ධා, පඤ්ච නීවරණානි, පඤ්ච කම්මානි ආනන්තරිකානි, පඤ්ච දිට්ඨියො, පඤ්ච වෙරා, පඤ්ච ව්‍යසනා, පඤ්ච අක්ඛන්තියා ආදීනවා, පඤ්ච භයානි, පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා.

පඤ්චකං.

841. ඡ විවාද මූලානි, ඡ ඡන්දරාගා ගෙහසිතා ධම්මා,[1] ඡ විරොධවත්ථූනි, ඡ තණ්හාකායා, ඡ අගාරවා, ඡ පරිහානියා ධම්මා, අපරෙපි ඡ පරිහානියා ධම්මා, ඡ සොමනස්සුපවිචාරා, ඡ දොමනස්සුපවිචාරා, ඡ උපෙක්ඛුපවිචාරා, ඡ ගෙහසිතානි සොමනස්සානි, ඡ ගෙහසිතානි දොමනස්සානි, ඡ ගෙහසිතා උපෙක්ඛා, ඡ දිට්ඨියො.

ඡක්කං.

842. සත්තානුසයා, සත්ත සඤ්ඤොජනානි, සත්ත පරියුට්ඨානානි, සත්ත අසද්ධම්මා, සත්ත දුච්චරිතානි, සත්ත මානා, සත්ත දිට්ඨියො.

සත්තකං.

843. අට්ඨ කිලෙසවත්ථූනි, අට්ඨ කුසීතවත්ථූනි, අට්ඨසු ලොකධම්මෙසු චිත්තස්ස පටිඝාතො, අට්ඨ අනරියවොහාරා, අට්ඨ මිච්ඡත්තා, අට්ඨ පුරිසදොසා, අට්ඨ අසඤ්ඤීවාදා, අට්ඨ නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා.

අට්ඨකං.

844. නව ආඝාතවත්ථූනි, නව පුරිසමලානි, නවවිධා මානා, නව තණ්හාමූලකා ධම්මා, නව ඉඤ්ජිතානි, නව මඤ්ඤිතානි, නව ඵන්දිතානි, නව පපඤ්චිතානි, නව සඞ්ඛතානි.

නවකං.

1. ඡ ඡන්දරාගා – සිරිමු, මජසං.

දුර්වචතා ය පාපමිත්‍රතා ය නානාත්වසංඥා ය, ඖද්ධත්‍ය ය කෞසීද්‍ය ය ප්‍රමාද ය, අසන්තුෂ්ටිතා ය අසම්ප්‍රජන්‍යතා ය මහෙච්ඡතා ය, අපත්‍රපා ය අනුත්තාප ය ප්‍රමාද ය, අනාදරිය ය දුර්වචතා ය පාපමිත්‍රතා ය, අශ්‍රද්ධා ය, අවදඤ්ඤුතා ය කෞසීද්‍ය ය, ඖද්ධත්‍ය ය අසංවර ය දුශ්ශීල්‍ය ය, ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව ය සදහම් නො අසනු කැමැති බව ය උපාරම්භ සිත් ඇති බව ය, මුළාසි බව ය සම්ප්‍රජන්‍ය රහිත බව ය චිත්තයාගේ වික්ෂෙප ය, මනසිකාර ය කුත්සිත මාර්ගසෙවන ය චිත්තයාගේ ලීනතා යි.

ත්‍රික යි.

839. ආශ්‍රව සතරෙකි, ග්‍රන්ථ සතරෙකි, ඔඝ සතරෙකි, යොග සතරෙකි, උපාදාන සතරෙකි, තෘෂ්ණොත්පාද සතරෙකි, අගතිගමන සතරෙකි, විපර්‍ය්‍යාස සතරෙකි, අනාර්‍ය්‍ය ව්‍යවහාර සතරෙකි, අන්‍ය වූ ද අනාර්‍ය්‍යව්‍යවහාර සතරෙකි, දුශ්චරිත සතරෙකි, අන්‍ය වූ ද දුශ්චරිත සතරෙකි, භය සතරෙකි, අන්‍ය වූ ද භය සතරෙකි, දෘෂ්ටි සතරෙකි.

චතුෂ්ක යි.

840. ඔරම්භාගියසංයොජන පසෙකි, උද්ධම්භාගියසංයොජන පසෙකි, මාත්සර්‍ය්‍ය පසෙකි, සඞ්ග පසෙකි, ශල්‍ය පසෙකි, චෙතොඛිල පසෙකි, චිත්තයාගේ විනිබන්ධ පසෙකි, නීවරණ පසෙකි, ආනන්තර්‍ය්‍යකර්ම පසෙකි, දෘෂ්ටි පසෙකි, වෛර පසෙකි, ව්‍යසන පසෙකි, අක්ෂාන්තියෙහි ආදීනව පසෙකි, භය පසෙකි, දෘෂ්ටධර්මනිර්වාණවාද පසෙකි.

පඤ්චක යි.

841. විවාදමූල සයෙකි, ගෘහශ්‍රිතඡන්දරාගධර්ම සයෙකි, විරුද්ධවස්තු සයෙකි, තෘෂ්ණාකාය සයෙකි, අගෞරව සයෙකි, පරිහානිකරධර්ම සයෙකි, අන්‍ය වූ ද පරිහානිකර ධර්ම සයෙකි, සෞමනස්‍යොපවිචාර සයෙකි, දෞර්මනස්‍යොපවිචාර සයෙකි, උපෙක්ෂොප විචාර සයෙකි, ගෘහශ්‍රිතසෞමනස්‍ය සයෙකි, ගෘහශ්‍රිතදෞර්මනස්‍ය සයෙකි, ගෘහශ්‍රිත උපෙක්ෂා සයෙකි, දෘෂ්ටි සයෙකි.

ෂට්ක යි.

842. අනුශය සතෙකි, සංයොජන සතෙකි, පර්‍ය්‍යුත්ථාන සතෙකි, අසද්ධර්ම සතෙකි, දුශ්චරිත සතෙකි, මාන සතෙකි, දෘෂ්ටි සතෙකි.

සප්තක යි.

843. ක්ලෙශවස්තු අටෙක, කුසීතවස්තු අටෙක, අෂ්ටලොකධර්මයෙහි චිත්තයාගේ ප්‍රතිඝාත ය, අනාර්‍ය්‍යව්‍යවහාර අටෙක, මිථ්‍යාත්ව අටෙක, පුරුෂදොෂ අටෙක, අසංඥීවාද අටෙක, නෛවසංඥානාසංඥීවාද අටෙකි.

අෂ්ටක යි.

844. ආඝාතවස්තු නවයෙක, පුරුෂමල නවයෙක, නවවිධමාන ය, තෘෂ්ණාමූලක ධර්ම නවයෙක, ඉඤ්ජිත නවයෙක, මඤ්ඤිත නවයෙක, ස්පන්දිත නවයෙක, ප්‍රපඤ්චිත නවයෙක, සඞ්ඛත නවයෙකි.

නවක යි.

845. දස කිලෙසවත්ථූනි, දස ආඝාතවත්ථූනි, දස අකුසලකම්මපථා, දස සඤ්ඤොජනානි, දස මිච්ඡත්තා, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි.

දසකං.

846. අට්ඨාරස තණ්හා විචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය, අට්ඨාරස තණ්හා විචරිතානි බාහිරස්ස උපාදාය, තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා ඡත්තිංස තණ්හාවිචරිතානි හොන්ති. ඉති අතීතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, අනාගතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, පච්චුප්පන්නානි ඡත්තිංස තණ්හා විචරිතානි, තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා අට්ඨතණ්හාවිචරිතසතං හොති. යානි ච ද්වාසට්ඨි දිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ වෙය්‍යාකරණෙ වුත්තානි භගවතා.

මාතිකා.

---

847. තත්ථ කතමො ජාතිමදො: ජාතිං පටිච්ච මදො මජ්ජනා මජ්ජිතත්තං මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති ජාතිමදො.

848. තත්ථ කතමො, ගොත්තමදො: ගොත්තං පටිච්ච -පෙ- ආරොග්‍යං පටිච්ච -පෙ- යොබ්බනං පටිච්ච -පෙ- ජීවිතං පටිච්ච -පෙ- ලාභං පටිච්ච -පෙ- සක්කාරං පටිච්ච -පෙ- ගරුකාරං පටිච්ච -පෙ- පුරෙක්ඛාරං පටිච්ච -පෙ- පරිවාරං පටිච්ච -පෙ- භොගං පටිච්ච -පෙ- වණ්ණං පටිච්ච -පෙ- සුතං පටිච්ච -පෙ- පටිභානං පටිච්ච -පෙ- රත්තඤ්ඤූතං පටිච්ච -පෙ- පිණ්ඩපාතිකත්තං පටිච්ච -පෙ- අනවඤ්ඤත්තං[1] පටිච්ච -පෙ ඉරියාපථං පටිච්ච -පෙ ඉද්ධිං පටිච්ච -පෙ- යසං පටිච්ච -පෙ- සීලං පටිච්ච -පෙ- ඣානං පටිච්ච -පෙ- සිප්පං පටිච්ච -පෙ- ආරොහං පටිච්ච -පෙ- පරිණාහං පටිච්ච -පෙ- සණ්ඨානං පටිච්ච -පෙ- පාරිපූරිං පටිච්ච මදො මජ්ජනා මජ්ජිතත්තං මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස අයං වුච්චති පාරිපූරිමදො.

849. තත්ථ කතමො මදො: යො මදො මජ්ජනා මජ්ජිතත්තං මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මදො.

850. තත්ථ කතමො පමාදො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනෝ දුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පාදනං කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තච්ඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො. යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො.

---

1. අනවඤ්ඤතං - සිරිමු, මජසං.

845. ක්ලේශවස්තු දසයෙක, ආඝාතවස්තු දසයෙක, අකුශලකර්මපථ දසයෙක, සංයොජන දසයෙක, මිථ්‍යාත්ව දසයෙක, දශවස්තුකමිථ්‍යාදෘෂ්ටි ය, දශවස්තුක අන්තග්‍රාහක දෘෂ්ටි යි.

දශක යි.

846. තෘෂ්ණාවිචරිත අටළොසෙක ආධ්‍යාත්මිකස්කන්ධ නිසා, තෘෂ්ණාවිචරිත අටළොසෙක බාහිරස්කන්ධ නිසා, එය එක් අයුරෙකින් රැස් කොට හකුළුවා තෘෂ්ණා විචරිත සතිසෙක් වෙයි. මෙසේ අතීතතෘෂ්ණාවිචරිත සතිසෙක, අනාගතතෘෂ්ණාවිචරිත සතිසෙක, ප්‍රත්‍යුත්පන්නතෘෂ්ණාවිචරිත සතිසෙක, එය එක් අයුරෙකින් රැස් කොට හකුළුවා තෘෂ්ණාවිචරිත අටතුරාසියෙක් වේ. තවද භාග්‍යවතුන් විසින් බ්‍රහ්මජාල ව්‍යාකරණයෙහි යම් දෙසැටදෘෂ්ටි කෙනෙක් වදාරන ලද්දහු නම් ඔහු යි.

මාතෘකා යි.

---

847. එහි ජාතිමද කවරෙ යත් : ජාතිය නිසා මදයෙක් මත් අයුරෙක් මත් වූ බවෙක් මානයෙක් මානනාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් ධ්වජයෙක් සම්ප්‍රග්‍රාහයෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ 'ජාතිමද' යි කියනු ලැබේ.

848. එහි ගොත්‍රමද කවරෙ යත් : ගොත්‍රය නිසා . . . ආරොග්‍යය නිසා . . . යෞවනය නිසා . . . ජීවිතය නිසා . . . ලාභය නිසා . . . සත්කාරය නිසා . . . ගරුකාරය නිසා . . . පුරස්කාරය නිසා . . . පිරිවර නිසා . . . භොගය නිසා . . . වර්ණය නිසා . . . ශ්‍රැතය නිසා . . . ප්‍රතිභානය නිසා . . . රාත්‍රඥතාව නිසා . . . පිණ්ඩපාතික බව නිසා . . . අවඥ නො කිරීම නිසා . . . ඊර්‍ය්‍යාපථය නිසා . . . සෘද්ධිය නිසා . . . යශස නිසා . . . ශීලය නිසා . . . ධ්‍යානය නිසා . . . ශිල්පය නිසා . . . ආරොහය නිසා . . . පරිණාහය නිසා . . . සටහන නිසා . . . පරිපූර්ණ බව නිසා මදයෙක් මත් අයුරෙක් මත් වූ බවෙක් මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් ධ්වජයෙක් සම්ප්‍රග්‍රාහයෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ 'පාරිපූරිමද' යි කියනු ලැබේ.

849. එහි මද කවරෙ යත් : යම් මදයෙක් මත් අයුරෙක් මත් වූ බවෙක් මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් ධ්වජයෙක් සම්ප්‍රග්‍රාහයෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ 'මද' යි කියනු ලැබේ.

850. එහි ප්‍රමාද කවරෙ යත් : කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිතයෙහි හෝ පඤ්චකාමගුණයෙහි හෝ චිත්තයාගේ විසර්ජනයෙක් පුනපුනා විසර්ජනයෙක් කුශලධර්මයන්ගේ වැඩීම පිණිස නො සකසා කරන බවෙක් සාතත්‍යක්‍රියා රහිත බවෙක් අනවස්ථිතක්‍රියා බවෙක් හැකුළුණු පැවැතුම් ඇති බවෙක් බහා තැබූ වීර්‍ය්‍යඡන්දය ඇති බවෙක් බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් අනාසෙවනයෙක් අභාවනයෙක් බහුල නො කිරීමෙක් නො පිහිටීමෙක් අනුයොග රහිත වීමෙක් ප්‍රමාදයෙක් වේ ද, යම් මෙබඳු ප්‍රමාදයෙක් ප්‍රමාද අයුරෙක් ප්‍රමත්ත බවෙක් වේ ද, මේ 'ප්‍රමාද' යි කියනු ලැබේ.

851. තත්ථ කතමො ථම්භො: යො ථම්භො ථම්භනා ථම්භිතත්තං කක්ඛළියං ඵාරුසියං උජුචිත්තතා අමුදුතා, අයං වුච්චති ථම්භො.

852. තත්ථ කතමො සාරම්භො: යො සාරම්භො පටිසාරම්භො සාරම්භනා පටිසාරම්භනා පටිසාරම්භිතත්තං, අයං වුච්චති සාරම්භො.

853. තත්ථ කතමා අත්‍රිච්ඡතා: ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භිය්‍යොකම්‍යතා යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං[1] අත්‍රිච්ඡතා රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දී නන්දීරාගො චිත්තස්ස සාරාගො, අයං වුච්චති අත්‍රිච්ඡතා.

854. තත්ථ කතමා මහිච්ඡතා: ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙහි පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භිය්‍යොකම්‍යතා, යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං මහිච්ඡතා රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති මහිච්ඡතා.

855. තත්ථ කතමා පාපිච්ඡතා: ඉධෙකච්චො අස්සද්ධො සමානො සද්ධොති මං ජනො ජානාතූති ඉච්ඡති, දුස්සීලො සමානො සීලවාති මං ජනො ජානාතූති ඉච්ඡති, අප්පස්සුතො සමානො බහුස්සුතොති මං ජනො ජානාතූති ඉච්ඡති, සඞ්ගණිකාරාමො සමානො පවිවිත්තොති මං ජනො ජානාතූති ඉච්ඡති, කුසීතො සමානො ආරද්ධවීරියොති මං ජනො ජානාතූති ඉච්ඡති, මුට්ඨස්සති සමානො උපට්ඨිතස්සතීති මං ජනො ජානාතූති ඉච්ඡති, අසමාහිතො සමානො සමාහිතොති මං ජනො ජානාතූති ඉච්ඡති. දුප්පඤ්ඤො සමානො පඤ්ඤවාති මං ජනො ජානාතූති ඉච්ඡති. අඛීණාසවො සමානො ඛීණාසවොති මං ජනො ජානාතූති ඉච්ඡති. යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං පාපිච්ඡතා රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති පාපිච්ඡතා.

856. තත්ථ කතමං සිඞ්ගං: යං සිඞ්ගං සිඞ්ගාරතා චතුරතා[2] චාතුරියං පරික්ඛත්තතා පාරික්ඛත්තියං, ඉදං වුච්චති සිඞ්ගං.

857. තත්ථ කතමං තින්තිණං: යං තින්තිණං තින්තිණායනා තින්තිණායිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ඡිකතා[3] සාදුකම්‍යතා[4], ඉදං වුච්චති තින්තිණං.

858. තත්ථ කතමං චාපල්‍යං:[5] චීවරමණ්ඩනා පත්තමණ්ඩනා සෙනාසනමණ්ඩනා ඉමස්ස වා පූතිකායස්ස බාහිරානං වා පරික්ඛාරානං මණ්ඩනා විභූසනා කෙලායනා පරිකෙලායනා[6] ගෙධිකතා ගෙධිකත්තං චපලතා චාපල්‍යං, ඉදං වුච්චති චාපල්‍යං.

---

1. ඉච්ඡාගතා - සිරිමු, මජසං
2. චාතුරතා - සිරිමු, මජසං.
3. පුච්ඡඤ්ජිකතා - සිරිමු, මජසං. පුඤ්ඡිකතා - සයා.
4. සාධුකම්‍යතා - සිරිමු, මජසං, සයා.
5. චාපල්ලං - සී පැමි.
6. කෙලනා, පරිකෙලනා - සිරිමු, මජසං, සයා.

851. එහි ස්තම්භ කවරෙ යත් : යම් ස්තම්භයෙක් තද අයුරෙක් තද වූ බවෙක් කර්කශ බවෙක් පරුෂ බවෙක් (අභිවාදනාදියෙහි) නො නැමෙන සිත් ඇති බවෙක් මෘදු නො වන බවෙක් වේ ද, මේ ' ස්තම්භ ' යි කියනු ලැබේ.

852. එහි සාරම්භ කවරෙ යත් : යම් කරණොත්තරකරණයෙක් ප්‍රතිසාරම්භයෙක් සාරම්භාකාරයෙක් ප්‍රතිසාරම්භාකාරයෙක් ප්‍රතිසාරම්භ කළ බවෙක් වේ ද, මේ ' සාරම්භ ' යි කියනු ලැබේ.

853. එහි අත්‍රිච්ඡතා කවර යත් : යම්කිසි සිවුරු-පිඩුවා-සෙනසුන්-ගිලන්පස-බෙහෙත්පිරිකරින් හෝ පස්කම්ගුණෙන් හෝ නො සතුටු වූවහුගේ බොහෝ කැමැති බවෙක් වේ ද, යම් මෙබඳු ඉච්ඡායෙක් ඉච්ඡාගතයෙක් අතිශයින් කැමැති බවෙක් රාගයෙක් සාරාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අත්‍රිච්ඡතා ' යි කියනු ලැබේ.

854. එහි මහිච්ඡතා කවර යත් : යම්කිසි සිවුරු-පිඩුවා-සෙනසුන්-ගිලන්පස-බෙහෙසත්පිරිකරින් නො සතුටු වූවහුගේ බොහෝ කැමැති බවෙක් වේ ද, යම් මෙබඳු ඉච්ඡායෙක් ඉච්ඡාගතයෙක් මහෙච්ඡ බවෙක් රාගයෙක් බලවත් රාගයෙක් . . . චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' මහිච්ඡතා ' යි කියනු ලැබේ.

855. එහි පාපිච්ඡතා කවර යත් : මෙලොව ඇතැමෙක් ශ්‍රද්ධා රහිත වූයේ ම ශ්‍රද්ධා ඇතියෙකැ යි ජන තෙම මා දනීවයි කැමැති වෙයි. දුශ්ශීල වූයේ ම සිල්වතෙකැ යි ජන තෙම මා දනීවයි කැමැති වෙයි. අල්පශ්‍රැත වූයේ ම බහුශ්‍රැතයෙකැ යි ජන තෙම මා දනීවයි කැමැති වෙයි, ගණයා කෙරෙහි ඇලුණේ ම විවික්තයෙකැ යි ජන තෙම මා දනීවයි කැමැති වෙයි. කුසීත වූයේ ම රුකුළුවැර ඇතියෙකැ යි ජන තෙම මා දනීව යි කැමැති වෙයි. මුළාසි ඇතියේ ම එළඹසිටිසිහි ඇතියෙකැ යි ජන තෙම මා දනීව යි කැමැති වෙයි. අසමාහිත වූයේ ම සමාහිතයෙකැ යි ජන තෙම මා දනීව යි කැමැති වෙයි. නුවණ නැතියෙක් වූයේ ම නුවණැතියෙකැ යි ජන තෙම මා දනීව යි කැමැති වෙයි. ක්ෂීණාස්‍රව නො වූයේ ම ක්ෂීණාස්‍රවයෙකැ යි ජන තෙම මා දනීව යි කැමැති වෙයි. යම් මෙබඳු ඉච්ඡායෙක් ඉච්ඡාගතයෙක් පාපෙච්ඡ බවෙක් රාගයෙක් බලවත් රාගයෙක් . . . චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' පාපිච්ඡතා ' යි කියනු ලැබේ.

856. එහි ශෘඞ්ග කවරෙ යත් : යම් ක්ලෙශශෘඞ්ගයෙක් ශෘඞ්ගාර (නාගරික) බවෙක් චතුර බවෙක් චාතුර්‍ය්‍යයෙක් දැඩි ශෘඞ්ගාර බවෙක් බලවත් ශෘඞ්ගාර බවෙක් වේ ද, මේ ' ශෘඞ්ගය ' යි කියනු ලැබේ.

857. එහි තින්තින කවරෙ යත් : යම් කෙදිරියක් කොඳුරන අයුරෙක් කොඳුළ බවෙක් ලොල් බවෙක් ලොල් අයුරෙක් ලොල් කළ බවෙක් නඟුට සලන බවෙක් මීහිරි කැමැති බවෙක් වේ ද, මේ ' තින්තින ' යි කියනු ලැබේ.

858. එහි චපල බව කවරෙ යත් : සිවුරු සැරසීමෙක් පාත්‍ර සැරසීමෙක් සෙනසුන් සැරසීමෙක් මේ පූතිකායයාගේ හෝ බාහිරපරිෂ්කාරයන්ගේ හෝ සැරසීමෙක් විභූෂණයෙක් නැළවීමෙක් හාත්පසින් නැළවීමෙක් ගිජු බවෙක් චපල බවෙක් චාපල්‍යයෙක් වේ ද මේ ' චපල බව ' යි කියනු ලැබේ.

859. තත්ථ කතමා අසභාගවුත්ති: මාතරි වා පිතරි වා ජෙට්ඨෙ වා කනිට්ඨෙ වා භාතරි ආචරියෙසු වා උපජ්ඣායෙ වා බුද්ධෙ වා සාවකෙසු වා අඤ්ඤතරඤ්ඤතරෙසු ගරුට්ඨානියෙසු විප්පටිකූලග්ගාහිතා විපච්චනීකසාතතා අනාදරියං අනාදරතා[1] අගාරවතා අප්පතිස්සවතා, අයං වුච්චති අසභාගවුත්ති.

860. තත්ථ කතමා අරති: පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු වා අධිකුසලෙසු ධම්මෙසු අරති අරතිතා අනභිරති අනභිරමනා උක්කණ්ඨිතා පරතස්සිතා, අයං වුච්චති අරති.

861. තත්ථ කතමා තන්දී: යා තන්දී තන්දියනා තන්දිමනකතා ආලස්‍යං ආලස්‍යායනා ආලස්‍යායිතත්තං, අයං වුච්චති තන්දී.

862. තත්ථ කතමා විජම්භිතා: යා කායස්ස ජම්භනා විජම්භනා ආනමනා විනමනා සන්නමනා පනමනා ව්‍යාධියකං, අයං වුච්චති විජම්භිතා.

863. තත්ථ කතමො භත්තසම්මදො: යා භුත්තාවිස්ස භත්තමුච්ඡා භත්තකිලමථො භත්තපරිළාහො කායදුට්ඨුල්ලං, අයං වුච්චති භත්තසම්මදො.

864. තත්ථ කතමං චෙතසො ච ලීනත්තං: යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති චෙතසො ච ලීනත්තං.

865. තත්ථ කතමා කුහනා: ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියාපථස්ස වා අට්ඨපනා[2] ඨපනා සණ්ඨපනා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, අයං වුච්චති කුහනා.

866. තත්ථ කතමා ලපනා: ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා[3] චාටුකම්‍යතා මුග්ගසුප්‍යතා පාරිභට්ටතා, අයං වුච්චති ලපනා.

867. තත්ථ කතමා නෙමිත්තිකතා: ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යං පරෙසං නිමිත්තං නිමිත්තකම්මං ඔභාසො ඔභාසකම්මං සාමන්තජප්පා පරිකථා, අයං වුච්චති නෙමිත්තිකතා.

868. තත්ථ කතමා නිප්පෙසිකතා: ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං අක්කොසනා වම්භනා ගරහනා උක්ඛෙපනා සමුක්ඛෙපනා ඛිපනා සංඛිපනා පාපනා සම්පාපනා අවණ්ණහාරිකා[4] පරපිට්ඨිමංසිකතා, අයං වුච්චති නිප්පෙසිකතා.

---

1. අනාදරියතා - සිරිමු, මජසං.
2. ආඨපනා - සීමු.
3. අනුප්පියභාසිතා - සීපැවි.
4. අවණ්ණහාරියා - සීපැවි.

859. එහි අසභාගවෘත්ති කවර යත් : මව කෙරෙහි හෝ පියා කෙරෙහි හෝ දෙටු බෑයා කෙරෙහි හෝ කනිටුබෑයා කෙරෙහි හෝ ආචාර්‍ය්‍යයන් කෙරෙහි හෝ උපාධ්‍යායයා කෙරෙහි හෝ බුදුන් කෙරෙහි හෝ බුදුසව්වන් කෙරෙහි හෝ අන්‍යතරාන්‍යතර ගරුස්ථාන යන්හි විලෝමග්‍රාහයෙක් විරුද්ධකරණයෙන් සුඛිතවන අයුරෙක් අනාදර බවෙක් අනාදරත්වයෙක් අගෞරව බවෙක් දෙටු කොට නො ගැන්මෙක් වේ ද, මේ ' අසභාගවෘත්ති ' යයි කියනු ලැබේ.

860. එහි අරති කවර යත් : ප්‍රාන්තසෙනාසනයන්හි හෝ අන්‍යතරාන්‍යතර අධි කුශලධර්මයන්හි හෝ යම් නො ඇල්මෙක් නො ඇලෙන අයුරෙක් අනභිරතියෙක් අනභිරමණයෙක් උකටලී බවෙක් උද්වෙගයෙක් වේ ද, මේ ' අරති ' යයි කියනු ලැබේ.

861. එහි තන්දි කවර යත් : යම් මැලිවීමෙක් මැලි අයුරෙක් මැලිසිත් ඇති බවෙක් අලස බවෙක් අලස අයුරෙක් අලස වූ බවෙක් වේ ද, මේ ' තන්දි ' යයි කියනු ලැබේ.

862. එහි විජම්භිකා කවර යත් : ශරීරයාගේ යම් ජෘම්භණයෙක් විජෘම්භණයෙක් ඉදිරියට නැමීමෙක් පස්සට නැමීමෙක් හාත්පසැ නැමීමෙක් නඟාසිටුවීමෙක් ගිලන් බවෙක් වේ ද, මේ ' විජම්භිකා ' යි කියනු ලැබේ.

863. එහි භත්තසම්මද කවරෙ යත් : වැළදූවහුට යම් භක්තමූර්ඡාවෙක් භක්ත ක්ලමථයෙක් භක්තපරිදාහයෙක් කය පිළිබඳ අකර්මණ්‍ය බවෙක් වේ ද, මේ ' භත්ත සම්මද ' යි කියනු ලැබේ.

864. එහි චිත්තයාගේ ලීනත්වය කවරෙ යත් : චිත්තයාගේ යම් අකල්‍ය බවෙක් අකර්මණ්‍ය බවෙක් එලෙන බවෙක් හාත්පසින් එලෙන බවෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකුළුණු බවෙක් සිත පිළිබඳ තද වීමෙක් තද අයුරෙක් තද බවෙක් වේ ද, මේ ' චිත්තයාගේ ලීනත්වය ' යි කියනු ලැබේ.

865. එහි කුහනා කවර යත් : ලාභසත්කාරප්‍රශංසා ඇසුරු කළ පාපෙච්ඡ වූ (අසද්ගුණ ප්‍රකාශ කරනු කැමැති) ආශාවෙන් මඩනා ලද්දහු ගේ ප්‍රත්‍යයප්‍රතිෂෙධනය යි කියන ලද කොහොන්වතින් හෝ සාමන්තජල්පනයෙන් හෝ ඊර්‍ය්‍යාපථයාගේ හෝ ආදියෙහි තැබීමෙක් තබන අයුරෙක් මොනොවට තැබීමෙක් මුහුණ හකුළුවන බවෙක් මුහුණ හකුළන අයුරෙක් විස්මය කරවීමෙක් විස්මය පැවැත්වීමෙක් කොහොන් බවෙක් වේ ද, මේ ' කුහනා ' යි කියනු ලැබේ.

866. එහි ලපනා කවර යත් : ලාභසත්කාර කීර්තිප්‍රශංසා ඇසුරු කළ පවිටු අදහස් ඇති ආශාවෙන් මඩනා ලද්දහුගේ පරාහට යම් පළමු කොට බිණීමෙක් මනා කොට බිණීමෙක් උසස් කොට බිණීමෙක් හාත්පසින් උසස් කොට බිණීමෙක් මතුමත්තෙහි බැඳීමෙක් හාත්පසින් මතුමත්තෙහි බැඳීමෙක් උස් කොට හැහැවීමෙක් හාත්පසින් උස් කොට හැහැවීමෙක් ප්‍රිය තෙපුල් බිණීමෙක් යටත් ව පවත්නා බවෙක් මුද්ගසූපය වැනි බවෙක් දරුවන් වඩන බවෙක් වේ ද, මේ ' ලපනා ' යි කියනු ලැබේ.

867. එහි නෙමිත්තිකතා කවර යත් : ලාභසත්කාරප්‍රශංසා ඇසුරු කළ පවිටු අදහස් ඇති ආශාවෙන් මඩනා ලද්දහුගේ මෙරමාහට යම් නිමිති කරන බවෙක් නිමිති කිරීමෙක් පහළ කිරීමෙක් පහළ කරන ක්‍රියාවෙක් සමීප කොට බිණීමෙක් පර්‍ය්‍යාය තෙපු ලෙක් වේ ද, මේ ' නෙමිත්තිකතා ' යි කියනු ලැබේ.

868. එහි නිප්පෙසිකතා කවර යත් : ලාභසත්කාරප්‍රශංසා ඇසුරු කළ පවිටු අදහස් ඇති ආශාවෙන් මඩනා ලද්දහුගේ මෙරමාහට යම් ආක්‍රොශ කිරීමෙක් පරිභව කිරීමෙක් ගර්හා කිරීමෙක් උස් කොට බිණීමෙක් හාත්පසින් උස් කොට බිණීමෙක් සිනහ කිරීමෙක් හාත්පසින් සිනහ කිරීමෙක් පැමිණවීමෙක් හාත්පසින් පැමිණවීමෙක් නුගුණ එළවන බවෙක් මෙරමාපිටුමස් කනසුලු බවෙක් වේ ද, මේ ' නිප්පෙසිකතා ' යි කියනු ලැබේ.

869. තත්ථ කතමා ලාභෙන ලාභං නිජිගිංසනතා: ලාභසක්කාරසිලොකසන්නිස්සිතො පාපිච්ඡො ඉච්ඡාපකතො ඉතො ලද්ධං ආමිසං අමුත්‍ර හරති, අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධ ආහරති, යා එවරූපා ආමිසෙන ආමිසස්ස එට්ඨි ගවෙට්ඨි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා, අයං වුච්චති ලාභෙන ලාභං නිජිගිංසනතා.

870. තත්ථ කතමො සෙය්‍යොහමස්මීති මානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා මානං ජප්පෙති, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස අයං වුච්චති සෙය්‍යොහමස්මීති මානො.

871. තත්ථ කතමො සදිසොහමස්මීති මානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා මානං ජප්පෙති, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති සදිසො'හමස්මීති මානො.

872. තත්ථ කතමො හීනොහමස්මීති මානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා ඔමානං ජප්පෙති, යො එවරූපො ඔමානො ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං හීළනා ඔහීළනා ඔහීළිතත්තං අත්තුඤ්ඤා අත්තවඤ්ඤා අත්තපරිභවො, අයං වුච්චති හීනො'හමස්මීති මානො.

873. තත්ථ කතමො සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො: ඉධෙකච්චො සෙය්‍යො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සෙය්‍යං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති සෙය්‍යස්ස සෙය්‍යො'හමස්මීති මානො.

874. තත්ථ කතමො සෙය්‍යස්ස සදිසො'හමස්මීති මානො: ඉධෙකච්චො සෙය්‍යො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සදිසං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති සෙය්‍යස්ස සදිසො'හමස්මීති මානො.

869. එහි ලාභයෙන් ලාභය සෙවීම කවරේ යත්: ලාභසත්කාරප්‍රශංසා ඇසුරු කෙළේ පවිටු අදහස් ඇතියේ ආශායෙන් මඩනා ලද්දාවූයේ මෙගෙන් ලද ආමිෂය එගෙට ගෙනයේ ද එගෙන් ලද ආමිෂය හෝ මෙගෙට ගෙන ඒ ද මෙබඳු වූ යම් ආමිෂයෙන් ආමිෂය කැමැති වීමෙක් සෙවීමෙක් නැවත නැවත සෙවීමෙක් එෂණයෙක් ගවෙෂණයෙක් පයෙෂණයෙක් වේ ද, මේ ' ලාභයෙන් ලාභය සෙවීම ' යි කියනු ලැබේ.

870. එහි මම උසස්මි යන මානය කවරේ යත්: මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍ර භාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් මානය කෙරෙයි. යම් මෙබඳු වූ මානයෙක් මානාකාරයෙක්, මානය කළ බවෙක් උන්නතියෙක් උස් කොට තැබීමෙක් මානධ්වජයෙක් සිත නඟාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මම උසස්මි යන මානය ' යි කියනු ලැබේ.

871. එහි මම සදෘශයෙමි යන මානය කවරේ යත්: මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍ර භාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යා වෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතරවස්තුවෙකින් මානය කෙරෙයි. යම් මෙබඳු වූ මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උසස් කොට තැබීමෙක් මානධ්වජයෙක් සිත නඟා ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතා යෙක් වේ ද, මේ ' මම සදෘශයෙමි යන මානය ' යි කියනු ලැබේ.

872. එහි මම හීනයෙමි යන මානය කවරේ යත්: මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතරවස්තුවෙකින් අවමානය කෙරෙයි. යම් මෙබඳු වූ හීනමානයෙක් අවමානාකාරයෙක් අවමන් කළ බවෙක් තමහට ගැරහීමෙක් අධික ව ගැරහීමෙක් ගැරහූ බවෙක් තමා හීන කොට සැලැකීමෙක් තමහට අවඥා කිරීමෙක් තමහට පරිභවයෙක් වේ ද, මේ ' මම හීනයෙමි මානය ' යි කියනු ලැබේ.

873. එහි මම ශ්‍රෙෂ්ඨයහට ශ්‍රෙෂ්ඨයෙමි යන මානය කවරේ යත්: මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්ය යෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතන යෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් ශ්‍රෙෂ්ඨ වේ ද, හෙතෙම පරහට වඩා තමා උසස් කොට තබයි, හේ එනිසා මානය කෙරෙයි. යම් මෙබඳු වූ මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නති යෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නඟාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතා යෙක් වේ ද, මේ ' මම ශ්‍රෙෂ්ඨයෙමි යන මානය ' යි කියනු ලැබේ.

874. එහි ' මම ශ්‍රෙෂ්ඨයහට සදෘශයෙමි යන මානය ' කවරේ යත්: මෙලොවැ ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්ය යෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතන යෙකින් හෝ විද්‍යායෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් ශ්‍රෙෂ්ඨ වේ ද, හෙතෙම තමා මෙරමා හා සදෘශ කෙරෙයි, හෙතෙම ඒනිසා මානය කෙරෙයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නති යෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නඟාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතා යෙක් වේ ද, මේ ' මම ශ්‍රෙෂ්ඨයහට සදෘශයෙමි යන මානය ' යි කියනු ලැබේ.

875. තත්ථ කතමො සෙය්‍යස්ස හීනො'හමස්මීති මානො: ඉධෙකච්චො සෙය්‍යො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි හීනං අත්තානං දහති. සො තං නිස්සාය ඔමානං ජප්පෙති. යො එවරූපො ඔමානො ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං හීලනා ඔහීලනා ඔහීලිතත්තං අත්තුඤ්ඤා අත්තවඤ්ඤා අත්තපරිභවො, අයං වුච්චති සෙය්‍යස්ස හීනො'හමස්මීති මානො.

876. තත්ථ කතමො සදිසස්ස සෙය්‍යො'හමස්මීති මානො: ඉධෙකච්චො සදිසො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සෙය්‍යං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති සදිසස්ස සෙය්‍යො'හමස්මීති මානො.

877. තත්ථ කතමො සදිසස්ස සදිසො'හමස්මීති මානො: ඉධෙකච්චො සදිසො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සදිසං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති සදිසස්ස සදිසො'හමස්මීති මානො.

878. තත්ථ කතමො සදිසස්ස'හීනොහමස්මීති මානො: ඉධෙකච්චො සදිසො හොති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි හීනං අත්තානං දහති. සො තං නිස්සාය ඔමානං ජප්පෙති. යො එවරූපො ඔමානො ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං හීලනා ඔහීලනා ඔහීලිතත්තං අත්තුඤ්ඤා අත්තවඤ්ඤා අත්තපරිභවො, අයං වුච්චති සදිසස්ස හීනො'හමස්මීති මානො.

879. තත්ථ කතමො හීනස්ස සෙය්‍යො'හමස්මීති මානො: ඉධෙකච්චො හීනො හොති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සෙය්‍යං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති හීනස්ස සෙය්‍යො'හමස්මීති මානො.

880. තත්ථ කතමො හීනස්ස සදිසො'හමස්මීති මානො: ඉධෙකච්චො හීනො හොති, ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි සදිසං අත්තානං දහති. සො තං නිස්සාය මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති හීනස්ස සදිසො'හමස්මීති මානො.

875. එහි ' මම ශ්‍රේෂ්ඨයහට හීනයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්ය යෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතන යෙකින් හෝ විද්‍යායෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් ශ්‍රේෂ්ඨ වේ ද, හෙතෙම මෙරමා කෙරෙන් තමා හීන කෙරෙයි, හෙතෙම එනිසා අවමානය කෙරෙයි. යම් මෙබඳු අවමානයෙක් අවමානාකාරයෙක් අවමන් කළ බවෙක් තමහට ගැරහීමෙක් අධික ව ගැරහීමෙක් ගැරහූ බවෙක් තමා හීන කොට සැලකී මෙක් තමහට අවඥ කිරීමෙක් තමහට පරිභවයෙක් වේ ද, මේ ' මම ශ්‍රේෂ්ඨයහට හීනයෙමි යන මානය ' යි කියනු ලැබේ.

876. එහි ' මම සදෘශයහට ශ්‍රේෂ්ඨයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ . . . අන්‍යතරාන්‍ය තරවස්තුයෙකින් සදෘශ වූයේ වේ ද, හෙතෙම මෙරමාහට වඩා තමා ශ්‍රේෂ්ඨ කෙරෙයි, හෙතෙම එනිසා මානය කෙරෙයි, යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මම සදෘශයහට ශ්‍රේෂ්ඨයෙමි යන මානය ' යි කියනු ලැබේ.

877. එහි ' මම සදෘශයහට සදෘශයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් සදෘශ වූයේ වේ ද, හෙතෙම මෙරමා හා තමා සදෘශ කෙරෙයි. හෙතෙම එනිසා මානය කෙරෙයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මම සදෘශයහට සදෘශයෙමි යන මානය ' යි කියනු ලැබේ.

878. එහි ' මම සදෘශයහට හීනයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් සදෘශ වූයේ වේ ද, හෙතෙම මෙරමාහට වඩා තමා හීන කෙරෙයි. හෙතෙම එනිසා තමහට අවමානය කෙරෙයි. යම් මෙබඳු අවමානයෙක් අවමානාකාරයෙක් අවමානය කළ බවෙක් ගැරහීමෙක් අයිමාත්‍ර ගැරහීමෙක් ගැරහූ බවෙක් තමා හීන කොට සැලකීමෙක් තමහට අවඥ කිරීමෙක් තමහට පරිභවයෙක් වේ ද, මේ ' මම සදෘශයහට හීනයෙමි යන මානය ' යි කියනු ලැබේ.

879. එහි ' මම හීනයහට ශ්‍රේෂ්ඨයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් හීන වූයේ වේ ද, හෙතෙම පරහට වඩා තමා ශ්‍රේෂ්ඨ කෙරෙයි. හෙතෙම එනිසා මානය කෙරෙයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මම හීනයහට ශ්‍රේෂ්ඨයෙමි යන මානය ' යි කියනු ලැබේ.

880. එහි ' මම හීනයනට සදෘශයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් හීන වූයේ වේ ද, හෙතෙම මෙරමා හා තමා සදෘශ කෙරෙයි. හෙතෙම එනිසා මානය කෙරෙයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතා යෙක් වේ ද, මේ ' මම හීනයහට සදෘශයෙමි යන මානය ' යි කියනු ලැබේ.

881. තත්ථ කතමො හීනස්ස හීනො'හමස්මීති මානො: ඉධෙකච්චො හීනො හොති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි හීනං අත්තානං දහති. සො තං නිස්සාය ඔමානං ජප්පෙති. යො එවරූපො ඔමානො ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං හීළනා ඔහීළනා ඔහීළිතත්තං අත්තුඤ්ඤා අත්තවඤ්ඤා අත්තපරිභවො, අයං වුච්චති හීනස්ස හීනො'හමස්මීති මානො.

882. තත්ථ කතමො මානො: යො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො.

883. තත්ථ කතමො අතිමානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පරෙහි අත්තානං අතිමඤ්ඤති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති අතිමානො.

884. තත්ථ කතමො මානාතිමානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පුබ්බකාලං පරෙහි සදිසං අත්තානං දහති. අපරකාලං අත්තානං සෙය්‍යං දහති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානාතිමානො.

885. තත්ථ කතමො ඔමානො: ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා ඔමානං ජප්පෙති. යො එවරූපො ඔමානො ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං හීළනා ඔහීළනා ඔහීළිතත්තං අත්තුඤ්ඤා අත්තවඤ්ඤා අත්තපරිභවො, අයං වුච්චති ඔමානො.

886. තත්ථ කතමො අධිමානො: අප්පත්තෙ පත්තසඤ්ඤිතා අකතෙ කතසඤ්ඤිතා අනධිගතෙ අධිගතසඤ්ඤිතා අසච්ඡිකතෙ සච්ඡිකතසඤ්ඤිතා, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති අධිමානො.

887. තත්ථ කතමො අස්මිමානො: රූපං අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයො, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයො. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති අස්මිමානො.

888. තත්ථ කතමො මිච්ඡාමානො: ඉධෙකච්චො පාපකෙන වා කම්මායතනෙන පාපකෙන වා සිප්පායතනෙන පාපකෙන වා විජ්ජාට්ඨානෙන පාපකෙන වා සුතෙන පාපකෙන වා පටිභානෙන පාපකෙන වා සීලෙන පාපකෙන වා වතෙන පාපකෙන වා සීලබ්බතෙන පාපකෙන වා පාපිකාය වා දිට්ඨියා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා මානං ජප්පෙති. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මිච්ඡාමානො.

881. එහි ' මම හීනයහට හීනයෙමි ' යන මානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් හීන වූයේ වේ ද, හෙතෙම මෙරමා කෙරෙන් තමා හීන කෙරෙයි. හෙතෙම එනිසා අවමානය කෙරෙයි. යම් මෙබඳු අවමානයෙක් අවමානාකාරයෙක් අවමානය කළ බවෙක් ගැරහීමෙක් අධිමාත්‍ර ගැරහීමෙක් ගර්හිත බවෙක් තමා පහත් කොට සැලකීමෙක් තමහට අවඥ කිරීමෙක් තමහට පරිභවයෙක් වේ ද, මේ ' මම හීනයහට හීනයෙමි යන මානය ' යි කියනු ලැබේ.

882. එහි මානය කවරෙ යත් : යම් මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නභාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මානය ' යි කියනු ලැබේ.

883. එහි අතිමානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් මෙරමාහට වඩා තමා උසස් කොට සිතයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' අතිමානය ' යි කියනු ලැබේ.

884. එහි මානාතිමානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ . . . අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් පූර්වකාලයෙහි මෙරමා හා සදෘශ කොට තමා තබයි. අපරකාලයෙහි තමා ශ්‍රෙෂ්ඨ කොට තබයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් . . . චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මානාතිමානය ' යි කියනු ලැබේ.

885. එහි ඔමානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්‍ය්‍යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යායෙකින් හෝ ශ්‍රුතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් තමහට අවමානය කෙරෙයි. යම් මෙබඳු අවමානයෙක් අවමානාකාරයෙක් අවමානය කළ බවෙක් ගැරහීමෙක් අධිමාත්‍ර ගැරහීමෙක් ගැරහූ බවෙක් තමා හීන කොට සැලකීමෙක් තමහට අවඥ කිරීමෙක් තමහට පරිභව කිරීමෙක් වේ ද, මේ ' ඔමානය ' යි කියනු ලැබේ.

886. එහි අධිමානය කවරෙ යත් : නො පැමිණියෙ (සිව්සස්) හි පැමිණි සංඥ ඇති බව ය, නො කළ (මාර්ග) කෘත්‍යයෙහි කළ සංඥ ඇති බව ය, අවබොධ නො කළ (සිව්සස්) දහම්හි අවබොධ කළ සංඥ ඇති බව ය, ප්‍රත්‍යක්ෂ නො කළ දෑයෙහි ප්‍රත්‍යක්ෂ කරන ලදැයි සංඥ ඇති බව යි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නභාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' අධිමානය ' යි කියනු ලැබේ.

887. එහි අස්මිමානය කවරෙ යත් : රූපයෙමි මාන ය, රූපයෙමි ඡන්ද ය, රූපයෙමි අනුශය ය, වෙදනායෙමි . . . සංඥයෙමි . . . සංස්කාරයෙමි . . . විඥනයෙමි මාන ය, විඥනයෙමි ඡන්ද ය, විඥනයෙමි අනුශය යි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නභාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' අස්මිමානය ' යි කියනු ලැබේ.

888. එහි මිථ්‍යාමානය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ලාමක වූ කර්මායතනයෙකින් හෝ ලාමක වූ ශිල්පායතනයෙකින් හෝ ලාමක වූ විද්‍යායෙකින් හෝ ලාමක වූ ශ්‍රැතයෙන් හෝ ලාමක වූ ප්‍රතිභානයෙන් හෝ ලාමක වූ ශීලයෙන් හෝ ලාමක වූ ව්‍රතයෙන් හෝ ලාමක වූ ශීලව්‍රතයෙන් හෝ ලාමක වූ දෘෂ්ටියෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් මානය කෙරෙයි. යම් මෙබඳු මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් උන්නාමයෙක් මානද්ධවජයෙක් සිත නභාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ ද, මේ ' මිථ්‍යාමානය ' යි කියනු ලැබේ.



Free Distribution www.aathaapi.org

889. තත්ථ කතමෝ ඤාතිවිතක්කෝ: ඤාතකේ ආරබ්භ ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසඞ්කප්පෝ, අයං වුච්චති ඤාතිවිතක්කෝ.

890. තත්ථ කතමෝ ජනපදවිතක්කෝ: ජනපදං ආරබ්භ ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසඞ්කප්පෝ, අයං වුච්චති ජනපදවිතක්කෝ.

891. තත්ථ කතමෝ අමරවිතක්කෝ: දුක්කරකාරිතා පටිසංයුත්තෝ වා දිට්ඨිගතපටිසංයුත්තෝ වා ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසඞ්කප්පෝ, අයං වුච්චති අමරවිතක්කෝ.

892. තත්ථ කතමෝ පරානුද්දයතාපටිසංයුත්තෝ විතක්කෝ: ඉධේකච්චෝ ගිහීසංසට්ඨෝ විහරති සහනන්දී සහසෝකී සුඛිතේසු සුඛිතෝ දුක්ඛිතේසු දුක්ඛිතෝ උප්පන්නේසු කිච්චකරණීයේසු අත්තනා වා යෝගං ආපජ්ජති. යෝ තත්ථ ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසඞ්කප්පෝ, අයං වුච්චති පරානුද්දයතාපටිසංයුත්තෝ විතක්කෝ.

893. තත්ථ කතමෝ ලාභසක්කාරසිලෝකපටිසංයුත්තෝ විතක්කෝ: ලාභසක්කාරසිලෝකං ආරබ්භ ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසංකප්පෝ, අයං වුච්චති ලාභසක්කාරසිලෝකපටිසංයුත්තෝ විතක්කෝ.

894. තත්ථ කතමෝ අනවඤ්ඤත්තිපටිසංයුත්තෝ විතක්කෝ: ඉධේකච්චෝ ජාතියා වා ගෝත්තේන වා කෝලපුත්තියේන වා වණ්ණපෝක්ඛරතාය වා ධනේන වා අජ්ඣේනේන වා කම්මායතනේන වා සිප්පායතනේන වා විජ්ජාට්ඨානේන වා සුතේන වා පටිභානේන වා අඤ්ඤතරඤ්ඤතරේන වත්ථුනා 'මා මං පරේ' අවජානිංසූ[1]ති. යෝ තත්ථ ගේහසිතෝ තක්කෝ විතක්කෝ මිච්ඡාසඞ්කප්පෝ, අයං වුච්චති අනවඤ්ඤත්තිපටිසංයුත්තෝ විතක්කෝ.

එකකං.

---

895. තත්ථ කතමෝ කෝධෝ: යෝ කෝධෝ කුජ්ඣනා කුජ්ඣිතත්තං දෝසෝ දුස්සනා දුස්සිතත්තං,[2] ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං, විරෝධෝ පටිවිරෝධෝ චණ්ඩික්කං අසුරෝපෝ[3] අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති කෝධෝ.

තත්ථ කතමෝ උපනාහෝ: පුබ්බකාලං[4] කෝධෝ අපරකාලං[5] උපනාහෝ. යෝ ඒවරූපෝ උපනාහෝ උපනය්හනා උපනය්හිතත්තං, ආඨපනා, ඨපනා සණ්ඨපනා අනුසංසන්දනා අනුප්පබන්ධනා දළ්හීකම්මං කෝධස්ස, අයං වුච්චති උපනාහෝ.

---

1. වත්ථුනා, මං - සිරිමු.
2. දූසනා දූසිතත්තං - ස්‍යා.
3. අස්සුරෝපෝ - සිරිමු.
4. පුබ්බකාලේ - සීපැවි.
5. අපරකාලේ - සීපැවි.

Free Distribution www.aathaapi.org

889. එහි ඥාතිවිතර්කය කවරෙ යත්: ඥාතීන් ඇරැබ ගෘහ (පඤ්චකාමගුණ) ශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' ඥාතිවිතර්කය ' යි කියනු ලැබේ.

890. එහි ජනපදවිතර්කය කවරෙ යත්: ජනපදය නිසා ගෘහශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' ජනපදවිතර්කය ' යි කියනු ලැබේ.

891. එහි අමරවිතර්කය කවරෙ යත්: දුෂ්කරක්‍රියාප්‍රතිසංයුක්ත වූ හෝ දෘෂ්ටිප්‍රතිසංයුක්ත වූ හෝ ගෘහශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' අමරවිතර්කය ' යි කියනු ලැබේ.

892. එහි පරානුකම්පාප්‍රතිසංයුක්ත වූ විතර්කය කවරෙ යත්: මෙලොව ඇතැමෙක් ගිහීන් හා සංසෘෂ්ට වූයේ එක්ව සතුටු වූයේ එක්ව ශොකී වූයේ සුඛිත කල්හි (තෙමේ) සුඛිත වැ දුඃඛිත කල්හි දුඃඛිත වැ වෙසෙයි. උපන් කටයුතු ඇති කල්හි තෙමේ හෝ යෙදෙයි. එහි යම් ගෘහශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' පරානුකම්පාප්‍රතිසංයුක්තවිතර්කය ' යි කියනු ලැබේ.

893. එහි ලාභසත්කාරප්‍රශංසාප්‍රතිසංයුක්තවිතර්කය කවරෙ යත්: ලාභසත්කාර ප්‍රශංසා නිසා ගෘහශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' ලාභ සත්කාරප්‍රශංසාප්‍රතිසංයුක්තවිතර්කය යි කියනු ලැබේ.

894. එහි අනවඥප්‍රතිසංයුක්තවිතර්කය කවරෙ යත්: මෙලොව ඇතැමෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යායෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතරවස්තුයෙකින් අන්‍යයෝ මට නහමක් අවමන් කෙරෙත්ව ' යි එහි යම් ගෘහශ්‍රිත තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' අනවඥප්‍රතිසංයුක්තවිතර්කය ' යි කියනු ලැබේ.

එකක යි.

---

895. එහි ක්‍රොධය කවරෙ යත්: යම් ක්‍රොධයෙක් ක්‍රොධ අයුරෙක් ක්‍රොධ කළ බවෙක් දෙෂයෙක් දූෂා අයුරෙක් දූෂිත බවෙක් ප්‍රකෘතිභාවය හැරීමෙක් ව්‍යාපාදකාරයෙක් ව්‍යාපාදිත බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් අපරිපූර්ණවචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ' ක්‍රොධය ' යි කියනු ලැබේ.

එහි උපනාහය කවරෙ යත්: පූර්වකාලය ක්‍රොධය වෙයි. අපරකාල උපනාහය වේ. යම් මෙබඳු උපනාහ (බද්ධවෛර)යෙක් බද්වෛර ඇති අයුරෙක් බද්වෛර ඇති බවෙක් (ක්‍රොධය) ආදියෙහි තැබීමෙක් පියවීත් තැබීමෙක් පුනපුනා තැබීමෙක් අනුසන්ධානයෙක් අනුප්‍රබන්ධයෙක් (ගැළපීමෙක්) ක්‍රොධය දැඩි කිරීමෙක් වේ ද, මේ ' උපනාහය ' යි කියනු ලැබේ.

896. තත්ථ කතමො මක්ඛො : යො මක්ඛො මක්ඛියනා[1] මක්ඛීයිතත්තං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං, අයං වුච්චති මක්ඛො.

තත්ථ කතමො පළාසො : යො පළාසො පළාසායනා පළාසාහාරො විවාදට්ඨානං යුගග්ගාහො අප්පටිනිස්සග්ගො, අයං වුච්චති පළාසො.

897. තත්ථ කතමා ඉස්සා : යා පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං, උසූයා උසූයනා උසූයිතත්තං, අයං වුච්චති ඉස්සා.

තත්ථ කතමං මච්ඡරියං : පඤ්ච මච්ඡරියානි : ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡෙරං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.

898. තත්ථ කතමා මායා : ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති, මා මං ජඤ්ඤාති ඉච්ඡති, මා මං ජඤ්ඤාති සංකප්පෙති, මා මං ජඤ්ඤාති වාචං භාසති, මා මං ජඤ්ඤාති කායෙන පරක්කමති, යා එවරූපා මායා මායාවිතා අච්චාසරා[2] වඤ්චනා නිකති විකිරණා පරිහරණා ගූහනා පරිගූහනා ඡාදනා පටිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා.

තත්ථ කතමං සාඨෙය්‍යං : ඉධෙකච්චො සඨො හොති පරිසඨො. යං තත්ථ සඨං සඨතා සාඨෙය්‍යං කක්ඛළතා කක්ඛළියං[3] පරික්ඛත්තතා පාරික්ඛත්තියං, ඉදං වුච්චති සාඨෙය්‍යං.

899. තත්ථ කතමා අවිජ්ජා : යං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජා.

තත්ථ කතමා භවතණ්හා : යො භවෙසු භවච්ඡන්දො භවරාගො භවනන්දී භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං, අයං වුච්චති භවතණ්හා.

900. තත්ථ කතමා භවදිට්ඨි : භවිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසගාහො[4] අයං වුච්චති භවදිට්ඨි.

තත්ථ කතමා විභවදිට්ඨි : න භවිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසගාහො, අයං වුච්චති විභවදිට්ඨි.

901. තත්ථ කතමා සස්සතදිට්ඨි : සස්සතො අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසගාහො, අයං වුච්චති සස්සතදිට්ඨි.

---

1. මක්ඛියනා - සිරිමු - ස්‍යා. මක්ඛායනා - මජසං.
2. අච්චසරා - සීපෑව.
3. කක්කරතා කක්කරියං - සිරිමු, මජසං.
   කක්ඛරතා, කක්ඛරියං - අට්ඨකථා
4. විපරියාසග්ගාහො - මජසං.

896. එහි මක්ඛය කවරෙ යත් : යම් පරගුණ මැකීමෙක් ගුණ මකන අයුරෙක් ගුණමැකූ බවෙක් රළුවදන් ඇති බවෙක් රළුකමෙක් වේ ද, මේ ' මක්ඛය ' යි කියනු ලැබේ.

එහි පළාසය කවරෙ යත් : යම් යුගග්‍රාහයෙක් යුගග්‍රාහ අයුරෙක් (ජයාහරණයෙන්) පළාසාහාරයෙක් විවාදකාරණයෙක් සමධුර ගැන්මෙක් නො හැරීමෙක් වේ ද, මේ ' පළාසය ' යි කියනු ලැබේ.

897. එහි ඊර්ෂ්‍යා කවර යත් : මෙරමා පිළිබඳ ලාභසත්කාරගරුකාරමානනවන්දන පූජාවන් කෙරෙහි යම් ඊර්ෂ්‍යායෙක් ඊර්ෂ්‍යා අයුරෙක් ඊර්ෂ්‍යා කළ බවෙක් දෙස් පහළ කිරීමෙක් දෙස් පහළ කරන අයුරෙක් දෙස් පහළ කළ බවෙක් වේ ද, මේ ' ඊර්ෂ්‍යා ' යි කියනු ලැබේ.

එහි මාත්සර්‍ය්‍ය කවරෙ යත් : මාත්සර්‍ය්‍ය පසෙකි : ආවාසමාත්සර්‍ය්‍ය ය, කුල මාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්මමාත්සර්‍ය්‍ය යි. යම් මෙබඳු මාත්සර්‍ය්‍යයෙක් මසුරු අයුරෙක් මසුරු කළ බවෙක් (ස්වකීය සම්පත්තීන්) ව්‍යාප්ත කරනු කැමැති බවෙක් තදමසුරු බවෙක් කටුකභාවයෙක් හැකුළුණුසිත් ඇති බවෙක් සිත නො විදහාගත් බවෙක් වේ ද, මේ ' මාත්සර්‍ය්‍ය ' යි කියනු ලැබේ.

898. එහි මායා කවර යත් : මෙලොව ඇතැමෙක් කයින් දුසිරිත් කොට වචන යෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට එය පිළිසන් කරනු පිණිස ලාමක වූ ඉච්ඡාවක් පිහිටුවයි, මා නො දනිවයි කැමැති වෙයි. මා නො දනිවයි කල්පනය කෙරෙයි, මා නො දනිවයි වචන කියයි, මා නො දනිවයි කයින් ව්‍යායාම කෙරෙයි. යම් මෙබඳු මායා යෙක් මායාවී බවෙක් ඉක්ම පැවැත්මෙක් වඤ්චනයෙක් නිකෘතියෙක් විකිරණයෙක් බැහැර කිරීමෙක් සැඟැවීමෙක් හාත්පසින් සැඟැවීමෙක් වැසීමෙක් හාත්පසින් වැසීමෙක් නො පහළ කිරීමෙක් නො හෙළි කිරීමෙක් පාපක්‍රියාව මොනොවට වැසීමෙක් වේ ද, මේ ' මායා ' යි කියනු ලැබේ.

එහි සාඨෙය්‍ය කවරෙ යත් : මෙලොව ඇතැමෙක් කෛරාටිකයෙක් හාත්පසින් කෛරාටිකයෙක් වෙයි. එහි යම් කෛරාටිකගුණයෙක් කෛරාටික අයුරෙක් කෛරාටික බවෙක් කර්කශතායෙක් කැකුළු බවෙක් (කැනසිටුවූ සෙයින්) දැඩිකෛරාටික බවෙක් පරික්ඛත්ත බවෙක් වේ ද, මේ ' සාඨෙය්‍ය ' යි කියනු ලැබේ.

899. එහි අවිද්‍යා කවර යත් : යම් අඥනයෙක් නො දැක්මෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහසඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අවිද්‍යා ' යි කියනු ලැබේ.

එහි භවතෘෂ්ණා කවර යත් : භවයන්හි යම් භවච්ඡන්දයෙක් භවරාගයෙක් භවනන්දි යෙක් භවතෘෂ්ණායෙක් භවස්නෙහයෙක් භවපරිදහයෙක් භවමූර්ඡායෙක් භවය ගිල ගැනීමෙක් වේ ද, මේ ' භවතෘෂ්ණා ' යි කියනු ලැබේ.

900. එහි භවදෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් වන්නේ යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් (වරදවාගැනීමෙක්) වේ ද, මේ ' භව දෘෂ්ටි ' යයි කියනු ලැබේ.

එහි විභවදෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් නො වන්නේ යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' විභවදෘෂ්ටි ' යයි කියනු ලැබේ.

901. එහි ශාශ්වතදෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් ශාශ්වත යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' ශාශ්වතදෘෂ්ටි ' යයි කියනු ලැබේ.

තත්ථ කතමා උච්ඡේදදිට්ඨි : උච්ඡිජ්ජිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති උච්ඡේදදිට්ඨි.

902. තත්ථ කතමා අන්තවාදිට්ඨි : අන්තවා අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අන්තවාදිට්ඨි.

තත්ථ කතමා අනන්තවාදිට්ඨි : අනන්තවා අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අනන්තවාදිට්ඨි.

903. තත්ථ කතමා පුබ්බන්තානුදිට්ඨි : පුබ්බන්තං ආරබ්භ යා උප්පජ්ජති දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති පුබ්බන්තානුදිට්ඨි.

තත්ථ කතමා අපරන්තානුදිට්ඨි : අපරන්තං ආරබ්භ යා උප්පජ්ජති දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අපරන්තානුදිට්ඨි.

904. තත්ථ කතමං අහිරිකං : යං න හිරීයති හිරීයිතබ්බෙන න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අහිරිකං.

තත්ථ කතමං අනොත්තප්පං : යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අනොත්තප්පං.

905. තත්ථ කතමා දොවචස්සතා : සහධම්මිකෙ වුච්චමානෙ දොවචස්සතා දොවචස්සායං දොවචස්සියං දොවචස්සතා විප්පටිකූලගාහිතා විපච්චනිකසාතතා අනාදරියං අනාදරතා අගාරවතා අප්පතිස්සවතා, අයං වුච්චති දොවචස්සතා.

තත්ථ කතමා පාපමිත්තතා : යෙ තෙ පුග්ගලා අස්සද්ධා දුස්සීලා අප්පස්සුතා මච්ඡරිනො දුප්පඤ්ඤා යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සංභජනා භත්ති සම්භත්ති සම්පවඞ්කතා, අයං වුච්චති පාපමිත්තතා.

906. තත්ථ කතමො අනජ්ජවො : යො අනජ්ජවො අනජ්ජවතා ජිම්හතා වඞ්කතා කුටිලතා, අයං වුච්චති අනජ්ජවො.

තත්ථ කතමො අමද්දවො : යා අමුදුතා අමද්දවතා කක්ඛළියං ඵාරුසියං කක්ඛළතා කඨිනතා උජුචිත්තතා අමුදුතා, අයං වුච්චති අමද්දවො.

907. තත්ථ කතමා අක්ඛන්ති : යා අක්ඛන්ති අක්ඛමනතා අනධිවාසනතා චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති අක්ඛන්ති.

තත්ථ කතමං අසොරච්චං : කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො, ඉදං වුච්චති අසොරච්චං, සබ්බම්පි දුස්සීල්‍යං අසොරච්චං.

Free Distribution www.aathaapi.org

එහි උච්ඡේදදෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් උච්ඡේද වන්නේ යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' උච්ඡේදදෘෂ්ටි ' යි කියනු ලැබේ.

902. එහි අන්තවද්දෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් අන්ත ඇත්තේ යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' අන්ත වද්දෘෂ්ටි ' යි කියනු ලැබේ.

එහි අනන්තවද්දෘෂ්ටි කවර යත් : ආත්මයත් ලොකයත් අන්ත නැත්තේ යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' අනන්තවද්දෘෂ්ටි ' යි කියනු ලැබේ.

903. එහි පූර්වාන්තානුදෘෂ්ටි කවර යත් : පූර්වාන්තය නිසා යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගත යෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් උපදී ද, මේ ' පූර්වාන්තානුදෘෂ්ටි ' යි කියනු ලැබේ.

එහි අපරාන්තානුදෘෂ්ටි කවර යත් : අපරාන්තය නිසා යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගත යෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් උපදී ද, මේ ' අපරාන්තානුදෘෂ්ටි ' යි කියනු ලැබේ.

904. එහි අපත්‍රපා කවර යත් : යමෙකින් ජුගුප්සා කළයුත්ත ජුගුප්සා නො කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ගේ සමාපත්තිය ජුගුප්සා නො කෙරේ ද, මේ ' අපත්‍රපා ' යි කියනු ලැබේ.

එහි අනොත්තප්ප කවරෙ යත් : යමෙකින් බියවිය (තැවිය) යුත්තට බිය නො වේ ද, ලාමක අකුශලධර්මයන්ගේ සමාපත්තියට බිය නො වේ ද, මේ ' අනොත්තප්ප ' යි කියනු ලැබේ.

905. එහි දුර්වචස්ක බව කවරෙ යත් : ප්‍රඥප්තශික්ෂාපදය කියනු ලබන කල්හි දුර්වචස්ක බවෙක් දුර්වචස්ක කමෙක් දුර්වචස්කකර්ම ඇති බවෙක් දුර්වචස්කතායෙක් විරුද්ධග්‍රාහයෙක් ප්‍රතිලොමග්‍රාහයෙහි මධුර බවෙක් අනාදර බවෙක් අනාදර අයුරෙක් අගෞරව බවෙක් නිඃශ්‍රය රහිත බවෙක් වේ ද, මේ ' දුර්වචස්ක බව ' යි කියනු ලැබේ.

එහි පාපමිත්‍රතා කවර යත් : යම් ඒ පුද්ගල කෙනෙක් අශ්‍රාද්ධ ද දුශ්ශීල ද අල්පශ්‍රැත ද මාත්සර්‍ය්‍ය ඇත්තාහු ද දුෂ්ප්‍රාඥ ද, ඔවුන්ගේ යම් සෙවනයෙක් බලවත් සෙවනයෙක් හාත්පසින් සෙවනයෙක් භජනයෙක් සම්භජනයෙක් භක්තියෙක් සම්භක්තියෙක් ඔවුන් කෙරෙහි නම්‍රත්වයෙක් වේ ද, මේ ' පාපමිත්‍රතා ' යි කියනු ලැබේ.

906. එහි අනාර්ජව කවරෙ යත් : යම් අනාර්ජව (වඞ්කතා) අයුරෙක් අනාර්ජව බවෙක් ජිම්හතායෙක් වඞ්ක බවෙක් කුටිල බවෙක් වේ ද, මේ ' අනාර්ජව ' යි කියනු ලැබේ.

එහි අමාර්දව කවරෙ යත් : යම් නො මුදු බවෙක් අමාර්දවාකාරයෙක් කර්කශ බවෙක් පරුෂ බවෙක් කර්කශ අයුරෙක් කඨින බවෙක් අමෘදුතාසඞ්ඛ්‍යාත ඍජු සිත් ඇති බවෙක් වේ ද, මේ ' අමාර්දව ' යි කියනු ලැබේ.

907. එහි අක්ෂාන්ති කවර යත් : යම් නො ඉවසීමෙක් නො ඉවසන අයුරෙක් අනධිවාසනතායෙක් සැඩ බවෙක් නො පිරිපුන් වදන් ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද මේ ' අක්ෂාන්ති ' යි කියනු ලැබේ.

එහි අසොරච්චය කවරෙ යත් : කායික වූ ව්‍යතික්‍රම (දුශ්චරිත) ය, වාචසික වූ ව්‍යති ක්‍රම ය, කායිකවාචසික වූ ව්‍යතික්‍රම යි. මේ ' අසොරච්ච ' යි කියනු ලැබේ. හැම දුසිල් බව අසොරච්ච යි.

908. තත්ථ කතමං අසාබල්‍යං; යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධි සංවත්තනිකා තථා රූපිං වාචං භාසිතා හොති. යා තත්ථ අසණ්හවාචතා අසඛිලවාචතා ඵරුසවාචතා, ඉදං වුච්චති අසාබල්‍යං

තත්ථ කතමො අප්පටිසන්ථාරො : ද්වෙ පටිසන්ථාරා ආමිසපටිසන්ථාරො ච ධම්මපටිසන්ථාරො ච ඉධෙකච්චො අප්පටිසන්ථාරකො හොති ආමිසපටිසන්ථාරෙන වා ධම්මපටිසන්ථාරෙන වා, අයං වුච්චති අප්පටිසන්ථාරො.

909. තත්ථ කතමා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා : ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති න රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං අගුත්ති අගොපනා අනාරක්ඛො අසංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා.

තත්ථ කතමා භොජනෙ අමත්තඤ්ඤුතා : ඉධෙකච්චො අප්පටිසඞ්ඛා අයොනිසො ආහාරං ආහාරෙති, දවාය මදාය මණ්ඩනාය විභූසනාය. යා තත්ථ අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා අප්පටිසඞ්ඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ අමත්තඤ්ඤුතා.

910. තත්ථ කතමං මුට්ඨස්සච්චං : යා අසති අනනුස්සති අප්පටිස්සති අසරණතා අධාරණතා පිලාපනතා සම්මුස්සනතා,[1] ඉදං වුච්චති මුට්ඨස්සච්චං.

තත්ථ කතමං අසම්පජඤ්ඤං : යං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, ඉදං වුච්චති අසම්පජඤ්ඤං.

911. තත්ථ කතමා සීලවිපත්ති : යො කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො, අයං වුච්චති සීලවිපත්ති. සබ්බම්පි දුස්සීල්‍යං සීලවිපත්ති.

තත්ථ කතමා දිට්ඨිවිපත්ති : නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨිවිපත්ති සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති

912. තත්ථ කතමං අජ්ඣත්තසංයොජනං : පඤ්චොරම්භාගියානි සංයොජනානි අජ්ඣත්තසංයොජනං. පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි බහිද්ධාසංයොජනං.

දුකං.

1. පම්මොස්සනතා - සීපෑවි.

Free Distribution www.aathaapi.org

908. එහි අසාබල්‍ය කවරෙ යත්: යම් ඒ වචනයෙක් (සඳෙස් බැවින්) ගඩු ඇත්තේ ද, කර්කශ (කුණු) වූයේ ද, මෙරමාහට කටුක වේ ද, මෙරමා ලගනේ ද ක්‍රොධයට ආසන්න වූයේ ද, සමාධිහුගේ නො පැවැත්ම කරන්නේ ද, එබඳු වචනය කියන්නේ වෙයි. එහි යම් නො මටවදන් බවෙක් නො මොළොක්වදන් බවෙක් රළුවදන් බවෙක් වේ ද, මේ ' අසාබල්‍ය ' යි කියනු ලැබේ.

එහි අප්‍රතිසන්ථාර කවරෙ යත්: ප්‍රතිසන්ථාර දෙකෙකි: ආමිෂප්‍රතිසන්ථාර (ආමිෂයෙන් ඇතිරීම) හා ධර්මප්‍රතිසන්ථාර යි. මෙලොව ඇතැමෙක් ආමිෂප්‍රතිසන්ථාරයෙන් හෝ ධර්මප්‍රතිසන්ථාරයෙන් හෝ නො අතුරන්නේ වෙයි. මේ ' අප්‍රතිසන්ථාර ' යි කියනු ලැබේ.

909. එහි ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා කවර යත්: මෙලොව ඇතැමෙක් ඇසින් (චක්ෂුර්විඥනයෙන්) රූපයක් දැක නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත ව වාසය කරන්නා වූ මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමකඅකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි. චක්ෂුරින්ද්‍රිය නො රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් අසා . . . දිවින් රසයක් විඳ . . . කයින් පහසක් පැහැස . . . මනසින් දහමක් දැන නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත ව වාස කරන්නා වූ මොහු අභිධ්‍යාදෞර්මනස්‍යසඞ්ඛ්‍යාත ලාමකඅකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි, මනින්ද්‍රිය නො රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. මේ ෂඩින්ද්‍රියයන්ගේ යම් නො රැක්මෙක් නො රක්නා අයුරෙක් අනාරක්ෂායෙක් අසංවරයෙක් වේ ද, මේ ' ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා ' යි කියනු ලැබේ.

එහි භොජනයෙහි අමාත්‍රඥතා කවර යත්: මෙලොව ඇතැමෙක් ප්‍රත්‍යවෙක්ෂා නො කොට අනුපායයෙන් කෙළි පිණිස මද පිණිස සැරසීම පිණිස විභූෂණය පිණිස අහර වළඳයි. ඒ නුනුවණින් අහරවැළඳීමෙහි යම් අසන්තුෂ්ටි බවෙක් පමණ නො දන්නා බවෙක් වේ ද, මේ ' භොජනයෙහි අමාත්‍රඥතා ' යි කියනු ලැබේ.

910. එහි මුඪස්මෘති බව කවරෙ යත්: යම් නො සිහියක් අනනුස්මෘතියෙක් අප්‍රතිස්මෘතියෙක් නො සිහි කරන අයුරෙක් නො දරන බවෙක් අරමුණෙහි ඉපිලෙන බවෙක් නටසිහි ඇති බවෙක් වේ ද, මේ ' මුඪස්මෘති බව ' යයි කියනු ලැබේ.

එහි අසම්ප්‍රජන්‍ය කවරෙ යත්: යම් නො දැන්මෙක් නො දැක්මෙක් . . . අවිද්‍යා පරිසයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අසම්ප්‍රජන්‍ය ' යි කියනු ලැබේ.

911. එහි ශීලවිපත් කවර යත්: යම් කායිකව්‍යතික්‍රමයෙක් (දුශ්චරිතයෙක්) වාචසිකව්‍යතික්‍රමයෙක් කායිකවාචසිකව්‍යතික්‍රමයෙක් වේ ද, මේ ' ශීලවිපත් ' යයි කියනු ලැබේ. හැම දුසිල් බව ශීලවිපත් වේ.

එහි දෘෂ්ටිවිපත් කවර යත්: දුන් දැයෙහි විපාක නැත, යාගයෙහි විපාක නැත . . . යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් ඔහු නැතැයි යම් මෙබඳු දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' දෘෂ්ටිවිපත ' යි කියනු ලැබේ. හැම මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපති.

912. එහි අධ්‍යාත්මසංයොජන කවරෙ යත්: ඔරම්භාගියසංයොජන පස අධ්‍යාත්ම සංයොජන ය, උද්ධම්භාගියසංයොජන පස වාහ්‍යසංයොජන යි.

ද්වික යි.

---

913. තත්ථ කතමානි තීණි අකුසලමූලානි : ලොභො දොසො මොහො.

තත්ථ කතමො ලොභො : යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දී[1] නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පරිගෙධො සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා[2] සඤ්ජනනී සිබ්බනී[3] ජාලිනී සරිතා විසත්තිකා සුත්තං[4] විසටා[5] ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සෙනහො[6] අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා[7] සාදුකම්‍යතා[8] අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සංපත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබලිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං වුච්චති ලොභො.

තත්ථ කතමො දොසො : අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි අනත්ථං චරති අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි අත්ථං චරති අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති, යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[9] අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති දොසො.

තත්ථ කතමො මොහො : දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං. යං එවරූපං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති මොහො. ඉමානි තීණි අකුසලමූලානි.

---

1 නන්දී – මජසං.
2. ජනියා – සිරිමු, සීපැවි.
3. සිබ්බිනි – සිරිමු, ස්‍යා, මජසං.
4. සොත්තං – සිරිමු, මජසං.
5. විසදා – සිරිමු.
6. සිනෙහො – මජසං, ස්‍යා.
7. පුච්ඡඤ්ජිකතා – සිරිමු, මජසං.
පුඤ්ජිකතා – සීපැවි, ස්‍යා.
8. සාධුකම්‍යතා – සිරිමු, ස්‍යා, මජසං.
9. අස්සුරොපො – සිරිමු.

913. එහි තුන් අකුශලමූලයෝ කවරහ යත් : ලොභ ය ද්වෙෂ ය මොහ යි.

එහි ලොභය කවරේ යත් : යම් රාගයෙක් බලවත් රාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් (කැමැත්තෙක්) නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් ඉච්ඡායෙක් මූර්ඡායෙක් ගිලගැනීමෙක් ගිජුබවෙක් බලවත් ගිජුබවෙක් රාගසඞ්ගයෙක් පඞ්කයෙක් (අදනා හෙයින්) එජායෙක් මායායෙක් (ජනනාර්ථයෙන්) ජනිකායෙක් සඤ්ජනනියක් (හිවනාර්ථයෙන්) සිබ්බනියක්, ජාලිනියක් සරිතාවක් විසත්තිකායෙක් සූත්‍රයෙක් (විස්තෘත බැවින්) විසටායෙක් ආයූහනියක් (රැස්කරනුවක්) ද්විතීයිකාවක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් වන (බලවත්තෘෂ්ණා)යෙක් වනථයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශිංසනයෙක් ආශිංසිත බවෙක් රූපාශායෙක් ශබ්දශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්ප්‍රෂ්ටව්‍යාශායෙක් ලාභාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් ජල්පයෙක් අභිජල්පයෙක් ජල්පන අයුරෙක් ජල්පිත බවෙක් පුනපුනා අරමුණු අදනා බවෙක් පුනපුනා අරමුණු අදනා අයුරෙක් පුනපුනා අරමුණු ඇදගත් බවෙක් නඟුටසලන බවෙක් මිහිරිකැමැති බවෙක් අධර්මරාගයෙක් විෂමලොභයෙක් කැමැත්තෙක් කැමැති අයුරෙක් ප්‍රාර්ථනායෙක් අභිලාෂයෙක් මොනොවට ප්‍රාර්ථනායෙක් කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභව තෘෂ්ණායෙක් රූපභවයෙහි තෘෂ්ණායෙක් අරූපභවයෙහි තෘෂ්ණායෙක් නිරොධ (උච්ඡෙද දෘෂ්ටි) යෙහි තෘෂ්ණායෙක් ශබ්දයෙහි තෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක් ඔඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදනයෙක් ආවරණයෙක් නීවරණයෙක් ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලෙශයෙක් අනුසයෙක් පර්යුත්ථානයෙක් තෘෂ්ණාලතායෙක් විවිධෙප්සායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදනයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබිලියෙක් මාරවිෂයයෙක් තෘෂ්ණානදියක් තෘෂ්ණාජාලයෙක් තෘෂ්ණා නැමැති බලුදමෙක් තෘෂ්ණාසමුද්‍රයෙක් අභිධ්‍යායෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' ලොභ ' යි කියනු ලැබේ.

එහි ද්වෙෂය කවරෙ යත් : මට අවැඩක් කෙළේ යයි ආඝාතයෙක් උපදී. මට අවැඩක් කරා යයි ආඝාතයෙක් උපදී. මට අවැඩක් කරන්නේ යයි ආඝාතයෙක් උපදී. මාගේ ප්‍රියමනාපයහට අවැඩක් කෙළේ ය. අවැඩක් කරයි, අවඩැක් කරන්නේ යයි ආඝාතයෙක් උපදී. මාගේ අප්‍රියඅමනාපයහට වැඩක් කෙළේ ය, වැඩක් කරයි, වැඩක් කරන්නේ යයි ආඝාතයෙක් උපදී. යළි අස්ථානයෙහි හෝ ආඝාතයෙක් උපදී. චිත්තයාගේ යම් මෙබඳු ආඝාතයෙක් බලවත් ආඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ ප්‍රකෘතිය හැරීමෙක් සිත් දූෂ්‍ය බවෙක් ක්‍රොධයෙක් ක්‍රොධ අයුරෙක් ක්‍රොධ කළ බවෙක් ද්වෙෂයෙක් ද්වෙෂාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපත්තියෙක් ව්‍යාපත්ති අයුරෙක් ව්‍යාපාදිත බවෙක් විරොධයෙක් පුනපුනා විරොධයෙක් සැඩ බවෙක් නො පිරිපුන් වදන් ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ' ද්වෙෂ ' යි කියනු ලැබේ.

එහි මොහය කවරෙ යත් : දුඃඛයෙහි නො දනීම ය, දුඃඛසමුදයෙහි නො දනීම ය, දුඃඛනිරොධයෙහි නො දනීම ය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි නො දනීම ය, පූර්වාන්තයෙහි නො දනීම ය, අවරාන්තයෙහි නො දනීම ය, පූර්වාන්තාවරාන්තයෙහි නො දනීම ය, ඉදංප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දනීම යි. යම් මෙබඳු නො දන්මෙක් නො දක්මෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' මොහ ' යි කියනු ලැබේ. මොහු තුන් අකුශලමූලයෝ යි.

914. තත්ථ කතමෙ තයො අකුසලවිතක්කා: කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. තත්ථ කතමො කාමවිතක්කො: කාමපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡා සඞ්කප්පො, අයං වුච්චති කාමවිතක්කො.

තත්ථ කතමො ව්‍යාපාද විතක්කො: ව්‍යාපාදපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡාසඞ්කප්පො, අයං වුච්චති ව්‍යාපාදවිතක්කො.

තත්ථ කතමො විහිංසාවිතක්කො: විහිංසාපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡාසඞ්කප්පො, අයං වුච්චති විහිංසාවිතක්කො. ඉමෙ තයො අකුසලවිතක්කා.

915. තත්ථ කතමා තිස්සො අකුසලසඤ්ඤා: කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා. තත්ථ කතමා කාමසඤ්ඤා: කාමපටිසංයුත්තා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං වුච්චති කාමසඤ්ඤා.

තත්ථ කතමා ව්‍යාපාදසඤ්ඤා: ව්‍යාපාදපටිසංයුත්තා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං වුච්චති ව්‍යාපාදසඤ්ඤා.

තත්ථ කතමා විහිංසාසඤ්ඤා: විහිංසාපටිසංයුත්තා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං වුච්චති විහිංසා සඤ්ඤා. ඉමා තිස්සො අකුසලසඤ්ඤා.

916. තත්ථ කතමා තිස්සො අකුසලධාතුයො: කාමධාතු, ව්‍යාපාදධාතු, විහිංසාධාතු. තත්ථ කතමා කාමධාතු: කාමවිතක්කො කාමධාතු ව්‍යාපාදවිතක්කො ව්‍යාපාදධාතු විහිංසාවිතක්කො විහිංසාධාතු.

තත්ථ කතමො කාමවිතක්කො: කාමපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡාසඞ්කප්පො, අයං වුච්චති කාමවිතක්කො.

තත්ථ කතමො ව්‍යාපාද විතක්කො: ව්‍යාපාදපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡාසඞ්කප්පො, අයං වුච්චති ව්‍යාපාදවිතක්කො.

තත්ථ කතමො විහිංසා විතක්කො: විහිංසාපටිසංයුත්තො තක්කො විතක්කො -පෙ- මිච්ඡාසඞ්කප්පො, අයං වුච්චති විහිංසා විතක්කො. ඉමා තිස්සො අකුසලධාතුයො.

917. තත්ථ කතමානි තීණි දුච්චරිතානි: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තත්ථ කතමං කායදුච්චරිතං: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො, ඉදං වුච්චති කායදුච්චරිතං.

තත්ථ කතමං වචීදුච්චරිතං: මුසාවාදො පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො, ඉදං වුච්චති වචීදුච්චරිතං.

තත්ථ කතමං මනොදුච්චරිතං: අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි, ඉදං වුච්චති මනොදුච්චරිතං.

තත්ථ කතමං කායදුච්චරිතං: අකුසලං කායකම්මං කායදුච්චරිතං, අකුසලං වචීකම්මං වචීදුච්චරිතං, අකුසලං මනොකම්මං මනොදුච්චරිතං. තත්ථ කතමං අකුසලං කායකම්මං: අකුසලා කායසඤ්චෙතනා අකුසලං කායකම්මං, අකුසලා වචීසඤ්චෙතනා අකුසලං වචීකම්මං, අකුසලා මනොසඤ්චෙතනා අකුසලං මනොකම්මං, ඉමානි තීණි දුච්චරිතානි.

Free Distribution www.aathaapi.org

914. එහි තුන් අකුශලවිතර්කයෝ කවරහ යත් : කාමවිතර්ක ය, ව්‍යාපාදවිතර්ක ය, විහිංසාවිතර්ක යි. එහි කාමවිතර්ක කවරෙ යත් : කාමප්‍රතිසංයුක්ත වූ තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' කාමවිතර්ක ' යි කියනු ලැබෙ.

එහි ව්‍යාපාදවිතර්ක කවරෙ යත් : ව්‍යාපාදප්‍රතිසංයුක්ත වූ තර්ක ය, විතර්ක ය, මිථ්‍යාසංකල්ප යි. මේ ' ව්‍යාපාදවිතර්ක ' යි කියනු ලැබෙ.

එහි විහිංසාවිතර්ක කවරෙ යත් : විහෙසාප්‍රතිසංයුක්ත වූ තර්ක ය, විතර්ක ය, මිථ්‍යාසංකල්ප යි. මේ ' විහිංසාවිතර්ක ' යි කියනු ලැබෙ. මොහු තුන් අකුශල විතර්කයෝ යි.

915. එහි තුන් අකුශලසංඥාවෝ කවරහ යත් : කාමසංඥා ය, ව්‍යාපාදසංඥා ය, විහිංසාසංඥා යි. එහි කාමසංඥා කවර යත් : කාමප්‍රතිසංයුක්ත වූ සංඥායෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ ' කාමසංඥා ' යි කියනු ලැබෙ.

එහි ව්‍යාපාදසංඥා කවර යත් : ව්‍යාපාදප්‍රතිසංයුක්ත වූ හැඳිනීමෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ ' ව්‍යාපාදසංඥා ' යි කියනු ලැබෙ.

එහි විහිංසාසංඥා කවර යත් : විහිංසාප්‍රතිසංයුක්ත වූ හැඳිනීමෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ ' විහිංසාසංඥා ' යි කියනු ලැබෙ. මොහු ' තුන් අකුශල සංඥා ' යි.

916. එහි තුන් අකුසලධාතුහු කවරහ යත් : කාමධාතු ය, ව්‍යාපාදධාතු ය, විහිංසා ධාතු යි. එහි කාමධාතු කවර යත් : කාමවිතර්කය කාමධාතු වෙයි, ව්‍යාපාදවිතර්කය ව්‍යාපාදධාතු වෙයි, විහිංසාවිතර්කය විහිංසාධාතු වේ.

එහි කාමවිතර්ක කවරෙ යත් : කාමප්‍රතිසංයුක්ත වූ තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' කාමවිතර්ක ' යි කියනු ලැබෙ.

එහි ව්‍යාපාදවිතර්ක කවරෙ යත් : ව්‍යාපාදප්‍රතිසංයුක්ත වූ තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' ව්‍යාපාදවිතර්ක ' යි කියනු ලැබෙ.

එහි විහිංසාවිතර්ක කවරෙ යත් : විහිංසාප්‍රතිසංයුක්ත වූ තර්කයෙක් විතර්කයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ ' විහිංසාවිතර්ක ' යි කියනු ලැබෙ. මොහු තුන් අකුශලධාතුහු වෙත්.

917. එහි තුන් දුශ්චරිතයෝ කවරහ යත් : කායදුශ්චරිත ය, වාග්දුශ්චරිත ය, මනොදුශ්චරිත යි. එහි කායදුශ්චරිතය කවරෙ යත් : ප්‍රාණඝාත ය, අදත්තාදාන ය, කාම මිථ්‍යාචාර යි. මේ ' කායදුශ්චරිත ' යි කියනු ලැබේ.

එහි වාග්දුශ්චරිතය කවරෙ යත් : මෘෂාවාද ය, පිශුනවචන ය, පරුෂවචන ය, සම්ඵප්‍රලාප යි. මේ ' වාග්දුශ්චරිත ' යි කියනු ලැබෙ.

එහි මනොදුශ්චරිතය කවරෙ යත් : අභිධ්‍යා ය, ව්‍යාපාද ය, මිථ්‍යාදෘෂ්ටි යි. මේ ' මනොදුශ්චරිත ' යි කියනු ලැබෙ.

එහි කායදුශ්චරිතය කවරෙ යත් : අකුශල වූ කායකර්ම කායදුශ්චරිත ය, අකුශල වූ වාක්කර්ම වාග්දුශ්චරිත ය, අකුශල වූ මනඃකර්ම මනොදුශ්චරිත යි. එහි අකුශල කායකර්ම කවරෙ යත් : අකුශල වූ කායසඤ්චෙතනා අකුශලකායකර්ම වෙයි. අකුශල වූ වාක්සඤ්චෙතනා අකුශලවාක්කර්ම වෙයි. අකුශල වූ මනස්සඤ්චෙතනා අකුශල මනඃකර්ම වේ. මොහු තුන් දුශ්චරිතයෝ යි.

918 තත්ථ කතමෙ තයො ආසවා : කාමාසවො භවාසවො අවිජ්ජාසවො. තත්ථ කතමො කාමාසවො : යො කාමෙසු කාමච්ඡන්දො -පෙ- කාමජ්ඣොසානං, අයං වුච්චති කාමාසවො.

තත්ථ කතමො භවාසවො : යො භවෙසු භවච්ඡන්දො -පෙ- භවජ්ඣොසානං, අයං වුච්චති භවාසවො.

තත්ථ කතමො අවිජ්ජාසවො : දුක්ඛෙ අඤ්ඤාණං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජාසවො. ඉමෙ තයො ආසවා.

919. තත්ථ කතමානි තීණි සංයොජනානි : සක්කායදිට්ඨි විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො. තත්ථ කතමා සක්කායදිට්ඨි : ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සක්කායදිට්ඨි.

තත්ථ කතමා විචිකිච්ඡා : සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති. යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං ථම්භිතත්තං[1] චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා.

තත්ථ කතමො සීලබ්බතපරාමාසො : ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සීලබ්බතපරාමාසො ඉමානි තීණි සංයොජනානි.

920. තත්ථ කතමා තිස්සො තණ්හා : කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. තත්ථ කතමා භවතණ්හා : භවදිට්ඨිසහගතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො, අයං වුච්චති භවතණ්හා.

තත්ථ කතමා විභවතණ්හා : උච්ඡෙදදිට්ඨි සහගතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො, අයං වුච්චති විභවතණ්හා. අවසෙසා තණ්හා කාමතණ්හා

තත්ථ කතමා කාමතණ්හා : කාමධාතු පටිසංයුත්තො රාගො සාරුගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති කාමතණ්හා. රූපධාතු අරූපධාතු පටිසංයුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරුගො, අයං වුච්චති භවතණ්හා. උච්ඡෙදදිට්ඨිසහගතො රුගො සාරුගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති විභවතණ්හා. ඉමා තිස්සො තණ්හා.

1. ඡම්භිතත්තං - සිරිමු.

Free Distribution www.aathaapi.org

918. එහි තුන් ආස්‍රවයෝ කවරහ යත් : කාමාස්‍රව ය, භවාස්‍ර ය, අවිද්‍යාස්‍රව යි. එහි කාමාස්‍රව කවරෙ යත් : පඤ්චකාමගුණයෙහි යම් කාමච්ඡන්දයෙක් . . . කාමයෙහි ගැලී බැසැගැන්මෙක් වේ ද, මේ ' කාමාස්‍රව ' යි කියනු ලැබේ.

එහි භවාස්‍රව කවරෙ යත් : රූපාරූපභවයන්හි (භවප්‍රාර්ථනා විසින්) යම් භවච්ඡන්දයෙක් . . . භවයෙහි ගැලීමෙක් වේ ද, මේ ' භවාස්‍රව ' යි කියනු ලැබේ.

එහි අවිද්‍යාස්‍රව කවරෙ යත් : දුඃඛයෙහි නො දැනීමෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අවිද්‍යාස්‍රව ' යි කියනු ලැබේ. මොහු තුන් ආස්‍රවයෝ යි.

919. එහි තුන් සංයොජනයෝ කවරහ යත් : සත්කායදෘෂ්ටි ය, විචිකිත්සා ය, ශීලව්‍රතපරාමර්ශ යි. එහි සත්කායදෘෂ්ටි කවර යත් : මෙලොව (බුද්ධාදි) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු (සතිපට්ඨානාදි) ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණු අශ්‍රැතවත් (ආගමාධිගමරහිත) පෘථග්ජන තෙම රූපය ආත්ම වශයෙන් (ආත්ම දෘෂ්ටියෙන්) දකී. ආත්මය රූප ඇත්තකැ යි හෝ ආත්මයෙහි හෝ රූපය ඇතැ යි රූපයෙහි හෝ ආත්මය ඇතැ යි, වෙදනාව . . . සංඥාව . . . සංස්කාරයන් . . . විඥානය ආත්මවශයෙන් දකී. ආත්මය විඥානය ඇත්තකැ යි හෝ ආත්මයෙහි හෝ විඥානය ඇතැ යි විඥානයෙහි හෝ ආත්මය ඇතැ යි (ආත්මදෘෂ්ටියෙන්) දකී. යම් මෙබඳු දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් . . . වරදවාගැන්මෙක් වේ ද, මේ ' සත්කායදෘෂ්ටි ' යි කියනු ලැබේ.

එහි විචිකිත්සා කවර යත් : ශාස්තෘහු කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා (අරමුණෙහි ක්ලාන්ත වීම) කෙරෙයි. ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ශික්ෂායෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. අපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තාපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ඉදංප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි සැක කෙරෙයි, විචිකිත්සා කෙරේ. යම් මෙබඳු සැකයෙක් සැක කරන අයුරෙක් සැක කළ බවෙක් චිත්තයාගේ තද බවෙක් මනොවිලෙඛයෙක් (සිතැහිරිගැසීමෙක්) වේ ද, මේ ' විචිකිත්සා ' යි කියනු ලැබේ.

එහි ශීලව්‍රතපරාමර්ශ කවරෙ යත් : මෙසස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි ය, ව්‍රතයෙන් ශුද්ධි ය, ශීලව්‍රතයෙන් ශුද්ධි යයි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' ශීලව්‍රතපරාමර්ශ ' යි කියනු ලැබේ. මොහු තුන් සංයොජනයෝ යි.

920. එහි තුන් තෘෂ්ණාවෝ කවරහ යත් : කාමතෘෂ්ණා ය, භවතෘෂ්ණා ය, විභවතෘෂ්ණා යි. එහි භවතෘෂ්ණා කවර යත් : භවදෘෂ්ටිසහගත වූ රාගයෙක් බලවත්රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' භවතෘෂ්ණා ' යි කියනු ලැබේ.

එහි විභවතෘෂ්ණා කවර යත් : උච්ඡෙදදෘෂ්ටිසහගත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' විභවතෘෂ්ණා ' යි කියනු ලැබේ. අවශෙෂ තෘෂ්ණාව ' කාමතෘෂ්ණා ' යි.

එහි කාමතෘෂ්ණා කවර යත් : කාමධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' කාමතෘෂ්ණා ' යි කියනු ලැබේ. රූපධාතු අරූපධාතු ප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' භවතෘෂ්ණා ' යි කියනු ලැබේ. උච්ඡෙදදෘෂ්ටිසහගත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' විභවතෘෂ්ණා ' යි කියනු ලැබේ. මොහු තුන් තෘෂ්ණා යි.

921. තත්ථ කතමා අපරාපි තිස්සො තණ්හා: කාමතණ්හා රූපතණ්හා අරූපතණ්හා. තත්ථ කතමා කාමතණ්හා: කාමධාතු පටිසංයුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති කාමතණ්හා.

තත්ථ කතමා රූපතණ්හා: රූපධාතුපටිසංයුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති රූපතණ්හා.

තත්ථ කතමා අරූපතණ්හා: අරූපධාතුපටිසංයුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති අරූපතණ්හා. ඉමා තිස්සො තණ්හා.

922. තත්ථ කතමා අපරාපි තිස්සො තණ්හා: රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා. තත්ථ කතමා රූපතණ්හා: රූපධාතුපටිසං-යුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති රූපතණ්හා.

තත්ථ කතමා අරූපතණ්හා: අරූපධාතුපටිසංයුත්තො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති අරූපතණ්හා.

තත්ථ කතමා නිරොධතණ්හා: උච්ඡෙදදිට්ඨි සහගතො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති නිරොධතණ්හා. ඉමා තිස්සො තණ්හා.

923. තත්ථ කතමා තිස්සො එසනා: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. තත්ථ කතමා කාමෙසනා: යො කාමෙසු කාමච්ඡන්දො -පෙ- කාමජ්ඣොසානං, අයං වුච්චති කාමෙසනා.

තත්ථ කතමා භවෙසනා: යො භවෙසු භවච්ඡන්දො -පෙ- භවජ්ඣො-සානං, අයං වුච්චති භවෙසනා.

තත්ථ කතමා බ්‍රහ්මචරියෙසනා: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසගාහො, අයං වුච්චති බ්‍රහ්මචරියෙසනා.

තත්ථ කතමා කාමෙසනා: කාමභවො, තදෙකට්ඨං අකුසලං කාය-කම්මං වචීකම්මං මනොකම්මං, අයං වුච්චති කාමෙසනා.

තත්ථ කතමා භවෙසනා: භවරාගො තදෙකට්ඨං අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං, අයං වුච්චති භවෙසනා.

තත්ථ කතමා බ්‍රහ්මචරියෙසනා: අන්තග්ගාහිකාදිට්ඨි තදෙකට්ඨං අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං, අයං වුච්චති බ්‍රහ්මචරි-යෙසනා. ඉමා තිස්සො එසනා.

924. තස්ස කතමා තිස්සො විධා: 'සෙය්‍යොහමස්මී'ති විධා, 'සදිසො හමස්මී'ති විධා, 'හීනොහමස්මී'ති විධා. ඉමා තිස්සො විධා.

325. තත්ථ කතමානි තීණි භයානි: ජාතිභයං ජරාභයං මරණභයං. තත්ථ කතමං ජාතිභයං: ජාතිං පටිච්ච භයං භයානකං ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උත්‍රාසො, ඉදං වුච්චති ජාතිභයං.

Free Distribution www.aathaapi.org

921. එහි අන්‍ය වූ ද තුන් තෘෂ්ණාවෝ කවරහ යත් : කාමතෘෂ්ණා ය, රූපතෘෂ්ණා ය, අරූපතෘෂ්ණා යි. එහි කාමතෘෂ්ණා කවර යත් : කාමධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' කාමතෘෂ්ණා ' යි කියනු ලැබේ.

එහි රූපතෘෂ්ණා කවර යත් : රූපධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' රූපතෘෂ්ණා ' යි කියනු ලැබේ.

එහි අරූපතෘෂ්ණා කවර යත් : අරූපධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අරූපතෘෂ්ණා ' යි කියනු ලැබේ. මොහු ' තුන් තෘෂ්ණා ' යි.

922. එහි අන්‍ය වූ ද තුන් තෘෂ්ණාවෝ කවරහ යත් : රූපතෘෂ්ණා ය, අරූපතෘෂ්ණා ය, නිරෝධතෘෂ්ණා යි. එහි රූපතෘෂ්ණා කවර යත් : රූපධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' රූපතෘෂ්ණා ' යි කියනු ලැබේ.

එහි අරූපතෘෂ්ණා කවර යත් : අරූපධාතුප්‍රතිසංයුක්ත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අරූපතෘෂ්ණා ' යි කියනු ලැබේ.

එහි නිරෝධතෘෂ්ණා කවර යත් : උච්ඡේදදෘෂ්ටිසහගත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' නිරෝධතෘෂ්ණා ' යි කියනු ලැබේ. මොහු ' තුන් තෘෂ්ණා ' යි.

923. එහි තුන් එසනාවෝ කවරහ යත් : කාමෙසනා (කාමගවෙෂණරාග) ය, භවෙසනා ය, බ්‍රහ්මචරියෙසනා යි. එහි කාමෙසනා කවර යත් : පඤ්චකාමගුණයෙහි යම් කාමච්ඡන්දයෙක් . . . කාමයන් ගිලගැනීමෙක් වේ ද, මේ ' කාමෙසනා ' යි කියනු ලැබේ.

එහි භවෙසනා කවර යත් : රූපාරූපභවයන්හි යම් භවච්ඡන්දයෙක් . . . භවය ගිල ගැනීමෙක් වේ ද, මේ ' භවෙසනා ' යි කියනු ලැබේ.

එහි බ්‍රහ්මචරියෙසනා කවර යත් : ලොකය ශාශ්වතැ යි හෝ ලොකය අශාශ්වතැ යි හෝ . . . සත්ත්ව තෙම මරණින් මතු නොම වෙයි නොද නොවේ ය යි හෝ යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' බ්‍රහ්මචරියෙසනා ' යි කියනු ලැබේ.

එහි කාමෙසනා කවර යත් : කාමභවය තදෙකස්ථ (එය හා එක්ව සිටි) අකුශල කායකර්ම ය, වාක්කර්ම ය, මනඃකර්ම යි. මේ ' කාමෙසනා ' යි කියනු ලැබේ.

එහි භවෙසනා කවර යත් : භවරාග ය, තදෙකස්ථ වූ අකුශල කායකර්ම ය, වාක් කර්ම ය, මනඃකර්ම යි. මේ ' භවෙසනා ' යි කියනු ලැබේ.

එහි බ්‍රහ්මචරියෙසනා කවර යත් : අන්තග්‍රාහකදෘෂ්ටි ය, තදෙකස්ථ වූ අකුශල කායකර්ම ය, වාක්කර්ම ය, මනඃකර්ම යි. මේ ' බ්‍රහ්මචරියෙසනා ' යි කියනු ලැබේ. මොහු ' තුන් එසනා ' යි.

924. එහි තුන් විධා (මානය) කවරහ යත් : ' මම ශ්‍රෙෂ්ඨයෙමි විධායෙක. මම සදෘශයෙමි විධායෙක. මම හීනයෙමි විධායෙකි. මොහු තුන් විධා යි.

925. එහි තුන් භය කවරහ යත් : ජාතිභය ය, ජරාභය ය, මරණභය යි. එහි ජාතිභය කවරෙ යත් : ජාතිය පිණිස භයෙක් භයානකයෙක් තැතිගැන්මෙක් ලොමුදහ ගැන්මෙක් චිත්තයාගේ උත්‍රාසයෙක් වේ ද, මේ ' ජාතිභය ' යි කියනු ලැබේ.

16—සිපී 17626 (3/75)

තත්ථ කතමං ජරාභයං : ජරං පටිච්ච භයං භයානකං ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උත්‍රාසො, ඉදං වුච්චති ජරාභයං.

තත්ථ කතමං මරණභයං : මරණං පටිච්ච භයං භයානකං ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උත්‍රාසො, ඉදං වුච්චති මරණභයං. ඉමානි තීණි භයානි.

926. තත්ථ කතමානි තීණි තමානි : අතීතං වා අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, අනාගතං වා අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. ඉමානි තීණි තමානි

927. තත්ථ කතමානි තීණි තිත්ථායතනානි : ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨී 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බන්තං පුබ්බෙකතහෙතූ'ති.

ඉධ පනෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨී. 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බන්තං ඉස්සරනිම්මාණහෙතූ'ති.

ඉධ පනෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨී 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බන්තං අහෙතුඅප්පච්චයා'ති. ඉමානි තීණි තිත්ථායතනානි.

928. තත්ථ කතමෙ තයො කිඤ්චනා : රාගො කිඤ්චනං දොසො කිඤ්චනං මොහො කිඤ්චනං. ඉමෙ තයො කිඤ්චනා.

929. තත්ථ කතමානි තීණි අඞ්ගණානි : රාගො අඞ්ගණං දොසො අඞ්ගණං මොහො අඞ්ගණං. ඉමානි තීණි අඞ්ගණානි.

930. තත්ථ කතමානි තීණි මලානි : රාගො මලං දොසො මලං මොහො මලං. ඉමානි තීණි මලානි.

931. තත්ථ කතමානි තීණි විසමානි : රාගො විසමං දොසො විසමං මොහො විසමං. ඉමානි තීණි විසමානි.

932. තත්ථ කතමානි අපරානිපි තීණි විසමානි : කායවිසමං වචීවිසමං මනොවිසමං. ඉමානි තීණි විසමානි.

933. තත්ථ කතමෙ තයො අග්ගී : රාගග්ගි දොසග්ගි මොහග්ගි, ඉමෙ තයො අග්ගී.

934. තත්ථ කතමෙ තයො කසාවා : රාගකසාවො දොසකසාවො මොහකසාවො ඉමෙ තයො කසාවා.

935. තත්ථ කතමෙ අපරෙපි තයො කසාවා : කායකසාවො වචීකසාවො මනොකසාවො. ඉමෙ තයො කසාවා.

එහි ජරාභය කවරේ යත් : ජරාව පිණිස බියෙක් බිය අයුරෙක් තැතිගැන්මෙක් ලොමුදහගැන්මෙක් චිත්තයාගේ උත්‍රාසයෙක් වේ ද, මේ ' ජරාභය ' යි කියනු ලැබේ.

එහි මරණභය කවරේ යත් : මරණය පිණිස බියෙක් බිය අයුරෙක් තැතිගැන්මෙක් ලොමුදහගැන්මෙක් චිත්තයාගේ උත්‍රාසයෙක් වේ ද, මේ ' මරණභය ' යි කියනු ලැබේ. මොහු තුන් භය වෙත්.

926. එහි තුන් තමස්හු (අඳුරු) කවරහ යත් : අතීතකාලය හෝ ඇරබ සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, එහි අධිමුක්ත නො වෙයි, නො පහදී. අනාගතකාලය හෝ ඇරබ සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. එහි අධිමුක්ත නො වෙයි, නො පහදී. මේ ප්‍රත්‍යුත්පන්නකාලය හෝ ඇරබ සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. එහි අධිමුක්ත නො වෙයි, නො පහදී. මොහු තුන් තමස්හු වෙත්.

927. එහි තුන් තීර්ථායතනයෝ කවරහ යත් : මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියනසුලු වෙයි. මෙබඳු දෘෂ්ටි ඇත්තේ යි : (කෙබඳු ද යත්) ' මේ සත්ත්ව තෙම යම් කිසි සුඛවෙදනාවක් හෝ දුඃඛවෙදනාවක් හෝ උපෙක්ෂාවෙදනාවක් හෝ විඳී නම් ඒ සියල්ල පූර්වකෘතහෙතුයෙන් විඳී ' යයි.

තවද මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියනසුලු වෙයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ යි : ' මේ සත්ත්ව තෙම යම්කිසි සුඛවෙදනාවක් හෝ දුඃඛවෙදනාවක් හෝ උපෙක්ෂාවෙදනාවක් හෝ විඳී නම් ඒ සියල්ල ඊශ්වරනිර්මාණහෙතුයෙන් විඳී යයි.

තවද මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියනසුලු වෙයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ යි : ' මේ සත්ත්ව තෙම යම්කිසි සුඛවෙදනාවක් හෝ දුඃඛවෙදනාවක් හෝ උපෙක්ෂාවෙදනාවක් හෝ විඳී නම් ඒ සියල්ල හෙතු රහිත ව ප්‍රත්‍යය රහිත ව විඳී යයි. මොහු ' තුන් තීර්ථායතනයෝ ' යි.

928. එහි තුන් පලිබොධ කවරහ යත් : රාගය පලිබොධයෙක, ද්වෙෂය පලිබොධයෙක, මොහය පලිබොධයෙකි. මොහු තුන් පලිබොධයෝ යි.

929. එහි තුන් අඞ්ගණයෝ (තියුණු කෙලෙස්) කවරහ යත් : රාගය අඞ්ගණයෙක, ද්වෙෂය අඞ්ගණයෙක, මොහය අඞ්ගණයෙකි. මොහු තුන් අඞ්ගණයෝ යි.

930. එහි තුන් මල කවරහ යත් : රාගය මලයෙක, ද්වෙෂය මලයෙක, මොහය මලයෙකි. මොහු ' තුන් මල ' වෙත්.

931. එහි තුන් විෂමයෝ කවරහ යත් : රාගය විෂමයෙක, ද්වෙෂය විෂමයෙක, මොහය විෂමයෙකි. මොහු ' තුන් විෂමයෝ ' යි.

932. එහි අනෙකුදු තුන් විෂමයෝ කවරහ යත් : කායවිෂම ය, වාග්විෂම ය, මනොවිෂම යි. මොහු ' තුන් විෂමයෝ ' යි.

933. එහි තුන් ගිනි කවරහ යත් : රාග ගිනි ය, ද්වෙෂ ගිනි ය, මොහ ගිනි යි. මොහු තුන්ගිනි වෙත්.

934. එහි තුන් කසට කවරහ යත් : රාගකසට ය, ද්වෙෂකසට ය, මොහකසට යි. මොහු තුන් කසට වෙත්.

935. එහි අනෙකුදු තුන්කසට කවරහ යත් : කායකසට ය, වාක්කසට ය, මනඃකසට යි. මොහු තුන් කසට වෙත්.

936 තත්ථ කතමා අස්සාදදිට්ඨි: ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨි 'නත්ථි කාමෙසු දොසො'ති. සො කාමෙසු පාතබ්‍යතං ආපජ්ජති, අයං වුච්චති අස්සාදදිට්ඨි.

තත්ථ කතමා අත්තානුදිට්ඨි: ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අත්තානුදිට්ඨි.

තත්ථ කතමා මිච්ඡාදිට්ඨි: නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො,[1] අයං වුච්චති මිච්ඡාදිට්ඨි. සස්සතදිට්ඨි අස්සාදදිට්ඨි, සක්කායදිට්ඨි අත්තානුදිට්ඨි, උච්ඡෙදදිට්ඨි මිච්ඡාදිට්ඨි.

937. තත්ථ කතමා අරති: පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු වා අධිකුසලෙසු ධම්මෙසු අරති අරතිතා[2] අනභිරති අනභිරමණා උක්කණ්ඨිතා පරිතස්සිතා[3], අයං වුච්චති අරති.

තත්ථ කතමා විහෙසා: ඉධෙකච්චො පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා රජ්ජුයා වා අඤ්ඤතරඤ්ඤතරෙන සත්තෙ විහෙඨෙති, යා එවරූපා හෙඨනා විහෙඨනා හිංසනා විහිංසනා රොසනා විරොසනා පරූපඝාතො, අයං වුච්චති විහෙසා.

තත්ථ කතමා අධම්මචරියා: කායෙන අධම්මචරියා විසමචරියා, වාචාය අධම්මචරියා විසමචරියා මනසා අධම්මචරියා විසමචරියා, අයං වුච්චති අධම්මචරියා.

938. තත්ථ කතමා දොවචස්සතා: සහධම්මිකෙ වුච්චමානෙ දොවචස්සායං දොවචස්සියං දොවචස්සතා විප්පටිකූලගාහිතා විපච්චනීකසාතතා අනාදරියං අනාදරතා අගාරවතා අප්පතිස්සවතා, අයං වුච්චති දොවචස්සතා.

තත්ථ කතමා පාපමිත්තතා: යෙ තෙ පුග්ගලා අස්සද්ධා දුස්සීලා අප්පස්සුතා මච්ඡරිනො දුප්පඤ්ඤා, යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සංභජනා භත්ති සම්භත්ති තංසම්පවඞ්කතා, අයං වුච්චති පාපමිත්තතා.

තත්ථ කතමා නානත්තසඤ්ඤා: කාමසඤ්ඤා බ්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා, අයං වුච්චති නානත්තසඤ්ඤා. සබ්බාපි අකුසලසඤ්ඤා නානත්තසඤ්ඤා.

1. විපරියාසග්ගාහො - මජසං.
විපරියෙසග්ගාහො - සයා.
2. අරතිකා - සිරිමු, සීපැවි, සයා.
3. පරිතස්සිකා - සිරිමු, සීපැවි, සයා.

936. එහි ආස්වාදදෘෂ්ටි කවර යත් : මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ ' වස්තුකාමසෙවනයෙහි දෙස් නැතැ ' යි මෙසෙයින් කියනසුලු වෙයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ යි. හෙතෙම වස්තුකාමයන්හි (කෙලෙශකාමය) පරිභොග කළයුතු බවට පැමිණෙයි. මේ ' ආස්වාදදෘෂ්ටි ' යයි කියනු ලැබේ.

එහි ආත්මානුගතදෘෂ්ටි කවර යත් : මේ ලොකයෙහි ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ, සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් විපරීතදෘෂ්ටියෙන් දකී. ආත්මය රූප ඇත්තකැ යි හෝ රූපය ආත්මයෙහි ඇතැ යි හෝ ආත්මය රූපයෙහි ඇතැ යි හෝ දකී. වෙදනාව . . . සංඥාව . . . සංස්කාරයන් . . . විඥානය ආත්ම වශයෙන් විපරීතදෘෂ්ටියෙන් දකී. ආත්මය විඥානය ඇත්තකැයි හෝ විඥානය ආත්මයෙහි ඇතැ යි හෝ ආත්මය විඥානයෙහි ඇතැ යි හෝ විපරීතදෘෂ්ටියෙන් දකී. යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' ආත්මානුගතදෘෂ්ටි ' යයි කියනු ලැබේ.

එහි මිථ්‍යාදෘෂ්ටි කවර යත් : දුන්දෙයෙහි විපාක නැත, පූජායෙහි විපාක නැත . . . යම් කෙනෙක් මෙලොව ද පරලොව ද තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් ඔහු නැතැ ' යි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' මිථ්‍යාදෘෂ්ටි ' යයි කියනු ලැබේ. ශාශ්වතදෘෂ්ටි ආස්වාදදෘෂ්ටි වෙයි, සත්කාය දෘෂ්ටිය ආත්මානුදෘෂ්ටි වෙයි, උච්ඡෙදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි වේ.

937. එහි අරති කවර යත් : ප්‍රාන්තසෙනාසනයන්හි හෝ අන්‍යතරාන්‍යතරඅධිකුශල ධර්මයන්හි හෝ යම් නො ඇල්මෙක් නො ඇලෙන අයුරෙක් අනභිරතියෙක් අනභිරමණයෙක් උකටලී බවෙක් උද්වෙගයෙක් වේ ද, මේ ' අරති ' යි කියනු ලැබේ.

එහි විහෙසා කවර යත් : මෙලොව ඇතැමෙක් අතින් හෝ කැටින් හෝ මුගුරින් හෝ සැතින් හෝ රැහැනින් හෝ එක්තර එක්තරයෙකින් සත්ත්වයන් පෙළ යි. යම් මෙබඳු පෙළීමෙක් වෙසෙසින් පෙළීමෙක් හිංසනයෙක් විහිංසනයෙක් රොෂ කිරීමෙක් වෙසෙසින් රොෂ කිරීමෙක් මෙරමා නැසීමෙක් වේ ද, මේ ' විහෙසා ' යි කියනු ලැබේ.

එහි අධර්මචර්‍ය්‍යා කවර යත් : කායික අධර්මචර්‍ය්‍යා ය, විෂමචර්‍ය්‍යා ය, වාචසික අධර්මචර්‍ය්‍යා ය, විෂමචර්‍ය්‍යා ය, මානසික අධර්මචර්‍ය්‍යා ය, විෂමචර්‍ය්‍යා යි. මේ ' අධර්ම චර්‍ය්‍යා ' යි කියනු ලැබේ.

938. එහි දුර්වචස්කතා කවර යත් : ප්‍රඥප්තශික්ෂාපදයක් කියනු ලබන කල්හි යම් දුර්වච කමෙක් දුර්වචකර්ම ඇති බවෙක් දුර්වචස්කතායෙක් විරුද්ධග්‍රාහයෙක් විරොධ ග්‍රාහයෙහි මිහිරි බවෙක් අනාදර බවෙක් අනාදර අයුරෙක් අගෞරව බවෙක් නිඃශ්‍රය රහිත බවෙක් වේ ද, මේ දුර්වචස්කතා ' යි කියනු ලැබේ.

එහි පාපමිත්‍රතා කවර යත් : යම් ඒ පුද්ගල කෙනෙක් සැදැහැ නැත්තාහු දුසිල් වූවාහු අල්පශ්‍රැත වූවාහු මසුරු වූවාහු නුවණ නැත්තාහු වෙත් ද, ඔවුන් පිළිබඳ යම් සෙවනයෙක් බලවත් සෙවනයෙක් හාත්පසින් සෙවනයෙක් භජනයෙක් හාත්පසින් භජනයෙක් භක්තියෙක් හාත්පසින් භක්තියෙක් ඔවුන් කෙරෙහි නැමුණු බවෙක් වේ ද, මේ ' පාපමිත්‍රතා ' යි කියනු ලැබේ.

එහි නානාත්වසංඥ කවර යත් : කාමසංඥ ය, ව්‍යාපාදසංඥ ය, විහිංසාසංඥ යි. මේ ' නානාත්වසංඥ ' යි කියනු ලැබේ. හැම අකුශලසංඥ නානාත්වසංඥ යි.

939. තත්ථ කතමං උද්ධච්චං: යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං.

තත්ථ කතමං කොසජ්ජං: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං කුසලානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, ඉදං වුච්චති කොසජ්ජං.

තත්ථ කතමො පමාදො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං කුසලානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො.

940. තත්ථ කතමා අසන්තුට්ඨිතා: ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භිය්‍යොකම්‍යතා. යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං අසන්තුට්ඨිතා රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති අසන්තුට්ඨිතා.

තත්ථ කතමා අසම්පජඤ්ඤතා: යං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අසම්පජඤ්ඤතා.

තත්ථ කතමා මහිච්ඡතා: ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි පඤ්චහි වා කාමගුණෙහි අසන්තුට්ඨස්ස භිය්‍යොකම්‍යතා. යා එවරූපා ඉච්ඡා ඉච්ඡාගතං මහිච්ඡතා රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො, අයං වුච්චති මහිච්ඡතා.

941. තත්ථ කතමං අහිරිකං: යං න හිරීයති හිරීයිතබ්බෙන න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අහිරිකං.

තත්ථ කතමං අනොත්තප්පං: යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අනොත්තප්පං.

තත්ථ කතමො පමාදො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා, පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං, කුසලානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො. යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො.

939. එහි ඖද්ධත්‍ය කවරෙ යත් : චිත්තයාගේ යම් උඩඟු බවෙක් නො සන්හිඳීමෙක් චිත්තයාගේ විසුරුණු බවෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද, මේ ' ඖද්ධත්‍ය ' යි කියනු ලැබේ.

එහි කෞසීද්‍යය-කුසීත බව කවරෙ යත් : කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිතයෙහි හෝ පස්කම්ගුණයෙහි හෝ චිත්තයාගේ විසර්ජන ය, පුනපුනා විසර්ජන ය, කුශලධර්මයන්ගේ වැඩීම පිණිස සකස් කොට නො කරන බව ය, නිරතුරු නො කරන බව ය, නො පිහිටි ක්‍රියා ඇති බව ය, හැකුළුණු පැවැතුම් ඇති බව ය, බහාතැබූ කුශලච්ඡන්ද ඇති බව ය, බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බව ය, ආසෙවන රහිත බව ය. නො වැඩීම ය, බහුල නො කිරීම ය, නො පිහිටීම ය, අනුයොග නො කිරීම ය, ප්‍රමාද යයි. මේ ' කෞසීද්‍ය ' යි කියනු ලැබේ.

එහි ප්‍රමාද කවරෙ යත් : කායදුශ්චරිතයෙහි වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිත යෙහි හෝ පස්කම්ගුණයෙහි හෝ චිත්තයාගේ විසර්ජන ය, පුනපුනා විසර්ජන ය, කුශලධර්මයන්ගේ වැඩීම පිණිස සකස් කොට නො කරන බව ය, නිරතුරු නො කරන බව ය, නො පිහිටි ක්‍රියා ඇති බව ය, හැකුළුණු පැවැතුම් ඇති බව ය, බහාතැබූ කුශලච්ඡන්ද ඇති බව ය, බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බව ය, ආසෙවන රහිත බව ය, නො වැඩීම ය, බහුල නො කිරීම ය, නො පිහිටීම ය, පුනපුනා නො යෙදීම ය, ප්‍රමාදය යි. යම් මෙබඳු ප්‍රමාද යෙක් ප්‍රමාද අයුරෙක් ප්‍රමාද වූ බවෙක් වේ ද, මේ ' ප්‍රමාද ' යි කියනු ලැබේ.

940. එහි අසන්තුෂ්ටිතා කවර යත් : ඉතරෙතරචීවරපිණ්ඩපාතසෙනාසනග්ලාන ප්‍රත්‍යයභෛසජ්‍යපරිෂ්කාරයන්ගෙන් හෝ පඤ්චකාමගුණයෙන් හෝ නො සතුටු වූවහුගේ බොහෝ කැමැති බව ය. යම් මෙබඳු ඉච්ඡායෙක් ඉච්ඡාගතයෙක් නො සතුටු බවෙක් රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අසන්තුෂ්ටිතා ' යි කියනු ලැබේ.

එහි අසම්ප්‍රජන්‍යතා කවර යත් : යම් අඥනයෙක් අදර්ශනයෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අසම්ප්‍රජන්‍යතා ' යි කියනු ලැබේ.

එහි මහෙච්ඡතා කවර යත් : ඉතරෙතරචීවරපිණ්ඩපාතසෙනාසනග්ලානප්‍රත්‍යය භෛසජ්‍යපරිෂ්කාරයන්ගෙන් හෝ පඤ්චකාමගුණයෙන් හෝ නො සතුටු වූවහුගේ බොහෝ කැමැති බව ය, යම් මෙබඳු ඊප්සායෙක් ඊප්සාගතයෙක් මහෙච්ඡබවෙක් රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' මහෙච්ඡතා ' යි කියනු ලැබේ.

941. එහි අපත්‍රපා කවර යත් : යමෙකින් ජුගුප්සා කළ යුත්ත ජුගුප්සා නො කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ට පැමිණීම ජුගුප්සා නො කෙරේ ද, මේ ' අපත්‍රපා ' යි කියනු ලැබේ.

එහි අනොත්තප්පය කවරෙ යත් : යමෙකින් බියවියයුත්තට බිය නො වේ ද, ලාමක අකුශලධර්මයන්ට පැමිණීමට බිය නො වේ ද, මේ ' අනොත්තප්පය ' යි කියනු ලැබේ.

එහි ප්‍රමාද කවරෙ යත් : කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනො දුශ්චරිතයෙහි හෝ පඤ්චකාමගුණයෙහි හෝ චිත්තයාගේ විසර්ජනයෙක් පුනපුනා විසර්ජනයෙක් කුශලධර්මයන්ගේ වැඩීමට සකස් කොට නො කරන බවෙක් නිරතුරු නො කරන බවෙක් නො පිහිටි ක්‍රියා ඇති බවෙක් හැකුළුණු පැවතුම් ඇති බවෙක් බහාතැබූ කුශලච්ඡන්දය ඇති බවෙක් බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් ආසෙවනය නො කිරීමෙක් නො වැඩීමෙක් බහුල නො කිරීමෙක් නො පිහිටීමෙක් අනුයොග නො කිරීමෙක් ප්‍රමාද යෙක් වේ ද, යම් මෙබඳු ප්‍රමාදයෙක් ප්‍රමාද අයුරෙක් ප්‍රමාද වූ බවෙක් වේ ද, මේ ' ප්‍රමාද ' යි කියනු ලැබේ.

942. තත්ථ කතමං අනාදරියං : යං අනාදරියං අනාදරතා අගාරවතා අප්පතිස්සවතා අනද්දා අනද්දායනා අනද්දායිතත්තං අසීල්‍යං අචිත්තීකාරො, ඉදං වුච්චති අනාදරියං.

තත්ථ කතමා දොවචස්සතා : සහධම්මිකෙ වුච්චමානෙ දොවචස්සායං දොවචස්සියං දොවචස්සතා විප්පටිකූලගාහිතා විපච්චනිකසාතතා[1] අනාදරියං අනාදරතා අගාරවතා අප්පතිස්සවතා, අයං වුච්චති දොවචස්සතා.

තත්ථ කතමා පාපමිත්තතා : යෙ තෙ පුග්ගලා අස්සද්ධා දුස්සීලා අප්පස්සුතා මච්ඡරිනො දුප්පඤ්ඤා. යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා පටිසෙවනා භජනා සංභජනා භත්ති සංභත්ති තං සම්පවඞ්කතා, අයං වුච්චති පාපමිත්තතා.

943. තත්ථ කතමං අස්සද්ධියං : ඉධෙකච්චො අස්සද්ධො හොති. න සද්දහති බුද්ධං වා, ධම්මං වා, සංඝං වා. යං එවරූපං අස්සද්ධියං අසද්දහනා අනොකප්පනා, අනභිප්පසාදො, ඉදං වුච්චති අස්සද්ධියං.

තත්ථ කතමා අවදඤ්ඤුතා : පඤ්චමච්ඡරියානි : ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡෙරං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, අයං වුච්චති අවදඤ්ඤුතා.

තත්ථ කතමං කොසජ්ජං : කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා. පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං කුසලානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, ඉදං වුච්චති කොසජ්ජං.

944. තත්ථ කතමං උද්ධච්චං : යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං.

තත්ථ කතමො අසංවරො : ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති න රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති න රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති, අයං වුච්චති අසංවරො.

තත්ථ කතමං දුස්සීල්‍යං : කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො, ඉදං වුච්චති දුස්සීල්‍යං.

1. විප්පච්චනිකසාතතා - සිමු.

942. එහි අනාදරිය කවරෙ යත් : යම් අනාදර බවෙක් අනාදර අයුරෙක් අගෞරව බවෙක් නිඃශ්‍රය රහිත බවෙක් නො ගැන්මෙක් නො ගන්නා අයුරෙක් නො ගත් බවෙක් ආචාර රහිත බවෙක් ගරු නො කිරීමෙක් වේ ද, මේ ' අනාදරිය ' යි කියනු ලැබේ.

එහි දුර්වචස්කතා කවර යත් : ප්‍රඥප්තශික්ෂාපදයක් කියනු ලබන කල්හි යම් දුර්වච කමෙක් දුර්වචකර්ම ඇති බවෙක් දුර්වචස්කතාවයක් විරුද්ධග්‍රාහයෙක් විරෝධග්‍රාහයෙහි මධුර බවෙක් අනාදර බවෙක් අනාදර අයුරෙක් අගෞරව බවෙක් නිඃශ්‍රය රහිත බවෙක් වේ ද, මේ ' දුර්වචස්කතා ' යි කියනු ලැබේ.

එහි පාපමිත්‍රතා කවර යත් : යම් ඒ පුද්ගල කෙනෙක් අශ්‍රාද්ධ ද, දුශ්ශීල ද, අල්පශ්‍රැත ද, මාත්සර්‍ය්‍යයෝ ද, දුෂ්ප්‍රාඥයෝ ද, ඔවුන්ගේ යම් සෙවනයෙක් බලවත් සෙවනයෙක් භාත්පසින් සෙවනයෙක් පුනපුනා සෙවනයෙක් භජනයෙක් භාත්පසින් භජනයෙක් (ඔවුන් කෙරෙහි) භක්තියෙක් භාත්පසින් භක්තියෙක් ඔවුනට නැමුණු බවෙක් වේ ද, මේ ' පාපමිත්‍රතා ' යි කියනු ලැබේ.

943. එහි ශ්‍රද්ධා නැති බව කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ශ්‍රද්ධා නැත්තේ වෙයි. බුදුන් හෝ දහම් හෝ සඞ්ඝයා හෝ නො හදහයි. යම් මෙබඳු ශ්‍රද්ධා නැති බවෙක් නො හදහන අයුරෙක් නො පිවිස ගැන්මෙක් නො පැහැදීමෙක් වේ ද, මේ ' ශ්‍රද්ධා නැති බව ' යි කියනු ලැබේ.

එහි අවදඤ්ඤුතා (වචනඥ නො වන බව) කවර යත් : මාත්සර්‍ය්‍ය පසෙකි : ආවාස මාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්මමාත්සර්‍ය්‍ය යි. යම් මෙබඳු මාත්සර්‍ය්‍යයෙක් මාත්සර්‍ය්‍ය අයුරෙක් මාත්සර්‍ය්‍යය කළ බවෙක් (ස්වකීය සම්පත්) ව්‍යාප්ත කරනු කැමැති බවෙක් තදමසුරු බවෙක් කටුකභාවයෙක් හැකුළුණුසිත් ඇති බවෙක් සිත නො විදහාගත් බවෙක් වේ ද, මේ ' අවදඤ්ඤුතා ' යි කියනු ලැබේ.

එහි කෞසිද්‍යය කවරෙ යත් : කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනො දුශ්චරිතයෙහි හෝ පඤ්චකාමගුණයෙහි හෝ චිත්තයාගේ විසර්ජනයෙක් පුනපුනා විසර්ජනයෙක් කුශලධර්මයන්ගේ වැඩීම පිණිස සකසා නො කරන බවෙක් සතතයෙන් නො කරන බවෙක් නො තිමී ක්‍රියා ඇති බවෙක් හැකුළුණු පැවතුම් ඇති බවෙක් බහාතැබූ කුශලච්ඡන්දය ඇති බවෙක් බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් ආසෙවන රහිත බවෙක් අභාවනයෙක් බහුල නො කිරීමෙක් නො පිහිටීමෙක් අනුයොග රහිත බවෙක් ප්‍රමාදයෙක් වේ ද, මේ ' කෞසීද්‍ය ' යි කියනු ලැබේ.

944. එහි ඖද්ධත්‍ය කවරෙ යත් : චිත්තයාගේ යම් උද්ධත බවෙක් නො සන්හිඳීමෙක් චිත්තයාගේ වික්ෂෙපයෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද, මේ ' ඖද්ධත්‍ය ' යි කියනු ලැබේ.

එහි අසංවර කවරෙ යත් : මෙලොව ඇතැමෙක් ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත ව වාස කරන්නා වූ මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමකඅකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී. චක්ෂුරින්ද්‍රියය නො රකී. චක්ෂු රින්ද්‍රියෙහි සංවරයට නො පැමිණෙයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් ගඟා . . . දිවින් රසක් විඳ . . . කයින් පහසක් පැහැස . . . මනසින් දහමක් දැන නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් කරුණෙකින් මනින්ද්‍රියය අසංවෘත ව වාස කරන්නා වූ මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි, මනින්ද්‍රිය නො රකියි. මනින්ද්‍රියෙහි සංවරයට නො පැමිණෙයි. මේ ' අසංවර ' යි කියනු ලැබේ.

එහි දුශ්ශීල බව කවරෙ යත් : කායිකව්‍යතික්‍රම ය, වාචසිකව්‍යතික්‍රම ය, කායික වාචසිකව්‍යතික්‍රම යි. මේ ' දුශ්ශීල බව ' යි කියනු ලැබේ.

945. තත්ථ කතමා අරියානං අදස්සනකම්‍යතා : තත්ථ කතමෙ අරියා : අරියා වුච්චන්ති බුද්ධා ච බුද්ධසාවකා ච, යා ඉමෙසං අරියානං අදස්සනකම්‍යතා අදට්ඨුකම්‍යතා අසමෙතුකම්‍යතා අසමාගන්තුකම්‍යතා, අයං වුච්චති අරියානං අදස්සනකම්‍යතා.

තත්ථ කතමා සද්ධම්මං අසොතුකම්‍යතා : තත්ථ කතමො සද්ධම්මො : චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, අයං වුච්චති සද්ධම්මො. යා ඉමස්ස සද්ධම්මස්ස අසොතුකම්‍යතා අසවනකම්‍යතා අනුග්ගහෙතුකම්‍යතා අධාරෙතුකම්‍යතා, අයං වුච්චති සද්ධම්මං අසොතුකම්‍යතා.

තත්ථ කතමා උපාරම්භචිත්තතා : තත්ථ කතමො උපාරම්භො : යො උපාරම්භො අනුපාරම්භො උපාරම්භනා අනුපාරම්භනා අනුපාරම්භිතත්තං උඤ්ඤා අවඤ්ඤා පරිභවො රන්ධගවෙසිතා, අයං වුච්චති උපාරම්භචිත්තතා.

946. තත්ථ කතමං මුට්ඨස්සච්චං : යා අස්සති අනනුස්සති අප්පටිස්සති අස්සරණතා අධාරණතා පිලාපනතා සම්මුස්සනතා, ඉදං වුච්චති මුට්ඨස්සච්චං.

තත්ථ කතමං අසම්පජඤ්ඤං : යං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, ඉදං වුච්චති අසම්පජඤ්ඤං.

තත්ථ කතමො චෙතසො වික්ඛෙපො : යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, අයං වුච්චති චෙතසො වික්ඛෙපො

947. තත්ථ කතමො අයොනිසො මනසිකාරො : අනිච්චෙ නිච්චන්ති අයොනිසො මනසිකාරො, දුක්ඛෙ සුඛන්ති අයොනිසො මනසිකාරො. අනත්තනි අත්තාති අයොනිසො මනසිකාරො, අසුභෙ සුභන්ති අයොනිසො මනසිකාරො, සච්චවිප්පටිකූලෙන වා චිත්තස්ස ආවට්ටනා අනාවට්ටනා[1] ආභොගො සමන්නාහාරො මනසිකාරො, අයං වුච්චති අයොනිසො මනසිකාරො.

තත්ථ කතමා කුම්මග්ගසෙවනා : තත්ථ කතමො කුම්මග්ගො : මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි, අයං වුච්චති කුම්මග්ගො. යා ඉමස්ස කුම්මග්ගස්ස සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සංභජනා භත්ති සම්භත්ති තං සම්පවඞ්කතා, අයං වුච්චති කුම්මග්ගසෙවනා.

තත්ථ කතමං චෙතසො ච ලීනත්තං : යා චිත්තස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති චෙතසො ච ලීනත්තං.

නිට්ඨිතං.

---

1. අනාවට්ටනා - සිරිමු, මජ්ඣං.
ආවජ්ජනා, අනාවජ්ජනා - සයා.

945. එහි ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව කවර යත් : එහි ආර්‍ය්‍යයෝ කවරහ යත් : බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද ආර්‍ය්‍යහ යි කියනු ලැබෙත්. යම් මේ ආර්‍ය්‍යයන්ගේ නො දැකීම කැමැති බවෙක් නො දක්නට කැමැති බවෙක් ඔවුන් වෙත නොඑළඹෙනු කැමැති බවෙක් ඔවුන් හා එක්වන්නට නො කැමැති බවෙක් වේ ද, මේ ' ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව ' යි කියනු ලැබේ.

එහි සදහම් නො අසනු කැමැති බව කවර යත් : එහි සද්ධර්ම කවරෙ යත් : සතර සතිපට්ඨාන ය, සතර සම්‍යක්ප්‍රධාන ය, සතරඍද්ධිපාද ය, පඤ්චෙන්ද්‍රිය ය, පඤ්චබල ය, සප්තබොධ්‍යඞ්ග ය, ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ග යයි මේ ' සද්ධර්ම ' යි කියනු ලැබේ. යම් මේ සද්ධර්මය නො අසන්නට කැමැති බවෙක් නො අසනු කැමැති බවෙක් උගන්නට නො කැමැති බවෙක් දරන්නට නො කැමැති බවෙක් වේ ද, මේ ' සදහම් නො අසනු කැමැති බව ' යි කියනු ලැබේ.

එහි උපාරම්භ සිත් ඇති බව කවරෙ යත් : එහි උපාරම්භ කවරෙ යත් : යම් උපාරම්භ (නිත්දපූර්වදෙෂාරොපණ) යෙක් පුනපුනා උපාරම්භයෙක් උපාරම්භ අයුරෙක් පුනපුනා උපාරම්භ අයුරෙක් පුනපුනා උපාරම්භ කළ බවෙක් පහත් කොට සිතීමෙක් අවඥයෙක් පරිභවයෙක් රන්ධ්‍රගවෙෂී (සිදුරු සොයන) බවෙක් වේ ද, මේ ' උපාරම්භ සිත් ඇති බව ' යි කියනු ලැබේ.

946. එහි මුඨස්මෘති කවර යත් : යම් නො සිහි කිරීමෙක් පුනපුනා නො සිහි කිරීමෙක් අබිමුව ව සිහි නො කිරීමෙක් සිහි නො කරන අයුරෙක් නො දරන බවෙක් (අරමුණෙහි) ඉල්පෙන බවෙක් ප්‍රමොෂ බවෙක් වේ ද, මේ ' මුඨස්මෘති ' යි කියනු ලැබේ.

එහි අසම්‍යග්ඥාන කවරෙ යත් : යම් අඥානයෙක් අදර්ශනයෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අසම්‍යග්ඥාන ' යි කියනු ලැබේ.

එහි චිත්තවික්ෂෙප කවරෙ යත් : චිත්තයාගේ යම් උද්ධත භාවයෙක් නො සන්හිඳීමෙක් චිත්තයාගේ විසිරීමෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද, මේ ' චිත්තවික්ෂෙප ' යි කියනු ලැබේ.

947. එහි අයොනිසොමනසිකාර කවරෙ යත් : අනිත්‍යයෙහි නිත්‍ය යනු අයොනිසොමනසිකාර ය, දුඃඛයෙහි සුඛ යනු අයොනිසොමනසිකාර ය, අනාත්මයෙහි ආත්ම යනු අයොනිසොමනසිකාර ය, අශුභයෙහි ශුභ යනු අයොනිසොමනසිකාර යි. සත්‍යයනට විලොම විසින් හෝ චිත්තයාගේ ආවර්ජනයෙක් පුනපුනා ආවර්ජනයෙක් ආභොගයෙක් සමන්වාහාරයෙක් මනසිකාරයෙක් වේ ද, මේ ' අයොනිසොමනසිකාර ' යි කියනු ලැබේ.

එහි කුත්සිතමාර්ගසෙවන කවරෙ යත් : එහි කුත්සිතමාර්ගය කවරෙ යත් : මිථ්‍යා දෘෂ්ටි ය, මිථ්‍යාසංකල්ප ය, මිථ්‍යාවචන ය, මිථ්‍යාකර්මාන්ත ය, මිථ්‍යාආජීව ය, මිථ්‍යා ව්‍යායාම ය, මිථ්‍යාස්මෘති ය, මිථ්‍යාසමාධි යි. මේ ' කුත්සිතමාර්ග ' යි කියනු ලැබේ. යම් මේ කුත්සිතමාර්ගයාගේ සෙවනයෙක් බලවත් සෙවනයෙක් භාත්පසින් සෙවනයෙක් භජනයෙක් භාත්පසින් භජනයෙක් එය කෙරෙහි භක්තියෙක් භාත්පසින් භක්තියෙක් එයට භාත්පසින් නැමුණු බවෙක් වේ ද, මේ ' කුත්සිතමාර්ගසෙවන ' යි කියනු ලැබේ.

එහි චිත්තයාගේ ලීනත්වය කවරෙ යත් : චිත්තයාගේ යම් අකල්‍ය බවෙක් අකර්මණ්‍ය බවෙක් එලෙන බවෙක් භාත්පසින් එලෙන බවෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකිළුණු බවෙක් චිත්තයාගේ තදයෙක් තද අයුරෙක් තද වූ බවෙක් වේ ද, මේ ' චිත්තයාගේ ලීනත්ව ' යි කියනු ලැබේ.

ත්‍රික යි.

---

948. තත්ථ කතමෙ චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො, තත්ථ කතමො කාමාසවො: යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමස්නෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, අයං වුච්චති කාමාසවො.

තත්ථ කතමො භවාසවො: යො භවෙසු භවච්ඡන්දො -පෙ- භවජ්ඣොසානං, අයං වුච්චති භවාසවො.

තත්ථ කතමො දිට්ඨාසවො: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා. හොති තථාගතො පරම්මරණාති වා. න හොති තථාගතො පරම්මරණාති වා. හොති ච න හොති ච තථාගතො පරම්මරණාති වා නෙව හොති න නහොති තථාගතො පරම්මරණාති වා යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨාසවො. සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨාසවො.

තත්ථ කතමො අවිජ්ජාසවො: දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජාසවො. ඉමෙ චත්තාරො ආසවා.

949. තත්ථ කතමෙ චත්තාරො ගන්ථා -පෙ- චත්තාරො ඔඝා -පෙ- චත්තාරො යොගා -පෙ- චත්තාරි උපාදානානි: කාමුපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං. තත්ථ කතමං කාමුපාදානං: යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමස්නෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, ඉදං වුච්චති කාමුපාදානං.

තත්ථ කතමං දිට්ඨුපාදානං: නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා, එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, ඉදං වුච්චති දිට්ඨුපාදානං. ඨපෙත්වා සීලබ්බතුපාදානඤ්ච අත්තවාදුපාදානඤ්ච සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨුපාදානං.

තත්ථ කතමං සීලබ්බතුපාදානං: ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, ඉදං වුච්චති සීලබ්බතුපාදානං.

තත්ථ කතමං අත්තවාදුපාදානං: ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං. විඤ්ඤාණස්මිං වා අත්තානං, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, ඉදං වුච්චති අත්තවාදුපාදානං. ඉමානි චත්තාරි උපාදානානි.

948. එහි සතර ආස්‍රවයෝ කවරහ යත් : කාමාස්‍රව ය, භවාස්‍රව ය, දෘෂ්ට්‍යාස්‍රව ය, අවිද්‍යාස්‍රව යි. එහි කාමාස්‍රව කවර යත් : පඤ්චකාමගුණයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාම මූර්ජායෙක් කාමයන්හි ගැලීමෙක් වේ ද, මේ ' කාමාස්‍රව ' යි කියනු ලැබෙ.

එහි භවාස්‍රව කවරෙ යත් : රූපාරූපභවයන්හි යම් භවච්ඡන්දයෙක් . . . භව ප්‍රේඞ්ධාසානයෙක් වේ ද, මේ ' භවාස්‍රව ' යි කියනු ලැබෙ.

එහි දෘෂ්ට්‍යාස්‍රව කවරෙ යත් : ලොකය ශාශ්වතයැ යි හෝ ලොකය අශාශ්වතයැ යි හෝ ලොකය අන්ත ඇතැයි හෝ ලොකය අන්ත නැතැ යි හෝ හෙ මැ ජීව ය හෙ මැ ශරීර යැ යි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්ව තෙම මරණින් මතු වේ යැ යි හෝ සත්ත්ව තෙම මරණින් මතු නො වේ යැ යි හෝ සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො වන්නේත් වේ යැ යි හෝ සත්ත්ව තෙම මරණින් මතු නො ම වෙයි නො ද නො වේ යැ යි හෝ යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' දෘෂ්ට්‍යාස්‍රව ' යි කියනු ලැබෙ. හැම මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ට්‍යාස්‍රව වේ.

එහි අවිද්‍යාස්‍රව කවරෙ යත් : දුඃඛයෙහි නො දැනීම ය, දුඃඛසමුදයෙහි නො දැනීම ය, දුඃඛනිරොධයෙහි නො දැනීම ය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි නො දැනීම ය, පූර්වාන්තයෙහි නො දැනීම ය, අපරාන්තයෙහි නො දැනීම ය, පූර්වාන්තාපරාන්තයෙහි නො දැනීම ය, ඉදංප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දැනීම යි. යම් මෙබඳු නො දැනීමෙක් නො දැකීමෙක් . . . අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ ' අවිද්‍යාස්‍රව ' යි කියනු ලැබෙ. මොහු සතර ආස්‍රව වෙත්.

949. එහි සතර ග්‍රන්ථයෝ . . . සතර ඔඝයෝ . . . සතර යොගයෝ . . . සතර උපාදනයෝ කවරහ යත් : කාමොපාදන ය, දෘෂ්ට්‍යුපාදන ය, ශීලව්‍රතොපාදන ය, ආත්මවාදෙපාදන යි. එහි කාමොපාදන කවරෙ යත් : පඤ්චකාමගුණයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ජායෙක් කාමයෙහි බැසගැනීමෙක් වේ ද, මේ ' කාමොපාදන ' යි කියනු ලැබෙ.

එහි දෘෂ්ට්‍යුපාදන කවරෙ යත් : ' දුන්දෙයෙහි විපාක නැත, පූජායෙහි විපාක නැත . . . යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් ඔහු නැතැ ' යි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍යාස ග්‍රාහයෙක් වේ ද, මේ ' දෘෂ්ට්‍යුපාදන ' යි කියනු ලැබෙ. ශීලව්‍රතොපාදනයත් ආත්මවාදෙපාදනයත් තබා හැම මිථ්‍යාදෘෂ්ටිය ' දෘෂ්ට්‍යුපාදන ' යි.

එහි ශීලව්‍රතොපාදන කවරෙ යත් : මෙසස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි ය, ව්‍රතයෙන් ශුද්ධි ය, ශීලව්‍රතයෙන් ශුද්ධි ය යි යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටි ගතයෙක් . . . විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' ශීලව්‍රතොපාදන ' යි කියනු ලැබෙ.

එහි ආත්මවාදෙපාදන කවරෙ යත් : මෙලොව ආර්‍යයන් නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් විපරීතදෘෂ්ටියෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ඇතැයි හෝ ආත්මය රූපයෙහි ඇතැයි හෝ විපරීතදෘෂ්ටියෙන් දකී. වෙදනාව . . . සංඥාව . . . සංස්කාරයන් . . . විඥානය ආත්මවශයෙන් විපරීතදෘෂ්ටියෙන් දකී. ආත්මය විඥානවත් කොට හෝ විඥානය ආත්මයෙහි ඇතැ යි හෝ ආත්මය විඥානයෙහි ඇතැ යි හෝ යම් මෙබඳු දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් . . . විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ' ආත්මවාදෙපාදන ' යි කියනු ලැබෙ. මොහු සතර උපාදනයෝ යි.

950. තත්‍ථ කතමෙ චත්තාරො තණ්හුප්පාදා: චීවරහෙතු වා භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, පිණ්ඩපාතහෙතු වා භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, සෙනාසනහෙතු වා භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, ඉති භවාභව හෙතු වා භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. ඉමෙ චත්තාරො තණ්හුප්පාදා.

951. තත්‍ථ කතමානි චත්තාරි අගතිගමනානි: ඡන්දාගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති. මොහාගතිං ගච්ඡති. භයාගතිං ගච්ඡති, යා එවරූපා අගතිගමනා ඡන්දගමනා වග්ගගමනා වාරිගමනා, ඉමානි චත්තාරි අගතිගමනානි.

952. තත්‍ථ කතමෙ චත්තාරො විපරියෙසා[1]: අනිච්චෙ නිච්චන්ති සඤ්ඤා විපරියෙසො චිත්තවිපරියෙසො දිට්ඨිවිපරියෙසො, දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා විපරියෙසො චිත්තවිපරියෙසො දිට්ඨිවිපරියෙසො, අනත්තනි අත්තාති සඤ්ඤාවිපරියෙසො චිත්තවිපරියෙසො දිට්ඨිවිපරියෙසො, අසුභෙ සුභන්ති සඤ්ඤාවිපරියෙසො චිත්තවිපරියෙසො දිට්ඨිවිපරියෙසො. ඉමෙ චත්තාරො විපරියෙසා.

953. තත්‍ථ කතමෙ චත්තාරො අනරියවොහාරා: අදිට්ඨෙ දිට්ඨවාදිතා අස්සුතෙ සුතවාදිතා අමුතෙ මුතවාදිතා අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා, ඉමෙ චත්තාරො අනරියවොහාරා.

954. තත්‍ථ කතමෙ අපරෙපි චත්තාරො අනරියවොහාරා: දිට්ඨෙ අදිට්ඨවාදිතා සුතෙ අස්සුතවාදිතා මුතෙ අමුතවාදිතා විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා. ඉමෙ චත්තාරො අනරියවොහාරා.

955. තත්‍ථ කතමානි චත්තාරි දුච්චරිතානි: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො, ඉමානි චත්තාරි දුච්චරිතානි.

956. තත්‍ථ කතමානි අපරානිපි චත්තාරි දුච්චරිතානි: මුසාවාදො පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො, ඉමානි චත්තාරි දුච්චරිතානි.

957. තත්‍ථ කතමානි චත්තාරි භයානි: ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං, ඉමානි චත්තාරි භයානි.

958. තත්‍ථ කතමානි අපරානි චත්තාරි භයානි: රාජභයං චොරභයං අග්ගිභයං උදකභයං, ඉමානි චත්තාරි භයානි.

959. තත්‍ථ කතමානි අපරානිපි චත්තාරි භයානි: ඌම්මිභයං, කුම්භීලභයං, ආවට්ටභයං, සුසුකාභයං, ඉමානි චත්තාරි භයානි.

960. තත්‍ථ කතමානි අපරානිපි චත්තාරි භයානි: අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං, ඉමානි චත්තාරි භයානි.

---

1. විපරියාසා - මජසං.

950. එහි සතර තෘෂ්ණොත්පාදයෝ කවරහ යත්: චීවරහෙතුයෙන් හෝ මහණහට උපදනා තෘෂ්ණාව උපදී. පිණ්ඩපාතහෙතුයෙන් හෝ මහණහට උපදනා තෘෂ්ණාව උපදී. සෙනාසනහෙතුයෙන් හෝ මහණහට උපදනා තෘෂ්ණාව උපදී. මෙසේ භවාභව (පිණී ඉපිණී තෙල්, මීහි, පැණි ආ) හෙතුයෙන් හෝ මහණහට උපදනා තෘෂ්ණාව උපදී. මොහු සතර තෘෂ්ණොත්පාදයෝ යි.

951. එහි සතර අගතිගමනයෝ කවරහ යත්: ඡන්දයෙන් (ප්‍රෙමවශයෙන්) අගතියට යෙයි. ද්වෙෂයෙන් අගතියට යෙයි. මොහයෙන් අගතියට යෙයි. භය විසින් අගතියට යේ. යම් මෙබඳු අගතිගමනයෙක් (අකටයුතු කිරීමෙක්) ඡන්දගමන යෙක් වර්ගගමනයෙක් (නිම්නගාමී බැවින්) වාරිගමනයෙක් වේ ද, මොහු සතර අගති ගමනයෝ යි.

952. එහි සතර විපර්‍ය්‍යාසයෝ කවරහ යත්: අනිත්‍යවස්තුයෙහි නිත්‍ය යයි සංඥ විපර්‍ය්‍යාස ය, චිත්තවිපර්‍ය්‍යාස ය, දෘෂ්ටිවිපර්‍ය්‍යාස ය, දුඃඛයෙහි සුඛ යයි සංඥවිපර්‍ය්‍යාස ය, චිත්තවිපර්‍ය්‍යාස ය, දෘෂ්ටිවිපර්‍ය්‍යාස ය, අනාත්මයෙහි ආත්ම යයි සංඥවිපර්‍ය්‍යාස ය, චිත්ත විපර්‍ය්‍යාස ය, දෘෂ්ටිවිපර්‍ය්‍යාස ය, අශුභයෙහි ශුභ යයි සංඥවිපර්‍ය්‍යාස ය, චිත්තවිපර්‍ය්‍යාස ය, දෘෂ්ටිවිපර්‍ය්‍යාස යි. මොහු සතර විපර්‍ය්‍යාසයෝ යි.

953. එහි සතර අනාර්‍ය්‍යව්‍යවහාරයෝ කවරහ යත්: අදෘෂ්ටයෙහි (නො දුටුයෙහි) දෘෂ්ටවාදිත්ව ය, අශ්‍රැතයෙහි (නො ඇසුයෙහි) ශ්‍රැතවාදිත්ව ය, අමුතයෙහි (නො ගත් ගන්ධ රසස්ප්‍රෂ්ටව්‍යයෙහි) මුතවාදිත්ව ය, අවිඥතයෙහි (නො දත්තෙහි) විඥතවාදිත්ව යි. මොහු ' සතර අනාර්‍ය්‍යව්‍යවහාරයෝ ' යි.

954. එහි අනෙකුදු සතර අනාර්‍ය්‍යව්‍යවහාරයෝ කවරහ යත්: දෘෂ්ටයෙහි අදෘෂ්ට වාදිත්ව ය, ශ්‍රැතයෙහි අශ්‍රැතවාදිත්ව ය, මුතයෙහි අමුතවාදිත්ව ය, විඥතයෙහි අවිඥත වාදිත්ව යයි. මොහු සතර අනාර්‍ය්‍යව්‍යවහාරයෝ යි.

955. එහි සතර දුශ්චරිතයෝ කවරහ යත්: ප්‍රාණඝාත ය, අදත්තාදන ය, කාමමිථ්‍යා චාර ය, මෘෂාවාද යි. මොහු සතර දුශ්චරිතයෝ යි.

956. එහි අනෙකුදු සතර දුශ්චරිතයෝ කවරහ යත්: මෘෂාවාද ය, පිශුනවචන ය, පරුෂවචන ය, සම්ප්‍රලාප යි. මොහු සතර දුශ්චරිතයෝ යි.

957. එහි සතර භය කවරහ යත්: ජාතිය නිසා උපන් බිය ය, ජරාව නිසා උපන් බිය ය, ව්‍යාධිය නිසා උපන් බිය ය, මරණය නිසා උපන් බිය යි. මොහු සතර භය වෙත්.

958. එහි අනෙකුදු සතර භය කවරහ යත්: රජු කෙරෙන් උපන් බිය ය, සොරු කෙරෙන් උපන් බිය ය, ගින්නෙන් උපන් බිය ය, දියෙන් උපන් බිය යි. මොහු සතර භය වෙත්.

959. එහි අනෙකුදු සතර භය කවරහ යත්: තරඟවැළ නිසා උපන් බිය ය, කිඹුලන් කෙරෙන් උපන් බිය ය, දියසුළියෙන් වන බිය ය, සැඩමසුන් කෙරෙන් උපන් බී ය යි මොහු සතර භය වෙත්.

960. එහි අනෙකුදු සතර භය කවරහ යත්: ආත්මානුවාදභය ය, පරානුවාදභය ය, දණ්ඩභය ය, දුර්ගතිභය යි. මොහු සතර භය වෙත්.

961. තත්ථ කතමා චතස්සො දිට්ඨියො: සයං කතං සුඛදුක්ඛන්ති සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. පරං කතං සුඛදුක්ඛන්ති සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. සයං කතඤ්ච පරං කතඤ්ච සුඛදුක්ඛන්ති සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛන්ති සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. ඉමා චතස්සො දිට්ඨියො

චතුක්කං.

---

962. තත්ථ කතමානි පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො කාමච්ඡන්දො ව්‍යාපාදො, ඉමානි පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි.

963 තත්ථ කතමානි පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤොජනානි: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා, ඉමානි පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤොජනානි.

964. තත්ථ කතමානි පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. ඉමානි පඤ්ච මච්ඡරියානි.

965. තත්ථ කතමෙ පඤ්ච සඞ්ගා: රාගසඞ්ගො දොසසඞ්ගො මොහසඞ්ගො මානසඞ්ගො දිට්ඨිසඞ්ගො, ඉමෙ පඤ්ච සඞ්ගා.

966. තත්ථ කතමෙ පඤ්ච සල්ලා: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං, ඉමෙ පඤ්ච සල්ලා.

967. තත්ථ කතමෙ පඤ්ච චෙතොඛිලා: සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්ජති න සම්පසීදති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො, ඉමෙ පඤ්ච චෙතොඛිලා.

968. තත්ථ කතමෙ පඤ්ච චෙතසො විනිබන්ධා: කාමෙ අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. කායෙ අවීතරාගො හොති. -පෙ- රූපෙ අවීතරාගො හොති. -පෙ- යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං[1] මිද්ධසුඛං අනුයුත්තො විහරති. අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති, ඉමෙ පඤ්ච චෙතසො විනිබන්ධා.

969. තත්ථ කතමානි පඤ්ච නීවරණානි: කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, ඉමානි පඤ්ච නීවරණානි.

---

1. ඵස්සසුඛං - සිමු.

Free Distribution www.aathaapi.org

961. එහි සතර දෘෂ්ටීහු කවරහ යත්: සුවදුක් (වෙදනාව) තමා විසින් කරන ලද යි සත්‍ය හෙයින් ස්ථිර හෙයින් දෘෂ්ටි උපදියි. සුවදුක් වෙදනා පරා විසින් කරන ලද යි සත්‍ය හෙයින් ස්ථිර හෙයින් දෘෂ්ටි උපදී. සුවදුක් තමා විසිනුත් පරා විසිනුත් කරන ලද යි සත්‍ය හෙයින් ස්ථිර හෙයින් දෘෂ්ටි උපදී. සුවදුක් තමා විසින් නො කරනලද ය, පරා විසින් නො කරන ලද ය, අධිත්‍යසමුත්පන්න ය යි සත්‍ය හෙයින් ස්ථිර හෙයින් දෘෂ්ටි උපදී. මොහු සතර දෘෂ්ටීහු වෙත්.

චතුෂ්ක යි.

---

962. එහි පඤ්චඔරම්භාගියසංයොජනයෝ කවරහ යත්: සත්කායදෘෂ්ටි ය, විචිකිත්සා ය, ශීලව්‍රතපරාමර්‍ශ ය, කාමච්ඡන්ද ය, ව්‍යාපාද යි. මොහු පඤ්චඔරම්භාගිය සංයොජනයෝ යි.

963. එහි පඤ්චඋද්ධම්භාගියසංයොජනයෝ කවරහ යත්: රූපරාග ය, අරූප රාග ය, මාන ය, ඖද්ධත්‍ය ය, අවිද්‍යා යි. මොහු පඤ්චඋද්ධම්භාගියසංයොජනයෝ යි.

964. එහි පඤ්චමාත්සර්‍ය්‍යයෝ කවරහ යත්: ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්මමාත්සර්‍ය්‍ය යි. මොහු පඤ්චමාත්සර්‍ය්‍යයෝ යි.

965. එහි පඤ්චසඞ්ගයෝ කවරහ යත්: රාගසඞ්ග ය, ද්වෙෂසඞ්ග ය, මොහසඞ්ග ය, මානසඞ්ග ය, දෘෂ්ටිසඞ්ග යි. මොහු පඤ්චසඞ්ගයෝ යි.

966. එහි පඤ්චශල්‍යයෝ කවරහ යත්: රාගශල්‍ය ය, ද්වෙෂශල්‍ය ය, මොහශල්‍ය ය, මානශල්‍ය ය, දෘෂ්ටිශල්‍ය යි. මොහු පඤ්චශල්‍යයෝ යි.

967. එහි පඤ්චචෙතොඛිලයෝ කවරහ යත්: ශාස්තෘන් කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නො ඇලෙයි, නො පහදී. ධර්මය කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නො ඇලෙයි, නො පහදී. සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නො ඇලෙයි, නො පහදී. ශික්ෂාව කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නො ඇලෙයි, නො පහදී. සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිත් ඇත්තේ ගැටුණුසිත් ඇත්තේ හටගත් චෙතොඛිල ඇත්තේ වෙයි. මොහු ' පඤ්ච චෙතොඛිලයෝ ' යි.

968. එහි පඤ්ච චිත්තවිනිබන්ධයෝ කවරහ යත්: වස්තුකාමක්ලෙශකාමයන්හි අවිගත වූ රාග ඇත්තේ අවිගත වූ ඡන්ද ඇත්තේ අවිගත වූ ප්‍රෙම ඇත්තේ අවිගත වූ පිපාසා ඇත්තේ අවිගත වූ පරිදහ ඇත්තේ අවිගත වූ තෘෂ්ණා ඇත්තේ වෙයි, අධ්‍යාත්මකායයෙහි අවිගතරාග ඇත්තේ වෙයි . . . බහිද්ධාරූපයෙහි අවිගතරාග ඇත්තේ වෙයි . . . කැමැති තාක් කුසපුරා වළඳා ශය්‍යාසුඛයෙහි ස්පර්‍ශසුඛයෙහි නිද්‍රාසුඛයෙහි යෙදුණේ වෙසෙයි. ' මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ එක්තරා දෙවියෙක් හෝ වන්නෙමි ' එක්තරා දෙවනිකායක් පතා බඹසර වෙසේ. මොහු පඤ්ච චිත්තවිනිබන්ධයෝ යි.

969. එහි පඤ්චනීවරණයෝ කවරහ යත්: කාමච්ඡන්දනීවරණ ය, ව්‍යාපාද නීවරණ ය, ථිනමිද්ධනීවරණ ය, උද්ධච්චකුක්කුච්චනීවරණ ය, විචිකිච්ඡානීවරණ යි. මොහු පඤ්චනීවරණයෝ යි.

17—ಔ8 17626 (3/75)

970. තත්ථ කතමානි පඤ්ච කම්මානි ආනන්තරියානි: මාතා ජීවිතා වොරොපිතා හොති. පිතා ජීවිතා වොරොපිතො හොති. අරහන්තො ජීවිතා වොරොපිතො හොති. දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදිතං හොති. සඞ්ඝො භින්නො හොති, ඉමානි පඤ්ච කම්මානි ආනන්තරියානි.

971. තත්ථ කතමා පඤ්ච දිට්ඨියො: සඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණාති ඉත්ථෙකෙ අභිවදන්ති, අසඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණාති ඉත්ථෙකෙ අභිවදන්ති, නෙවසඤ්ඤීනාසඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණාති ඉත්ථෙකෙ අභිවදන්ති, සතො වා පන සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති, දිට්ඨධම්මනිබ්බානං වා පනෙකෙ අභිවදන්ති, ඉමා පඤ්ච දිට්ඨියො.

972. තත්ථ කතමෙ පඤ්ච වෙරා: පාණාතිපාතො අදින්නාදානං කාමෙසුමිච්ඡාචාරො මුසාවාදො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං, ඉමෙ පඤ්ච වෙරා.

973. තත්ථ කතමෙ පඤ්ච ව්‍යසනා: ඤාතිව්‍යසනං භොගව්‍යසනං රොගව්‍යසනං සීලව්‍යසනං දිට්ඨිව්‍යසනං, ඉමෙ පඤ්ච ව්‍යසනා.

974. තත්ථ කතමෙ පඤ්ච අඛන්තියා ආදීනවා: බහුනො ජනස්ස අප්පියො හොති අමනාපො, වෙරබහුලො ච හොති, වජ්ජබහුලො ච, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, ඉමෙ පඤ්ච අඛන්තියා ආදීනවා.

975. තත්ථ කතමානි පඤ්ච භයානි: ආජීවිකභයං අසිලොකභයං පරිසසාරජ්ජභයං මරණභයං දුග්ගතිභයං, ඉමානි පඤ්චභයානි.

976. තත්ථ කතමෙ පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා: ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨී. 'යතො ඛො භො අයං අත්තා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති. එත්තාවතා ඛො භො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොතීති, ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොති. තං කිස්ස හෙතු: කාමා හි භො අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, තෙසං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. යතො ඛො භො අයං අත්තා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා ඛො භො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොතීති ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

Free Distribution www.aathaapi.org

970. එහි පඤ්චානන්තර්‍යකර්මයෝ කවරහ යත් : මව දිවියෙන් ගළවනලද වෙයි, පියා දිවියෙන් ගළවනලද වෙයි, රහත් දිවියෙන් ගළවනලද වෙයි, දුෂ්ට සිතින් තථාගත සිරුරෙහි ලෙහෙ උපදවන ලද්දේ වෙයි, සඞ්ඝයා බිඳුනා ලද්දේ වේ. මොහු පඤ්චානන්තර්‍යකර්මයෝ යි.

971. එහි පඤ්චදෘෂ්ටීහු කවරහ යත් : මරණින් මත්තෙහි ආත්මය සංඥ ඇත්තේ නිත්‍ය වේ යයි ඇතැම් කෙනෙක් කියති. මරණින් මත්තෙහි ආත්මය සංඥ විරහිත වූයේ නිත්‍ය වේ යයි ඇතැම් කෙනෙක් කියති. මරණින් මත්තෙහි ආත්මය නෛවසංඥීනාසංඥී වූයේ නිත්‍ය වේ යයි ඇතැම් කෙනෙක් කියති. තවද විද්‍යමාන වූ ම සත්ත්වයාගේ සිඳීම විනාශය විභවය පනවත්. යළි ඇතැම් කෙනෙක් දෘෂ්ටධර්මනිර්වාණය හෝ කියත්. මොහු පඤ්චදෘෂ්ටීහු වෙත්.

972. එහි පඤ්චවෛරයෝ කවරහ යත් : ප්‍රාණඝාත ය, අදත්තාදාන ය, කාමමිථ්‍යාචාර ය, මෘෂාවාදය, මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීම යි. මොහු පඤ්චවෛරයෝ යි.

973. එහි පඤ්චව්‍යසනයෝ කවරහ යත් : ඥතිව්‍යසන ය, භොගව්‍යසන ය, රොගව්‍යසන ය, ශීලව්‍යසන ය, දෘෂ්ටිව්‍යසන යි. මොහු පඤ්චව්‍යසනයෝ යි.

974. එහි අක්ෂාන්තියෙහි පඤ්චආදීනවයෝ කවරහ යත් : බොහෝ දෙනාට අප්‍රිය වූයේ අමනාප වූයේ වෙයි. වෛරබහුල වූයේත් වද්‍යබහුල වූයේත් වෙයි. මූඪ වූයේ කලුරිය කෙරෙයි, කාබුන් මරණින් මතුයෙහි සැපයෙන් පහවූ දුකට ගති වූ විවස ව පතිත වන නිරයට පැමිණේ. මොහු අක්ෂාන්තියෙහි පඤ්චආදීනවයෝ යි.

975. එහි පඤ්චභය කවරහ යත් : දිවිවැටුම නිසා උපන් බිය ය, ගැරැහුම්බිය ය, පිරිස්හි සාරද්‍ය සඞ්ඛ්‍යාත බිය ය, මරණයෙන් වූ බිය ය, දුගති බිය යි. මොහු පඤ්චභය වෙත්.

976. එහි පඤ්චදෘෂ්ටධර්මනිර්වාණවාදයෝ කවරහ යත් : මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. භවත, යම් තැනෙක පටන් මේ ආත්මය පස්කම්ගුණයෙන් ඇලුණේ යුක්ත වූයේ ඉඳුරන් පිනවා ද, භවත්නි, මෙතෙකින් මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෙල ආත්මය ඇත් ම ය තෝ යමක් කියෙහි නම් තෙල නැතැයි නො කියමි. භවත මෙතෙකින් මේ ආත්මය පරමදෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ නො ද වෙයි. ඊට හෙතු කිම ? භවත, කාමයෝ අනිත්‍යයහ, දුඃඛයහ, විපරිණාමස්වභාවයහ. ඔවුන්ගේ විපරිණාම සඞ්ඛ්‍යාත අන්‍යථාත්වයෙන් සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසයෝ උපදිත්. භවත, යම් තැනෙක පටන් මේ ආත්මය කාමයන්ගෙන් වෙන් ව ම . . . ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, මෙතෙකින් භවත, මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොති. තං කිස්ස හෙතු: යදෙව තත්ථ විතක්කිතං විචාරිතං එතෙන එතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො භො අයං අත්තා විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා ඛො භො අයං අත්තා පරම දිට්ඨධම්ම නිබ්බානප්පත්තො හොතීති ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්ම නිබ්බානං පඤ්ඤාපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොති. තං කිස්ස හෙතු: යදෙව තත්ථ පීතිගතං චෙතසො උබ්බිල්ලාවිතත්තං[1] එතෙන එතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො භො අයං අත්තා පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා ඛො භො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොතීති ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානප්පත්තො හොති. තං කිස්ස හෙතු: යදෙව තත්ථ සුඛමිති චෙතසො[2] ආභොගො එතෙන එතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො භො අයං අත්තා සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා ඛො භො අයං අත්තා පරමදිට්ඨ ධම්මනිබ්බානප්පත්තො හොතීති ඉත්ථෙකෙ සතො සත්තස්ස පරම දිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති. ඉමෙ පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා.

පඤ්චකං.

---

977. තත්ථ කතමානි ඡ විවාදමූලානි: කොධො මක්ඛො ඉස්සා සාඨෙය්‍යං පාපිච්ඡතා සන්දිට්ඨිපරාමාසිතා. ඉමානි ඡ විවාදමූලානි.

978. තත්ථ කතමෙ ඡ ඡන්දරාගා ගෙහසිතා ධම්මා: මනාපියෙසු රූපෙසු ගෙහසිතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො. මනාපියෙසු සද්දෙසු -පෙ- මනාපියෙසු ගන්ධෙසු -පෙ- මනාපියෙසු රසෙසු -පෙ- මනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- මනාපියෙසු ධම්මෙසු ගෙහසිතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො, ඉමෙ ඡ ඡන්දරාගා ගෙහසිතා ධම්මා.

979. තත්ථ කතමානි ඡ විරොධවත්ථූනි: අමනාපියෙසු රූපෙසු චිත්තස්ස ආඝාතො පටිඝාතො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස. අමනාපියෙසු සද්දෙසු -පෙ- අමනාපියෙසු ගන්ධෙසු -පෙ- අමනාපියෙසු රසෙසු -පෙ- අමනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- අමනාපියෙසු ධම්මෙසු චිත්තස්ස ආඝාතො පටිඝාතො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, ඉමානි ඡ විරොධවත්ථූනි.

---

1. උබිල්ලාවිතං - සී - උබ්බිල්ලාවිතං - PTS උපිල්ලාවිතං - සිරිමු. මජසං 2. සුඛපීති චෙතසො ආභොගො - සිරිමු, මජසං.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි: භවත, තෙල ආත්මය ඇත් ම ය, තෝ යමක් කියෙහි නම් තෙල නැතැ යි නො කියමි. භවත, මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ නොද වෙයි, ඊට හෙතු කිම ? එහි යම් ම විතර්කයෙක් විචාරයෙක් වේ ද, මෙයින් තෙල ප්‍රථමධ්‍යානය ඖදරික ව වැටහෙයි. භවත, යම් තැනෙක පටන් මේ ආත්මය විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද මෙතෙකින් භවත, මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෙල ආත්මය ඇත් ම ය, තෝ යමක් කියෙහි නම්, තෙල නැතැයි නො කියමි. භවත, මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ නො ද වෙයි. ඊට හෙතු කිම ? එහි යම් මැ ප්‍රීතිගතයෙක් චිත්තයා ගේ උත්ප්ලාවනයෙක් වේ ද, මෙයින් තෙල ද්විතීයධ්‍යානය ඖදරික සේ වැටැහෙයි. භවත, යම් තැනෙක පටන් මේ ආත්මය ප්‍රීතියගේ ද විරාගයෙන් . . . තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය පරමදෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයා ගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, මේ ආත්මය ඇත් ම ය, තෝ යමක් කියෙහි නම්, තෙල නැතැයි නො කියමි. භවත, මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ නො ද වෙයි. ඊට හෙතු කිම ? එහි යම් මැ සුඛයෙහි චිත්තයා ගේ ආභොගයෙක් වේ ද, මෙයින් තෙල තෘතීයධ්‍යානය ඖදරික සේ වැටැහෙයි. භවත, යම් තැනෙක පටන් මේ ආත්මය සුඛයා ගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයා ගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්. මේ පඤ්ච දෘෂ්ටධර්මනිර්වාණවාදයෝ යි.

**පඤ්චක යි.**

---

977. එහි විවාදමූලයෝ සදෙන කවරහ යත් : ක්‍රොධ ය, මකු බව ය, ඊර්ෂ්‍යා ය සඨ බව ය, පාපිච්ඡ බව ය, ස්වකීය දෘෂ්ටිය පරාමශී කරනසුලු බව යි. මොහු සදෙන විවාදමූලයෝයි.

978. එහි ගෘහශ්‍රිත වූ ඡන්දරාගධර්මයෝ සදෙන කවරහ යත් : මනවඩන රූපයන්හි ගෘහශ්‍රිත වූ රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත්රාගයෙක්, මන වඩන ශබ්දයන්හි . . . මනවඩන ගන්ධයන්හි . . . මනවඩන රසයන්හි . . . මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයන්හි . . . මනවඩන ධර්මාලම්බනයන්හි ගෘහශ්‍රිත රාගයෙක් බලවත් රාගයෙක් චිත්තයාගේ බලවත්රාගයෙක් වේ ද, මොහු සදෙන ගෘහශ්‍රිතඡන්දරාගධර්මයෝ යි.

979. එහි විරුද්ධවස්තුහු සදෙන කවරහ යත් : අනිෂ්ට වූ රූපයන්හි චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් සැඩ බවෙක් දුරුක්තියෙක් චිත්තයාගේ නො සතුටුබවෙක්, අනිෂ්ට වූ ශබ්දයන්හි . . . අනිෂ්ට වූ ගන්ධයන්හි . . . අනිෂ්ට වූ රසයන්හි . . . අනිෂ්ට වූ ස්ප්‍රෂ්ටව්‍යයන්හි . . . අනිෂ්ට වූ ධර්මාලම්බනයන්හි චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් සැඩ බවෙක් දුරුක්තියෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මොහු විරුද්ධවස්තුහු සදෙන වෙත්.

980. තත්‍ථ කතමා ඡ තණ්හාකායා : රූපතණ්හා සද්දතණ්හා ගන්‍ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. ඉමෙ ඡ තණ්හාකායා.

981. තත්‍ථ කතමෙ ඡ අගාරවා : සත්‍ථරි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සො. සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සො. සික්ඛාය අගාරවො විහරති අප්පතිස්සො. අප්පමාදෙ අගාරවො විහරති අප්පතිස්සො. පටිසන්‍ථාරෙ අගාරවො විහරති අප්පතිස්සො ඉමෙ ඡ අගාරවා.

982. තත්‍ථ කතමෙ ඡ පරිහානියා ධම්මා : කම්මාරාමතා භස්සාරාමතා නිද්දාරාමතා සඞ්ගණිකාරාමතා සංසග්ගාරාමතා පපඤ්චාරාමතා, ඉමෙ ඡ පරිහානියා ධම්මා.

983 තත්‍ථ කතමෙ අපරෙපි ඡ පරිහානියා ධම්මා : කම්මාරාමතා භස්සාරාමතා නිද්දාරාමතා සඞ්ගණිකාරාමතා දොවචස්සතා පාපමිත්තතා, ඉමෙ ඡ පරිහානියා ධම්මා.

984. තත්‍ථ කතමෙ ඡ සොමනස්සූපවිචාරා : චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්‍ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති, ඉමෙ ඡ සොමනස්සූපවිචාරා.

985. තත්‍ථ කතමෙ ඡ දොමනස්සූපවිචාරා : චක්ඛුනා රූපං දිස්වා දොමනස්සට්ඨානියං රූපං උපවිචරති, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්‍ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය දොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති, ඉමෙ ඡ දොමනස්සූපවිචාරා.

986. තත්‍ථ කතමෙ ඡ උපෙක්ඛූපවිචාරා : චක්ඛුනා රූපං දිස්වා උපෙක්ඛාට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්‍ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උපෙක්ඛාට්ඨානියං ධම්මං උපවිචරති, ඉමෙ ඡ උපෙක්ඛූපවිචාරා.

987. තත්‍ථ කතමානි ඡ ගෙහසිතානි සොමනස්සානි : මනාපියෙසු රූපෙසු ගෙහසිතං චෙතසිකං සාතං චෙතසිකං සුඛං, චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, මනාපියෙසු සද්දෙසු -පෙ- මනාපියෙසු ගන්‍ධෙසු -පෙ- මනාපියෙසු රසෙසු -පෙ- මනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- මනාපියෙසු ධම්මෙසු ගෙහසිතං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉමානි ඡ ගෙහසිතානි සොමනස්සානි.

980. එහි ෂට්තෘෂ්ණාකාය කවරේ යත් : රූපතෘෂ්ණා ය, ශබ්දතෘෂ්ණා ය, ගන්ධතෘෂ්ණාය, රසතෘෂ්ණා ය, ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා ය, ධර්මතෘෂ්ණා යි. මොහු ෂට් තෘෂ්ණාකාය වෙත්.

981. එහි අගෞරවයෝ සදෙන කවරහ යත් : ශාස්තෲන් කෙරෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසෙයි. ධර්මය කෙරෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසෙයි. සඞ්ඝයා කෙරෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසෙයි, ශික්‍ෂායෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසෙයි, අප්‍රමාදයෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසෙයි. ප්‍රතිසන්ථාරයෙහි ගෞරව රහිත ව නිඃශ්‍රය රහිත ව වෙසේ. මොහු අගෞරවයෝ සදෙන වෙත්.

982. එහි පරිහාණියධර්මයෝ සදෙන කවරහ යත් : කම්හි ඇලුණු බව ය, කථායෙහි ඇලුණු බව ය, නිද්‍රායෙහි ඇලුණු බව ය, සඞ්ගණිකායෙහි ඇලුණු බව ය, සංසර්ගයෙහි ඇලුණු බව ය, ප්‍රපඤ්චයෙහි ඇලුණු බව යි. මොහු පරිහාණියධර්මයෝ සදෙන වෙත්.

983. එහි අන්‍ය වූ ද, පරිහාණියධර්මයෝ සදෙන කවරහ යත් : කම්හි ඇලුණු බව ය, කථායෙහි ඇලුණු බව ය, නිද්‍රායෙහි ඇලුණු බව ය, සඞ්ගණිකායෙහි ඇලුණු බව ය, දුබැසි බව ය, පාපමිත්‍ර බව යි. මොහු පරිහාණියධර්මයෝ සදෙන වෙත්.

984. එහි සොමනස්සුපවිචාරයෝ සදෙන කවරහ යත් : ඇසින් රූපයක් දැක සොමනසට කරුණු වූ රූපයෙහි සිත එළවයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් අසා . . . දිවින් රසක් විඳ . . . කයින් පහසක් පැහැස . . . මනසින් දහමක් දැන සොමනසට කරුණු වූ ධර්මයෙහි සිත එළවයි. මොහු සොමනස්සුපවිචාරයෝ සදෙන වෙත්.

985. එහි දොමනස්සුපවිචාරයෝ සදෙන කවරහ යත් : ඇසින් රූපයක් දැක දොම්නසට කරුණු වූ රූපයෙහි සිත එළවයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් අසා . . . දිවින් රසක් විඳ . . . කයින් පහසක් පැහැසැ. . . මනසින් දහමක් දැන දොම්නසට කරුණු වූ දහම්හි සිත එළවයි. මොහු දොමනස්සුපවිචාරයෝ සදෙන වෙත්.

986. එහි උපෙක්ඛුපවිචාරයෝ සදෙන කවරහ යත් : ඇසින් රූපයක් දැක උපෙක්‍ෂාවට කරුණු වූ රූපයෙහි සිත එළවයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් අසා . . . දිවින් රසක් විඳ . . . කයින් පහසක් පැහැසැ . . . මනසින් දහමක් දැන උපෙක්‍ෂාවට කරුණු වූ දහම්හි සිත එළවයි. මොහු උපෙක්ඛුපවිචාරයෝ සදෙන වෙත්.

987. එහි ගෘහශ්‍රිත සෞමනස්‍යයෝ සදෙන කවරහ යත් : මනවඩනා රූපයන්හි කාමාශ්‍රිත වූ චෛතසිකසාතයෙක් චෛතසිකසුඛයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදනායෙක්, මනවඩනා ශබ්දයන්හි . . . මනවඩනා ගන්ධයන්හි . . . මනවඩනා රසයන්හි . . . මනවඩනා ස්ප්‍රෂ්ටව්‍යයන්හි . . . මනවඩනා දහම්හි කාමාශ්‍රිත වූ චෛතසික සාතයෙක් චෛතසික සුඛයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදනායෙක් වේ ද, මොහු ගෘහශ්‍රිතසෞමනස්‍යයෝ සදෙන වෙත්.

988. තත්ථ කතමානි ඡ ගෙහසිතානි දොමනස්සානි: අමනාපියෙසු රූපෙසු ගෙහසිතං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං, චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, අමනාපියෙසු සද්දෙසු -පෙ- අමනාපියෙසු ගන්ධෙසු -පෙ- අමනාපියෙසු රසෙසු -පෙ- අමනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- අමනාපියෙසු ධම්මෙසු ගෙහසිතං චෙතසිකං අසාතං චෙතයිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉමානි ඡ ගෙහසිතානි දොමනස්සානි.

989. තත්ථ කතමා ඡ ගෙහසිතා උපෙක්ඛා: උපෙක්ඛාඨානීයෙසු රූපෙසු ගෙහසිතං චෙතයිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා උපෙක්ඛාඨානීයෙසු සද්දෙසු -පෙ- උපෙක්ඛාඨානීයෙසු ගන්ධෙසු -පෙ- උපෙක්ඛාඨානීයෙසු රසෙසු -පෙ- උපෙක්ඛාඨානීයෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- උපෙක්ඛාඨානීයෙසු ධම්මෙසු ගෙහසිතං චෙතයිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, ඉමා ඡ ගෙහසිතා උපෙක්ඛා.

990. තත්ථ කතමා ඡ දිට්ඨියො: අත්ථි මෙ අත්තාති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, නත්ථි මෙ අත්තාති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අත්තනා වා අත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අත්තනා වා අනත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අනත්තනා වා අත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අථ වා පනස්ස එවං දිට්ඨි හොති, සො මෙ අයං අත්තා වදෙ වෙදෙය්‍යො, තත්‍ර තත්‍ර දීඝරත්තං කල්‍යාණපාපකානං කම්මානං විපාකං පච්චනුභොති න සො ජාතො නාහොසි. න සො ජාතො න භවිස්සති. නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මොති වා පනස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, ඉමා ඡ දිට්ඨියො.

ඡක්කං.

---

991. තත්ථ කතමෙ සත්තානුසයා: කාමරාගානුසයො පටිඝානුසයො මානානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො, ඉමෙ සත්ත අනුසයා.

992. තත්ථ කතමානි සත්ත සඤ්ඤොජනානි: කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං මානසඤ්ඤොජනං දිට්ඨිසඤ්ඤොජනං විචිකිච්ඡාසඤ්ඤොජනං භවරාගසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි සත්ත සඤ්ඤොජනානි.

993. තත්ථ කතමානි සත්ත පරියුට්ඨානානි: කාමරාගපරියුට්ඨානං පටිඝපරියුට්ඨානං මානපරියුට්ඨානං දිට්ඨිපරියුට්ඨානං විචිකිච්ඡාපරියුට්ඨානං භවරාගපරියුට්ඨානං අවිජ්ජාපරියුට්ඨානං, ඉමානි සත්ත පරියුට්ඨානානි.

Free Distribution www.aathaapi.org

988. එහි ගෘහශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙන කවරහ යත් : අනිෂ්ට වූ රූපයන්හි ගෘහශ්‍රිත වූ චෛතසික අසාතයෙක් චෛතසික දුඃඛයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාතදුඃඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාතදුඃඛවෙදනාවෙක්, අනිෂ්ට වූ ශබ්දයන්හි . . . අනිෂ්ට වූ ගන්ධයන්හි . . . අනිෂ්ට වූ රසයන්හි . . . අනිෂ්ට වූ ස්ප්‍රෂ්ටව්‍ය යන්හි . . . අනිෂ්ට වූ ධර්මයන්හි ගෘහශ්‍රිත වූ චෛතසික අසාතයෙක් චෛතසික දුඃඛයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාතදුඃඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාතදුඃඛවෙදනාවෙක් වේ ද, මොහු ' ගෘහශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙන ' වෙත්.

989. එහි ගෘහශ්‍රිතඋපෙක්ෂාවෝ සදෙන කවරහ යත් : උපෙක්ෂාවට කරුණු වූ රූපයන්හි ගෘහශ්‍රිත වූ චෛතසික නෙවසාතනාසාතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් උපෙක්ෂාවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් උපෙක්ෂාවෙදනාවෙක්, උපෙක්ෂාවට කරුණු වූ ශබ්දයන්හි . . . උපෙක්ෂාවට කරුණු වූ ගන්ධයන්හි . . . උපෙක්ෂාවට කරුණු වූ රසයන්හි . . . උපෙක්ෂාවට කරුණු වූ ස්ප්‍රෂ්ටව්‍යයන්හි . . . උපෙක්ෂාවට කරුණු වූ ධර්මයන්හි ගෘහශ්‍රිත වූ චෛතසික නෙවසාතනාසාතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් උපෙක්ෂාවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් උපෙක්ෂාවෙදනාවෙක් වේ ද, මොහු ගෘහශ්‍රිතඋපෙක්ෂාවෝ සදෙන වෙත්.

990. එහි ෂඩ්දෘෂ්ටිහු කවරහ යත් : මාගේ ආත්මය ඇතැ යි හෝ සත්‍ය විසින් ස්ථිර විසින් ඔහුට දෘෂ්ටිය උපදියි. මාගේ ආත්මය නැතැ යි හෝ සත්‍ය විසින් ස්ථිර විසින් ඔහුට දෘෂ්ටිය උපදියි. (සංඥාස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මයෙන් (අවශෙෂස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මය දනිමි හෝ සත්‍ය විසින් ස්ථිර විසින් ඔහුට දෘෂ්ටිය උපදියි. ආත්මයෙන් අනාත්මය දනිමි හෝ සත්‍ය විසින් ස්ථිර විසින් ඔහුට දෘෂ්ටිය උපදියි. අනාත්මයෙන් ආත්මය දනිමි හෝ සත්‍ය විසින් ස්ථිර විසින් ඔහුට දෘෂ්ටිය උපදියි. නොහොත් යළි ඔහුට මෙබඳු දෘෂ්ටියෙක් වෙයි : (කෙබඳු ය යත්) යමෙක් කථා කරනුයේ නම් විඳුනේ නම් ඒ ඒ තැන්හි දිගුකලක් කල්‍යාණපාපකකර්මයන්ගේ විපාකය අනුභව කෙරේ නම් ඒ මේ මාගේ ආත්මය වෙයි. හෙතෙම නූපන්නේ නො වූයේ ය, හෙතෙම නූපන්නේ නො වන්නේ ය, නිත්‍ය ය, ධ්‍රැව ය, අවිපරිණාමස්වභාව ඇත්තේ යයි හෝ ඔහුට සත්‍ය විසින් ස්ථිර විසින් දෘෂ්ටිය උපදී. මොහු ෂඩ්දෘෂ්ටිහු වෙත්.

**ෂට්ක යි.**

---

991. එහි සප්තානුශයයෝ කවරහ යත් : කාමරාගානුශය ය, ප්‍රතිඝානුශය ය, මානානුශය ය, දෘෂ්ට්‍යනුශය ය, විචිකිත්සානුශය ය, භවරාගානුශය ය, අවිද්‍යානුශය යි. මොහු සප්තානුශය වෙත්.

992. එහි සප්ත සංයොජනයෝ කවරහ යත් : කාමරාගසංයොජන ය, ප්‍රතිඝසංයොජන ය, මානසංයොජන ය, දෘෂ්ටිසංයොජන ය, විචිකිත්සාසංයොජන ය, භවරාගසංයොජන ය, අවිද්‍යාසංයොජන යි. මොහු සප්ත සංයොජනයෝ යි.

993. එහි සප්ත පර්යුත්ථානයෝ කවරහ යත් : කාමරාගපර්යුත්ථාන ය, ප්‍රතිඝපර්යුත්ථාන ය, මානපර්යුත්ථාන ය, දෘෂ්ටිපර්යුත්ථාන ය, විචිකිත්සාපර්යුත්ථාන ය, භවරාගපර්යුත්ථාන ය, අවිද්‍යාපර්යුත්ථාන යි. මොහු සප්ත පර්යුත්ථානයෝ යි.

994. තත්ථ කතමෙ සත්ත අසද්ධම්මා: අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති. මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති. ඉමෙ සත්ත අසද්ධම්මා.

995. තත්ථ කතමානි සත්ත දුච්චරිතානි: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො, ඉමානි සත්ත දුච්චරිතානි.

996. තත්ථ කතමෙ සත්ත මානා: මානො අතිමානො මානාතිමානො ඔමානො අධිමානො අස්මිමානො මිච්ඡාමානො. ඉමෙ සත්ත මානා.

997. තත්ථ කතමා සත්ත දිට්ඨියො: ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨී. යතො ඛො භො අයං අත්තා රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා දිබ්බො රූපී කාමාවචරො කබළිංකාරාහාරභක්ඛො, තං ත්වං න ජානාසි න පස්සසි තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා, එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති, ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති අත්ථි ඛො භො අඤ්ඤො අත්තා දිබ්බො රූපී මනොමයො සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො, තං ත්වං න ජානාසි න පස්සසි, තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති, විනස්සති, න හොති, පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති, ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනූපගො තං ත්වං න ජානාසි න පස්සසි, තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති, විනස්සති, න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති, ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

Free Distribution www.aathaapi.org

994. එහි සප්ත අසද්ධර්මයෝ කවරහ යත් : අශ්‍රාද්ධයෙක් වෙයි, අහ්‍රීකයෙක් වෙයි, පාපභීරුක නො වූයෙක් වෙයි, අල්පශ්‍රැතයෙක් වෙයි, කුසීතයෙක් වෙයි, මුළාසිහි ඇත්තේ වෙයි, දුෂ්ප්‍රාඥයෙක් වේ. මොහු සප්තඅසද්ධර්මයෝ යි.

995. එහි සප්ත දුශ්චරිතයෝ කවරහ යත් : ප්‍රාණඝාත ය, අදත්තාදාන ය, කාම මිථ්‍යාචාර ය, මෘෂාවාද ය, පිශුනවචන ය, පරුෂවචන ය, සම්ඵප්‍රලාප යි. මොහු සප්ත දුශ්චරිතයෝ යි.

996. එහි සප්ත මානයෝ කවරහ යත් : මාන ය, අතිමාන ය, මානාතිමාන ය, අවමාන ය, අධිමාන ය, අස්මිමාන ය, මිථ්‍යාමාන යි. මොහු සප්ත මානයෝ යි.

997. එහි සප්තදෘෂ්ටිහු කවරහ යත් : මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. භවත, යම් හෙයකින් රූපී වූ චාතුර්මහාභූතික වූ මාතාපෛතෘකසම්භව වූ මේ ආත්මය කරජකායයාගේ බිඳීමෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි, මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය විභවය පනවති.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි නම් තෙල ආත්මය ඇත් ම ය, තෙල නැතැ යි නො කියමි. එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි. භවත, දිව්‍ය වූ රූපී වූ කාමාවචර වූ කවලීකාරාහාරය වළඳනා අන්‍ය ආත්මයෙක් ඇත් මැ යි. එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම් දනිමි දක්මි. භවත, ඒ මේ ආත්මය යම් හෙයෙකින් කරජකායයාගේ භෙදයෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය විභවය පනවති.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි නම් තෙල ආත්ම ඇත් ම ය, තෙලෙ නැතැ ' යි නො කියමි, එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි. භවත, දිව්‍ය වූ රූපී වූ (ධ්‍යාන) මනසින් නිපන් හැම අඟපසඟ ඇති පරිපූර්ණ ඉන්ද්‍රිය ඇති අන්‍ය ආත්මයෙක් ඇත් මැ යි. එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම දනිමි, දක්මි. භවත, ඒ මේ ආත්මය යම් හෙයෙකින් ශරීරයාගේ භෙදයෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, මෙතෙකින් භවත, මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය විභවය පනවති.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි නම් තෙල ආත්මය ඇත් ම ය, තෙලෙ නැතැ යි නො කියමි, එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි, භවත, සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඩගමයෙන් නානාත්වසංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ' ආකාශය අනන්ත ය ' යි ආකාසානඤ්චායතනයට පැමිණි අන්‍ය ආත්මයෙක් ඇත. එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම දනිමි, දක්මි, භවත, ඒ ආත්මය යම් හෙයෙකින් ශරීරයාගේ භෙදයෙන් සිඳේ ද වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, මෙතෙකින් භවත, මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය විභවය පනවති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගො, තං ත්වං න ජානාසි න පස්සසි තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා, එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති, ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගො, තං ත්වං න ජානාසි න පස්සසි, තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගො. තං ත්වං න ජානාසි න පස්සසි, තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතීති ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති. ඉමෙ සත්ත දිට්ඨියො.

සත්තකං.

---

998. තත්ථ කතමානි අට්ඨ කිලෙසවත්ථූනි: ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං. ඉමානි අට්ඨ කිලෙසවත්ථූනි.

999. තත්ථ කතමානි අට්ඨ කුසීතවත්ථූනි: ඉධ භික්ඛුනා කම්මං කාතබ්බං හොති, තස්ස එවං හොති: කම්මං ඛො මෙ කාතබ්බං භවිස්සති. කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලමිස්සති. හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඨමං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං දුතියං කුසීතවත්ථු.

Free Distribution www.aathaapi.org

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි ද, තෙල ආත්මය ඇත, ' තෙලෙ නැතැ ' යි නො කියමි. එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි, භවත, සර්වප්‍රකාරයෙන් අකාසානඤ්චායතනය ඉක්මවා ' විඥනය අනන්ත ය ' යි විඤ්ඤණඤ්චායතනයට පැමිණි අන්‍ය ආත්මයෙක් ඇත් මැ යි, එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම දනිමි, දක්මි. භවත, ඒ ආත්මය යම් හෙයෙකින් ශරීරයාගේ භෙදයෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡෙදය විනාශය විභවය පනවති.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි ද, තෙල ආත්මය ඇත් මැ ය ' තෙලෙ නැතැ ' යි නො කියමි, එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි, භවත, සර්වප්‍රකාරයෙන් විඤ්ඤණඤ්චායතනය ඉක්මවා ' කිසිවක් නැතැ ' යි ආකිඤ්චඤ්ඤයතනයට පැමිණි අන්‍යආත්මයෙක් ඇත් මැ යි, එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම දනිමි, දක්මි. භවත, ඒ ආත්මය යම් හෙයෙකින් ශරීරයාගේ භෙදයෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, මෙතෙකින් භවත, මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතැම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡෙදය විනාශය විභවය පනවති.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි : භවත, තෝ යමක් කියෙහි නම් තෙල ආත්මය ඇත් ම ය ' තෙල නැතැ ' යි නො කියමි. එතෙකුදුවත් භවත, මේ ආත්මය මෙතෙකින් මොනොවට සිඳුණේ නො වෙයි. භවත, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤයතනය ඉක්මවා නෙවසඤ්ඤනාසඤ්ඤයතනයට පැමිණි අන්‍ය ආත්මයෙක් ඇත් මැ යි. එය තෝ නො දන්නෙහි ය, නො දක්නෙහි ය, එය මම දනිමි, දක්මි. භවත, ඒ ආත්මය යම් හෙයෙකින් ශරීරයාගේ භෙදයෙන් සිඳේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, මෙතෙකින් භවත, මේ ආත්මය මොනොවට සිඳුණේ වේ යයි මෙසේ ඇතම් කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡෙදය විනාශය පනවත්. මොහු සප්තදෘෂ්ටීහු වෙත්.

සප්තක යි.

---

998. එහි අෂ්ට ක්ලෙශවස්තුහු කවරහ යත් : ලොභ ය, ද්වෙෂ ය, මොහ ය, මාන ය, දෘෂ්ටි ය, විචිකිත්සා ය, ථීන ය, ඖද්ධත්‍ය යි. මොහු අෂ්ට ක්ලෙශවස්තුහු වෙත්.

999. එහි අෂ්ට කුසීදවස්තුහු කවරහ යත් : මෙ සස්නෙහි මහණහු විසින් කළයුතු කිසෙක් වෙයි, ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මා විසින් කළයුතු කිසෙක් වන්නේ ය, මා කිස කරන්නහුට කය ක්ලාන්ත වෙයි. මම හොවිම් නම් මැනැවැ යි හෙතෙම වැදහොවී. නො පැමිණියහු (ධ්‍යානාදිය) ගේ පැමිණීම පිණිස අනධිගතයා ගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ පළමු වැනි කුසීදවස්තුව වෙයි.

තවද අනෙකෙකි : මහණහු විසින් කිසෙක් කරනලද වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි, මම වනාහි කිසක් කෙළෙමි. මා කිස කරන්නහුට කය ක්ලාන්ත විය. මම හොවිම් නම් මැනැවැ යි හෙතෙම හොවී. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගත යාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ දෙවැනි කුසීදවස්තුව වෙයි.

පුන ච පරං භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති, තස්ස එවං හොති: මග්ගො ඛො පන මෙ ගන්තබ්බො භවිස්සති. මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමීති, සො නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං තතියං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති: අහං ඛො මග්ගං අගමාසිං. මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලන්තො හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති. න විරියං ආරභති. අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං චතුත්ථං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො කිලන්තො අකම්මඤ්ඤො, හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඤ්චමං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො කිලන්තො අකම්මඤ්ඤො මාසාචිතං මඤ්ඤෙ. හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං ඡට්ඨං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො. තස්ස එවං හොති: උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො ආබාධො අත්ථි කප්පො නිපජ්ජිතුං. හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං සත්තමං කුසීතවත්ථු.

පුන ච පරං භික්ඛු ගිලානා වුට්ඨිතො හොති අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, තස්ස එවං හොති: අහං ඛො ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස මෙ කායො දුබ්බලො අකම්මඤ්ඤො හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං අට්ඨමං කුසීතවත්ථු. ඉමානි අට්ඨ කුසීතවත්ථූනි.

1000. තත්ථ කතමෙසු අට්ඨසු ලොකධම්මෙසු චිත්තස්ස පටිඝාතො: ලාභෙ සාරාගො අලාභෙ පටිවිරොධො යසෙ සාරාගො අයසෙ පටිවිරොධො පසංසාය සාරාගො නින්දාය පටිවිරොධො සුඛෙ සාරාගො දුක්ඛෙ පටිවිරොධො, ඉමෙසු අට්ඨසු ලොකධම්මෙසු චිත්තස්ස පටිඝාතො.

Free Distribution www.aathaapi.org

තවද අනෙකෙක් : මහණහු විසින් මඟ යායුතු වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි, මා විනාහි මඟ යායුතු වෙයි, මා මඟ යන්නහුට කය ක්ලාන්ත වෙයි. මම හොවිම් නම් මැනැවැ යි හෙතෙම හොවී. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ තුන්වැනි කුසීදවස්තුව වෙයි.

තවද අනෙකෙක් : මහණහු විසින් මඟ ගියේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. මම මඟ ගියෙමි. මා මඟ යන්නහුට කය ක්ලාන්ත විය. මම් හොවිම් නම් මැනැවැ යි හෙතෙම හොවී. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ සතර වැනි කුසීදවස්තුව වෙයි.

තවද අනෙකෙක් : මහණ තෙම ගමෙක හෝ නියම්ගමෙක හෝ පිඩු පිණිස සරන්නේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජනයක් කැමැති තෙක් කුසපුරා නො ලබයි, ඔහුට මෙබඳු සිතෙක් වෙයි, මම විනාහි ගමෙහි හෝ නියම්ගමෙහි හෝ පිඩුපිණිස සරන්නෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජනයක් කැමැති තෙක් කුසපුරා නො ලද්දෙමි. ඒ මාගේ කය ක්ලාන්ත විය, අකර්මණ්‍ය විය, මම් හොවිම් නම් මැනැවැ යි හෙතෙම හොවී. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහු ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ පස් වැනි කුසීදවස්තුව වෙයි.

තවද අනෙකෙක් : මහණ තෙම ගමෙක හෝ නියම්ගමෙක හෝ පිඩු පිණිස සරන්නේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජනයක් කැමැති තෙක් කුසපුරා ලබයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි, මම විනාහි ගමෙහි හෝ නියම්ගමෙහි හෝ පිඩු පිණිස සරන්නෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජනයක් කැමැති තෙක් කුසපුරා ලදිමි. ඒ මාගේ කය ක්ලාන්ත විය, අකර්මණ්‍ය විය, (තෙත්) මැඇට පිරූ කලක් වැන්න. මම් හොවිම් නම් මැනැවැ යි හෙතෙම හොවියි. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහු ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ සවැනි කුසීදවස්තුව වෙයි.

තවද අනෙකෙක් : මහණහට අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි, ඔහුට මෙබඳු සිතෙක් වෙයි ; ' මට මේ අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ ය. නිදන්නට කැප ඇති, මම් නිදනුයෙම් නම් මැනැවැ ' යි. හෙතෙම නිදයි, නො පැමිණියහු ගේ පැමිණීම පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරෙයි. මේ සත් වැනි කුසීදවස්තුව වේ.

තවද අනෙකෙක් : මහණ තෙම ගිලන් ව සිට ඉන් නැඟුණේ ගිලන් බැවින් නැඟී නොබෝකල් ඇතියේ වෙයි, ඔහුට මෙබඳු සිතෙක් වෙයි, ' මම විනාහි ගිලනින් නැඟුණෙම් ගිලන් බැවින් නැඟී නොබෝකල් ඇතියෙමි, ඒ මාගේ කය දුබල ය අකර්මණ්‍ය ය, මම් හොවිම් නම් මැනැවැ ' යි හෙතෙම හොවියි. නො පැමිණියහුගේ පැමිණීම පිණිස අනධිගත යාගේ අධිගමය පිණිස ප්‍රත්‍යක්ෂ නො කළහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ නො කෙරේ. මේ අට වැනි කුසීදවස්තුව වේ. මොහු අෂ්ටකුසීදවස්තුහු වෙත්.

1000. එහි කවර අෂ්ටලොකධර්මයෙහි චිත්තයාගේ ප්‍රතිඝාතය වේ ද යත් : ලාභයෙහි බලවත් රාග ය, අලාභයෙහි ප්‍රතිවිරොධ ය, යශස්හි බලවත් රාග ය, අයශසෙහි ප්‍රතිවිරොධ ය, ප්‍රශංසායෙහි බලවත් රාග ය, නින්දයෙහි ප්‍රතිවිරොධ ය, සුඛයෙහි බලවත් රාග ය, දුඃඛයෙහි ප්‍රතිවිරොධ යයි. මේ අෂ්ටලොකධර්මයෙහි චිත්තයාගේ ප්‍රතිඝාතය වේ.

1001. තත්ථ කතමෙ අට්ඨ අනරියවොහාරා: අදිට්ඨෙ දිට්ඨවාදිතා, අස්සුතෙ සුතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා, දිට්ඨෙ අදිට්ඨවාදිතා, සුතෙ අස්සුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා. ඉමෙ අට්ඨ අනරියවොහාරා.

1002. තත්ථ කතමෙ අට්ඨ මිච්ඡත්තා: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තො, මිච්ඡාආජීවො, මිච්ඡාවායාමො, මිච්ඡාසති, මිච්ඡාසමාධි. ඉමෙ අට්ඨමිච්ඡත්තා.

1003. තත්ථ කතමෙ අට්ඨ පුරිසදොසා: ඉධ භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො න සරාමි න සරාමී'ති අසතියාව නිබ්බෙඨෙති. අයං පඨමො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති, සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො චොදකං යෙව පටිප්ඵරති. කිං නු ඛො තුය්හං බාලස්ස අව්‍යත්තස්ස භණිතෙන, ත්වම්පි නාම මං භණිතබ්බං මඤ්ඤසීති. අයං දුතියො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති, සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො චොදකංයෙව පච්චාරොපෙති. ත්වම්පි ඛොසි ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො, ත්වං තාව පඨමං පටිකරොහීති අයං තතියො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. බහිද්ධා කථං අපනාමෙති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං චතුත්ථො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො සඞ්ඝමජ්ඣෙ බාහා වික්ඛෙපකං භණති. අයං පඤ්චමො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො නෙවාහං ආපන්නොස්මි න පනාහං අනාපන්නොස්මීති තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති. අයං ඡට්ඨො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො අනාදියිත්වා සඞ්ඝං, අනාදියිත්වා චොදකං, සාපත්තිකොව යෙන කාමං පක්කමති. අයං සත්තමො පුරිසදොසො.

පුන ච පරං භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො එවමාහ: කිං නු ඛො තුම්හෙ ආයස්මන්තො අතිබාළ්හං මයි බ්‍යාවටා, ඉදානාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමීති. සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා එවමාහ: 'ඉදානි ඛො තුම්හෙ ආයස්මන්තො අත්තමනා හොථා'ති. අයං අට්ඨමො පුරිසදොසො. ඉමෙ අට්ඨ පුරිසදොසා.

1001. එහි අෂ්ට අනාර්‍ය්‍යව්‍යවහාරයෝ කවරහ යත් : අදෘෂ්ටයෙහි දෘෂ්ටවාදී බව ය, අශ්‍රැතයෙහි ශ්‍රැතවාදී බව ය, අමුතයෙහි මුතවාදී බව ය, අවිඥාතයෙහි විඥාතවාදී බව ය, දෘෂ්ටයෙහි අදෘෂ්ටවාදී බව ය, ශ්‍රැතයෙහි අශ්‍රැතවාදී බව ය, මුතයෙහි අමුතවාදී බව ය, විඥාතයෙහි අවිඥාතවාදී බව යි. මොහු අෂ්ට අනාර්‍ය්‍යව්‍යවහාරයෝ යි.

1002. එහි අෂ්ට මිථ්‍යාත්වයෝ කවරහ යත් : මිථ්‍යාදෘෂ්ටි ය, මිථ්‍යාසංකල්ප ය, මිථ්‍යාවචන ය, මිථ්‍යාකර්මාන්ත ය, මිථ්‍යාආජීව ය, මිථ්‍යාව්‍යායාම ය, මිථ්‍යාස්මෘති ය, මිථ්‍යාසමාධි යි. මොහු අෂ්ට මිථ්‍යාත්වයෝ යි.

1003. එහි අෂ්ට පුරුෂදෝෂයෝ කවරහ යත් : මෙ සස්නෙහි මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ නො සිහි කෙරෙමි, නො සිහි කෙරෙමි නො සිහියෙන් ම මිදෙයි. මේ පළමු වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ ' බොළඳ වූ අව්‍යක්ත වූ තාගේ කථායෙන් කිම ? තො ද මා කියයුත්තකු කොට හඟනෙහි ද ' යි චෝදකයාහට ම පටහැනි වෙයි. මේ දෙ වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ ' තො ද මෙ නම් ඇවැතට පැමිණියෙහි, තෝ පළමු කොට පිළියම් කරව ' යි චෝදකයාහට ම ප්‍රත්‍යාරෝපණය කෙරේ. මේ තුන් වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ අනෙකකින් අනෙකක් පිළි සොයයි. කථාව බැහැරට නමයි. කෝපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරේ. මේ සතර වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ සඟ මැද අත් සලමින් කථා කෙරෙයි. මේ පස් වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ ' මම් නො ම අවන්මි, යළි මම් නො අවන්නෙම් නො වෙමි ' තූෂ්ණීම්භූත ව සඞ්ඝයා වෙහෙසයි. මේ ස වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ සඞ්ඝයා අනාදර කොට චෝදකයා අනාදර කොට සාපත්තික ව ම කැමැති තැනෙක යේ. මේ සත් වැනි පුරුෂදෝෂය වෙයි.

තවද අනෙකෙකි : මහණහු මහණහට ඇවැතින් චෝදනා කෙරෙති. ඒ මහණ තෙම මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන්නේ මෙසේ කියයි : ' ඇවැත්නි, නුඹ වහන්සේ මා කෙරෙහි කුමට ඉතා දැඩි ව (පමණ ඉක්ම) ව්‍යාපෘතවවූ ද ? දැන් මම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට පෙරළෙමි ' යි. හෙතෙම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි ව මෙසේ කියයි : ' ඇවැත්නි, දැන් නුඹ වහන්සේ සතුටුසිතැති වවූ ' යයි. මේ අට වැනි පුරුෂදෝෂය වේ. මොහු අෂ්ට පුරුෂදෝෂයෝ යි.

18 – ශ්‍රී 17626 (3/75)

1004. තත්ථ කතමෙ අට්ඨ අසඤ්ඤීවාදා: රූපී අත්තා හොති අරොගො පරම්මරණාති අසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අරූපී අත්තා -පෙ- රූපී ච අරූපී ච -පෙ- නෙවරූපී නාරූපී -පෙ- අන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති අසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අනන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති. අසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අන්තවා ච අනන්තවා ච අත්තා හොති අරොගො පරම්මරණාති අසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. නෙවන්තවා නානන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති අසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. ඉමෙ අට්ඨ අසඤ්ඤීවාදා.

1005. තත්ථ කතමෙ අට්ඨ නෙවසඤ්ඤී නාසඤ්ඤීවාදා: රූපී අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අරූපී අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. රූපී ච අරූපී ච අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. නෙව රූපී නා රූපී අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤපෙන්ති. අනන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අන්තවා ච අනන්තවා ච අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. නෙවන්තවා නානන්තවා අත්තා හොති අරොගො පරම්මරණාති නෙවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. ඉමෙ අට්ඨ නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා.

අට්ඨකං.

---

1006. තත්ථ කතමානි නව ආඝාතවත්ථූනි: අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති. අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති. අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි, අනත්ථං චරති, අනත්ථං චරිස්සතීති. ආඝාතො ජායති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි, අත්ථං චරති, අත්ථං චරිස්සතීති ආඝාතො ජායති. ඉමානි නව ආඝාතවත්ථූනි.

1007. තත්ථ කතමානි නව පුරිසමලානි: කොධො මක්ඛො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං මුසාවාදො පාපිච්ඡතා මිච්ඡාදිට්ඨි ඉමානි නව පුරිසමලානි.

1008. තත්ථ කතමෙ නවවිධා මානා: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො, සෙය්‍යස්ස සදිසො හමස්මීති මානො, සෙය්‍යස්ස හීනො හමස්මීති මානො, සදිසස්ස සෙය්‍යො හමස්මීති මානො, සදිසස්ස සදිසො හමස්මීති මානො, සදිසස්ස හීනො හමස්මීති මානො, හීනස්ස සෙය්‍යො හමස්මීති මානො, හීනස්ස සදිසො හමස්මීති මානො, හීනස්ස හීනො හමස්මීති මානො. ඉමෙ නවවිධා මානා.

1004. එහි අෂ්ට අසංඥීවාදයෝ කවරහ යත්: ආත්මය රූප ඇත්තේ වෙයි, මරණින් මත්තෙහි නිත්‍ය වේ යැ යි ද, ඒ ආත්මය අසංඥී යැ යි ද පනවති. ආත්මය රූප නැත්තේ වෙයි . . . රූප ඇත්තේ ද රූප නැත්තේ ද වෙයි . . . නො ම රූප ඇත්තේ නො ද රූප නැත්තේ වෙයි . . . ආත්මය අනන්තවත් වෙයි, මරණින් මත්තෙහි නිත්‍ය වේ යැ යි ද ඒ ආත්මය අසංඥී යැ යි ද පනවති. ආත්මය අනන්තවත් වෙයි, මරණින් මත්තෙහි නිත්‍ය වේ යැ යි ද, එය අසංඥී යැ යි ද පනවති. ආත්මය අන්තවත් ද අනන්තවත් ද වෙයි, මරණින් මත්තෙහි නිත්‍ය වේ යැ යි ද එය අසංඥී යැ යි ද පනවති. ආත්මය නො ම අන්තවත් නොද අනන්තවත් වෙයි, මරණින් මත්තෙහි නිත්‍ය වේ යැ යි ද එය අසංඥී යැ යි ද පනවත්. මොහු අෂ්ට අසංඥීවාදයෝ යි.

1005. එහි අෂ්ට නෛවසංඥීනාසංඥීවාදයෝ කවරහ යත්: ආත්මය රූපවත් වෙයි. මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති, ආත්මය අරූපි වෙයි, මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති, ආත්මය රූපිත් අරූපිත් වෙයි. මරණින් මතු නිත්‍ය වේ යැ යි ද එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති. ආත්මය නෛවරූපිනාරූපි වෙයි. මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති. ආත්මය අන්තවත් වෙයි, මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති. ආත්මය අන්තවත් නො වෙයි, මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති. ආත්මය අන්තවත් ද අනන්තවත් ද වෙයි, මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවති. ආත්මය නො ම අන්තවත් නොද අනන්තවත් වෙයි. මරණින් මතු නිත්‍ය වේ යැ යි ද, එය නෛවසංඥීනාසංඥී යැ යි ද පනවත්. මොහු අෂ්ට නෛවසංඥීනාසංඥීවාදයෝ යි.

අෂ්ටක යි.

---

1006. එහි නව ආඝාතවස්තූහු කවරහ යත්: මට අනර්ථයක් කෙළේ යැ යි ආඝාතයෙක් උපදී. මට අනර්ථයක් කෙරේ යැ යි ආඝාතයෙක් උපදියි. මට අනර්ථයක් කරන්නේ යැ යි ආඝාතයෙක් උපදියි. මාගේ ප්‍රියමනාපයහට අනර්ථයක් කෙළේ ය, අනර්ථයක් කෙරෙයි, අනර්ථයක් කරන්නේ යැ යි ආඝාතයෙක් උපදියි. මාගේ අප්‍රිය අමනාපයහට අර්ථයක් කෙළේ ය, අර්ථයක් කෙරෙයි, අර්ථයක් කරන්නේ යැ යි ආඝාතයෙක් උපදී. මොහු නව ආඝාතවස්තූහු වෙත්.

1007. එහි නව පුරුෂමලයෝ කවරහ යත්: ක්‍රොධ ය, මකු බව ය. ඊර්ෂ්‍යා ය, මාත්සර්‍ය්‍ය ය, මායා ය, ශඨ බව ය, මෘෂාවාද ය, පාපෙච්ඡතා ය, මිථ්‍යාදෘෂ්ටි යි. මොහු නව පුරුෂමලයෝ යි.

1008. එහි නවවිධ මානයෝ කවරහ යත්: මම ශ්‍රෙෂ්ඨයහට ශ්‍රෙෂ්ඨයෙමි යන මාන ය, මම ශ්‍රෙෂ්ඨයහට සදෘශයෙමි යන මාන ය, මම ශ්‍රෙෂ්ඨයහට හීනයෙමි යන මාන ය, මම සදෘශයහට ශ්‍රෙෂ්ඨයෙමි යන මාන ය, මම සදෘශයහට සදෘශයෙමි යන මාන ය, මම සදෘශයහට හීනයෙමි යන මාන ය, මම හීනයහට ශ්‍රෙෂ්ඨයෙමි යන මාන ය, මම හීනයහට සදෘශයෙමි යන මාන ය, මම හීනයහට හීනයෙමි යන මාන යි. මොහු නවවිධ මානයෝ යි.

1009. තත්ථ කතමෙ නව තණ්හාමූලකා ධම්මා: තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං දණ්ඩාදානසත්ථාදානකලහවිග්ගහවිවාදතුවංතුවංපෙසුඤ්ඤමුසාවාදා, අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. ඉමෙ නව තණ්හාමූලකා ධම්මා.

1010. තත්ථ කතමානි නව ඉඤ්ජිතානි: 'අස්මී'ති ඉඤ්ජිතමෙතං 'අහමස්මී'ති ඉඤ්ජිතමෙතං, 'අයමහමස්මී'ති ඉඤ්ජිතමෙතං, 'භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං, 'රූපී භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං, 'අරූපී භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං, 'සඤ්ඤී භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං, 'අසඤ්ඤී භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං, 'නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්ස'න්ති ඉඤ්ජිතමෙතං. ඉමානි නව ඉඤ්ජිතානි.

1011. තත්ථ කතමානි නව මඤ්ඤිතානි--පෙ--නව ඵන්දිතානි --පෙ-- නව පපඤ්චිතානි --පෙ-- නව සඞ්ඛතානි: 'අස්මී'ති සඞ්ඛතමෙතං, 'අහමස්මී'ති සඞ්ඛතමෙතං, 'අයමහමස්මී'ති සඞ්ඛතමෙතං, 'භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, 'රූපී භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, 'අරූපී භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, 'සඤ්ඤී භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, 'අසඤ්ඤී භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, 'නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්ස'න්ති සඞ්ඛතමෙතං, ඉමානි නව සඞ්ඛතානි.

නවකං

---

1012. තත්ථ කතමානි දස කිලෙසවත්ථූනි: ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං, ඉමානි දස කිලෙසවත්ථූනි.

1013 තත්ථ කතමානි දස ආඝාතවත්ථූනි: අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි අනත්ථං චරති අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි අත්ථං චරති අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති, ඉමානි දස ආඝාතවත්ථූනි.

1014. තත්ථ කතමෙ දස අකුසලකම්මපථා: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි, ඉමෙ දස අකුසලකම්මපථා.

1015. තත්ථ කතමානි දස සඤ්ඤොජනානි: කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං, මානසඤ්ඤොජනං, දිට්ඨිසඤ්ඤොජනං, විචිකිච්ඡාසඤ්ඤොජනං, සීලබ්බතපරාමාසසඤ්ඤොජනං, භවරාගසඤ්ඤොජනං, ඉස්සාසඤ්ඤොජනං, මච්ඡරියසඤ්ඤොජනං, අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි දස සඤ්ඤොජනානි.

Free Distribution www.aathaapi.org

1009. එහි නව තෘෂ්ණාමූලකධර්මයෝ කවරහ යත්: තෘෂ්ණාව නිසා (රූපාදි අරමුණු) සෙවීම ය, පර්‍යෙෂණය නිසා ලාභ ය, ලාභය නිසා තෘෂ්ණාදෘෂ්ටිවිනිශ්චය ය, විනිශ්චය නිසා ඡන්දරාග ය, ඡන්දරාගය නිසා (මම ය මාගේ ය යන) අධ්‍යවසාන ය, අධ්‍යවසානය නිසා තෘෂ්ණාදෘෂ්ටි පරිග්‍රහ ය, පරිග්‍රහය නිසා මාත්සර්‍ය්‍ය ය, මාත්සර්‍ය්‍යය නිසා ආරක්ෂාව ය, ආරක්ෂාව හෙතු කොට දඬුගැනීම ය, අවිගැනීම ය, කලහ ය, විග්‍රහ ය, විවාද ය, තෝ තෝ යන බස ය, පෛශුන්‍ය ය, මෘෂාවාද ය යන මොහු ය, නොයෙක් ලාමක අකුශලධර්මයෝ ය, යන මොහු වෙත්. මොහු නව තෘෂ්ණාමූලකධර්මයෝ යි.

1010. එහි නව ඉඤ්ජිතයෝ කවරහ යත්: 'වෙමි' යන තෙල ඉඤ්ජිතයෙක, 'මම වෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'මේ මම වෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'රූපී වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'අරූපී වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'සංඥී වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'අසංඥී වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙක, 'නෛවසංඥීනාසංඥී වන්නෙමි' තෙල ඉඤ්ජිතයෙකි. මොහු නව ඉඤ්ජිතයෝ යි.

1011. එහි නව මඤ්ඤිතයෝ කවරහ යත්: . . . නව එන්දිතයෝ . . නවපපඤ්චිතයෝ . . . නව සඞ්ඛතයෝ කවරහ යත්: 'වෙමි' තෙල සඞ්ඛතයෙක, 'මම වෙමි' තෙල සඞ්ඛතයෙක, 'මේ මම වෙමි' තෙල සඞ්ඛතයෙක, 'වන්නෙමි' තෙල සඞ්ඛතයෙක, 'රූපී වන්නෙමි' තෙල සඞ්ඛතයෙක, 'අරූපී වන්නෙමි' තෙල සඞ්ඛතයෙක, 'සංඥී වන්නෙමි' තෙල සඞ්ඛතයෙක, 'අසංඥී වන්නෙමි' තෙල සඞ්ඛතයෙක, 'නෛවසංඥීනාසංඥී වන්නෙමි' තෙල සඞ්ඛතයෙකි. මොහු නව සඞ්ඛතයෝ යි.

නවක යි.

---

1012. එහි දශ ක්ලෙශවස්තූහු කවරහ යත්: ලොභ ය, ද්වෙෂ ය, මොහ ය, මාන ය, දෘෂ්ටි ය, විචිකිත්සා ය, ස්ත්‍යාන ය, ඖද්ධත්‍ය ය, අහ්‍රීක ය, අනපත්‍රපා යි. මොහු දශකෙලෙශවස්තූහු වෙත්.

1013. එහි දශ ආඝාතවස්තු කවරහ යත්: මට අනර්ථ කළැ යි ආඝාත උපදී. මට අනර්ථ කෙරේ යැ යි ආඝාත උපදී. මට අනර්ථ කරන්නේ යැ යි ආඝාත උපදී. මාගේ ප්‍රියමනාපයහට අනර්ථ කෙළේ ය. අනර්ථ කෙරෙයි. අනර්ථ කරන්නේ යැ යි ආඝාත උපදී. මාගේ අප්‍රියඅමනාපයහට අර්ථ කෙළේ ය, අර්ථ කෙරෙයි, අර්ථ කරන්නේ යැ යි ආඝාත උපදී. යළි අස්ථානයෙහි හෝ ආඝාත උපදී. මොහු දශ ආඝාතවස්තු වෙත්.

1014. එහි දශ අකුශලකර්මපථයෝ කවරහ යත්: ප්‍රාණවධ ය, අදත්තාදාන ය, කාමමිථ්‍යාචාර ය, මෘෂාවාද ය, පිශුනවචන ය, පරුෂවචන ය, සම්ඵප්‍රලාප ය, අභිධ්‍යා ය, ව්‍යාපාද ය, මිථ්‍යාදෘෂ්ටි යි. මොහු දශ අකුශලකර්මපථයෝ යි.

1015. එහි දශ සංයොජනයෝ කවරහ යත්: කාමරාගසංයොජන ය, ප්‍රතිඝසංයොජන ය, මානසංයොජන ය, දෘෂ්ටිසංයොජන ය, විචිකිත්සාසංයොජන ය, ශීලව්‍රතපරාමර්ශසංයොජන ය, භවරාගසංයොජන ය, ඊර්ෂ්‍යාසංයොජන ය, මාත්සර්‍ය්‍යසංයොජන ය, අවිද්‍යාසංයොජන යි. මොහු දශ සංයොජනයෝ යි.

1016. තත්ථ කතමෙ දස මිච්ඡත්තා: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණං මිච්ඡාවිමුත්ති, ඉමෙ දස මිච්ඡත්තා.

1017. තත්ථ කතමා දසවත්ථුකා මිච්ඡාදිට්ඨි: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති, අයං දසවත්ථුකා මිච්ඡාදිට්ඨි.

1018. තත්ථ කතමා දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න හොති ච තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, අයං දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි.

දසකං.

---

1019. තත්ථ කතමානි අට්ඨාරස තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය: අස්මීති හොති, ඉත්ථස්මීති හොති, එවස්මීති හොති, අඤ්ඤථාස්මීති හොති, භවිස්සන්ති හොති, ඉත්ථං භවිස්සන්ති හොති. එවං භවිස්සන්ති හොති. අඤ්ඤථා භවිස්සන්ති හොති, අසස්මීති[1] හොති, සතස්මීති[2] හොති, සියන්ති හොති, ඉත්ථං සියන්ති හොති, එවං සියන්ති හොති, අඤ්ඤථා සියන්ති හොති, අපාහං සියන්ති හොති, අපාහං ඉත්ථං සියන්ති හොති, අපාහං එවං සියන්ති හොති, අපාහං අඤ්ඤථා සියන්ති හොති.

කථඤ්ච අස්මීති හොති: කඤ්චි ධම්මං අනවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අස්මීති ඡන්දං පටිලභති. අස්මීති මානං පටිලභති අස්මීති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉත්ථස්මීති වා එවස්මීති වා අඤ්ඤථාස්මීති වා.

කථඤ්ච ඉත්ථස්මීති හොති: ඛත්තියොස්මීති වා බ්‍රාහ්මණොස්මීති වා වෙස්සොස්මීති වා සුද්දොස්මීති වා ගහට්ඨොස්මීති වා පබ්බජිතොස්මීති වා දෙවොස්මීති වා මනුස්සොස්මීති වා රූපීස්මීති වා අරූපීස්මීති වා සඤ්ඤීස්මීති වා අසඤ්ඤීස්මීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීස්මීති වා, එවං ඉත්ථස්මීති හොති.

---

1. සස්මීති - සිරිමු.
2. අසස්මීති - සිරිමු, සාතස්මීති - මජසං, සයා.

1016. එහි දශ මිථ්‍යාත්වයෝ කවරහ යත්: මිථ්‍යාදෘෂ්ටි ය, මිථ්‍යාසංකල්ප ය, මිථ්‍යාවාක් ය, මිථ්‍යාකර්මාන්ත ය, මිථ්‍යාජීව ය, මිථ්‍යාව්‍යායාම ය, මිථ්‍යාස්මෘති ය, මිථ්‍යාසමාධි ය, මිථ්‍යාඥාන ය, මිථ්‍යාවිමුක්ති යි. මොහු දශ මිථ්‍යාත්වයෝ යි.

1017. එහි දශ වස්තුකමිථ්‍යාදෘෂ්ටි කවර යත්: දුන්දෙයෙහි විපාක නැත, පුදනලද්දෙයෙහි විපාක නැත, හවනලද්දෙයෙහි විපාක නැත, සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක නැත, මෙලොව නැත, පරලොව නැත, මව් නැත, පියා නැත, ඖපපාතිකසත්ත්වයෝ නැත. ලොව යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ ම දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම්, එබඳු සම්‍යග්ගත වූ සම්‍යක්ප්‍රතිපන්න වූ ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් නැතැ යි. මේ දශ වස්තුකමිථ්‍යාදෘෂ්ටි වේ.

1018. එහි දශවස්තුක අන්තග්‍රාහිකදෘෂ්ටි කවර යත්: ලොකය ශාශ්වතැ යි හෝ ලොකය අශාශ්වතැ යි හෝ ලොකය අන්තවත් යැ යි හෝ ලොකය අනන්තවත් යැ යි හෝ එ මැ ජීව ය එ මැ ශරීර යැ යි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි හෝ, සත්ත්ව තෙමේ මරණින් මතු වෙයි හෝ, සත්ත්ව තෙමේ මරණින් මතු නො වෙයි හෝ, සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේත් නො වන්නේත් වේ යැ යි හෝ සත්ත්ව තෙමේ මරණින් මතු නො ම වෙයි නො වන්නේ නො වෙයි හෝ යි. මේ දශවස්තුක අන්තග්‍රාහිකාදෘෂ්ටි වේ.

දශකා යි.

---

1019. එහි ආධ්‍යාත්මිකපඤ්චස්කන්ධය නිසා පවත්නා අටළොස් තෘෂ්ණාවිචරිතයෝ කවරහ යත්: (මම) 'වෙමි' (තෘෂ්ණාව) වෙයි, 'මේ ප්‍රකාර වෙමි' තෘෂ්ණා වෙයි, 'මෙසේ වෙමි' තෘෂ්ණාව වෙයි, 'අන් ප්‍රකාරයෙකින් වෙමි' තෘෂ්ණා වෙයි, (මම) 'වන්නෙමි' තෘෂ්ණා වෙයි, 'මේ ප්‍රකාරයෙන් වන්නෙමි' වෙයි, 'මෙසේ වන්නෙමි, වෙයි, 'අන් ප්‍රකාරයෙකින් වන්නෙමි' වෙයි, 'ශාශ්වතයෙමි' වෙයි, 'අශාශ්වතයෙමි' වෙයි, 'වන්නෙම් දෝහො' යි වෙයි. 'මේ ප්‍රකාරයෙන් වන්නෙම් දෝහො' යි වෙයි, මෙසේ වන්නෙම් දෝහො' යි වෙයි, අන් ප්‍රකාරයෙකින් වන්නෙම් දෝහො' යි වෙයි, 'වන්නෙම් නම් මැනැවැ' යි වෙයි. 'මේ ප්‍රකාරයෙන් වන්නෙම් නම් මැනැවැ' යි වෙයි, 'මෙසේ වන්නෙම් නම් මැනැවැ' යි වෙයි, අන් ප්‍රකාරයෙකින් වන්නෙම් නම් මැනැවැ' යි වේ.

කිසෙයින් 'වෙමි' වේ ද යත්: කිසිදහමක් රූපය, වෙදනාව, සංඥව සංස්කාරයන් විඥනය නො වෙන් කොටගෙන මම වෙමි' යි තෘෂ්ණාවට පැමිණෙයි. 'මම වෙමි' යි මානයට පැමිණෙයි, 'මම වෙමි' යි දෘෂ්ටියට පැමිණෙයි. ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි 'මේ ප්‍රකාර වෙමි' යි හෝ 'මෙසේ වෙමි' යි හෝ 'අන් ප්‍රකාරයෙකින් වෙමි' යි හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙති.

කිසෙයින් 'මේ ප්‍රකාර වෙමි' වේ ද යත්: ක්ෂත්‍රියයෙමි හෝ බ්‍රාහ්මණයෙමි හෝ වෛශ්‍යයෙමි හෝ ශුද්‍රයෙමි හෝ ගෘහස්ථයෙමි හෝ ප්‍රව්‍රජිතයෙමි හෝ දිව්‍යයෙමි හෝ මනුෂ්‍යයෙමි හෝ රූපි වෙමි හෝ අරූපි වෙමි හෝ සංඥී වෙමි හෝ අසංඥී වෙමි හෝ නෛවසංඥීනාසංඥී වෙමි හෝ 'මේ ප්‍රකාර වෙමි' යි වේ.

කථඤ්ච එවස්මීති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො තථාහං ඛත්තියොස්මීති වා, යථා සො බ්‍රාහ්මණො තථාහං බ්‍රාහ්මණොස්මීති වා, යථා සො වෙස්සො තථාහං වෙස්සොස්මීති වා, යථා සො සුද්දො, තථාහං සුද්දොස්මීති වා, යථා සො ගහට්ඨො තථාහං ගහට්ඨොස්මීති වා, යථා සො පබ්බජිතො තථාහං පබ්බජිතොස්මීති වා, යථා සො දෙවො තථාහං දෙවොස්මීති වා යථා සො මනුස්සො තථාහං මනුස්සොස්මීති වා, යථා සො රූපී තථාහං රූපීස්මීති වා, යථා සො අරූපී තථාහං අරූපීස්මීති වා, යථා සො සඤ්ඤී තථාහං සඤ්ඤීස්මීති වා, යථා සො අසඤ්ඤී තථාහං අසඤ්ඤීස්මීති වා, යථා සො නෙවසඤ්ඤී නාසඤ්ඤී තථාහං නෙවසඤ්ඤී නාසඤ්ඤීස්මීති වා, එවං එවස්මීති හොති.

කථඤ්ච අඤ්ඤථාස්මීති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො නාහං තථා ඛත්තියොස්මීති වා, යථා සො බ්‍රාහ්මණො නාහං තථා බ්‍රාහ්මණොස්මීති වා, යථා සො වෙස්සො නාහං තථා වෙස්සොස්මීති වා, යථා සො සුද්දො නාහං තථා සුද්දොස්මීති වා, යථා සො ගහට්ඨො නාහං තථා ගහට්ඨොස්මීති වා, යථා සො පබ්බජිතො නාහං තථා පබ්බජිතොස්මීති වා, යථා සො දෙවො නාහං තථා දෙවොස්මීති වා, යථා සො මනුස්සො නාහං තථා මනුස්සොස්මීති වා, යථා සො රූපී නාහං තථා රූපීස්මීති වා, යථා සො අරූපී නාහං තථා අරූපීස්මීති වා, යථා සො සඤ්ඤී නාහං තථා සඤ්ඤීස්මීති වා, යථා සො අසඤ්ඤී නාහං තථා අසඤ්ඤීස්මීති වා, යථා සො නෙවසඤ්ඤී නාසඤ්ඤී නාහං තථා නෙවසඤ්ඤී නාසඤ්ඤීස්මීති වා, එවං අඤ්ඤථාස්මීති හොති.

කථඤ්ච භවිස්සන්ති හොති: කඤ්චි ධම්මං අනවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං භවිස්සන්ති ඡන්දං පටිලභති, භවිස්සන්ති මානං පටිලභති. භවිස්සන්ති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉත්ථං භවිස්සන්ති වා එවං භවිස්සන්ති වා අඤ්ඤථා භවිස්සන්ති වා.

කථඤ්ච ඉත්ථං භවිස්සන්ති හොති: ඛත්තියො භවිස්සන්ති වා, බ්‍රාහ්මණො භවිස්සන්ති වා, වෙස්සො භවිස්සන්ති වා, සුද්දො භවිස්සන්ති වා, ගහට්ඨො භවිස්සන්ති වා, පබ්බජිතො භවිස්සන්ති වා, දෙවො භවිස්සන්ති වා, මනුස්සො භවිස්සන්ති වා, රූපී භවිස්සන්ති වා, අරූපී භවිස්සන්ති වා, සඤ්ඤී භවිස්සන්ති වා, අසඤ්ඤී භවිස්සන්ති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං ඉත්ථං භවිස්සන්ති හොති.

කථඤ්ච එවං භවිස්සන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො තථාහං ඛත්තියො භවිස්සන්ති වා, යථා සො බ්‍රාහ්මණො තථාහං බ්‍රාහ්මණො භවිස්සන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී තථාහං නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං භවිස්සන්ති හොති.

කථඤ්ච අඤ්ඤථා භවිස්සන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො නාහං තථා ඛත්තියො භවිස්සන්ති වා, යථා සො බ්‍රාහ්මණො නාහං තථා බ්‍රාහ්මණො භවිස්සන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤී නාසඤ්ඤී නාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං අඤ්ඤථා භවිස්සන්ති හොති.

Free Distribution www.aathaapi.org

කිසෙයින් ' මෙසේ වෙමි ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්ෂත්‍රියයෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණයෙමි හෝ යම්සේ හෙතෙම වෛශ්‍ය වේ නම් එසෙයින් මම වෛශ්‍යයෙමි හෝ යම්සේ හෙතෙම ශුද්‍ර වේ නම් එසෙයින් මම ශුද්‍රයෙමි හෝ යම්සේ හෙතෙම ගෘහස්ථ වේ නම් එසෙයින් මම ගෘහස්ථයෙමි හෝ යම්සේ හෙතෙම ප්‍රව්‍රජිත වේ නම් එසෙයින් මම ප්‍රව්‍රජිතයෙමි හෝ යම්සේ හෙතෙම දිව්‍ය වේ නම් එසෙයින් මම දිව්‍යයෙමි හෝ යම්සේ හෙතෙම රූපී වේ නම් එසෙයින් මම රූපී වෙමි හෝ යම්සේ හෙතෙම අරූපී වේ නම් එසෙයින් මම අරූපී වෙමි හෝ යම්සේ හෙතෙම සංඥී වේ නම් එසෙයින් මම සංඥී වෙමි හෝ යම්සේ හෙතෙම අසංඥී වේ නම් එසෙයින් මම අසංඥී වෙමි හෝ යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥීනාසංඥී වෙමි හෝ මෙසෙයින් ' මෙසේ වෙමි ' යි වේ.

කිසෙයින් ' අන් ප්‍රකාරයෙකින් වෙමි ' වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්ෂත්‍රිය නො වෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ නො වෙමි හෝ යම්සේ හෙතෙම වෛශ්‍ය වේ නම් එසෙයින් මම වෛශ්‍ය නො වෙමි හෝ යම්සේ හෙතෙම ශුද්‍ර වේ නම් එසෙයින් මම ශුද්‍ර නො වෙමි හෝ යම්සේ හෙතෙම ගෘහස්ථ වේ නම් එසෙයින් මම ගෘහස්ථ නො වෙමි හෝ යම්සේ හෙතෙම ප්‍රව්‍රජිත වේ නම් එසෙයින් මම ප්‍රව්‍රජිත නො වෙමි හෝ යම්සේ හෙතෙම දෙවි වේ නම් එසෙයින් මම දෙවි නො වෙමි හෝ යම්සේ හෙතෙම මනුෂ්‍ය වේ නම් එසෙයින් මම මනුෂ්‍ය නො වෙමි හෝ යම්සේ හෙතෙම රූපී වේ නම් එසෙයින් මම රූපී නො වෙමි හෝ යම්සේ හෙතෙම අරූපී වේ නම් එසෙයින් මම අරූපී නො වෙමි හෝ යම්සේ හෙතෙම සංඥී වේ නම් එසෙයින් මම සංඥී නො වෙමි හෝ යම්සේ හෙතෙම අසංඥී වේ නම් එසෙයින් මම අසංඥී නො වෙමි හෝ යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥීනාසංඥී නො වෙමි හෝ මෙසෙයින් ' අන් ප්‍රකාරයෙකින් වෙමි ' යි වේ.

කිසෙයින් ' වන්නෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය නො වෙන් කොටගෙන මම වන්නෙමි තෘෂ්ණාවට පැමිණෙයි, වන්නෙමි මානයට පැමිණෙයි. වන්නෙමි දෘෂ්ටියට පැමිණෙයි, ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මේ ප්‍රකාරයෙන් වන්නෙමි හෝ මෙසේ වන්නෙමි හෝ අන් ප්‍රකාරයෙකින් වන්නෙමි හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් ' මේ ප්‍රකාරයෙන් වන්නෙමි ' යි වේ ද යත් : ක්ෂත්‍රිය වන්නෙමි හෝ බ්‍රාහ්මණ වන්නෙමි හෝ වෛශ්‍ය වන්නෙමි හෝ ශුද්‍ර වන්නෙමි හෝ ගෘහස්ථ වන්නෙමි හෝ ප්‍රව්‍රජිත වන්නෙමි හෝ දිව්‍ය වන්නෙමි හෝ මනුෂ්‍ය වන්නෙමි හෝ රූපී වන්නෙමි හෝ අරූපී වන්නෙමි හෝ සංඥී වන්නෙමි හෝ අසංඥී වන්නෙමි හෝ නෛවසංඥීනාසංඥී වන්නෙමි හෝ මෙසෙයින් ' මේ ප්‍රකාරයෙන් වන්නෙමි ' යි වේ.

කිසෙයින් ' මෙසේ වන්නෙමි ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේනම් එසෙයින් මම ක්ෂත්‍රිය වන්නෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ වන්නෙමි හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥීනාසංඥී වන්නෙමි හෝ මෙසෙයින් ' මෙසේ වන්නෙමි ' යි වේ.

කිසෙයින් අන් ප්‍රකාරයෙකින් වන්නෙමි ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්‍ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්‍ෂත්‍රිය නො වන්නෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාග්මණ නො වන්නෙමි හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥීනාසංඥී නො වන්නෙමි හෝ මෙසෙයින් ' අන් ප්‍රකාරයෙකින් වන්නෙමි ' යි වේ.

කථඤ්ච අසස්මීති හොති: කඤ්චි ධම්මං අනවකාරිං[1] කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං නිච්චොස්මි ධුවොස්මි සස්සතොස්මි අවිපරිණාමධම්මොස්මීති එවං අසස්මීති හොති.

කථඤ්ච සතස්මීති හොති: කඤ්චි ධම්මං අනවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං උච්ඡිජ්ජිස්සාමි විනස්සිස්සාමි න භවිස්සාමීති, එවං සතස්මීති හොති.

කථඤ්ච සියන්ති හොති: කඤ්චි ධම්මං අනවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං සියන්ති ඡන්දං පටිලභති, සියන්ති මානං පටිලභති, සියන්ති දිට්ඨිං පටිලභති, තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉත්ථං සියන්ති වා, එවං සියන්ති වා, අඤ්ඤථා සියන්ති වා.

කථඤ්ච ඉත්ථං සියන්ති හොති: ඛත්තියො සියන්ති වා, බ්‍රාහ්මණො සියන්ති වා, වෙස්සො සියන්ති වා, සුද්දො සියන්ති වා, ගහට්ඨො සියන්ති වා, පබ්බජිතො සියන්ති වා, දෙවො සියන්ති වා, මනුස්සො සියන්ති වා, රූපි සියන්ති වා, අරූපි සියන්ති වා, සඤ්ඤී සියන්ති වා, අසඤ්ඤී සියන්ති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං ඉත්ථං සියන්ති හොති.

කථඤ්ච එවං සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො තථාහං ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො තථාහං බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී, තථාහං නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං එවං සියන්ති හොති.

කථඤ්ච අඤ්ඤථා සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො නාහං තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො නාහං තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී නාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං අඤ්ඤථා සියන්ති හොති.

කථඤ්ච අපාහං සියන්ති හොති: කඤ්චි ධම්මං අනවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අපාහං සියන්ති ඡන්දං පටිලභති. අපාහං සියන්ති මානං පටිලභති. අපාහං සියන්ති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: අපාහං ඉත්ථං සියන්ති වා, අපාහං එවං සියන්ති වා, අපාහං අඤ්ඤථා සියන්ති වා.

කථඤ්ච අපාහං ඉත්ථං සියන්ති හොති: අපාහං ඛත්තියො සියන්ති වා, අපාහං බ්‍රාහ්මණො සියන්ති වා, අපාහං වෙස්සො සියන්ති වා, අපාහං සුද්දො සියන්ති වා, අපාහං ගහට්ඨො සියන්ති වා, අපාහං පබ්බජිතො සියන්ති වා, අපාහං දෙවො සියන්ති වා, අපාහං මනුස්සො සියන්ති වා, අපාහං රූපි සියන්ති වා, අපාහං අරූපි සියන්ති වා, අපාහං සඤ්ඤී සියන්ති වා, අපාහං අසඤ්ඤී සියන්ති වා, අපාහං නෙවසඤ්ඤී නාසඤ්ඤී සියන්ති වා. එවං අපාහං ඉත්ථං සියන්ති හොති.

---

1. අනවකාරී - සිමු.

කිසෙයින් ' ශාශ්වතයෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය නො වෙන් කොටගෙන මම නිත්‍යයෙමි ධ්‍රැවයෙමි ශාශ්වතයෙමි විපරිණාමස්වභාව නැත්තෙමි ' යි මෙසෙයින් ' ශාශ්වතයෙමි ' යි වේ.

කිසෙයින් අශාශ්වතයෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය නො වෙන් කොටගෙන මම සිඳෙන්නෙමි වැනැසෙන්නෙමි නො වන්නෙමි ' යි මෙසෙයින් ' අශාශ්වතයෙමි ' යි වේ.

කිසෙයින් වන්නෙම් දෝහො යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය නො වෙන් කොටගෙන මම වන්නෙම් දෝ හො යි තෘෂ්ණාවට පැමිණෙයි, වන්නෙම් දෝ හො යි මානයට පැමිණෙයි, වන්නෙම් දෝ හො යි දෘෂ්ටියට පැමිණෙයි. ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මේ ප්‍රකාරයෙන් වන්නෙම් දෝහෝ කියා හෝ මෙසේ වන්නෙම් දෝහෝ කියා හෝ අන් ප්‍රකාරයෙකින් වන්නෙම් දෝහෝ කියා හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් මේ ප්‍රකාරයෙන් වන්නෙම් දෝහො ' යි වේ ද යත් : ක්ෂත්‍රිය වන්නෙම් දෝහො යි කියා හෝ බ්‍රාහ්මණ වන්නෙම් දෝහො යි කියා හෝ වෛශ්‍ය වන්නෙම් දෝහො යි කියා හෝ ශුද්‍ර වන්නෙම් දෝහො යි කියා හෝ ගෘහස්ථ වන්නෙම් දෝහො ' යි කියා හෝ ප්‍රව්‍රජිත වන්නෙම් දෝහො ' යි කියා හෝ දිව්‍ය වන්නෙම් දෝහො ' යි කියා හෝ මනුෂ්‍ය වන්නෙම් දෝහො ' යි කියා හෝ රූපී වන්නෙම් දෝහො ' යි කියා හෝ අරූපී වන්නෙම් දෝහො ' යි කියා හෝ සංඥී වන්නෙම් දෝහො ' යි කියා හෝ අසංඥී වන්නෙම්දෝහො ' යි කියා හෝ නෛවසංඥිනාසංඥී වන්නෙම් දෝහො ' යි කියා හෝ මෙසෙයින් ' මේ ප්‍රකාරයෙන් වන්නෙම් දෝහො ' යි වේ.

කිසෙයින් මෙසේ වන්නෙම් දෝහො ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්ෂත්‍රිය වන්නෙම් දෝහො ' යි කියා හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ වන්නෙම් දෝහො ' යි කියා හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥිනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥී නාසංඥී වන්නෙම් දෝහො ' යි කියා හෝ මෙසෙයින් ' මෙසේ වන්නෙම් දෝහො ' යි යනු වේ.

කිසෙයින් අන් ප්‍රකාරයෙකින් වන්නෙම් දෝහො ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්ෂත්‍රිය නො වන්නෙම් දෝහො ' යි කියා හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ නො වන්නෙම් දෝහො ' යි කියා හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥිනාසංඥී වේ නම් එසෙයින් මම නෛවසංඥිනාසංඥී නො වන්නෙම් දෝහො ' යි කියා හෝ මෙසෙයින් 'අන් ප්‍රකාරයෙකින් වන්නෙම් දෝහො' යනු වේ.

කිසෙයින් මම වන්නෙම් නම් මැනැවැයි වේ ද යත් : කිසිදහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය නො වෙන් කොටගෙන මම වන්නෙම් නම් මැනැවැ ' යි තෘෂ්ණාවට පැමිණෙයි, මම වන්නෙම් නම් මැනැවැ යි මානයට පැමිණෙයි, මම වන්නෙම් නම් මැනැවැ යි දෘෂ්ටියට පැමිණෙයි. ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මම මේ ප්‍රකාරයෙන් වන්නෙම් නම් මැනැවැ ' යි හෝ මම මෙසේ වන්නෙම් නම් මැනැවැ යි හෝ මම අන් ප්‍රකාරයෙකින් වන්නෙම් නම් මැනැවැ 'යි හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් ' මම මේ ප්‍රකාරයෙන් වන්නෙම් නම් මැනැවැ ' යි වේ ද යත් : මම ක්ෂත්‍රිය වන්නෙම් නම් මැනැවැ යි හෝ මම බ්‍රාහ්මණ වන්නෙම් නම් මැනැවැ යි හෝ මම වෛශ්‍ය වන්නෙම් නම් මැනැවැ යි හෝ මම ශුද්‍ර වන්නෙම් නම් මැනැවැ යි හෝ මම ගෘහස්ථ වන්නෙම් නම් මැනැවැ යි හෝ මම පැවිදි වන්නෙම් නම් මැනැවැ යි හෝ මම දෙව් වන්නෙම් නම් මැනැවැ යි හෝ මම මිනිස් වන්නෙම් නම් මැනැවැ යි හෝ මම රූපී වන්නෙම් නම් මැනැවැ යි හෝ මම අරූපී වන්නෙම් නම් මැනැවැ යි හෝ මම සංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මම අසංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මම නෛවසංඥී නාසංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් ' මම මේ ප්‍රකාරයෙන් වන්නෙම් නම් මැනැව ' යනු වේ.

කථඤ්ච අපාහං එවං සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො අපාහං තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො අපාහං තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී අපාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා. එවං අපාහං එවං සියන්ති හොති.

කථඤ්ච අපාහං අඤ්ඤථා සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො අපාහං න තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො අපාහං න තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී අපාහං න තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා. එවං අපාහං අඤ්ඤථා සියන්ති හොති. ඉමානි අට්ඨාරස තණ්හා විචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය.

තත්ථ කතමානි අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය: ඉමිනා අස්මීති හොති. ඉමිනා ඉත්ථස්මීති හොති. ඉමිනා එවස්මීති හොති. ඉමිනා අඤ්ඤථාස්මීති හොති ඉමිනා භවිස්සන්ති හොති ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති. ඉමිනා එවං භවිස්සන්ති හොති ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති හොති. ඉමිනා අසස්මීති හොති. ඉමිනා සතස්මීති හොති. ඉමිනා සියන්ති හොති. ඉමිනා ඉත්ථං සියන්ති හොති ඉමිනා එවං සියන්ති හොති. ඉමිනා අඤ්ඤථා සියන්ති හොති. ඉමිනා අපාහං සියන්ති හොති. ඉමිනා අපාහං ඉත්ථං සියන්ති හොති, ඉමිනා අපාහං එවං සියන්ති හොති ඉමිනා අපාහං අඤ්ඤථා සියන්ති හොති.

කථඤ්ච ඉමිනා අස්මීති හොති: කඤ්චි ධම්මං අවකාරිං[1] කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං. ඉමිනා අස්මීති ඡන්දං පටිලභති. ඉමිනා අස්මීති මානං පටිලභති. ඉමිනා අස්මීති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉමිනා ඉත්ථස්මීති වා, ඉමිනා එවස්මීති වා ඉමිනා අඤ්ඤථාස්මීති වා.

කථඤ්ච ඉමිනා ඉත්ථස්මීති හොති: ඉමිනා ඛත්තියොස්මීති වා, ඉමිනා බ්‍රාහ්මණොස්මීති වා, ඉමිනා වෙස්සොස්මීති වා, ඉමිනා සුද්දොස්මීති වා, ඉමිනා ගහට්ඨොස්මීති වා, ඉමිනා පබ්බජිතොස්මීති වා, ඉමිනා දෙවොස්මීති වා. ඉමිනා මනුස්සොස්මීති වා, ඉමිනා රූපීස්මීති වා, ඉමිනා අරූපීස්මීති වා, ඉමිනා සඤ්ඤීස්මීති වා, ඉමිනා අසඤ්ඤීස්මීති වා, ඉමිනා නෙවසඤ්ඤීනාසඤ්ඤීස්මීති වා, එවං ඉමිනා ඉත්ථස්මීති හොති.

කථඤ්ච ඉමිනා එවස්මීති හොති: පර පුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා තථාහං ඛත්තියොස්මීති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා තථාහං බ්‍රාහ්මණොස්මීති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා තථාහං නෙවසඤ්ඤීනාසඤ්ඤීස්මීති වා, එවං ඉමිනා එවස්මීති හොති.

කථඤ්ච ඉමිනා අඤ්ඤථාස්මීති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා නාහං තථා ඛත්තියොස්මීති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා නාහං තථා බ්‍රාහ්මණොස්මීති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා නාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤීස්මීති වා, එවං ඉමිනා අඤ්ඤථාස්මීති හොති.

1. අවකාරී - සිමු.

කිසෙයින් 'මම මෙසේ වත්නෙම් නම් මැනැවැ' යි වේ ද යත්: පරපුඟුලකු පිළිස යම්සේ හෙතෙම ක්‍ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්‍ෂත්‍රිය වත්නෙම් නම් මැනැවැ යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ වත්නෙම් නම් මැනැවැ යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසඤ්ඤීනාසඤ්ඤී වේ නම් එසෙයින් මම නෙවසඤ්ඤීනාසඤ්ඤී වත්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් 'මම මෙසේ වත්නෙම් නම් මැනැව' යනු වේ.

කිසෙයින් 'මම අන් ප්‍රකාරයෙකින් වත්නෙම් නම් මැනැවැ' යි වේ ද යත්: පරපුඟුලකු පිළිස යම්සේ හෙතෙම ක්‍ෂත්‍රිය වේ නම් එසෙයින් මම ක්‍ෂත්‍රිය නො වත්නෙම් නම් මැනැවැ යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම බ්‍රාහ්මණ නො වත්නෙම් නම් මැනැවැ යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසඤ්ඤීනාසඤ්ඤී වේ නම් එසෙයින් මම නෙවසඤ්ඤීනාසඤ්ඤී නො වත්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් 'මම අන් ප්‍රකාරයෙකින් වත්නෙම් නම් මැනැවැ' යනු වේ. මොහු ආධ්‍යාත්මික ස්කන්ධපඤ්චකය ගෙන අටළොස් තෘෂ්ණාවිචරිතයෝ යි.

එහි බාහිර ස්කන්ධපඤ්චකය ගෙන අටළොස් තෘෂ්ණාවිචරිතයෝ කවරහ යත්: මෙයින් (මම) වෙමි වෙයි, මෙයින් මෙ ප්‍රකාරයෙන් වෙමි වෙයි, මෙයින් මෙසේ වෙමි වෙයි, මෙයින් අන් ප්‍රකාරයෙකින් වෙමි වෙයි, මෙයින් (මම) වත්නෙමි වෙයි, මෙයින් මෙ ප්‍රකාරයෙන් වත්නෙමි වෙයි, මෙයින් මෙසේ වත්නෙමි වෙයි, මෙයින් අන් ප්‍රකාරයෙකින් වත්නෙමි වෙයි, මෙයින් ශාශ්වතයෙමි වෙයි, මෙයින් අශාශ්වතයෙමි වෙයි, මෙයින් වත්නෙම් දෝහො යි වෙයි, මෙයින් මෙ ප්‍රකාරයෙන් වත්නෙම් දෝහො යි වෙයි, මෙයින් මෙසේ වත්නෙම් දෝහො යි වෙයි, මෙයින් අන් ප්‍රකාරයෙකින් වත්නෙම් දෝහො යි වෙයි, මෙයින් මම වත්නෙම් නම් මැනැවැ යි වෙයි, මෙයින් මම මේ ප්‍රකාරයෙන් වත්නෙම් නම් මැනැවැ යි වෙයි, මෙයින් මම මෙසේ වත්නෙම් නම් මැනැවැ යි වෙයි, මෙයින් මම අන් ප්‍රකාරයෙකින් වත්නෙම් නම් මැනැවැ යි වේ.

කිසෙයින් 'මෙයින් (මම) වෙමි' යි වේ ද යත්: කිසි ධර්මයක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය වෙන් කොටගෙන මෙයින් '(මම) වෙමි' යි තෘෂ්ණාවට පැමිණෙයි, මෙයින් 'වෙමි' යි මානයට පැමිණෙයි, මෙයින් 'වෙමි' යි දෘෂ්ටියට පැමිණෙයි, ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මෙයින් මේ ප්‍රකාරයෙන් වෙමි හෝ මෙයින් මෙසේ වෙමි හෝ මෙයින් අන් ප්‍රකාරයෙකින් වෙමි හෝ මෙ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් මෙයින් මෙ ප්‍රකාරයෙන් වෙමි' යි වේ ද යත්: මෙයින් ක්‍ෂත්‍රිය වෙමි හෝ මෙයින් බ්‍රාහ්මණ වෙමි හෝ මෙයින් වෛශ්‍ය වෙමි හෝ මෙයින් ශූද්‍ර වෙමි හෝ මෙයින් ගැහැවි වෙමි හෝ මෙයින් පැවිදි වෙමි හෝ මෙයින් දෙව් වෙමි හෝ මෙයින් මිනිස් වෙමි හෝ මෙයින් රූපී වෙමි හෝ මෙයින් අරූපී වෙමි හෝ මෙයින් සංඥී වෙමි හෝ මෙයින් අසංඥී වෙමි හෝ මෙයින් නෙවසඤ්ඤීනාසඤ්ඤී වෙමි හෝ මෙසේ 'මෙයින් මෙ ප්‍රකාරයෙන් වෙමි' යි වේ.

කිසෙයින් 'මෙයින් මෙසේ වෙමි' යි වේ ද යත්: පරපුඟුලකු පිළිස යම්සේ හෙතෙම ක්‍ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්‍ෂත්‍රිය වෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ වෙමි හෝ . . . යම්සේ හෙතෙම නෙවසඤ්ඤීනාසඤ්ඤී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසඤ්ඤීනාසඤ්ඤී වෙමි හෝ මෙසේ මෙයින් මෙසේ වෙමි' යි වේ.

කිසෙයින් මෙයින් අන් ප්‍රකාරයෙකින් වෙමි' යි වේ ද යත්: පරපුඟුලකු පිළිස යම්සේ හෙතෙම ක්‍ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්‍ෂත්‍රිය නො වෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ නො වෙමි හෝ . . . යම්සේ හෙතෙම නෙවසඤ්ඤීනාසඤ්ඤී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසඤ්ඤීනාසඤ්ඤී නො වෙමි හෝ මෙසේ මෙයින් අන් ප්‍රකාරයෙකින් වෙමි' යි වේ.

කථඤ්ච ඉමිනා භවිස්සන්ති හොති: කඤ්චිධම්මං අවකාරිං[1] කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ඉමිනා භවිස්සන්ති ඡන්දං පටිලභති. ඉමිනා භවිස්සන්ති මානං පටිලභති: ඉමිනා භවිස්සන්ති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉමිනා ඉත්ථං භවිස්සන්ති වා, ඉමිනා එවං භවිස්සන්ති වා, ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති වා.

කථඤ්ච ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති: ඉමිනා ඛත්තියො භවිස්සන්ති වා -පෙ- ඉමිනා අරූපී භවිස්සන්ති වා, ඉමිනා සඤ්ඤී භවිස්සන්ති වා, ඉමිනා අසඤ්ඤී භවිස්සන්ති වා, ඉමිනා නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති.

කථඤ්ච ඉමිනා එවං භවිස්සන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා තථාහං ඛත්තියො භවිස්සන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා තථාහං බ්‍රාහ්මණො භවිස්සන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා තථාහං නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං ඉමිනා එවං ගවිස්සන්ති හොති.

කථඤ්ච ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා නාහං තථා ඛත්තියො භවිස්සන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා නාහං තථා බ්‍රාහ්මණො භවිස්සන්ති වා -පෙ යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා නාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති වා, එවං ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති හොති.

කථඤ්ච ඉමිනා අසස්මීති හොති: කඤ්චි ධම්මං අවකාරිං[1] කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ඉමිනා නිච්චොස්මි ධුවොස්මි සස්සතොස්මි අවිපරිණාමධම්මොස්මීති, එවං ඉමිනා අසස්මීති හොති.

කථඤ්ච ඉමිනා සතස්මීති හොති: කඤ්චි ධම්මං අවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ඉමිනා උච්ඡිජ්ජිස්සාමි විනස්සිස්සාමි න භවිස්සාමීති, එවං ඉමිනා සතස්මීති හොති.

කථඤ්ච ඉමිනා සියන්ති හොති: කිඤ්චි ධම්මං අවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං, ඉමිනා සියන්ති ඡන්දං පටිලභති, ඉමිනා සියන්ති මානං පටිලභති, ඉමිනා සියන්ති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉමිනා ඉත්ථං සියන්ති වා, ඉමිනා එවං සියන්ති වා, ඉමිනා අඤ්ඤථා සියන්ති වා.

කථඤ්ච ඉමිනා ඉත්ථං සියන්ති හොති: ඉමිනා ඛත්තියො සියන්ති වා, ඉමිනා බ්‍රාහ්මණො සියන්ති වා, ඉමිනා වෙස්සො සියන්ති වා, ඉමිනා සුද්දො සියන්ති වා, ඉමිනා ගහට්ඨො සියන්ති වා, ඉමිනා පබ්බජිතො සියන්ති වා, ඉමිනා දෙවො සියන්ති වා, ඉමිනා මනුස්සො සියන්ති වා, ඉමිනා රූපී සියන්ති වා, ඉමිනා අරූපී සියන්ති වා, ඉමිනා සඤ්ඤී සියන්ති වා, ඉමිනා අසඤ්ඤී සියන්ති වා, ඉමිනා නෙවසඤ්ඤී නාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා ඉත්ථං සියන්ති හොති.

1. අවකාරී - සිමු.

කිසෙයින් ' මෙයින් (මම) වන්නෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය වෙන් කොටගෙන මෙයින් වන්නෙමි තෘෂ්ණාවට පැමිණෙයි, මෙයින් වන්නෙමි මානයට පැමිණෙයි, මෙයින් වන්නෙමි දෘෂ්ටියට පැමිණෙයි, ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මෙයින් මේ ප්‍රකාරයෙන් වන්නෙමි හෝ මෙයින් මෙසේ වන්නෙමි හෝ මෙයින් අන් ප්‍රකාරයෙකින් වන්නෙමි හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් ' මෙයින් මේ ප්‍රකාරයෙන් වන්නෙමි ' යි වේ ද යත් : මෙයින් ක්ෂත්‍රි වන්නෙමි හෝ . . . මෙයින් අරූපී වන්නෙමි හෝ මෙයින් සංඥී වන්නෙමි හෝ මෙයින් අසංඥී වන්නෙමි හෝ මෙයින් නෛවසංඥීනාසංඥී වන්නෙමි හෝ මෙසේ ' මෙයින් මේ ප්‍රකාර වන්නෙමි ' යි වේ.

කිසෙයින් ' මෙයින් මෙසේ වන්නෙමි ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය වන්නෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ වන්නෙමි හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෛවසංඥීනාසංඥී වන්නෙමි හෝ මෙසෙයින් ' මෙයින් මෙසේ වන්නෙමි ' යි වේ.

කිසෙයින් ' මෙයින් අන් ප්‍රකාරයෙකින් වන්නෙමි ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය නො වන්නෙමි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ නො වන්නෙමි හෝ . . . යම්සේ හෙතෙම නෛවසංඥීනාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෛවසංඥීනාසංඥී නො වන්නෙමි හෝ මෙසෙයින් ' මෙයින් අන් ප්‍රකාර වන්නෙමි ' යි වේ.

කිසෙයින් ' මෙයින් ශාශ්වතයෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය වෙන් කොටගෙන මෙයින් නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, අවිපරිණාමස්වභාව ඇත්තෙමි ' යි මෙසෙයින් ' මෙයින් ශාශ්වතයෙමි ' යි වේ.

කිසෙයින් ' මෙයින් මම අශාශ්වතයෙමි ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය වෙන් කොටගෙන මෙයින් සිඳෙන්නෙමි, වැනැසෙන්නෙමි, නො වන්නෙමි ' යි මෙසෙයින් ' මෙයින් අශාශ්වතයෙමි ' යි වේ.

කිසෙයින් ' මෙයින් වන්නෙම දෝහො ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය වෙන් කොටගෙන මෙයින් වන්නෙම දෝහො ' යි තෘෂ්ණාවට පැමිණෙයි, මෙයින් වන්නෙම දෝහො ' යි මානයට පැමිණෙයි, මෙයින් වන්නෙම දෝහො යි දෘෂ්ටියට පැමිණෙයි, ඒ තුන් ප්‍රපඤ්චයන් ඇති කල්හි මෙයින් මේ ප්‍රකාර වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් මෙසේ වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් අන් ප්‍රකාර වන්නෙම දෝහෝ කියා හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් ' මෙයින් මේ ප්‍රකාර වන්නෙම දෝහො ' යි වේ ද යත් : මෙයින් ක්ෂත්‍රිය වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් බ්‍රාහ්මණ වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් වෛශ්‍ය වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් ශුද්‍ර වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් ගැහැවි වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් පැවිදි වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් දෙවි වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් මිනිස් වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් රූපී වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් අරූපී වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් සංඥී වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් අසංඥී වන්නෙම දෝහෝ කියා හෝ මෙයින් නෛවසංඥීනාසංඥී වන්නෙම දෝහෝ කියා හෝ මෙසෙයින් ' මෙයින් මේ ප්‍රකාර වන්නෙම දෝහො ' යි වේ.

කථඤ්ච ඉමිනා එවං සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා තථාහං ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා තථාහං බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා තථාහං නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා එවං සියන්ති හොති.

කථඤ්ච ඉමිනා අඤ්ඤථා සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා නාහං තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා නාහං තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා නාහං තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා අඤ්ඤථා සියන්ති හොති.

කථඤ්ච ඉමිනා අපාහං සියන්ති හොති: කඤ්චි ධම්මං අවකාරිං කරිත්වා රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ඉමිනා අපාහං සියන්ති ඡන්දං පටිලභති, ඉමිනා අපාහං සියන්ති මානං පටිලභති, ඉමිනා අපාහං සියන්ති දිට්ඨිං පටිලභති. තස්මිං සති ඉමානි පපඤ්චිතානි හොන්ති: ඉමිනා අපාහං ඉත්ථං සියන්ති වා, ඉමිනා අපාහං එවං සියන්ති වා, ඉමිනා අපාහං අඤ්ඤථා සියන්ති වා.

කථඤ්ච ඉමිනා අපාහං ඉත්ථං සියන්ති හොති: ඉමිනා අපාහං ඛත්තියො සියන්ති වා, ඉමිනා අපාහං බ්‍රාහ්මණො සියන්ති වා, ඉමිනා අපාහං වෙස්සො සියන්ති වා, ඉමිනා අපාහං සුද්දො සියන්ති වා, ඉමිනා අපාහං ගහට්ඨො සියන්ති වා, ඉමිනා අපාහං පබ්බජිතො සියන්ති වා, ඉමිනා අපාහං දෙවො සියන්ති වා, ඉමිනා අපාහං මනුස්සො සියන්ති වා, ඉමිනා අපාහං රූපී සියන්ති වා, ඉමිනා අපාහං අරූපී සියන්ති වා, ඉමිනා අපාහං සඤ්ඤී සියන්ති වා, ඉමිනා අපාහං අසඤ්ඤී සියන්ති වා, ඉමිනා අපාහං නෙවසඤ්ඤී, නාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා අපාහං ඉත්ථං සියන්ති හොති.

කථඤ්ච ඉමිනා අපාහං එවං සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා අපාහං තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා අපාහං තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤී නාසඤ්ඤී ඉමිනා අපාහං තථා නෙවසඤ්ඤී නාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා අපාහං එවං සියන්ති හොති.

කථඤ්ච ඉමිනා අපාහං අඤ්ඤථා සියන්ති හොති: පරපුග්ගලං උපනිධාය යථා සො ඛත්තියො ඉමිනා අපාහං න තථා ඛත්තියො සියන්ති වා, යථා සො බ්‍රාහ්මණො ඉමිනා අපාහං න තථා බ්‍රාහ්මණො සියන්ති වා -පෙ- යථා සො නෙවසඤ්ඤීනාසඤ්ඤී ඉමිනා අපාහං න තථා නෙවසඤ්ඤීනාසඤ්ඤී සියන්ති වා, එවං ඉමිනා අපාහං අඤ්ඤථා සියන්ති හොති. ඉමානි අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය.

කිසෙයින් ' මෙයින් මෙසේ වන්නෙම් දෝහො ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය වන්නෙම් දෝහො යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ වන්නෙම් දෝහො ' යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසංඥානාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසංඥානාසංඥී වන්නෙම් දෝහො යි හෝ මෙසෙයින් ' මෙයින් මෙසේ වන්නෙම් දෝහො ' යි වේ.

කිසෙයින් ' මෙයින් අන් ප්‍රකාර වන්නෙම් දෝහො ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය නො වන්නෙම් දෝහො යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ නො වන්නෙම් දෝහො ' යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසංඥානාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසංඥානාසංඥී නො වන්නෙම් දෝහො ' යි මෙසෙයින් ' මෙයින් අන් ප්‍රකාර වන්නෙම් දෝහො ' යි වේ.

කිසෙයින් ' මෙයින් මම වන්නෙම් නම් මැනැවැ ' යි වේ ද යත් : කිසි දහමක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය වෙන් කොටගෙන මෙයින් මම වන්නෙම් නම් මැනැවැ ' යි තෘෂ්ණාවට පැමිණෙයි, මෙයින් මම වන්නෙම් නම් මැනැවැ යි මානයට පැමිණෙයි, මෙයින් මම වන්නෙම් නම් මැනැවැ යි දෘෂ්ටියට පැමිණෙයි. ඒ තුන් ප්‍රපඤ්ච යන් ඇති කල්හි මෙයින් මම මේ ප්‍රකාර වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම මෙසේ වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම අන් ප්‍රකාරයෙකින් වන්නෙම් නම් මැනැවැ යි හෝ මේ ප්‍රපඤ්චිතයෝ වෙත්.

කිසෙයින් ' මෙයින් මම මේ ප්‍රකාර වන්නෙම් නම් මැනැවැ ' යි වේ ද යත් : මෙයින් මම ක්ෂත්‍රිය වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම බ්‍රාහ්මණ වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම වෛශ්‍ය වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම ශූද්‍ර වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම ගැහැවි වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම පැවිදි වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම දෙවි වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම මිනිස් වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම රූපී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම අරූපී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම සංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම අසංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙයින් මම නෙවසංඥානාසංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් ' මෙයින් මම මේ ප්‍රකාර වන්නෙම් නම් මැනැවැ ' යි වේ.

කිසෙයින් ' මෙයින් මම මෙසේ වන්නෙම් නම් මැනැවැ ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය වන්නෙම් නම් මැනැවැ යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ වන්නෙම් නම් මැනැවැ යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසංඥානාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසංඥානාසංඥී වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් ' මෙයින් මම මෙසේ වන්නෙම් නම් මැනැවැ ' යි වේ.

කිසෙයින් ' මෙයින් මම අන් ප්‍රකාරයෙකින් වන්නෙම් නම් මැනැවැ ' යි වේ ද යත් : පරපුඟුලකු පිණිස යම්සේ හෙතෙම ක්ෂත්‍රිය වේ නම් එසෙයින් මම මෙයින් ක්ෂත්‍රිය නො වන්නෙම් නම් මැනැවැ යි හෝ යම්සේ හෙතෙම බ්‍රාහ්මණ වේ නම් එසෙයින් මම මෙයින් බ්‍රාහ්මණ නො වන්නෙම් මැනැවැ යි හෝ . . . යම්සේ හෙතෙම නෙවසංඥී නාසංඥී වේ නම් එසෙයින් මම මෙයින් නෙවසංඥානාසංඥී නො වන්නෙම් නම් මැනැවැ යි හෝ මෙසෙයින් ' මෙයින් මම අන් ප්‍රකාරයෙකින් වන්නෙම් නම් මැනැවැ ' යි වේ. මොහු බාහිර ස්කන්ධපඤ්චකය ගැන අටළොස් තෘෂ්ණාවිචරිතයෝ යි.

19—ශ්‍රී 17626 (3/75)

ඉති ඉමානි අට්ඨාරස තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය, ඉමානි අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය. තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා ඡත්තිංස තණ්හාවිචරිතානි හොන්ති. ඉති එවරූපානි අතීතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, අනාගතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, පච්චුප්පන්නානි ඡත්තිංස තණ්හාවිචරිතානි, තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා අට්ඨතණ්හාවිචරිතසතං හොති.

තත්ථ කතමානි ද්වාසට්ඨි දිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ වෙය්‍යාකරණෙ වුත්තානි භගවතා: චත්තාරො සස්සතවාදා, චත්තාරො එකච්චසස්සතිකා, චත්තාරො අන්තානන්තිකා, චත්තාරො අමරාවික්ඛෙපිකා, ද්වෙ අධිච්චසමුප්පන්නිකා, සොළස සඤ්ඤීවාදා, අට්ඨ අසඤ්ඤීවාදා, අට්ඨ නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා, සත්ත උච්ඡෙදවාදා, පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා, ඉමානි ද්වාසට්ඨි දිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ වෙය්‍යාකරණෙ වුත්තානි භගවතාති.

ඛුද්දකවත්ථුවිභඞ්ගො නිට්ඨිතො.

මෙසේ මේ ආධ්‍යාත්මිකස්කන්ධපඤ්චකය ගැන අටළොස් තෘෂ්ණාවිචරිතයෝ ය, මේ බාහිරස්කන්ධපඤ්චකය ගැන අටළොස් තෘෂ්ණාවිචරිතයෝ ය යි ඒ සියල්ල එක් අයුරෙකින් කැටි කොට හකුළුවා සතිස් තෘෂ්ණාවිචරිතයෝ වෙති. මෙසේ මෙබඳු අතීත වූ සතිස් තෘෂ්ණාවිචරිතයෝ ය, අනාගත වූ සතිස් තෘෂ්ණාවිචරිතයෝ ය, ප්‍රත්‍යුත්පන්න වූ සතිස් තෘෂ්ණාවිචරිතයෝ ය යි ඒ සියල්ල එක් අයුරෙකින් කැටි කොට හකුළුවා එක්සියඅටක් තෘෂ්ණාවිචරිත වේ.

එහි භාග්‍යවතුන් විසින් බ්‍රහ්මජාලවෛයාකරණයෙහි වදළ දෙසැට දෘෂ්ටිගතයෝ කවරහ යත්: සතර ශාශ්වතවාදයෝ ය, සතර ඒකත්‍යශාශ්වතිකයෝ ය, සතර අන්තානන්තිකයෝ ය, සතර අමරාවික්ෂෙපිකයෝ ය, අධීත්‍යසමුත්පන්නවාද ඇතියෝ දෙදෙන ය, සොළොස් සංඥීවාදයෝ ය, අසංඥීවාදයෝ අටදෙන ය, නෛවසඤ්ඤීනාසඤ්ඤීවාදයෝ අටදෙන ය, උච්ඡෙදවාදයෝ සත්දෙන ය, දෘෂ්ටධර්මනිර්වාණවාදයෝ පස්දෙන යි, මොහු භාග්‍යවතුන් විසින් බ්‍රහ්මජාලවෛයාකරණයෙහි වදළ දෙසැට දෘෂ්ටිගතයෝ යි.

ඛුද්දකවත්ථුවිභඞ්ග නිමි.

---

# 18. ධම්මහදය විභඞ්ගො

## 1

1020. කති ඛන්ධා: කති ආයතනානි: කති ධාතුයො: කති සච්චානි: කති ඉන්ද්‍රියානි: කති හෙතු: කති ආහාරා: කති ඵස්සා: කති වෙදනා: කති සඤ්ඤා: කති චෙතනා: කති චිත්තානි:

1021. පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරසධාතුයො, චත්තාරි සච්චානි, බාවීසතින්ද්‍රියානි, නව හෙතු, චත්තාරො ආහාරා, සත්ත ඵස්සා, සත්ත වෙදනා, සත්ත සඤ්ඤා, සත්ත චෙතනා, සත්ත චිත්තානි.

1022. තත්ථ කතමෙ පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති පඤ්චක්ඛන්ධා

1023. තත්ථ කතමානි ද්වාදසායතනානි: චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. ඉමානි වුච්චන්ති ද්වාදසායතනානි.

1024. තත්ථ කතමා අට්ඨාරසධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛු-විඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. ඉමා වුච්චන්ති අට්ඨාරසධාතුයො.

1025. තත්ථ කතමානි චත්තාරි සච්චානි: දුක්ඛසච්චං සමුදයසච්චං නිරොධසච්චං මග්ගසච්චං. ඉමානි වුච්චන්ති චත්තාරි සච්චානි.

1026. තත්ථ කතමානි බාවීසතින්ද්‍රියානි: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි වුච්චන්ති බාවීසතින්ද්‍රියානි.

1027. තත්ථ කතමෙ නව හෙතු: තයො කුසලහෙතු, තයො අකුසල-හෙතු, තයො අව්‍යාකතහෙතු. තත්ථ කතමෙ තයො කුසලහෙතු: අලොභො කුසලහෙතු, අදොසො කුසලහෙතු, අමොහො කුසලහෙතු, ඉමෙ තයො කුසලහෙතු. තත්ථ කතමෙ තයො අකුසලහෙතු, ලොභො අකුසලහෙතු, දොසො අකුසලහෙතු, මොහො අකුසලහෙතු, ඉමෙ තයො අකුසලහෙතු. තත්ථ කතමෙ තයො අව්‍යාකතහෙතු: කුසලානං වා ධම්මානං විපාකතො කිරියාව්‍යාකතෙසු වා ධම්මෙසු අලොභො අදොසො අමොහො, ඉමෙ තයො අව්‍යාකතහෙතු. ඉමෙ වුච්චන්ති නව හෙතු.



Free Distribution www.aathaapi.org

# 18. ධම්මහදය විභඞ්ගය

## 1

1020. ස්කන්ධයෝ කෙතෙක් ද, ආයතනයෝ කෙතෙක් ද, ධාතූහු කෙතෙක් ද, සත්‍යයෝ කෙතෙක් ද, ඉන්ද්‍රියයෝ කෙතෙක් ද, හෙතූහු කෙතෙක් ද, ආහාරයෝ කෙතෙක් ද, ස්පර්ශයෝ කෙතෙක් ද, වේදනා කෙතෙක් ද, සංඥා කෙතෙක් ද, චේතනා කෙතෙක් ද, චිත්තයෝ කෙතෙක් ද යත් :

1021. ස්කන්ධ පසෙකි, ආයතන දොළොසෙකි, ධාතු අටළොසෙකි, සත්‍ය සතරෙකි, ඉන්ද්‍රිය දෙවිස්සෙකි, හෙතු නවයෙකි, ආහාර සතරෙකි, ස්පර්ශ සතෙකි, වේදනා සතෙකි, සංඥා සතෙකි, චේතනා සතෙකි, චිත්ත සතෙකි.

1022. එහි පඤ්චස්කන්ධයෝ කවරහ යත් : රූපස්කන්ධ ය, වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥානස්කන්ධ යි. මොහු පඤ්චස්කන්ධයහ යි කියනු ලැබෙත්.

1023. එහි ද්වාදශායතනයෝ කවරහ යත් : චක්ෂුරායතන ය, රූපායතන ය, ශ්‍රොත්‍රායතන ය, ශබ්දයතන ය, ඝ්‍රාණායතන ය, ගන්ධායතන ය, ජිහ්වායතන ය, රසායතන ය, කායායතන ය, ස්ප්‍රෂ්ටව්‍යායතන ය, මනායතන ය, ධර්මායතන යි. මොහු ද්වාදශායතනහ යි කියනු ලැබෙත්.

1024. එහි අටළොස්ධාතූහු කවරහ යත් : චක්ෂුර්ධාතු ය රූපධාතු ය චක්ෂුර්විඥානධාතු ය, ශ්‍රොත්‍රධාතු ය ශබ්දධාතු ය ශ්‍රොත්‍රවිඥානධාතු ය, ඝ්‍රාණධාතු ය ගන්ධධාතු ය ඝ්‍රාණවිඥානධාතු ය, ජිහ්වාධාතු ය රසධාතු ය ජිහ්වාවිඥානධාතු ය, කායධාතු ය ස්ප්‍රෂ්ටව්‍යධාතු ය කායවිඥානධාතු ය, මනෝධාතු ය ධම්මධාතු ය මනෝවිඥානධාතු යි. මොහු අටළොස්ධාතූහු වෙත්.

1025. එහි සතර සත්‍යයෝ කවරහ යත් : දුඃඛසත්‍ය ය, සමුදයසත්‍ය ය, නිරොධ සත්‍ය ය, මාර්ගසත්‍ය යි. මොහු සතර සත්‍යහ යි කියනු ලැබෙත්.

1026. එහි දෙවිසි ඉන්ද්‍රියයෝ කවරහ යත් : චක්ෂුරින්ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය, ඝ්‍රාණෙන්ද්‍රිය ය, ජිහ්වෙන්ද්‍රිය ය, කායෙන්ද්‍රිය ය, මනින්ද්‍රිය ය, ස්ත්‍රීන්ද්‍රිය ය, පුරුෂෙන්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය ය, සුඛෙන්ද්‍රිය ය, දුඃඛෙන්ද්‍රිය ය, සෞමනස්‍යෙන්ද්‍රිය ය, දෞර්මනස්‍යෙන්ද්‍රිය ය, උපෙක්ෂෙන්ද්‍රිය ය, ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය ය, අඤ්ඤින්ද්‍රිය ය, අඤ්ඤාතාවින්ද්‍රිය යි. මොහු දෙවිසි ඉන්ද්‍රියයෝ යි කියනු ලැබෙත්.

1027. එහි නවහෙතූහු කවරහ යත් : කුශලහෙතූහු තිදෙනෙකි, අකුශලහෙතූහු තිදෙනෙකි, අව්‍යාකෘතහෙතූහු තිදෙනෙකි. එහි තුන් කුශලහෙතූහු කවරහ යත් : අලොභය කුශලහෙතු වෙයි, අද්වේෂය කුශලහෙතු වෙයි, අමොහය කුශලහෙතු වේ, මොහු තුන් කුශලහෙතූහු වෙත්. එහි තුන් අකුශලහෙතූහු කවරහ යත් : ලොභය අකුශලහෙතු වෙයි, ද්වේෂය අකුශලහෙතු වෙයි. මොහය අකුශලහෙතු වේ, මොහු තුන් අකුශලහෙතූහු වෙත්. එහි තුන් අව්‍යාකෘතහෙතූහු කවරහ යත් : කුශලකර්මයන්ගේ විපාක හෙයින් හෝ ක්‍රියාව්‍යාකෘතධර්මයන්හි හෝ අලොභ ය, අද්වේෂ ය, අමොහ යි. මොහු තුන් අව්‍යාකෘතහෙතූහු වෙත්. මොහු නවහෙතූහ යි කියනු ලැබෙත්.



Free Distribution www.aathaapi.org

1028. තත්ථ කතමෙ චත්තාරො ආහාරා: කබළීකාරො ආහාරො ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. ඉමෙ වුච්චන්ති චත්තාරො ආහාරා.

1029. තත්ථ කතමෙ සත්ත ඵස්සා: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොධාතුසම්ඵස්සො මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. ඉමෙ වුච්චන්ති සත්ත සම්ඵස්සා.

1030. තත්ථ කතමා සත්ත වෙදනා: චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා ඝානසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොධාතුසම්ඵස්සජා වෙදනා මනොවිඤ්ඤාණ-ධාතුසම්ඵස්සජා වෙදනා. ඉමා වුච්චන්ති සත්ත වෙදනා.

1031. තත්ථ කතමා සත්තසඤ්ඤා: චක්ඛුසම්ඵස්සජා සඤ්ඤා සොතසම්ඵස්සජා සඤ්ඤා ඝානසම්ඵස්සජා සඤ්ඤා ජිව්හාසම්ඵස්සජා සඤ්ඤා කායසම්ඵස්සජා සඤ්ඤා මනොධාතුසම්ඵස්සජා සඤ්ඤා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා. ඉමා වුච්චන්ති සත්තසඤ්ඤා.

1332. තත්ථ කතමා සත්ත චෙතනා: චක්ඛුසම්ඵස්සජා චෙතනා සොතසම්ඵස්සජා චෙතනා ඝානසම්ඵස්සජා චෙතනා ජිව්හාසම්ඵස්සජා චෙතනා කායසම්ඵස්සජා චෙතනා මනොධාතුසම්ඵස්සජා චෙතනා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා. ඉමා වුච්චන්ති සත්ත චෙතනා.

1033. තත්ථ කතමානි සත්තචිත්තානි: චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොධාතු මනො-විඤ්ඤාණධාතු. ඉමානි වුච්චන්ති සත්ත චිත්තානි.

## 2

1034. කාමධාතුයා කති ඛන්ධා: කති ආයතනානි: කති ධාතුයො: කති සච්චානි: කති ඉන්ද්‍රියානි: කති හෙතූ: කති ආහාරා: කති ඵස්සා: කති වෙදනා: කති සඤ්ඤා: කති චෙතනා: කති චිත්තානි:

කාමධාතුයා පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරසධාතුයො, තීණි සච්චානි, බාවීසතින්ද්‍රියානි, නව හෙතූ, චත්තාරො ආහාරා, සත්ත ඵස්සා, සත්ත වෙදනා, සත්ත සඤ්ඤා, සත්ත චෙතනා, සත්ත චිත්තානි.

තත්ථ කතමෙ කාමධාතුයා පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති කාමධාතුයා පඤ්චක්ඛන්ධා.

තත්ථ කතමානි කාමධාතුයා ද්වාදසායතනානි: චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. ඉමානි වුච්චන්ති කාමධාතුයා ද්වාදසායතනානි.

තත්ථ කතමා කාමධාතුයා අට්ඨාරසධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. ඉමා වුච්චන්ති කාමධාතුයා අට්ඨාරස ධාතුයො.

1028. එහි සතර ආහාරයෝ කවරහ යත්: කවලීකාරාහාර ය ස්පර්ශාහාර ය මනොසඤ්චේතනාහාර ය විඥානාහාර යි. මොහු සතර ආහාරයෝ යි කියනු ලැබෙත්.

1029. එහි සප්තස්පර්ශයෝ කවරහ යත්: චක්ඛුසම්ඵස්ස ය සොතසම්ඵස්ස ය ඝානසම්ඵස්ස ය ජිව්හාසම්ඵස්ස ය කායසම්ඵස්ස ය මනොධාතුසම්ඵස්ස ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්ස යි. මොහු සප්තස්පර්ශහ යි කියනු ලැබෙත්.

1030. එහි සප්තවෙදනා කවරහ යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනා ය සොතසම්ඵස්සයෙන් උපන් වෙදනා ය ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනා ය කායසම්ඵස්සයෙන් උපන් වෙදනා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් වෙදනා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් වෙදනා යි. මොහු සප්තවෙදනා යි කියනු ලැබෙත්.

1031. එහි සප්තසංඥා කවරහ යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් සංඥා ය සොතසම්ඵස්සයෙන් උපන් සංඥා ය ඝානසම්ඵස්සයෙන් උපන් සංඥා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් සංඥා ය කායසම්ඵස්සයෙන් උපන් සංඥා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් සංඥා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් සංඥා යි. මොහු සප්තසංඥා යි කියනු ලැබෙත්.

1032. එහි සප්තචෙතනා කවරහ යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් චෙතනා ය සොතසම්ඵස්සයෙන් උපන් චෙතනා ය ඝානසම්ඵස්සයෙන් උපන් චෙතනා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් චෙතනා ය කායසම්ඵස්සයෙන් උපන් චෙතනා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් චෙතනා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් චෙතනා යි. මොහු සප්තචෙතනා යි කියනු ලැබෙත්.

1033. එහි සප්තචිත්තයෝ කවරහ යත්: චක්ෂුර්විඥාන ය ශ්‍රොත්‍රවිඥාන ය ඝ්‍රාණවිඥාන ය ජිහ්වාවිඥාන ය කායවිඥාන ය මනොධාතු ය මනොවිඥානධාතු යි. මොහු සප්තචිත්තයෝ යි කියනු ලැබෙත්.

## 2

1034. කාමධාතුයෙහි ස්කන්ධයෝ කෙතෙක් ද, ආයතනයෝ කෙතෙක් ද, ධාතුහු කෙතෙක් ද, සත්‍යයෝ කෙතෙක් ද, ඉන්ද්‍රියයෝ කෙතෙක් ද, හෙතුහු කෙතෙක් ද, සංඥා කෙතෙක් ද, චෙතනා කෙතෙක් ද, චිත්තයෝ කෙතෙක් ද යත්:

කාමධාතුයෙහි ස්කන්ධ පසෙක, ආයතන දොළොසෙක, ධාතුහු අටළොසෙක, සත්‍ය තුනෙක, ඉන්ද්‍රිය දෙවිස්සෙක, හෙතු නවයෙක, ආහාර සතරෙක, ස්පර්ශ සතෙක, වෙදනා සතෙක, සංඥා සතෙක, චෙතනා සතෙක, චිත්ත සතෙකි.

එහි කාමධාතුයෙහි පඤ්චස්කන්ධයෝ කවරහ යත්: රූපස්කන්ධ ය වෙදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ යි. මොහු කාමධාතුයෙහි පඤ්චස්කන්ධයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි ද්වාදශායතනයෝ කවරහ යත්: චක්ෂුරායතන ය රූපායතන ය ශ්‍රොත්‍රායතන ය ශබ්දයතන ය ඝ්‍රාණායතන ය ගන්ධායතන ය ජිහ්වායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. මොහු කාමධාතුයෙහි ද්වාදශායතනයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි අටළොස් ධාතුහු කවරහ යත්: චක්ෂුර්ධාතු ය රූපධාතු ය චක්ෂුර්විඥානධාතු ය, ශ්‍රොත්‍රධාතු ය ශබ්දධාතු ය ශ්‍රොත්‍රවිඥානධාතු ය, ඝ්‍රාණධාතු ය ගන්ධධාතු ය ඝ්‍රාණවිඥානධාතු ය, ජිහ්වාධාතු ය රසධාතු ය ජිහ්වාවිඥානධාතු ය, කායධාතු ය ස්ප්‍රෂ්ටව්‍යධාතු ය කායවිඥානධාතු ය, මනොධාතු ය ධම්මධාතු ය මනොවිඥානධාතු යි. මොහු කාමධාතුයෙහි අටළොස් ධාතුහ යි කියනු ලැබෙත්.

තත්ථ කතමානි කාමධාතුයා තීණි සච්චානි: දුක්ඛසච්චං සමුදයසච්චං මග්ගසච්චං. ඉමානි වුච්චන්ති කාමධාතුයා තීණි සච්චානි.

තත්ථ කතමානි කාමධාතුයා බාවීසතින්ද්‍රියානි: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං -පෙ- අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි වුච්චන්ති කාමධාතුයා බාවීසතින්ද්‍රියානි.

තත්ථ කතමෙ කාමධාතුයා නව හෙතූ: තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ. ඉමෙ වුච්චන්ති කාමධාතුයා නව හෙතූ.

තත්ථ කතමෙ කාමධාතුයා චත්තාරො ආහාරා: කබළීකාරො ආහාරො ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. ඉමෙ වුච්චන්ති කාමධාතුයා චත්තාරො ආහාරා.

තත්ථ කතමෙ කාමධාතුයා සත්ත ඵස්සා: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොධාතුසම්ඵස්සො මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. ඉමෙ වුච්චන්ති කාමධාතුයා සත්ත ඵස්සා.

තත්ථ කතමා කාමධාතුයා සත්ත වෙදනා: චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා ඝානසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොධාතුසම්ඵස්සජා වෙදනා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා වෙදනා. ඉමා වුච්චන්ති කාමධාතුයා සත්ත වෙදනා.

තත්ථ කතමා කාමධාතුයා සත්ත සඤ්ඤා: චක්ඛුසම්ඵස්සජා සඤ්ඤා සොතසම්ඵස්සජා සඤ්ඤා ඝානසම්ඵස්සජා සඤ්ඤා ජිව්හාසම්ඵස්සජා සඤ්ඤා කායසම්ඵස්සජා සඤ්ඤා මනොධාතුසම්ඵස්සජා සඤ්ඤා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා. ඉමා වුච්චන්ති කාමධාතුයා සත්ත සඤ්ඤා.

තත්ථ කතමා කාමධාතුයා සත්ත චෙතනා: චක්ඛුසම්ඵස්සජා චෙතනා සොතසම්ඵස්සජා චෙතනා ඝානසම්ඵස්සජා චෙතනා ජිව්හාසම්ඵස්සජා චෙතනා කායසම්ඵස්සජා චෙතනා මනොධාතුසම්ඵස්සජා චෙතනා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා. ඉමා වුච්චන්ති කාමධාතුයා සත්ත චෙතනා.

තත්ථ කතමානි කාමධාතුයා සත්ත චිත්තානි: චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොධාතු මනොවිඤ්ඤාණධාතු. ඉමානි වුච්චන්ති කාමධාතුයා සත්ත චිත්තානි.

1035. රූපධාතුයා කති ඛන්ධා: කති ආයතනා: කති ධාතුයො: කති සච්චානි: කති ඉන්ද්‍රියානි -පෙ- කති චිත්තානි:

රූපධාතුයා පඤ්චක්ඛන්ධා, ඡ ආයතනානි, නව ධාතුයො, තීණි සච්චානි, චුද්දසින්ද්‍රියානි, අට්ඨ හෙතූ, තයො ආහාරා, චත්තාරො ඵස්සා, චත්තාරො වෙදනා, චත්තාරො සඤ්ඤා, චත්තාරො චෙතනා, චත්තාරි චිත්තානි.

තත්ථ කතමෙ රූපධාතුයා පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති රූපධාතුයා පඤ්චක්ඛන්ධා.

Free Distribution www.aathaapi.org

එහි කාමධාතුයෙහි තුන් සත්‍යයෝ කවරහ යත්: දුඃඛසත්‍ය ය සමුදයසත්‍ය ය මාර්ගසත්‍ය යි. මොහු කාමධාතුයෙහි තුන් සත්‍යයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි දෙවිසි ඉන්ද්‍රියයෝ කවරහ යත්: චක්ෂුරින්ද්‍රිය ය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය . . . අඤ්ඤාතාවින්ද්‍රිය යි. මොහු කාමධාතුයෙහි දෙවිසි ඉන්ද්‍රියයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි නවහෙතූහු කවරහ යත්: කුශලහෙතු තුනෙක, අකුශලහෙතු තුනෙක, අව්‍යාකෘතහෙතු තුනෙකි. මොහු කාමධාතුයෙහි නවහෙතූහ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සතර ආහාරයෝ කවරහ යත්: කවලීකාරාහාර ය ස්පර්ශාහාර ය මනොසඤ්චෙතනාහාර ය විඥානාහාර යි. මොහු කාමධාතුයෙහි සතර ආහාරයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සප්තස්පර්ශයෝ කවරහ යත්: චක්ඛුසම්ඵස්ස ය සොතසම්ඵස්ස ය ඝානසම්ඵස්ස ය ජිව්හාසම්ඵස්ස ය කායසම්ඵස්ස ය මනොධාතුසම්ඵස්ස ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්ස යි. මොහු කාමධාතුයෙහි සප්තස්පර්ශයෝ යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සප්තවෙදනා කවර යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනා ය සොතසම්ඵස්සයෙන් උපන් වෙදනා ය ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනා ය කායසම්ඵස්සයෙන් උපන් වෙදනා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් වෙදනා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් වෙදනා යි. මොහු කාමධාතුයෙහි සප්තවෙදනා යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සප්තසංඥා කවර යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් සංඥා ය සොතසම්ඵස්සයෙන් උපන් සංඥා ය ඝානසම්ඵස්සයෙන් උපන් සංඥා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් සංඥා ය කායසම්ඵස්සයෙන් උපන් සංඥා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් සංඥා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් සංඥා යි. මොහු කාමධාතුයෙහි සප්තසංඥා යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සප්තචෙතනා කවර යත්: චක්ඛුසම්ඵස්සයෙන් උපන් චෙතනා ය සොතසම්ඵස්සයෙන් උපන් චෙතනා ය ඝානසම්ඵස්සයෙන් උපන් චෙතනා ය ජිව්හාසම්ඵස්සයෙන් උපන් චෙතනා ය කායසම්ඵස්සයෙන් උපන් චෙතනා ය මනොධාතුසම්ඵස්සයෙන් උපන් චෙතනා ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සයෙන් උපන් චෙතනා යි. මොහු කාමධාතුයෙහි සප්තචෙතනා යි කියනු ලැබෙත්.

එහි කාමධාතුයෙහි සප්තචිත්තයෝ කවරහ යත්: චක්ෂුර්විඥාන ය ශ්‍රොත්‍රවිඥාන ය ඝ්‍රාණවිඥාන ය ජිහ්වාවිඥාන ය කායවිඥාන ය මනොධාතු ය මනොවිඥානධාතු යි. මොහු කාමධාතුයෙහි සප්තචිත්තයෝ යි කියනු ලැබෙත්.

1035. රූපධාතුයෙහි ස්කන්ධයෝ කෙතෙක් ද, ආයතනයෝ කෙතෙක් ද, ධාතූහු කෙතෙක් ද, සත්‍යයෝ කෙතෙක් ද, ඉන්ද්‍රියයෝ කෙතෙක් ද ? . . . චිත්තයෝ කෙතෙක් ද යත්:

රූපධාතුයෙහි ස්කන්ධ පසෙක, ආයතන සයෙක, ධාතු නවයෙක, සත්‍ය තුනෙක, ඉන්ද්‍රිය තුදුසෙක, හෙතු අටෙක, ආහාර තුනෙක, ස්පර්ශ සතරෙක, වෙදනා සතරෙක, සංඥා සතරෙක, චෙතනා සතරෙක, සිත් සතරෙකි.

එහි රූපධාතුයෙහි පඤ්චස්කන්ධයෝ කවරහ යත්: රූපස්කන්ධ ය වෙදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ යි. මොහු රූපධාතුයෙහි පඤ්චස්කන්ධයෝ යි.

තත්ථ කතමානි රූපධාතුයා ඡ ආයතනානි: චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං මනායතනං ධම්මායතනං. ඉමානි වුච්චන්ති රූපධාතුයා ඡ ආයතනානි.

තත්ථ කතමා රූපධාතුයා නව ධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. ඉමා වුච්චන්ති රූපධාතුයා නව ධාතුයො.

තත්ථ කතමානි රූපධාතුයා තීණි සච්චානි: දුක්ඛසච්චං සමුදයසච්චං මග්ගසච්චං. ඉමානි වුච්චන්ති රූපධාතුයා තීණි සච්චානි.

තත්ථ කතමානි රූපධාතුයා චුද්දසින්ද්‍රියානි: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි වුච්චන්ති රූපධාතුයා චුද්දසින්ද්‍රියානි.

තත්ථ කතමෙ රූපධාතුයා අට්ඨ හෙතූ: තයො කුසලහෙතූ, ද්වෙ අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ. තත්ථ කතමෙ තයො කුසලහෙතූ: අලොභො කුසලහෙතු, අදොසො කුසලහෙතු, අමොහො කුසලහෙතු. ඉමෙ තයො කුසලහෙතූ.

තත්ථ කතමෙ ද්වෙ අකුසලහෙතූ: ලොභො අකුසලහෙතු මොහො අකුසලහෙතු. ඉමෙ ද්වෙ අකුසලහෙතූ.

තත්ථ කතමෙ තයො අබ්‍යාකත හෙතූ: කුසලානං වා ධම්මානං විපාකතො කිරියාබ්‍යාකතෙසු වා ධම්මෙසු අලොභො අදොසො අමොහො ඉමෙ තයො අබ්‍යාකත හෙතූ. ඉමෙ වුච්චන්ති රූපධාතුයා අට්ඨ හෙතූ.

තත්ථ කතමෙ රූපධාතුයා තයො ආහාරා: ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. ඉමෙ වුච්චන්ති රූපධාතුයා තයො ආහාරා.

තත්ථ කතමෙ රූපධාතුයා චත්තාරො ඵස්සා: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො මනොධාතුසම්ඵස්සො මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. ඉමෙ වුච්චන්ති රූපධාතුයා චත්තාරො ඵස්සා.

තත්ථ කතමා රූපධාතුයා චතස්සො වෙදනා -පෙ- චතස්සො සඤ්ඤා -පෙ- චතස්සො චෙතනා -පෙ- චත්තාරි චිත්තානි: චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං මනොධාතු මනොවිඤ්ඤාණධාතු. ඉමානි වුච්චන්ති රූපධාතුයා චත්තාරි චිත්තානි.

1036. අරූපධාතුයා කති ඛන්ධා: -පෙ- කති චිත්තානි:

අරූපධාතුයා චත්තාරො ඛන්ධා, ද්වෙ ආයතනානි, ද්වෙ ධාතුයො, තීණි සච්චානි, එකාදසින්ද්‍රියානි, අට්ඨ හෙතූ, තයො ආහාරා, එකො ඵස්සො, එකා වෙදනා, එකා සඤ්ඤා, එකා චෙතනා, එකං චිත්තං.

තත්ථ කතමෙ අරූපධාතුයා චත්තාරො ඛන්ධා: වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති අරූපධාතුයා චත්තාරො ඛන්ධා.

තත්ථ කතමානි අරූපධාතුයා ද්වෙ ආයතනානි: මනායතනං ධම්මායතනං. ඉමානි වුච්චන්ති අරූපධාතුයා ද්වෙ ආයතනානි.

එහි රූපධාතුයෙහි ෂඩායතනයෝ කවරහ යත්: චක්ෂුරායතන ය රූපායතන ය ශ්‍රොත්‍රායතන ය ශබ්දයතන ය මනායතන ය ධර්මායතන යි. මොහු රූපධාතුයෙහි ෂඩායතනහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි නවධාතු කවර යත්: චක්ෂුර්ධාතු ය රූපධාතු ය චක්ෂුර්විඥාන ධාතු ය ශ්‍රොත්‍රධාතු ය ශබ්දධාතු ය ශ්‍රොත්‍රවිඥානධාතු ය මනොධාතු ය ධර්මධාතු ය මනො විඥානධාතු යි. මොහු රූපධාතුයෙහි නවධාතුහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි තුන් සත්‍යයෝ කවරහ යත්: දුඃඛසත්‍ය ය සමුදය සත්‍ය ය මාර්ගසත්‍ය යි. මොහු රූපධාතුයෙහි තුන් සත්‍යහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි තුදුස් ඉන්ද්‍රියයෝ කවරහ යත්: චක්ෂුරින්ද්‍රිය ය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය මනින්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සෞමනස්‍යෙන්ද්‍රිය ය උපෙක්ෂෙන්ද්‍රිය ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍ය්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය අනඤ්ඤාතඤ්ඤස්සාමීති න්ද්‍රිය ය අඤ්ඤින්ද්‍රිය ය අඤ්ඤාතාවින්ද්‍රිය යි. මොහු රූපධාතුයෙහි තුදුස් ඉන්ද්‍රියහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි අෂ්ටහෙතුහු කවරහ යත්: තුන් කුශලහෙතු ය අකුශලහෙතුහු දෙදෙන ය තුන් අව්‍යාකෘතහෙතු යි. එහි තුන් කුශලහෙතු කවර යත්: අලොභය කුශලහෙතුයෙක, අද්වෙෂය කුශලහෙතුයෙක, අමොහය කුශලහෙතුයෙකි. මොහු තුන් කුශලහෙතු වෙත්.

එහි අකුශලධාතුහු දෙදෙන කවරහ යත්: ලොභය අකුශලහෙතුයෙකි, මොහය අකුශලහෙතුයෙකි. මොහු අකුශලහෙතුහු දෙදෙන වෙත්.

එහි තුන් අව්‍යාකෘතහෙතුහු කවරහ යත්: කුශලධර්මයන්ගේ විපාක හෙයින් හෝ ක්‍රියාව්‍යාකෘතධර්මයන්හි හෝ අලොභ ය අද්වෙෂ ය අමොහ යි. මොහු තුන් අව්‍යාකෘතහෙතු වෙත්. මොහු රූපධාතුයෙහි අෂ්ටහෙතුහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි තුන් ආහාරයෝ කවරහ යත්: ස්පර්ශාහාර ය මනො සඤ්චෙතනාහාර ය විඥානාහාර යි. මොහු රූපධාතුයෙහි තුන් ආහාරහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි සතර ස්පර්ශයෝ කවරහ යත්: චක්ෂුසම්ඵස්ස ය සොත සම්ඵස්ස ය මනොධාතුසම්ඵස්ස ය මනොවිඤ්ඤාණධාතුසම්ඵස්ස යි. මොහු රූපධාතුයෙහි සතර ස්පර්ශහ යි කියනු ලැබෙත්.

එහි රූපධාතුයෙහි සතර වෙදනා කවර යත්: . . . සතර සංඥා . . . සතර චෙතනා . . . සතර චිත්තයෝ කවරහ යත්: චක්ෂුර්විඥාන ය ශ්‍රොත්‍රවිඥාන ය මනොධාතු ය මනොවිඥානධාතු යි. මොහු රූපධාතුයෙහි සතර චිත්තහ යි කියනු ලැබෙත්.

1036. අරූපධාතුයෙහි: ස්කන්ධයෝ කෙතෙක් ද . . . චිත්තයෝ කෙතෙක් ද යත්:

අරූපධාතුයෙහි ස්කන්ධ සතරෙක, ආයතන දෙකෙක, ධාතු දෙකෙක, සත්‍ය තුනෙක, ඉන්ද්‍රිය එකොළොසෙක, හෙතු අටෙක, ආහාර තුනෙක, ස්පර්ශ එකෙක, වෙදනා එකෙක, සංඥා එකෙක, චෙතනා එකෙක, චිත්ත එකෙකි.

එහි අරූපධාතුයෙහි සතර ස්කන්ධයෝ කවරහ යත්: වෙදනා ස්කන්ධ ය සංඥා ස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ යි. මොහු අරූපධාතුයෙහි සතර ස්කන්ධහ යි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි ආයතනයෝ දෙදෙන කවරහ යත්: මනායතන ය ධර්මා යතන යි. මොහු අරූපධාතුයෙහි ආයතනයෝ දෙදෙන යයි කියනු ලැබෙත්.

තත්ථ කතමා අරූපධාතුයා ද්වෙ ධාතුයො: මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. ඉමා වුච්චන්ති අරූපධාතුයා ද්වෙ ධාතුයො.

තත්ථ කතමානි අරූපධාතුයා තීණි සච්චානි: දුක්ඛසච්චං සමුදයසච්චං මග්ගසච්චං. ඉමානි වුච්චන්ති අරූපධාතුයා තීණි සච්චානි.

තත්ථ කතමානි අරූපධාතුයා එකාදසින්ද්‍රියානි: මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි වුච්චන්ති අරූපධාතුයා එකාදසින්ද්‍රියානි.

තත්ථ කතමෙ අරූපධාතුයා අට්ඨහෙතූ: තයො කුසලහෙතූ ද්වෙ අකුසලහෙතූ තයො අව්‍යාකතහෙතූ. ඉමෙ වුච්චන්ති අරූපධාතුයා අට්ඨහෙතූ.

තත්ථ කතමෙ අරූපධාතුයා තයො ආහාරා: ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. ඉමෙ වුච්චන්ති අරූපධාතුයා තයො ආහාරා.

තත්ථ කතමො අරූපධාතුයා එකො ඵස්සො: මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. අයං වුච්චති අරූපධාතුයො එකො ඵස්සො.

තත්ථ කතමා අරූපධාතුයා එකා වෙදනා -පෙ- එකා සඤ්ඤා -පෙ- එකා චෙතනා -පෙ- එකං චිත්තං: මනොවිඤ්ඤාණධාතු. ඉදං වුච්චති අරූපධාතුයා එකං චිත්තං.

1037 අපරියාපන්නා කති ඛන්ධා: -පෙ- කති චිත්තානි: අපරියාපන්නා චත්තාරො ඛන්ධා, ද්වෙ ආයතනානි, ද්වෙ ධාතුයො, ද්වෙ සච්චානි, ද්වාදසින්ද්‍රියානි, ඡ හෙතූ, තයො ආහාරා, එකො ඵස්සො, එකා වෙදනා, එකා සඤ්ඤා, එකා චෙතනා, එකං චිත්තං.

තත්ථ කතමෙ අපරියාපන්නා චත්තාරො ඛන්ධා: වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති අපරියාපන්නා චත්තාරො ඛන්ධා.

තත්ථ කතමානි අපරියාපන්නා ද්වෙ ආයතනානි: මනායතනං ධම්මායතනං. ඉමානි වුච්චන්ති අපරියාපන්නා ද්වෙ ආයතනානි

තත්ථ කතමා අපරියාපන්නා ද්වෙ ධාතුයො: මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. ඉමා වුච්චන්ති අපරියාපන්නා ද්වෙ ධාතුයො.

තත්ථ කතමානි අපරියාපන්නා ද්වෙ සච්චානි: මග්ගසච්චං නිරොධසච්චං. ඉමානි වුච්චන්ති අපරියාපන්නා ද්වෙ සච්චානි.

තත්ථ කතමානි අපරියාපන්නා ද්වාදසින්ද්‍රියානි: මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි වුච්චන්ති අපරියාපන්නා ද්වාදසින්ද්‍රියානි.

තත්ථ කතමෙ අපරියාපන්නා ඡ හෙතූ: තයො කුසලහෙතූ, තයො අව්‍යාකතහෙතූ.

තත්ථ කතමෙ තයො කුසලහෙතූ: අලොභො කුසලහෙතු, අදොසො කුසලහෙතු, අමොහො කුසලහෙතු. ඉමෙ තයො කුසලහෙතූ.

Free Distribution www.aathaapi.org

එහි අරූපධාතුයෙහි ධාතූහු දෙදෙන කවරහ යත් : මනොවිඥානධාතු ය ධර්ම ධාතු යි. මොහු අරූපධාතුයෙහි ධාතූහු දෙදෙන යයි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි තුන් සත්‍යයෝ කවරහ යත් : දුඃඛසත්‍ය ය සමුදයසත්‍ය ය මාර්ගසත්‍ය යි. මොහු අරූපධාතුයෙහි තුන් සත්‍යහ යි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි එකොළොස් ඉන්ද්‍රියයෝ කවරහ යත් : මනින්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සෞමනස්‍යෙන්ද්‍රිය ය උපෙක්ෂෙන්ද්‍රිය ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍ය්‍යෙ න්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය අඤ්ඤින්ද්‍රිය ය අඤ්ඤාතා වින්ද්‍රිය යි. මොහු අරූපධාතුයෙහි එකොළොස් ඉන්ද්‍රියහ යි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි අෂ්ටහෙතු කවර යත් : තුන් කුශලහෙතු ය අකුශලහෙතු දෙක ය තුන් අව්‍යාකෘතහෙතු යි. මොහු අරූපධාතුයෙහි අෂ්ටහෙතුහ යි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි තුන් ආහාර කවර යත් : ස්පර්ශාහාර ය මනොසඤ්චෙතනා හාර ය විඥානාහාර යි. මොහු අරූපධාතුයෙහි තුන් ආහාරහ යි කියනු ලැබෙත්.

එහි අරූපධාතුයෙහි එක් මැ ස්පර්ශය කවරෙ යත් : මනොවිඤ්ඤාණධාතුසම්ඵස්ස යි. මේ අරූපධාතුයෙහි එක් මැ ස්පර්ශ යි කියනු ලැබෙ.

එහි අරූපධාතුයෙහි එක් මැ වෙදනාව . . . එක් මැ සංඥාව . . . එක් මැ චෙතනාව . . . එක් මැ චිත්තය කවරෙ යත් : මනොවිඥානධාතු යි. මේ අරූපධාතුයෙහි එක් මැ චිත්ත යි කියනු ලැබෙ.

1037. අපර්‍යාපන්නයෙහි : ස්කන්ධයෝ කෙතෙක් ද . . . චිත්තයෝ කෙතෙක් ද යත් :

අපර්‍යාපන්නයෙහි ස්කන්ධ සතරෙක ආයතන දෙකෙක ධාතු දෙකෙක සත්‍ය දෙකෙක ඉන්ද්‍රිය දොළොසෙක හෙතු සයෙක ආහාර තුනෙක ස්පර්ශ එකෙක වෙදනා එකෙක සංඥා එකෙක චෙතනා එකෙක චිත්ත එකෙකි.

එහි අපර්‍යාපන්නයෙහි සතර ස්කන්ධයෝ කවරහ යත් : වෙදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ යි. මොහු අපර්‍යාපන්නයෙහි සතර ස්කන්ධහ යි කියනු ලැබෙත්.

එහි අපර්‍යාපන්නයෙහි ආයතනයෝ දෙදෙන කවරහ යත් : මනායතන ය ධර්මායතන යි. මොහු අපර්‍යාපන්නයෙහි ආයතනයෝ දෙදෙන යයි කියනු ලැබෙත්.

එහි අපර්‍යාපන්නයෙහි ධාතූහු දෙදෙන කවරහ යත් : මනොවිඥානධාතු ය ධර්මධාතු යි. මොහු අපර්‍යාපන්නයෙහි ධාතූහු දෙදෙන යයි කියනු ලැබෙත්.

එහි අපර්‍යාපන්නයෙහි සත්‍යයෝ දෙදෙන කවරහ යත් : මාර්ගසත්‍ය ය නිරොධ සත්‍ය යි. මොහු අපර්‍යාපන්නයෙහි සත්‍යයෝ දෙදෙන යයි කියනු ලැබෙත්.

එහි අපර්‍යාපන්නයෙහි දොළොස් ඉන්ද්‍රියයෝ කවරහ යත් : මනින්ද්‍රිය ය ජීවිතින්ද්‍රිය ය සොමනස්සින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය ය සද්ධින්ද්‍රිය ය විරියින්ද්‍රිය ය සතින්ද්‍රිය ය සමාධින්ද්‍රිය ය පඤ්ඤින්ද්‍රිය ය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය ය අඤ්ඤි න්ද්‍රිය ය අඤ්ඤාතාවින්ද්‍රිය යි. මොහු අපර්‍යාපන්නයෙහි දොළොස් ඉන්ද්‍රියයෝ යයි කියනු ලැබෙත්.

එහි අපර්‍යාපන්නයෙහි ෂඩ් හෙතූ හු කවරහ යත් : කුසල හෙතූහු තිදෙන ය අව්‍යාකෘතහෙතූහු තිදෙන යි.

එහි කුසලහෙතූහු තිදෙන කවරහ යත් : අලොභකුසලහෙතු ය අදෙසකුසල හෙතු ය අමොහකුසලහෙතු යි. මොහු තිදෙන කුසලහෙතු යි.

තත්ථ කතමෙ තයො අව්‍යාකතහෙතූ: කුසලානං ධම්මානං විපාකතො අලොභො අදොසො අමොහො. ඉමෙ තයො අව්‍යාකතහෙතූ. ඉමෙ වුච්චන්ති අපරියාපන්නා ඡ හෙතූ.

තත්ථ කතමෙ අපරියාපන්නා තයො ආහාරා: ඵස්සාහාරො, මනොසඤ්චෙතනාහාරො, විඤ්ඤාණාහාරො. ඉමෙ වුච්චන්ති අපරියාපන්නා තයො ආහාරා.

තත්ථ කතමො අපරියාපන්නො එකො ඵස්සො: මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. අයං වුච්චති අපරියාපන්නො එකො ඵස්සො.

තත්ථ කතමා අපරියාපන්නා එකා වෙදනා -පෙ- එකා සඤ්ඤා -පෙ- එකා චෙතනා -පෙ- එකං චිත්තං: මනොවිඤ්ඤාණධාතු. ඉදං වුච්චති අපරියාපන්නං එකං චිත්තං.

## 3

1038. පඤ්චන්නං ඛන්ධානං කති කාමධාතු පරියාපන්නා: කති න කාමධාතුපරියාපන්නා: -පෙ- සත්තන්නං චිත්තානං කති කාමධාතු පරියාපන්නා: කති න කාමධාතුපරියාපන්නා:

රූපක්ඛන්ධො කාමධාතුපරියාපන්නො. චත්තාරො ඛන්ධා සියා කාමධාතුපරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

දසායතනා කාමධාතුපරියාපන්නා. ද්වෙ ආයතනා සියා කාමධාතු-පරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

සොළස ධාතුයො කාමධාතු පරියාපන්නා. ද්වෙ ධාතුයො සියා කාමධාතුපරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

සමුදයසච්චං කාමධාතුපරියාපන්නං. ද්වෙ සච්චා න කාමධාතු පරියාපන්නා. දුක්ඛසච්චං සියා කාමධාතුපරියාපන්නං, සියා න කාමධාතු පරියාපන්නං

දසින්ද්‍රියා කාමධාතුපරියාපන්නා. තීණින්ද්‍රියා න කාමධාතුපරියාපන්නා. නවින්ද්‍රියා සියා කාමධාතුපරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

තයො අකුසලහෙතූ කාමධාතුපරියාපන්නා. ඡ හෙතූ සියා කාමධාතු පරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

කබළිඞ්කාරො ආහාරො කාමධාතුපරියාපන්නො. තයො ආහාරා සියා කාමධාතුපරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

ඡ ඵස්සා කාමධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො සියා කාමධාතුපරියාපන්නො, සියා න කාමධාතුපරියාපන්නො.

ඡ වෙදනා -පෙ- ඡ සඤ්ඤා -පෙ- ඡ චෙතනා -පෙ- ඡ චිත්තා කාමධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතු සියා කාමධාතුපරියාපන්නා, සියා න කාමධාතුපරියාපන්නා.

1039. පඤ්චන්නං ඛන්ධානං කති රූපධාතුපරියාපන්නා: කති න රූපධාතුපරියාපන්නා -පෙ- සත්තන්නං චිත්තානං කති රූපධාතුපරියා-පන්නා: කති න රූපධාතුපරියාපන්නා:

එහි අව්‍යාකෘතහෙතූහු තිදෙන කවරහ යත් : කුසලධර්මයන්ගේ විපාකවශයෙන් අලොභ ය අදෙස ය අමොහ යි. මොහු තිදෙන අව්‍යාකෘතහෙතූහු යි. මොහු අපයර්‍යාපන්නයෙහි ෂඩ් හෙතූහු යි කියනු ලැබෙත්.

එහි අපයර්‍යාපන්නයෙහි ආහාරයෝ තිදෙන කවරහ යත් : ස්පර්ශාහාර ය. මනඃසඤ්චෙතනාහාර ය, විඥානාහාරයි. මොහු අපයර්‍යාපන්නයෙහි ආහාරයෝ තිදෙන යි කියනු ලැබෙත්.

එහි අපයර්‍යාපන්නයෙහි එක් ස්පර්ශය කවරෙ යත් : මනොවිඥානධාතු සංස්පර්ශයි. මේ අපයර්‍යාපන්නයෙහි එක් ස්පර්ශ යි කියනු ලැබේ.

එහි අපයර්‍යාපන්නයෙහි එක් වෙදනාව කවර යත් : . . . එක් සංඥ . . . එක් චෙතනා . . . එක් සිත කවරෙ යත් : මනොවිඥානධාතු යි. මේ අපයර්‍යාපන්න යෙහි එක් සිත යි කියනු ලැබේ.

## 3

1038. පඤ්ච ස්කන්ධයන් අතුරෙහි කෙතෙක් කාමධාතුපයර්‍යාපන්න ද, කෙතෙක් කාමධාතුපයර්‍යාපන්න නො වෙත් ද . . .සප්තචිත්තයෙන් කෙතෙක් කාමධාතුපයර්‍යාපන්න ද, කෙතෙක් කාමධාතු පයර්‍යාපන්න නො වෙත් ද යත් :

රූපස්කන්ධය කාමධාතුපයර්‍යාපන්න යි. සතර ස්කන්ධයෝ කාමධාතුපයර්‍යාපන්න ද වෙත්, කාමධාතුපයර්‍යාපන්න නො ද වෙත්.

ආයතනයෝ දස දෙනෙක් කාමධාතුපයර්‍යාපන්න වෙත්. ආයතනයෝ දෙදෙනෙක් කාමධාතුපයර්‍යාපන්න ද වෙත්, කාමධාතු පයර්‍යාපන්න නො ද වෙත්.

සොළොස් ධාතු කෙනෙක් කාමධාතුපයර්‍යාපන්නයහ. ධාතූහු දෙදෙනෙක් කාමධාතුපයර්‍යාපන්න ද වෙති. කාමධාතුපයර්‍යාපන්න නො ද වෙත්.

සමුදයසත්‍යය කාමධාතුපයර්‍යාපන්න යි. සත්‍යයෝ දෙදෙනෙක් කාමධාතුපයර්‍යා පන්න නො වෙත්. දුඃඛසත්‍යය කාමධාතුපයර්‍යාපන්න ද වෙයි. කාමධාතුපයර්‍යාපන්න නො ද වේ.

දශ ඉන්ද්‍රියයෝ කාමධාතුපයර්‍යාපන්නයහ. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් කාමධාතු පයර්‍යාපන්න නො වෙත්. නව ඉන්ද්‍රියයෝ කාමධාතුපයර්‍යාපන්න ද වෙත්. කාමධාතු පයර්‍යාපන්න නො ද වෙත්.

අකුශලහෙතූහු තිදෙනෙක් කාමධාතුපයර්‍යාපන්න වෙත්. ෂඩ්හෙතූහු කාමධාතු පයර්‍යාපන්න ද වෙත්. කාමධාතුපයර්‍යාපන්න නො ද වෙත්.

කවළීකාරාහාරය කාමධාතුපයර්‍යාපන්න යි. ආහාරයෝ තිදෙනෙක් කාමධාතු පයර්‍යාපන්න ද වෙත්. කාමධාතුපයර්‍යාපන්න නො ද වෙත්.

ෂට් ස්පර්ශයෝ කාමධාතු පයර්‍යාපන්නයහ. මනොවිඥානධාතු සංස්පර්ශය කාමධාතුපයර්‍යාපන්න ද වේ. කාමධාතුපයර්‍යාපන්න නො ද වේ.

ෂඩ්වෙදනාවෝ . . . ෂට්සංඥවෝ . . . ෂට්චෙතනාවෝ . . . ෂට්චිත්තයෝ කාම ධාතුපයර්‍යාපන්නයහ. මනොවිඥානධාතුව කාමධාතුපයර්‍යාපන්න ද වේ. කාමධාතුපයර්‍යා පන්න නො ද වේ.

1039. පඤ්ච ස්කන්ධයන් අතුරෙහි කෙතෙක් රූපධාතුපයර්‍යාපන්න වෙත් ද, කෙතෙක් රූපධාතුපයර්‍යාපන්න නො වෙත් ද . . . සප්ත චිත්තයන් අතුරෙහි කෙතෙක් රූපධාතුපයර්‍යාපන්න වෙත් ද කෙතෙක් රූපධාතුපයර්‍යාපන්න නො වෙත් ද යත් :

රූපක්ඛන්ධො න රූපධාතුපරියාපන්නො. චත්තාරො ඛන්ධා සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

දසායතනා න රූපධාතුපරියාපන්නා. ද්වෙ ආයතනා සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

සොළස ධාතුයො න රූපධාතුපරියාපන්නා. ද්වෙ ධාතුයො සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

තීණි සච්චානි න රූපධාතුපරියාපන්නානි. දුක්ඛසච්චං සියා රූපධාතුපරියාපන්නං, සියා න රූපධාතුපරියාපන්නං.

තෙරසින්ද්‍රියා න රූපධාතුපරියාපන්නා. නවින්ද්‍රියා සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

තයො අකුසලහෙතු න රූපධාතුපරියාපන්නා. ඡ හෙතු සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

කබළිඞ්කාරො ආහාරො න රූපධාතුපරියාපන්නො. තයො ආහාරා සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

ඡ ඵස්සා න රූපධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො සියා රූපධාතුපරියාපන්නො, සියා න රූපධාතුපරියාපන්නො.

ඡ වෙදනා -පෙ- ඡ සඤ්ඤා -පෙ- ඡ චෙතනා -පෙ- ඡ චිත්තා න රූපධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතු සියා රූපධාතුපරියාපන්නා, සියා න රූපධාතුපරියාපන්නා.

1040. පඤ්චන්නං ඛන්ධානං කති අරූපධාතුපරියාපන්නා: කති න අරූපධාතුපරියාපන්නා: -පෙ- සත්තන්නං චිත්තානං කති අරූපධාතුපරියාපන්නා: කති න අරූපධාතුපරියාපන්නා:

රූපක්ඛන්ධො න අරූපධාතුපරියාපන්නො. චත්තාරො ඛන්ධා සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

දසායතනා න අරූපධාතුපරියාපන්නා. ද්වෙ ආයතනා සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

සොළස ධාතුයො න අරූපධාතුපරියාපන්නා. ද්වෙ ධාතුයො සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

තීණි සච්චානි න අරූපධාතුපරියාපන්නානි. දුක්ඛසච්චං සියා අරූපධාතුපරියාපන්නං, සියා න අරූපධාතුපරියාපන්නං.

චුද්දසින්ද්‍රියා න අරූපධාතුපරියාපන්නා. අට්ඨින්ද්‍රියා සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

තයො අකුසලහෙතු න අරූපධාතුපරියාපන්නා. ඡ හෙතු සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

කබළිඞ්කාරො ආහාරො න අරූපධාතුපරියාපන්නො. තයො ආහාරා සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

ඡ ඵස්සා න අරූපධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො සියා අරූපධාතුපරියාපන්නො, සියා න අරූපධාතුපරියාපන්නො.

ඡ වෙදනා -පෙ- ඡ සඤ්ඤා -පෙ- ඡ චෙතනා -පෙ- ඡ චිත්තා න අරූපධාතුපරියාපන්නා. මනොවිඤ්ඤාණධාතු සියා අරූපධාතුපරියාපන්නා, සියා න අරූපධාතුපරියාපන්නා.

රූපස්කන්ධය රූපධාතුපයාපන්න නො වෙයි. ස්කන්ධයෝ සතර දෙනෙක් රූපධාතුපයාපන්න ද වෙති. රූපධාතුපයාපන්න නොද වෙත්.

දශආයතනයෝ රූපධාතුපයාපන්න නො වෙත්. ආයතනයෝ දෙදෙනෙක් රූපධාතු පයාපන්න ද වෙත්. රූපධාතුපයාපන්න නොද වෙත්.

ෂොඩශධාතු කෙනෙක් රූපධාතුපයාපන්න නො වෙත්. ධාතුහු දෙදෙනෙක් රූපධාතුපයාපන්න ද වෙත්. රූපධාතුපයාපන්න නොද වෙත්.

සත්‍යයෝ තිදෙනෙක් රූපධාතුපයාපන්න නො වෙත්. දුඃඛසත්‍යය රූපධාතු පයාපන්න ද වෙයි. රූපධාතුපයාපන්න නොද වේ.

තෙළෙස් ඉන්ද්‍රිය කෙනෙක් රූපධාතුපයාපන්න නො වෙත්. නවඉන්ද්‍රිය කෙනෙක් රූපධාතුපයාපන්න ද වෙත්. රූපධාතුපයාපන්න නොද වෙත්.

අකුසලහෙතුහු තිදෙන රූපධාතුපයාපන්න නො වෙත්. ෂට්හෙතුහු රූපධාතුපයා පන්න ද වෙත්. රූපධාතුපයාපන්න නොද වෙත්.

කවලීකාරාහාරය රූපධාතුපයාපන්න නො වේ. ආහාරයෝ තිදෙනෙක් රූපධාතු පයාපන්න ද වෙත්. රූපධාතුපයාපන්න නො ද වෙත්.

ෂට්ස්පර්ශයෝ රූපධාතුපයාපන්න නො වෙත්. මනොවිඥානධාතුසංස්පර්ශය රූපධාතුපයාපන්න ද වේ. රූපධාතුපයාපන්න නොද වේ.

ෂඩ්වෙදනාවෝ . . . ෂට්සංඥාවෝ . . . ෂට්චෙතනාවෝ . . . ෂට්චිත්තයෝ රූපධාතු පයාපන්න නො වෙත්. මනොවිඥානධාතුව රූපධාතුපයාපන්න ද වේ. රූපධාතු පයාපන්න නොද වේ.

1040. පඤ්චස්කන්ධයන් අතුරෙහි කෙතෙක් අරූපධාතුපයාපන්න වෙත් ද කෙතෙක් අරූපධාතුපයාපන්න නො වෙත් ද . . . සප්තචිත්තයන් අතුරෙහි කෙතෙක් අරූපධාතුපයාපන්න වෙත් ද කෙතෙක් අරූපධාතුපයාපන්න නො වෙත් ද යත් :

රූපස්කන්ධය අරූපධාතුපයාපන්න නො වේ. ස්කන්ධයෝ සතරදෙනෙක් අරූප ධාතුපයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

දශආයතන කෙනෙක් අරූපධාතුපයාපන්න නො වෙත්. ආයතනයෝ දෙදෙනෙක් අරූපධාතුපයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

ෂොඩශධාතු කෙනෙක් අරූපධාතුපයාපන්න නො වෙත්. ධාතුහු දෙදෙනෙක් අරූපධාතුපයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

සත්‍යයෝ තිදෙනෙක් අරූපධාතුපයාපන්න නො වෙත්. දුඃඛසත්‍යය අරූපධාතු පයාපන්න ද වේ. අරූපධාතුපයාපන්න නොද වේ.

තුදුස් ඉන්ද්‍රිය කෙනෙක් අරූපධාතුපයාපන්න නො වෙත්. ඉන්ද්‍රියයෝ අටදෙනෙක් අරූපධාතුපයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

අකුශල හෙතුහු තිදෙන අරූපධාතුපයාපන්න නො වෙත්. ෂට්හෙතුහු අරූපධාතු පයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

කබළිංකාර ආහාරය අරූපධාතුපයාපන්න නො වේ. ආහාරයෝ තිදෙනෙක් අරූපධාතුපයාපන්න ද වෙත්. අරූපධාතුපයාපන්න නොද වෙත්.

ෂට්ස්පර්ශයෝ අරූපධාතුපයාපන්න නො වෙත්. මනොවිඥානධාතුසංස්පර්ශය අරූපධාතුපයාපන්න ද වේ. අරූපධාතුපයාපන්න නොද වේ.

ෂට්වෙදනාවෝ . . . ෂට්සංඥාවෝ . . . ෂඩ්චෙතනාවෝ . . . ෂට්චිත්තයෝ අරූපධාතුපයාපන්න නො වෙත්. මනොවිඥානධාතු අරූපධාතුපයාපන්න ද වේ. අරූපධාතුපයාපන්න නොද වේ.

21—සිපි 17626 (75/03)

1041. පඤ්චන්නං ඛන්ධානං කති පරියාපන්නා: කති අපරියාපන්නා -පෙ- සත්තන්නං චිත්තානං කති පරියාපන්නා: කති අපරියාපන්නා:

රූපක්ඛන්ධො පරියාපන්නො. චත්තාරො ඛන්ධා සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

දසායතනා පරියාපන්නා. ද්වෙ ආයතනා සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

සොළස ධාතුයො පරියාපන්නා. ද්වෙ ධාතුයො සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

ද්වෙ සච්චා පරියාපන්නා. ද්වෙ සච්චා අපරියාපන්නා.

දසින්ද්‍රියා පරියාපන්නා. තීණින්ද්‍රියා අපරියාපන්නා. නවින්ද්‍රියා සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

තයො අකුසලහෙතූ පරියාපන්නා. ඡ හෙතූ සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

කබළීකාරො ආහාරො පරියාපන්නො. තයො ආහාරා සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

ඡ ඵස්සා පරියාපන්නා. මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො සියා පරියාපන්නො, සියා අපරියාපන්නො.

ඡ වෙදනා -පෙ- ඡ සඤ්ඤා -පෙ- ඡ චෙතනා -පෙ- ඡ චිත්තා පරියාපන්නා. මනොවිඤ්ඤාණධාතු සියා පරියාපන්නා, සියා අපරියාපන්නා.

## 4

1042. කාමධාතුයා උපපත්තික්ඛණෙ කති ඛන්ධා පාතුභවන්ති -පෙ- කති චිත්තානි පාතුභවන්ති:

කාමධාතුයා උපපත්තික්ඛණෙ සබ්බෙසං පඤ්චක්ඛන්ධා පාතුභවන්ති.

කස්සචි එකාදසායතනානි පාතුභවන්ති. කස්සචි දසායතනානි පාතුභවන්ති. කස්සචි අපරානි දසායතනානි පාතුභවන්ති. කස්සචි නවායතනානි පාතුභවන්ති. කස්සචි සත්තායතනානි පාතුභවන්ති.

කස්සචි එකාදස ධාතුයො පාතුභවන්ති. කස්සචි දස ධාතුයො පාතුභවන්ති. කස්සචි අපරා දස ධාතුයො පාතුභවන්ති. කස්සචි නව ධාතුයො පාතුභවන්ති. කස්සචි සත්ත ධාතුයො පාතුභවන්ති.

සබ්බෙසං එකං සච්චං පාතුභවති.

කස්සචි චුද්දසින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි තෙරසින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි අපරානි තෙරසින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි ද්වාදසින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි දසින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි නවින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි අපරානි නවින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි අපරානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි සත්තින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි පඤ්චින්ද්‍රියානි පාතුභවන්ති. කස්සචි චත්තාරින්ද්‍රියානි පාතුභවන්ති.

කස්සචි තයො හෙතූ පාතුභවන්ති. කස්සචි ද්වෙ හෙතූ පාතුභවන්ති. කෙචි[1] අහෙතුකා පාතුභවන්ති.

සබ්බෙසං චත්තාරො ආහාරා පාතුභවන්ති. සබ්බෙසං එකො ඵස්සො පාතුභවති.

සබ්බෙසං එකා වෙදනා, එකා සඤ්ඤා, එකා චෙතනා, එකං චිත්තං පාතුභවති.

1. කස්සචි - සීමු, මජසං.

1041. පඤ්චස්කන්ධයන් අතුරෙහි කෙතෙක් පයඞාපන්නයෝ වෙත් ද කෙතෙක් අපයඞාපන්නයෝ වෙත් ද . . . සප්තචිත්තයන් අතුරෙහි කෙතෙක් පයඞාපන්නයෝ වෙත් ද කෙතෙක් අපයඞාපන්නයෝ වෙත් ද යත් :

රූපස්කන්ධය පයඞාපන්න යි. සතර ස්කන්ධ කෙනෙක් පයඞාපන්න ද වෙත්. අපයඞාපන්න ද වෙත්.

දශආයතන කෙනෙක් පයඞාපන්නයහ. ආයතනයෝ දෙදෙනෙක් පයඞාපන්න ද වෙත්. අපයඞාපන්න ද වෙත්.

සොළොස් ධාතු කෙනෙක් පයඞාපන්නයහ. ධාතූහු දෙදෙනෙක් පයඞාපන්න ද වෙත්. අපයඞාපන්න ද වෙත්.

සත්‍යයෝ දෙදෙනෙක් පයඞාපන්නයහ. සත්‍යයෝ දෙදෙනෙක් අපයඞාපන්න වෙත්.

ඉන්ද්‍රියයෝ දශ දෙනෙක් පයඞාපන්නයහ. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් අපයඞාපන්න යහ. ඉන්ද්‍රියයෝ නවදෙනෙක් පයඞාපන්න ද වෙත්. අපයඞාපන්න ද වෙත්.

අකුසලහෙතූහු තිදෙනෙක් පයඞාපන්නයහ. ෂඩ් හෙතූහු පයඞාපන්න ද වෙත්. අපයඞාපන්න ද වෙත්.

කබළිංකාර ආහාරය පයඞාපන්න ය. ආහාරයෝ තිදෙනෙක් පයඞාපන්න ද වෙති. අපයඞාපන්න ද වෙත්.

ෂට්ස්පර්ශයෝ පයඞාපන්නයහ. මනොවිඥානධාතුසංස්පර්ශය පයඞාපන්න ද වෙයි, අපයඞාපන්න ද වේ.

ෂඩ්වෙදනාවෝ . . . ෂට්සංඥාවෝ . . . ෂට්චෙතනාවෝ . . . ෂට්චිත්තයෝ පයඞාපන්නයහ. මනොවිඥානධාතු පයඞාපන්න ද වේ. අපයඞාපන්න ද වේ.

## 4

1042. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කෙතෙක් ස්කන්ධයෝ පහළ වෙත් ද, . . . කෙතෙක් සිත් පහළ වෙත් ද යත් :

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි සියල්ලන්ට පඤ්චස්කන්ධයෝ පහළ වෙත්.

කිසිවකුට එකොළොස් ආයතන කෙනෙක් පහළ වෙති. කිසිවකුට දශආයතන කෙනෙක් පහළ වෙති. කිසිවකුට අන්‍ය දශආයතන කෙනෙක් පහළ වෙති. කිසිවකුට නවආයතන කෙනෙක් පහළ වෙති. කිසිවකුට සත්ආයතන කෙනෙක් පහළ වෙත්.

කිසිවකුට එකොළොස් ධාතූහු පහළ වෙති. කිසිවකුට දශධාතූහු පහළ වෙති. කිසිවකුට අන්‍ය වූ දශධාතූහු පහළ වෙති. කිසිවකුට නවධාතූහු පහළ වෙති. කිසිවකුට සප්තධාතූහු පහළ වෙත්.

සියල්ලන්ට එක් සත්‍යයක් පහළ වෙයි.

කිසිවකුව තුදුස් ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට අන්‍ය වූ තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළවෙති. කිසිවකුට දොළොස් ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට දශ ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට නව ඉන්ද්‍රියයෝ පහළ වෙත්. කිසිවකුට අන්‍ය වූ නව ඉන්ද්‍රියයෝ පහළ වෙත්. කිසිවකුට අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට අන්‍ය වූ අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට සප්ත ඉන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට පඤ්චෙන්ද්‍රියයෝ පහළ වෙති. කිසිවකුට සතර ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කිසිවකුට හෙතූහු තිදෙනෙක් පහළ වෙති. කිසිවකුට හෙතූ දෙදෙනෙක් පහළ වෙති. කිසිකෙනෙක් අහෙතුක වැ පහළ වෙත්.

සියල්ලන්ට සතර ආහාරයෝ පහළ වෙත්. සියල්ලන්ට එක් ස්පර්ශයෙක් පහළ වෙයි. සියල්ලන්ට එක් වෙදනාවක් . . . එක් සංඥාවක් . . . එක් චෙතනාවක් . . . එක් සිතක් පහළ වෙයි.

1643. කාමධාතුයා උපපත්තික්ඛණෙ සබ්බෙසං කතමෙ පඤ්චක්ඛන්ධා පාතුභවන්ති: රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො. කාමධාතුයා උපපත්තික්ඛණෙ සබ්බෙසං ඉමෙ පඤ්චක්ඛන්ධා පාතුභවන්ති.

1044. කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස[1] එකාදසායතනානි පාතුභවන්ති: කාමාවචරානං දෙවානං, පඨමකප්පිකානං මනුස්සානං, ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං පරිපුණ්ණායතනානං, උපපත්තික්ඛණෙ එකාදසායතනානි පාතුභවන්ති: චක්ඛායතනං රූපායතනං සොතායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං, කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි එකාදසායතනානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස දසායතනානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං ඔපපාතිකානං අසුරානං ඔපපාතිකානං තිරච්ඡානගතානං නෙරයිකානං ජච්චන්ධානං උපපත්තික්ඛණෙ දසායතනානි පාතුභවන්ති: රූපායතනං සොතායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං, කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි දසායතනානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස අපරානි දසායතනානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං, ජච්චබධිරානං උපපත්තික්ඛණෙ දසායතනානි පාතුභවන්ති: චක්ඛායතනං රූපායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි දසායතනානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස නවායතනානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං, ජච්චබධිරානං, උපපත්තික්ඛණෙ නවායතනානි පාතුභවන්ති: රූපායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි නවායතනානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස සත්තායතනානි පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං උපපත්තික්ඛණෙ සත්තායතනානි පාතුභවන්ති: රූපායතනං ගන්ධායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි සත්තායතනානි පාතුභවන්ති.

1045. කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස එකාදස ධාතුයො පාතුභවන්ති: කාමාවචරානං දෙවානං පඨමකප්පිකානං මනුස්සානං, ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං පරිපුණ්ණායතනානං, උපපත්තික්ඛණෙ එකාදස ධාතුයො පාතුභවන්ති: චක්ඛුධාතු රූපධාතු සොතධාතු ඝානධාතු ගන්ධධාතු ජිව්හාධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමා එකාදසධාතුයො පාතුභවන්ති.

---

1. කස්සචි - සිරිමු.

1043. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි සියල්ලන්ට කවර පඤ්චස්කන්ධයෝ පහළ වෙත් ද යත් : රූපස්කන්ධ ය . . . විඥානස්කන්ධ යි.

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි සියල්ලන්ට මේ පඤ්චස්කන්ධයෝ පහළ වෙත්.

1044. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට එකොළොස් ආයතන කෙනෙක් පහළ වෙත් ද යත් : කාමාවචර දෙවියන්ට ද ප්‍රථම කල්පිකවූ මනුෂ්‍යයන්ට ද ඖපපාතික වූ ප්‍රෙතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද සම්පූර්ණ ආයතන ඇතියනට උත්පත්තික්ෂණයෙහි එකොළොස් ආයතනයෝ පහළ වෙත් : චක්ෂුරායතන ය රූපායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ගන්ධායතන ය ජිහ්වායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි මොවුන්ට මේ එකොළොස් ආයතනයෝ පහළ වෙත්.

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට දශායතනයෝ පහළ වෙත් ද යත් : ඖපපාතිකවූ ප්‍රෙතයන්ට ද ඖපපාතිකවූ අසුරයන්ට ද ඖපපාතිකවූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද ජාත්‍යන්ධයන්ට ද උත්පත්තික්ෂණයෙහි දශායතනයෝ පහළ වෙත් : රූපායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ගන්ධායතන ය ජිව්හායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි මොවුන්ට මේ දශායතනයෝ පහළ වෙත්.

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට අන්‍ය වූ දශායතනයෝ පහළ වෙත් ද යත් : ඖපපාතික වූ ප්‍රෙතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද උත්පත්තියෙන් බිහිරි වූවන්ට ද උත්පත්තික්ෂණයෙහි දශායතනයෝ පහළ වෙත් : චක්ෂුරායතන ය රූපායතන ය ඝ්‍රාණායතන ය ගන්ධායතන ය ජිව්හායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්ත්වයන්ට මේ දශායතනයෝ පහළ වෙත්.

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරකුට නවායතනයෝ පහළ වෙත් ද යත් : ඖපපාතික වූ ප්‍රෙතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද ජාත්‍යන්ධයන්ට ද උත්පත්තික්ෂණයෙහි නවආයතනයෝ පහළ වෙත් : රූපායතන ය ඝ්‍රාණායතන ය ගන්ධායතන ය ජිව්හායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්ත්වයන්ට මේ නවායතනයෝ පහළ වෙත්.

කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරකුට සප්තායතනයෝ පහළ වෙත් ද යත් : ගැබිහි හෝනා සත්ත්වයන්ගේ උත්පත්තික්ෂණයෙහි සප්තායතනයෝ පහළ වෙත් : රූපායතන ය ගන්ධායතන ය රසායතන ය කායායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය මනායතන ය ධර්මායතන යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්ත්වයන්ට මේ සප්තායතනයෝ පහළ වෙත්.

1045. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට එකොළොස් ධාතුහු පහළ වෙත් ද යත් : කාමාවචර දෙවියන්ට ද ප්‍රථමකල්පයෙහි වූ මනුෂ්‍යයන්ට ද ඖපපාතික වූ ප්‍රෙතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද පරිපූර්ණ ආයතන ඇත්තවුන්ට උත්පත්තික්ෂණයෙහි එකොළොස් ධාතුහු පහළ වෙත් : චක්ෂුර්ධාතු රූපධාතු ශ්‍රොත්‍රධාතු ඝ්‍රාණධාතු ගන්ධධාතු ජිව්හාධාතු රසධාතු කායධාතු ස්ප්‍රෂ්ටව්‍යධාතු මනොවිඥානධාතු ධර්මධාතු යි. කාමධාතුවෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්ත්වයන්ට මේ එකොළොස් ධාතුහු තුමූ පහළ වෙත්.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස දස ධාතුයො පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං, ජච්චන්ධානං උපපත්තික්ඛණෙ දස ධාතුයො පාතුභවන්ති: රූපධාතු සොතධාතු ඝානධාතු ගන්ධධාතු ජිව්හාධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමා දස ධාතුයො පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස අපරා දස ධාතුයො පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං, ජච්චබධිරානං උපපත්තික්ඛණෙ දස ධාතුයො පාතුභවන්ති: චක්ඛුධාතු රූපධාතු ඝානධාතු ගන්ධධාතු ජිව්හාධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමා දස ධාතුයො පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස නව ධාතුයො පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං, ඔපපාතිකානං අසුරානං, ඔපපාතිකානං තිරච්ඡානගතානං, නෙරයිකානං, ජච්චන්ධබධිරානං උපපත්තික්ඛණෙ නව ධාතුයො පාතුභවන්ති: රූපධාතු ඝානධාතු ගන්ධධාතු ජිව්හාධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමා නව ධාතුයො පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස සත්ත ධාතුයො පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං උපපත්තික්ඛණෙ සත්ත ධාතුයො පාතුභවන්ති: රූපධාතු ගන්ධධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමා සත්ත ධාතුයො පාතුභවන්ති.

1046. කාමධාතුයා උපපත්තික්ඛණෙ සබ්බෙසං කතමං එකං සච්චං පාතුභවති: දුක්ඛසච්චං. කාමධාතුයා උපපත්තික්ඛණෙ සබ්බෙසං ඉදං එකං සච්චං පාතුභවති.

1047. කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස චුද්දසින්ද්‍රියානි පාතුභවන්ති: කාමාවචරානං දෙවානං සහෙතුකානං ඤාණසම්පයුත්තානං උපපත්තික්ඛණෙ චුද්දසින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි චුද්දසින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස තෙරසින්ද්‍රියානි පාතුභවන්ති: කාමාවචරානං දෙවානං සහෙතුකානං ඤාණවිප්පයුත්තානං උපපත්තික්ඛණෙ තෙරසින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි තෙරසින්ද්‍රියානි පාතුභවන්ති.

Free Distribution www.aathaapi.org

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට දශධාතූහු පහළ වෙත් ද යත්: ඖපපාතික වූ ප්‍රේතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද ජාත්‍යන්ධයන්ට ද උත්පත්තික්ෂණයෙහි දශධාතූහු පහළ වෙති : රූපධාතු ශ්‍රොත්‍ර ධාතු ඝ්‍රාණධාතු ගන්ධධාතු ජිහ්වාධාතු රසධාතු කායධාතු ස්ප්‍රෂ්ටව්‍යධාතු මනොවිඥාන ධාතු ධර්මධාතු යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ දශධාතූහු පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට අන්‍යවූ දශධාතූහු පහළ වෙත් ද යත්: ඖපපාතික වූ ප්‍රේතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද උත්පත්තියෙන් බිහිරන්ට ද උත්පත්තික්ෂණයෙහි දශධාතූහු පහළ වෙති : චක්ෂුර්ධාතු රූපධාතු ඝ්‍රාණධාතු ගන්ධධාතු ජිහ්වාධාතු රසධාතු කායධාතු ස්ප්‍රෂ්ටව්‍යධාතු මනොවිඥාන ධාතු ධර්මධාතු යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ දශ ධාතූහු පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට නවධාතූහු පහළ වෙත් ද යත් : ඖපපාතික වූ ප්‍රේතයන්ට ද ඖපපාතික වූ අසුරයන්ට ද ඖපපාතික වූ තිරිසනුන්ට ද නිරිසතුන්ට ද උත්පත්තියෙන් අඳබිහිරි වූවන්ට ද උත්පත්තික්ෂණයෙහි නවධාතූහු පහළ වෙති : රූපධාතු ඝ්‍රාණධාතු ගන්ධධාතු ජිහ්වාධාතු රසධාතු කායධාතු ස්ප්‍රෂ්ටව්‍ය ධාතු මනොවිඥානධාතු ධර්මධාතු යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ නව ධාතූහු පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට සප්තධාතූහු පහළ වෙත් ද යත් : ගැබ හෝනා සත්නට උපන් ඇසිල්ලෙහි ධාතූහු සත් දෙනෙක් පහළ වෙති : රූපධාතු ගන්ධධාතු රසධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතුයි. කාමධාතුයෙහි උපන් ඇසිල්ලෙහි තෙල සත්නට මේ සප්තධාතූහු පහළ වෙත්.

1046. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි සියල්ලන්ට කවර එක් සත්‍යයෙක් පහළ වේ ද යත් : දුඃඛසත්‍ය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි සියල්ලන්ට මේ එක් සත්‍යය පහළ වේ.

1047. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට තුදුස් ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : සහෙතුක වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචරදෙවියන්ට උත්පත්තික්ෂණයෙහි තුදුස් ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිහ්වෙන්ද්‍රිය කායෙන්ද්‍රිය මනඉන්ද්‍රිය ස්ත්‍රීන්ද්‍රිය හෝ පුරුෂෙන්ද්‍රිය හෝ ය ජීවිතෙන්ද්‍රිය සොම නස්සින්ද්‍රිය හෝ උපෙක්ෂෙන්ද්‍රිය හෝ ය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය ස්මෘතීන්ද්‍රිය සමාධීන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන් හට මේ තුදුස් ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : සහෙතුක වූ ඥානවිප්‍රයුක්ත වූ කාමාවචරදෙවියන්ට උත්පත්තික්ෂණයෙහි තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ජිහ්වෙන්ද්‍රිය කායෙන්ද්‍රිය මනඉන්ද්‍රිය ස්ත්‍රීන්ද්‍රිය හෝ පුරුෂෙන්ද්‍රිය හෝ ය ජීවිතෙන්ද්‍රිය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ෂෙන්ද්‍රිය හෝ ය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය ස්මෘතීන්ද්‍රිය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයා උපපත්තික්ඛණෙ[1] කස්ස අපරානි තෙරසින්ද්‍රියානි පාතුභවන්ති: පඨමකප්පිකානං මනුස්සානං සහෙතුකානං ඤාණසම්පයුත්තානං උපපත්තික්ඛණෙ තෙරසින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි තෙරසින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස ද්වාදසින්ද්‍රියානි පාතුභවන්ති: පඨමකප්පිකානං මනුස්සානං සහෙතුකානං ඤාණවිප්පයුත්තානං උපපත්තික්ඛණෙ ද්වාදසින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි ද්වාදසින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස දසින්ද්‍රියානි පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං සහෙතුකානං ඤාණසම්පයුත්තානං උපපත්තික්ඛණෙ දසින්ද්‍රියානි පාතුභවන්ති: කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං. පඤ්ඤින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි දසින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස නවින්ද්‍රියානි පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං සහෙතුකානං ඤාණවිප්පයුත්තානං උපපත්තික්ඛණෙ නවින්ද්‍රියානි පාතුභවන්ති: කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි නවින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස අපරානි නවින්ද්‍රියානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං ඔපපාතිකානං අසුරානං ඔපපාතිකානං තිරච්ඡානගතානං නෙරයිකානං පරිපුණ්ණායතනානං උපපත්තික්ඛණෙ නවින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි නවින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං ඔපපාතිකානං අසුරානං ඔපපාතිකානං තිරච්ඡානගතානං නෙරයිකානං ජච්චන්ධානං උපපත්තික්ඛණෙ අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති: සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උපපත්තික්ඛණෙ කස්ස අපරානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං ඔපපාතිකානං අසුරානං ඔපපාතිකානං තිරච්ඡානගතානං නෙරයිකානං ජච්චබධිරානං උපපත්තික්ඛණෙ අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. කාමධාතුයා උපපත්තික්ඛණෙ එතෙසං ඉමානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති.

---

1. උපපත්තික්ඛණෙ - මජසං.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට අන්‍ය වූ තෙළෙස්ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ප්‍රථමකල්පයෙහි වූ ඥානසම්ප්‍රයුක්ත වූ සහෙතුක වූ මනුෂ්‍යයන්ට උත්පත්තික්ෂණයෙහි තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිහ්වෙන්ද්‍රිය කායෙන්ද්‍රිය මනින්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ෂෙන්ද්‍රිය හෝ ය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය ස්මෘතීන්ද්‍රිය සමාධීන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ තෙළෙස් ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට දෙළොස් ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ප්‍රථමකල්පයෙහි වූ සහෙතුක වූ ඥානවිප්‍රයුක්ත වූ මනුෂ්‍යයන්ට උත්පත්තික්ෂණයෙහි දෙළොස් ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ෂුරින්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිහ්වෙන්ද්‍රිය කායෙන්ද්‍රිය මනඉන්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ෂෙන්ද්‍රිය හෝ ය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය ස්මෘතීන්ද්‍රි ය සමාධීන්ද්‍රිය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ දෙළොස්ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි කවරක්හට දශ ඉන්ද්‍රිය කෙනෙක් පහළ වෙත් ද යත් : ගැබ්හි හෝනා ඥානසම්ප්‍රයුක්ත වූ සහෙතුක වූ සත්වයනට උත්පත්තික්ෂණයෙහි දශ ඉන්ද්‍රිය කෙනෙක් පහළ වෙති : කායෙන්ද්‍රිය මන ඉන්ද්‍රිය ස්ත්‍රීන්ද්‍රිය හෝ පුරුෂෙන්ද්‍රිය හෝ ය ජීවිතෙන්ද්‍රිය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ෂෙන්ද්‍රිය හෝ ය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය ස්මෘතීන්ද්‍රිය සමාධීන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යි. කාමධාතුයෙහි උත්පත්තික්ෂණයෙහි තෙල සත්වයන්ට මේ දශ ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට නව ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ගැබ හෝනා සහෙතුක වූ සත්ත්වයනට ඥානවිප්‍රයුක්ත සත්ත්වයනට උපදනා ඇසිල්ලෙහි නව ඉන්ද්‍රියයෝ පහළ වෙති : කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ඛින්ද්‍රිය හෝ ය සද්ධින්ද්‍රිය ය විරියින්ද්‍රිය ය ස්ත්‍රීන්ද්‍රිය ය සමාධින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලුනට මේ නව ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට අනෙකුදු නව ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ඔපපාතික ප්‍රෙතයනට ඔපපාතික අසුරයනට ඔපපාතික තිරශ්චීනගත යනට නෙරිසත්නට පිරිපුන්ඉඳුරන් ඇතියනට උපදනා ඇසිල්ලෙහි නව ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ඛුන්ද්‍රිය ය සොතින්ද්‍රිය ය ඝානින්ද්‍රිය ය ජිව්හින්ද්‍රිය ය කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලුනට මේ නව ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ඔපපාතික ප්‍රෙතයනට ඔපපාතික අසුරයනට ඔපපාතික තිරශ්චීනගතයනට නිරිසත්නට ජාත්‍යන්ධයනට උපදනා ඇසිල්ලෙහි අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙති : සොතින්ද්‍රිය ය ඝානින්ද්‍රිය ය ජිව්හින්ද්‍රිය ය කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලුනට මේ අට ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට අනෙකුදු අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ඔපපාතික ප්‍රෙතයන්ට ඔපපාතික අසුරයන්ට ඔපපාතික තිරශ්චීනගත යන්ට නිරිසත්නට ජාතිබධිරයනට උපදනා ඇසිල්ලෙහි අෂ්ට ඉන්ද්‍රියයෝ පහළ වෙති : චක්ඛුන්ද්‍රිය ය ඝානින්ද්‍රිය ය ජිව්හින්ද්‍රිය ය කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලුනට මේ අට ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්ස සත්තින්ද්‍රියානි පාතුභවන්ති: ඔපපාතිකානං පෙතානං ඔපපාතිකානං අසුරානං ඔපපාතිකානං තිරච්ඡානගතානං නෙරයිකානං ජච්චබධිරානං උප්පත්තික්ඛණෙ සත්තින්ද්‍රියානි පාතුභවන්ති: ඝාණින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. කාමධාතුයා උප්පත්තික්ඛණෙ එතෙසං ඉමානි සත්තින්ද්‍රියානි පාතුභවන්ති.

කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්ස පඤ්චින්ද්‍රියානි පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං අහෙතුකානං ඨපෙත්වා නපුංසකානං උප්පත්තික්ඛණෙ පඤ්චින්ද්‍රියානි පාතුභවන්ති: කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං වා පුරිසින්ද්‍රියං වා ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. කාමධාතුයා උප්පත්තික්ඛණෙ එතෙසං ඉමානි පඤ්චින්ද්‍රියානි පාතුභාවන්ති.

කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්ස චත්තාරින්ද්‍රියානි පාතුභවන්ති: ගබ්භසෙය්‍යකානං සත්තානං අහෙතුකානං නපුංසකානං උප්පත්තික්ඛණෙ චත්තාරින්ද්‍රියානි පාතුභවන්ති: කායින්ද්‍රියං මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං: කාමධාතුයා උප්පත්තික්ඛණෙ එතෙසං ඉමානි චත්තාරින්ද්‍රියානි පාතුභවන්ති.

1048. කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්ස තයො හෙතූ පාතුභවන්ති: කාමාවචරානං දෙවානං පඨමකප්පිකානං මනුස්සානං ගබ්භසෙය්‍යකානං සත්තානං සහෙතුකානං ඤාණසම්පයුත්තානං උප්පත්තික්ඛණෙ තයො හෙතූ පාතුභවන්ති: අලොභො විපාකහෙතු, අදොසො විපාකහෙතු, අමොහො විපාකහෙතු. කාමධාතුයා උප්පත්තික්ඛණෙ එතෙසං ඉමෙ තයො හෙතූ පාතුභවන්ති.

කාමධාතුයා උප්පත්තික්ඛණෙ කස්ස ද්වෙ හෙතූ පාතුභවන්ති: කාමාවචරානං දෙවානං පඨමකප්පිකානං මනුස්සානං ගබ්භසෙය්‍යකානං සත්තානං සහෙතුකානං ඤාණවිප්පයුත්තානං උප්පත්තික්ඛණෙ ද්වෙ හෙතූ පාතුභවන්ති: අලොභො විපාකහෙතු, අදොසො විපාකහෙතු. කාමධාතුයා උප්පත්තික්ඛණෙ එතෙසං ඉමෙ ද්වෙ හෙතූ පාතුභවන්ති. අවසෙසා සත්තා[1] අහෙතුකා පාතුභවන්ති.

1049. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං කතමෙ චත්තාරො ආහාරා පාතුභවන්ති: කබළිංකාරො ආහාරො ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං ඉමෙ චත්තාරො ආහාරා පාතුභවන්ති.

1050. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං කතමො එකො ඵස්සො පාතුභවති: මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං අයං එකො ඵස්සො පාතුභවති.

1051. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං කතමා එකා වෙදනා -පෙ- එකා සඤ්ඤා -පෙ- එකා චෙතනා -පෙ- එකං චිත්තං පාතුභවති: මනොවිඤ්ඤාණධාතු. කාමධාතුයා උප්පත්තික්ඛණෙ සබ්බෙසං ඉදං එකං චිත්තං පාතුභවති.

1052. රූපධාතුයා උප්පත්තික්ඛණෙ කති ඛන්ධා පාතුභවන්ති -පෙ- කති චිත්තානි පාතුභවන්ති: රූපධාතුයා උප්පත්තික්ඛණෙ ඨපෙත්වා අසඤ්ඤසත්තානං දෙවානං පඤ්චක්ඛන්ධා පාතුභවන්ති, පඤ්චායතනානි පාතුභවන්ති, පඤ්ච ධාතුයො පාතුභවන්ති, එකං සච්චං පාතුභවති, දසින්ද්‍රියානි පාතුභවන්ති, තයො හෙතූ පාතුභවන්ති, තයො ආහාරා පාතුභවන්ති, එකො ඵස්සො පාතුභවති, එකා වෙදනා, එකා සඤ්ඤා, එකා චෙතනා, එකං චිත්තං පාතුභවති.

1. අවසෙසානං සත්තානං – සීමු, මජසං

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට සප්ත ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ඖපපාතික ප්‍රෙතයනට ඖපපාතික අසුරයනට ඖපපාතික තිරශ්චීනගතයනට නෛරි සත්නට ජාතිබධිරයනට උපදනා ඇසිල්ලෙහි සප්ත ඉන්ද්‍රියයෝ පහළ වෙති : ඝ්‍රාණින්ද්‍රිය ය ජිව්හින්ද්‍රිය ය කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලූනට මේ සප්ත ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට පඤ්ච ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : නපුංසකයනට තබා ගැබහෝනා අහෙතුක සත්නට උපදනා ඇසිල්ලෙහි පඤ්චෙන්ද්‍රියයෝ පහළ වෙති : කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ඉත්ථින්ද්‍රිය හෝ පුරිසින්ද්‍රිය හෝ ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලූනට මේ පස් ඉඳුරෝ පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට සතර ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : ගැබහෝනා අහෙතුක වූ නපුංසක සත්ත්වයනට උපදනා ඇසිල්ලෙහි සතර ඉන්ද්‍රියයෝ පහළ වෙති : කායින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ජීවිතින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලූනට මේ සතර ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

1048. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට තුන් හෙතුහු පහළ වෙත් ද යත් : කාමාවචර දෙවියනට ප්‍රථමකල්පයෙහි වූ මිනිස්නට ගැබහෝනා සත්නට සහෙතුක වූ ඥානසම්ප්‍රයුක්ත චුවනට උපදනා ඇසිල්ලෙහි තුන් හෙතුහු පහළ වෙති : අලොභ විපාකහෙතු ය අදෙස විපාකහෙතු ය අමොහ විපාකහෙතු යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලූනට මේ තුන් හෙතුහු පහළ වෙත්.

කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවරක්හට ද්විහෙතුහු පහළ වෙත් ද යත් : කාමාවචර දෙවියනට ප්‍රථමකල්පික මිනිස්නට ගැබහෝනා සත්නට සහෙතුක ඥානවිප්‍රයුක්ත චුවනට උපදනා ඇසිල්ලෙහි ද්විහෙතුහු පහළ වෙති : අලොභවිපාකහෙතු ය අදෙසවිපාකහෙතු යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි තුලූනට මේ ද්විහෙතුහු පහළ වෙත්. සෙසු සත්ත්වයෝ අහෙතුක වැ පහළ වෙත්.

1049. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි සියලු සත්නට කවර සතර ආහාරයෝ පහළ වෙත් ද යත් : කවලීකාරාහාර ය ස්පර්ශාහාර ය මනස්සඤ්චෙතනාහාර ය විඥානාහාර යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි සියලු සත්නට මේ සතර ආහාරයෝ පහළ වෙත්.

1050. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි සියලු සත්නට කවර එක් ස්පර්ශයෙක් පහළ වෙයි යත් : මනොවිඥානධාතුසංස්පර්ශය යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි හැම සත්නට මේ එක ස්පර්ශය පහළ වේ.

1051. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි හැම සත්නට කවර එක් වෙදනාවක් . . . එක් සංඥවක් . . . එක් චෙතනාවක් . . . එක් සිතක් පහළ වෙයි යත් : මනොවිඥාන ධාතු යි. කාමධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි හැම සත්නට මේ එක් සිත පහළ වේ.

1052. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කෙතෙක් ස්කන්ධයෝ පහළ වෙත් ද . . . කෙතෙක් චිත්තයෝ පහළ වෙත් ද යත් : රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි අසංඥසත්ත්ව දෙවියනට තබා පඤ්ච ස්කන්ධයෝ පහළ වෙති. පඤ්චායතනයෝ පහළ වෙති. පඤ්ච ධාතුහු පහළ වෙති. එක් සත්‍යයෙක් පහළ වෙයි. දශ ඉන්ද්‍රියයෝ පහළ වෙති. තුන් හෙතුහු පහළ වෙති. තුන් ආහාරයෝ පහළ වෙති. එක් ස්පර්ශයෙක් පහළ වෙයි. එක් වෙදනාවක්, එක් සංඥවක්, එක් චෙතනාවක්, එක් චිත්තයෙක් පහළ වේ.

1053. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ පඤ්චක්ඛන්ධා පාතුභවන්ති: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ පඤ්චක්ඛන්ධා පාතුභවන්ති.

1054. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමානි පඤ්චායතනානි පාතුභවන්ති: චක්ඛායතනං රූපායතනං සොතායතනං මනායතනං ධම්මායතනං. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමානි පඤ්චායතනානි පාතුභවන්ති.

1055. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමා පඤ්ච ධාතුයො පාතුභවන්ති: චක්ඛුධාතු රූපධාතු සොතධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමා පඤ්ච ධාතුයො පාතුභවන්ති.

1056. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමං එකං සච්චං පාතුභවති: දුක්ඛසච්චං. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉදං එකං සච්චං පාතුභවති.

1057. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමානි දසින්ද්‍රියානි පාතුභවන්ති: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං වා උපෙක්ඛින්ද්‍රියං වා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමානි දසින්ද්‍රියානි පාතුභවන්ති.

1058. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ තයො හෙතූ පාතුභවන්ති: අලොභො විපාක හෙතු, අදොසො විපාකහෙතු, අමොහො විපාකහෙතු. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ තයො හෙතූ පාතුභවන්ති.

1059. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ තයො ආහාරා පාතුභවන්ති: ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. රූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ තයො ආහාරා පාතුභවන්ති.

1060. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමො එකො ඵස්සො පාතුභවති: මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. රූපධාතුයා උපපත්තික්ඛණෙ අයං එකො ඵස්සො පාතුභවති.

1061. රූපධාතුයා උපපත්තික්ඛණෙ කතමා එකා වෙදනා -පෙ- එකා සඤ්ඤා -පෙ- එකා චෙතනා -පෙ- එකං චිත්තං පාතුභවති: මනොවිඤ්ඤාණධාතු. රූපධාතුයා උපපත්තික්ඛණෙ. ඉදං එකං චිත්තං පාතුභවති.

1062. අසඤ්ඤසත්තානං දෙවානං උපපත්තික්ඛණෙ කති ඛන්ධා පාතුභවන්ති: -පෙ- කති චිත්තානි පාතුභවන්ති: අසඤ්ඤසත්තානං දෙවානං උපපත්තික්ඛණෙ එකො ඛන්ධො පාතුභවති: රූපක්ඛන්ධො. ද්වෙ ආයතනානි පාතුභවන්ති: රූපායතනං ධම්මායතනං. ද්වෙ ධාතුයො පාතුභවන්ති: රූපධාතු ධම්මධාතු. එකං සච්චං පාතුභවති: දුක්ඛසච්චං. එකින්ද්‍රියං පාතුභවති: රූපජීවිතින්ද්‍රියං. අසඤ්ඤසත්තා දෙවා අහෙතුකා, අනාහාරා, අඵස්සකා, අවෙදනකා, අසඤ්ඤකා, අචෙතනකා, අචිත්තකා පාතුභවන්ති.

1053. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර පඤ්චස්කන්ධයෝ පහළ වෙත් ද යත් : රූපස්කන්ධ ය, වෙදනාස්කන්ධ ය, සංඥස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥන ස්කන්ධ යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ පඤ්චස්කන්ධයෝ පහළ වෙත්.

1054. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර පඤ්චායතනයෝ පහළ වෙත් ද යත් : චක්ඛායතන ය, රූපායතන ය, සොතායතන ය, මනායතන ය, ධම්මායතන යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ පඤ්චායතනයෝ පහළ වෙත්.

1055. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර පඤ්චධාතුහු පහළ වෙත් ද යත් : චක්ඛුධාතු ය, රූපධාතු ය, සොතධාතු ය, මනොවිඤ්ඤණධාතු ය, ධම්මධාතු යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ පඤ්චධාතුහු පහළ වෙත්.

1056. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් සත්‍යයෙක් පහළ වෙයි යත් : දුඃඛසත්‍යය යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක් සත්‍යය පහළ වේ.

1057. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර දශ ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : චක්ඛුන්ද්‍රිය ය සොතින්ද්‍රිය ය මනින්ද්‍රිය ය ජීවිතින්ද්‍රිය ය සොමනස්සින්ද්‍රිය හෝ උපෙක්ඛින්ද්‍රිය හෝ ය සද්ධින්ද්‍රිය ය විරියින්ද්‍රිය ය සතින්ද්‍රිය ය සමාධින්ද්‍රිය ය පඤ්ඤින්ද්‍රිය යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ දශ ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

1058. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර තුන් හෙතුහු පහළ වෙත් ද යත් : අලොභවිපාකහෙතු ය, අදොසවිපාකහෙතු ය, අමොහවිපාකහෙතු යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ තුන් හෙතුහු පහළ වෙත්.

1059. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර තුන් ආහාරයෝ පහළ වෙත් ද යත් : ස්පර්ශාහාර ය, මනස්සඤ්චෙතනාහාර ය, විඥනාහාර යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ තුන් ආහාරයෝ පහළ වෙත්.

1060. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් ස්පර්ශයෙක් පහළ වේ ද යත් : මනොවිඥනධාතුසංස්පර්ශය යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක ස්පර්ශය පහළ වේ.

1061. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් වෙදනාවක් ... එක් සංඥවක් ... එක් චෙතනාවක් ... එක් චිත්තයෙක් පහළ වෙයි යත් : මනොවිඥන ධාතු යි. රූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක් සිත පහළ වේ.

1062. අසංඥසත්ත්ව දෙවියනට උපදනා ඇසිල්ලෙහි කෙතෙක් ස්කන්ධයෝ පහළ වෙත් ද ... කෙතෙක් චිත්තයෝ පහළ වෙත් ද යත් : අසංඥසත්ත්ව දෙවියනට උපදනා ඇසිල්ලෙහි එක් ස්කන්ධයෙක් පහළ වෙයි : රූපස්කන්ධ යි. ආයතනයෝ දෙදෙනෙක් පහළ වෙති : රූපායතන ය, ධම්මායතන යි. ධාතුහු දෙදෙනෙක් පහළ වෙති : රූපධාතු ය, ධම්මධාතු යි. එක් සත්‍යයෙක් පහළ වෙයි : දුඃඛසත්‍ය යි. එක් ඉන්ද්‍රියයෙක් පහළ වෙයි : රූපජීවිතින්ද්‍රිය යි. අසංඥසත්ත්ව දෙවියෝ අහෙතුක යෝ ය, අනාහාරයෝ ය, අස්පර්ශකයෝ ය, අවෙදනකයෝ ය, අසංඥකයෝ ය, අචෙතනකයෝ ය, අචිත්තක වූවාහු පහළ වෙත්.

1063. අරූපධාතුයා උපපත්තික්ඛණෙ කති ඛන්ධා පාතුභවන්ති: -පෙ- කති චිත්තානි පාතුභවන්ති: අරූපධාතුයා උපපත්තික්ඛණෙ චත්තාරො ඛන්ධා පාතුභවන්ති, ද්වෙ ආයතනානි පාතුභවන්ති, ද්වෙ ධාතුයො පාතුභවන්ති, එකං සච්චං පාතුභවති, අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති. තයො හෙතූ පාතුභවන්ති, තයො ආහාරා පාතුභවන්ති, එකො ඵස්සො පාතුභවති එකා වෙදනා - එකා සඤ්ඤා - එකා චෙතනා - එකං චිත්තං පාතුභවති

4064. අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ චත්තාරො ඛන්ධා පාතුභවන්ති: වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ චත්තාරො ඛන්ධා පාතුභවන්ති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමානි ද්වෙ ආයතනානි පාතුභවන්ති: මනායතනං ධම්මායතනං. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමානි ද්වෙ ආයතනානි පාතුභවන්ති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමා ද්වෙ ධාතුයො පාතුභවන්ති: මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමා ද්වෙ ධාතුයො පාතුභවන්ති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමං එකං සච්චං පාතුභවති: දුක්ඛසච්චං. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉදං එකං සච්චං පාතුභවති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති: මනින්ද්‍රියං ජීවිතින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමානි අට්ඨින්ද්‍රියානි පාතුභවන්ති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ තයො හෙතූ පාතුභවන්ති: අලොභො විපාකහෙතු, අදොසො විපාකහෙතු, අමොහො විපාකහෙතු. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ තයො හෙතූ පාතුභවන්ති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමෙ තයො ආහාරා පාතුභවන්ති: ඵස්සාහාරො මනොසඤ්චෙතනාහාරො විඤ්ඤාණාහාරො. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉමෙ තයො ආහාරා පාතුභවන්ති

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමො එකො ඵස්සො පාතුභවති: මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො. අරූපධාතුයා උපපත්තික්ඛණෙ අයං එකො ඵස්සො පාතුභවති.

අරූපධාතුයා උපපත්තික්ඛණෙ කතමා එකා වෙදනා -පෙ- එකා සඤ්ඤා -පෙ- එකා චෙතනා -පෙ- එකං චිත්තං පාතුභවති: මනොවිඤ්ඤාණධාතු. අරූපධාතුයා උපපත්තික්ඛණෙ ඉදං එකං චිත්තං පාතුභවති.

## 5

1065. කාමාවචරා ධම්මා, න කාමාවචරා ධම්මා, රූපාවචරා ධම්මා, න රූපාවචරා ධම්මා, අරූපාවචරා ධම්මා, න අරූපාවචරා ධම්මා, පරියාපන්නා ධම්මා, අපරියාපන්නා ධම්මා.

1066. කතමෙ ධම්මා කාමාවචරා: හෙට්ඨතො අවීචිනිරයං පරියන්තං කරිත්වා, උපරිතො පරනිම්මිත-වසවත්තිදෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධා ධාතු ආයතනා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. ඉමෙ ධම්මා කාමාවචරා.

1063. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කෙතෙක් ස්කන්ධයෝ පහළ වෙත් ද . . . කෙතෙක් චිත්තයෝ පහළ වෙත් ද යත් : අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි සතර ස්කන්ධයෝ පහළ වෙති, ආයතනයෝ දෙදෙනෙක් පහළ වෙති, ධාතූහු දෙදෙනෙක් පහළ වෙති, එක් සත්‍යයෙක් පහළ වෙයි, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් පහළ වෙති, හෙතූහු තිදෙනෙක් පහළ වෙති, ආහාරයෝ තිදෙනෙක් පහළ වෙති, එක් ස්පර්ශයෙක් පහළ වෙයි, එක් වෙදනාවක් – එක් සංඥවක් – එක් චෙතනාවක් – එක් චිත්තයෙක් පහළ වේ.

1064. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර සතර ස්කන්ධයෝ පහළ වෙත් ද යත් : වෙදනාස්කන්ධ යැ, සංඥස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, විඥනස්කන්ධ යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ සතර ස්කන්ධයෝ පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර ආයතනයෝ දෙදෙනෙක් පහළ වෙත් ද යත් : මනායතන යැ, ධර්මායතන යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ ආයතනයෝ දෙදෙන පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර ධාතූහු දෙදෙනෙක් පහළ වෙත් ද යත් : මනොවිඥනධාතු යැ, ධර්මධාතු යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ ධාතූහු දෙදෙන පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් සත්‍යයෙක් පහළ වේ ද යත් : දුඃඛසත්‍ය යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක් සත්‍යය පහළ වේ.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර අට ඉන්ද්‍රියයෝ පහළ වෙත් ද යත් : මනින්ද්‍රිය යැ ජීවිතින්ද්‍රිය යැ උපෙක්ඛින්ද්‍රිය යැ සද්ධින්ද්‍රිය යැ විරියින්ද්‍රිය යැ සතින්ද්‍රිය යැ සමාධින්ද්‍රිය යැ පඤ්ඤින්ද්‍රිය යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ අට ඉන්ද්‍රියයෝ පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර තුන් හෙතූහු පහළ වෙත් ද යත් : අලොභවිපාකහෙතු යැ, අදෙසවිපාකහෙතු යැ, අමොහහෙතු යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ තුන් හෙතූහු පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර තුන් ආහාරයෝ පහළ වෙත් ද යත් : ස්පර්ශාහාර යැ, මනොසඤ්චෙතනාහාර යැ, විඥනාහාර යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ තුන් ආහාරයෝ පහළ වෙත්.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් ස්පර්ශයෙක් පහළ වේ ද යත් : මනොවිඥනධාතුසංස්පර්ශය යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක් ස්පර්ශය පහළ වේ.

අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි කවර එක් වෙදනාවක් . . . එක් සංඥවක් . . . එක් චෙතනාවක් . . . එක් චිත්තයෙක් පහළ වේ ද යත් : මනොවිඥනධාතු යි. අරූපධාතුයෙහි උපදනා ඇසිල්ලෙහි මේ එක් චිත්තය පහළ වේ.

## 5

1065. කාමාවචරධර්මයෝ යැ කාමාවචර නො වූ ධර්මයෝ යැ, රූපාවචරධර්මයෝ යැ, රූපාවචර නො වූ ධර්මයෝ යැ, අරූපාවචරධර්මයෝ යැ, අරූපාවචර නො වූ ධර්මයෝ යැ, පරියාපන්නධර්මයෝ යැ, අපරියාපන්නධර්මයෝ යි.

1066. කාමාවචරධර්මයෝ කවරහ යත් : යටින් අවීචිනිරය හිම් කොට උඩින් පරනිර්මිතවශවර්ති දෙවියන් ඇතුළු කොට මේ අතර මෙහි හැසිරෙන මෙහි ඇතුළු වූ යම් ස්කන්ධ කෙනෙක් ධාතු – ආයතන – රූප – වෙදනා – සංඥ – සංස්කාර කෙනෙක් විඥනයෙක් වේ ද මේ ධර්මයෝ කාමාවචරයෝ යි.

1067. කතමෙ ධම්මා න කාමාවචරා: රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා. ඉමෙ ධම්මා න කාමාවචරා.

1068. කතමෙ ධම්මා රූපාවචරා: හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කරිත්වා උපරිතො අකනිට්ඨෙ දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා. ඉමෙ ධම්මා රූපාවචරා.

1069. කතමෙ ධම්මා න රූපාවචරා: කාමාවචරා අරූපාවචරා අපරියාපන්නා. ඉමෙ ධම්මා න රූපාවචරා.

1070 කතමෙ ධම්මා අරූපාවචරා: හෙට්ඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ පරියන්තං කරිත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා. ඉමෙ ධම්මා අරූපාවචරා.

1071. කතමෙ ධම්මා න අරූපාවචරා: කාමාවචරා රූපාවචරා අපරියාපන්නා. ඉමෙ ධම්මා න අරූපාවචරා.

1072. කතමෙ ධම්මා පරියාපන්නා: සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා, කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ ධම්මා පරියාපන්නා.

1073. කතමෙ ධම්මා අපරියාපන්නා: මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු. ඉමෙ ධම්මා අපරියාපන්නා.

6

1074. දෙවාති තයො දෙවා: සම්මුති දෙවා, උපපත්ති දෙවා, විසුද්ධි දෙවා. සම්මුතිදෙවා නාම රාජානො, දෙවියො, කුමාරා. උපපත්තිදෙවා නාම චාතුම්මහාරජිකෙ දෙවෙ උපාදාය තදුපරි දෙවා. විසුද්ධිදෙවා නාම අරහන්තො වුච්චන්ති.

1075. දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා කත්ථ උපපජ්ජන්ති.

දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා අප්පෙකච්චෙ ගහපතිමහාසාලානං[1] සහබ්‍යතං උපපජ්ජන්ති[2], අප්පෙකච්චෙ බ්‍රාහ්මණමහාසාලානං සහබ්‍යතං උපපජ්ජන්ති[2], අප්පෙකච්චෙ ඛත්තියමහාසාලානං[3] සහබ්‍යතං උපපජ්ජන්ති,[2] අප්පෙකච්චෙ චාතුම්මහාරජිකානං[4] දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ නිම්මාණරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති.[1]

---

1. ඛත්තියමහාසාලානං – සිරිමු, මජසං, සහා. 2. උපපජ්ජන්ති – සිරිමු. 3. ගහපතිමහාසාලානං – සිරිමු, මජසං, සහා.
4. චාතුමහාරාජිකානං – මජසං.

1067. කාමාවචර නො වූ ධර්මයෝ කවරහ යත් : රූපාවචරයෝ යැ, අරූපාවචරයෝ යැ, අපයර්‍යාපන්නයෝ යි. මොහු කාමාවචර නො වූ ධර්මයෝ යි.

1068. රූපාවචරධර්මයෝ කවරහ යත් : යටින් බඹලොව පිරියත් කොට උඩින් අකනිට්ඨදෙවියන් ඇතුළු කොට මේ අතර මෙහි හැසිරෙන මෙහි ඇතුළු වූ සමාපන්නයාගේ හෝ උපන්නහුගේ හෝ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇත්තහුගේ හෝ යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් වෙත් ද මේ ධර්මයෝ රූපාවචරයෝ යි.

1069. රූපාවචර නො වූ ධර්මයෝ කවරහ යත් : කාමාවචරයෝ යැ, අරූපාවචරයෝ යැ, අපයර්‍යාපන්නයෝ යි. මොහු රූපාවචර නො වූ ධර්මයෝ යි.

1070. අරූපාවචරධර්මයෝ කවරහ යත් : යටින් ආකාසානඤ්චායතනූපග දෙවියන් පිරියත් කොට උඩින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන් ඇතුළු කොට මේ අතර මෙහි හැසිරෙන මෙහි ඇතුළු වැ සිටි සමාපන්නයාගේ හෝ උපපන්නයාගේ හෝ දිට්ඨධම්මසුඛවිහාර ඇත්තහුගේ හෝ යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් වෙත් ද මේ ධර්මයෝ අරූපාවචරයෝ යි.

1071. අරූපාවචර නො වූ ධර්මයෝ කවරහ යත් : කාමාවචරයෝ යැ, රූපාවචරයෝ යැ, අපර්යාපන්නයෝ යැ යන මේ ධර්මයෝ අරූපාවචර නො වෙත්.

1072. වට්ටපරියාපන්න ධර්මයෝ කවරහ යත් : සාශ්‍රව වූ කාමාවචර රූපාවචර අරූපාවචර කුශල අකුශල අව්‍යාකෘත ධර්මයෝ යැ, රූපස්කන්ධ යැ, වෙදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ (භව වශයෙන් අවකාශ වශයෙන් පිරිසිඳුනාලද) පරියාපන්නයෝ වෙත්.

1073. අපරියාපන්න ධර්මයෝ කවරහ යත් : සතර මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ (භවාදි විසින්) අපරියාපන්නයෝ වෙත්.

## 6

1074. දෙවා යනු : දෙවියෝ තුන්දෙනෙකි. සම්මුතිදෙවියෝ යැ, උත්පත්ති දෙවියෝ යැ, විශුද්ධිදෙවියෝ යි. සම්මුතිදෙවියෝ නම් : අභිෂෙක ලත් රජවරු යැ, රාජදෙවීහු යැ, රාජකුමාරයෝ යි. උත්පත්ති දෙවියෝ නම් : සිවුමහරජයෙහි දෙවියන් පටන් කොට එයින් මතුයෙහි දෙවියෝ යැ. විශුද්ධිදෙවියෝ නම් : රහත්හු යි.

1075. දන් දී සිල් සමාදන් වැ පෙහෙවස්කම් කොට කොහි උපදී ද යත් :

දන් දී සිල් සමාදන් වැ පෙහෙවස්කම් කොට ඇතැම් කෙනෙක් ගෘහපතිමහාසාරයන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් බ්‍රාහ්මණමහාසාරයන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් ක්ෂත්‍රිය මහාසාරයන්ගේ සහභාවයට පැමිණෙත්.

ඇතැම් කෙනෙක් චාතුම්මහාරාජිකදෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් තාවතිංසදෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් යාම දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් තුසිතදෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් නිම්මාණරතිදෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් පරනිම්මිතවසවත්තිදෙවියන්ගේ සහභාවයට පැමිණෙත්.

21—ෂ8 17626 (75/03)

Free Distribution www.aathaapi.org

1076. මනුස්සානං කිත්තකං ආයුප්පමාණං: වස්සසතං අප්පං වා භිය්‍යො.

1077. චාතුම්මහාරාජිකානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යානි මානුස්සකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංස රත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ. තෙන සංවච්ඡරෙන දිබ්බානි පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං. මනුස්සානං ගණනාය කිත්තකං හොති: නවුතිවස්සසතසහස්සානි.

1078. තාවතිංසානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යං මානුස්සකං වස්සසතං, තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංස රත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ, තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං. මනුස්සානං ගණනාය කිත්තකං හොති: තිස්සො ච වස්සකොටියො සට්ඨි ච වස්සසතසහස්සානි.

1079. යාමානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යානි මානුස්සකානි ද්වෙ වස්සසතානි, යාමානං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ. තෙන සංවච්ඡරෙන දිබ්බානි ද්වෙ වස්සසහස්සානි යාමානං දෙවානං ආයුප්පමාණං. මනුස්සානං ගණනාය කිත්තකං හොති: චුද්දස ච[1] වස්සකොටියො චත්තාරීසඤ්ච වස්සසතසහස්සානි.

1080. තුසිතානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යානි මානුස්සකානි චත්තාරිවස්සසතානි, තුසිතානං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංසරත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ. තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්සසහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං මනුස්සානං ගණනාය කිත්තකං හොති: සත්තපඤ්ඤාස වස්සකොටියො සට්ඨි ච වස්සසතසහස්සානි.

1081. නිම්මාණරතීනං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යානි මානුස්සකානි අට්ඨවස්සසතානි, නිම්මාණරතීනං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංස රත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ, තෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨ වස්ස-සහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං. මනුස්සානං ගණනාය කිත්තකං හොති: ද්වෙ වස්සකොටිසතානි තිංසා ච වස්සකොටියො චත්තාරීසඤ්ච වස්සසතසහස්සානි.

1082. පරනිම්මිතවසවත්තීනං දෙවානං කිත්තකං ආයුප්පමාණං: යානි මානුස්සකානි සොළසවස්සසතානි, පරනිම්මිතවසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංස රත්තියො, මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ, තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළසවස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං ආයුප්පමාණං. මනුස්සානං ගණනාය කිත්තකං හොති: නව ච වස්සකොටි සතානි එකවීසඤ්ච වස්සකොටියො සට්ඨි ච වස්සසතසහස්සානී'ති.

---

1. චුද්දසඤ්ච - සිරිමු, මජ්ඣං. 2. තිස්සො ච වස්සකොටියො - සිරිමු.

1076. මිනිසුන්ගේ ආයුප්‍රමාණය කෙතෙක යත් : අවුරුදු සියයෙකි. මදක් වැඩි වූ හෝ යි. (දෙසියයට නොපැමිණී යයි සේ යි.)

1077. චාතුම්මහාරාජික දෙවියනට ආයුප්‍රමාණය කෙතෙක යත් : මිනිසුන්ගේ අවුරුදු පනසෙක් සියුමහරජයෙහි වැසි දෙවියනට එක් රෑදවලෙක් වෙයි, ඒ රාත්‍රියෙන් තිස්රැයෙක් මසෙක් වෙයි, ඒ මාසයෙන් දෙළොස්මසක් ඇති සංවත්සරයෙක් වෙයි, ඒ සංවත්සරයෙන් දිව්‍ය වූ පන්සියක් හවුරුදු චාතුම්මහාරාජික දෙවියනට ආයුප්‍රමාණ යි. මිනිස්ගණනින් කෙතෙක් වෙයි යත් : අවුරුදු අනූලක්ෂයෙකි.

1078. තවතිසාවැසි දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : මිනිසුන් පිළිබඳ යම් අවුරුදු සියයෙක් වේ ද, තෙල තවුතිසා වැසි දෙවියනට එක් රෑදවලෙක් වෙයි, ඒ රාත්‍රියෙන්, තිස්රැයෙක් මාසයෙක, ඒ මසින් දෙළොස්මසක් ඇති සංවත්සරයෙක් වෙයි, ඒ සංවත්සර යෙන් හවුරුදු දහසෙක් තාවතිංසදෙවියනට ආයුප්‍රමාණ යි. මිනිස් ගණනින් කෙතෙක් වෙයි යත් : හවුරුදු තුන්කෙළසැටලක්ෂයෙකි.

1079. යාමදෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : මිනිසුන් පිළිබඳ හවුරුදු දෙසිය යෙක් යාමදෙවියනට එක් රෑදවලෙක් වෙයි, ඒ රාත්‍රියෙන් තිස්රැයෙක් මසෙක, ඒ මසින් දෙළොස්මසක් ඇති හවුරුද්දෙක් වෙයි, ඒ හවුරුද්දෙන් දිව්‍ය වූ දෙදහසෙක් හවුරුදු යාමදෙවියනට ආයුප්‍රමාණ යි. මිනිස්ගණනින් කෙතෙක් වෙයි යත් : හවුරුදු තුදුස් කෙළසතලිස්ලක්ෂයෙකි.

1080. තුසිතදෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : මිනිසුන් පිළිබඳ හවුරුදු සාරසියයෙක් තුසිත දෙවියනට එක් රාත්‍රිදිවයෙක් වෙයි, ඒ රාත්‍රියෙන් තිස්රැයෙක් මාසයෙක, ඒ මසින් දෙළොස්මසක් ඇති හවුරුද්දෙක් වෙයි, ඒ හවුරුද්දෙන් දිව්‍ය වූ හවුරුදු සාරදහසක් තුසිත දෙවියනට ආයුප්‍රමාණ යි. මිනිස්ගණනින් කෙතෙක් වෙයි යත් : සත්පනස්කෙළසැටලක්ෂයක් හවුරුදු වේ.

1081. නිම්මාණරතිදෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : මිනිසුන් ගේ හවුරුදු අටසියයක් නිම්මාණරතිදෙවියනට එක් රෑදවලෙක් වෙයි, ඒ රාත්‍රියෙන් තිස්රැයෙක් මාසයෙක, ඒ මසින් දෙළොස්මසක් ඇති හවුරුද්දෙක් වෙයි, ඒ හවුරුද්දෙන් දිව්‍ය වූ අටදහසක් හවුරුදු නිම්මාණරතිදෙවියනට ආයුප්‍රමාණ යි. මිනිස්ගණනින් කෙතෙක් හවුරුදු වෙයි යත් : දෙසියතිස්කෙළසතලිස්ලක්ෂයක් හවුරුදු වේ.

1082. පරනිම්මිතවසවත්ති දෙවියනට කෙතෙක් ආයුප්‍රමාණ වෙයි යත් : මිනිසුන් පිළිබඳ එක්දහස්සසියක් හවුරුදු පරනිම්මිතවසවත්ති දෙවියනට එක් රාත්‍රිදිවයෙක් වෙයි, ඒ රාත්‍රියෙන් තිස්රැයෙක් මාසයෙක, ඒ මසින් දෙළොස්මසක් ඇති සංවත්සරයෙක් වෙයි, ඒ සංවත්සරයෙන් දිව්‍ය වූ සොළොස්දහසක් හවුරුදු පරනිම්මිතවසවත්ති දෙවියනට ආයුප්‍රමාණ වෙයි. මිනිස්ගණනින් කෙතෙක් වෙයි යත් : නවසියඑක්විසිකෙළසැට ලක්ෂයක් හවුරුදු වේ යයි.

1083 ජ එතෙ කාමාවචරා - සබ්බකාමසමිද්ධිනො.
සබ්බෙසං එකසඞ්ඛාතො - ආයු භවති කිත්තකො,
ද්වාදස කොටිසතං තෙසං - අට්ඨවීසඤ්ච කොටියො,
පඤ්චදස සතසහස්සානි - වස්සග්ගෙන පකාසිතා'ති.

1384. පඨමං ඣානං පරිත්තං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: පඨමං ඣානං[1] පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: කප්පස්ස තතියො භාගො. පඨමං ඣානං මජ්ඣිමං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: පඨමං ඣානං මජ්ඣිමං භාවෙත්වා බ්‍රහ්මපුරොහිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං: උපඩ්ඪකප්පො. පඨමං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: පඨමං ඣානං පණීතං භාවෙත්වා මහාබ්‍රහ්මානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං: කප්පො.

1085. දුතියං ඣානං[2] පරිත්තං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: දුතියං ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: ද්වෙ කප්පා. දුතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: දුතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා අප්පමාණාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: චත්තාරො කප්පා. දුතියං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: දුතියං ඣානං පණීතං භාවෙත්වා ආභස්සරානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: අට්ඨ කප්පා.

1086. තතියං ඣානං[3] පරිත්තං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: තතියං ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තසුභානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති[4] තෙසං කිත්තකං ආයුප්පමාණං: සොළස කප්පා. තතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: තතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා අප්පමාණසුභානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: ද්වත්තිංස කප්පා. තතියං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති: තතියං ඣානං පණීතං භාවෙත්වා සුභකිණ්හානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. තෙසං කිත්තකං ආයුප්පමාණං: චතුසට්ඨිකප්පා.

1087. චතුත්ථං ඣානං[5] භාවෙත්වා ආරම්මණනානත්තතා මනසිකාරනානත්තතා ඡන්දනානත්තතා පණිධිනානත්තතා අධිමොක්ඛනානත්තතා අභිනීහාරනානත්තතා පඤ්ඤානානත්තතා අප්පෙකච්චෙ අසඤ්ඤසත්තානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ වෙහප්ඵලානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ අවිහානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ අතප්පානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ සුදස්සානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ සුදස්සීනං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ අකනිට්ඨානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ ආකාසානඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති.

---

1. පඨමජ්ඣානං - සිරිමු.
2. දුතියජ්ඣානං - සිරිමු.
3. තතියජ්ඣානං - සිරිමු.
4. උපපජ්ජන්ති - සිරිමු.
5. චතුත්ථජ්ඣානං - සිරිමු.

Free Distribution www.aathaapi.org

1083. තෙල ෂට්කාමාවචරයෝ සියලු පඤ්චකාමයෙන් සමෘද්ධ වූවාහු වෙති. සියලු කාමාවචරයන්ගේ එක්රැස් කොට පුඩුකළ ආයුප්‍රමාණය කෙතෙක් වෙයි යත් :

ඒ ෂට්කාමාවචර දෙවියන්ගේ ආයු මිනිසුන්ගේ හවුරුදු ගණනායෙන් දෙළොස්සිය අටවිසිකෙළපනස්ලක්ෂ (1228,50,00,000) කැයි ප්‍රකාශ කරනලදයි.

1084. ප්‍රථමධ්‍යානය පරිත්ත (අල්පගුණ) කොට වඩා කොහි උපදිත් ද යත් : ප්‍රථම ධ්‍යානය පරිත්ත කොට වඩා බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ගේ සහභාවයට පැමිණෙත්. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්පයක තුන්වැනි භාග යයි. (කල්පයකින් තුනෙන් කොටසකැයි සේයි.) ප්‍රථමධ්‍යානය මධ්‍යම කොට වඩා කොහි උපදිත් ද යත් : ප්‍රථම ධ්‍යානය මධ්‍යම කොට වඩා බ්‍රහ්මපුරොහිත දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : අඩකපෙකි. ප්‍රථමධ්‍යානය ප්‍රණීත කොට වඩා කොහි උපදිති යත් : ප්‍රථමධ්‍යානය ප්‍රණීත කොට වඩා මහාබ්‍රහ්මයන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්පයෙකි.

1085. ද්විතීයධ්‍යානය ගුණයෙන් අල්ප කොට වඩා කොහි උපදිති යත් : ද්විතීය ධ්‍යානය අල්පගුණ කොට වඩා පරිත්තාභ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : දෙ කල්පයෙකි. ද්විතීයධ්‍යානය මධ්‍යම කොට වඩා කොහි උපදිති යත් : ද්විතීයධ්‍යානය මධ්‍යම කොට වඩා අප්පමාණාභ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප සතරෙකි. ද්විතීය ධ්‍යානය ප්‍රණීත කොට වඩා කොහි උපදිති යත් : ද්විතීයධ්‍යානය ප්‍රණීත කොට වඩා ආභස්සර දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : අට කල්පයෙකි.

1086. තෘතීයධ්‍යානය පරිත්ත කොට වඩා කොහි උපදිති යත් : තෘතීයධ්‍යානය පරිත්ත කොට වඩා පරිත්තසුභ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : සොළොස් කල්පයෙකි. තෘතීයධ්‍යානය මධ්‍යම කොට වඩා කොහි උපදිති යත් : තෘතීයධ්‍යානය මධ්‍යම කොට වඩා අප්පමාණසුභ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට ආයුප්‍රමාණ කෙතෙක යත් : දෙතිස් කල්පයෙකි. තෘතීයධ්‍යානය ප්‍රණීත කොට වඩා කොහි උපදිති යත් : තෘතීයධ්‍යානය ප්‍රණීත කොට වඩා සුභකිණ්හ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති. ඔවුනට අයුප්‍රමාණ කෙතෙක යත් : සුසැට කල්පයෙකි.

1087. චතුර්ථධ්‍යානය වඩා ආලම්බනනානාත්වයෙන් මනසිකාරනානාත්වයෙන් ඡන්දනානාත්වයෙන් ප්‍රණිධිනානාත්වයෙන් අධිමොක්ෂනානාත්වයෙන් අභිනීහාර නානාත්වයෙන් ප්‍රඥානානාත්වයෙන් ඇතැම් කෙනෙක් අසඤ්ඤසත්ත දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් වෙහප්ඵල දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් අවිහ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් අතප්ප දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් සුදස්ස දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් සුදස්සී දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් අකණිට්ඨ දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් ආකාසානඤ්චායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් විඤ්ඤාණඤ්චායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙති, ඇතැම් කෙනෙක් නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙත්.

1088. අසඤ්ඤසත්තානඤ්ච වෙහප්ඵලානඤ්ච දෙවානං කිත්තකං ආයුප්පමාණං: පඤ්ච කප්පසතානි.

අවිහානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: කප්පසහස්සං.

අතප්පානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: ද්වෙ කප්පසහස්සානි.

සුදස්සානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: චත්තාරි කප්පසහස්සානි.

සුදස්සීනං දෙවානං කිත්තකං ආයුප්පමාණං: අට්ඨ කප්පසහස්සානි.

අකනිට්ඨානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: සොළස කප්පසහස්සානි.

ආකාසානඤ්චායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: වීසති කප්පසහස්සානි.

විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: චත්තාරීස කප්පසහස්සානි.

ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: සට්ඨි කප්පසහස්සානි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං: චතුරාසීති කප්පසහස්සානි.

1089. උක්ඛිත්තා පුඤ්ඤතෙජෙන – කාමරූපගතිඞ්ගතා
භවග්ගතම්පි සම්පත්තා – පුනාගච්ඡන්ති දුග්ගතිං.
තාව දීඝායුකා සත්තා – චවන්ති ආයුසඞ්ඛයා,
නත්ථි කොචි භවො නිච්චො – ඉති වුත්තං මහෙසිනා.
තස්මා හි ධීරා නිපකා – නිපුණා අත්ථචින්තකා,
ජරාමරණමොක්ඛාය – භාවෙන්ති මග්ගමුත්තමං.
භාවයිත්වා සුචිං[1] මග්ගං – නිබ්බානොගධගාමිනං,
සබ්බාසවෙ[2] පරිඤ්ඤාය – පරිනිබ්බන්ති අනාසවා'ති.

## 7

1090. පඤ්චන්නං ඛන්ධානං කති අභිඤ්ඤෙය්‍යා, කති පරිඤ්ඤෙය්‍යා, කති පහාතබ්බා, කති භාවෙතබ්බා, කති සච්ඡිකාතබ්බා, කති න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා –පෙ– සත්තන්නං චිත්තානං කති අභිඤ්ඤෙය්‍යා, කති පරිඤ්ඤෙය්‍යා, කති පහාතබ්බා, කති භාවෙතබ්බා, කති සච්ඡිකාතබ්බා, කති න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා:

1091. රූපක්ඛන්ධො අභිඤ්ඤෙය්‍යො පරිඤ්ඤෙය්‍යො න පහාතබ්බො න භාවෙතබ්බො න සච්ඡිකාතබ්බො. චත්තාරො ඛන්ධා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා. න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා.

---

1. සුචි මග්ගං – PTS.
2. සබ්බභවෙ – කත්ථචි.

Free Distribution www.aathaapi.org

1088. අසඤ්ඤසත්ත, වෙහප්ඵල දෙවියන්ට ආයුප්‍රමාණ කෙතෙක යත් : පන්සියක් කල්පයෙකි.

අවිහ දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප දහසෙකි.

අතප්ප දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප දෙදහසෙකි.

සුදස්ස දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප සාරදහසෙකි.

සුදස්සී දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප අටදහසෙකි.

අකණිට්ඨක දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප සොළොස්දහසෙකි.

ආකාසානඤ්චායතනූපග දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප විසිදහසෙකි.

විඤ්ඤාණඤ්චායතනූපග දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප සතලිස් දහසෙකි.

ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප හැටදහසෙකි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියනට ආයුප්‍රමාණ කෙතෙක යත් : කල්ප සුවාසූදහසෙකි.

1089. පින්තෙදින් උපරිභාවයට පමුණුවනලදුව මනුෂ්‍යාදි සප්තසුගතිභවයට හා එකොළොස් රූපභවයට පිළිසඳ විසින් ගියාහු ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඞ්ඛ්‍යාත භවාග්‍රයට පැමිණියාහු ද පෙරලා දුගතියට පැමිණෙත්.

කල්ප සුවාසූදහසක් පමණ දීර්ඝායුෂ්ක වූ සත්ත්වයෝ ආයු ගෙවියෑමෙන් ච්‍යුත වෙති. නිත්‍ය වූ කිසි භවයෙක් නැතැයි මහර්ෂි වූ සර්වඥයන් විසින් වදරන ලදි. එහෙයින් ම ධීර වූ එළඹසිටි සිහි ඇති නිපුණ වූ ස්වාර්ථාදි අර්ථචින්තකයෝ ජරාමරණමොක්ෂයට කාරණ වූ නිවන පිණිස උතුම් වූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වඩත්.

නිවනට පමුණුවන පවිත්‍ර වූ ආර්‍ය්‍යමාර්ගය ස්වසන්තානයෙහි උපදවා කාමාදි සියලු ආස්‍රවයන් ත්‍රිවිධ පරිඥයෙන් දැන ආස්‍රව රහිත වූවාහු පරිනිර්වාණය කෙරෙත්.

## 7

1090. පඤ්චස්කන්ධයන් අතුරෙහි ස්වභාවලක්ෂණාවබොධ වශයෙන් දතයුතු ස්කන්ධයෝ කෙතෙක, සාමාන්‍යලක්ෂණාවබොධ වශයෙන් දතයුතු ස්කන්ධයෝ කෙතෙක, ප්‍රහාතව්‍යයෝ කෙතෙක, භාවිතව්‍යයෝ කෙතෙක, සාක්ෂාත්කර්තව්‍යයෝ කෙතෙක, ප්‍රහාතව්‍ය නොවූවාහු, භාවිතව්‍ය නොවූවාහු, සාක්ෂාත්කර්තව්‍ය නොවූවාහු කෙතෙක . . . සප්ත චිත්තයන් අතුරෙහි අභිඥෙයයෝ කෙතෙක, පරිඥෙයයෝ කෙතෙක, ප්‍රහාතව්‍යයෝ කෙතෙක, භාවිතව්‍යයෝ කෙතෙක, සාක්ෂාත්කර්තව්‍යයෝ කෙතෙක, ප්‍රහාතව්‍ය නොවූවාහු, භාවිතව්‍ය නොවූවාහු සාක්ෂාත්කර්තව්‍ය නොවූවාහු කෙතෙක යත් :

1091. රූපස්කන්ධය අභිඥෙය (ස්වභාව ලක්ෂණාවබොධයෙන් දතයුතු) යෑ, පරිඥෙය (සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දතයුතු) යෑ, ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත්කර්තව්‍ය නො වෙයි. සතර ස්කන්ධයෝ අභිඥෙයහ, පරිඥෙයහ. ප්‍රහාතව්‍ය වියහෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, ප්‍රහාතව්‍ය නො වියහෙති, භාවිතව්‍ය නො වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වියහෙත්.

1092. දසායතනා අභිඤ්ඤෙය්‍යා, පරිඤ්ඤෙය්‍යා, න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා. ද්වෙ ආයතනා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා. න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා.

1093. සොළසධාතුයො අභිඤ්ඤෙය්‍යා, පරිඤ්ඤෙය්‍යා, න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා. ද්වෙ ධාතුයො අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා.

1094. සමුදයසච්චං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං පහාතබ්බං න භාවෙතබ්බං න සච්ඡිකාතබ්බං. මග්ගසච්චං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං න පහාතබ්බං භාවෙතබ්බං න සච්ඡිකාතබ්බං. නිරොධසච්චං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං න පහාතබ්බං න භාවෙතබ්බං සච්ඡිකාතබ්බං. දුක්ඛසච්චං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං, සියා පහාතබ්බං න භාවෙතබ්බං, න සච්ඡිකාතබ්බං, සියා න පහාතබ්බං.

1095. නවින්ද්‍රියා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා න පහාතබ්බා න භාවෙතබ්බා න සච්ඡිකාතබ්බා. දොමනස්සින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං පහාතබ්බං න භාවෙතබ්බං න සච්ඡිකාතබ්බං. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං න පහාතබ්බං. භාවෙතබ්බං න සච්ඡිකාතබ්බං. අඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං න පහාතබ්බං. සියා භාවෙතබ්බං, සියා සච්ඡිකාතබ්බං. අඤ්ඤාතාවින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං න පහාතබ්බං න භාවෙතබ්බං සච්ඡිකාතබ්බං. තීණින්ද්‍රියා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා න පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න භාවෙතබ්බා න සච්ඡිකාතබ්බා. ඡ ඉන්ද්‍රියා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා.

1096. තයො අකුසලහෙතූ අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා. තයො කුසලහෙතූ අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, න පහාතබ්බා, සියා භාවෙතබ්බා න සච්ඡිකාතබ්බා, සියා න භාවෙතබ්බා. තයො අව්‍යාකතහෙතූ අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා, න පහාතබ්බා න භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න සච්ඡිකාතබ්බා.

1097. කබළිඞ්කාරො ආහාරො අභිඤ්ඤෙය්‍යො, පරිඤ්ඤෙය්‍යො, න පහාතබ්බො, න භාවෙතබ්බො, න සච්ඡිකාතබ්බො. තයො ආහාරා අභිඤ්ඤෙය්‍යා, පරිඤ්ඤෙය්‍යා, සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා.

1098. ඡ ඵස්සා අභිඤ්ඤෙය්‍යා, පරිඤ්ඤෙය්‍යා, න පහාතබ්බා, න භාවෙතබ්බා, න සච්ඡිකාතබ්බා. මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, පරිඤ්ඤෙය්‍යො, සියා පහාතබ්බො, සියා භාවෙතබ්බො, සියා සච්ඡිකාතබ්බො, සියා න පහාතබ්බො, න භාවෙතබ්බො, න සච්ඡිකාතබ්බො.

1092. දශායතනයෝ අභිඥෙයහ, පරිඥෙයහ, ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්. (මනායතන ධර්මායතන සඞ්ඛ්‍යාත) ආයතනයෝ දෙදෙන අභිඥෙය වෙති, පරිඥෙය වෙති, ප්‍රහාතව්‍ය වියහෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, ප්‍රහාතව්‍ය භාවිතව්‍ය සාක්ෂාත්කර්තව්‍ය නො වියහෙත්.

1093. සොළොස් ධතුහු අභිඥෙයහ, පරිඥෙයහ, ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්. (ධම්මධාතු මනොවිඤ්ඤණධාතු සඞ්ඛ්‍යාත) ධාතුහු දෙදෙන අභිඥෙයහ, පරිඥෙයහ, ප්‍රහාතව්‍ය වියහෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත් කර්තව්‍ය වියහෙති, ප්‍රහාතව්‍ය භාවිතව්‍ය සාක්ෂාත්කර්තව්‍ය නො වියහෙත්.

1094. සමුදයසත්‍යය අභිඥෙය යැ, පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය යැ, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත්කර්තව්‍ය නො වේ. මාර්ගසත්‍යය අභිඥෙය යැ, පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය නො වෙයි. භාවිතව්‍ය යැ, සාක්ෂාත්කර්තව්‍ය නො වේ. නිරොධසත්‍යය අභිඥෙය යැ, පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත්කර්තව්‍ය යි. දුඃඛ සත්‍යය අභිඥෙය යැ, පරිඥෙය යැ ප්‍රහාතව්‍ය වියහෙයි, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත් කර්තව්‍ය නො වෙයි, ප්‍රහාතව්‍ය නො වියහේ.

1095. ඉන්ද්‍රියයෝ නව දෙනෙක් අභිඥෙය වෙති, පරිඥෙය වෙති, ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්. දෙමනස්සින්ද්‍රිය අභිඥෙය යැ පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය යැ, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත් කර්තව්‍ය නො වේ. අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය අභිඥෙය යැ පරිඥෙය යැ ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය යැ සාක්ෂාත්කර්තව්‍ය නො වේ. අඤ්ඤින්ද්‍රිය අභිඥෙය යැ පරිඥෙය යැ ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය වියහෙයි, සාක්ෂාත්කර්තව්‍ය වියහේ. අඤ්ඤතාවින්ද්‍රිය අභිඥෙය යැ, පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත් කර්තව්‍ය යි. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් අභිඥෙය වෙති පරිඥෙය වෙති ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, භාවිතව්‍ය සාක්ෂාත්කර්තව්‍ය නො වියහෙත්. ඉන්ද්‍රියයෝ සදෙනෙක් අභිඥෙය වෙති පරිඥෙය වෙති, ප්‍රහාතව්‍ය වියහෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, ප්‍රහාතව්‍ය භාවිතව්‍ය සාක්ෂාත් කර්තව්‍ය නො වියහෙත්.

1096. තුන් අකුශලහෙතුහු අභිඥෙය වෙති, පරිඥෙය වෙති ප්‍රහාතව්‍ය වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්. තුන් කුශල හෙතුහු අභිඥෙයයෝ යැ පරිඥෙයයෝ යැ, ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වියහෙත්. තුන් අව්‍යාකෘතහෙතුහු අභිඥෙයයෝ යැ පරිඥෙයයෝ යැ ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, සාක්ෂාත් කර්තව්‍ය නො වියහෙත්.

1097. කවලීකාරආහාරය අභිඥෙය යැ පරිඥෙය යැ ප්‍රහාතව්‍ය නො වෙයි, භාවිතව්‍ය නො වෙයි, සාක්ෂාත්කර්තව්‍ය නො වේ. (ස්පර්ශාදී) තුන් ආහාරයෝ අභිඥෙයයෝ යැ පරිඥෙයයෝ යැ ප්‍රහාතව්‍ය වියහෙති, භාවිතව්‍ය වියහෙති, සාක්ෂාත්කර්තව්‍ය වියහෙති, ප්‍රහාතව්‍ය නො වියහෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්.

1098. ස්පර්ශයෝ සදෙන අභිඥෙයයෝ යැ පරිඥෙයයෝ යැ ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්. මනොවිඥානධාතුසංස්පර්ශය අභිඥෙය යැ පරිඥෙය යැ ප්‍රහාතව්‍ය වියහෙයි, භාවිතව්‍ය වියහෙයි, සාක්ෂාත්කර්තව්‍ය වියහෙයි, ප්‍රහාතව්‍ය භාවිතව්‍ය සාක්ෂාත්කර්තව්‍ය නො වියහේ.

1099. ඡ වෙදනා, ඡ සඤ්ඤා, ඡ චෙතනා, ඡ චිත්තා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා න පහාතබ්බා න භාවෙතබ්බා න සච්ඡිකාතබ්බා.

1100. මනොවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා සියා පහාතබ්බා, සියා භාවෙතබ්බා, සියා සච්ඡිකාතබ්බා, සියා න පහාතබ්බා, න භාවෙතබ්බා න සච්ඡිකාතබ්බා.

## 8

1101. පඤ්චන්නං ඛන්ධානං කති සාරම්මණා, කති අනාරම්මණා-පෙ- සත්තන්නං චිත්තානං කති සාරම්මණා, කති අනාරම්මණා :

1102. රූපක්ඛන්ධො අනාරම්මණො. චත්තාරො ඛන්ධා සාරම්මණා.

දසායතනා අනාරම්මණා. මනායතනං සාරම්මණං. ධම්මායතනං සියා සාරම්මණං, සියා අනාරම්මණං.

දසධාතුයො අනාරම්මණා. සත්තධාතුයො සාරම්මණා. ධම්මධාතු සියා සාරම්මණා, සියා අනාරම්මණා.

ද්වෙ සච්චා සාරම්මණා. නිරොධසච්චං අනාරම්මණං. දුක්ඛසච්චං සියා සාරම්මණං, සියා අනාරම්මණං.

සත්තින්ද්‍රියා අනාරම්මණා. චුද්දසින්ද්‍රියා සාරම්මණා. ජීවිතින්ද්‍රියං සියා සාරම්මණං, සියා අනාරම්මණං.

නව හෙතූ සාරම්මණා. කබළිඞ්කාරො ආහාරො අනාරම්මණො. තයො ආහාරා සාරම්මණා.

සත්ත ඵස්සා, සත්ත වෙදනා, සත්ත සඤ්ඤා, සත්ත චෙතනා, සත්ත චිත්තා සාරම්මණා.

1103. පඤ්චන්නං ඛන්ධානං කති සාරම්මණාරම්මණා, කති අනාරම්මණාරම්මණා -පෙ- සත්තන්නං චිත්තානං කති සාරම්මණාරම්මණා, කති අනාරම්මණාරම්මණා:

1104 රූපක්ඛන්ධො අනාරම්මණො. චත්තාරො ඛන්ධා සියා සාරම්මණාරම්මණා, සියා අනාරම්මණාරම්මණා.

දසායතනා අනාරම්මණා. මනායතනං සියා සාරම්මණාරම්මණං, සියා අනාරම්මණාරම්මණං. ධම්මායතනං සියා සාරම්මණාරම්මණං, සියා අනාරම්මණාරම්මණං, සියා අනාරම්මණං.

දස ධාතුයො අනාරම්මණා. ඡ ධාතුයො අනාරම්මණාරම්මණා. මනොවිඤ්ඤාණධාතු සියා සාරම්මණාරම්මණා, සියා අනාරම්මණාරම්මණා, ධම්මධාතු සියා සාරම්මණාරම්මණා, සියා අනාරම්මණාරම්මණා, සියා අනාරම්මණා

නිරොධසච්චං අනාරම්මණං. මග්ගසච්චං අනාරම්මණාරම්මණං. සමුදයසච්චං සියා සාරම්මණාරම්මණං, සියා අනාරම්මණාරම්මණං, දුක්ඛසච්චං සියා සාරම්මණාරම්මණං, සියා අනාරම්මණාරම්මණං, සියා අනාරම්මණං.

1099. වෙදනාවෝ සදෙන . . . සංඥාවෝ සදෙන . . . චෙතනාවෝ සදෙන . . . චිත්තයෝ සදෙන අභිඥෙයයෝ යැ පරිඥෙයයෝ යැ ප්‍රහාතව්‍ය නො වෙති, භාවිතව්‍ය නො වෙති, සාක්ෂාත්කර්තව්‍ය නො වෙත්.

1100. මනොවිඥානධාතු අභිඥෙය යැ, පරිඥෙය යැ, ප්‍රහාතව්‍ය වියහෙයි, භාවිතව්‍ය වියහෙයි, සාක්ෂාත්කර්තව්‍ය වියහෙයි, ප්‍රහාතව්‍ය භාවිතව්‍ය සාක්ෂාත්කර්තව්‍ය නො වියහේ.

## 8

